තිත්ත කෝපි

ක්‍රිස්ටීන් විල්සන්



තිත්ත කෝපි

ක්‍රිස්ටීන් විල්සන්

THE BITTER BERRY
නමැති ඉංග්‍රීසි නවකථාවේ
සිංහල අනුවාදය

අනුවාදක
සී. ඒ. විජේසේකර

ANCL
ප්‍රකාශනයක්

ප්‍රථම මුද්‍රණය 1962
දෙවැනි මුද්‍රණය 1996 ජුනි.

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
සියලු හිමිකම් ඇවිරිණි.

පිටකවරය සැකසුම:
හර්ෂ ගුණවර්ධන විසිනි.

ISBN 955 – 9034 – 16 – 2

මේ පොත
පුරෝගාමී වැවිලිකරුවන් වෙත
පිරිනැමේ

e-Book by LOL_SEEN

කතෘගේ වෙනත් කෘති :

THE MOUNTAIN ROAD

I AM THE WINGS

සිංහල
EBOOKS

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..

තිත්ත කෝපි

අද ලංකාවේ අක්කර සිය දහස් ගණනක පැතිර පවත්නා තේ වගාව පිහිටා තිබෙන්නේ පසුගිය සිය වසේ දී සශ්‍රීක ලෙස වැඩුණු කෝපිවල සොහොන් බිම් මත ය. මුලදී ඉමහත් යස ඉසුරු ලබා දී නැවත ඒ වනසා දමූ ''තිත්ත කෝපිවලට'' දිවයින පුරා පැතිරෙමින් හදිසියේ ම වැළඳුණු කොළරෝගය මහත් කම්කටුළු මධ්‍යයේ මෙහෙකළ දහස් ගණනක ගේ විනාශයට මුල් විය. පුරෝගාමී වැවිලිකරුවන්ගේ දිවිපෙවෙත් ඇසුරෙන් නවතායෙන් ගොතන ලද මේ නවකථාව පාඨකයා කුල්මත් කරවීමට සමත් වෙයි.

අවුරුදු ගණනක් මුළුල්ලේ ඔවුනොවුන් හමු නො වූ මස්සිනාවරු දෙදෙනෙක් 1859 දී ලන්ඩනය මීදුමෙන් වැසී ගත් දිනයෙක අහම්බෙන් මුණගැසෙති. ලංකාවේ වැවිලිකරුවකු වශයෙන් මහත් යස ඉසුරින් අනූන ව, තඹ පැහැ ගැන්වී ගිය හියු නෙවිල් සිය වත්තට යා බදව පිහිටි කෝපිවත්තක් මිල දී ගැනීමට තැන්පත් ගති ඇති සිය මස්සිනා වූ ටොම් පොළඹවයි. මස්සිනා අනුගමනය කොට ටොම් ලංකාවට ඒමට ටික දිනකට පෙර රුසිරුමත් සේරා කෝටනේ හමුවී ඇ විවාහ කරගනියි.

ඔවුන් නො දන්නා වත්තේ ඔවුනට හමුවූ දේත්, ඔවුන් මුහුණ පෑ දුෂ්කරතා වලට ධෛර්‍යසම්පන්න ව මුහුණ දුන් සැටිත්, මෙහි අනාවරණය වෙයි. ඉඩමෙන් දිවිපෙවෙත ලබා ගැනීමට කළ සටන, දෙමස්සිනාලාගේ වෙනස්කම, ඔවුන්ගේ ජීවිතයට පුදුම එළවන ඇලිසන් පැරඩෙ එකතුවීම, බෙදවාචකයනට හා විනාශයට ඇති උග්‍ර ආසන්නතාවය යන මේ සියල්ල මෙහි ගැප් වී ඇත. අලුත් රටේ ජීවත්වීමේ දී ඇතිවිය යුතු වීරෝදර ගුණාංගයන් මෙන් ම දුක් කම්කටුළු ද කතුවරිය ඉතා විශිෂ්ට ලෙස දක්වා ඇති අතර, මෙහි කාලපරිච්ඡේදය ද පසුබිම ද තාත්වික ව නිරූපණය වී ඇත්තේ ය.

ප්‍රකාශකයෝ

මේ පොත ගැන ....

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ පොත් ප්‍රකාශන ව්‍යාපෘතිය යටතේ පළ කෙරෙන 5 වැනි කෘතිය 'තිත්ත කෝපි' තවකථාවයි. 60 දශකයේ ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් ප්‍රසිද්ධ කරන ලද උසස් ගණයේ පරිවර්තන කෘතීන් කීපයක් වෙයි. වර්ෂ 35 කට පමණ පසුව මෙම කෘතීන් වෙළඳ පොළෙහි නොමැති කම නිසා ඒවා කියවීම කෙරෙහි දැඩි උනන්දුවක් දැක්වූ අපගේ පාඨක භවතුනට මෙම පොත් නැවත වරක් පොත් ප්‍රකාශන ව්‍යාපෘතිය විසින් මුද්‍රණය කොට පළ කිරීමට තීරණය කරන ලදී. මේ දක්වා පළකරන ලද 'සුදු වැද්ද' 'සුදු ගෝනා' පොත්වල 2 වන හා 3 වන මුද්‍රණ සති කීපයකින් අලෙවි කිරීමට හැකියාව ලැබීම අපට මහත් ධෛර්යයක් හා සතුටක් ලබාදීමට සමත්විණි. 'තිත්ත කෝපි' කෘතිය නැවත මුද්‍රණය කරන ලෙස ඉල්ලා පාඨක පිරිස් ලිපි රාශියක් එවා ඇත. ඒ අයගේ කියවීමේ ආශාව මුදුන්පත් කරලීමට මෙම කෘතියේ 2 වන මුද්‍රණය මේ ලෙස එළිදකී. මෙහි ප්‍රථම මුද්‍රණය 1962 දී අප ආයතනය විසින් එළිදක්වනු ලැබිණි.

මෙම පොතෙහි අනුවාදක ලෙස කටයුතු කළ මහරගම දහම් මාවතේ පදිංචි සී. ඒ. විජේසේකර මහතා කෘතහස්ත පරිවර්තකයෙකි. ජීවිතයේ සැඳෑ සමය ගත කරන ඒ මහතා මේ අවස්ථාවේදී කෘතවේදීව සිහිපත් කරන්නෙමු.

ප්‍රකාශන ව්‍යාපෘතිය සම්බන්ධව අප නිරතුරුව ධෛර්යමත් කරන අප ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, මෙම කෘතිය කලට වේලාවට අලංකාර ලෙස මුද්‍රණය කර දුන් අප ආයතනයේ වාණිජ මුද්‍රණ අංශයේ කළමණාකාර මහතා ඇතුළු සෙසු සියලුම කාර්ය මණ්ඩලයටත්. ග්‍රැෆික් අංශයේ සංස්කාරක සහ කළමණාකාර මහතා ඇතුළු සෙසු අයටත්, පොත් ප්‍රකාශන අංශයේ කාර්ය මණ්ඩලයටත් කෘතඥ වෙමු.

නිස්සංක මදුරප්පෙරුම,
උපදේශක,
පොත් ප්‍රකාශන ව්‍යාපෘතිය,

1996 ජූනි මස 20 දින,
'ලේක්හවුස්'
කොළඹ 10.

කතුවරියගෙන්

ලන්තානාව වීමට අත්‍යන්තයෙන් ම සුදුසු තේ වත්තක් ලංකාවේ කඳුකරයේ ඇත. එය කුරන් රහදෙන දියඇලි, පොකුණු හා ඇළදෙළින් යුක්ත ය. තවමත් වල්ඌරන් හා කොටියන් ඉඳහිට ඇතැයි කියන වනරොද ද අහසේ නිසල ව මෙන් පියාසර කරන උකුසන් ඇති පතන බිම් ද මෙහි ඇත්තේ ය. අතීතයෙන් ශෙෂ වූ කෝපි අක්කර බාගයකුදු මෙහි තිබේ.

වක් වූ කරත්ත පාර ඔස්සේ, වත්තේ ඉම පසුකොට කන්ද ඉහළට යන ඔබ කෙළවර වීසල් පාළු බිමකට පැමිණෙන්නෙහි ය. පේන තෙක් මානය දක්වා විහිදුණු තණබිම් මුහුදු මට්ටමින් අඩි 3,000 ක් ඔබ්බෙහි පෙදෙසක් අනාවරණය කරයි. ඒ මැද හුදෙකලා වූ සෙල්මුවා දුම්කවුළුවක නෂ්ටාවශෙෂයකි.

මේ ස්ථානයෙහි අතීතයේ විශාල කෝපි වත්තක් පැවැත්තේ යයි වයස්ගත තේ සාදන්නෙක් මට කීය. 1869 දී හදිසියෙන් ම මතුවූ ''හෙමීලියා වැස්ටාටරික්ස්'' නමැති කොළ රෝගය වසක් පාසා කෝපි දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කය විනාශ මුඛයට පත්කළ සැටිත්, 1880 ගණන් වන විට ලංකාවෙන් කෝපි නැත්තට ම නැතිවී ගිය සැටිත් මට පසුව දැනගන්නට ලැබිණ.

පැරණි වැවිලිකරුවන්ගේ වීරත්වය හා ධෛර්‍යය සිය පියවරුන් කළ විස්තරවලින් දැනගත් ඔවුන්ගේ දරුවන්ගෙන් මට අවබොධ වන්නට විය. ඉතුරු ව සිටි කෝපි වැවිලිකරුවන් ටික දෙනාගේ මුවින් ද මට ඒ කාලවල දුක් කම්කටොලු ගැන දැන ගන්නට ලැබුණේ ය. ලබාගත හැකි වූ සෑම පොත්පත්, ලියුම් කියුම් හා වාර්තාවලින්, ලංකාව එතරම් ණයගැති ආදි වැවිලිකරුවන්ගේ ජීවිතය පිළිබඳ පුනර්ජීවයක් ඇති කිරීමට මම ඇරඹීමි. එහෙත්, වැඩි කොටස මට අවබොධ වූයේ ඒ තේ වත්තේ – මේ පොතේ ලන්තානාවේ– වාසය කිරීමෙනැ යි සිතේ: එය කලක් මගේ නිවෙස ද වූ හෙයිනි.

අනුවාදක ගැන ....

කොලින් ඇල්ෆ්‍රඩ් විජේසේකර (සි. ඒ. විජේසේකර)

'තිත්ත කෝපි' පොතෙහි අනුවාදක කොලින් ඇල්ෆ්‍රඩ් විජේසේකර (සි. ඒ. විජේසේකර) මහතා 1905 නොවැම්බර් මස උපත ලැබීය. තම පියාගේ අඩිපාරේ යමින් ජනමාධ්‍ය ක්ෂේත්‍රයට පිවිසි ඒ මහතා 1922 දී දිනමිණ පුවත්පතෙහි භාෂා පරිවර්තකයකු ලෙස ස්වකීය 17 වැනි වියේදී සේවයට බැඳුනි.

1927 දී හෙතෙම දිනමිණ කර්තෘ මණ්ඩලයේ ස්ථිර සේවයට පත්වූ අතර වසර 12 ක කාලයක් තුළ ඔහු එම පුවත්පතේ ළමා පිටුව හා විශේෂාංග සංස්කාරක ලෙස සේවය කළේය. 1937 සිට 1939 දක්වා කාලය තුළ විජේසේකර මහතා 'සරසවි සඳරැස' පුවත්පතේ සංස්කාරක ලෙස සේවය කර ඇත. ඔහුගේ මාධ්‍ය ජීවිතයේ නැවත වරක් 1947 දී ලංකාදීප පුවත්පත ආරම්භ කළ අවධියේ එහි ප්‍රධාන උප කර්තෘ ලෙස සේවයට බැඳුනි.

විජේසේකර මහතාගේ සේවය මාධ්‍ය ක්ෂේත්‍රයේ පමණක් නොව ග්‍රන්ථ කර්තෘවරයෙකු වශයෙන් ද තවදුරටත් විදහා පෑවේය. 1936 දී කාටර් ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය සංශෝධනය කිරීම ඒ මහතාගෙන් සිදුවූ මෙහෙයකි.

ඒ මහතා විසින් ලියන ලද කෘතීන් අතර 'හෙළදිව පුවත' නැමති ඉතිහාස ග්‍රන්ථය ද 'දස පිරිත' ඇසුරු කරගෙන සම්පාදනය කරන ලද සිංහල ගී පිරිත් නැමති කෘතියත්, විනෝද කාව්‍ය සංග්‍රහය නමින් පළවූ කාව්‍ය ග්‍රන්ථයත් වෙයි. මේ හැර ඔහු විසින් පුස්තකාල පොත් ඇසුරු කොට ගෙන ලංකාවේ බලි තොවිල් පිළිබඳව විස්තරාත්මක ග්‍රන්ථයක් ඉංග්‍රීසි බසින් පළකරන ලදී. මෙයට අමතරව ඔහු විසින් ලියා පළකරන ලද ළමා සාහිත්‍ය ග්‍රන්ථ ගණනාවක් ද ඇත.

පරිවර්තන කාර්යයේදී ඉතා කෘතහස්ත භාවයක් දැක්වූ විජේසේකර මහතා 'තිත්ත කෝපි' (Bitter Berry) කෘතියට අතිරේක වශයෙන් 'අපේ උරුමය' (Our Heritage), ලංකාව සහ ලෝක ඉතිහාසය (Ceylon and World History), වන ප්‍රවාහය (Jungle Tide) (සංශෝධිත පිටපත), නරිනයිදේ (Rare a Romance of Nariya, The Jackal), ලංකාව හා බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරු (The British Governer of Ceylon), ලංකා ජනතාව (The People of Ceylon) යනාදී කෘතීන් සහ 'කාලිදූස ප්‍රණීත ශෘතබෝධ' නම් සංස්කෘත ග්‍රන්ථය 'සුතබෝද හෙළ සිලෝ' නමින් සිංහලට නැගීය. ඔහුගේ පියා විසින් සංස්කරණය කරන ලද 'ථූපවංශය' නැවත වරක් සකස් කරන ලදුව එහි ගැට පද වලට ඉංග්‍රීසියෙන් අර්ථ ලියා පළකළේය.

දැනට ජීවිතයේ සන්ධ්‍යා සමය ගෙවන සි. ඒ. විජේසේකර මහතා මහරගම 'දහම් මාවතේ ස්වකීය දියණියකගේ නිවසේ පදිංචිව සිටියි.

ඒ මහතා පිරිමි දරුවන් දෙදෙනෙකුගේ සහ ගැහැනු දරුවන් පස්දෙනකුගේ පියෙකි.

කාණ්ඩය 1

1

ටොම් නෙවිල්, සිය පළල් උරහිස් කබායකින් ආවරණය කරමින්, ඇල්බට රොස් ආරක්ෂණ සමාගමේ කාර්යාලයෙන් එළියට බැස්සෙ, 1859 අවුරුද්දේ දවසක මීදුමින් වැසීගත් ලන්ඩන් නුවර වීදියකට ය.

''ආයිත් ඔබ ප්‍රමාද කරන්ට වීම ගැන කනගාටුයි, ස්මිත්. ඊටමත් මෙහෙම රැක''යි මඳ සිනා මුසු මුහුණකින් ටොම් කීවේ තරමක් කනස්සල්ලෙනි.

තරුණ නෙවිල් ගේ මේ වචන ඇසූ දොරටුපාලයා ද ඔහු මෙන්' ම ගම්වැසියෙක් විය. රූප ලක්ෂණයෙන් හා ස්වභාවයෙන් නෙවිල් නගරබද කාර්යාලයීය ජීවිතයකට වඩා ගම්බද ගොවිරාළ කෙනකු ගේ ජීවිතයකට යෝග්‍ය බැව් ඔහුට ද පෙනුණි.

''අඳුරු රැයක්, මහත්තයා; රථයකට අඬ ගහන්න ද?''

''බොහොම ස්තූතියි. අර අපායක් වැනි මේසෙ ළඟ මුළු දවස ම ගත කරලා දැන් ඉතින් මට ඕනෑ කකුල් ටිකක් දිග ඇර ගන්නයි.''

ටොම් සිය මහල් නිවෙසට යැමට මහට බැස්සේ ය. පියකරු නො වන ඒ ගෙයි කවුළුවලින් පෙනෙන්නේ ස්වාභාවික රුචිර දර්ශනයක් නො වේ. දුම් වැදුණු බිත්ති හා දුඹුරු පැහැති වහළ ඇති ගෙවල් පමණකි.

අහෝ! මේ කෙතරම් පිළිකුල් දර්ශනයක් ද? විවිධත්වයක් නැති ඒකාකාර වැඩවලින් මිරිකී ගිය සිරුරක් ඇති ඔහුට ලන්ඩනයෙන් විහිදෙන ගන්ධය පවා ඔහුගේ හුස්ම හිර කරන්නාක් මෙන් විය. ඔහුගේ පියා සතු ව තිබී, දැන් අන්‍යයන් අතට පත්ව ඇති, බරැන්ට්වුඩ මන්දිරය හා ඒ අවට පැතුරුණු උපශාන්ත කඳුකර දර්ශනය යළිත් හිමිකර ගැනීමට ඔහු කුමක් නම් නො කරයි ද?

මීදුම මඳින් මඳ අඩු විය. තමාගේ දුම් කෝව දල්වා ගැනීමට, ටොම් ගැස් කණුවක් යටට ගියේ ය. ළහි ළහියේ නො ඉවසිල්ලෙන් තබන පා හඬක් ඔහුට ඇසෙත් ම, ඒ පහනේ නො පැහැදිලි එළියෙන් පෙනුණේ ඔහු දෙසට එන මිනිසෙකි.

''මහත්මයා, මා මේ ඉන්නේ කොහේදැ යි මට කියන්ට පුළුවන් ද? මා බැලුවේ ඇල්බට්රොස් ආරක්ෂණ කන්තෝරුව යි. නුමුත් මේ මීදුමේ පැටලී–''

තවමත් දැල්වෙන ගිනිකූර අතින් ගෙන සිටි ටොම් වහා ම හිස ඔසවා බැලී ය. කටහඬ සම්පූර්ණයෙන් මාරු වූ ළමයකුගේ මෙන් වූ මේ බැරැඩි හඬ ඔහු අසා ඇත්තේ තවත් එක් කෙනකුගෙන් පමණකි. ගිනිකූර නිවී යන්ට පෙර පෙනුණේ දුඹුරු පැහැති හීන් මුහුණක් සහ මනා සේ වැඩුණු දෙබැමක් මැද විහිළු ගතිය දනවන නෙත් යුවළකි.

''හො හෝ! ටොම් නෙවිල් ද මේ? හරි පුදුමයක් නේ.''

''හියු! කොයි ලෝකයෙන් ද ඔබ මතුවුණේ?''

මේ මස්සිනාවරුන් දෙදෙනා අතට අත දුන් හ. එහෙත් නො දැනුවත්ව ම වාගේ ඔවුන්ගේ අත් බැම්මෙන් ගිලිහිණි. කලකට පෙර ඔවුන් හමු වූ විටක ඒ අත් ම කෝපයෙන් අමෝරාගත් සැටි එකිනෙකාට මතක් විය.

යළිත් කථාව ඇරඹුවේ හියු නෙවිල් ය.

''අපේ පරණ කෝන්තරේ මතක් කරන්ට ඕනෑ නෑ, ටොම්. අවුරුදු නවයක් කියන්නේ ලොකු කාලයක්. ඊට පස්සේ බොහෝ දේවල් සිදුවෙලා තියෙනවා.''

සිය මස්සිනා ගේ තරම් පියකරු නො වූ සිනා රැල්ලක් ටොම් ගේ මුවින් පහළ විය. එයින් ඔහුගේ දළ රළු ලක්ෂණ ද වෙනස් වී ගියේ ය.

''ඒවා මතක නැති කරන්ට මාත් සතුටු යි'' හේ මඳක් චකිත ස්වරයකින් කී ය. ''ඇල්බට්රොස් සමාගම සමග කිසි ම ගනුදෙනුවක් කිරීමට මේ හවස ඔබ පමාවුණා වැඩි යි. වෙන කරන්ට දෙයක් නැත්නම් නරක ද මාත් එක්ක කෑමට යන්න. සෑහෙන තරම් හොඳ අවන් හලක් මේ කිට්ටුව තියෙනවා.''

සාමාන්‍ය උසට වඩා මනා සේ වැඩුණු සිරුරු ඇති මේ දෙදෙනාගෙන් කෙනෙක් හැඩි දැඩි ය. කල්පනාකාරී ගමන් ඇත්තෙකි. අනෙක් තැනැත්තේ මෘදුය, කඩිසර ය. දෙදෙන ම ''කිංස්හෙඩ'' අවන්හලට පිවිස ඔවුන්ට කතාබස් කරගතහැකි සේ හුදෙකලා ව පිහිටි මේසයක් කරා ගියහ.

ටොම් සිය මස්සිනා දෙස පරීක්ෂාකාරී ව බැලී ය. හියු, අවුරුදු දෙකකින් වැඩිමල් වූවත්, ඔහුගේ සිහින් සිරුරත් බිය සැක නො දනවන හිසත් මුව ශෝභාවත් කරණ කොට ගෙන දෙදෙනා අතර බාලයා ලෙස පෙනුණි. සිය මස්සිනා ගේ නුපුරුදු ඇතුල් කොට කබාය දෙස නෙත් යොමු කළ ටොම්

කල්පනා කළේ මොහු කදිම චරිත ලක්ෂණයෙන් හෙබී සිටින බව යි. හියු ගේ රත් පැහැති කොපුල් තල නිසා ඒ කාමරයේ සිටි අන් හැම දෙනා ගේ දර්ශනය මලානික පෙනුමක් ගත්තේ ය.

මෙ අතර හියු ද ටොම් ගැන සැලකිලි සහිත ව බැලුවේ තරමක හාස්‍යයකිනි.

‘‘තාම පරණ ටොම්මයි, ආ? නුමුත් මට පේන්නේ අසුපිට යන විට ඔබ අඳින ඇඳුම් මීට වඩා කැපෙනවා කියායි.’’

ටොම් නෙවිල් ගේ මුව දැඩි විය. ‘‘මගේ පියා ගේ මරණින් පසු බරන්වුඩ මන්දිරය විකුණන්ට සිද්ද වුණා,’’යි හේ හෙමිහිට කීය.

‘‘ඒ වෙලාවේ දී නගරයේ රක්ෂාවක් හැර වෙන යමක් ගැන සිතන්ට ඉඩ තිබුණේ නෑ. ඉතින් එය බාරගන්ට මා ඉතා සතුටු වුණා.’’

හියු සිය මස්සිනා ගේ එඩිතර බැල්ම මග හැරියේ ය. ‘‘නෑ, මම හිතන්නේ නෑ, නාකි මනුස්සයා ගැන මම බොහොම කනගාටු වුණා.’’

‘‘දෙස්තර කිව්වේ-ඒක තිගැස්සීමක් කියලයි,’’ ටොම් හෙමිහිට පැවසී ය.

හියු ගැරුප්පුව සමග සෙල්ලම් කරන්ට විය. හදිසියේ ම එය ඔහුගේ අතින් ගිලිහී මේසයෙන් එපිටට වැටුණි. ටොම් එය ගෙන සිතුවිලි බරින් ම ආපසු දුනි.

‘‘ඔබ නිතර ම හිතුවක්කාරයෙක් වෙලා හිටියා, හියු.’’ යළිත් වරක් ඔහුගේ මද සිනහවෙන් මුහුණේ පැවති බැරෑරුම් බව මහහැරුණි. ‘‘එන්න මට කියන්න, මොකද ඔයතරම් තඹ පාට වෙන්ට හේතුව. ඇත්තට ම මට පේන හැටියට ඔබට හොඳට සාර හැඩ යි.’’ හියුගේ කරවට ඇති පට ලේන්සුවේ දවටුණු අගනා මුතු ඇටය ඔහුගේ නෙතට ලක් විය.

එකෙණෙහි ඇති වූ අපහසුව අමතක වී හියු මේසය හරහා නැවුණි. තඹ වන් මුහුණ දීප්තිමත් විය. ‘‘මම ඉඩම් හිමියෙක්, ටොම්. මීනිසා නුදුටු වීරු තරම් පියකරු ඉඩම් අක්කර අටසියයක්; කෝපි! මුදල් පිරි ඉතිරී යනු ලංකාවත් එහි කෝපි ගැනත් කියන්නේ කුමට ද? හුස්ම හිරකරන මීදුමක පැටලීමක් එහි නෑ. හිරු එළිය මුළුද ම බබළනවා. අන්න එහෙම රටකටයි මම තව දවසකින් හෝ දෙකකින් ආපසු යන්නේ.’’

‘‘ලංකාව’’ යි ටොම් විස්මයාකුල ව කී ය.

මෙ අලුත් විජිතය ගැන හියු කථා කරන විට ඔහුගේ නෙත් හමුවේ අනාවරණය වූයේ අමුතු සුන්දර ලෝකයකි.

කැලිෆෝනියාවේ හා අවුස්ත්‍රේලියාවේ රත්රන්වලට පැවැති පොරය තරම් බලවත් උද්‍යෝගයකින් 1840 ගණන්වල දී ඉඩම් හිමිකරගන්ට යෑම, එහිදී උපයා ගත්තා වූ ද නැතිකළා වූ ද විශාල ධන සම්භාර, කෙළවරක් නැති මුව දඩයම්, දිවයිනේ අමන්දනන්ද දර්ශනය, පහසු පියකරු ජීවිතය, යන මේ සියල්ල ම ඔහුට දැනගන්නට ලැබුණි. "මහත්මයකුගේ ජීවිතය ටොම්."

ගම්බද රදළ කෙනකු ගේ පුත්‍රයකු ව උපන් ටොම් නෙවිල් නිසර්ගයෙන් ම ජනාකීර්ණ නගර හෙළා දුටුවේ පිටිසරට දැඩි ඇල්මක් දක්වී ය. මේ අවස්ථාවේ දී ඔහුගේ සිත ප්‍රබල වේගයකින් ඇළලී ගියේ ය.

"ඉඩම් මිල ක්‍රමයෙන් නගින නමුත් මේ දවස්වල ඉඩම ලාබයි" හියු ඔහුට කී ය. "කම්කරුවන් ගේ වැටුප් අඩුකම නිසාත්, පහත් ජීවන වියදම නිසාත් ධනය රැස් කරන්ට පුළුවන. මා කියන්නේ මේක පරාදීසයක් මෙයින් නිදහස් වී ඒ රටට යෑමට තීරණය කළ දවස ගැන මා කවදවත සංතාප වුණේ නෑ."

"ඔබ වාසනාවන්ත යි" යනු පැවසූ ටොම් ගේ සිතුවිලි ඔහුගේ කාර්යාලය දෙසට යොමු වූයේ මඳ පිළිකුලක් සහිත ව ය.

හියු මේසය හරහා නැඹුරු විය. ඔහුගේ ගන නිල් නෙත් පැහැය – ළමා කාලයේ පැවැති ඒ නයනෝද්දීප්තිය–ටොම් ගේ සිතට නැඟී ය. "ටොම්, ඇයි ඔබ ලංකාවට නො යන්නේ? ඔබට සුදුසු ඒ අන්දමේ ජීවිතයක්." හේ මිට මොලවා මේසයට පහරක් දුනි. "මම දන්නවා ඔබට හොඳ ම තැන! මගේ ඉඩමට අල්ලපු එක. මම පිටත් වෙන්ට ඉස්සෙල්ලා ඒක කුණු කොල්ලෙට ගත්තා. නුමුත් මා ගත්ත ගාණට ම ඔබට ඒක දෙන්නම්. වැඩ කරන්ට පුළුවන් තරමට මට තියෙනවා. කොහොම ද මගේ යෝජනාව?"

ටොම් ගේ උගුර වියළුණි. "කීය ද?"

"හොඳයි, අපි කියමු පවුම් දෙදහ යි. ඒ, සියලු ම ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණත් ඇතුළු ව යි. ඒ ගාණට වෙන කිසි කෙනකුට මම දෙන්නේ නෑ"යි හියු කී ය.

දුඹුරු පැහැයෙන් වැසී ගිය ලන්ඩනයේ මිහිදුම් පටලය දෙස ටොම් කවුළුවෙන් බැලී ය. "අක්කර කීය ද?"

"අක්කර පන්සියයකටත් හයසියයකටත් අතර ගණනක්. සැන්දෑ කාලයේ නැග එන මුදු සිනිඳු පිනි ඇති මෙතැන උස මූදු මට්ටමේ සිට අඩි තුන්දහසකි. වත්තෙහි ම ගලා බස්නා දිය ඇල්ලෙන් ද ඉරු එළියෙන් හා ගන නිල් කඳු පෙළින් ද එය ශෝභමාන ය."

ටොම් වසඟ වීය. තම මස්සිනා දෙස නෙත'ගින් බැලූ හේ වත්ත විකුණුණා හා සමාන බැව් එකෙණෙහි ම දැන් ගති.

පසු ව එන සිය මස්සිනාට සියල්ල සූදනම් කර තබන බවට පොරොන්දු වී දවස් තුනකට පසු හියු නෙවිල් ලංකාව බලා යාත්‍රාරම්භ කළේ ය. ටොම් ''ලන්තානා වත්ත'' යනුවෙන් ලංකාවේ ප්‍රකට, එහෙත් තමා නො දන්නා, අක්කර සිය ගණනක ඔප්පු තිරප්පු පෙරළමින් සිටියේ ය.

2

ටොම් එංගලන්තයේ සිටි අවසාන සති කීපය ගම්බද නිවසක ගත කෙළේ ය. එහි දී ලංකාව බලා පිටත්වීමට ටික දිනකට පෙර ඔහුට සේරා මුණ ගැසුණා ය. ඇ දුටු විගස ඔහුගේ සිත පෙම් පසින් බැඳිණි. මේ දෙදෙනා එකට දඩයමේ ගියහ. එකට ආලිංගන නැටුමෙහි යෙදුණෝ ය. වනයේ සංචාරය කරන මොවුන්ට අවට සියලු දේ ගැන මනා දැනුමක් ලැබුණු අතර එකිනෙකා ගැන කිසි ම අවබෝධයක් ඇති නො වී ය.

ශාරීරික වශයෙන් සාමාන්‍ය රුප ශෝභාවක් මිස එතරම අගනා රූ සපුවක් නැති, මවුපිය සතු ධනයක් උරුම ව නැති, බාලකාලයේ දී මවු පියන් ගේ වියෝගයෙන් අනාථ වූ, සිහින් සිරුරු ඇති, මේ එකුන් විසි හැවිරිදි තරුණිය කෙරෙහි ටොම් ගේ සිතෙහි නිම් හිම් නැති ප්‍රේමයක් ජනිතවීම, වනිතාවන් ගැන කුලැටි ව සිටි ටොම්ට අපූර්ව ජනක අත් දැකීමක් විය.

ඔහුට මෙතෙක් කල් හමු වූ ඉතා ම පුදුම තැනැත්තිය ඕ තොමෝ වූවා ය. ගමනක යෙදෙමින් සැතැප්මක් පසු කළ හැටියේ ම විඩාවී යයි නො කියමින් තොර තෝංචියක් නැති ව නිෂ්ඵල දේ නො දොඩමින් ගමනේ විනෝදය භුක්ති විඳින්ට පුළුවන් වූ ද පක්ෂීන් හා රුරා බසින ඇළ දොළවලින් ආස්වාදයක් ලැබිය හැකි වූ ද එක ම කාන්තාව ඕ වූවා ය. තොල් අසල වළ ගැසීමේ විශේෂ ලක්ෂණයෙන් හෙබි ඇගේ ශරීරයේ වාම් ස්වභාවයත් කාන්තිමත් නිල් නෙත් සහලින් හෙළන එඩිතර බැල්මත් ඔහුගේ සිත් ඇද ගති.

එකාන්ත අධිෂ්ඨානයකින් යුක්ත ව ටොම් ඇට ආලය කරන්නට විය. ඇ හමු වී සතියකින් පසු ව ඔහු සමග විවාහ වන ලෙස යෝජනා කරන ලද්දේ වුව ද ඇගෙන් ලැබෙන පිළිතුර මෙය ම යයි ඇසූ ටොම්ට පුදුම නො වී සිටිනු නො හැකි විය. වාම් ගති ඇති මොහු වැන්නකු සමග සේරා පෙමින් බැඳීම ඔහුට විශ්වාස කළ නො හැකි තරම් වූයේ ය.

ඇට දිය හැකි කුමක්දැයි ටොම්ට මතක් වූයේ ඇ විසින් ඔහු පිළිගනු ලැබූ ඒ ප්‍රීතියෙන් ඉල්පී ගිය මොහොතේ දී ය. ඇ හා සමග පෙම්බස් තෙපලන කාලයේ දී කෝපි වත්තක් පවතින වගවත් මොහුට අමතක වී තිබුණි.

ටොම් ඇ දෙස හෙලුවේ නො ඉවසිලි බැල්මකි. ලන්තානා වත්තේ දිය ඇල්ලත් ඒ අවට කඳු පෙළේ ශොභමාන දර්ශනයත් වර්ණනා කරන අතර අනාගතය ගැන සිත යොමු කළ ටොම් යම් යම් දුෂ්කරතා විඳ දරා ගන්ටත් කරුණු සැලසෙන බව ඇට දැන්නුවේ ය. කැලේ කපා එළි පහළි කොට වත්තක් වගා කිරීමේ දී සේරාට මුහුණ පාන්ට සිදු විය හැකි කම්කටුළු හා අගහිඟ කම්වල ජවනිකාවක් මොහු ගේ සිතේ ඇඳී ගියෙන් හෙතෙම ඒ සියලු තතු අල්ප මාත්‍රයකුදු නො සඟවා සිය පෙම්වතියට අවංකව ම විදහා පැවේ ය.

‘‘සේරා, ඔබ කියනවා නම් මේ වත්ත මම අත් අරින්නම්.’’

ඕ තොමෝ ඔහුට දැත දිගු කළා ය. ‘‘එහෙම ඕනැ නැ ටොම්. අපි එකට සිටිමු. එච්චර නොවැ ඕනැ කරන්නෙ.’’

ඔහුගේ නෙත් යුවළේ විස්මයාකුල භාවය ඇට දැනුණි.

‘‘එංගලන්තය අත්හැර යන්ට ඔබේ අමනාපයක් නැ? සමහරවිට එය අවුරුදු බොහෝ ගණනකට වෙන්ට පුළුවන්.’’

‘‘මට මේ රටේ වැඩි සම්බන්ධයක් නැ, මා රැක බලාගත් කෝඩිනර් පවුල හැර.’’

‘‘ඉතින් සේරා ඔබ, බයත් නැ.’’

ඕ වික්ෂිප්ත ව ඔහු දෙස බැලුවා ය. ‘‘ඇයි මා බය වෙන්නේ. මට තියෙන එක ම බය ඔබේ මස්සිනා මෙච්චර වර්ණනා කළ රන්දිව ගැන ඔබ කළකිරේ ය කියා යි. ඇගේ ස්වරය වෙනස් විය. ‘‘වෙළඳ ගනු දෙනු ගැන ස්ත්‍රියක් කතා නො කළයුතු බව මා දන්නවා. නුමුත් ඉඩම නො දැක එය මිලයට ගැනීමෙන් ඔබ කළේ පොඩි මෝඩකමක් යයි ඔබට හිතෙන්නේ නැද්ද?’’

හේ මෙසේ කී ය. ‘‘සේරා, සමහරවිට යම් යම් දේ ගැනත් මිනිසුන් ගැනත් විශ්වාසයක් තියන්ට වෙනවා. එවේලේ ම මා තීරණය කළේ නැත්නම් මට ඒ ප්‍රස්තාව නැතුව යනවා. තමාගේ ප්‍රයෝජනයට ගත් මේ ඉඩම මට දීමෙන් හියු මට කර තියෙන්නේ උපකාරයකි.’’

දුර නැකමකින් මස්සිනා වන, අලංකාරයෙන් ඇළලී ගිය අබිරහසක් වැනි, හියු ගැන ඔහු ඇට කිව්වේ ඉතා ස්වල්පයකි. එහෙත් පැකුළුණු ස්වරයකින් ඇ ‘‘ටොම්—’’

හේ මඳ සිනහ පැ ය. ‘‘වත්තක ජීවත් වීමට ඔබේ අමනාපයක් නැත්නම් එච්චරයි ඕනැ. අපේ අභිනව ජීවිතය සාර්ථක කර ගනිමු. කාට ද කියන්න පුළුවන්, තව අවුරුදු ටිකකින් ආයිත් එංගලන්තෙට එන්ට තරම් අපට මුදල් සම්බකරන්ට පුළුවන් වෙන්ට බැරියැ?’’

ප්‍රීතිමත් වූ විට දක්නා පරිදි නැහැය කරකවමින් ඕ සිනාසුණා ය. ''හා! ටොම්, අලුත් විපිතයක් ගොඩ නැංවීමට උදවු දෙනවිට මේ මොනව ද හිතන්නෙ? තව අවුරුදු බොහෝ ගණනාකට අපේ ගමරට ඒකයි. ඒක අපි හොඳ එකක් කර ගනිමු. ඇත්තෙන් ම පෙළීවන, වාසි පැත්ත ගැන විතරක් කල්පනා කරමින් අපි එහි නො යමු.''

''ඔබ ලැබීම මට කොච්චර වාසනාවක් ද?'' යි හේ කොඳුළේ ය.

ගන වනින් හා නො හඳුනන දූයින් පිරි ඒ ඈත පිහිටි දිවයින සිතට නැග එන් ම, ඔහු හා අතිනත ගත් ඇගේ සිත ප්‍රීතියෙන් උදම් වී ගියේ ය.

3

නැවේ ගරාදි සේරා ගේ අතේ පහස ලැබ රත් වී තුබුණි. නැව් තට්ටුවේ ලෑලි අතර කොහු නිසා එහි මැලියම් බැඳුණක් බඳු විය. මුලින් ම ලංකාවේ දර්ශනය ලබා ගැනීමට නැව් තට්ටුවේ රැස්කමින් සිටි ඩහදිය වැකුණු පුරුෂයන් විසිදෙනා හා හදෙනෙක් පමණ වූ ස්ත්‍රීන් අතර මුදු සිනිඳු ඉන්දියා මුස්ලින් පිළියෙන් මැහූ ගවුමක් ඇඳ සිටි සේරා ශාන්ත පෙනුමකින් හා නවප්‍රබොධයකින් යුක්ත වූවා ය.

මේ දිග ගමන කෙළවර වීමට ළංවීම ගැන ටොම් ප්‍රීතියෙන් සිටියේ ය. ටොන් 500 ක් බර ඇති ''මේෂ'' නමැති මේ රුවල් නැවේ සිටි අනෙක් මගීහු ද ඔවුන් මෙන් ම මෙ රටට එන අමුත්තෝ වූහ. සාමාන්‍යයෙන් පියකරු පිරිසක් වුව ද, ඉඳහිට මේ පිරිස කන්දෙස් කිරියාවක් වූ අවස්ථා ද නැත්තේ නො වී ය.

මොවුන්ගේ ප්‍රධාන සාකච්ඡාව වූයේ කෝපි ය. කෝපි දුටුවෝ ඉතා ස්වල්ප දෙනෙකි. ටොම් මහත් නො ඉවසිල්ලකින් පුල පුලා සිටියේ අලසකම් දුරලා, ඒ වැවිල්ලෙහි නිරත වීමට ය.

මේ යාත්‍රා ගමනට ගතවූ කාලය නිරර්ථක නුවූයේ ය. මූදේ ගතකළ ඒ මාස කීපය තුළ දී මනා සේ වැඩුණු සිරුරක් ඇති, මධ්‍යම වයස්හි වූ ස්කොට් ජාතික ඇන්ගස් මැක්ලොයිඩ් නැමැත්තකු ගෙන් ටොම්ට සිංහල හා දෙමළ ටිකක් ඉගෙන ගත හැකි විය. එපමණක් නො ව කෝපි වැවිල්ල ගැන අත්දුටු විශිෂ්ට උපදෙශ වගයකුත් ලැබුණි. මැක්ලොයිඩ් කතා කළේ ලංකාවේ දී ලැබූ දැනීමෙන් පමණක් නො ව, ලංකාවේ මෙන් ආවට ගියාට නො වවන, ඉතා දියුණු වැවිලි ක්‍රම ඇති ජැමෙයිකාවෙන් ලත් අත්දැකීම් ද අනුව ය.

ඔහු ටොම්ට කී දේ බොහොමයක් අමුතු වටිනා දේ විය. වැවීම එතරම් අමාරු දෙයක් නො වන හැටියටයි ටොම් තම මස්සිනා ගෙන් දැන ගත්තේ. හියු නෙවිල් කියූ හැටියට එය අලුත් කැලෑ බිමක පැළ සිටුවා ඒවා වැඩෙනතුරු බලා සිටිනු පමණකි. මේ ගැන ටොම් සඳහන් කළ විට ඇන්ගස් මැක්ලොයිඩ් මඳක් අවඥ සහිත සිනහවක් පහළ කෙළේ ය.

''බොහො ම දෙනා හිතන්නේ එහෙම තමයි, ළමයා'' යි හේ හිස සැලී ය. ''කැලේ ගිනිතියා යන්තම් පේළි සාද වළවල් හාරා ඒවායේ පැළ සිටුවා හොඳ ම ප්‍රතිඵල බලා සිටීම යි. නුමුත් ඊට වඩා දේ කරන්ට තියෙන බව සිහි තබා ගන්න. මේ ගැන දවසක ගණන් දෙන්ට වෙනවා. පොළොවෙන් යමක් ලබා ගත්තොත් කවර ක්‍රමයකින් හෝ එය ආපසු දෙන්ට වෙනවා.''

ඔහුගේ මවු, ධෛර්‍ය සම්පන්න ප්‍රියංකර මහලු කාන්තාවක් වූවා, ඇගේ මේ ආදරනීය පුතණුවන්ට සැලකුවේ වගකීම් විරහිත පාසැල් ශිෂ්‍යයකුට මෙනි. ඕ සේරා කෙරෙහි මහත් ළැදියාවක් දක්වූවා ය. එමෙන් ම ඇට අනෙක විධ කරුණාවෙන් සැලකුවා ය. ටොම් සමග ගරාදි වැට ළඟ සිටගත් මැක්ලොයිඩ් නෝනා ඇඳ සිටි දුඹුරු පැහැති ක්‍රිනෝලීනයත්, හිස ලා සිටි තොප්පියත් නිසා ඇගේ රුව කදිමට කැපී පෙනුණි. ඕ සේරාට හිස සලා මෙසේ කීවා ය. ''ඔබට ලැබී ඇත්තේ අලංකාර සුරු බුහුටි භාර්‍යාවක්, ටොම්. ඈ දුබල සේ පෙනෙතත් හැඩි දැඩි ගතියකින් යුක්ත ය. මූද එතරම් සැඩ ව තිබිය දී අනික් ස්ත්‍රීන්ට ඈ උදව් දුන් අන්දම මට කවදවත් අමතක නො වේ. ඈ ඉතා වෙහෙසට පත්වී සුදුමැලි ව ගියත්, දුව ගෙන එන්නේ සිනා මුසු මුහුණකිනි.'' උද්වෙගය නිසා දීප්තිමත් වූ නෙත් ඇතිව ගරාදිය කරා ඈ නැවතත් දුව එනු ඕ දුටුවා ය. ''ඔබ මොකුත් හරි දැක්කා ද, ළමයා?''

''හා, ඔව්! ක්ෂිතිජයේ දුඹුරු හැඩක් අන්න පේනවා.''

''හා, එතන තමයි, දෙවියන්ට ස්තුති වේවා'' යි ඇන්ගස් උද්‍යොගවත් ව කී ය. ''බැටළුවන් හවරවුණ ද පටන් කාපු ලුණු මසු යි පරණ විස්කෝතු යි මට දැන් ඇති වෙලා.''

''ඇන්ගස් ඔහුගේ කැම ගැන මීසක් වෙන කල්පනා කරන දෙයක් නැ''යි මැක්ලොයිඩ් නෝනා පැවසුවා ය. මවු හා පුතා අතර පෙම්බර බැල්මක් හුවමාරු විය. වේගවත් ලෙස පවන් සලමින් ඕ තොමෝ නැවතත් ''කොහොම වුණත් ආයිත් අපේ කදු මුදුනට පැමිණෙන්ට මා පුල පුලා සිටින බව නම් නො කියා ම බැහැ'' කීවා ය.

'මාත් එහෙමයි. වැඩක් කරන්නට යළිත් පටන්ගන්න.''

ඇන්ගස් තමාගේ බකල කකුල් සහිත තරබාරු සිරුර හරවමින් ''ටොම් ඔබෙන් මා ප්‍රශ්නයක් අසන්ට හිටියා'' යි හෙමිහිට කී ය.

''කවදවත් ඇසින් නුදුටු වත්තක් ගන්ට ඔබට හිතුණේ මන්ද?''

සේරා ගේ තියුණු කනට මේ ප්‍රශ්නය වැටුණි. ''ඔබ රැවටෙන්ට එපා, ඇන්ගස්. බාහිර පෙනීමෙන් ඔහු ක්‍රියා පරවශ කෙනකු වුවත් ටොම් ගේ හද පත්ලෙහි අලංකාර රසය ගැප් වී ඇත. ඔහුගේ මස්සිනා කඳු පෙළවල් හා දිය ඇල්ල මතක් කළ පමණින් ඔහු වසඟ වුණා. මේ ස්ථානය ටොම් මට ද මුලින් ම විස්තර කලේ ඒවා ගැන සඳහන් කිරීමෙන්!''යි සේරා කීවා ය.

ටොම් කෙරෙහි පහළ වූ සිනහව අඩුවී ගිය පසු, හේ ශාන්ත ව මෙසේ කී ය. ''ඒ කාලයේ මගේ මස්සිනා වහා ම එංගලන්තෙන් පිටත් වීමට සිටි බැවින් ඔහුට මගේ තීරණය දැනගන්ට ඕනෑ වුණා. ලන්තානා වත්ත ගැන ඇසූ පමණින් එය මට දෙව් ලොවක් සේ වැටහුණා. එද මට පෙනුණේත් මට තවමත් පෙනෙන්නේත් එහෙ ම මයි. එය කුමක් වුවත් මා ගතකරමින් සිටි නගරබද ජීවිතයට වඩා මේ වතු ජීවිතය හොඳ බව යි.''

ඇන්ගස් ඔහු දෙස වහා ම බලා ''ඒ ගැන ඔබ කල්පනා කරන්නේ එසේ නම්, ටොම්– මා නිකම් හිතුවා.''

''ඔබ කවදවත් ලන්තානාවට ගිහිල්ලා නෑ. ඔබ මට කීවේ..............''

''නෑ, ළමයා, මම කවදවත් ලන්තානාවට ගිහිල්ලා නෑ. ඔබේ මස්සිනා සිටින තැනත් මා ඉන්නා තැනත් අතර දුර හැතැප්ම විසිපහක් තරම් වත් නැති නමුත් ඔබේ මස්සිනා ගැන මා දන්නේ ඇයි හොඳයි කියන පමණට යි.''

''මට මේතාක් සම්බවුණු කිසිවෙක් ඒ ස්ථානය ගැන දන්නා හැඩක් පේන්නේ නෑ''යි ටොම් හෙමිහිට කී ය.

මේ දෙදෙනා ගේ කථාව වෙන දේවල්වලට හැරුණු විට මෙතෙක් සාවධාන ව අසා සිටි මැක්ලොයිඩ් නෝනා සේරා ගේ අතින් ඇල්ලුවා ය.

''ඔබේ මස්සිනා හියු නෙවිල් ඇත්ත වශයෙන් ම ගාලු වරායට ඔබ හමු වෙන්ට එනවා නේද?''යි ඕ ඇසුවා ය.

''ටොම් ඔහු බලාපොරොත්තු වෙනවා''යි සේරා පැකුළුණු හඬකින් කීවා ය. ''ටොම් ගැන සලකා ඔහු එනවා ඇතැයි මාත් හිතනවා.''

හියු ටොම් ගේ නෑයකු බව දැන සිටි මැක්ලොයිඩ් නෝනා ඔහු ගැන විශේෂයෙන් ම නිශ්ශබ්ද වූයේ, මෙවර ද නිහඬ වූවා ය. මහලු කාන්තාව ගේ මුහුණ දෙස බැලූ සේරා ගේ සිතේ සැකයක් පහළ වූ පළමු වෙනි වතාව මෙය නො වේ.

එද රෑ අහස පුන් සඳින් වියෝ වූ නමුත් බබළන තුරු පෙළින් පැහැදිලි විය. දවල් කාලයේ ඇති වූ මැලිකම දුරලන තරමට මඳ සුළඟක් ද හැමී ය.



"දැන් නැව ළඟාවන්නේ ගල්පරවලින් අනතුරු සහිත වරායකටය—ගාලු වරායටය."

සේරා නිදි වරමින් සිය කාමරයේ නිසොල්මන් ව සිටියේ ටොම්ට හිරිහැර නො වන අන්දලිනි.

''සේරා''

''ඔබට නින්ද යන්නේ නැද් ද, ටොම් ?''

''මේ අප්‍රකට දෙශයකට ඔබ ගෙනයැම සාධාරණ ද කියායි මා කල්පනා කරන්නේ.''

ඕ වැලමිට ගසා හැරුණා ය. ''සාධාරණ ද? ඇයි? ඒ අක්කර දහස් ගණනක කැලෑ එළිකිරීම ගැන කල්පනා කරන විට කොතරම් විස්මය ජනක ද! වනාන්තරය ඔස්සේ අලුත් මංමාවත් පමණක් නො ව දුම්රිය මාර්ග ද වැටෙනු නියත යි. මේ සියල්ල ම අලුත් --ප්‍රබෝධ ජනක—''

''ඔබ බය නෑ''යි හේ දෙවනුවත්, අවසාන වරටත් ඇසී ය.

''මා ආඩම්බර වෙන්නේ මේ ව්‍යාපාරයේ පුරෝගාමිකයන් අතරට අපත් වැටීම ගැන යි.''

4

හිරු උදවීමත් සමග ඈත ක්ෂිතිජයෙහි ගොඩබිම පැහැදිලිව ම පෙනිණි. රන්වන් වෙරළේ හැපුණු දිය රැලි සමග දිය කඩනයන්හි ශබදය ද නැංගේ ය. පොල්වතු සමූහයට ඔබ්බෙන් ගන නිල් කඳු වැටියකි. මේ කඳු වැටිය මැදින් අනික් හැම කන්දකට ම වඩා උස් ව පෙනුණේ ශ්‍රී පාද කන්දයි. අවුරුදු දෙදහසකට අධික කාලයක් මුළුල්ලේ ලංකාවාසීන් ගේ භක්ත්‍යාදරයට ලක් වූ මෙය සිද්ධස්ථානයකැ යි මැක්ලොයිඩ් නෝනා නෙවිල්ලාට හඳුන්වා දුන්නා ය. නෙවිල්ලා ගේ අනාගතය රඳා පැවතුණේ මේ කඳු අතර ය.

දූන් නැව ළඟා වන්නේ ගල්පරවලින් අනතුරු සහිත වරායකට ය– ගාලු වරායට ය. නියමු ඔරුව සඳහා ''මේෂ'' නැවෙන් තැබූ වෙඩිල්ලට පිළිතුරු වශයෙන් වෙරළ දෙසින් ද වෙඩි හඬක් ඇසුණි. ටික වේලාවකින් කුඩා නියමු ඔරුවක් වරායේ සිට ආවේ ය. සුදු පාටැති කලිසම් හා තද ව බොත්තම් පිය වූ නිල් ජකට්ටුවක් ඇඳ පළල් ඉදිකොළ තොප්පියක් හිසලා සිටි, කළුවන් සිරුරක් ඇති, නියමුවා රැන් පිණි දිගේ නැවට නැඟ සුක්කානම ගත්තේ ය.

නැව නැංගුරම් ලන විට මධ්‍යාහ්නයට ළඟා විය. සිංහල මිනිසුන් පදවන කසාවන් රුවල් යෙදූ කට්ටමරම්, අඟුල් ආදී යාත්‍රා කීපයක් ඒ මේ අත වැනෙමින් නැව වටකර ගත්තේ ය.

පැය කිපයකට පසු සේරා හෝටලයේ නිදන කාමරයේ තනි ව සිටියා ය. ටොම් ඇ මෙහි නවතා වෙන වැඩක යෙදුණේ ය. දූලි වැකුණු දොර රෙදි හිරු එළිය වැළකී ය. කාමරේ බඩුවලට තිබුණේ ලණු පැදුරකුත්, පුටු දෙකකුත්, මේසයකුත්, වියනක් ඇති මැද හරියේ මුස්ලින් රෙද්දක් දැමූ ඇඳකුත් ය. ලණු පැදුර හරහා දුඹුරු පැහැති ගෝනුස්සකු දුවනවා දුටු ඕ බියෙන් පස්සට පැන්නා ය. ටොම් නා වේ මන්ද? උෂ්ණයත් කාමරේ පුස්ගඳ මුසු වූ හුමාලයත් කරණ කොට ගෙන ඕ හිස රුදවෙන් පෙළුණා ය. කරකැවිල්ලෙන් පෙළෙන්නට වූ ඕ කවුළුව වෙත ගොස් එහි පියන් හැර දැම්මා ය.

සැන්දෑවේ හමන මඳ සුළඟ ඇගේ උණුසුම් මුහුණට වදිත් ම හිස රුජාව ද අඩු විය. නිකමට අත නබා ගත් ඕ පහත දර්ශනයෙන් වශීකෘත වූවා ය. ඒ අවට පිහිටි විශාල කොටු පවුර අපර දිග හැඩයක් ගෙන හැර පෑමෙන්, ඇ විදේශයක සිටින බව නො දැනුණි. නොයෙක් වර්ගවල ජනයාගෙන් ආකීර්ණ වූ වීථිය කහ මලින් හා රත් මලින් බබළන ගස්වලින් අලංකෘත වූයේ ය. කවුදෝ ඇට නැවේ දී විස්තර කළ පරිදි අවුරුදු සිය ගණනකටත් වැඩි කාලයකට පෙර ලන්දේසින් සෙවණ පිණිස වැවූ, දැන් බරිතාන්‍යයනට එපා වී කපා දමන සූරිය ගස්, මේවා වෙන්ට ඇතැයි ඇට සිතුණි. එය කනගාටුවට කරුණකැයි සේරා කල්පනා කළා ය. ඔවුන්ගේ ගේ අවට නොයෙක් ගස් තිබීම ගැන ඕ කැමති ය. සමහර විට මේවා සූරිය ගස් හෝ පක්ෂීන් ආකර්ෂණය වන මල් පල බරින් නැමුණු ගස් ය.

ඇ පිටිපසින් දොරක් විවෘත වූයෙන් ටොම්ට ආචාර කිරීමට ඕ වහා දුව ගියා ය.

‘‘ටොම්! මොකද වුණේ?’’

ඇ දෙසට හැරුණු ඔහු ගේ මුහුණ දුඹුරු පැහැ වී වෙහෙසුණු බවක් දක් වී.

‘‘අන්තිමේ දී හියුට එන්ට බැරිවුණා’’යි හේ දුක් බර ව කීය. අරලියවත්ත, නාවලපිටිය යන ලිපිනය හා 1860 පෙබරවාරි දිනයකුත් දරන, එඩිතර හ විසිතුරු කළුවන් අකුරින් ලියැවුණු ලියුමක් හේ අතින් දැරී ය.

හියු නෙවිල් මෙසේ ලියා තිබුණි.

ආදරණීය ටොම්,

ඔබ සහ ඔබ මනාලියත් ලංකාවට එනවිට පිළිගන්ට ෂතු වෙනුවට මෙසේ ලියුමක් මගින් ආචාර දක්වන්ට සිදුවීම තරම් මගේ සිත පහරන වෙන දෙයක් නැත. නමුත් මගේ වැවිලි ද්‍රව්‍ය නරක් වෙන්ට පෙර කොළඹට පටවා එවීම පිණිස වැඩ රාශියක් මා පිට පැවරී තිබේ. ඒ මදිවාට නරක පාරවල් හා රථ වාහන නො සෑහීමත් නිසා මෙය අවුලෙන් අවුලකි.

ඔබට නම් හිරිහැරවීමට එතරම් දෙයක් නැත. ලන්තානාව භාර ඕවර්සියර් ගොන්සාලේස්, ඔබ වෙනුවෙන් කළ යුතු සියල්ල ම කර ඇත. ළඟදී ගත් ඔබේ අස්වැන්නත් ඔබේ කොළඹ ඒජන්තවරුන්ට යවන ලදුව දැන් මහ ඇතැයි සිතමි. ඒ නිසා මා ප්‍රිය මස්සිනේ, ඔබට ඕනෑ තරම් කාලය යොදා ගන්න. කොළඹ ගමනින් හැකිතරම් ප්‍රයෝජන ගනු මැනවි. මක්නිසාදයත්, මේ 'කැලෑවට' (නො දියුණු පළාත්වලට අප දෙන නාමය එය යි) ඔබ පැමිණි විට විනෝද වීම්වලට ඔබට ඉඩක් නො ලැබෙන බැවිනි. පැරඩේ මහතා හා එම නෝනා මහත්මයා ගේත් ආගන්තුක සත්කාරය විඳින මෙන් මම දන්වනු කැමැත්තෙමි. මා ඔවුන්ට දැනට ම ලියා ඇත. ඒ හැර ඔබ හඳුන්වා දීමේ ලිපියක් ද මේ සමග තිබේ. කොළඹ පිළිකුල් කටයුතු හෝටලයකට වඩා ඔවුන් සමග නැවතීම ඔබට බොහෝ සෙයින් සැපදායක වනු නියත ය. ඇඩ්වින් පැරඩේ ගේ වත්තක් මා බලා කියා ගනිමින් ඔවුන්ට තරමක උපකාරයක් කරන බැවින් ඔබ එහි නවත්වා ගැනීමට සන්තොෂ වනු ඇත.

ඔබ මහනුවරට ඒමට බලාපොරොත්තුවන දවස මට දන්වන්න. එවිට ගොන්සාලේස් සමග එහිදී ඔබ හමුවීමට මම හැකිතරම් වෑයම් කරමි. එය කෙසේ නමුත් කළ නො හැකි ම දෙයක් වුණොත් ඔබ මට ක්ෂමා විය යුතුයි. නුමුත් ලන්තානාවට ඔබ පැමිණිවිට හැකි තරම් ඉක්මනින් මම එහි එමි.

විවාහයෙන් මගේ අභිනව නෑනා වූ තැනැත්තියට මගේ ආදර ගෞරව පිරිනමන්න. ඇත්තටම ශුරය, ඔබේ හැටි මා දන්නවා නම්, ඒකාන්තයෙන් ම, ඕ රූ රැජිනක්!''

පිටු බාගයක් තරම් දිගට පැතුරුණු ඔහුගේ අත්සනින් කිසියම් උඩඟුකමක් පෙනි ගියේ ය.

පසු ව ඇට කනගාටු වීමට ඉඩ ඇති වේගවත් වචන මාලාවක් මුවින් ගිලිහෙන්ට ආ නමුත් සේරා එය උත්සාහයෙන් මැඩ පවත්වාගෙන තොල විකා ගත්තා ය. එහෙත් ඇගේ ඇසිපිය ඉක්මනින් ගැටීම වළකා ගත නො හැකි විය. ටොම් එය දැක ඔහුගේ කෝපය යටපත් කෙළේ ය.

''එය හියු ගේ ස්වභාව යි. එයින් කලබල වෙන්ට එපා, සේරා: ඔහු නැතුවාට අපට මේ වැඩකරගත හැකිවාට සැකයක් නෑ.''

''සමහරවිට ඊට වඩා හොඳට පුළුවන් වේවි''යි ඕ වහා පිළිවදන් දුන්නා ය. ''ඔබේ මේ මස්සිනා දකින්ට යි මගේ ආසාව.''

මැක්ලොයිඩ්ලා සමග රෑ කෑම ගැනීමට ඔවුන් සූදානම් කරගෙන සිටි බව මතක්වෙන්ටත් පෙර රෑ කෑමට සීනුව නාද විය.

මාස ගණනක් මුළුල්ලේ කෑ ලුණු දැමූ හරක්මස් හා එළුමස්වලට පසු ව ලැබුණු මේ අලුත් හරක් මස්වල අගය! වම්බටු, තම්බපු වට්ටක්කා හා පැණි රස අල ජාති, රන්වන් ඉදුණු අඹ, පැපොල් හා මැන්ගුස්තන්, මේවා විදේශීය වූ නමුත් කොතරම් රසවත් එළවළු හා පලතුරුද? ඒ සවස් මානය අනික් අයට කෙසේ වෙතත් සේරාට නුහුරු නුපුරුදු විලාසයක් දැක්වී. ඕ මෙසේ කල්පනා කළා ය. ''රැළි වැටුණු පළල වඩම් පංකාවක් මා හිස මත වැනේ. සුදු රෙදි හැඳ නැමී පනාවලින් ශොභාමත් කළ හිස් ඇති, පාවහන් නො දැමූ, මෙහෙකාරයෝ අතට පයට සිටිති. එවැනි ලංකාවෙහි ය මා දැන් සිටින්නේ. මා දන්නා වෙන කිසි ම තැනකට වඩා මෙය අමුතු යි......සමන් පිච්ච හා තද සුවඳ විහිදෙන වෙනත් මල්වලින් පිරී තිබේ. බදින තෙල්වලත් කුළු බඩුවලත් තද සුවඳ මෙහි තිබේ.''

අන්තිමේ දී පිරිමින්ට වයින් බොන්ටත් ධූම පානය කරන්ටත් ඉඩහැර මැක්ලොයිඩ් නෝනා සේරා ගේ අත අල්වා ගෙන බරාඳයට ගියා ය.

''මේවා ඔක්කොම ඔබට පුදුමයක් වාගේ පේනවා ඇති නේ ද? අවුරුදු හතලිහකට පෙර මනාලියක් වෙලා මා ආ දවස්වල මට සිතුණු දේවල් මට මතක යි.''

මදක් පියවුණු ඇසින් වුවද කල්පනාකාරී මුහුණකින් යුක්ත ව මේ තරුණ කාන්තාව වාඩිවී සිටි වේවැල් පුටුවේ ම දිගා වනු ඕ දුටුවා ය. උකුල මත තබා ගත් මුදු සිනිඳු අතුල්තල හා කුඩා ළමයකු ගේ මෙන් වෙන් වී දිස්වන දෙතොල් ඇති මෝ ඉමහත් තරුණ බවක් දැක්වූවා ය. මැක්ලොයිඩ් නෝනා ඇ දෙස පරීක්ෂාකාරී ව බලන අතර සේරා නෙත් අයා මඳ සිනහවකින් ආචාර කළා ය. එහෙත් ඒ සිනහවේ ගැබ්වී තුබුණු ශාන්ත ශක්තිය ගැන ඇට විස්මය පත් නො වී සිටිනු නො හැකි විය.

''නෑ–මේ කිසිවක් නියම තත්ත්වය ලෙස පේන්නේ නෑ......උෂ්ණ කලාපයට අයත් මේ පළාත්වල ශබ්දවලට මා ඇහුන් කන් දුන්නා. අපේ රටේ කොයි දේකට ත් වඩා ඒවා බොහොම වෙනස් නේ ද?''

මැක්ලොයිඩ් නෝනා ගේ බැල්ම ශාන්ත වූයේ ය. මේ රටට ගැළපෙන හැටියට සේරා හැඩගැසීම ගැන බියවන්ට දෙයක් නැති බව ඕ දැන ගත්තා ය.

''අනිද්ද ඔබ කොළඹ යෑමට අස්ස කෝච්චියෙ නගිනවා නේ ද?''

සේරා හිස නැමුවා ය. අපි වත්තට යන්ට ඉස්සෙල්ලා ටොම්ට අඳුන්වා දීමෙ ලියුම් දෙන්ටත් වෙළඳ ගනුදෙනු වගයක් කරගන්ටත් තියෙනවා. අප එහි ගතකරන දවස්වල ටොම් ගේ මස්සිනා ගේ යහළුවන් සමග එනම්–පැරඩේලා ත් සමග–ඉන්ට සූදානම් කර තියෙනවා.

''පැරඩේලා?'' ඇගේ සිරුර කිළි පොළන්නාක් මෙන් වනු සේරා දුටුවා ය.

''ඔබ ඔවුන් දන්නවා ද?''

''එඩ්වින් පැරඩේ කසාද බඳින්ට ඉස්සෙල්ලා අපට බොහෝවිට හම්බ වුණා. ඔහුට මම නිතර ම ප්‍රිය කළා. පැරඩේ නෝනා නම් මට කවදවත් හම්බවෙලා නෑ.''

ඇගේ විනීත කට එතෙකින් වැසුණි. සිය මිතුරියගෙන් මීට වැඩි යමක් දැන ගන්ට නො ලැබෙන බව සේරා දැන ගත්තා ය.

ඕ සිනාසුණා ය. ''ප්‍රිය මැක්ලොයිඩ් නෝනා, ඔබ ඉතාමත් කුතුහලවෙන්ට පටන්ගත් විගස ම නිතර ම නවතිනවා.''

''හා, එහෙම වෙන්ට ඇති. ඔබටත් මෙරට ඕපාදූප ගැන තරමක පළපුරුද්දක් ලැබුණා ම ඔබත් එහෙම ම කරන්ට ඉගෙන ගනීවි.'' මහලු කාන්තාව ඈ දෙස මඳ සිනහ පෑවා ය. ඔබ අප දකින්ට ආවාම කොළඹ ගැන ඔබේ හැඟීම් මට කියන්ට ඕනෑ. අපේ වැවිල්ල වන ඩන්ඩී තියෙන්නේ සාමාන්‍යයෙන් මහනුවරටත්, ඔබට ඇති ළඟ ම ගම වූ නාවලපිටියටත් අතර මැද හරියේ වාගේ ය. ඒ නිසා එහි නැවතී යෑම පහසු යි.''

කොළඹ–මහනුවර – නාවලපිටිය යන මේ තැන් පමණක් නො ව ඔවුන්ගේ වත්ත වන ලන්තානාව පවා සේරාට තවමත් නාම මාත්‍ර ය. ඇගේ සිතෙහි රැඳී තිබුණේ මේ උෂ්ණ කලාපික රටේ ගත කළ මුල් රාත්‍රියේ සිදුවීම ය. රැහැයියන්ගේ කර්කශ ගීතයත්, බකමූණන් නො නැවතී නගන, ''හූම්, හූම්'' හඬත්, බිත්තියේ බඩගාන හූනන් ගේ සිහින් ''චික්, චික්'' හඬත් ය. දහස් ගණන් කණමැදිරියන් ගේ එළියෙන් ආලෝකවත් වූ සූරිය ගස් හදිසියෙන් දුටු ඇගේ සිත විස්මයෙන් ඇළලී ගියේ ය.

''මෙහි අනික් කෘමීන් හා සතුනුත් මොවුන් තරම් ම ලක්ෂණ නම්, අහිංසක නම්''යි ඕ මිමිනුවා ය.

''අහිංසක සතුන් ඉතා ම අවශ්‍යයන් හැටියට ම පිළිගෙන විසකුරු සතුන්ට උන්ගේ පාඩුවේ ඉන්ට හැරියොත් ඔවුන්ගෙන් නිකරුණේ හිරිහැර වෙන්නේ නෑ.'' මැක්ලොයිඩ් නෝනා සඳ එළියෙන් නැවුණු කොටු පවුරු දෙස බැලුවා ය. ''ජීවිතයටත් එය නො ගැළපෙන නීතියක් නො වෙයි, මගේ මිතුරිය, විශේෂයෙන් ම පස්සේ කී ටික.''

එදා රෑ සේරා තමා රැට අඳින ඇඳුමේ සිටි කුඩා කුරුමිණියකු ගලවා දමන අතර මැක්ලොයිඩ් නෝනා ගේ අවවාදය ඈට සිනහ මුසුව මතක් විය. ටොම් ගේ මුහුණේ සතුට පළවන සිනහ රැල්ලක් නැත. ඒ වෙනුවට ඔහු සිතිවිලි බරින් යෙදී කනස්සල්ලෙන් මෙන් පිළිතුරු දුනි. ''මට කරුණු හොඳින් වැටහෙන අන්දමට අපට මුහුණ පාන්ට තියෙන්නේ හිරිහැර රාශියකට යි.

කෘමි ජාතීන්ගෙන් වන හිරිහැරය එතරම් ගණන් ගත යුත්තක් නො වේ. වත්තක් වැවීමේ දී ඉදිරිපත් විය හැකි කම්කටුළු සියල්ල මැඩගෙන අපේ ව්‍යාපාරය සඵල කර ගැනීමේ දී විඳින්ට සිදුවන හිරිහැරයි මට මතක් වන්නේ.''

5

පසුවද උදෑසන ම මැක්ලොයිඩලා ගියෝ ය. මවත් පුතාත් යන මේ දෙදෙනා ගේ ශාන්ත ස්වභාවයෙත්, ඇසූ විට පමණක් ඔවුන්ගෙන් ලැබෙන නුවණැති අවවාදයෙත් අගය නෙවිල්ලාට අවබෝධ වුණේ ඔවුන් නික්මී ගිය පසුව ය. ලන්තානාහි සිට සැතැප්ම විස්සක් දුරින් පිහිටි මැක්ලොයිඩලා ගේ වැවිල්ල වන ඩන්ඩී වත්තේ නැවතී යාමේ ප්‍රස්තාව දෙස ටොම් හා සේරා ඉතා ප්‍රීතියෙන් බලා සිටියෝ ය. මේ දෙදෙන ම ඔවුන්ගේ අනාගත නිවාසයට පැමිණීමට නො ඉවසිල්ලෙන් උන්හ.

නෙවිල්ල ද ඊට දවස් දෙකකට පසු කොළඹට පිටත් වූවෝ ය. වෙඩිමුර තබන වේලාවේ හෙවත් උදෑසන, අස්ස කෝච්චිය පිටත් වෙන බැවින් මොවුහු හිමිදිරියේ ම නැගිට කලබලෙන් කෝපි ටිකක් බී පිට වූහ. සුදු ඇඳුමෙන් සැරසුණු සේවකයෙක් පෙට්ටි උසුලාගෙන කෝච්චි පළට ආවේ ය.

''කෝච්චිය'' යනුවෙන් ලොකු නමක් වූ නමුත් මෙය, දෙපස කැන්වස් තිර යෙදූ, මගීන් පස්දෙනකුට හෝ හදෙනකුට වාඩි විය හැකි, කබල් වාහනයකි. කාපිරි රියැදුරා ළඟ ද ආසනයක් හෝ දෙකක් විය. කැහැටු අශ්ව නාම්බන් දෙස අනුකම්පා සහගත බැල්මක් හෙළා සේරා රියතුළ වාඩි ගත්තා ය. ටොම්, රියැදුරා ළඟ උඩ අසුනෙහි වාඩි වීම ඇගේ මහත් දෙම්නසට හේතු විය.

එද උදේ ඔවුන් හැර තවත් මගීන් නැති සේ පෙනුණි. බඩු බාහිර තබා බැඳගත් වහා ම රියැදුරාත් අස්ගොව්වෝත් බලා සිටි අයත් ක්‍රියාරම්භ කළහ. සමහරුන් රෝද කරකැවූ අතර තවත් අය රිය තල්ලු කළෝ ය. ටික දෙනෙක් අසුන් ගේ කන් හා වල්ගා වලින් ද ඇද්දෝ ය. ඔවුන් කෑ කෝගසත් ම වධ දෙත් ම අශ්වයෝ සිටිවන ම සිටියාහු ය. මේ වධකයන් වෙහෙස මහන්සි වී විවේක ගන්ට වූ විට අශ්වයෝ පිටත් වූහ.

එකෙණෙහි ම රියැදුරා සිය අසුනට පැන ගත්තේ ය. අස්ගොව්වා පා පුවරුවට නැංගේ ය. කිසි වග විභාගයක් නැති ව උදව්කාරයෝ පා තබන්ට හෝ අල්ලා ගන්ට පුළුවන් හැමතැන ම එල්ලුණාහ. වීදිය දිගේ හෙමින් හෙමින් ඇදුණු කෝච්චිය තැපැල් මලු පටවා ගනු පිණිස තැපැල් කන්තෝරුව ඉදිරිපස හදිසියේ ම නතර විය.

නැවතත් ඔව්හු ගමන් ඇරඹූහ. මේ වර අසුන්ගේ සහයෝගය වඩා හොදින් ලැබුණි. වක් වූ මහ මග, විටෙක පොල් වතු මැදින් ද විටෙක නොගැඹුරු තැන විනිවිද පෙනෙන සේ කොළ පැහැගත්, විටෙක මඳ නිල්, විටෙක ගන නිල්, විටෙක ඉදුනිල් පැහැගත් දියෙන් හා නැග එන තරඟ පෙළින් හෙබි මුහුදු වෙරළ අසබඩින් ද වැටිණි. මෙහි හැම දෙයක ම විවිධ වර්ණොපශොභිත ලීලාවක් සේරාට පෙනුණි. නෙරළු තුරුවලින් වැටුණු කළුවන් සේයාවේත් රන් සිරියල් පැහැගත් පසේත් වෙරළේත් සුළඟින් ලෙලෙන අතුපතරැති ගස්වල ළා කොළ පැහැයේත් මූදට පලබරින් නැමුණු හිරු රැසින් මැලවුණු ගස් මුදුන්වලත් සැහවී තිබුණේ අනුපම ශක්තියකි.

මධ්‍යාහනය වන්ට පෙර කොළඹට යැනැප්ම තිහක් දුරින් පිහිටි බෙන්තර තානායමට ඔවුහු ළඟා වූහ. මාලු එළවළු හා පලතුරුවලින් යුක්ත වූ මේ ආහාරයට තිබුණේ සිංහල හාලේ බත ය.

කෝච්චිය කොළඹට ළඟා වන විට ඇඳිරි වැටී තිබුණි. ටොම් ස්වාධීන ව සිටීමට කැමැති වූ ත මුදු සේරා ගේ ඇවිටිලි නිසා තේ නො කැමැත්තෙන් නමුත් පැරඩෙලා ගේ ආරාධනය පිළිගත්තේ ය. එහෙත් කොළඹ කොටුවට නුදුරින් පිහිටි, අලුත් පන්නයේ පෙදෙසක් වන, කොල්ලුපිටියේ පියකරු නිවසක් කරා ගමන් විඩාවෙන් වෙහෙසට පත්වී සිටි මොවුන් සමග කෝච්චිය ළඟාවත් ම, මේ නාඳුනන මිනිසුන් හමුවීමට හදිසියේ ම නො කැමැත්තෙක් දනුණේ සේරාට ය.

සේරාට වඩා අවුරුදු පහක පරණ වයසින් වැඩි, නිල්වන් කෙස් කළඹින් හා සිහින් සිරුරින් යුත් තරුණ කාන්තාවක් ඔවුන් පිළිගැනීමට බරාඳයට පැමිණියා ය. ඈ පසු පස පැමිණියේ මධ්‍යම වයසේ සිටි, එතරම් කැපී පෙනෙන අංග ලක්ෂණ නැති, තරබාරු පුරුෂයෙකි.

සිය බිරිඳ මුව නො සෑහෙන තරම් වර්ණනාන්විත වචනවලින් ආගන්තුකයන් පිළිගත් අතර, පසෙකට වී සිටි මෙතෙම තමා එඩ්වින් පැරඩෙ යයි හඳුන්වමින් ඉදිරිපත් විය. තියුණු නුවණින් හා මහත් වෙහෙස දරා වැඩ කිරීමෙන් මුදල් උපයාගත්, සැප සම්පත් අනූන වෙළෙන්දකු වූ මොහු තමාගේ නියම තතු සැඟවීමට අදහස් කළේ නැත. ටොම් ද ඔහුගේ දැඩි අවංක භාවයට එකෙණෙහි ම වසඟ විය. බොහෝ දෙනා හිමිකර ගන්ට යත්න දරූ ගරු කටයුතු ඇලිසන් ගුත්රි නම් වූ, කුලීන වනිතාවක් ඔහුගේ බිරිඳ වූවා ය. ඈ ගැන සුපරීක්ෂාකාරී වියයුතු බව සේරාට නිරායාසයෙන් ම අවබෝධ විය.

ඇලිසන් ගේ මද සිනහව නිති මුවග රැඳිණි. ඇගේ රූප සෞන්දර්යය චිත්තාකර්ෂණීය වූවා සේ ම ගේ දෙර බඩු බාහිරාදියත් අත්‍යලංකාර වූයේ ය. ඇලිසන් ආගන්තුකයන් පිළිගන්නා කාමරයට සේරා කැඳවාගෙන ගියා ය. එහි තුබුණු වටිනා බුමුතුරුණුවලින් ද සියඹලා අරටුවෙන් හා කළුවර ලීයෙන්

කළ ඇඳ පුටු ආදියෙන් ද ඒ ස්ථානය ශොභාමත් විය. එහි ඇඳ දෙපස තුබූ මල් බඳුන් දෙකේ වූ අරලිය මල් පොකුරුවලින් මුළු කාමරය ම සුවඳවත් විය.

''ඔයාගෙ මහත්තයා හියු නෙවිල් ගේ මස්සිනා නේ ද?''යි හදිසියේ ම ඇලිසන් විචාළා ය.

''ඔව්, නුමුත් නාම මට එයා හම්බ වෙලා නෑ.'' ඇගේ සිනිඳු ඇස්බැම් සැලෙත් ම සේරා මෙසේ ද කීවා ය. ''හියු එංගලන්තෙන් පිට වූ විට ටොම් හා මා ත් හමුවෙලා නෑ. ඔහු ගැන බොහෝ දේ මා අසා ඇති නිසා ඔහු හමු වීමට මා ඉතා ආසාවෙන් සිටිනවා.''

''මං දන්නේ නෑ ඔබ අසා ඇත්තේ මොනවා ද කියා''යි ඇගේ දෙනෙත් ඊර්ෂ්‍යා සහගත ව දිලිසුණි.

හදිසි සැලකිල්ලක් දක්වමින් ''ඔබ ඔහු හොඳට දන්නවා ද?''යි සේරා ඇසුවා ය.

''අනේ! මිතුරිය, මම ඒ තරම් ම හොඳින් දන්නේ නෑ. ඔහුගේ වැවිල්ල අසල ම තියෙන මගේ මහත්තයාගේ වැවිල්ලත් පාලනය කර දීමට ඔහු එකඟ වුණා. අපේ හැඳිනීම ඒ මාර්ගයෙනුයි.'' ඇගේ කටහඬ තවමත් කුතුහලයකින් යුක්ත විය.

''හියු නෙවිල් හොඳට අඳුනනවා යයි යම් ස්ත්‍රියක් කීවොත් එය ඇට කැලලක් වන බව ඔබට දැනගැනීමට තරම් කාලයක් තව ම ගත වුණේ නෑ. ඇත්ත වශයෙන් කොයි ස්ත්‍රියක් වත් එහෙම කියාවිය කියා මට නම් සැකයි.''

සේරා ඇ වෙතින් හෙමිහිට බැහැර ව ගියා ය. ''හියු නෙවිල් මගේ මහත්තයාගේ මස්සිනා''යි විඩාවට පත් හඬකින් ඕ පැවසුවා ය.

එකෙණෙහි ම ඇලිසන් ඇගේ දෑතින් ම සේරා අල්ලා ගත්තා ය.

''අනේ මිතුරිය, මට බොහොම කනගාටුයි. මට ඔබ සමා වෙනවා ද?''

''ඒකට කමක් නෑ. පැරඬේ නෝනා''යි සේරා කීවා ය.

''මා අදහස් කළේ......... ඔහුගේ බිරිඳ නැසීගිය වෙලේ ඔහු සිටියේ සිහි විකල් වෙලා වගෙයි. ඒ නෝනා මං කවදවත් දැකලා නෑ. හියු පළමුවෙන් ම මෙරටට නැව් නැඟ එන අතර මග දී දරුවෙක් ලැබෙන්ට ගිහින් ඒ නෝනා මළා. අනේ ඒ දුප්පත් දරුවා! මවු කෙනකු ගේ පෙම්බර වචනවල රස විඳ ගැනීමේ වාසනාව ඒ ළමයාට සදහට ම නැති වුණා. ඒ මදිවාට ඒ වත්තේ තට්ට තනියම ඔහු කාලය ගෙවනවා.''

මුවින් ගිලිහුණු වදන් වැළ, ඇලිසන් ගේ පිටවීම ත් සමග ම නතර විය. ඉතුරුවූයේ ඒ වචන මාලාවේ ප්‍රතිරාවයත්, ඈ ඇඟ ගල්වා තුබූ විලවුන්වලින් පැතුරුණු දැඩි සුවඳත් ය.

සේරා බරපතළ කල්පනාවක යෙදෙමින් ඇඳ කෙළවර වාඩි වී හුන්නා ය. ඒ අසල අරලිය මල් කළඹින් නික්මුණු තද සුවඳ යළිත් ඇට ආඝ්‍රාණය වූයෙන් හියු ගේ වත්තේ නමත් අරලිය යන බව ඇ සිතට නැඟුණි.

දැන් ලැබුණු ප්‍රවෘත්තියෙන් ටිකින් ටික එළිවෙතත්, අබිරහසක් වූ හියු ගේ ඡායාවක් දැන් ඇගේ සිත්හි ඇත. ඇත්ත වශයෙන් ම හියු කෙබඳු පුද්ගලයෙක් ද? ඇගේ කුතුහලය කෙමෙන් වැඩුණි.

ඇ තවමත් ඇඳ කෙළවර හිඳගෙන ඒ ළඟ තුබූ විශාල මල් බඳුන් දෙස නෙත් යොමු කරගෙන සිටිනු ටොම් දුටුවේ ය.

‘‘ඔබේ මස්සිනා විවාහ වී සිට ඒ භාර්යාවත් නැති වී දැන් පුතකුත් සිටින බව ඔබ දන්නවා ද?’’ යි ඕ ඇසුවා ය.

මේ ආරංචිය ඔහුට ලැබුණු පළමුවෙනි වතාව මෙය බව ඇට එක වරට ම දැනුණි.

6

මහනුවර යන අශ්ව කෝච්චිය ගමනේ අවසාන කොටස වූ කඳු පෙදෙස නැඟීම අතර ටොම් හා කළ සාකච්ඡාව සේරාට යළිත් මතක් විය.

ඇලිසන් කී දේ සියල්ල සිය සැමියාට දැන්වූ කල්හි ඔහුගේ ස්වාභාවික විනීත ගතිය හැඩි දැඩි වූ සැටිත් ශාන්ත දර්ශනය රෞද්‍ර වූ සැටිත් පළමුවරට ඕ දුටුවා ය.

‘‘නෑ, මම දන්නේ නෑ, හියු කසාද බැඳලා හිටි විත්තිය. ඔහු මට එය කියන්ට කැමැති වුණේ නැත්නම් ඒක ඔහුගේ වැඩක්.’’ හේ හිස සැලී ය. ‘‘ඒ නමුත් මට පුදුමයි ඔහු ඒ ගැන මතක් නො කිරීම.’’ ඔහුගේ මේ වික්ෂිප්ත භාවය සමග මඳ සිත් තැවුලක් ද දක්නට ලැබුණි. එහෙත් මේ කාරණය ගැන යළිත් ඔව්හු කතා නො කළහ.

පැරඩේලා සමග ඔවුන් ගත කළ කෙටි කාලය ඉක්මනින් ගත විය. කුරුඳු වත්තේ උදෑසන අසු පිටින් ගිය ගමන් ද ගාලු මුවදොර මූදු බඩ රථ වාහන ගමන් ද පැරඩේලා ගේ නිවස පිටිපස වැවේ ඔරු පැදීම ද ප්‍රීතිදයක වූ නමුත් සේරා ඇත්ත වශයෙන් ම ඒවායින් විනෝදයක් නො ලැබුවා ය. අලුත



සැතැප්ම ගණනක් මුළුල්ලේ අශ්වකෝච්චිය.................................අලංකාර වූ මාර්ගයක් ඔස්සේ සෙමින් සෙමින් ගමන් ගත්තේ ය.

කුළුපග වූවන් ගේ නිවෙස් කරා ගිය මොවුහු පෙර නො වින්ද විරූ තරම් ආගන්තුක සත්කාර ලැබූහ. මක්නිසා ද යත් මේ විදේශිකයන් හැම දෙනාම එකමුතු කරන සුළු වූ පොදු බැම්මක් තුබූ බැවිනි.

කෙසේ වෙතත් ඇලිසන් ගේ යහළුවන් අතර ඕ කිසි විටෙකත් සතුටින් කල් නො යැවූවා ය. ඔවුන් ගේ කතා බස් හුදෙක් අනුන්ගේ ඇඳුම් පැළඳුම් නැතහොත් වතු වැවීමේ කම්කටුළු හෝ නොයෙක් දුෂ්කරතා වැනි ඕපා දූපවලින් ගහණ බැව් ඇට පෙනුණි.

"සේරා, අපි දැන් දුර්ග මාර්ගය මුදුනේ."

ඈ අඩ නින්දෙන් සිටින්ට ඇත. සැතැප්ම ගණනක් මුළුල්ලේ අශ්ව කෝච්චිය විශාල පඹ වැලින් වෙළුණු වෘක්ෂලතාදියේ සෙවණ ලබමින්, ගලා බස්නා ඇළදෙළවලින් ද ගැඹුරු හෙල්වලින් ද අලංකාර වූ මාර්ගයක් ඔස්සේ සෙමින් සෙමින් ගමන් ගත්තේ ය. එක් අතකින් උස් වූ කඳු වැටියෙන් ද, අනික් අතින් තද බෑවුම් සහිත ගන වන පෙදෙසින් හා මිටියාවතින් ද යුක්ත වූ මේ පෙදෙස දකුම්කලු විය. රෑහැයියන් ගේ හීන් හඬිනුත් ගිරවුන් ගේ කර්කශ නාදයෙනුත් මුළු වනය එක කොලාහල වූයේ ය. එහෙත් කෝපි වැවිලි කාරයන් මේ වන සෞන්දර්යය ඉක්මනින් යටපත් කරන රග පෙනුණි. දැන් භූමිය සමතලා වූයේ අශ්ව කෝච්චිය කෝපි වගාව අතරින් ධාවනය කෙළේ ය.

"නෙවිල් මහත්තයා, මෙන්න ඔබට කදිම කෝපි වැවිල්ලක්."

කෝච්චියේ සිටි අනික් එක ම තැනැත්තා පේරාදෙණියේ මල් වත්තට යන, මඳ වශයෙන් රැවුලක් ඇති, තරුණ තෘණ විද්‍යාඥයෙකි. පිලිප් ක්‍රෝලි නමැති මේ තෙමේ ළං ළංව වැවූ ගහ කොළවලින් ගහණ විශාල වැවිල්ලක් දැක හිස සැලී ය.

"මේ නො දියුණු නමුත් සාරවත් රටේ අපි දිගට හරහට කොතරම් ඉඩම් වවා තියෙනවා ද? 1820 තරම් මෑත කාලය දක්වා ප්‍රධාන නගර ටිකක හැර එක ම පාරක් තනා නො තිබුණු බව ඔබ දන්න වා ද?"යි පැවසූ ක්‍රෝලි ගේ තරුණ මුහුණ උද්‍යොගයෙන් දීප්තිමත් විය. "තවත් ධනය ලැබෙන විට පාසැල්, රෝහල් හා දුම්රිය පොළවල් පිහිටු වනවා ඇති. ඔබට අර පෙනෙන කැලෑ සියල්ල කෝපි වැවිල්ලෙන් අතුරුදන් වී යයි."

"දැන් තියෙන හැටියට කොතරම් අලංකාර ද?"යි සේරා සුසුම් ලෑවා ය.

"අලංකාර තමා, නුමුත් පලදවක් නෑ."

"ක්‍රෝලි මහත්තයා, කෝපි ගැන ඔබේ ඇති උනන්දුව !"

''කෝපි ගැන පමණක් නො වෙයි නෙවිල් නෝනා, කෝපිවලට ආධාර වශයෙන් තවත් අතිරේක ජාති වැවීමට පේරාදෙණිය මල්වත්ත භාරකාර ආචාර්ය ත්වයිට්ස් මහත්තයා නිතර ම ඇවිටිලි කරනවා. ඇයි, මේ රටේ වවන්ට බැරි මොනවා ද?''

ටොම් තියුණු නෙත් යුවළකින් බලමින් ඉදිරියට නැමුණි. ''ඔබේ ආචාර්ය ත්වයිට්ස් මහත්තයා ගැන මම අසා තියෙනවා. ඔහු හමුවීමට මා කැමති යි. ඔහු තරමක තාපසයෙක් නේද?''

''එමෙන් ම දැනට ඉන්නා ශ්‍රේෂ්ඨතම තෘණ විද්‍යාඥයින්ගෙන් කෙනෙක්.''

''අක්කර දහස් ගණන් කැලෑ මෙසේ එළි කිරීමෙන් හා ගිනි තැබීමෙන් ස්වභාව ධර්මය වෙනස් වී තියෙනවා. සමහර විට ආචාර්ය ත්වයිට්ස් මහත්තයා සමග වැඩි දෙනෙක් එකඟ නූනත් ඔහුගේ විශ්වාසය කෝපි පැළයට සෙවන අවශ්‍ය බවත් එය එළිමහනේ තිබීමෙන් ඊට රෝග වැළඳෙන්ට ඉඩ තියෙන බවත් ය.''

ටොම් හෙමිහිට හිස සැලී ය. ''ඔහු හරි බවට මට සැකයක් නෑ. නුමුත් දුරට පේනකොට මට ඒ කීම විශ්වාස කරන්ට අමාරු යි.'' ඔහු මෙසේ කීවේ එවේලේ ඔවුන් පසු කරමින් සිටි කෝපි වැවිල්ලක් දෙස බලා හිස සලමිනි. එකිනෙකට ළංව අක්කරයක් අක්කරයක් පාසා තද කොළ පාටින් යුත් කොළ ගැවසී ඒ ගස් ඉතා සරු ලෙස අතු පතර විහිදෙමින් වැඩෙන බැව් හැම අතින් ම පෙනුණි.

''ඔව්, දැනට නම් ඒවා සශ්‍රීක තමයි. ඒ නමුත් ආචාර්ය ත්වයිට්ස් මහත්තයා කල්පනා කරන්නේ මෙරට කෝපි වැවිල්ල දියුණු කිරීමට තවත් ඉඩ තියෙන බව යි. මේ රටේ සම්පූර්ණ ආර්ථික අනාගතය එක ම වැවිල්ලකට සීමා කිරීම නුවණට හුරු යයි ඔබ සිතනවා ද?''

''එහෙනම් අතිරේක වැවිලි හැටියට ඔහු යෝජනා කරන්නේ මොනවා ද?

''සින්කෝනා– කොකෝවා– තේ.''

''මම කෝපි විතරක් වවනවා. අනික්වා ගැන මේ තරමවත් මම දන්නේ නෑ.''

ක්‍රෝලි දත් පා මඳ සිනහ පෑ ය. ''කෝපි මිල ගණන් ආදිය ගැන සලකා බලන කොට ඔබට මා දෙස් නගන්නේ නැත.''

''ඒ කෙසේ වෙතත් ඔය ආචාර්ය ත්වයිට්ස් මහත්තයා සමග කථා බස් කරන්ට මම කැමතියි.''

''ඔහුගේ ආශ්‍රමයෙන් ඔහු එළියට ගන්ට පුළුවන් නම් ඔබ වාසනාවන්තයෙක්.''

මාර්ගය වක් වූ තැන්වලදී කෝච්චිය පැද්දීම නිසා වැඩි දුරටත් කතා බස් කළ නො හැකි වූයේ, ටොම් අවට පිහිටි රුචිර දර්ශනයේ රස විඳිමින් සිය අසුනේ හාන්සි විය. මෙහි පස සාරවත් විය. පස සේදී යෑම ගැන ඇන්ගස් මැක්ලොයිඩ් මෙතරම් සැලකිල්ලකින් කතා කළේ මන්ද යනු දැන් ඔහුට වැටහෙන්නට පටන් ගති. ඉඩම් පිහිටා තිබෙන අන්දමත් තද වර්ෂාපතනය නිසාත් මෙය් බැරෑරුම් ප්‍රශ්නයක් විය හැකි ය. සිය වැවිල්ල ගැන ගැඹුරු කල්පනාවක යෙදුණු සැටි ඔහුගේ නෙත්වලින් පවා දක්නා ලදී. ඇට කිසි සේත් අවබොධ කරගන්ට බැරි තරම් සිතුවිලි දමක ටොම් පැටලී සිටින බව, ඔහු දෙස බැලූ සේරාට පෙනුණි.

ඔහුගේ කරමත ඇගේ හිස තබාගෙන ඕ මේ ප්‍රදේශයේ ස්වාභාවික සෞන්දර්යයේ රස විඳින්ට වූවා ය.

මහනුවරට නුදුරින් පිහිටි පේරාදෙණිය මල් වත්තේ දී පිලිප් ක්‍රෝලි ඔවුන් හැර ගියෙන් ඔව්හු මහනුවරට ගමන් ගත්හ.

ලන්තානාව එන්ට එන්ට ම ළං වෙන්නා සේ පෙනුණි. තව මඳ වේලාවකින් ඔවුන්ට හියු නෙවිල් සහ ගොන්සාලේස් කන්කානියා හමුවීමෙන් ඔවුන්ගේ ඉඩම ගැන සියලු තොරතුරු යථා තත්ත්වයෙන් හෙළිවනු ඇත.

ටොම් සේරා සමග අතිනත ගනිමින් ''සේරා අපේ ගමනේ අන්තිම කොටස මේ ය''යි කී ය.

සේරා ඔහු දෙස බැලූ විට මහත් උද්‍යොගයෙන් ඇළලී ගිය මුහුණක සිරිය දිස් විණි.

අශ්ව කෝච්චිය නගරයේ ධාවනය කරන කල්හි, ඔහු වටපිටාවට සිය නෙත් යොමු කළේ නො ඉවසිල්ලෙන් මෙනි.

අවුරුදු 300 ක් මුළුල්ලේ ප්‍රතිකාලුන් ගේ හා ලන්දේසීන් ගේ ආක්‍රමණයන් සාර්ථක ලෙස පලවා හරිමින් පැවැති සෙංකඩගල රාජධානියේ මේ අන්තිම කඳුකර අගනුවර මුලින් දුටු සැටියේ ම, එහි පිහිටි පටු වීදි හා අපිළිසුදු කුඩා ගෙවල් ඔවුන්ගේ නෙත් සිත් කලකිරවන සුලු විය. එසේ වුවද සන්හුන් දිය කඳින් හෙබි වැවකින් යුත් කඳු විවරයක පිහිටි මේ නගරය දර්ශනීය වූයේ ය. පහතරට උණුසුම් ගුණය වෙනුවට මෙහි අවට වාතය වඩා පිරිසිදු ද සිසිල් ද විය. ජීවිතය ද කොළඹට වඩා විවේකී වූත්, සුඛොපභොගී වූත් ලීලාවක් දැක් විය. ඇත ඇසෙන දළදා මාලිගාවේ බෙර හඬත්, වීදිවල එහා මෙහා වඩින භික්ෂූන් වහන්සේගේ සන්සුන් ගමනත්, මේ පුරාණ රාජධානියට ම සරිලන සේ සේරා සැලකුවා ය.

7

හෝටලයේ ඉදිරිපසට රියැදුරා අශ්ව කෝච්චිය ළඟා කරත් ම පිටතට පැන්න ටොම් ඇ බසිනතුරු දොර හැර ගෙන සිටියේ ය.

ප්‍රධාන කාමරයට ඇ හෙමි හිට පා නගත් ම එහි සතුටු සාමීච්චියේ යෙදෙමින් විනෝද රසය විඳිමින් සිටියවුන් ගේ හඬ හදිසියේ ම නැවතුණි. විළිබර කොපුල් තලවලින් යුත් වූ ඕ තොමෝ ඇ දෙස බැලුම් හෙළූ, මනා සේ වැඩුණු අඟ පසඟ ඇති, නිසැකයෙන් ම වතුකාරයන්ගේ ස්වභාවය ගත්, පිරිසක් දුටුවා ය. රළු දළිරැවුලින් හා අශූන් පිට යැමේ දී ලන මඩ වැකුණු පාවහන් සහලින් සැරසී, ඉරි වැටුණු ටවීඩ කෝට් හැඳගත් මේ පුරුෂයන් කෙරෙහි වැවිලිකාරයන් ගේ අංග ලක්ෂණ අනූන ව විද්‍යමාන වූයේ ය. සේරා ගේ රූ සපුවට බොහෝදෙනා ගේ මන නුවන් ඇදී ඇති බව හදිසියෙන් දුටු ටොම් අමුත්තන් පිළිගන්නා ලිපිකරු වාඩිගෙන සිටි මේසය වෙතට එඩිතර ව ඇ කැඳවාගෙන ගොස් තමා කවුදැයි හඳුන්වා දුන්නේ ය. ඒ අතර නව උද්‍යෝගයකින් මෙන් මේ යුවළට පිටිපසින්, යළිත් සතුටු සාමීචි කථා ඇරඹුණි.

‘‘මගේ මස්සිනා, හියු නෙවිල් මහත්තයා, මෙහි දී හම්බවීමට මම බලා පොරොත්තු වෙනවා.’’

‘‘තමුන්නාන්සේ හම්බවෙන්ට කවුදෝ කෙනෙක් බලා ඉන්නවා. අපි ඔබ ගැන බලාපොරොත්තු ව හිටියා.’’

ලිපිකරු මෙසේ කථා කරන අතර, සිහින් විහිළු මුහුණක් ඇති, සුදුමැලි මිනිසෙක් ඉදිරියට ආවේ ය. වැරහැලි වී ගිය කළු ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි හේ නීග්‍රෝ ජාතිකයන් හිසලන පළල් තොප්පියක් ඔහුගේ අඩපණ වූ ඇඟිලි මත කරකවමින්, සිටියේ ය.

‘‘තමුන්නාන්සේ නෙවිල් මහත්මයා නේම ද? ලන්තානාවේ ඔබේ ඕවර් සියර් ගොන්සාලේස් – මමයි.’’

කනස්සලු පෙනුමක් ඇති කළුවන් නෙත් සඟළක් දෙස තමා බලා සිටින බැව් ටොමට හැඟුණේ ය.

‘‘නෙවිල් මහත්තයා මෙය තමුන්නාන්සේට දෙන්ටත් අන්තිම මොහොතේ ඔහුට එන්ට බැරි වූ බව ඔබට කියන්ටත් මට කිව්වා.’’

මෙය හියු ගේ තවත් ව්‍යාජ ලියුමක් විය. ලියුම කියවන්ටත් පෙර එහි ඇතුළත් විය හැකි වූ කරුණු ටොම් දත්තේ ය. ඔහුගේ සැලකිල්ල තදින් යොමු වූයේ ලියුමේ අන්තිම ඡේදයට යි.

''වත්තට ඕනෑකරන උපකරණ මොනවාදැයි ගොන්සාලේස් ඔබට දන්වන්වා ඇත. ඔහුගේ උපදෙස් නිසැක ව ම පිළිගන්ට පුළුවනි.''

''මගේ මස්සිනා ඇත්ත වශයෙන් ම මට කියන්නට තැත් කරන්නේ කුමක් ද'' ටොම් ගේ අයෝමය කටහඬින් පිටවිණ. ''මගේ ඉඩම මා බලාපොරොත්තු වූ විදියට නැද්ද?''

ගොන්සාලේස් නො සන්සුන් වූයේ ය. ''තමුන්නාන්සේ බලාපොරොත්තු වුණේ මොනවාදැයි මා දන්නේ නෑ. ලන්තානාවේ පොළොව සාරවත්. නුමුත් එය කලින් අයිති ව සිටි ඇන්ස්ට්රුතර් මහත්තයා පසු කාලයක දී ඉඩමට වියදම් කළේ නැහැ. අපට ආවුධ හා උපකරණ ටිකක් තියෙනවා. ඕනෑ ම කරන දේවල්වල ලැයිස්තුවක් මම ලිව්වා.''

මේ මිනිසා ගේ ගීතවත් හඬින් ඔහුගේ පෘතුගිසි මිශ්‍රණය එළි දරව් විය.

''මම ඉඩම මිලයට ගත් වෙලේ මට දැනගන්ට ලැබුණේ එය කැලෑ එළිකර කොටසක් වවා ඇති හැටියට යි. ඉඩකඩ යන්ත්‍රෝපකරණාදිය ද සෑහෙන තරමට ඇති හැටියට යි.'' උපකරණ ලැයිස්තුව දෙස බැලූ ටොම් ගේ ඇස් රතු විය. ''මේක විකාරයක්! පොළොව හාරන මුල්ලු, ගස් කපන පොරෝ, ඉස්කෝප්ප, පිහියා, පල්පිං මැසිමට අලුත් සිලින්ඩරයක්–! රන් පවුම් සිය ගණනක් වියදම් කළයුතු උපකරණ මේ ලැයිස්තුවේ තියෙනවා.''

''මහත්තයා, මම මේ ලැයිස්තුව පුළුවන් තරම් අඩු කරලයි තියෙන්නෙ. මේ බඩු නැතුව අපට වැඩ කරගෙන යන්ට බෑ.''

ටොම් උරහිස් පළල් කොට පපුව ඉස්සරහට දැමීය. ''හොඳයි, ගොන්සාලේස්. ඕනෑ මොනවා ද යන වග මට වඩා හොඳට ඔබ දන්නවා. බඩු මිලයට ගැනීමට ඔබ කියන තැන්වලට අපි හෙට යමු. නුමුත් මම පොහොසතෙක් නො වන බව මතක තියාගන්ට ඕනෑ. මට කොයිකටත් තියෙන්නේ පවුන් දහක් දෙදහක් විතරයි. ඒක වියදම් වුණා ම– ආයිත් මොකුත් නෑ.''

''ඒ, මේක ඔවර්සියර් ගේ වරද නො වේ''යයි කියද්දී ඔහුගේ මුහුණේ මඳ සිනහ රැල්ලක් නැගුණි.

''මම මේකට ලැස්තිවෙලා හිටියෙ නැතුවා වැරදි යි. දැන් මොනවා කරන්ට ද?''

''මම හිතුවෙ තමුන්නාන්සේ දන්නවා ඇත කියා යි. මට බොහොම කනගාටු යි. ඔබට හැම උදව්වක් ම කිරීමට මම සූදානම්.''

ටොම් ගොන්සාලේස් ගේ උරහිසට අත තබමින් ''ඔබ උදව් කරන බව මට නිසැකයි,'' යි පැවසී ය.

8

ටොම සහ සේරා ඩන්ඩී වත්තේ මැක්ලොයිඩ්ලා සමග දිවා භෝජනය ගත්හ.

පයිප්පය දල්වාගෙන පුටුව මත හාන්සි වූ ටොම් ගේ රළි ගැසුණු ඇස් බැම් සහළ දෙය ඇන්ගස් මැක්ලොයිඩ් කල්පනාකාරී ව බැලුවේ ය. ''ඔබේ හිතේ මොනවා හෝ තියෙනවා ටොම්. ඇයි, මොකුත් හිරිහැරයක් ද?''

ටොම් පැකිලි හිස වැනී ය. ''ඔබට උපකාර කරන්ට පුළුවන් දෙයක් නම් නෑ. මතක් කළාට ස්තුති යි.''

ඇත්තෙන් ම ඔහුගේ සිතේ යමක් පැවැත්තේ ද! මහනුවර ගතකළ ඒ අන්තිම දවස් දෙකේ ඔවර්සියර් සමග බඩු මිලදී ගැනීමේ කෙළවරක් තුබුණේ නැත. ගොන්සාලේස් කොතරම් ප්‍රයත්න දැරූ නමුත් බඩු වෙනුවෙන් වියදම් වූ මුදල ද සුළු පටු නො වී ය. පිටරටින් ගෙන්වූ යන්ත්‍රෝපකරණාදියේ වටිනාකම ටොම් විසින් ගණන් නො ගන්නා ලදී.

ඇන්ගස් මැක්ලොයිඩ් නිහඬ බව බින්දේ ය. ''ළමයා මේ රෑ වත් ඔබ නවතිනවා නම් මම කැමති යි. මේ පළාතේ වහින්නේ නා කපන වැහි. ඔබත් සේරාත් ඊට අහු වෙනවාට මම කැමති නෑ.''

අහසේ පාවෙන වළාකුළු දෙස බැලූ ටොම් එකෙණෙහි ම හුනස්නෙන් නැගිට්ටේ ය. ''තව හැතපුම් විස්සකුත් යන්ට තියෙද්දී වැස්සට අහුවෙන්ට මාත් කැමති නෑ. අපි පිටත් වෙන්ට තිබුණේ මීට බොහොම කලින්. ඔබ අපට සංග්‍රහ කළා බොහො ම වැඩි යි.''

මැක්ලොයිඩ් නෝනා ද මේ අතර කථා කරමින් ''ඔබ රෑ නැවතීම නුවණට හුරු යි. ඔබ නිසා නො වේ නම්, සේරා නිසාවත්.''

එහෙත් සේරා ඇගේ ස්වාමි පුරුෂයා ගේ නෙතට ලක්වූවා, වහා නැගිට පිටත්වීමට අවසර ඉල්ලන ලීලාවෙන් මැක්ලොයිඩ් නෝනා දෙස මඳ හසින් බැලුවා ය. ''මට කොහෙත් ම මහන්සියක් නෑ. ඒ එක්ක ම ටොම්ට පුළුවන් ඉක්මනින් වත්තට යන්ට ඕනෑ කරන බවත් මම දන්නවා.''

මහනුවර දී ටොම් අසුන් දෙදෙනකු මිලයට ගත් බැවින් අසුන්පිට යනවිට අඳින ඇඳුම්වලින් සැරසීමට සේරා ළහි ළහියේ කාමරයට ගියා ය. දෝලාවෙන් හෝ බරකරත්තයකින් ගමන් කරනවාට වඩා අසුන් පිට යෑම ප්‍රීති ජනක බව කියා සේරා ඒ ගමන් ක්‍රමයට සැමියා ද කැමති කරවා ගෙන තිබිණි.

අසුන් පිට නැගුණු නෙවිල්ලා මහ මඟ පහළට යන සැටි මැක්ලොයිඩලා බලා සිටියෝ ය. තරබාරු ටොම් ද, කුඩා නමුත් සෘජු ව පිහිටි ශරීරයක් ඇති ව සැදලයේ හුරු පුරුදු ගතියෙන් වාඩිවී ගමන් කළ සේරා ද දුටු මැක්ලොයිඩ නෝනා සුසුම් ලමින් මෙසේ කීවා ය:—''ඇ වීර තරුණියක්. ටිකක් බිය සැක නැතුවා වගෙයි. නුමුත් මේ ගති හොඳට වෙන්ට පුළුවනි. ඉදිරියට මුහුණ පාන්ට තියෙන කම්කටුළුත් දුෂ්කර කමුත් ඇ නො දන්නා එක හොඳයි. ඇ අධෛර්යය වේය යන බියට මම ඒවා ගැන වැඩි යමක් කිව්වේ නෑ. පසුගිය ද ඔබ මට කී දේ ඔහුටත් කිවා ද ඇන්ගස්?''

මට ප්‍රස්තාවක් ලැබුණා නම් මා කියනවා, අම්මා. නුමුත් ටොම් නෙවිල් තමන්ට ඇති වැඩ ගැන කථාකරන හෝ අමාරුකම්වලට මුහුණ පා ඒවා තමන් ම නිරවුල් කර ගන්ට පෙර අනුන් ගේ උදවු ඉල්ලන ජාතියේ හෝ කෙනෙක් නො වේ. දියුණු වේගෙන යන මේ රටට කියාපු මිනිහෙක්.''

''ඔහු මෙයින් විනාස වෙන්නේ නැතැයි මම හිතනවා. හොඳ මිනිස්සු කී දෙනෙක් මේකෙන් විනාස වෙලා ගියාදැ''යි මැක්ලොයිඩ නෝනා බැරෑරුම් ලීලාවකින් පැවසුවා ය.

නෙවිල්ලා ලන්තානාවට ළංවත් ම සුළඟ සීතල විය. තණකොළ ටිකක් හැර වෙන කිසිවක් නො වැවෙන මුඩු පතන බිම්, රන්වන් ගොයමින් බැබළුණු ලියදි, සශ්‍රීක අතුපතරින් හෙබියා වූ කෝපි වතු හා කැලේ ගිනි තැබීමේ දී මහගස්වලින් දැවී ඉතුරු වූ කඳන් කොට ද පසු කරමින් ඔව්හු ගමන් ගත්හ.

උදෑසන මහ නුවරින් පිටත් වී සැතැප්ම විසිපහක් පමණ මඟ ගෙවා සිටි මොවුනතුරෙන් සේරා විඩාවට පත්වීමේ ලකුණු දක්වූවා ය. මධ්‍යාහ්න වේලේ සිට වැටුණු පින්න අතුරුදන් ව වැසි වහින්ට වූයෙන් සේරා ඇඟමස් විනිවිද යන සුළු තද සීතලෙන් මිරිකුණා ය. නාවලපිටියේ තානායම පේනතෙක් මානයට පැමිණි විට ටොම්ට ද ලැබුණේ අස්වැසිල්ලකි. ගොන්සාලේස් සහ අස්ගොව්වාත් මොවුන් එනතුරු එහි සිටියෝ ය. කැවිලි පෙවිලි ස්වල්පයක් ගෙන මඳ වේලාවක් විවේක ගත් පසු ඔව්හු ගමනේ අවසාන කොටසෙහි යෙදුණා හ.

කල්පනාකාරී ලෙස ගොන්සාලේස් සේරාට බර කරත්තයක් සපයා තුබුණෙන් ඕතොමෝ ස්තුති පෙරදැරි ව එහි වූ ගුදිරියේ දිගා වූවා ය. ටොම් අසු පිටින් ම ගමනේ යෙදුණි. ඇගේ අශ්වයා ගොන්සාලේස්ට නැගීමට දෙන ලද නමුත් ඔහු ඌ පිට යෑම වෙනුවට කරත්තය සමග පයින් ම ගමන් කරන්ට විය.

එහෙත් දැඩි වෙහෙස ගෙන දෙන සුලු කරත්ත ගමන ඇරඹුණු පසු ඇගේ අසුගෙන් කලින් ලැබුණු උද්‍යොගයත් එසේ යන අතර හැමූ පවනින් ලත් ප්‍රබෝධයත් නැතිවීමේ පාඩුව තදින් දැනුණේ ය. ගමනේ ඉතුරු හරිය ඇට

හැඟුණේ සිහිනයක් මෙනි. විනාඩි ගණන් ගතවීම ඉතා හෙමිහිට වූයෙන් පළමු වෙනි වතාවට ඇයට තනියක් දැනෙන්නට විය. එහෙත් සැන්දෑ සමය ගතවී අඳුර වැටෙත් ම, ටොම්ට සේරා ගේ හැඟීම් දැනුණු නිසා දෝ සිය අසුපිටින් බැස උගේ තෝන් ලණු ද ගොන්සාලේස්ට දී කරත්තේ සිටි සිය බිරිඳ පසෙකින් හිඳ ගත්තේ ය. ඔහු කිසිවක් මුවෙන් නො බැණ ඇගේ කරට අත දමා, හිස ඔහුගේ උර මත තබා ගත්තේ ය. කරත්තය නවත්වන තුරු ඔව්හු මෙලෙස ගමන් කළහ. පිටට එබී බැලූ ඔවුන්ට පෙනුණේ කඳු අතරින් වැටුණු වක් වූ පටු මඟකි.

''මේ කරත්තෙන් යන්ට පුළුවන් තරම තමයි, මහත්තයා''යි ගොන්සාලේස් කී ය.

ඇ උසුලාගෙන යැමට සිටි ක්ෂාන්ත මිනිසුන් කණ්ඩායමත් ඔවුන් වෙත තුබූ විශාල දෝලා පුටුවත් තෝන්තුවෙන් මෙන් සිටි සේරා දුටුවා ය.

පැය දෙකක් ගතවූවා පමණි. කිසියම් අඩු පාඩුවක් ඇට දැනුණේ ය. සේවකයන් ගේ අඩි ශබ්දය නැවතී පහන් එළියක් ඇගේ නෙත් සඟළ හමුවේ බැබළෙමින් තිබිණි.

''සුන්දරිය, මේ ඔබේ ගෙදර''යි ටොම් කියනු ඇට ඇසුණේ ය.

විඩාවෙන් මැලවී සිටි ඇ ටොම් දෙස බැල්මක් හෙළුවා පමණකි.

දෝලා පුටුවෙන් බට ඕ තොමෝ පෘථිවියේ භ්‍රමණය නවතින තුරු ඒ මේ අත වැනෙන්නට වූවා ය. වැස්ස නැවතී රිදීවන් සඳරැස් දහරින් බිම් පෙදෙස නැහැවුණි. මෙපරිද්දෙනි සිය අනාගත නිවාසය සේරා පළමුවෙනි වරට දුටුවේ. මෙය රුචිර දර්ශනයක් ගෙන හැර දැක් වූ චන්ද්‍රාලෝකයක් නො වී ය. ඡායාවන් ගේ හා විවරයන් ගේ හැඩි දැඩි බව විදහමින් ගින්නෙන් දැවුණු ගස් කඳන් කිසියම් මනඃකල්පිත සොහොන් බිමකින් නැගී එන ඇට සැකිලි මෙන් අනාවරණය කළ, ශීත වූත්, අනුකම්පා විරහිත වූත් ආලෝකයක් පමණි.

ඉදිරිපස සමතලා බිමේ වරිච්චියෙන් තැනූ ගෙයක් විය.

ටොම් ගේ උගුර කට වියළුණු රහ ඕ දුටුවා ය. බිය සැක ගති අතුරුදන් විය. ඕ සැමියා දෙසට නැඹුරු වූවා ය. ළපටි ප්‍රේමයෙන් ඇගේ මුහුණේ සිරියාව වැඩෙනු හේ දුටුවේ ය. ''සිරිතක් වශයෙන්, පළමුවෙනි ගෙදර එළිපත හරහා ඔබ මා වඩාගෙන යන්නේ නැද්ද, ටොම්''යි ඇගේ මුවින් මුදු සිනිඳු ස්වරයෙන් ගිලිහෙනු ඔහුට ඇසුණේ ය.

කාණ්ඩය 2

1

අරුණෝදයත් සමග ම ටොම් සිය ගෙයි දෙර සිටගෙන තමාගේ ඉඩම දෙස බැලි ය. පසුගිය රාත්‍රියේ ඔහුගේ ආවේගය වූයේ මීට යාබද වත්තට අසූපිටින් ගොස් සිය මස්සිනා සමග වේගවත් කථාවක යෙදීමට නමුත් සේරා එසේ කිරීමෙන් තමා වැළැක්වීම ගැන දැන් ඔහු සතුටු විය. එහෙත් හියූ නැතුවාට ඔවුන්ට තනිව ම වැඩ කර ගන්ට පුළුවන් බව සේරා ඇගේ අවසාන හුස්ම දක්වා ස්ඵුටකිරීමට සූදනම් බව ඔහු සැලකුවේ එතරම් සතුටකින් නො වේ. ටොම් තර්ක කළේ ඉතා ලිහිල් අන්දමකිනි. ලන්තානාව ඔහුගේ ය. එබැවින් එය හැකි තරම් හොදට වැඩකරවීම ඔහුට අයත් මෙහෙයකි.

ඔහු ඉදිරියේ පැතිරී තිබුණේ කැඩී බිඳී දැවී ගිය මුඩු බිම් අක්කර පන්සියයකි. එහෙත් ඇලෙන එපිට කන්දේ ඔහුට සරු ව වැඩුණු ගන කැලයක් ඈත පෙනුණි. මැත දැවී ගොස් බිමට වැටුණු ගස් අතරින් පච්ච වියනක් මෙන් දිස් වූ කෝපි පැළ පෙනුණේ ය. ඒ පැළ නිසා දැවී ගිය කළු පස වැසී තිබුණි. ඒ මොහොතේ දී ඉඩම් කෙරෙහි ඇති ඔහුගේ ළැදියාව කුළු ගැන්වී එය සශ්‍රීක කිරීමට ඉටා ගත්තේ ය.

කුඩා පැළ අසල නො කපා හැර තුබූ කුරුඳු ගසෙක වැස සිටි සුදු කළු පැහැති පියාපතින් හෙබි පොල්කිච්චකු නාද කරන්ට වූයෙන් ටොම් හිස ඔසවා බැලී ය.

‘‘මගේ ඉඩම, නො සලකා හැර දැමූ නිසරු එකක්. නුමුත් දෙවියන් ගේ උදවුවෙන් මම මෙය දියුණු කරමි’’යි යනු ඔහුගේ මනසට නැගුණි. පසුගිය රාත්‍රියේ මේසයේ පැත්තකට ද තුබූ තොප්පිය ගෙන හෙතෙම එළියට ගියේ ය.

වැඩි දුර යන්ට මත්තෙන් ඔහු පිටි පසින් හෙමිහිට නගන පා හඬක් ඇසුණි. ආපසු හැරී බැලූ විට ඔහු දුටුවේ ගොන්සාලේස් ය. ඕවරසියර් ගේ කනස්සලු සහිත වැහැරී ගිය මුහුණ ඔහු හිසලා සිටි බාල්දියක හැඩයගත් අවුවට ලන තොප්පියෙන් වැසී තුබුණු අතර ඔහුගේ දෙකකුල් දණහිස් දක්වා පූඩාවන්ගෙන් ආරක්ෂාවීම සඳහා කැන්වස්වලින් ආවරණය වී තිබුණි.

ආචාර සමාචාර දක් වූ පසු ටොම් සන්සුන් ලෙස මෙසේ කී ය. ''මට ඔක්කෝම බලන්ට ඕනෑ, ගොන්සාලේස්. මගේ නියම තත්ත්වය කුමක්දැයි මට දැනගන්ට ඕනෑ.''

මීට විනාඩි 10 ට පසු පළමුවරට ඔහුගේ කම්කරු කණ්ඩායම ඉදිරියේ ඔහු සිට ගත්තේ ය. මෙතරම් බැලීමට පියකරු නො වන පිරිසක් ඔහු පෙර නුදුටු විරූ ය. ඒ කම්කරු පිරිසේ කන්කානියා වන, ගොරිල්ලකු බඳු වූ කරුප්පන් වැනි මිනිසකු ඔහු මින් පෙර කවදාවත් දැක නැත.

''හොඳ මිනිසුන් කණ්ඩායමකුත් සමග දෙවෙනි කන්කානියෙක් මට හොයාගන්ට පුළුවන් වුණා. ඒ අය හෙට එනවා ඇති''යි ගොන්සාලේස් කී ය. ''මේ මිනිස්සුන්ට අපි කියන්නේ පෙරළිකාරයෝ කියායි. සමහර විට මේ අය පෙරළි කරන්ට බැරි කමක් නෑ.''

ටොම් හිස සැලී ය. කම්කරුවන් ලබා ගැනීම දුෂ්කර බවත් කරුප්පන් විශාල මුදලක් වත්තට ණය බව ගොන්සාලේස් කී වගත් ඔහු දනී.

ඔහු දෙස හැරුණු තවමත් නාඳුනන ඒ මුහුණු හේ බැලී ය. මේ අය ඔහුගෙන් යැපෙන ඔහුගේ කම්කරුවෝ ය. ඇත්තෙන් ම ඔවුන් හඳුනාගෙන ඔවුන්ට අවවාද අනුශාසනා දීමෙන් උදව්වීමට ඔහුට ප්‍රස්තාව ලැබේ ද?

මෙයින් වැඩි දෙනා ගේ මුහුණු ළමයින් ගේ බඳු ඉතා වාම් ඒවා විය. එහෙත් ඉඳහිට කිසියම් කෙනෙක් ඔහු දෙස රවා බැලූහ. මෙයින් වැඩිදෙනා හොඳට හෝ නරකට පහසුවෙන් අවනත කර ගත හැකි බව ඔහුට සිතුණේ ය. කන්කානියා ගේ දුෂ්ට මුහුණ දෙස බැල්මක් හෙලා හේ කථා කරන්ට පටන් ගති.

''මා මෙහි සිටින්ට සතුටු බව ඔවුන්ට දන්වනු. ඔවුන්ට මා ඉතා සාධාරණ වත් හොඳිනුත් සංග්‍රහ කරන බවත් ඊට ප්‍රත්‍යුපකාර වශයෙන් හොඳින් වැඩ කරනවා ඇතැයි මා බලාපොරොත්තු වන බවත් ඔවුන්ට කියනු. නිකම් බොරු කිරීම මට රුස්සන්නේ නෑ''යි ටොම් ගොන්සාලේස්ට කී ය.

ගොන්සාලේස් මේ පණිවුඩය දෙමළෙන් පැවසූ කල්හි කම්කරු ස්ත්‍රී පුරුෂයන් නො සන්සුන් වූ බව ටොම් දුටුවේ ය. ඒ අතර සමහරු යම් යම් දේ කොඳුරන්ට වූහ. එහෙත් මොහුගේ සැලකිල්ල යොමුවූයේ කරුප්පන් කන්කානියා කෙරෙහි ය. ඔහුගේ ඝන ඇසිපිය හා ලේ පැහැති ඇස්වලින් විරුද්ධත්වයක සේයාවක් පෙනිණි. ඊට මොහොතකට පසු මේ මිනිසා කපටි සිනාමුසු මුහුණකින් ආචාර කරමින් ඉදිරියට අවුත් තමාගේ අලුත් ස්වාමියාට නො නැසෙන භක්තියකින් සේවය කරන බව දැන් වී ය.

ගොන්සාලේස් ඔවුන්ගේ නම් සටහන් කරගෙන ඔවුන්ට නියමිත වැඩ භාරදුන් කල්හි ටොම් ඔහු දෙසට හැරී දැන් ඉතින් වත්තට''යි කී ය.

ටොම් ගේ ආරක්ෂිත නො වූ කකුල් දෙස බැලූ ගොන්සාලේස් බියපත් ව ''සර්, ඔබට මේ කුඩලු මේස් ඕනෑ.''

මේ මොනවාදැයි ටොම් සලකා ගන්ටත් පෙර ඔහු තමාගේ එකී මේස් එළියට ගෙන මෙසේ කී ය. ''සර්, මේවා නැතුව මේ තෙත් තැන්වල ඇවිදීම නුවණට හුරු නෑ. පූඩාවන් හෙවත් කුඩැල්ලන් මටත් පුරුදුයි. ඇරත් උන් ගලවා දැමීමට මම නිතර ම දෙහි බෑයක් ගෙනියනවා. ඒ දෙහි ඉස්ම ගෑ හැටියේ ම උං වැටෙනවා. කුඩැල්ලා එළියට ඇද්දෙත් උගේ දළ පහර වැදුණු තැන් වණ වෙනවා.''

ප්‍රමාද වීම ගැනත් මේ මිනිසා ගේ නො සන්සුන් කම ගැනත් නො ඉවසිලිවත් වූ ටොම් ඔහුට කොටින් ස්තුති කොට කුඩලු මේස් ඇඳගෙන ගියේ ය. අක්කර 300ක් විශාල කැලේ පැයක් මුළුල්ලේ ඇවිද්ද ටොම්ට මෙකී මේස් වර්ගය තමාට දීම ගැන ඉතාමත් ස්තුති වන්ත විය යුතු බව දැනුණි. ඕවර්සියර් ගේ කකුල් වැසී යන තරම් එල්ලුණ කුඩැල්ලන්ගෙන් පිරුණ ද දෙහි යුෂ යන්තමින් ඔවුන්ට මිරිකූ විට උන් සියලු දෙනා ම බිම වැටුණා හ.

මොවුන් ගන කැලය මැදට පැමිණි විට ගොන්සාලේස් හදිසියේ නැවතී ඔවුන් ගමන් කරන පාර දැක්වී ය. විශාල බල්ලකු ගේ වැනි පා සටහන් එහි දක්නා ලදී. ඊට නුදුරින් අමු බෙටි වගයක් ද තිබිණි. ගොන්සාලේස් කොඳුරමින් මෙන් ''කොටියෙක් සර්, මේ පැත්තෙන් මේ දැන් යන්ට ඇති''යි කී ය. ඒ පා සටහන් වන ලැහැබ දෙසට යොමු වී තිබුණේ ය. එහෙත් ඔවුන් දෙස හොරෙන් බැලුම් ලන නෙත් යුවළක් අසල ඇතැයි ටොම්ට හැඟුණි. නැවතත් ඔවුන් එළිමහනට වන් වේලේ ගොන්සාලේස් ස්වකීය ස්වාභාවික හඬින් මෙසේ පැවසී ය:

''මොවුන් ජෝඩුවක් ඉන්නවා, සර්. ඔවුන් කම්කරුවන් ගේ හරකුන්ට හිරිහැර කර තියෙනවා.''

ටොම් හිස වනමින්, ''ඒ ගැන අපි මොනවා හරි කරන්ට ඕනෑ''යි කී ය.

මොව්හු අක්කර ගණන් හිස් පතන ඉඩම් පසුකර ගියහ. විශාල ගල්වලින් යුත් එහි අතරින් පතර මානා පඳුරු හා තද සුවඳැති උස් පැහිරි ද විය.

''මෙහි කිසිවක් වවන්ට බැරි ද?''

''යුකැලිප්ටස් වැනි සුළං ආවරණය කරන ගස් විතරයි, සර්.''

සිත් වේදනාවෙන් මිරිකී ටොම් ගේ හිස නැමුණි. ඇස්වලින් හෙලන බැල්ම ද කල්පනාකාරී එකක් විය.

''දෙයියෝ සාක්කි! කෝපි පැළවලට වෙලා තියෙන්නේ මොනවා ද?''

''ඌරු මීයෝ, සර්. ළඟක දී හිටන් ඔවුන් බොහොම දෙනෙක් වතුවල පැතිරිලා. ඔවුන් ආ ඉක්මනින් ම පිටවෙලා යනවා ඇති.''

''ඊළඟට අර ගස්යට ලොකු වළවල්?''

''වල් ඌරෝ හාරලා, සර්.''

මෙය පියවරක් පියවරක් පාසා බලවත් සටනක් කොට ජය ගත යුතු වැඩක් යයි ටොම් බැරෑරුම් ලෙස කල්පනා කෙළේ ය. කම්කරු ආරාවුල් හා කැලෑ සතුන්ගෙන් වන විනාශයත්, තද වැසි සහ බෑවුම් සහිත පොළොවත්, පස් සේදී යෑමේ අවදානමත්, තමන්ට පළ පුරුදු ප්‍රධාන ආහාර නැති වී යෑමත්, සම්පූර්ණ හුදකලා හාවයත් යන මේ සියල්ලට ම තමා ද සේරා ද මුහුණ පෑ යුතු විය.

2

කාර්යාලයක් මෙන් පාවිච්චිකළ මඩුවට මේ දෙදෙනා පැමුණුණේ සවස් වරුවේ ය. පෙට්ටි දෙකක් අතර දමා තුබූ ලැල්ල මේසයක් සේ පාවිච්චි කරන ලදි. එය පිටී පස වූ පුටුවේ වාඩිගත් ටොම්, ගොන්සාලේස් මේසය මත දමූ පොත් පරීක්ෂාකර බැලී ය.

''හොඳයි, මං මීලයට ගත් හරිය අක්කර හය සියයකට යන්තම් අඩු බව පේනවා. එයින් අක්කර දෙසියයක් කෝපි නැත්නම් වල්පැල, අක්කර තුන් සියයක් කැලෑව, මේ සියල්ල ම කෝපි වැවීමට සුදුසුයි. ඉතුරු හරිය නිෂ්ඵල, තණ බිම්. ඒවාට කියන්නේ මොනවාද? පතන හේමා; අපේ අවි ආයුධ ගොඩනැගිලි, යන්ත්‍රොපකරණ යන කිසිවක් වැඩට යොද ගන්ට බෑ. කොටින් ම ඒවා කහළ ගොඩක්.'' ඔහු තද සුසුමක් හෙළා ලැබූ අස්වැසිල්ලෙන් පසු මෙසේ කී ය. ''ඒවා එපමණ යි. අපේ වත්කම්. මොනවා ද අපේ වත්කම්, ගොන්සාලේස්? මේ වේලාවේ දී මට මතක්කර ගන්ට බොහොම අමාරුයි.''

ගොන්සාලේස් ගේ දර්ශනය කොතරම් දුඃඛදයක වී ද යත් ටොම් ට සිනහ නොවී සිටින්ට නොහැකි විය. ''කාමර වගයක් තියනවා– ඒවාට කියන්නේ ලැයින් ද? මෙහෙම වත්තකට ඕනැකරන කම්කරු සංඛ්‍යාවෙන් බාගෙකට තරම් ඒ ඇති. ඒකත් එකක්. අපට තව නවත් ලැයින් වහා ම උවමනා කරනවා.''

නිකම් පාරක හැඩයකුත් පෙනෙනවා. ඔබ එළිපහළි කොට වළවල් ගැසූ ඇත ඉඩම් කැබැල්ලේ හිටවීමට හොඳ පැල තිබෙන තවානකුත් තියෙනවා. අපට ඉන්ට ගෙයකුත් තියෙනවා.''

''මීට වඩා වැඩි යමක් කරන්ට ලැබුණා නම් මම කැමතියි, සර්. නුමුත් මට ලැබුණු එක ම උපදේශය ඔබ එනතුරු පුළුවන් තරම් වියදම් අඩු කරන්ට කියා ය.''

''හා, මට මතක නැතිවුණා. ළහදී ම පූදින කෝපි පැළ වගයකුත් තියෙනවා. එමෙන් ම ඔබ බේරාගෙන දැන් ටිකකට කලින් කොළඹ යැවූ පලද වෙනුත් යමක් ලැබෙ වි.''

ටොම් දිග හැරී ගොන්සාලේස් දෙස කෙළින් බැලී ය. ''මට කියන්න, ගොන්සාලේස්, මගේ මස්සිනා කවද හරි මේ ඉඩම බලන්ට ආවා ද?''

හදිසියේ ම ඇසූ මේ ප්‍රශ්නයට ගොන්සාලේස් තැතනුවෙ ය. ''නෑ සර්. මම හිතන්නේ එහෙම ආවෙ නෑ. ඇන්ස්ටරුතර් මහත්තයා මෙහි ඉන්ද දී නෙවිල් මහත්තයා ඔහුගේ කන්තෝරුවට ආ බව විතරක් මට මතකයි. එවේලේ ඔහු වත්ත කොතරම් දුරට බැලුවා ද යි මට කියන්නට බෑ.''

''ඇන්ස්ටරුතර් මහත්නයා මෙය දියුණු නො කළේ මන්ද?''

ගොන්සාලේස් පැකුළුණි. මීට හේතු වූ කරුණු කීපයකි. අලුත් ඉඩම් හිමියා ඒවා ගැන නො දැන සිටීම පුදුමයට කරුණක් විය. කලින් සිටි වතු හිමියා ලංකාණ්ඩුකාර තුමා, පාදිලිඋන්නාන්සේලා හා සිවිල් නිලධාරීන් වැනි ප්‍රභූ පක්ෂයේ වතු හිමියන් ගේ පරම්පරාවට අයිති වූවෙකි. මොවුහු ඔවුන්ගේ නිම් හිම් නැති උද්‍යොගය නිසා පස් අවුරුද්දක් වත් ගත වන්ට මත්තෙන් රන් පවුම් පනස් ලක්ෂයක් වියදම් කළෝ ය. ඔහුගේ යුගයේ සිටි අනික් අය මෙන් ඇන්ස්ටරුතර් ද කොළඹ වැවිලිකාරයෙක් වී ය. මෙබඳු තත්ත්වයේ වැවිලිකාරයෝ කොළඹ සුඛොපභොගී ජීවිත ගත කරමින් ඉඳ හිටලා, හාවා හඳ දැක්කාක් මෙන්, තම වතු බැලීමට පැමිණුණහ. කොළඹ සුඛවිහරණයටත් දූ කෙළීම් ආදියටත් සිය ධනය යොදමින් කල් ගෙවූ ඇන්ස්ටරුතර් ද වත්ත බලන්ට ආවේ කලාතුරකිනි. හැකි තරම් අර්ථ සංරක්ෂණ විධි යොදමින් එය මෙසේ ඇතක සිට පාලනය කරන ලදී. කෝපි මිල බැස්ස කල්හි අනෙක් වතු හිමියන් වැඩි දෙනා මෙන් නො ව සිය වත්ත නො විකුණා එය රැක ගෙන සිට අන්තිමේ දී–සමහරුන් කියන පරිදි ණයකින් නිදහස්වීමට–හියු නෙවිල්ට කුණු කොල්ලයට විකුණන්ට සිදු විය.

ගොන්සාලේස් ගේ මුහුණ පරීක්ෂාකාරී ව බලා සිටි ටොම් එහි බොහෝ කරුණු ගැප් වී ඇති බව දැන ගති,

''මෙහි ප්‍රශ්නය මේකයි, මා ළඟ තියෙන මුදලින් අපට ගොඩ එන්ට පුළුවන් ද?''

තමාගේ මුළු අර මුදලේ ප්‍රමාණය හේ දැන්වී ය. ''මම ණයට ගන්නේ නෑ. මෙයින් වැඩ කරගන්ට අපට හැකි යයි ඔබ හිතනවා ද?''

එහි ''අපට'' යන වචනයෙන් ගොන්සාලේස් ටොම්ට බැඳුණි. ගොන්සාලේස්ට වතු වැවිල්ලෙහි පහළොස් අවුරුද්දක පළ පුරුද්දක් ඇත. පරීක්ෂාකාරී ව වැඩීමෙන් නිසරු බිම් සරු වූ හැටි ඔහු දැක තිබේ. අපරීක්ෂාකාරී ව ප්‍රයෝජනයට යෙදීමෙන් සාරවත් කැලෑ බිම් පිරිහුණු සැටිත් ඔහු දැක තිබේ. බොහෝ දේ නැතහොත් සියල්ල ම රඳා පැවැත්තේ වැවිලිකාරයා පිට ය. අලුත් ස්වාමියා දෙස ශීඝ්‍ර බැල්මක් හෙළූ හෙතෙම, ඔහුගේ නිර්භය නෙත් යුවළෙන් විහිදෙන නුවණැති බැල්මත් ශක්තිමත් තරුණ දේහයත් දිටී ය.

''ඔව සර්,'' හෙතෙම හෙමිහිට කීය. ''අපට ඒක කරන්ට පුළුවන් කියා මම හිතනවා,''

3

සේරා අවදිවන විට පොල්කිච්චා ගේ හඬ නැවතී බොහෝ වේලාවකි. හැම පසින් ම ඈට තෙතමනය දැනුණේ ය. සුළඟ ද තෙත් විය. ඇඳ ඇතිරිලි අතට ඇලෙන තරම් පිනිබා තිබිණි. ඈ දෙනෙත් පියා නො සොල්මනේ ම සිට ගත්තා ය. අරුණෝදයෙන් එළිදරව් වන දේ ඕ තව මොහොතකට කල් දැමුවා ය.

ඈට නැවතත් නින්ද යන්ට ඇත. ඊළඟට නෙත් අයා බැලූ විට හිරු එළියෙන් ඈ දුටුවේ මැටි ගා තුබූ සමතලා නුවූ පොළොවත් කුඩා කාමරය හා අතු සෙවෙණි කළ වහලත් අමු ලීවලට මැටි ගසා සකස් කර තුබූ වරිච්චි බිත්තිත් ය. මෙයින් සමහර ලී ඇත්ත වශයෙන් ම පැළවන බව පෙනුණි.

ඇතිරිල්ල පැත්තකට දමා ඕ ඇඳෙන් එකැවර ම බිමට පැන්නා ය. මහනුවර දී මිලයට ගත් මේ ඇඳ හැතපුම් තිස් පහක් පමණ කුලීකාරයන් විසින් උසුලා ගෙන එන ලද්දකි. බිම්ට බැස්ස ඕ තොමෝ කලින් දවසේ රාත්‍රියේ ගමන් වෙහෙස නිසා නො බැලූ අනික් ගේ දෙරබඩු හෙමි හිට බලන්ට වූවා ය. ඒ තනි පුටුව, බිත්තියේ ඇති තිත් සහිත කණ්ණාඩිය, ''මේෂ'' නැවේ කාමරයේ තැබීමට ඔවුන් මිලයට ගත් ජග්ගුව හා බේසමත් තබා තිබූ පකිස් පෙට්ටි මේසය යන මේවා ය.

ඇඳුම් අදිමින්, ඔවුන් ගෙදර සිට ගෙනා බඩුවලින් පිරී තුබුණු, ඊළඟ කාමරයට ගියා ය. ඇගේ මවුගේ රිදී බඩු, රෝයල් ඩාබි වර්ගයේ කෑම කන පිඟන් කට්ටලය, වීත්ත හා සිහින් ලිනන් රෙදි යන මේවා මේ ස්ථානයට කිසිසේත් සරිලන ඒවා නො වි ය.

කාමරය මැද වූ කෑම මේසය මත මැක්ලොයිඩ්ලා ඔවුන්ට දුන් පාන්, කේජු, හා හැළි පරිස්සමින් තබා තිබුණේ ය. එහෙත් ඒවා වැසීමට ටොම්ට මතක නැති වුණි. මේ සියල්ල ම කළු කුඹින්ගෙන් වැසී තුබුණේ ය. සේරා කිරි නැති සීතල කෝපි කෝප්පයක් බී පිටිපස ගෙයින් පිටත වූ කුඩා කාමරයට ගියා ය. මෙය නිසැක ව මුළු තැන් ගෙය වෙන්ට ඇත. එහි ලී දෙර සම්පූර්ණයෙන් හළ විට ඕ තිගැස්සී සිටියා ය. හැම පසින් ම වැසුණු, පුස් ගඳ හමන ඒ අඳුරු කාමරයේ පිළිස්සුණු ලිග්ගල් කීපයක් ඇති, මැටියෙන් සෑදූ කෑම පිසන තැනක් ඕ දුටුවා ය. මෙරට සෑදූ දූලි වැකුණු වළං කීපයකුත් හිරමණයකුත් පමණක් එහි තිබුණි.

මෙය ඉතාමත් අප්‍රිය ජනක විය. ගොන්සාලේස් ඔවුන්ට මෙහෙකාරයකු සොයා දෙන තුරු ස්වකීය ආහාරය ඇ පිසිය යුත්තේ මෙහි ද? අර මුල්ලේ තිබෙන ඉතත් දරවලින් ඇ ගිනි අවුළුවා ගත්තේ හෝ ගොන්සාලේස් සපයන අමුතු වර්ගයේ ආහාර ජාති පිසින්නේ හෝ කෙසේ ද?

මෙහි දෙර පියා දමා ඇ කෑම කන කාමරයට ගොස් හැදිසියේ ම හිතේ පහළ වූ ශෝකය ඉවසාගත නො හී, පෙර නො කළ විරූ පරිද්දෙන් හිස අත් තබා ගෙන අඬන්ට වූවා ය. ඒ අසල ඔරලෝසුවකින් නැගුණු ටික් ටික් හඬත් එකිනෙකට ගැටුණි. එවෙලේ ඇගේ සිත වාවාගෙන හෙමි හිට ඔළුව උස්සා අන්තිම කඳුළු බින්දුව පිස දැම්මා ය.

‘‘කවදවත් මෙහෙම ඇඩීම හොඳ නෑ’’යි ඕ සිතුවා ය. ‘‘දියුණු කරන්ට බැරි තරමට නරක් වූ කිසිවක් ලෝකයේ නෑ. හැකි තරම් ඉක්මනින් නිසි දේ කිරීමට මා උනන්දු වෙච්ච තරමට හොඳයි.’’

සිහින් හඬක් ඇසී ඇ කැරකී සිටියා ය. දෙරළඟ වැරහැලි සරමකින් සැරසුණු වැහැරී ගිය සිරුරක් ඇති යමෙක් බිත්තර හා සහල් පොල් ටිකකුත් වට්ටියක ලා ගෙන සිටියේ ය.

පළමුව මේ දෙළොස් හැවිරිදි වයසට වැඩි නො වන ළමයෙකැයි ඕ සිතුවා ය. එහෙත් කිට්ටු වී බලත් ම පහළොස් අවුරුද්දක් හෝ සොළොස් අවුරුද්දක් තරම් වයසැති තරුණයකු බව ඇට පෙනුණි.

‘‘ඒ මොනවා ද?’’යි ඕ විනීත ලෙස ඇසුවා ය.

කොලුවා හයෙන් පස්සට ගියේ ය.

‘‘මොනවා ද ඕනෑ. බඩු විකුණනවා ද?’’ යනුවෙන් විචාරමින් ඕ තොමෝ ඒ කොලුවා ළඟ තුබූ බඩු දෙසට අත් දිගු කළා ය. ඒ එතරම් වටිනා බඩු නො වී ය.

හේ හිස සැලී ය.

''කීය ද?''

මේ තරුණයා වචනයක් වත් කථා නො කොට හිස සලන්ට වන. තමා කී කිසිවක් නො තේරෙන යමකු පළමු වරට හමුවීමෙන් ඇගේ සිත අවුල් විය.

''මෙන්න'' කියමින් ඇ සිලිමෙ කාසියක් දැක්වූ විට තරුණයාගේ මුහුණේ ප්‍රීතිමත් භාවයක් දක්නා ලදී.

ඒ කාසිය ගැනීමට ඔහු අත දිගු කරත් ම එහි සැරව වැහෙන තුවාලයක් ඕ දුටුවා ය. අත ඇල්ලූ විට ඔහු එය ඇද නො ගත් නමුත් වේදනාවෙන් මිරිකුණු බව පෙනී ගියෙන් ඒ තුවාලය පීඩාදයක බව ඇට දැනුණි.

ඔහුට මඳක් නවතින ලෙස අතින් සලකුණු කොට ඕ නිදන කාමරයට ගොස් වතුර බේසමකුත් සබන් හා තුවාල බඳින රෙදිත් ගෙනාවා ය. ඔහුගේ තුවාලය හෙමි හිට තෙතමාත්තු කොට සැරව වැහෙන මස පිස දමා බෙහෙත් ලා රෙදි පටියකින් බැන්ද ය.

මෙසේ ඇ සාත්තු කරද්දී පුදුමයට පත් වී ඇගේ මුහුණ දෙස බලා සිටියේ, සාත්තුව නිමවෙත් ම, හේ නිසොල්මන් විය.

''හා, හොඳයි. හෙට ඇවිත් මට තුවාලෙ පෙන්නන්ට ඕනෑ''යි ඇ සිනාහමුසුව පැවසූවා ය. එහෙත් ඔහු යටට ගිලුණු විශාල ඇස් අයා ගෞරව සහිත ලීලාවකින් ඇගේ පැහැපත් කෙස් කළඹ දෙස බලන බැව් ඇට දැනුණි.

මේ අතර සේරා ගේ බැල්ම පිටිපස මිදුලේ කොනක තුඹු ඉදලකට යොමු වූයේ ය. ඇට හදිසි ආභාසයක් ලැබී එය ගෙන ඔහු දෙස විචාරාත්මක ව බලමින් එයින් පොළොව අතුගාන හැඩ දැක්වූවා ය. එයින් අදහස් කරන ලද දේ දැන ගත් හෙතෙම වහා ම ඇගෙන් ඉදල ගෙන මිදුල අතු ගාන්ට පටන් ගත්තේ ය.

ඔහු එහි සිටීම ගැන ඇ හදිසියේ ම සතුටට පත් වූවා ය. කලකට පෙර අහසේ පියාසර කරන උකුස්සකු ගේ හඬ මිස වෙන කිසි ශබ්දයක් නෑසුණු ඇට දැන් තනියක් නැත. යටත් පිරිසෙයින් විනාඩි කිහිපයක් නමුත් ඇගේ ඒ කුඩා ගෙපැළ හැර දමා අවට කඳු පෙළේ හා වන බිමෙහි සොබා සිරිය විඳින්නට ඉඩ ලැබුණි.

ගෙට ඉතා ළඟින් ගලා බසින දෙළ පහරක් ද ලිය වැලින් ගැවසුණු පොකුණක් ද ඕ දුටුවා ය. සිසිල් කඳුකර ජලයෙන් මුහුණ සෝද ගන්ට ඇ නැඹුරු වත් ම ඒ ජලය මත ඇ දෙස බලා සිටින වෙනත් කතක් මෙන් ඇගේ සේයාව පෙනුණි. ඇගේ තරුණ රූපයේ ශෝභාමත් බව සෙලවෙන දියෙන් වඩාත් අලංකාර වූයේ ගත කෙලින් කොට, ''හා ටොම්, මට මීට වඩා පළපුරුද්දක් තිබුණා නම්''යි මිමිනුවා ය.

ඇ ආපසු ගෙදර ආ විට අලුත් සේවකයා කලින් සිටි තැන නො සිටියේ ය. එහෙත් මුළු තැන් ගෙයින් දුම් විහිදෙනු දැක ඕ පුදුම වූවා ය. ඇතුළට ගොස් බැලූ විට ගිනි ඇවිලෙන ලිප් දෙකකුත් ඒ මත ව්‍යංජන උතුරන හට්ටි දෙකකුත් දක්නා ලදී.

ඇ සතුටු වූ බව දුටු ඔහුගේ නො ඉවසිලිවත් බව දැක්වුණු සිහින් මුහුණෙන් නැගුණේ සිනා රැල්ලකි. ගොන්සාලේස් ඔවුන්ගේ ප්‍රයෝජනයට ගෙනා මෙරට සාමාන්‍ය එළවළුත් තමා ගෙනා සහලුත් හෙතෙම ඇට පෙන්වී ය. ‘‘ඇත්තට ම කොච්චර හොඳක් ද, ඔහු හදන්නේ අපට කෑම උයන්ට ’’යි ඕ කල්පනා කළා ය. ඇ හිස සැලූ වහා ම හෙතෙම තවත් වළඳක හාල් හොඳට සෝද එය ශුද්ධ වූ විට එයින් මිටි කීපයක් උතුරන වතුරට දැමී ය. ඊට පසු ගෙඩියක් බිඳ හිරමණේ වාඩි වී, පොල් ගාන්ට වූයේ ය.

පොල් ගාන සැටි හෝ දුරු මිරිස් ඉඟුරු ආදී පස් කුළු බඩු පාවිච්චි කරන සැටිත් නො දැන සිටි සේරා මොහු බැදගත් කුළු බඩු ඇඹරුම් ගලේ අඹරන සැටි බලා පුදුම වී සිටින අතර ලිපෙන් නැගුණු දුම් ඉවසා ගත නො හී ගේ තුළට දිව ගියා ය. ඔවුන් ගෙනා පෙට්ටි බොහොමයක් කඩා ඒවා තුළ තුබූ ද්‍රව්‍ය ළඟ දණ ගසා හිඳගත් විට දීර්ඝ නෞකා ගමනකින් හා උෂ්ණ කලාපික රටවල තෙතමනෙන් විය හැකි දේ ඇට වැටහුණි. අලුත් රෙදි වර්ග පුස්කා තිබුණි. පොත්පත් හා සපත්තුවලටත් එම කල දසාව ම ගොස් තුබුණේ ය. සමහර පොත්වල සමින් කළ පිට කොළ මැලියමින් ගැලවී ඇකිලී තිබුණි.

ස්වකීය සේවකයා ගේ නම බණ්ඩා බව ඕ දැනගත්තා ය. ඔහුගේ උපකාරය ඇතුව ගස් දෙකක් අතර වැළක් බැඳ රෙදි සමහරක් අවුවේ දැමුවා ය. ගේ අසල ඔයේ වතුර වළ ළඟ තුබූ ගල් මත ද සමහර රෙදි ආදිය දමා වේලන ලදී.

මේ සියලු දේ කළ නමුත් ඇගේ සිත බලවත් කෝපයකින් දැවෙන්ට පටන් ගති. වත්ත සම්බන්ධයෙන් ඇති තතු හරි හැටි නො දක්වා ටොම්ගෙන් ඒවා වසන් කර තැබීමට හියු නෙවිල්ට හැකි වූයේ කෙසේ ද? මේ තරම් නරක ලෙස ඔහු ටොම් සම්බන්ධයෙන් ක්‍රියා කළේ කෙසේ ද?

ඇ වතුර වළ ළඟ රෙදි සෝදමින් සිටින විට ඒ අසල පා නගන හඬක් ඇට ඇසුණි. හැරී බැලූ විට, ඕ අසුපිට නැගගත් අමුත්තකු දුටුවා ය. මේ අන් කිසිවකු නො ව හියු නෙවිල් බව ඇට එ කෙණෙහි වැටහිණ.

තමාගේ පොඩිවුණු ඇඳුම හරි ගස්සා ගනිමින් මුහුණට වැටුණු තෙත් කෙස් රොදක් සකස් කර ගනිමින් ඇ කෙළින් සිට ගත්තේ කලබල සහිත ගතියකිනි.

‘‘සේරා’’ කියා අතක් දිගුකරමින් ‘‘මම හියු නෙවිල්’’යි අමුත්තා කී ය.

''හා, පමා වී නමුත් හම්බුවුණු එක හොඳයි'' කියා සේරා පැවසුවා ය. ටොම් ගේ වැනි මුවක් ඇති නමුත් ඔහුගේ ඇස් හා දෙතොල් දෙස පරීක්ෂා කාරී ව බැලූවිට ඒවා බෙහෙවින් සරදම් කරන සුලු බව ඇට හැඟිණ.

ඔහුගේ මුහුණ අලංකාර සිනා රැල්ලකින් ශොභාමත් විය. ''සත්තකට ම සේරා, ප්‍රමාදවීම මට වළක්වන්ට බැරි වුණා. මගේ කෝපි යවාගන්ට වුණු මහන්සිය ගැන ඔබ දන්නවා නම්–''

''එහෙනම් අද නිවාඩු ලැබිච්ච එක පුදුමයක්''යයි කියමින් සේරා කඩිසර ලෙස රෙදි වනන්ට වූවා ය.

පුස් බැඳුණු කොට්ටඋරයක් හියු ඇට දුන්නේ ය. ''අනේ වෙලා තියන දෙයක්! කමක් නෑ. අව් රස්නයෙන් ඔය පුස් ලකුණු බොහොම ඉක්මනින් නැති වෙයි.'' ඇසි පිය යන්තම් හෙළුණු පමණින් ඔහුගේ ස්වභාවයේ බැරෑරුම්කම සැහවීමට හේ සමත් විය.

සේරා ඔහුගෙන් එය උදුරා ගත්තා ය. ''බොහොම ස්තුතියි. තනියම වැඩ කරගන්ට මට හොඳට පුළුවන්.''

''ඔබට කැමැත්තක්'' හියු ඇ පිටිපස ගලක් මත වාඩිවුණි. ඔහු බොහෝ වෙලාවක් නිහඬව සිටි බැවින් ඕ පස්ස හැරී බැලුවා ය. ඔහුගේ කළුවන් හිස චිත්‍ර අඳින පලකයකට නැමී තිබුණි. එහි අඳින කඩදසිය මත පැන්සලය ශීඝ්‍ර ව ගමන් කරන බව දක්නා ලදී.

නිරායාසයෙන් මෙන් ඕ අඩියක් ළං වූවාය.

''හියු නෙවිල්, ඔතන ඉඳන් මා ව අඳින්ට පුළුවන් කියා ඔබ හිතනවා නම්''යි ඕ කථාව ඇරඹුවා ය.

ඔහු ඒ කොළය ගලවා ඇට පෙන්නුවේ ය. එහි ඉතා විශිෂ්ට ලෙස ඇඳ තිබුණේ පොකුණක් ඉස්මත්තේ ගසක වියලුණු අත්තක හුන් පිළිහුඩුවකු ගේ රූපයකි.

ටොම් ගේ මේ තඹ පාටැති සිහින් සිරුරක් සහිත මස්සිනා කොතරම් පුදුම කෙනකු දැයි ඇට සිතුණි. මෙතෙක් කල් ඇ සිතා සිටි අන්දමට නො ව ඔහු දක්ෂ චිත්‍ර ශිල්පියකු බව පෙනී ගියේය. ඇ නොකැමැත්තෙන් ම වාගේ හිස හරවා බැලූ විට කළුවන් අතුපතර මැද, දිලිසෙන පියාපත් ඇති ඒ අලංකාර පක්ෂියා ඕ දුටුවා ය. ඇ බලා සිටියදී ම ඌ දිය පිට වැටුණු ගලක් මෙන් වහා පියාඹා අවුත් මසකු ඩැහැගති. හොටෙන් ගත් මසු දහලද්දී ම ඌ අසල පිහිටි වන ලැහැබෙහි සැහවුණි.

මේ දර්ශනයෙන් ප්‍රීතියට පත් වූ ඕ තොල විකා ගත්තා ය. හියු අමුතු කල්පනාකාරී ස්වභාවයකින් ඇ දෙස බලා සිටින බව ඕ දුටුවා ය.

‘‘මෙරට මෙවැනි අලංකාර පක්ෂි ජාති හතක් ඉන්නවා’’යි කියමින් ඔහු ඒ රූ සටහන ඉරන්ට වුණි.

එය වැළැක්වීමට මෙන් ඕ ඉදිරිපත් වූවා ය. ඔහුගේ දෙබැම නැටවුණි.

‘‘ඔබට ඕනෑ නම් දවසක පිළිහුඩුවකු ගේ නියම රූ සටහනක් මම ඇඳ දෙන්නම්’’

‘‘ඔබ කොච්චර පුදුම මිනිහෙක්ද’’යි ඔහු දෙස බලමින් ඕ කීවා ය. ‘‘මගේ සැමියාට මේ කබල් වත්ත විකුණන්ට පුළුවන් තරම් ගරුසරුකමක් නැති ඔබ දැන් කිසි වරදක් නො කෙරුවා වාගේ මෙහි ඇවිල්ලා කුරුල්ලන් අඳිනවා–’’

තවත් රූපයක් අඳින්ට පටන් ගනිමින් ‘‘පිළිහුඩුවා කාගේත් හිත ගන්නා සතෙක්’’යි හියු කීවේ ය. ‘‘ඇත්ත කියතොත් වත්ත ගැන මමවත් හරි හැටියට දැන හිටියේ නෑ. ඒක මට ලැබුණේ ණයකට හිලව් වශයෙන්. එය සෑහෙන තරම් වටිනා හැටියට මට හැඟුණා.’’

‘‘වත්ත ගැන හරිහැටියට දැන හිටියේ නැති බැව් ඔබ දැන් කිව්වා! නුමුත් ඔබ ටොම්ට කිව්වා—’’

‘‘අනේ සේරා, මම ටොම්ට කිසි බොරුවක් කිව්වේ නෑ. මම ඔහුට කිව්වා අක්කර හයසීයකට ටිකක් අඩු ලස්සණ ඉඩමක් තියෙනවාය කියා. මීට වඩා ලස්සණ ඉඩමක් තවත් කොයින් ද? අරලිය වත්ත මම ගත්තේ ඒකේ අලංකාර පිහිටීම නිසා, උපකරණ ටිකකුත් බංගලාවකුත් තියෙන බව මම ඔහුට කිව්වා.’’

සේරා නැගිට්ටා ය. ‘‘ඔබ එය දැක තියෙනවා ද හියු නෙවිල්’’ යි ඕ මුදු වදනින් ඇසුවා ය.

හියු ද නැගිට්ටේ ය. ඈට වඩා ඔහු ඉතා උස බව පෙනුණි. ‘‘ඇත්ත නම් මේ ස්ථානය ටොම්ට විකුණන විට මම ගෙපැළ දැක තිබුණේ නෑ. එමෙන් ම ඔහු භාය්‍යාවක් ගෙනෙන බවත් මම දැන හිටියේ නෑ. ඔබ මගේ කීම විශ්වාස නො කරන බව මම දනිමි. මා වත්ත මිලයට ගත්තේ හොඳම විශ්වාසයක් පිටයි. මෙබඳු ගනුදෙනු මේ රටේ නිතරම වන දේවල්. බොහෝ විට අලුත් අයිතිකාරයන් කවදවත් වතු නො බලා ඒවා සල්ලි දී ගන්නවා.’’

‘‘නුමුත් ඔබ ටොම්ට ඇත්ත ලියා නෑව්වේ මන්ද?’’යි සේරා විචාළා ය.

හියු තිගැස්සුණි. ‘‘මම නැවතත් කියන්නේ මම ඔහුට කිසි බොරුවක් කිව්වේ නැති වගයි.’’

‘‘නුමුත් ඔබ හුඟක් දේ අත් ඇරියා.’’

''මගේ කල්පනාවේ හැටියට ඔහුට ඒ තරම් අලාබයක් වෙලා නෑ.''

ඔහු වහ වහා තවත් රේඛා කීපයක් ඇඳ ඔහු අදිමින් සිටි චිත්‍රය ඇට දුනි.

නිසැකව ම එය ඇගේ රූපය යි. එහි හැම ලක්ෂණයකින් ම ඇගේ කෝපාවිෂ්ට භාවය පළවුණි.

''ඔබ තේරුම් ගන්ට බැරි කෙනෙක්''යි කියමින් ඇගේ මුවග පහළ වූ මඳ සිනහව වසන් කිරීමට ඕ පසෙකට හැරුණා ය. කෝපය කෙසේ වෙතත් ඔහු කෙරෙහි හාස්‍යෝත්පාදක ප්‍රිය භාවයක් ද ඈ තුළ ඇති විය. ''මට දූන් වැඩ වගයක් තියෙනවා. අජේ ගේ පදිංචියට සුදුසු තැනක් කිරීමට මට තියෙනවා.''

නිදැල්ලේ තණ කමින් සිටි අශ්වයා හියු කඩිසර ලෙස බැඳ ඈ පසු පස ගියේ ය. ''ඇත්තෙන් ම බංගලාව ගැන මට බොහොම කනගාටු''යි ඔහු කීවේ පසු තැවිලි ගතියකිනි.

''කරුණාකර යන්න, මට බොහොම වැඩ තියෙනවා''යි සේරා කියමින් ඉක්මනින් ගමන් කළා ය.

''මොනවා ටොම් නො බලා යන්න ද?''

සේරා පසු බැස්සා ය. ''ඔබට ටොම් හම්බවීම මට වළක්වන්ට බැරිය කියා මම හිතනවා''යි ඕ හෙමිහිට පැවසුවා ය. ''නුමුත් ඔබ ඔහුට කියාපු බොරුවල හැටියට මෙහි පස් පාගන්නේ කොහොම ද?—''

හියු සමාව අයදින ලීලාවෙන් දත් පා සිනාසුණේ ය.

''සේරා, ඔබ මාව බොහොම තදින් වරද්දලා තේරුම් ගන්නවා. සමහර විට ටොම් බලාපොරොත්තු වුණු තරම් ලන්තානාව දියුණුවෙන් අඩු වෙන්ට පුළුවනි. නුමුත් මේ කාලයේ මෙයින් පල ප්‍රයෝජන ලැබීමට ඇති මාර්ග බොහොමයි. විශේෂයෙන් ම දූන්.''

තරහ මුහුණකින් යුතුව සේරා ගේ තුළට ගමන් කළා ය. යමක් අහුලා ගැනීමට ඈ නැමුණු හැම විටක ම පිටිපස සිටි ඔහු එය බැගෑපත් ලෙස ඇගේ අත්වලින් ගති. මෙය විහිළුවක් වැනි වූ බැවින් එක් අතකින් සිනහ මුසුව ද අනික් අතින් කෝපයෙන් ද සේරා හදිසියෙන් ම අවනත වූවා ය. හියු නෙවිල් ඔහුගේ සිතැඟි පරිද්දෙන් ම දමනය කිරීමට ඉටාගෙන සෘජු ව සිට ගත්තා ය.

''කරුණාකර අර පකිස් පෙට්ටි බරාදයට අදිනවා ද?'' යි ඕ නිසල ව ඇසුවා ය.

ඔහුගේ මුව සැලුණි. ''හොඳයි, නෝනාමහත්මයා.''

එතැන්සිට මුළු උදය කාලයේ ම ඔහු ලවා බඩු මුට්ටු පිළියෙළ කර වූවාය. ධූලි වැකුණු ඇඳුම් ඇති හෙතෙම අන්තිමේ දී තමාට ඉතා වෙහෙස බව හැඟ වූයේ ය. ඈ සමග කතා බස් කිරීමට ඔහු සැරසුණු හැම විටක ම සේරා ඔහුට වැඩක් පැවරුවා ය. අන්තිමේ දී මනා සේ සකස් වූ කාමරයකට ගොස් හේ නළලින් ඩාදිය පිස දමන්නට වන.

''සේරා, ඔබ මිනිසුන් මරවා වැඩගන්ඩ හරි හපනියක්.''

පළමුවෙනි වරට සේරා ඔහු දෙස බලා සිනාසුණා ය. ''ඔය තරම් බර වැඩ ඔබට කරන්ට පුළුවන් කියා මං හිතුවේ නෑ''යි ඕ ලජ්ජාවෙන් මෙන් කීවා ය.

''නෑ, ඒ වැඩ කිරීමට පුළුවනැයි මට වත් හිතුණේ නෑ.''

ගේ පිටිපස ඇති පිල්ලට ගොස් ඔහු මූණකට සෝදගෙන ඉතා පිරිසුදු සුදු පටලේන්සුවකින් දැත් පිස දමමින් කෑම කන කාමරයට පැමිණියේ ය.

හදිසියේ ම කලබල වූ ඕ ''බන්ඩා'' යයි අඩ ගැසුවා ය.

ඒ තරුණයා දුව අවුත් එහි බලාගත්වන ම සිටියේ ය.

''ඔබේ වැඩ හවර ද?''යි ඈ ඇසුවේ ඔහුට ඈ කියන වචන නො තේරෙන බව මතක නැතිව ය.

බණ්ඩා ඈ දෙස තවමත් බලා සිටින අතර හියු කම්මැලි කමින් අත දිඟු කොට ඔහුගේ කරින් අල්ලා සිංහලෙන් කතා කළේ ය.

''ඔහුට යන්න හරින්න! ඔබ ඔහු බය කරවනවා''යි සේරා වහා ම පැවසී ය.

මොහුගේ සිංහල කතාවට ළමයා ගේ මුහුණේ සිනහ රැල්ලක් පහළ වී දෙන ලද්දේ උද්‍යොගවත් පිළිතුරකි. පිටට තට්ටු කොට හියු ඔහුට යන්ට හැරියේ ය.

''ඔබ ඔහුට දුන් මුදල ඔහු එවූ මිනිසාට දෙන්ට තියෙනවා. නුමුත් ආපහු ඇවිල්ලා ඔබට වැඩ කරන්න ඔහු කැමතියි. ඔබ මිනිසුන් මරවා වැඩ ගන්න හැටි ඔහු දන්නේ නෑ.''

සේරා හිස සැලූ විට ළමයා ප්‍රීතියෙන් බැහැරට ගියේ ය. නුමුත් කලබල සහිත අවස්ථාව මහහැරුණි. හියු ඉදිරිපස බරාදයට ගොස් මීටියාවත දෙස බැලී ය. ''අන්න දූන් එනවා ටොම්. හීලෑ බැටළුවකු වාගේ ගොන්සාලේසුත් පස්සෙන් එනවා. හොහෝ! අන්න ටොම්!''

අත වනමින් ඔහු ටොම් හමුවන්ට ගියේ ය.

නැවතත් හියු ගේ කපටිකම්වලට ටොම් අසුවේදෝයි සේරා සැක සහිත වූවා ය. ආකර්ෂණ බලයක් ඔහුට තුබූ නමුත් ඈ වසහ කර ගැනීමට ඔහුට කිසි කලෙකත් නො හැකි වනු ඇත. යම් විදියකින් ටොම් හියු ගේ වචනවලට රැවටී වත්තේ තත්ත්වය සම්බන්ධයෙන් ඔහුගේ අදහසට ම එකඟ වුණොත්?

එහෙත් මේ දෙදෙනා කඳු මුදුනතට හෙමි හිට ආ විට සේරා ඒ ගැන බිය වියයුතු නො වන බව සැලකුවේ තරමක ගර්වයෙනි. යටපත් කළ නො හැකි හියු අවනත නො වී ය. ''ඔබට යම් උදවුවක් ඕනෑ නම් ටොම්, ඒක මට දන්නන එක විතරයි තියෙන්නෙ''යි ප්‍රමුදිත ලීලාවකින් ඔහු කියනු ඇට ඇසුණි.

''බොහොම ස්තුතියි, නුමුත් මට තනියම වැඩ කරගන්ට පුළුවන්''යි ටොම් එඩිතර ව පිළිතුරු දුන්නේ ය.

හියු ඇට අතින් ආචාර දක්වමින් අසුපිට නැග කන්ද පාවුල දෙසට පිටත් විය.

වතුර වළ ළහ තුබූ ඉරන ලද පිළිහුඩු චිත්‍රයේ කඩදසි කැබලි සුළඟකින් විසිරෙන්ට වන.

සේරා ටොම් ගේ අත අල්වා ගත්තා ය. හියු දුන් ඇත සිටි නමුත් ඔහුගේ සම්ප්‍රාප්තියේත් අවඥ සහිත මඳ සිනාවේත් ජායා මාත්‍ර තවමත් එහි රැඳුණාක් මෙනි. ''හියු පළමුවෙන් ම එංගලන්තය හැර එන්ට පෙර ඔහුත් ඔබත් අතර ඇති වූ නො මනාපය මොකක් ද ටොම්.''

ඔහු ගේ අත දැඩි වූ බවක් දැනිණි. ''ගිය දේ ගියාවේ, සේරා. යමෙක් දැනමුතු වයසට එනතුරු කළ කී දෙයින් ඔහු මැන ගන්ට බෑ.''

''නුමුත් ඒ කාලයේ ඔහුගේ වයස විස්සක් නේ ද? පොඩි ළමයෙක් නො වෙයි—''මේ මිනිසා ප්‍රිය ජනක ය. එහෙත් තමාට හැඟුණ අන්දමේ දුෂ්ටයකුවත් ඇලිසන් පැරඩේ කියන් පරිදි සල්ලාලයකුවත් නො ව පහසුවෙන් සිතා ගන්ට බැරි අන්දමේ පුද්ගලයකු ලෙස වැටහීමට හියු ගේ බාල කාලයෙන් කුමක් දෙස් දෙන්නේ දැයි සේරා කල්පනා කරන්ට වූවා ය.

රථවාහන අනතුරකින් සිය මවු පිය දෙදෙනා මළ පසු මේ අනාථ ළමයා ප්‍රන්සයේ සිට ටොම් ගේ පියා ''බරැන්ටවුඩ'' මන්දිරයට ගෙනා දවසේ විස්තරයක් ටොම් හෙමි හිට කියන්ට විය.

''හියුට ඇති වූ කනගාටුව කවදවත් කිසිකෙනෙකුට දැනගන්ට ලැබුණේ නෑ. ඔහු ඒ තරම් හොඳට එය යටපත් කරගෙන හිටියා. නුමුත් තුන් වරක් ඔහු පැන ගියා. ඔහු අපේ ගෙදර නියම වශයෙන් ම පදිංචි වීමට බොහෝ කාලයක් ගතවුණා.''

සේරා හිස සැලුවා ය. ඔව, හියු නෙවිල් ඔහුට ම විශෙෂ වූ ආඩම්බර ලීලාවක් ඇත්තෙකි.

''ඔහු කිසි බයක් නැති පුදුම ළමයෙක්. මට මතකයි හැම දෙනා ම භයගැන්නූ දඟකාර විශාල අස්සයෙකු ඔහු හීලෑ කළ හැටි. වරක් ඔහු උගුලක අසුවී මැරෙන්ට වැටුණු බළල් පැටියෙකුත් බේරා ගත්තා. සමහර වේලාවලට පුදුම අන්දමේ තද ගතියක් ද ඔහුට තිබුණා. බොහෝවිට ඔහු මුල්ලකට වෙලා කෙළවරක් නැති තරමට රූප ඇන්ද.''

සේරා සිනහ වූවා ය.

පුදුමය නම් ඔහුගේ දඟකාර කම හා නො සන්සුන් ගති කොපමණ තිබුණත් ඔහු හැම දෙනාට ම ප්‍රිය වීමයි. ඔහුට නිකන් ඉන්ට පුළුවන් නම් යන්තම් වත් වැඩක් කළා යයි මම හිතන්නේ නෑ. නමුත් ඔහු හැම විභාගවලින් ම සමර්ථ වුණා. ඔක්ස්පර්ඩ විශ්ව විද්‍යාලයට ඔහු යැවීම කාලය අපතේ හැරීම කැයි මගේ පියා කල්පනා කළා. එ නිසා ඔහු බූදලේ භාරකාරයා හැටියට පත් කළා.''

ටොම් මඳක් නැවතුණි. ''හියු ගේ මුදල් එහි යොද තිබුණා. මගේ පියාත් හියුත් ''බරුන්වවුඩ'' මන්දිරය හා ඊට අයිති ගොවිපළවල් හවුලේ අයිති කර ගෙන හිටියා. පස්සේ හියු ගේ පියා මැරුණාම මගේ පියා හියු ගේ භාරකාරයා හැටියට පත් වෙලා මේ වැඩ පිළිවෙළ පවත්වා ගෙන ගියා. කාලය නරක අතට හැරී අපට අත ගහන්ට තිබුණු හැම ශතයක් ම ගන්ට සිද්ද වුණා.'' යළි හේ පසු බැස්සේ ය. ''හියු අවුරුදු විස්ස කාලයේ දී අවාසනාවන්ත සිද්ධියක් වෙලා මගේ පියා ඔහුට හොඳට ම බැණ වැදුණා. හියුට කේන්ති ගියා ම යකා වගේ. ඔහු ඔහුගේ බඩුත්, මූල ධනය සියල්ලත් ඇරගෙන පිටත් ව ගියා.''

''නමුත් බාලයෙක් ව ඉඳන් ඔහුට එහෙම කරන්ට පුළුවන් ද?'' යි සේරා ඇසුවා ය.

''මුදලේ භාර කාරයා හැටියට ඔහුට චැක් පොත් ලබා ගන්නට පුළුවන් වුණා. නීතිය අතින් නම් මෙයින් ඔහු වළක්වන්ට තිබුණා. නමුත් ඒ ගැන දෝෂාරෝපණ අසන්ට මගේ පියා කැමති වුණේ නෑ.''

''කොහොම වුවත් ඒවා හියු ගේ ම සල්ලි නෙ.''

''නමුත් මෙහි දී සැලකිය යුතු දේ නම් ඔහු ඒ සල්ලි ගත්තේ බූදලේට බොහොම අමාරු අවස්ථාවක දී. මගේ පියා ඒ ස්ථානය උකස් කර තුබුණු එක නිදහස් කිරීමත් වැළකුණා. මා එසේ ක්‍රියා කිරීම වැඩිය හොඳ නැති නමුත් මම ලන්ඩනයට ගිහින් හියු අල්ලා වාඩුව ගත්තා. ඔහු හදිසියේ ම ළමයකු

මෙන් දත් පා සිනා සුණි. ''එයින් විශාල හොඳක් වුණා නෙවෙයි. තරමක යහපතක් සැලසුණා...... අර ගිය අවුරුද්දේ ලන්ඩනයේ තද මීදුම පැවති දවසේ මගේ වෙළඳ සමාගමත් සමග ඔහුට ගනු දෙනුවක් තිබුණේ නැත්නම් අපි කවදවත් හම්බ වෙන්නේ වත් මෙහෙම මේ රටට එන්ට වෙන්නේ වත් නෑ.''

''ටොම්, හියුට එංගලන්තය හැර ද මුලින්ම එන්ට සිද්ද වුණේ මොකද?

''ඒක පෙම් පුවතක්– ඔහුට නො ගැළපෙන පවුලක තරුණියක් සමග පෙම් කිරිම නිසා වෙච්ච වැඩක්. ඒ ගැන ඔබට මා කියන්නේ මෙච්චර යි.''

සේරා ලන්තානාවට උඩින් පිහිටි කන්ද දෙසට නෙත් යොමු කළා ය. හියු නො පෙනී ගියේ මේ දිසාවට ය.

''මා කසාද බැන්දේ ඔබ වීම ගැන මම ඉතාමත් ප්‍රීති වෙනවා, ටොම්''යි ඔ හෙමිහිට පැවසුවා ය. ඇගේ දැත් ඔහුගේ දැඩි ඇඟිලිවලින් තද විය.

5

සේරා නිශ්චල ව ඇඳේ වැතිරී සිටින විට බිමින් කිසියම් ශබ්දයක් ඇසුණි.

ඒ අන් කිසිවකින් ආ එකක් නො ව බිම දුවන මීයන්ගෙන් නැඟුණු හඬකි. එක් මීයකු ගේ දිවීම නිසා වීදුරුවක් ද බිම වැටී බිඳුණි. හොරුන් වත් ගෙට වැදී දෝ යි සැක කළ ටොම් ඔහුගේ ඇඳ යට තිබූ තුවක්කුව අතට ගත්තේ ය.

''මේ මීයෝ, ටොම්.''

හේ නැවතත් අනික් අතට හැරී නිදන්ට වන. ටික වේලාවක් ගත වූ පසු මීයන් ගේ හිරිහැරය නැවතුණේ ය. ඉඳ හිට බංගලාවෙන් ඈත තණ බිමෙන් සිවලකු ගේ හූ හඬ නැඟුණි. තවත් වරෙක කොටියකු අල්ලා ගත් මුවකු ගේ හෝ වල් බළලකු විසින් ඩැහැගත් හාවකු ගේ මරහඬ නැඟේ. ඇට නින්ද ගියේ අලුයම් වූ විට ය.

කම්කරුවන්ට රැස්වීමට තළාව පිඹීමත් සමග ම ටොම් අවදි විය. ඒ ඇඳ පසෙක සිටි එකුන් විසි වියට වඩා නො වැඩී සේ පෙනුණු සේරා ගේ නිල්වන් කෙස් කළඹ විහිදී දෙනෙත් වෙසෙසින් බර වී තිබිණි. කාමරේට තද මී දුමක් උදේ ගලා එන්ට වූයෙන් හේ ඇට රෙද්දක් පෙරවූයේ ය.

බළල් පැටවකු මෙන් ඕ අකුළන ලද අත් දෙක මත හිස තබා ගත්තා ය.

''කීයද වේලාව, පෙම්වත?''

''හයට විතර ඇති. කම්කරුවන් ගේ පෙරෙට්ටුවට මම යන්ට ඕනෑ. ඔබ තව නිද ගන්න.

ඕ ඇනුමක් හැර හිස සලා ''ටොම්, අර මීයන් ආයිත් ආවා''යි පැවසුවා ය.

මීයන්ගෙන් වූ හිරිහැර ඇ විඳ දරාගත් සැටි ඇ විස්තර කළ විට හේ සිනාසුණේ ය. ''මොන ධෛර්යයක් ද? මා සිතුවේ නෑ ඔබ ඔය තරම් ධෛර්‍ය සම්පන්නය කියා.''

''මාත් හිතුවේ නෑ''යි පැවසූ ඇගේ ඇස්වලින් කලබල වූ ලකුණු පළවුණි. ''ඔබේ කෝපි ගස්වලට උන් බොහොම අලාභහානි කරනවා නේ ද?''

''ඔව්, උන් අල්ලා ගන්ට ඕනෑ. මම හිතනවා ගොන්සාලේස් අදත් තව හුඟක් පෙන්වාවි කියා.''

''දුප්පත් ටොම්.'' ඔහුගේ ඇසි බැම අතර වැටුණු රැල්ලක් ඇ සිය ඇඟිලි වලින් පිරිමැද්ද ය.

''කුලීකාරයෝ දවසකට දහක් විතර අල්ලනවා– ඔවුන් පුළුස්සා කන බව ඔබ දන්නවා ද? නුමුත් උන්ගේ රංචු නම් අඩුවෙන්නේ නෑ.''

''උන් එන තරම ඉක්මනින්ම යන්ට යාවි, ටොම්. ගොන්සාලේස් එහෙම කියනවා මට ඇහුණා.''

''එතකොට මගේ කෝපි පඳුරු ඉතුරුවෙලා තිබුණොත් වාසනාවක්.''

කිරි නැති කෝපි කෝප්ප දෙකකුත් කැබින් විස්කෝතු දෙකකුත් රැගෙන බණ්ඩා එහි ආවේ ය. විස්කෝතු කා ටොම් මුහුණ පුළුටුකර ගනිමින් කෝපි බීවේ ය.

''අපි මේ තරම් මහන්සි ගන්නේ මෙ වැනි දෙයක් වවා ගන්ට නම් ඒ කරන්නේ මොකට දැයි මට හිතෙනවා.''

සේරා තනියම සිනාසුණා ය. එළ දෙනක හා වසු පැටවකු ගම සිට ගෙනෙන මෙන් ඇ දනට ම ගොන්සාලේස්ට කියා ඇත. හෙට ටොම් ගේ කෝපි වලට කිරි ලැබේ. ඇ බටර් හා කේජු සාදන්ට ද පිළියෙළ කර ඇත්තේ ය. මේවා වතුකරයේ ලබා ගැනීමට දුෂ්කර සුඛෝපභෝගී ද්‍රව්‍ය ය.

ඉරි වැටුණු වව්ඩ කලිසම් කට්ටලය, කළු හම් ඉණ පටිය හා වතුකාරයින් ගේ කොටු සහිත කබාය ටොම් ඉක්මනින් ඇඟලා ගත්තේ ය.

''අද උදේ කම්කරුවන් රැස්වන තැනට මාත් එක්ක ඔබ එන්ට කැමති ද, සේරා?''

සේරා වහා ඇඳෙන් පිටට පැන්නා ය. ''ඔබ ඔහොම අහනතුරු මම පුල පුලා සිටියා.''

බංගලාවේ සිට බඹ පන්සියයක් ඇති නැති තරම් දුරින් කෝපි ඇට ශුද්ධ කරන ස්ථානයත් ගබඩාවත් විය. මීට මඳක් ඔබ්බෙන් වූයේ කම්කරුවන් රැස්වන තැන ළඟ පිහිටි කෝපි මැස්ස ය.

කෝපි ඇට ශුද්ධ කරන ස්ථානය පළමුවරට දුටු සේරා කළකිරුණා ය. මෙය කණු කීපයක් මත රඳුණු, අතු සෙවෙණි කළ වහළක් ඇති, වරිච්චි බිත්තියෙන් තැනූ මඩුවකි. මෙහි දුමක් ද තිබුණි. තමන්ගේ නිවෙසෙහි මෙන් මෙහි පිහිටි කවුළු ද මී හරක් හම් සරණේරු හැර වෙනත් සොයිබ ආදියෙන් තොර විය. ඒ ගෙට වාතාශ්‍රය හෝ ආලෝකය ලැබීමට මහක් තිබුණේ ම නැත.

ගේ ඇතුළට ගිය ඕ එහි උස් වේදිකාවක් මත වියළි කෝපි ගොඩ ගසා තිබෙනු දුටුවා ය. ඊට යටින් කෝපි ඇට ශුද්ධ කරන යන්ත්‍රයත් ඊට අඩි තුනකට පහළින් පැසවන හා සෝදන භාජනත් තබා තිබුණි.

ගොන්සාලේස් ඔවුන් සමග ඒ ගෙට ගියේ ය. ඔවුන් පිටිපස කම්කරුවන් ගේ නාම ලේඛනය එක් අතකින් ද තෙල් කඩදසි කුඩය කිහිල්ලේ ද තබාගෙන ලජ්ජා හරිත ව සිටි ඔහු දෙසට ටොම් හැරුණි.

''ගොන්සාලේස්, මේ ගැන මට වඩා දන්නේ ඔබ යි. මෙහි විස්තර ඔක්කොම අපේ නෝනාට ඔබ ම කියන්න.''

කැරකෙන සිලින්ඩර් දෙකේ ඇති ගැටවලින් කෝපි ඇටවල පොතු ගැසෙන සැටි ඕවර්සියර් මනා ලෙස විස්තර කෙළේ ය. කැපෙන පොතු සීරි ගොස් ඒ පොතු වැටෙන වළට වැටී පසු ව මේ සුදු ඇට මේ පෙනේරයට වැටේ ය යි හේ කීය.

''ඊට පසු ඒවා වැටෙන්නේ ජල භාජනයකට සම්බන්ධ වූ මේ කාණුවටයි.'' කියමින් ටොම් කතාව කෙළවර කෙළේ ය.

සේරා කරුණු අවබෝධ වූ බව හඟවන්ට තැත් කළ නමුදු යන්ත්‍ර සූත්‍ර ඇට ජීවිතයේ තෝරා ගත නො හැකි අවලක්ෂණ අබිරහසක් විය.

''සිලින්ඩරයත් මන්නයත් අතර ගල් හෝ වෙන ලෝහජාතියක් හිරවුණොත් වැඩේ වැරදුණා තමයි''යි ටොම් පැවසී ය. ටොම් මල බැඳී තුබූ යකඩ හෙම්හිට අතගා ''මට තෝරා ගන්ට බැරි ඔබ මෙය ක්‍රියා කරවන්නේ කොහොම ද යන වගයි.''

''මෙය වැඩි කලක් පවතින්නේ නෑ, සර්.''

ඒවගේ ම මේ ගෙපැළද වැඩි කල් නො පවතින බව වට පිට බැලූ සේරාට නැගුණේ දෙම්නසිනි.

''ඇන්ස්ටරුතර් මහත්තයා මෙච්චර මේවා නො සලකා හැරියේ කෝමද?''යි ඕ පුදුම පත් ව ඇසුවා ය.

''එයා ව අපට මැනගන්ට බැ, සේරා. විපත්තියකට පත්වුණා ම අපිත් මොනවා කරයි ද කියා අපට කියන්ට පුළුවන් ද?''

නො සලකා හරිනලද මේ ගස්වලින් ගොන්සාලේස් මහත් උත්සාහයෙන් බේරා ගත් අස්වැන්න ස්වල්පයක් කඩාකප්පල් වූ උපකරණවලින් සකස් කර ගෙන තිබුණි. එහෙත් මැතක පැවති අස්වැනි කාලයෙන් ඉතුරු වූ පුස් ගඳ ඉවසා ගත නුහුණු සේරා හෙම්හිට බැහැර ව ගියා ය.

ඇ එසේ හැරී යන විට ''ඊයේ රාත්‍රියේ මීයන්ගෙන් හුඟක් අලාභ හානි වුණා ද?''යි ටොම් විචාරනු ඇට ඇසුණි.

''ඔව්, සර්, බොහොම විශාලයි. අප හුඟක් දුරට පසුබස්සන්ට තරම් එය සැහේ.'

තුන්දෙනා කම්කරුවන් රැස්වන තැනට නිසොල්මනේ ඇවිදින්ට වූහ. පුරුෂයෝ දෙපේළියක ද ස්ත්‍රීහුත් දරුවෝත් තවත් පේළියක ද සිටියහ. ගොන්සාලේස් මොවුන්ගේ නම් ලියා ගන්ට පටන් ගති. එහෙත් සේරා දුටු විට කම්කරු ස්ත්‍රීන් අතර තොර තෝන්වියක් නැති කතා ඇරඹුණි.

''පේස වන්ඩා'' (කථා කරන්න එපා)යි ගොන්සාලේස් ඔහුගේ තරමට වඩා මහ හඬින් ගුගුළේ ය.

''හරියට ම ගැණු වාගේ'' යයි ප්‍රීති සහගත ව කියමින් ටොම් ඕවර්සියර් ළඟට වුණි. ''අපි මොවුන් තියාගත යුතු ද? ගොන්සාලේස්. මට පේන හැටියට මේ ස්ත්‍රීන් එක්කෝ වඳුරන් කෑගහන්නාක් මෙන් චරචර ගගා කතා කරනවා. නැත්නම් බොරු ලෙඩ අරං වැඩට එන්නේ නැ.''

''සර්, කෝපි නෙළීමට ඔවුන් පිරිමින්ට වඩා කඩිසරයි.'' එසේ ද කියා ගොන්සාලේස් නැවතත් ''පිරිමින් සතුටින් වැඩෙහි උනන්දු කරවන්නේ ඔවුනු''යි කී ය.

සේරා මේ දෙදෙනා දෙස බලා සිනාසුණා ය. ගොන්සාලේස් ලබාගන්නට හැකිවීම ටොම් ගේ කොතරම් වාසනාවක් ද? පළමුවෙන් ම ඉඩම් මිළයට ගත් විදේශීන් අතුරෙහි වූ ස්කොච් ජාතිකයන් දෙදෙනකු යටතේ පුහුණුව ලැබූ මොහු දක්ෂ වැවිලි කරුවෙකි. ඒ ඇරත් වෙන අය මෙන් නො ව මේ ස්කොච් ජාතිකයෝ ඉතා පරිස්සමින් ඉඩම් සශ්‍රීක කළහ. ගොන්සාලේස් ස්වකීය

නො සැලකිලිමත් ගතියත්, මීටි බවත්, කළු පැහැයත් උරුම කර ගත්තේ ප්‍රතිකාල් හා සිංහල මිශ්‍රණයක් ලැබූ ඔහුගේ පියාගෙනි. එහෙත් මේ සියල්ල සමග, කවුරුනුත් ප්‍රිය කරන විනීත භාවයක් ඔහුට තිබුණේ ය. ඔහුගෙන් බොහෝ දේ පිළිබඳ ව, විශේෂයෙන් ම කම්කරු ප්‍රශ්න විෂයෙහි, අවබෝධයක් ලබත හැකි යයි ටොම් සිතූ බව ඕ දැන සිටියා ය.

ඇගේ බැල්ම කම්කරුවන් දෙසට යොමු විය. හදිසියේ ම ඕ රවා බැලුවා ය. මේ කණ්ඩායමේ නායකයා ලෙස පෙනෙන අර දෙමළා ගේ මුහුණ කොතරම් නපුරු ද? ඔහු හා ගොන්සාලේස් අතර අරගලයක් ඇරඹී තිබුණි. කළුවර ලීයක් තරම් කළු වූ ඔහුගේ අතින් ගත් සැරයටියක් ඇතිව ඔහු දුන් කර්කශ පිළිතුරු අසා ඇගේ ඇඟ කිලි පොලන්නට විය. ටොම් ගේ කට හඬ ද මේ විවාදයට මෘදු ලෙස ඇදී ගියේ ය.

''ඇති ගොන්සාලේස්. නැති වෙච්ච ආවුද ගැන වග කියන්ට ඕනෑ ඔහු බව මම කියන හැටියට ඔහුට කියනු. ඔහු කැමති වුණත් නූණත් ඔහු ඒවා ආපසු ලබා දෙන්ට හෝ අලාභය ගෙවන්ට හෝ ඕනෑ.''

ඔහු එකෙණෙහි යන්ට හැරුණි.

''එන්න සේරා, මේ කම් කටුළුවලින් ඔබ ඈවත් කරගන්ට.''

ටොම් ඇ සමග කෝපි ගස් අතුරෙන් ගමන් කරත් ම කන්කානියා ගේ රළු පරුෂ වචන ද සෙමින් නැසී ගියේ ය.

''මේක අලංකාර ඉඩමක්''යි හේ කල්පනා හරිත ව කීය.

''ටොම්, ඔබ ඇයි අර නපුරු මිනිහා තියාගෙන ඉන්නෙ. අර අර කන්කානියා.''

''ඔහු වත්තට තියෙන ණය බේරාපු වහා ම ඔහු අස් කරනවා.''

ඕ වෙවුලන්ට වන. ''ඔහු බොහොම දුෂ්ට යි.''

''ඔහුට හිතුණා ම හොඳට වැඩ කරනවායයි ගොන්සාලේස් මට කියනවා.''

''පෙම්වත, ඔබ ඔහු අස්කරනවා නම් මම කැමතියි. ඒ කියන්නේ දැමම ම.''

ටොම් ඇ දෙස මඳ සිනාවක් පා මෙසේ කී ය. ''ප්‍රේමිය, මේවා ගැන මම ක්‍රියා කරන්නම්. ඔබට වෙහෙසෙන්ට ඕනෑ තරම් වැඩ තියෙනවා.''

ඔවුන් වත්තේ ගමන් කරන විට ඇගේ සිතින් කරුප්පන් අතුරුදන් වුණි. ටොම් වත්තේ රුචිර දර්ශනය ගැන කී දේ නම් සැබෑ ය. දැනට ලන්තානා වේ යම් යම් අඩු පාඩු තිබුණත් ගිරි ශිඛර අතර පිහිටි මේ ස්ථානය ශ්‍රී ශොභා

වෙන් අනූන ය. කඳුරැලි අතර ගලින් ගල ගලා බස්නා කුඩා දිය ඇලි ය. මැටි බිම් ඉවුරු හා සිහින් මිවන පඳුරු ද නිල් හා රන්වන් කුසුමින් බර වූ උඩ වැඩියා (ඕකිඩ්) පැළ රැඳි ගස් ද වූයේ ය. සෘතු ගුණයෙන් ගෙවී ගිය තද බැවුම් සහිත හෙල් ඇති මේ බිම් පෙදෙස කඳු මුදුන් දක්වා උස් ව පැතිරිණ.

''මෙය මා දැක තිබෙන ඉතාම අලංකාර ස්ථානය''යි ඕ හුස්මක් හෙළා කීවා ය. එය ඔවුන්ට ම අයිති බව ද ඇට සිහි පත් විය. ''මෙය හොඳින් රැක ගැනීමට මට පුළුවන් හැම දෙයකින් ම උදව් කරන්නම්. ටොම් , එය මම ස්වයං පොෂිත කරවන්නම්. මේ වත්ත මම මලින් ගවසන්නම්.''

ටොම් ඇගේ අත තදින් අල්ලා ගති. වහා දුව ගොස් වැඩ පටන් ගැනීමට සැරසුණු ඕ ''මගේ කුකුල් කොටුවට යන්ට ඕනෑ''යි කීවා ය. ඇගේ උනන්දුව ගැන ටොම්ට සිනා නො වී සිටිය නො හැකි විය.

ඇ යන්ට හැරුණුවිට වත්තේ ඇත කෙළවර තණ බිමක සුදු පාට කිසියම් දෙයක් ඇගේ ඇසට ගොදුරු වූයේ ය.

''ටොම්, අර ඇත ගේ ඔබට පේනවා ද? එතරම් හුදෙකළා තැනක පදිංචි ව ඉන්නේ කවුද කියන එක මට පුදුමයක්.''

ඒ පිරිසිදු තනි ගෙය බාගයක් ගස් වදුලෙන් වැසුණේ, කඳු බැවුමක පිහිටි යේ ය.

ටොම් හිස සැලී ය. ''පළමුවෙන් ම වත්ත වටේ යන වීටත් මම එය දැක්කා. ඒක ගැන ගොන්සාලේස්ගෙන් මම අහන්ට ඕනෑ. එය මගේ මායිම තුළයි තියෙන්නේ.''

එහෙත් ඔහු ඒ ගැන ගොන්සාලේස්ගෙන් අසා එහි කලක සිට ම ස්ත්‍රියක් පදිංචි ව සිටින බව දැනගත් විට දැනට එය අප්‍රකට ව තිබීම යොග්‍ය යයි ටොම්ට හැඟුණි.

6

මීළඟ දවස්වල මෙකී මිටියාවතේ පිහිටි ගෙය ගැන සිත යොමු කිරීමට ටොම්ට ප්‍රස්තාවක් ලැබුණේ නැත. සේරා ගේ සිනා මුසු මුහුණ ද ඇගේ ධෛර්යය ද ඔහු කෙරේ ඇ තැබූ පරම විශ්වාසය ද මොහුගේ දුක් කම්කටුළු මැඩ පා, ලන්තානාව හොඳින් වැඩකරන වත්තක් බවට පත්කිරීමට ඔහු උද්‍යොගමත් කෙළේ ය.

සේරා ද ඇගේ හිරිහැර කරදර ආදියෙන් කිසිසේත් අධෛර්ය නො වී ගෙදර දොරේ වැඩ පොළවල නිරත වූවා ය. කරගැට එනතෙක් කුකුළු කොටු වල වැඩ කිරීමත්, වත්තේ මල් වැවීමත්, ලී බඩු පිරිසිදු කිරීමත්, පුටු රෙදි ආදිය මැහීමත් බණ්ඩාට කැම පිසන්ට ඉගැන්වීමත් ඇට තුබූ වැඩවලින් සමහරකි.

නියම වශයෙන් වතු වැවීම වැවිලි විද්‍යාවට වඩා අමුතු එකක් බව ටොම්ට වැටහුණේ අවු වැසි පිනි කිසිවක් නො බලා වැවීමේ කාර්‍යයෙහි යෙදෙන්ට වූ පසුව ය. බොහෝ විට මොහු ගොන්සාලේස් සමග කතාබස් කිරීමෙහි යෙදේ.

කම්කරුවන් නිසා වරක් කෝපයට ද වරක් සතුටට ද පත් වූ ටොම් වැඩි කල් නො ගොස් සිංහල හා දෙමළ ජනයා අතර හැසිරීම් විෂයෙහි ඇති වෙනස දැන ගති. සාමාන්‍ය වශයෙන් දෙමළ කම්කරුවන් බර වැඩට හුරු පුරුදු, පහසුවෙන් තේරුම් ගත හැකි පිරිසක් බවත් සිංහල ජනයා වඩා නුවණැති සැප පහසු කම් සොයන අය බවත් හේ දැන ගත්තේ ය.

වැවිලි කර්මාන්තයේ ජීවනාලි බඳු මංමාවත් ගැන ද ඔහුට කරුණු වැට හුණි. මේවා කොතරම් නරක තත්ත්වයකින් පැවතුණේ ද යත් එම පාරවල රථ වාහන යන්ට පෙර, වළ ගොඩලි සොයා බැලීමට මිනිස්සු ඉදිරියෙන් ගමන් කළහ. මීට අවුරුදු කිපයකට පෙර වතුකාර සංගමය පිහිටුවන ලද්දේ ඇත්ත වශයෙන් ම හොඳ මංමාවත් ඉදි කරවා ගැනීමට ය. කරුණු පැවැත්තේ මෙසේ බැවින් හොඳ ම වර්ගයේ කෝපි කොළඹට ලැබෙන විට නරක් වී තිබීමත් කම්කරුවන්ට ගෙනයන සහල් ඔවුන්ට සාගතයකින් පීඩා විඳින්ට සිදුවන තුරු සපයා දෙන්ට නො හැකි වීමත් පුදුමයක් නො වී ය.

කලට වේලාවට සහල් නො ලැබුණු විට ටික දවසකට නමුත් පිරිමසා ගන්ට සහල් ගන්ට පුළුවන් ස්ථානය ගොන්සාලේස් දනී. සමහර විට ගොන්සාලේස් හෝ ටොම් සාදුකින් පෙළෙන කම්කරුවන් කීප දෙනකුත් කැටුව ගම්පොළ පාර දිගේ අසුන් පිට අවුත් තමන්ගේ සහල් ගෙනෙන කරත්තය සෙවීමට පාරේ යන සෑම කරත්තයක් ම නතර කර බලයි.

අන්තිමට ඔවුන්ගේ කරත්තය හමු වේ. බොහෝ විට එය අලවංගු නැවෙන තරම් බර පැටවූ එකකි. මිනිසුන් මේ කරත්තය තල්ලු කොට පාර අයිනේ දීම සහල් බා බුසල් කාල හෝ බාගය බැගින් ගෝනිවල පුරවා වත්තට යවනු ලැබේ. යටත් පිරිසෙයින් තව මාසයකටවත් ආහාර ලබා ගැනීමේ ප්‍රශ්නය විසඳීමේ සහනය ඔවුන්ට ලැබුණේ යයි ඔව්හු සිතති.

හිමිදිරියේ සිට ඇඳිරි වැටෙන තුරු ටොම් ගොන්සාලේස් සමග වැඩ කළේ ය. වැසි කාලය ළඟාවීමත් සමග කලින් කැණ තුබූ වළ වල කුඩා පැළ සිටුවීමට නිසිකල් පැමුණුණි.

මැක්ලොයිඩ්ගෙන් ඉගෙන ගත් දේ ක්‍රියාවෙහි යෙදීමට ඉටාගත් ටොම් ඒ වළවල් පුරුදු ක්‍රමයට වඩා තවත් පළලට හෝ ගැඹුරට කණින්ට නියම කර කැලේ පස් හා පෝරවලින් ඒවා තරමක් දුරට පුරවන්ට සැලැස් වීය. ගොන්සාලේස් උපදෙස් අකුරට ම පිළිපැද්ද අතර ඔහු තරමක් දුකින් සිටියේ ය.

''සර්, මේ තරම් වැඩි වියදම් යන වැවිලි ක්‍රමයකින් අපි වියදම් අඩු කරන්නේ කොහොම ද? අනික් වතුවල—''

ටොම් කථාව කෙළවර කරන්ට ඉඩ නො දී මෙසේ කී ය. ''ඔව් මා දන්නවා අනික් වතුවල පැළ වළවල්වල ගසා ඒවා උඩට ළඟ ම තිබෙන පස් දනවා. වෙන වතුවල වල් නෙළීමක් හෝ පෝර දැමීමක් නෑ. ආවට ගියාට මේ ඉඩමේ වැඩ කරන්ට මා කැමති නෑ, ගොන්සාලේස්. මේ ඉඩම් එතරම් ම සශ්‍රීක නෑ. නමුත් සශ්‍රීක කරන්ට ඉඩ තියෙනවා. නො සලකා හැර දමා තිබෙන පඳුර වැඩි වශයෙන් කප්පාදු කිරිම හෝ නෙළීම අඩු කිරිම හෝ අමුතු බිම් මනාව සකස් නො කිරිම හෝ නියම සකසුරුවම් කම නො වේ.''

මේ සියලු වැඩට ඔහුගේ මුල ධනය කොතරම් දුරට පිරිහී යන්නේදැයි හේ හොඳින් දැක්කේ ය. එහෙත් වැඩය නිම කිරීමට මත්තෙන් හැකි තාක් සියල්ල කිරීම ඔහුගේ අධිෂ්ඨානය විය. වත්තට කිසි අඩුපාඩුවක් වෙන්ට ඉඩ නො තබා, තමන්ගේ සැප පහසු කම් නො තකා අන්තිම ශතය පවා ඊට වියදම් කිරීමට සේරා හා ටොම් ඉටා ගත් හ.

කෙසේ වෙතත් ටොම්ට පැවැති බැරෑරුම් ප්‍රශ්නය නම් කම්කරු ආරාවුල් ය. අලුත් ''ලයින්'' පේළියේ වැඩ අවසන් වූ වහා ම කරුප්පන් ගේ කම්කරුවන් එහි පදිංචියට ගොස් කඩා කප්පල් ව තුබූ පරණ ''ලයින්'' පෙළ අලුත් කම්කරුවන්ගේ පදිංචියට තැබුවේ ටොම් ඒ සම්බන්ධයෙන් කිසි ම නියෝගයක් දීමට පෙර ය. මේ මිනිසුන් පලවා හැරීමට ටොම් නො ඉවසිලිවත් වූවද පසු ව බොහෝ දුර කල්පනා කොට, මේ අවස්ථාවේදී කිසිවක් නො බැණ සිටීම යොග්‍ය යයි ඔහුට වැටහිණි. කරුප්පන් ගේ කම්කරු කණ්ඩායම වත්තේ බොහෝ කාලයක් මුළුල්ලේ සිටි පිරිසකි. එහෙත් වික්ෂෙපයට පත් ව සිටි ටොම් කවද හෝ බරපතළ කෝලාහල ඇති වන බව දැන ගත්තේ ය.

''සේරා මේ අවස්ථාවේ දී කරුප්පන්ට ඕනෑ හැටියට ක්‍රියා කරන්ට මා ඉඩදීම වැරදියයි ඔබ හිතනවා ද? ගොන්සාලේස් කියන්නේ මම ඔහු දෙට්ට දැමිය යුතුය කියායි.''

''කරුප්පන්ට-ඉන්ට ඉඩ හැරීම ඔබේ දුර්වල කමෙකැයි ඔහුට සිතෙන්ට පුළුවනි''යි සේරා හෙමිහිට පැවසුවා ය.

''දැන් ඔහු දෙට්ට දැම්මොත් කැරළි කෝලාහල ඇති වන්ට පුළුවන. මට වළක්වා ගන්ට ඕනෑ එක ම දේත් ඒකයි.''

''ඔබ කියන දේ නම් එක විධියකට ඇත්ත තමයි, ටොම්, නමුත් ඔහුට ඕනෑ හැටියට ඉඩ දෙන්ට මම කැමති නෑ. පෙම්වත, ඔහු මතක් වෙන කොටත් මට බයයි.—''

මෙය සැබවකි. වත්තේ සිටියවුන්ගෙන් ඇට බිය එළ වූ එකම තැනැත්තා මේ මහ කන්කානියා ය. තෙල් පැහැති මුහුණින් හා ඌරකුගේ බඳු කුඩා දෙනෙතින් ටොම් හා ඇ දෙස ඔහු හෙළූ දුෂ්ට බැලුම් ඕ නො රිස්සුවා ය. සොර කම් කළ ආයුධවලට ඔහුට මුදල් ගෙවන්ට සැලැස්වීම ගැන ඔහු ටොම්ට විරුද්ධ ව බැඳගත් වෛරය පහසුවෙන් අමතක නො කරන බව ද ඇට සිතුණි.

''ඔහුගෙන් මට බයක් නෑ. ඔහු රස්සාවෙන් පන්නා අරින්ට මට මහක් නැති නමුත් වචනවලින් ප්‍රකාශ කරන්ට බැරි තරම් ඔහු මට හිරිහැරයක්. වැඩි දවසක් යන්ට ඉස්සෙල්ලා ඔය ඌරාට මම පාඩමක් උගන්වනවා''

''ටොම් ඔබ නො කළ යුතු එක ම දේ ඒකයි. ''ශේරා ඔහුගේ අත මිරිකා ඔහු දෙස චකිත මුහුණකින් බැලුවා ය. ඒ දුටු හේ සිනාසුණි.

''හැමදා වගේ ම ඔබෙ කීම හරි ප්‍රෙමීය, තරහ නො වී ඉන්ට මම පුළුවන් තරම් උත්සාහ ගන්නම්.''

දහස් ගණන් වැඩ පළ මධ්‍යයේ ශේරා ගේ කාලය ඉක්මනින් ගෙවී යන අතර යම් යම් දුක් කම්කටුළු මහ හරවා ගැනීමට ඈට උපකාර වූයේ ටොම් ගේ කරුණා ගුණය යි. බංගලාවේ වහළය හෙවිල්ලන දවස්වල තද වැසි වසින්ට වූවිට ටොම් හා ශේරාටත් විශාල කුඩ දෙකක් යට මුළු රැයක් ගත කරන්ට වීම, මැසි මදුරුවන් ගේ පීඩා වළක්වා ගැනීමට බණ්ඩා ගොම රිටි පිළිස්සූ විට මදුරුවන් නො සිට ගියත් ඊට පසු සති ගණන් මුළුල්ලේ එකී දුමේ ගඳ පැතිරීම ද වැනි දේ කරණ කොට ගෙන මොවුන්ට අපමණ හිරිහැර කරදර ඇති වූයේ ය.

බණ්ඩා කරන මෙබඳු වැඩවලින් ඉඳහිට හිරිහැර ඇති වූ නමුත් හෙතෙම යමක් ඉගෙනීමට කැමැති නුවණැති තරුණයෙක් විය. ඔහුගේ ඉංග්‍රීසි දැනීම දවසින් දවස දියුණු වූ අතර ශේරාට ඔහු දන්නා පරිදි සිංහල ද ඉගැන්වී ය. බණ්ඩා ගේ කෑම පිසීම ද රසවත් වුණි. බොහෝ දවස්වල ශේරා හා ටොම්ට වට්ටක්කා හෝ කරවල සමග බත් කෑමට සිදුවුවත් කලාතුරකින් නමුත් ගමින් කුකුළු මස් ටිකක් ද ලැබිණි.

දවස්පතා උදෑසන ශේරා සියතින් ම කුකුළු පැටවුන්ට කැවීම ප්‍රිය කළා ය. දිනක් උදෑසන ඇගේ පුල්ලි වැටුණු සුරතල් කිකිළිය කරා ගොස් බිත්තර දමා ඇද්දූයි බැලීමට අත දමූවිට අධික ශීතල දෙයක් ශේරා ගේ අත වැදුණෙන් ඈ තිගැස්සී එකැවර අත ඇදගත්තා ය.

''ටොම්, හනික එන්න. කිකිළිය යට මොකෙක්දෝ ඉන්නවා. තුවක්කුවත් අරන් එන එක හොඳයි.''

ටොම් තුවක්කුව ද ගෙන වහා ම එහි පැමිණියේ ය. කිකිළිය ඉස්සූ විට, බිත්තර වෙළාගෙන සිටි නාගයෙක් පෙණය පුප්පමින් පැන්නේ ය.

වෙඩි පහර කෑ නයා ගේ බඩ බිත්තර වලින් පිරී තිබුණි. වෙඩි පහරින් තුවාල වූ ඌ ඇඹරී ගියේ ය.

තවමත් බියෙන් වෙවුලමින් මලානික ව සිටි ශේරා ''ඇත්තෙන් ම අපි ගත කරන්නේ අඳුරු ජීවිතයක් යයි කාටවත් කියන්න බෑ''යි පවසා වැඩිකල් නො ගොස් තමාත් තුවක්කුව පාවිච්චි කරන හැටි ඉගෙන ගන්ට ඉටා ගත්තා ය.

7

නෙවිල්ලාගේ දෙවෙනි ආගන්තුකයා බලාපොරොත්තු නො වූවෙකි. සේරාට නයා හමු වී වැඩි කලක් ගත වන්ට මත්තෙන් එක් සවසක ඇඳිරි වැටීගෙන එන වේලේ, මොවුන් මල්වත්තක් සකස් කරමින් සිටිය දී පතන හරහා නිදැල්ලේ මෙන් ආ අසකු පිට උන්, වෙහෙස පත් කෙනකු ඔවුහු දුටුවෝ ය.

නෙවිල් යුවළ ඒ තැනැත්තා කරා ළඟාවත් ම ඔහු පූජකයකු බව ඔහුගේ පළල් වාටියක් ඇති තොප්පියෙන් දැනගත්හ. ටොම් ඔහු සමාදරයෙන් පිළිගැනීමට කන්ද පාමුලට දිව්වේ ය. සේරා අමුත්තකු පිළිගැනීමට අවශ්‍ය දෑ සූදානම් කරන මෙන් බණ්ඩාට කියන්ට ගේ තුළට ගියා ය.

ආගන්තුකයා ගෙදරට පැමිණි විට ඔහු අසනීපයෙන් පෙළෙන බව සේරාට දැනුණි. ටොම් අසුගේ තෝන් ලණු අල්ලාගෙන ඒ අමුත්තා වාරු කරද්දී දෙතොල් දක්වා සුදුමැලි වූ ඔහු බඩේ ඇවිලීමකින් පෙළෙන බව දක්නා ලදී.

මේ පූජක තැන අසු පිටින් වැටෙන්ට යද්දී ටොම් ඔහු අල්වා ගෙන, සේරාගේත් උපකාරය ඇතිව ගෙදරට උසුලා ගෙන ගොස් ඇඳේ තැබී ය. නෞකාගමනේ දී අත් බෙහෙත් ටිකක් ගෙනෙන ලෙස නැවේ ශල්‍ය වෛද්‍යවරයා භාග්‍යයකට මෙන් ටොම්ට අවවාද කර තුබුණි. එසේ ගෙනා දිය කළ අබිං ටිකක් මිශ්‍ර කළ ''බ්‍රැන්ඩි'' වීදුරුවක් සිහිසන් නැති ව සිටි රෝගියා ගේ කටට වත් කරන ලදී.

රෝගියා උණ විකාරයෙන් දොඩන අතර ටොම් හා සේරා රෑ මුළුල්ලේ නිදි වරමින් වරින් වර ලෙඩාට සාත්තු සප්පායම් කළෝ ය. උදේ වන විට තරමක් සුවය ලැබූ ලෙඩා සැපසේ නිදමින් සිටියේ ය. ඔහුගේ නළලට වැටුණු සිනිඳු කෙස් රොදත්, මුහුණේ අව්‍යාජ පෙනුමත් නිසා හේ කුඩා ළමයකු මෙන් පෙනුණි.

මද්දහනේ දී පමණ අවදි වූ මෙතෙම ඒ අසල නැමී සිටි සේරා දිටී ය.

''ඔබ හුඟක් අසනීප ව හිටියා. නුමුත් දැන් සුව වේගෙන එනවා. මම තමයි නෙවිල් නෝනා''යි ඕ මුදු වදනින් පැවසුවා ය.

''නෙවිල් නෝනා?'' ඔහුගේ නළලත් රැළි වැටුණි. ''හා, හරි, මට දැන් මතක් වෙනවා. ඔබ මෙරටට ආවේ ඉතා මෑත දී නේ ද? මැක්ලොයිඩ්ලා හමුවෙන්ට ගිය විට ඔබ හමුවීමටත් නො වරදවා එන්ටැයි මට කීවා.''

''ඔහොම ලෙඩින් ඉඳගෙන හැතැප්ම විස්සකටත් වැඩි ඒ මඟ ගෙවා ඔබ ආවා ද?''

පාදිලි තැන දුබල ලෙසින් සිනහ වී ''මගේ ඔය සුළු ලෙඩ සනීපවෙන තුරු හිටියොත් වතුවලට මට යන්ට ලැබෙන්නේ නෑ. වාසනාවකට මෙන් ඔබේ වත්තට හැරෙන තැනට එන තුරු මට කිසි අසනිපයක් තිබුණේ නැහැ. ඊට පසු මගේ මේ අස්සයා– මම හිතනවා– අඩිපාර දිගේ ඇවිත් ඔබ ළඟට මාව ගෙනාවා. ඔබ බොහොම කරුණාවන්තයි.''

මේ නැනැත්තේ දෙවගැති ස්ටුවර්ට මැක්පාර්ලේන් ය. දෙවෙනි රාත්‍රියේ දී බරාඳයේ ආවරණ සහිත තැනක දමා තුබූ කව්ච්චියේ ම නිදන්නට ඕනෑ යයි හේ කියා සිටියේ ය.

ඔහු ක්‍රමයෙන් සුවපත් වීමත් සමග මේ තිදෙන එක් වී සාකච්ඡා කරන්ට වූහ. ඇන්ගස් මැක්ලොයිඩ්ගෙන් දැනගන්ට ලැබුණාටත් වඩා මොහුගෙන් නෙවිල්ලාට වැවිලිකාරයන් ගැන දැන ගත හැකි විය.

තැනින් තැන විසිරී හුදකලා ව පිහිටි වතු ගැනත්, ඔවුන් පදිංචි ගෙදරටත් වඩා අන්ත වූ ගෙවල්වල වසන, ස්ත්‍රීන් නැති පුරුෂයන් ගැනත්, හේ විස්තර කළේ ය.

''ඔබ වාසනාවන්තයි, නෙවිල් මහත්මයා. ඔබට ඔබේ භාර්යාව සිටිනවා.. මේ වතුකාරයන් බොහොම දෙනකුට තමන්ගේ ම ස්ත්‍රියක් ඇතුව සිටීම කුමක් ද යන වගවත් මතක නැති වෙලා වගෙයි. මෙයින් සමහරු රැවුල කපන්නේ වත් නැතුව සිටීම ගැන ඔවුන්ට වැරදි කියන්ට පුළුවන් ද? නමුත් සමහර මිනිස්සු අවස්ථාවේ හැටියට හැඩ ගැසෙන හැටි පුදුමයි. සමහරු ඉතා හැඩි දැඩි වෙනවා. සමහරු සිනහ උපද්දන තරමට සම්මුතිවලට ගරු කරනවා. මම යන එන වත්තක් තියෙනවා. එහි නෝනා කෙනෙකුත් ඉන්නවා. එහි වතුකාර මහත්තයයි ඔහුගේ භාර්යාවයි හැම ද ම රෑ කෑම මේසෙට එන්නේ එංගලන්තයේ සවස් කාලයේ අඳින ඇඳුම් කට්ටලවලින් සැරසිලයි. ඒ අතර එහි අසල කැලේ නරි හූ කියනවා. අලි ගස් ගල් පෙරළනවා. ඇත්තෙන් ම මගෙනුත් මෙහෙම ඇඳුම් බලාපොරොත්තුවීම මට හිරිහැරයක්. එහෙම ඇඳුම් අඳින්ට මට වත්කමකුත් නෑ''යි හේ කීයේ ය.

''ඒ මොන කෝලමක්දැ,''යි සේරා කීවා ය.

තිත් වැටුණු සිනිඳු මුස්ලින් ඇඳුමකින් සැරසී සිටි ඈ දෙස පූජක තැන කරුණාවෙන් බැලී ය. ''මම ඒකාන්තයෙන් ම එකහයි. නුමුත් දුරදිග සලකා බලන කොට, වැවිලි කාරයන් තරම් කරුණාවත් ගුණවත් මිනිස්සු වෙන නෑ. මොවුන්ගෙන් වැඩි දෙනා වැටුප් ලබන සුපිරින්ටැන්ඩන්ට්වරුන් නමුත් මේ රට සශ්‍රීක කිරීමට ඔබේ ස්වාමිපුරුෂයා මෙන් ඒ අය ද උදේ හිටන් රෑ වෙනතුරු වැඩකරනවා. බොහෝ විට මොවුන්ට අවුරුද්දකට පවුන් සීයකට හෝ දෙසීයකට වඩා ලැබෙන්නේ නැහැ. එඩිතර සිත් පවා චංචල කරන සුළු අවස්ථා මධ්‍යයේ යි මේ අය ජීවත්වන්නේ.''

''ඒ නිසා ද, ඒ අය ඔච්චර බොන්නේ ?'' යයි සේරා ළාමක ලෙස ඇසුවා ය. ටොම් හා පූජක තැනත් එකිනෙකා දෙස බලා සිනා සුණහ.

''ඉඩම් හිමි වැවිලිකාරයන් ඇරුණා ම සවස් කාලයක පෝටර් බෝතලයක් ෂෙරි වීදුරුවක් ආදිය බොන්ට පුළුවන් අය වැඩි දෙනෙක් නැහැ. ඉඳ හිටලා ඔවුන් සාබි සතුටුවන වේලාවක තරමක් වැඩි පුර බිව්වොත් මිස ඔය හිතන තරමට ඔවුන් බොන්නේ නෑ. හැබැයි, හුහක් බොන අයත් නැත්තේ නෑ''යි හෙතෙම සුසුමක් හෙළමින් කී ය.

දවසක් තමාට වැඩි සනිපයක් දැනුණු විට ටොම් සමග කම්කරුවන් රැස් වන තැනට යෑමට මැක්පාර්ලේන් මහතා කැමැත්තක් ප්‍රකාශ කෙළේ ය. බලාගත් වනම සිටි කළු පැහැති මිනිසුන් සියයක් පමණ මේ දෙදෙනා දුටු කල්හි ටොම් ගේ මුහුණේ බැරෑරුම් ගතියක් දක්නා ලදි.

''මේ මිනිසුන් බොහෝ දෙනා දැනටමත් මාව සලකන්නේ පියෙක්, නඩුකාරයෙක්, දෙස්තර කෙනෙක් වැනි කරුණාවන්තයෙක් හැටියටයි. හොඳ හැටියට ඔවුන් රැක බලා ගැනීම සමහර විට මට මහත් වගකීමක් ලෙස පෙනෙනව.''

මහ කන්කානියා වූ කරුප්පන් ගේ විරුද්ධත්වය කෙසේ වෙතත් රාමසාමී නම් අලුත් කන්කානියකු යටතේ ගොන්සාලේස් ගෙනා අලුත් කම්කරුවන් කණ්ඩායම වතුවල සිටින බොහෝ කම්කරුවන්ට සමාන පිරිසක් විය. ස්වාමි සේවක දෙපක්ෂය අතර පුදුම එළවන අන්‍යොන්‍ය සම්බන්ධයක් පැවතුණි. දකුණු ඉන්දියාවේ සිට ආ මේ මිනිසුන් නිසා වතුවල වැඩ කරවා ගැනීම පහසු බවත්, විවේක සැපයට ම එල්බී සිටින සිංහල ගම්වැසියන් වැඩට එද්ද නේද්ද යන්න සැක සහිත හෙයින් ඔවුන් කෙරේ බලාපොරොත්තු තැබිය නො හැකි බවත් ටොම්ට නිතර ම කල්පනා විය.

අවුරුද්දක් පාසා ම, සිය භාර්යාවන් හා දරුවන් කැටුව එන මේ දෙමළ ඉන්දියාවේ සිට පෝක් සමුද්‍ර සන්ධිය ඔස්සේ අවුත් කැලෑ හා තැනිතලා බිම් අතරින් මහත් වෙහෙස දරා ටික කලක් වැඩ කිරීමට මේ කඳු බිම්වලට පයින් ම ගමන් කරති. කලක් තිස්සේ වැඩ කොට යමක් ඉතුරු කරගත් පසු සිය රට ගොස්, යළිත් අස්වැන්න ලබා ගන්නා කාලය කිට්ටුකොට ඔව්හු මෙහි එති.

''මෙහි එන අතර මහ කී දෙනෙක් මැරෙනවා ද?''යි පාදිලි තැන කනගාටුවෙන් මෙන් කී ය.

වඩා පරීක්ෂාකාරී ව බලන කොට කම්කරු කණ්ඩායම කොටස් දෙකකකට බෙදී සිටින බව හේ දුටුවේ ය. එක් කණ්ඩායමක මුල් තැන ගෙන සිටියේ වඳුරකු ගේ මෙන් අහංකාර පෙනුමක් ඇති, තෙල් පැහැති මුහුණකින් යුතු, සුදු

තලප්පාවක් හිස බැඳ සිටි කලහකාරි කන්කානියෙකි. කුඩා කණ්ඩායමේ පසෙකින් සිටියේ අළු පාටැති එල්ලා හැලෙන රැවුලක් හා සිහින් උස් සිරුරක් ඇති මඳ කනස්සලු පෙනුමකින් යුත් දෙවෙනි කන්කානියා ය.

ටොම් ස්වකීය ආගන්තුකයා ගේ පරීක්ෂණාත්මක නෙත් බලා ''හා ඔබ රාමසාමි හා කරුප්පන් හඳුනාගත්තා. කරුප්පන්ට ස්තුති වෙන්න මගේ කම්කරු පිරිසත් ලොකු ප්‍රශ්නයක් වෙලා තියෙනවා''යි මිමිනුවේ ය.

පසුව සේරා ගේ කෝපි සංග්‍රහය විඳිමින් බංගලාවේ සිටින අතර ලන්තාගාවේ කලින් සිටි උදසීන කම්කරුවන් ක්‍රියා ශූර අලුත් කම්කරු කණ්ඩායමක් සමග දබර වී සිටින සැටිත්, ඔවුන්ගේ නො සන්සුන් ගතියත් ටොම් විස්තර කළේ ය.

''මේ දවස්වල සමහර විට මෙහි මිනී මැරුමක් වෙන්ට පුළුවනි''යි හෙතෙම දෙමනස් සහගත ව කීය. ''නුමුත් ගොන්සාලේස් කියන්නේ මම කෙළින් සිටියොත් එබඳු විපතක් කලකට සිද්ද නො වේය කියායි. 'කෙළින් සිටියොත්' යන්නෙන් ඔහු අදහස් කරන්නේ මොකක්දැයි මට ඉගියක් තිබෙනවා. එහෙත් මම ඊට කැමති නෑ. පෙළක් වතුකාරයන් වාගෙ නීතිය අතට ගෙන ක්‍රියා කරන්ට මම කැමති නෑ.''

''තද අයුතු කම් ඉඳ හිට සිද්ද වෙලා තියෙනවා සැබැයි. ඒ වුණත් වතු කාරයන් වැඩි දෙනෙකුගෙන් සාධාරණ ලෙස යුක්තිය ඉටු වෙනවා කීවොත් ඒ පුදුමයක් නො වෙයි. මේ රට ගැන නො දන්නා, කම්කරුවන් කෙරෙහි අනුකම්පාවක් නැති, කොළඹ මහෙස්ත්‍රාත් වරුන්ට වඩා ඔවුන්ගෙන් යුතුකම් ඉෂ්ට වෙනවා.''

ටොම් හිස සැලී ය.'' මම ඔවුන් ගැන අසා තියෙනවා. ඔය අයට අඩ ගහන්නේ නැතුව මගේ ප්‍රශ්න මම විසඳා ගන්නවා.''

''ඒ වුණත් වතු කාරයන් හා සිවිල් නිලධාරීන් අතර විරුද්ධත්වයක් තිබීම කනගාටුවට කරුණක්. අපි සේරම එකයි. ගමරට සිට හැතැක්ම දහස් ගණනකින් ඈත පදිංචි විදේශිකයෝ. අපි එකමුතු විය යුතුයි. ඒ අපේ යහපත පිණිස පමණක් නො වෙයි. මේ රට මෙහි ම වැසියන්ට භුක්තියට සවි වූ තැනක් බවත් අපි මතක තියාගන්ට ඕනෑ.''

''අපේ හැඟීම එහෙම තමා, මැක්පාර්ලේන් මහතා''යි සේරා දිලෙන දෙනෙතින් යුතුව කීවා ය.

ටොම් පුටුවට හාන්සි වී ''පූජකවරයකු වූවාට මෙරට ගැන ඔබට හොඳ දැනීමක් තියෙනවා නේ''යි කී ය.

පූජක තැන සිනාසුණි. ''සමහර විට මාත් වතුකාරයෙක් වෙලා සිටි නිසා වෙන්ට ඇති.''

සතියක් කෙළවර වූ පසු අසු පිට නැඟ යෑමට තරම් ඔහුට සනීප තිබුණි. තමාට මේ තරම් හොඳින් සංග්‍රහ කළ ඒ ගෙපැළට පළමු ව ආශීර්වාද කොට හැකි වූ විටක නැවත එන බව කියා හේ නික්ම ගියේ ය.

අසුපිට ම සිට නෙවිල්ලා දෙස බලා හෙතෙම හෙමිහිට මෙසේ කී ය.'' වැඩි කල් යන්නට මත්තෙන් මේ දිස්ත්‍රික්කේ දේව මෙහෙයක් ඉඳ හිටලා පවත්වන්ට පුළුවන් වේ යයි මම හිතනවා. මෙහි කොත්මලේ හා දෙළොස්බාගේ අලුත් වතු බොහොමයක් පැන නැඟීගන එනවා. කෝපි ගබඩාවක් හෝ මහේස්ත්‍රාත් උසාවියක් වුණත් ඇති.''

පූජක තැන දිගුකළ අත තම අතින් දෘඪ කොටගෙන ආචාර කරමින් ''ලන්තානාවේ ඔබ කැමති ඕනෑ ම ගොඩනැගිල්ලක් ඔබට පාවිච්චි කරන්ට පුළුවන්''යි ටොම් කී ය.

හියු නෙවිල් ගේ වත්ත පිහිටි කඳු පෙදෙස දෙස මැක්පාර්ලේන් බැලී ය.

''මේ කිසි ම දේව මෙහෙයකට ඔබේ මස්සිනා තෝන්ට පුළුවනි.''

මේ වන තුරු ඔහු හියු නෙවිල් හඳුනන බව සඳහන් කළේ නැත.

''හා, මම ඔහු අඳුනනවා. පසුගිය වාරයේ මං එහි ගිය වෙලේ පාදිලිවරුන්ට කැමැති නැති බවත් එහි ඇවිත් නැවත හිරිහැර වෙන්ට ඕනෑ නැති බවත් ඔහු මට කිව්වා. හා, හොඳයි, මගේ භක්තිමත් පිරිසට එකතුවීමට අඩු ගණනේ අලුත් මිත්‍රයන් දෙදෙනෙක්වත් මට ලැබුණා''යි පාදිලිතැන දුක්මුසු ව පැවසී ය.

පාදිලි තැන ඔහුගේ කදිම අස්පොච්චාට, විලුඹින් සනිටුහන් කොට කෙමෙන් නො පෙනී ගියේය.

කාණ්ඩය 3

1

අලුත් මල් වැටිය ළඟින් සේරා වෙහෙසට පත් ව නැගී සිටගත්තා ය. ඉදිරියේ සිටි මිනිසා අපිරිසිදු රෙදි කැබැල්ලක් හිස වෙළාගත් කිළුටු බැනියමක් හා රෙද්දක් ඇඳ සිටි කාලකණ්ණි පුරුෂයෙකි.

ඔහු අත තුබූ ලියුම ටොම්ට එවා තිබුණි. කවරයේ අකුරුවලින් මෙය හියු නෙවිල් විසින් එවන ලද්දක් බව ඕ හඳුනා ගත්තා ය. එය රැගෙන කන්තෝරුවට ගිය ඕ මොහුට මෙසේ ලියන්ට ඇති හේතුව කුමක්දැ යි සිතුවා ය. පළමු හමු වීමෙන් පසු මෙතෙක් ඔහුගෙන් ආරංචියක් නො වී ය.

‘‘ඉරිද වතුකාර සමාජයේ භෝජන සංග්‍රහයට එන්ට කියා හියු කියා තිබෙනවා’’යි කියමින් ටොම් ලියුම මේසය මත තබා පුටුවේ හාන්සි විය. ‘‘මට බෑ, මම යන්නේ නැහැ.’’

‘‘ඇයි නො යන්නේ’’යි සේරා ඇසුවා ය.

හේ ඈ දෙස රවා බැලී ය. ‘‘එකක් ඔබ තනිකර යන්ට මම කොහෙත් ම කැමති නෑ.’’

සේරා කාමරයේ ඇවිද අන්තිමේ දී කවුළුව ඉදිරියේ වාඩිගත්තා ය. ඈ ඉදිරිපසින් කෙළින් ම හියු නෙවිල් ගේ අරලිය වත්ත පිහිටි නිල් කඳු වැටිය ය. ඕ ටොම් දෙසට හැරී ‘‘මෙය අනික් වතුකාරයන් හමුවීමට ඔබට හොඳ ප්‍රස්තාවක්’’යි සෙමින් කීවා ය.

‘‘ඔවුන්ට ඕනෑ නම් මෙහි එන්ට තිබුණා’’යි ටොම් කලකිරුණු හඬකින් කී ය.

‘‘ඔවුන්ගේ ඊඩන් උයනේ ගැණියක සිටීම ගැන ඔවුන් බය වෙලා වෙන්ට ඇති.’’ ඕ ඔහු දෙස හැරී ‘‘ඇත්තෙන් ම, ඔබ යා යුතුයි, ටොම්. එයින් ඔබට යහපතක් වෙයි,’’ කීවා ය.

නියමිත දවස ළං වන්ට වන්ට ප්‍රීති සහගත බලාපොරොත්තුවකින් තමා සිටි බැව් ටොම් පිළිගත්තේ ය. මෙතෙක් දුර ඔහුගේ ජීවිතය කිසි විවේකයක් ලැබීමට අවකාශ නැති තරම් වැඩ කටයුතුවලින් බර විය. තම අසල් වැසියන් හමුවීම– ඔවුන් සමග වතු ගැන කථාකිරීම– ප්‍රයෝජනවත් වෙන්ට පුළුවන.

වතුකාරයන් රැස්වන නාවලපිටි ගමේ පිහිටි ඒ ස්ථානයට සැතපුම් එකොළොසක් අසු පිටින් යා යුතු විය. එහි යැමට වේලාසන ම පිටත් වීමට ටොම් බලාපොරොත්තු වූ නමුත් වත්තේ ඇති වූ බලාපොරොත්තු නැති වැඩ වගයක් නිසා ඔහුට පිටත් වන්නට ලැබුණේ මද්දහන පමණ වූ විට ය.

පැයක් හෝ දෙකක් පමණ ගමන් කොට, ටොම් ආණ්ඩුවේ තානායම් පළට ළඟා වූයේ ය.

සැතපුම් ගණන් අවට පදිංචි විනෝදශීලී වතුකාරයෝ ඉරුදින උදය මෙහි දී මුණ ගැසුණහ. ටොම් එත් ම, ඔහුට ආචාර කිරීමට ඔවුහු හැරුණහ. මේ දිස්ත්‍රික්කයේ පදිංචියට ඔහු අවුත් සිටින බව ඔවුන්ට කල් තබා ම දැනගන්නට ලැබී තුබුණා සේ පෙනිණි.

තමා වටකරගෙන, එකිනෙකා හඳුන්වා දෙමින් සිටිය දී, ටොම්, හියු නෙවිල් කොහිදැයි සෙවී ය.

‘‘ඔබ සොයන්නේ ඔබේ මස්සිනා නම්, මහන්සි වෙන්ට උවමනා නෑ. සාමාන්‍යයෙන් පසුවට ම එන්නේ ඔහු’’යි එක් අයෙක් කීහ.

‘‘ආ! මේ එන්නේ දැන්’’යි උස මහත මයික් ඔ’කොනල් බරාඳයේ සිට කෑ ගැසී ය.

වතුකාර පිරිස ඉදිරියට නැඹුරු වූ විට පාරදිගේ හියු ගේ අසු දුව එනු ටොම් දිටී ය. මොහොතක් ගත වුණා පමණි. ධූලි පටලයකින් වැසී ගත් හියු අසුපිට ම තානායමේ පියගැට පෙළට ළඟා විය.

‘‘නිතර ම එන්නේ මහා තේජසින්. ඒක ඕනෑවට ම කරනවාදැයි දන්නේ නැතැ’’යි ටොම් සිතී ය.

‘‘මෙච්චර වේලාසන ආවේ මන්ද,’’යි මහලු ඇන්ඩෘ ක්‍රේග් ඇසී ය. ‘‘ඔබේ මස්සිනා නිසා වෙන්ට ඇති. ජේන හැටියට නම් ඔබ දෙදෙනාගෙන් හොඳ මිනිහා ඔහු යි!’’

හියු දත් සපා සිනාහ විය. හියු ගේ ළමා වියේ දීත් ඒ සිනාරැල්ල මිනිසුන් ගේ සිත් ඇද ගත් හැටි ඔහු දෙස බලා සිටි ටොම්ට මතක් විය.

''ඩෙ, ඔය වචනවලට මම සමාව දෙන්නේ නෑ, ඇන්ඩි, නාකි ජඩයා. උඹ කියාපු දේ වැරදියි කියලා මම කියන්නේත් නෑ.''

හියු අසල සිටි කුදිරකාරයකුට තෝන් ලණුදී පඩි දෙක බැගින් එකට නැග ටොම් ගේ අත අල්වා ගත්තේ ය.

''ඔබ ආවාට බොහොම සතුටුයි, ටොම්. දැන් බීම රවුම මගෙනුයි. ඔබ ගන්නේ මොනවා ද, ටොම්?''

හියු ගේ පැමිණීමත් සමග රැස්ව සිටියවුන් අතර අමුතු ප්‍රබෝධයක් ඇති විය. මේ උද්‍යොගයට ටොම් ද නිරායාසයෙන් හවුල් වූයේ ය.

පළමු රවුමෙන් පසු රවුම් කීපයක් ම විග විගස ගියේ ය. ප්‍රීති රසාස්වාදය ද තියුණු ව වැඩුණි.

''පෝලෝ!'' හදිසියේ ම හියු කෑ ගැසී ය. ''කවුද කැමට පෙර පෝලෝ ගහන්ට ලෑස්ති.''

හැම දෙනෙක් ම වියරු වැටුණාක්මෙන් කැමැත්ත ප්‍රකාශ කළහ. පුටු කඩි මුඩියේ එහා මෙහා වුණි. තත්ත්වය මදක් අවුල් සහිත වූ නමුත් හියු ශාන්ත ව කරුණු නිරවුල් කළේ ය.

වළ ගැසුණු කොපුල් තලයක් හා විශාල උඩු රැවුළක් ඇති කෙනකු දෙසට තමාගේ බීර වීදුරුව වනා ''සෙයර්ස් – ස්මිත්, ඔබ එක් පැත්තක නායකයා වෙන්න''යයි කීය.

''අනික් පැත්තේ නායකයා ඔබයි'' හදෙනකුගේ පමණ මුවින් ගිලිහුණි.

''ටොම්, ඔබ කියන්නේ මොකක් ද?''

''ඔබ අමනාප නැත්නම් මෙවරට මම බැහැර ව සිටින්නම්''යි කියමින් ටොම් රහසින් ඔරලෝසුව දෙස බැලූ විට වේලාව එකත් පසුවී තිබෙන බැව් දුටුවේ ය. මෙ වේලේ සේරා වත්තේ මොනවා කරමින් ඇද්ද? පිරිස අතර පැවැති ඝෝෂාවත්, අධික සුරාපානයත් තොර තෝංචියක් නැති කථාවත්, නිසා ටොම් පෙරළා වත්තට යෑමට පුල පුලා සිටියේ ය.

මින් පසු පැවැත් වූ ක්‍රීඩාව කිසිසේත් 'පොලෝ' නො වී ය. තානායමේ ඉදිරිපස මිදුලේ අසුන් පිට නැග ගත් පොරකන පිරිසකි. අශ්වයෝ ද වියරු වැටුණා සේ ඒ මේ අත දිව්වෝ ය. නිම හිම නැති ප්‍රීතියෙන් කෑ කෝ ගසන වතුකාරයෝ ඔවුනොවුන් හා තරඟ කළහ. මෙවැනි උත්සවවල දී ප්‍රයෝජනයට ගැනීමට තානායමේ තබා තිබෙන මේ පෝලෝ පිති පන්දුවට හරි හැටියට වැදුණොත් ඒ ඉතා කලාතුරකිනි.

අන්තිමේ දී හියු ක්‍රීඩාව කෙළවර කෙළේ ය. කෑම සූදනම් බව දන් වූ සානායමකරු ගේ මුහුණේ බියපත් විලාසය ඔහු දුටු බව ටොම්ට ද පෙනුණි.

ඊළඟට විශාල කෑමක් විය. මැස්සක් මෙන් තනා තිබූ මේසයේ සිංහල හාලේ බත් කඳු ගසා තිබුණි. මුං, මෑ ආදී ඇටවර්ග වට්ටක්කා, බණ්ඩක්කා, වම්බටු ආදී එළවළු ජාති, කුකුළු මස් හා තැම්බූ බිත්තර පිර වූ සුදු පැහැති දිසිවලින් ද, අච්චාරු හා චට්නිවර්ග, කටදන මිරිස් සම්බෝල, සිහින් පප්පඩම් ගොඩවල් හා තද සුවඳ වැහෙන බොම්බිලි කරවල දැමූ කුඩා බඳුන් වලින් ද මේසය පිරී තිබුණි.

වතුකාරයෝ තද කුස ගින්නෙන් කෑමට වාඩි වූහ. මුහුණු රතු කරගෙන, ඩාදිය පෙරා ගෙන, බීර බිබී, මොවුහු මේ කෑමජාති ගිල දැමූහ.

මේසය මුල හරියේ ටොම් ළඟ වාඩිගෙන සිටි හියු නිශ්ශබ්ද විය. මීට කලිනුත් මේ ගතිගුණ ඔහු කෙරෙහි පහළ වී තිබෙනු දුටු ටොම් මඳක් අපහසු වෙන් ඔහු දෙස බලා සිටියේ ය.

හදිසියේම ''අපි විසිදෙදෙනෙක්''යි හියු කී ය. ඔහුගේ හඬ වේගවත් වී ය. ''මගේ වාසනාවන්ත මස්සිනාට මෙන් හායඝාවක් නැති, ආඩම්බර වීමට ගෙයක් දොරක් නැති, අපට අපි විසි දෙදෙනෙක්.'' මේ කියමනෙහි ස්වානුකම්පාවක් නො ව උපහාසාත්මක සරදමක් ගැප් ව ඇතැයි ටොම්ට අවබෝධ විය. හදිසි උත්සවාකාරයකින් යුත් මේ ප්‍රීති සමාගමයන් සානුකම්පිත නො වේ ද? අපට තැනක් නැති අනාගතයක් ගොඩ නගන අපි හෙට වෙන කොට අපේ වතුවල යි. අපි ටික දෙනෙක් පොහොසත් වෙන්ට පුළුවනි. එහෙත්, අපි කැලෑවලින් බේරාගත් මේ ඉඩම්වල රඳවන උරුමය ඊටත් වඩා පොහොසත් වෙනවා ඇති''. හියු කට ඇද කළේ ය. ''සමහර විට අනාගතයේ දී අපේ මේ ව්‍යායාමය අනුන්ගේ ධනය හා ශ්‍රමය සූරා කෑමකැයි කියන්ටත් බැරි නැත.''

ඔහු මේසය අල්ලාගෙන අමාරුවෙන් නැගිට''ච්ඃ, මම හිතුවාට වඩා බීලා තියෙනවා වගෙයි,'' කී ය.

ඔහුගේ යාළුවෝ ඔවුන'තර කථාව නවත්වා ඔහු දෙස බලාගත් වන ම සිටියෝ ය. ඕනෑවට වැඩිය හියු නෙවිල් බීගත් විට ඒ බව කීම දුෂ්කර දෙයකි. ටොම් හැර, හියු ගැන හොඳ දැනීමක් ඇතුව සිටි මයික් ඔපැරල් නමැති තරබාරු අයිරිෂ් ජාතිකයා හියු ගේ කනස්සලු ගතිය දැක අනික් අයට නිහඬ වීමට සංඥවක් කළේ ය.

''මම ගෙදර යනවා''යි හියු කී ය.

මේ වර ඔහු නැවැත්වීමට කිසිවෙක් උත්සාහ කළේ නැත.

''මේ ස්ථානයෙන් ඔබට පිටවීමට මම උදව් වෙන්නං, ළමයා,''යි මයික් ශාන්ත ව හියු ගේ කරට අත ලාගෙන, පසු පසින් එන ටොම් ද සමඟ දෙර ළඟට ගියේ ය.

හියු ගලක් මෙන් නිශ්චල ව ඉදිරිපස බලමින් සිටියේ ය. කඳු මුදුන් දක්වා වැවී තුබුණු කෝපි පැළ දෙස අතක් දිගුකොට ''අර බලන්න. ඒවා වැව්වේ අපි. මතුකාලයේ පරපුර ඒවායේ පලදව නෙලාවි. නුමුත් වැඩි වැඩියෙන් කැලෑ ගිනි තියා, වෙහෙස මහන්සි ව වවා, පුහු ජීවිත මේ රටේ ගත කර, අපි මැරෙන්ට අපේ රටට යන්ට ඕනෑ''යි කී ය.

''ඔබට වෙලා තියෙන්නේ මොකද, හියු''යි මයික් තැති ගැනී විචාළේ ය.

සිය මස්සිනා ගේ පිටිපසින්, ටොම් උස මහත අයිරිෂ් ජාතිකයා දෙස අවවාදත්මක බැල්මක් හෙළූ නමුත් හියු එය දැක්කේ ය.

''මොකුත් නෑ. නිමේෂ මාත්‍ර දර්ශනයක් පමණයි.'' හේ සිනාසුණේ ය. ''ඔබට දැන් හිරිහැර වෙන්ට කිසි දෙයක් නෑ. මගේ ගුණවත් මස්සිනා මා ගැන බලාවි. මේ මගේ මස්සිනා හරි වාසනාවන්තයා. ඔහුට සිතූ පැතූ හැම දෙයක් ම ලැබුණා. දැන් කොළඹින් මෙපිට ලස්සණ ම භාර්යාව ඉන්නේ ඔහුට යි.''

''අපි යමු, හියු''යි ටොම් ශාන්ත ව පැවසී ය. හියු ගේ මේ ස්වභාවය කොතරම් අව්‍යාජ දැයි ඔහුට සිතාගන්ට නුපුළුවන් විය.

හියු කුමක් කරන්ට යන්නේ දැයි ටොම් දැනගන්ටත් පෙර ඔහු සිය අසු නැග පාර දිගේ යන්ට විය.

අඩි පාර දිගේ අහිංසක පෙනුමකින් හෙමි හිට ගමන් කළ හියුට අරලිය හා ලන්තානාවත් අතර මායිමේදී ටොම් කිට්ටු කළේ ය. හති දමමින් හා තරමක කේන්තියෙන් සිටි ටොම් ඔහුට ළං කර අසු නැවතී ය. දේව ගැතියකු සේ උප ශාන්ත ව හියු සිටින බව හේ දුටුවේ ය. ඔහුගේ අශ්වයා අධික වෙහෙසට පත් ව පෙණ දමමින් සිටියේ ය.

''අර ප්‍රදර්ශනය මොන යකා ගෙ උවමනාවකට ද?

''මොන ප්‍රදර්ශනය ද?''යි හියු අහිංසක ව ඇසී ය.

ටොම් දිග සුසුමක් හෙළී ය. ''අපි නැවතත් බරුන්වවුඩ හි නො සිටින බව මට තේරුම් ගන්ට බැහැ. ඔබේ හිතුවක්කාරකම දැන් වත් මඟ හැරී ඇතැයි මම සිතුවා.''

හියු සිනාසුණි. ''මාත් හිතුවේ එහෙම ම යි. ටොම්, ඔබ දකින විට මගේ හිත කැලඹෙනවා. එමෙන් ම මගේ දුෂ්ට ගති ඇවිස්සෙනවා.'' ඔහු හදිසි උද්වේගයකින් අහස දෙස බලා ''බලන්න අර උකුස්සා, ඔය තරම් නිරායාස

යෙන් පියාසර කරන සතෙක් ඔබ දැක තියෙනවා ද? දයාදය මහත් නො වන්නට ස්වභාවධර්මය ඌට දී තිබෙන නාදය, හරියට ම වේදනාවෙන් මිරිකෙන බළලකු ගේ හඬ වාගෙ යි.''

ඈත ආකාශයේ ඒ පියැඹීමෙන් වශී වූ හියු ගේ මුහුණ මොහොතකට පැහැපත් වනු ටොම් දුටුවේ ය. මොහු ගේ චරිතයේ සංකීර්ණතාවන්ගෙන් මීට පෙර බොහෝ වතාවල කැලඹුණාක් මෙන් ටොම් යළිත් කැලඹුණි. ඔහුගේ කෝපය ද පහ ව ගියේ ය.

මේ දෙදෙන නිහඬ ව අසු නැග ගියහ.. තමා ම වවමින් සිටි ඒ උයනේ පසෙක නිල්වන් වතින් සැරසී වැඩ කරමින් සිටි සේරා ගේ කුඩා සිරුර ඔවුහු දුටුවෝ ය.

''සත්තකින් ම, මේ කෙල්ලට කදිම ධෛර්යයක් තිබෙනවා''යි හියු සෙමින් කී ය.

'හියු, ඔබ විවාහ වී සිටි බව මට කවදවත් කීවේ නෑ''යි ටොම් ඇරඹී ය.

එකවරට ම හියු සිය අසු නැවතී ය. ඔහුගේ මුහුණින් ළමා ගතිය නැති විය. එය වෙස් මුහුණක සේ හිස් බවක් පෑ ය.

''සමහර විට, ඒ ගැන කථා කිරීමට නුවුවමනා නිසායි.'' ඔහුගේ කටහඬ අමිහිරි විය.

''මම කනගාටුයි, එහෙම කිව්වාට– මා අදහස් කළේ නෑ—''

''ඔබේ ජීවිතය ඔබ ගත කරන්න. මගේ ජීවිතය මා ගෙන යන්නම්. අපි මස්සිනාලා වූ නිසා ම අසල් වාසීන් වූ නිසාම අප දෙදෙනාගේ හැම දෙයක්, අපි දැන සිටින්ට ඕනෑ නැහැ. එහෙම නේ ද?''

ඔවුන් පාර දෙපසට බෙදන දෙමං කඩට පැමිණියෙන්, හියු තමාගේ පාලු බංගලාවට අසු මෙහෙය වූයේ ය.

2

ඒ අවුරුද්දේ වියළි කාල ගුණය අප්‍රේල් මාසයේ ද බොහෝ දවස් ගතවන තුරු පැවැත්තේ, වාතය ද දැඩි සේ උෂ්ණ විය. පසුගිය ඔක්තෝබර් හෝ නොවැම්බර් මාසේ දී කපා හෙලන ලද ගන කැලෑ දර මෙන් වියළී ගශාස තිබී පුළුස්සන ලදුව, මුළු දිස්ත්‍රික්කයේ ම කඳුකරය නිතර ම පාහේ ගිනිදැල් වලින් පිරිණ. වරක් සශ්‍රීක ව පැවැති වනාන්තරයේ අක්කර සියයක්, දෙසියයක් හෝ තුන්සියයක් දැල්වීමට අවශ්‍ය වූයේ යන්තම් ගිනි හුලකි. ඒ ගිනිදැල්ලේ ම උසින් පහත් වූ වළාකුලකින් ඇති වූ වැස්සකින් නිවී යන තෙක් දවස් ගණනක් මුළුල්ලේ ම, දැවී ඉතුරු වූ අඟුරුවලින් දුම් නැගිණ.

කලින් සිටි අයිතිකාරයා කපා දැමූ කැලේ වියළි ගස් පඳුරු ආදිය පාගමින් ගමන් කළ ටොම් සිය වත්තට නො පමා ව ගිනි තැබීමට සිතා ගති. තම කළ වියදමින් කිසියම් ප්‍රතිඵලයක් ලැබීමට නම් ඉඩමේ හැම අක්කරයක ම කෝපි වැවිය යුතු බව පෙනී ගියේ ය. කැලේ වැවී තිබෙන විශාල කැබැල්ලේ ගස් කපා වියලා ගන්නා පිණිස ඔක්තෝබර් මාසේ වනතුරු සිටිය යුතු නමුත් මේ අක්කර පනහේ ඉඩම් කැබැල්ල ඔහුට පමා නො කළහැකි වූයේ ය. ගිනි තැබීම පරික්ෂාකාරී ව කළ යුතු බවට ගොන්සාලේස් විසින් අවවාද කරන ලදී. මෝසම් සුළං ඉතා ආසන්න ව පැවැති මේ කාලයේ හිටි හැටියේ ම සුළං හැමීම විශෙෂයෙන් ම මේ දිස්ත්‍රික්කේ සිරිතකි. ඒ ඇරත් ටොම් ගේ කම්කරුවන් ගේ ගෙවල් ද ගිනි ඇවිලෙන තැනට භයානක ලෙස ඉතා ළංව පිහිටා ඇත.

''ඒ ගැන අපි බලාගන්නම්''යි ටොම් ගොන්සාලේස්ට කොටින් කී ය. ''ඕනෑ ම හදිස්සියකට මූණ පාන්ට ලෑස්ති ව ඉන්ට හැම මිනිහාට ම කියන්ට ඕනෑ. 'හෙට දවල් ගිනි තියමු.''

පසුවද කාලගුණය පරික්ෂා කර බලනු පිණිස වෙනදටත් වඩා කලින් ටොම් අවදි වූයේ ය. පසුව තත්ත්වය කෙසේ වේ දැයි සිතා ගැනීමට තරම් කල් නුවූවත් කඳු වැසී ගිය මීදුම හැර, අහස වලාකුළින් තොරවන ලකුණු පෙනුණි. යන්තම්වත් සුළඟක ලකුණු නො වී ය. ලොකු සහනයක් ලැබූ සේ අන්තිම මොහොතේ දී ටොම් ගිනි අවුලන්නට අණ දුන්නේ ය.

මධ්‍යාහ්නය ළං වෙත් ම මඳ සුළඟක් ඇති වූයෙන් කවදත් කල්පනාවෙන් කටයුතු කරන ගොන්සාලේස් පරික්ෂාකාරී ව ක්‍රියා කරන ලෙස නැවතත් මතක් කෙළේ ය.

''හෙට මීට අන්ත වෙන්ට පුළුවනි. අනිද්දා සමහර විට වහීවි. මමත් ඔබ මෙන් ම ඒතරම් කැමති නෑ. නුමුත් අපි අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්ට ඕනෑ''යි ටොම් කී ය.

ගොන්සාලේස් සියලු ම ආරක්ෂා සංවිධාන දැඩි කොට ටොම් ගේ අදහස දන්වා හියු නෙවිල් ට ද කෙටි පණිවුඩයක් යැවී ය. මද්දහනේ දී ටොම් හා සේරා ගින්න බැලීමට කඳු ගැටයක් මත සිටගත් වේලේ හියු ද පැමිණ ඔවුන්ට එක් විය.

ඔහු හිස නමා කළ ආචාරයට සේරා ද සමාචාර දක්වා කුඩය යටට වී, ''ආරාධනයක් නැතුව පැමිණීම මොහුගේ පුරුද්ද නො වේ දැ''යි කල්පනා කළා ය.

''කන්දේ කපොල්ල පැත්තෙන් හුළං ටිකක් එනවා''යි හියු ගේ ගොරෝසු හඬින් ඇදලා පැදලා කී ය. ''ඔබ ස්ථිරවශයෙන් ම ගිනි තියන්ට හිතා ඉන්නවා නම්, ගින්න පාලනය කිරීම ටිකක් දුෂ්කර වෙන්ට පුළුවනැයි මට හිතුණා.''

''සුළඟ දැනෙන්නේවත් නැතැ''යි ටොම් කොටින් පිළිතුරු දුන්නේ ය. ඔහු ද මේ කාරණය දැන සිටියේ මදක් කම්පාවෙනි. නුමුත් වලාකුළු වහ වහා එක් රැස් වුණි. එමෙන් ම මේ අවස්ථාව මග හැරී ගියොත්, තව මාස ගණනක් ගතවන තුරු යළිත් ප්‍රස්තාවක් නො ලැබෙන බව හේ දත්තේ ය.

හියු උරහිස් සෙලවී ය. මේ ඉඩම ඔබෙයි, ටොම්. ඒ වුණත් ඕනැ ම හදිස්සියකට ඔබෙ මිනිසුන් ලෑස්තිය කියා මා හිතනවා.''

ගොන්සාලේස් සෙමින් මෙසේ කී ය: ''සමාවන්න මහත්වරුනි, බන්ගලා වෙත්, කම්කරුවන්ගේ ලයින් පේළියේත් වහළ වල් ළඟ මිනිසුන් නවත්තා, යම්විදියකින් ගිනි පුපුරක් ඒ පැත්තට ආවොත් නිවා දමන්ට මා අණ කළා. එමෙන් නෙවිල් මහත්තයාගේ අණ පරිදි යම් කරදරයක් ඇති වූවොත් වහා ම ක්‍රියා කිරීමට සූදනම් ව වත්තේ මායිම දිගේ ද මිනිස්සු ඉන්නවා.''

''හොඳ මිනිහා''යි සිය මස්සිනා දෙස නෙතගින් බලමින් හියු මෙසේ ද කීය. ''ගොන්සාලේස්, ඔබ මා යටතේ රස්සාවට පත්කර නො ගෙන, මගේ මස්සිනා ළඟ රස්සාව ලබා දීම මෝඩ කමක් බව මට පෙනෙනවා.''

ටොම් ඔරලෝසුව දෙස බැලී ය. ''හොඳයි ගොන්සාලේස්, ගිනි තියන්ට පටන්ගන්න ඔවුන්ට කියන්න. ඒ එක්ක ම අහකට යන ගිනි පුපුරු හැම එකක් ම නිවන්ට යයි කැලේ වටේ සිටින අර මිනිස්සුන්ට කියන්ට ඕනැ. නැත්නම් ඊට හේතුව මන්දැයි බලන්ට මම එනවා.''

වට පිටාව හොඳට පෙනෙන ඒ ස්ථානයෙන් කොන්දෙස්තර කන්ද පාමුලට දුවනු නිරික්ෂකයෝ තිදෙන දුටුවෝ ය. ඔහු වහ වහා උපදෙස් දෙන අතර, එක් මිනිසකු ගිනි හුලකින් ගිනි අවුලනු ද ඔව්හු දුටුවෝ ය. ඕවර්සියර් ගේ තවත් ආඥවක් ලත් විගස ඒ ඒ අය ඉඩමේ නොයෙක් තැන්වලට ගොස් රැකවල් ගත්හ.

මුලදී කිසි දෙයක් සිදුවන සේ පෙනෙන්ට තිබුණේ නැත. ඉන්පසු එකක් හැර එකක් ධූම පටල නොයෙක් දෙසින් නික්මී එක ම ධූමස්කන්ධයකින් අහස වැසී ගියේ ය.

තැනෙක ගිනි පුළිඟුවක් උඩට නැග, පසු බැස, නිවී ගියේ ය. තවෙකක් වඩා වේගයෙන් ඉහළට නැගිණ. ඉක්බිති හදිසියේ ම මුළු වනය සිසාරා ගිනි ඇවිළිණ. බුර බුරා නගිමින්, වියළි වන ලැහැබ හා ගස් කඳන් අවුලමින්, ගින්න එන්ට එන්ට ම වැඩි වූයේ ය. එහි අධික උෂ්ණයෙන් වරින් වර පිපිරුණු මහ ගල්වල පතුරු සී සී කඩ විසිරී ගියේ ය.

ඉතා ඉහළට නැඟුණු මහ ගිනි කඳින් නික්මුණු කළු දුම් පටලය අහස ද විවිධ වර්ණයෙන් ආලෝක කෙළේ ය.

''ඔබේ ලැයින්, ටොම්, බලන්න, ඔබේ ලැයින්වලට ගිනි අල්ලලා.''

සේරාට මෙය භය ජනක දර්ශනයක් විය. එහෙත් සියල්ල දවන ගින්නෙන් ඇගේ නෙත් ඇද ගැනීමට ඕ අපොහොසත් වූවා ය. ඒ ගින්නේ බලයෙන් ඕ බිය පත් වුව ද එයින් මහත් ප්‍රීතියක් ද ලැබුවා ය.

හියු ඒ අසල සිටගෙන මොළොක් හඬින් මෙසේ කී ය: ''හරි අලංකාරයි නේ ද?''

හේ ඈ දෙස මොහොතකට බැලී ය. දෙදෙනාගේ ම ලෙළ දෙන ඇස් එකට හමු විය. හේ සිනාසුණේ ය. ''සේරා, ඔබ දකින්ට තිබුණේ මගේ අක්කර හාර සියයේ ඉඩම ගිනි ගත් දවස. මුළු කොත්මලේ මිටියාවතේ ඒ තරම් ලස්සණ ගින්නක් ඇවිලුණු නැති බව මට ඒකාන්ත යි. එපමණක් නො වෙයි, ඒ ගින්නට සුළඟ ද එක්වුණා. අදත් තරමක හුළඟක් නැතුවා නො වේ.''

ටොම් නො ඉවසිලිවත් වූයේ ය. ඒ ඇත්තයි. හදිසියේ ම සුළඟක් හැමී ය. ගිනි පුපුරු සහ දුම් මුසු උණුසුම් වාතය ඔවුනතර විටින් විට කැරකුණි.

හදිසියේ ම හියු ඉදිරියට පැන, ඇස් කුඩා කර, ගින්න දෙස බැලී ය. ''ඔබෙ මිනිස්සු හැමදෙනා ම නිසි තැන්වල ද?''

ටොම් කැලේ අද්දර පරික්ෂා කළේ ය. තැනින් තැන නතර කළ මිනිසුන් ය. සියල්ල නිසි පරිදි තිබුණා සේ පෙනුණි.

උන් හිටි හැටියේ ම හියු මහ හඬින් ගුගුළේ ය. ''ඔබෙ ලැයින්, ටොම්, බලන්න, ඔබෙ ලැයින් වලට ගිනි අල්ලලා.''

හියු කඳු බැවුම ඔස්සේ දුව ගියේ ය. ටොම් ද ඔහු පස්සේ දිවී ය. සමහර විට සුළඟට ආ ගිනි පුපුරක් පරණ පොල් අතු වලට වැටෙන්ට ඇති. මූලප්පරාලය උඩ සිටි මිනිසුන්ට මෙය නො පෙනුණි. වහලයට ගිනි ගත් වහා ම මොවුහු පණ බේරා ගැනීමට ලහි ලහියේ එළියට පැන්නෝ ය.

එක් මිනිසකු අසරණ ලෙස අතින් ගෙන සිටි තෙත අතු කිනිති වගයක් හියු උදුරා ගත් අතර ටොම් තවත් කෙනෙකුගෙන් එබඳු කිනිති ටිකක් ගති. මේවායින් ගින්න නිවීමට ඔවුන් උත්සාහ යෙදූ අතර ගින්න තව තවත් නැඟ ආයේ ය. තවත් ලැයින් පේළියක් ඇවිලුණි.

මෙසේ ලැයින් පේළි කීපයක් ඇවිල වූ ගින්න ටොම් මිලයට ගත් අලුත් උපකරණ තිබූ ගබඩා කාමරයට ද ආසන්න විය.

''තවත් මිනිස්සු ගෙන එනු''යි ටොම් කෑ ගැසී ය.

වියරු වැටුණකු මෙන්, තමාගේ ආරක්ෂාව පවා නො තකා ගින්න නිවමින් ඒ මේ අත දිවූ ගොන්සාලේස් මොහොතක් නතර විය. ''ඉන්න මිනිස්සු සේරම මෙතැනයි, සර්'' යි හේ කී ය.

''කෝ කරුප්පන් ගේ මිනිස්සු''

ගොන්සාලේස් ඔහු දෙස ශූන්‍ය බැල්මක් හෙළී ය. ''කැලෑව අයිනේ සර්, මම හිතනවා.''

''දැන් මිනිස්සු හොය හොයා ඉන්ටවත් වෙලාවක් නෑ. මගේ මේස ලාච්චුවෙන් ගබඩා කාමරේ යතුර අරගෙන, ඉන්න සේරම මිනිස්සුන්ගේ උදව් ඇතිව ආරක්ෂා ඇති ස්ථානයකට උපකරණ ටික ගෙනියන්න.''

ගිනිගෙන දිලිසෙන අතු සෙවිලිකළ වහළකින් කොටසක් බිමට වැටුණි. යන්තමින් පස්සට පැන්නෙන් බරපතළ තුවාලවලින් බේරුණි. ඔහු ඉදිරියේ ම, බේරා ගන්ට බැරි තත්ත්වයට ම ලැයින් හයක් ගිනි බත් වූයේ ය.

ඔවුන් ළඟ සිටි ගැහැණියක් ඉකි බිඳ බිඳ හඬන්ට වූවා ය.

''දෙයියෝ සාක්කි! ඇගේ ළමයා අර ගිනි ගොඩේ!''

ගිනි ඇවිළෙන ගෙපැළට පැන ගිය හියු සිහි නැති ව සිටි, තුන් හැවිරිදි ළදරුවකු වඩාගෙන අවුත් සේරාට දුන්නේ ය.

''දුම් වැදී සිහිසන් නැතුවයි ඇ ඉන්නේ. ඇට සිහිය ලැබෙන තුරු උණුසුම් ව තබන්න.'' ඔහු ටොම් දෙස බැලුවේ දුම් වැකුණු මුහුණකිනි. ''මේවා කිසි දෙයක් දැන් බේරාගන්ට පුළුවන් වේය කියා මා හිතන්නේ නෑ.''

ටොම් කමීස අතින් මුහුණ පිස දමා ගත්තේ ය. ''නෑ, අපි ගබඩාවට යමු.''

කම්කරුවන්ට තමා පස්සෙන් එන්ට නියම කොට ටොම් අඩි පාර දිගේ දිව්වේ ය.

ඔහු දොර තල්ලු කරන විට අතු සෙවෙණි කළ වහළේ කොටසක් දැවෙමින් තුබුණි. දොර අගුළුලා තුබුණේ ය. මේ වේලේ කාර්යාලය දෙසින් කනස්සලු මුහුණක් සහිත ව දුව ආ ගොන්සාලේස් ''යතුර එතන නෑ, සර්''යි කී ය.

එය සෙවීමට දැන් වෙලාවක් නෑ. ''හා, හොඳයි! දොර කඩා දමමු!''

ටොම්, හියු හා ගොන්සාලේස් යන තුන් දෙන ම එකතු වී දොර තල්ලු කළ අතර දිරා ගිය වහළ ගිනි ගනිමින් පැවැත්තේ ය.

තමා අත අඩමින් හුන් දරුවා මවුට දී සේරා කන්ද පහළට දිව්වා ය. එවිට ම, ගිනිගෙන දිලිසෙන මඩුවට ටොම් ඇතුල්වනු ඕ දුටුවා ය.

පිටිපස සිටි හියු හා ගොන්සාලේස් ළහ දී මහ නුවරින් මිලට ගත් වෑ, පොරෝ, මුල්ලු, අලවංගු ආදී උපකරණ රාශිය අහුලාගෙන ඒවා පෙළ සෑදී සිටි මිනිසුන් අතිනත යවා ආරක්ෂිත ස්ථානයක තැන්පත් කළහ.

වහලේ කොටසක් පාත් වෙන විට ම ''ටොම්!''යි සේරා කෑ ගැසුවා ය.

ගොන්සාලේස් හා හියු ද ඉදිරියට පැන්නහ. ඔව්හු දුමින් වැසී ගියහ.

කල්පාන්තයක් මෙන් දික් වූ කාලයක් ගිනි ගන්නා ගොඩනැගිල්ල හැර, අන් කිසිවක් සේරාට දක්නට නො ලැබුණි. දුම් කඳ මැදින් ටොම් හා හියු ගොන්සාලේස් ගේ දුබල සිරුර ඔසවා ගෙන එනු ඕ දුටුවා ය. ටොම් ගේ මුහුණ කළු පැහැ ගැන්වී තිබුණි. ඔහුගේ කබාය තවමත් පිළිස්සේ. හියුගේ තත්ත්වය ද ඊට දෙවෙනි නො වී ය.

ඔව්හු, ඒ කුඩා ඕවර්සියර් තණ බිම මත හෙමිහිට තැබූහ. සේරා ඔවුන් වෙත දුව ආවා ය. නැගිට උන් ඔව්හු පිරිසුදු වාතය ආශ්වාස කරමින් කහින්ට වූහ.

''ඔහුට හුඟක් අමාරු ද?''

''ඒක කියන්ට අමාරුයි. අපි ඔහු බංගලාවට එක්ක යමු.'' හේ තදින් කහින්ට විය.

''ඔබෙ ඉතුරු උපකරණ ටික ගැන කනගාටුයි, ටොම්''යි හියු කී ය.

''ටිකක්වත් බෙරා ගන්ට ලැබීම ගැන මම ස්තුති වන්ත වෙනවා.''

ටොම්, සිය මහත් සිරුර නමා, ළමයකු මෙන් ගොන්සාලේස් ඇතට වඩා ගත්තේ ය. තිදෙනා ම හෙමිහිට ගෙදරට ගියහ.

විනාඩි කීපයක් ගතවූ පසු ඔහු නිදන කාමරයේ සතප්පවා මස්සිනාවරු දෙදෙන පිටතට ආවෝ ය.

''අපි මුලින් හිතූ තරමට ම ඔහු පිළිස්සිලා යයි මම හිතන්නේ නෑ. ඔහු බලාගන්ට තනියම ඔබට පුළුවන් කියා හිතනවා ද සේරා? හියුත් මමත් නැවතත් ගින්න දිහාට යන්ට ඕනෑ. නුමුත් මම කියන්නේ මේක එතරම් ලේසි වැඩක් නො වේ.''

ඕ ඔහු දෙස ඕනෑ කමින් බලා සිටියා ය.

''ඒකාන්තයෙන් ම ටොම් , රෙදි පාන්කඩ ස්වල්පයක් මම ඔලිව් තෙල් වලින් පෙඟෙව්වා–''

ඇගේ කල්පනාකාරී මුහුණේ සිරියාව නරඹමින් සිටි හියු ගේ බැල්ම ඔ නො දැක්කා ය.

ටොම් ද අනුමත කරන ලීලාවකින් හිස සැලී ය. ''ඒ පාන්කඩ පිළිස්සිච්ච තැන්වල යන්තම් තියන්න. වෙළන්නට එපා. අමු මස් හුහක් පෑදී තියෙනවා.''

ඈ එකඟ බව දැක්වූවා ය.

''ඔහුට රස්නෙට යමක් බොන්න දෙන්න. ඔහු නිශ්චල ව තියන්න. තවත් තුවාල කාරයන් එක්කෙනෙක් දෙන්නෙක් මම දැන් එවන්නම්.''

ටොම් හා හියු වහා ම ගෙයින් පිටවූහ. සේරා ගොන්සාලේස් සමග රැඳුණා ය.

ඈ ඇතුළු වන විට ම, හේ නො ඉවසිලිවත් ව වේදනාවෙන් මිරිකෙමින් නො අඩා සිටිනු පිණිස දත් මිටි කන්ට වූයේ ය.

''මම ආපසු යන්ට ඕනෑ. උදව් වෙන්න. පහළ තත්ත්වය නරක බව මට පේනවා.''

ඔහුගේ පසකින් දණ නමාගෙන සේරා ඔහුට සාත්තු කරන අතර ''ඔබව නිශ්චල ලෙස තබන්ට යයි මට නියම කර තියෙනවා'' යි කීවා ය.

''නෙවිල් නෝනා, ඔබ මට මෙහෙම සාත්තු කරනවාට මම කැමති නෑ.''

''ෂ්.........කරුණාකර නිසොල්මන් ව ඉන්න. ඒක මට උදව්වක්.''

මුල දී මේ පිළිස්සීම දැක පිළිකුල් සිතුණ ද, සේරා, හුදු කරුණාවෙන් හා දයාවෙන් බෙහෙත් ගල්වමින් ප්‍රතිකාර කරද්දී, හේ නිශ්චල විය.

මස්සිනාවරුන් දෙදෙනා පිළිස්සී වෙහෙස මහන්සි වී බංගලාවට එනවිට පැය ගණනක් ගතවූවා සේ දැනිණි. කැලේ ගිනි ඇවිලෙමින් තිබුණි. එහෙත් දැන් පෙරට වඩා පරීක්ෂා කාරී වූ මුර කාරයෝ හැම පුපුරක් ම නපුරු සතකු මෙන් සලකා එය නිවා දැමූහ.

අත් පා පිළිස්සුණු තවත් තුවාල කාරයන් කීප දෙනකුට සේරා ඈට හැකි තරම් හොඳින් උපස්ථාන කළා ය.

දැන් ඕ විමසිල්ලෙන් ටොම් හා හියු දෙස බැලුවා ය.

''ඔබේ අත් පිළිස්සිලා!''

හියු දත් පා සිනාසුණි. ''මට කිසි අමාරුවක් නෑ. හොඳ වැඩක් කරන්ට ගිහින් ගෑවුණු කුණු ටිකක් පමණයි මේ. ටොම් ගැන කොහොමදැයි මම කියන්ට දන්නේ නෑ.''

හියු ඇඟ සෝදා ගන්ට ගිය විට සේරා ටොම් ළඟ දණ ගසා හිඳගෙන, පිළිස්සී කළු ගැන්වී තිබුණු ඔහුගේ සම ද මතුවෙන දිය බුබුළු ද දුටු විට ඇගේ නෙත් කඳුළින් තෙත් විය.

''අනේ, පෙම්වත, ඔයා ගැන මා බය වූ තරම!''

හම පිළිස්සී රළුව තුබූ නමුත් කාය පීඩාව ද නො තකා, ටොම් මඳ සිනහවකින් මුව සරසමින් ''මාව ඔහොම ලෙහෙසියෙන් මරන්ට බෑ''යි කී ය.

''අලාබය බොහොම බරපතල ද?''

''දෙයියන් ගේ පිහිටෙන් අපේ උපකරණ වැඩි හරියක් ඉතුරු කරගන්ට පුළුවන් වුණා. මගේ හිත හුඟක් කලබල වී තිබුණේ ඒ ගැන යි.''

''ලැයින් ගැන කොහොම ද?''

''ඒවා ඔක්කොම ගියා. හැබැයි වාසනාවකට මෙන් පරණ ඒවා විතරයි. හියුට ස්තුති වන්ට ,අපට අඩු ගණනේ අලුත් ලැයින් ටිකවත් බේරා ගන්ට ලැබුණා.''

ඔහුගේ මුහුණ හා පිළිස්සුණු ඇසි බැම ඕ තෙත මාත්තු කළාය. දූලි කුණු යටින් ඔහුගේ හම ගින්දර මෙන් රත් පැහැ වී තිබුණි.

හියු ද කාමරයට පෙරළා පැමිණියේ ය. ඔහු හොඳින් ඇඟ පත සෝදා ගෙන ආ නමුත් අත් දෙක පිටි පසට බැඳගෙන සිටිනු සේරා දුටුවා ය.

''කෝ බලන්න ඔබේ අත්, හියු.''

''ඒවායේ වරදක් නෑ.''

අන්තිමේ දී නො කැමැත්තෙන් මෙන් ඔහු දැත දිඟු කෙළේ ය. එක අතක් තදින් ම පිළිස්සී තුබුණු අතර අනිකේ පිට පැත්ත යටට කැපී තිබුණි. ඈ ඒ තුවාලවලට ප්‍රතිකාර කරන අතර ඔහු වේදනාවෙන් පීඩා විඳින බව මුහුණෙන් පළ විය.

''කරුප්පන් හා ඔහුගේ පිරිසට මොනවා වුණා දැයි ඔබ දැක්කා ද? ටොම්''යි සේරා විචාළා ය.

‘‘ඔවුන් සිටියේ කැලේ අනික් පැත්තේ යයි ද ඒ නිසා ඔවුන් දකින්ට ලැබුණේ නැතැයි ද කියා කරුප්පන් කීවා.’’

ඔහු පයිප්පය විකනු සේරා දුටුවා ය. ඔහුගේ සිතිවිලි දැන් බර ව තුබුණේ මේ අලුත් විපත ගැනත් අලාබය කොතරම් ද, ඒ කෙසේ අඩු වියදමින් පිරිමසා ගත යුතු ද යන ආදී කරුණු ගැනත් බැව් ඈට දැනුණි. රාමසාමි සහ ඔහුගේ පිරිස අවුරුදු පතා ඉන්දියාවට යන ගමනෙහි ළඟදී ම යෙදෙන නිසා ඔවුන් වෙනුවෙන් අමුතු ඉඩකඩ සපයන්ට නො ලැබීම කොතරම් වාසනාවක් ද? තාවකාලික වශයෙන් ඔවුන්ට කෝපි ඇට ශුද්ධ කරන කාමරයෙහි නවාතැන් සපයන්ට පුළුවන් වෙතැ යි ඕ සිතුවා ය. ඔවුන්ට වැඩිපුර ආහාර ආදිය ඈ සැපයිය යුතු විය. එහෙත් කවද හෝ අලුත් ලැයින් පේළියක් ගොඩ නැගීමටත් ගින්නෙන් ද විනාශ වූ උපකරණ නැවත මිලයට ගැනීමටත් වියදම් අවශ්‍ය වේ.

ඊළඟ කාමරයේ ගොන්සාලේස් දෙඩවන්ට වූයෙන් ටොම් හා සේරා එකිනෙකා දෙස බලා එකවර ම නැගිට ඔහුගේ ඇඳ වෙතට ගියහ.

ඔහු ඇඳේ ඒ මේ අත පෙරළෙමින් ‘‘යකුර, කවුද ඒක හැංගුවා. මම හැම තැනම බැලුවා—’’

‘‘මම දන්නවා’’යි ටොම් සෙමින් කී ය.

‘‘දැන් ඒ ගැන කල්පනා කරන්ට එපා.’’

‘‘ඔබ—දන්නවා, සර්.’’

‘‘කරුප්පන් ගේ බෑණා, නඩේසන්, මගේ මේස ලාච්චුවෙන් යමක් ගන්නවා දුටු බව කම්කරුවෙක් මට කිව්වා. මා ඒ ගැන ඔහුගෙන් ඇසුවා. කිසි ම ගරුසරුවක් නැතිව ඔහු එය නැතැයි කීවා. මට කරන්ට වෙන දෙයක් නැති නිසා ඔහු වත්තෙන් දොට්ට දැම්මා.’’

‘‘මම දන්නවා මේකට මුල කරුප්පන් බව’’යි ගොන්සාලේස් අමාරුවෙන් පැවසීය. ‘‘සර්.........ඔබ නඩේසන් අස් කළ එක හරි නෑ.’’

ටොම් ඕවර්සියර් ගේ අතින් අල්ලා මෙසේ කී ය. ‘‘දැන් වැඩිය කතා කරන්න එපා. ටිකක් නිදගන්න හදන්න. අසනීප වැඩිකරගෙන, මගේ කරදරවලට තවත් එකතු කරන්ට ඔබට වුවමනා නැහැ නේ ද?’’

‘‘නෑ. සර්.’’ මොහුගේ හඬ කෙදිරියකට පෙරළුණි. ‘‘කරුණාකර මගේ ගෙදරට යන්ඩ දෙන්න. එය මට වඩා පහසු යි. මගේ මේ පිළිස්සීම්වලට දේශීය ප්‍රතිකාරයක් ගන්ටයි මගේ කැමැත්ත.’’

සේරා හා ටොම් බරාදය දෙසට ගමන් කරමින් හියුට ද මේ ගැන කීහ. ‘‘ඒක හොඳ යයි කියා ඔබ හිතනවා ද ?’’යි සේරා නො ඉවසිල්ලෙන් ඇසුවා ය.

‘‘ඇයි නැත්තෙ ? ඒ සමහර වෙදකම් අපේ ඒවාට වඩා අත් දුටු ඒවා. ඉතිරි හරිය විශ්වාසය’’යි කියමින් හියු සාක්කුවට අත් දමාගෙන පියගැට පෙළ බසිමින් ‘‘මමත් යන්ට ඕනෑ’’යි කී ය.

ටොම් අතිනත දී ආචාර කොට ‘‘ඔබ කළ සියලු උපකාරවලට ස්තුතියි, හියු’’යි පැවසී ය.

හියු සරදම් ලීලාවකින් පිළිතුරු දෙමින් මෙසේ කී ය: ‘‘ඒක ප්‍රීතියක්, ලන්තානාවේ බේරහේරා ගන්ට ඕනෑ තවත් යමක් ඇති වූවොත් ඒ මට දන්වන්න.’’

3

වතුවල ප්‍රවෘත්ති වහා පැතිර ගියේ ය. මීළඟ දවස් කීපය තුළ වතුකාරයෝ ලන්තානාවට පැමිණ සිදුවූ විපත ගැන කනගාටුව ප්‍රකාශ කොට ඕනෑ ම උදව්වක් කිරිමට සූදනම් බව පැවසූහ.

ටොම් හා තමා හුදෙකලාව සිටීම ගැන රහසි ගත ලෙස කනස්සල්ලෙන් සිටි සේරා මේ හැඩි දැඩි මිනිසුන් ඇට මහත් හරසර දක්වමින් සුරුට්ටු පත්තු කරමින් පයිප්ප උරමින් ටොම් හා නිරතුරු ව කතා බස් කරමින් සිටීම ගැන විස්මය පත් වූවා ය.

මැතකදී වූ සිදුවීම හිරිහැරදයක වූ නමුදු මෙතෙක් කල් අසල් වැසි වතුකාරයන් හා ඔවුන් අතර පැවැති සබකෝලය ක්‍රමයෙන් අතුරුදන් වන බව ඇට දැනුණි. ආගන්තුක සත්කාර වශයෙන් ඇට දිය හැකි ව තුබුණේ සාමාන්‍ය ව්‍යඤ්ජන හා බතක් පමණකි. එහෙත් උණුසුම් හදවතින් ඕ මේ වතු කාරයන් සාදරයෙන් පිළිගත්තා ය.

පළමුකොට ම මෙහි පැමිණි අමුත්තන් අතර රතු මුහුණක් ඇති, බකල ගමනින් යුතු, තරබාරු ඇන්ගස් මැක්ලොයිඩ් ද විය.

‘‘අපේ නිවාඩුවලට මුදල් රාශියක් වියදම් වී තිබෙනවා, ටොම්. නුමුත් ඔබට යම්කිසි ප්‍රයෝජනයක් සඳහා ඕනෑ නම්, ඉතුරු වී තියෙන මුදල් ටික දෙන්ට පුළුවනි. ඔබට මේ දවස්වල ටිකක් අමාරු බව මම දන්නවා.’’

ටොම් මේ ආධාරය ප්‍රතික්ෂේප කෙළේ ය. එහෙත් ඔහු කෙරේ තම සිතෙහි තද ළබැඳියාවක් ඇති විය.

ඔහුගේ කාර්‍යාලයේ වාඩිවී, ඇන්ගස්ට පෙන්නිමට කඩදසි වගයක් ගනු පිණිස ටොම් ලාච්චුව ඇරියේ ය. හේ හදිස්සියේ තිගැස්සී කෑ ගැසීය.

''ඇයි, මොකා ද?''

එකැවර ම ටොම් ලාච්චුව වැසී ය. ඔහුගේ කඩදසි මත යතුර ඕනැකමින් ම තබා තිබූ කවරෙක් හෝ ටොම්ට භය නැති බව ද දන්වා තුබුණේ ය.

ළඟදී ගිනිගැසූ කැලේ තවමත් දුම නගිමින් පැවතුණි. පොළොවේ අළු යට සැඟවුණු ගිනි පුපුරු තවමත් සම්පූර්ණයෙන් ම නිවී තිබුණේ ද නැත.

අසල දගිය ලැයින් පෙළත්, වැටෙමින් තුබුණු කණුත්, ලණු වියූ ඇඳක සුන් බුන් හෝ කැඩුණු බිඳුණු වළඳක් මේ කාමර මෑතක මිනිසුන් පදිංචි ව සිටි බවට එක ම සාක්ෂ්‍ය වූයේ ය.

ගින්නෙන් පසුව පැවැති මේ දුෂ්කර දවස්වල වත්තේ වැඩපළ තාවකාලික ව නැවතී තුබුණි. කෝපි වේලන කාමරයේ තද බද වී සිටි රාමසාමි ගේ මිනිසුන් ගේ කල්පනාව ඉන්දියාවට යෑම ගැන ය. තමාගේ බැණා වත්තෙන් පිටු දැකීම ගැන කනස්සල්ලෙන් හා නො හොඳින් සිටි කරුප්පන් ඔහුට නැවත රස්සාව දීමට ටොම් නො කැමැති වීම නිසා, එළිපිට ම ටොම් හා කෝලාහලයට ද සූදනම් ව සිටියේ ය.

''දෙරේ, මගේ බැණා නැවත වැඩට ගන්නේ නැත්නම් අපට බොහොම කනගාටුයි, අපට වැඩ කරන්න බැහැ''යි හේ පැවසී ය.

ටොම් කෝපය මනා සේ මැඩපවත්වා ගෙන සිටියේ ය.

''බොහොම හොඳයි එහෙම වුණොත් ඔබට කිසි ම පඩියක් ලැබෙන්නේ නෑ.''

''අපි වැඩ කරන්නට වෙන වත්තක් හොයා ගන්නවා.''

''කම්කරුවන් ඕනෑ නො කරන මේ කාලයේ දී ද?''

මේ අවස්ථාවේ දී කරුප්පන් ඔහුගේ ආඩම්බර කතා ඉදිරිපත් කරද්ද යනු සැක සහිත බව ටොම් වටහා ගති. කරුප්පන්ට අයිති ඉඩමක් ලන්තානාවට යාබද ව තිබෙන බැවින්, ඔහුට මේ වත්ත තරම පහසු තැනක් සොයා ගත නො හැකි ය.

දෙදෙනා ම එකිනෙකා දෙස රවා බැලූහ. පසුව කන්කානියා ගේ තෙල් පැහැති මුහුණෙහි නියාලු ආචාරශීලී බවක් පෙනිණි.

''තමුන්නාන්සේගේ කැමැත්තක්.''

වත්තේ වැඩ කෙරිණි. එහෙත් සතුටුදායක සේ නො වේ. ගොන්සාලේස් නැති නිසාත්, සෑහෙන පමණ දෙමළ නො දන්නා නිසාත්, ටොම් ගේ දුර්වල කම්වලට තෙමේම ශාප කර ගත්තේ ය. ගොන්සාලේස් සුවය ලැබූ වහා ම, තමාට දැනට වඩා කාලය මිඩංගු කළ හැකි වූ විගස ම, ස්වභාෂාවන් දෙක ම ඉගෙනීමට ටොම් ඉටා ගත්තේ ය. ඒ කාලය එතරම් දීර්ඝ නො වන බව ඔහු සැලකුවේ ගොන්සාලේස් ප්‍රාතිහාර්යයකින් මෙන් ඉක්මනින් සුව වෙමින් සිටි හෙයිනි.

ගොන්සාලේස් සිය ගෙදරට ගොස් දවස් දෙකක් ගත වූ පසු ඔහුට තුබූ තද වේදනාව බොහෝ දුරට මග හැරී තුබුණි. සේරා තෙල් ගා එළා තුබූ පාන්කඩ වෙනුවට අඹිහිරි සුවඳින් යුතු දේශීය පත්තු බැඳ තුබුණේ ය.

''ඔහුට මේ බෙහෙත් වලින් ලේ විස නූණොත් පුදුමෙකැයි'' ටොම් සේරාට කීය. ''අනික් මිනිසුන්ගේ තුවාලවලට වඩා මේ දේශීය ඖෂධවලින් ඔහුගේ පිළිස්සුණු තැන් හොඳ වෙන බව පේනවා. මේ බෙහෙත් කොහෙන් ලබා ගන්නවා ද මම දන්නේ නෑ.''

දවසක් ඉතා වෙහෙස වී වැඩකොට නිම වූ ටොම් සිය කාර්යාලයේ සිට කන්කානියා හමුවීමට ගියේ ය. ඇඳිරි වැටී තිබුණෙන් වත්තේ පැවැත්තේ උපශාන්ත ගතියකි. මෙය ඔහු ඉතා ප්‍රිය කළ මොහොතකි. ටික වේලාවක් ලැයින්වල පර බල්ලන්ගේ බිරීමක්වත් පක්ෂීන්ගේ නාදයක් හෝ අන් කිසිවකුගේ කටහඬක් වත් නෑසුණි. හිරු අවරගිර සැපත් වී රන් පැහැති වලා අහසේ පා වෙත් ම මිටියාවත සිසාරා නොයෙක් සෙවණැලි වැටුණි. කෝපි පඳුරු අතරින් ගමන්ගත් ටොම් ගේ විඩාව හා අවිවේකි ගතිය ද අතුරුදන් වී ගියේ ය.

විශාල නුග ගසක් හා වල් අඹ ගසක් අතර ගොන්සාලේස් ගේ වරිච්චි ගේ දිස්විණි. ටොම් ගොන්සාලේස් හමුවී පෙරළා ගෙදර ආ විට රෝගියා ගේ තොරතුරු දැනගැනීම පිණිස හියු එහි පැමිණ සිටියේ ය. ටොම් රෝගියා ගේ තත්ත්වය සංක්ෂෙපයෙන් විස්තර කෙළේ ය.

හියු රාත්‍රි භොජනය ගැනීමට ද නැවතී වෙනත් වතුකාරයන් පිළිබඳ කථා ප්‍රවෘත්තිවලින් හා ඔහු කළ දඩයම් විස්තර කිරීමාදියෙන් පිරිස ප්‍රමොද කළේ ය. සඳ පායා කඳු මුදුනට වන් කල්හි ඔහු සිට ගත්තේ ය.

''මීට වඩා බොහො ම කලින් පුතා ළඟට යන්ට යි තිබුණේ''යි හියු කීවේ ය.

''හා, හියු, ඔහු බලන්ට මම කොච්චර ආසාවෙන් ඉන්නවා ද?''යි සේරා කල්පනා බර ව කීවා ය.

''ඒ ගැන මට සැකයක් නෑ. ඔහු ළඟදී ම දවසක කාටවත් නො කියා මෙහි එන්ට බැරි නෑ.''

උද්‍යොගයෙන් තොර වූ මුහුණක් ඇතිව හියු පිටත්ව ගියේ ය. සේරා හියුගේ පුතණුවන් දක්නට පුල පුලා සිටියා ය. මවු නැති ඒ දරුවා ගැන ඇගේ සිත නිතර යොමු විය. ඔහු දැක ගැනීමට ඇට කවදා ඉඩ ලැබේ ද?

කාණ්ඩය 4

1

තමා ගේ සිහින් සිරුරට සරි නො වන තරම් ලොකු හිසක් ඇති හේ ඉතා කුඩා ළමයෙකි. වැටී තුවාල වූ දණ හිසක කිළුටු වෙළුමක් විය. යන්තම් හය ඇවිරිදි මේ ළමයා ගේ මුහුණේ පැවැති දුර්මුඛ භාවය නිසා ඔහුගේ උද්වේගය කලල අවස්ථාවේදී ම අකුරුදහන් වූවා සේ වී ය.

ඔහුගේ ආයා ද ඔහු අප්‍රිය කළා ය. එහෙත් ඔහුගේ පියා අසල සිටින විට ඒ බව සඟවා ඈ නිමහිම නැතුව ළමයා වර්ණනා කළේ හියු නෙවිල් ගේ මුවග මඳ සිනාවක් පහළ කර ගන්නා අටියෙනි.

දවසක් ආයා ජෝසප් නම් අප්පු සමග කතාබස් කරමින් සිටි කල්හි ඩේවිඩ් ඔහුගේ සෙල්ලම් පිටියේ සිට කෝපි ගස් අතරින් වත්ත පහළට දුව ගියේ ය.

ඩේවිඩ් ගමන් ගත් මග දික් එකකි. කෙටි ම පාරෙන් හැතැප්මක් පමණ විය. එහෙත් කෝපි පඳුරු අතරින් වැටී තුබුණු වක් වූ ඒ මගට ඔහු ප්‍රිය කෙළේ ය. සමහර කාලවල දී ඔහුගේ හිසට උඩින් වැඩී තුබුණු අතු නිසා උමඟක සිටින්නකු මෙන් දැනුණු ඔහුට, තමා කුඩා වන සතකු යයි සිතුණි. අනිත් සෑතුවල දී, ඔහුගේ පියා ළඟ තුබූ සේයා හිම දර්ශනයක ආකාරයෙන් පිපුණු සුදුමලින් ගස් පිරී තිබුණි. මෙසේ මල් හටගන්නා කාලයේ අවට වාතය මල් සුවඳින් පිරී ගියේ ය. රොන් ගන්ට එන බිඟුන් ගේ ගුමු ගුමු නද ද නැලවිලි ගීයක් මෙන් විය.

ළමයා බිම වැටුණේ ය. එහෙත් තුවාලය පිස දමමින්, හේ යළිත් දුවන්ට වන.

සැඟවෙන ස්ථානයකට ඔහු මේ පැමිණියේ දීර්ඝ කාලයකට—සිවු මසකට පමණ– පසුව ය. ඔහු මේ කාල සීමාව ගැන දැනගත්තේ යාබද ලන්තානා වත්තට අභිනවයෙන් මිනිසුන් පැමිණියේ මේ කාලයේ දී යයි ආයා ඔහුට කී නිසාත් තනිය ම ඇවිදින විටක ඔහු එතැනට හදිසියෙන් කඩා වැටුණේ ඊට ටික දවසකට කලින් නිසාත් ය.

කෝපි පඳුරු කෙළවර පතන බිම ය. කඳු බෑවුම ඔස්සේ ගිය මොහුගේ දෙපා රිදෙන්ට වන. වෙහෙස වී ඇවිද, බංගලාව අසල, වඳුලෙන් වැසී ගත් දියවළ ළඟට, හේ හදිසියෙන් ම පැමිණියේ ය. ගලින් ගලට පැන එන රිදී

දිය දහරත්, ඉරු එළියේ රඟදෙන දෙවදුනු පැහැ යුත් කුරත්ගේ එළියත් නිසා මේ ස්ථානයේ දර්ශනය ප්‍රියකරු විය. ඔව්, එහි තෙත් වූ මැටි ඉවුරේ තිබුණේ ඔහුගේ ගුහාව ය.

ඩේවිඩ් දණින් වැටී අඳුරු ගුහාව ඇතුළත එබී බැලී ය. දියසෙවෙලි බැඳී, වල්පැළ වැවී තිබුණු මේ ගුහාව ඔහුට සැඟවීමට තරම් විශාල විය. එහෙත් අද ඔහුගේ අදහස එසේ කරන්ට නො වේ.

ආයාට යළිත් සොයාගෙන ඔහුට දඬුවම් කළ නො හෙන පරිද්දෙන් පසු ගිය වතාවේ දී ඔහුගේ දුනු ඊතල මෙහි සැඟවී ය. නිතර මෙහි අවුත් මේවායින් සෙල්ලම් කරන්ට බලාපොරොත්තු වූ නමුත් ලෙඩින් වැටීම නිසා ඔහුට එය නො හැකි විය. ලෙඩ සුව වූ පසුත් ''ඩේවිඩ් පුන්චි මහත්තයා මෙහෙ එන්න; ඩේවිඩ් පුන්චි මහත්තයා ඔතනට යන්ට එපා''. ආදිය කියමින් ඔහු පස්සේ ම ගිය ආයා ගේ ඇවිටිලිවලින් ඊට බාධා ඇති විය.

ඔහුගේ උනන්දුව එන්ට එන්ට ම වැඩි විය. කුරකුට, එසේ නැත්නම් අර ගහේ පෙනෙන අඹ ගෙඩියකට, ඒත් නැතහොත් අලියකුට පවා විදදමන්ට ඔහුට සිතුණි. ඔහු ගුහාව තුළට අත එබී ය. එහි පිනි වැටුණු වැල්වලින් ඔහුගේ කමිස අත තෙමුණේ ය. ගුහාව තුළ ඉතා සීතල විය. පාසි හා තෙත් මැටියෙන් යුක්ත වූ ඒ ස්ථානය ඔහුගේ සිත නව නවත් උද්‍යොගවත් කෙළේ ය.

පසේ සුවඳ ද මිහිරි විය. කුඩා ඇඟිලි ගුහාවේ ඇතට ම දික් වූයේ ය. ඔහු දුනු ඊතල ඉතා ඇතට දමා තුබුණේ ආයාගෙන් බේරාගනු සඳහා ය. හා! දැන් ඔහුට එය අහුවුණා. ඔහුගේ දුන්න! ඊතල! මහත් උද්‍යොගයෙන් ඔහු එය තදින් අල්ලා ගති. ඒ එක්ක ම මොළොක් යමක් දඟලන රඟ ඔහුට දැනුණි.

ක්ෂණයකින් හේ වේදනාවෙන් හා බියෙන් කැ ගසන්ට විය. ඔහුගේ මාපටැඟිල්ලේ තියුණු යමක් ඇනුණේ ය. තවමත් දුනු ඊ අල්ලාගෙන සිටි ඔහු අත් එළියට ගත් විට ඇඟිල්ලේ සිදුරු දෙකක් දක්නා ලදී.

දිය වළට වතුර ගැනීමට ආ බණ්ඩාට, ළමයා කැ ගසන හඬ ඇසී දුව ආවේය. දුනු ඊතල ළඟ ළමයා වැටී සිටින ආකාරයත් ඔහුගේ දෙනෙත්හි අමුතු බැල්මත්, මා පටැඟිල්ලේ තුවාලයත් දුටු බණ්ඩා මහත් බියට පත් වූයේ ය.

''පුංචි මහත්තයා, මොකද වුණේ? පුංචි මහත්තයා. . . . .''

ළමයා කිසිවක් නො කී ය. බණ්ඩා ළඟට විත් නැමී ඉදිමුණු මාපටැඟිල්ලත් නයි ගුලත් දැක්කේ ය. පිටිසර ළමයෙකු වූ ඔහුට එකෙණෙහි ම සිදුවූයේ කුමක් දැයි අවබෝධ විය.

මේ ළමයා ගෙට ගෙනෙන විට සේරා දෙර රෙදි මසමින් සිටියා ය.

ළමයා ගේ කුඩා සිරුර බණ්ඩා ගේ දෑතේ පණ නැතුව වැතිරී තුබුණි. ඒ මොළොක් වටකුරු නළල පහළ තුබූ ඇසිපිය විනිවිද පෙනෙන සේ සිහින් ව පැවැත්තේ ය.

‘‘නෝනා, ඉක්මන් කරන්න!’’ යි බණ්ඩා කොඳුළේ ය. ‘‘නයෙක් කාලා. මම හිතනවා මාපිලෙක් වෙන්ට ඇති.’’

සේරා ප්‍රශ්න ඇසීමට පමා නො වූවා ය. මෙබඳු අවස්ථාවක දී කළ යුතු දෙය ටොම් කියා තුබුණි. කළ යුතු කුමක් දැයි ඈට නිරායාසයෙන් ම අවබොධ විය. බණ්ඩා ළමයා ඇඳ මත තබද්දීම, දෂ්ට කළ මා පටැඟිල්ල තදින් ඉදිමී තිබෙනු ඕ දුටුවාය. වහාම වැළමිටට උඩින් වෙළුමක් දමා, කුඩා පැන පිහියක් සෝද, වරක් දෙවරක් ඉදිමුණු ඇඟිල්ලට ඇන, තුවාලය කටින් ඉරුවාය.

ලේ ගලාඑන්ට වන. එය ඇද්ද? ළමයාගෙන් තවත් ලේ අද්දන්ට ද? දැනටමත් ඕනෑවට වඩා ලේ ගලා තිබෙ ද? ළමයා ගේ සුදුමැලි මුහුණ දෙස නො ඉවසිලිමත් බැල්මක් හෙළා ඕ තුවාලය වෙළුවා ය.

‘‘බණ්ඩා, තද සැරේට කෝපි ටිකක් ගෙනෙන්.’’

මුලින් බින්දු ස්වල්පයක් පිටගිය නමුත් සේරා ළමයා ගේ කටේ තව තවත් වත් කළා ය. ඔහුගේ මුහුණ යළිත් පැහැපත් විය.

ඉතා මෘදු ලෙස ඔහු නැගිටුවා බණ්ඩාගේ ද උදව් ඇතුව ඔබ මොබ ඇවිදවන්ට වූවා ය. මුල දී මෙය රූකඩයක් ඇවිදුවීම බඳු වුවද දැන් ළමයා මඳක් කෙඳිරි ගා පසු ව අඩන්ට පටන් ගත්තේ ය.

‘‘නෑ, පුතා, තව ටිකක් ඇවිදින්ට ඕනෑ.’’

ඔහුගේ සිහින් කකුල් ඇද්දෙන්ට වූ නමුදු ඔව්හු ඔහු තදින් අඩද්දී ම ඇවිද්දෙව්වෝ ය. පැයක් හෝ දෙකක් පමණ ගත වූ පසු කුඩා දරුවා ගේ නිදිමත ගතිය දුරු විය. එහෙත් හේ බොහෝ වෙහෙසට පත්ව සිටියේ ය.

බණ්ඩා සෙමින් මෙසේ කී ය. ‘‘පුංචි මහත්තයාට දැන් නිදගන්ට හරින්න. එතකොට හොඳවෙයි කියා, මා හිතනවා.’’

ඔහුගේ ඩා දිය පිරි පොකුටු කෙස් පිරිමදිමින් ඔහුට ඇඳ මත නිදන්ට ඕ සැලැස් වූවා ය. දුප්පත් අසරණයා! ඔහු මෙහාට තනියම ආවෙ කොහොම ද? ගැණියක නැති, මේ යාබද විශාල වත්තේ හේ කෙබඳු ජීවිතයක් ගත කරයි ද?

පිටතින් ඇට අඩි ශබ්දයක් ඇසුණි. ඊළඟ මොහොතේ දී කිසි දැන්වීමක් නැතුව ම හියු නෙවිල් කාමරයට ඇතුළු වූයේ ය.

‘‘ඩේවිඩ්ට මොකද වෙලා තියෙන්නේ? ඔහු මෙතැනට ආවේ කොහොමද?’’ ඔහුගේ හඩ සිත් නැවුල මෙන් ම කෝපය ද දනවී ය. ඇගේ මනස්තාපය කෝපාවිෂ්ට වචන මාලාවකට පෙරළෙනු ඇට දැනිණි.

‘‘ඒකට උත්තරය මට වඩා හොඳින් දැන ගත යුත්තේ ඔබ යි. ඔහුට වෙලා තියෙන්නෙ. . . .නයකු දෂ්ට කරලා. . . .මාපිලෙක් කියල බණ්ඩා කිව්වා.’’

ඔහු ඇඳ ළඟ වැටී සිය පුතණුවන් ගේ ඩා දිය වැකුණු කෙස් කළඹ පිරිමදින අතර දිග සුසුමක් හෙළනු ඇට ඇසුණි.

‘‘ඔබ එය හොඳින් ම දන්නවා ද? ඔබ කළ ප්‍රතිකාරය කුමක් ද?’’

ඔහුගේ ප්‍රශ්නයේ රළු පරළු ගතිය ඕ නො රිස්සුවා ය. නො සැලි කොටින් පිළිතුරු දුන්නා ය.

හියු හෙළුවේ අස්වැසිලි සුසුමකි. ‘‘මෙරටට ළඟදී ආ කෙනකුට නියම ප්‍රතිකාර කරන්ට පුළුවන් වෙතැයි මා හිතුවේ නෑ. මට සමාවෙන්න.’’ මොහොතකට මඳ සිනහ රැල්ලකින් ඔහුගේ මුහුණ ප්‍රබෝධමත් විය. ‘‘හොඳයි මීට වඩා කුඩා වූ එහෙත් විසකුරු සර්පයෙක් වුණා නම්—ඩේවිඩුත් ගෙදරින් මීට වඩා ඈත් ව සිටියා නම් කියන්නේ—කොයි දෙයියන්ට ද— ?’’

ඔහුගේ මුහුණ මලානික වී තිබෙනු සේරා දුටුවා ය. ඇගේ කෝපය මඳක් යටපත් විය. ‘‘ඔහුට මෙහෙම තනියම යන්ට ඉඩ අරින්නේ ඇයි? සමහර විට මීට වඩා නපුරක් වුණා නම්.’’

හියු මහත් නො ඉවසිල්ලෙන් ළමයා ගේ ලක්ෂණ කළු හිසකෙස් පිරිමැද්දේ ය.

‘‘ඩේවිඩ් ගේ ප්‍රශ්නය නිරාකරණය කරගන්නේ කොහොම ද කියන එක දෙයියෝ දනී. මෙරට ආයා කෙනකුට ළමයා බාර දුන්නාම ලේසි නැහැ.’’

ඩේවිඩ් නෙත් අයා ‘‘රිදෙනවා. . . .රිදෙනවා’’ යි කෙදිරි ගාන්ට වන. සිය පියා දුටු ඔහුගේ කෙදිරිය නැවතිණ. බියපත් වූ ඔහුගේ විශාල නෙත් සහළ හියු නෙවිල් දෙස යොමු විය.

‘‘හය වෙන්ට එපා, පුතා. මම ඔබට බණින්නේ නෑ.’’

ළමා බැල්ම වෙනුවට කල්පනාකාරි අවිනිශ්චිත බැල්මක් මේ ළමයා හෙළන බව සේරා දුටුවා ය. හියු නෙවිල්ට ද එය වැටහුණු බව ඈ දැන ගත්තේ හැඩි දැඩි පෙනුමක් ඇතිව ඔහු වහා ම නැඟිට්ට හෙයිනි.

''ඒ කෙසේ වෙතත් කිසි ම කතාවක් නැතුව ඔබට වත්තෙන් පැන දුවන්ට හේතුවක් තිබුණේ නෑ. ඔබ මේ පැත්තට ආ බව කම්කරුවකු නො දැක්කා නම් ඔබ කොතන ඉන්නවා දැයි අපට සොයාගන්ට බැරිවෙනවා. මා කියන දේ ඔබට ඇහෙනවා ද, ඩේවිඩ? ආයිත් එහෙම මෙහෙම කරන්ට එපා.''

''හොඳයි, තාත්තේ.''

සේරා පිය පුත් දෙදෙනා දෙස බැලුවේ අනුකම්පා සහිත සිතකිනි. හැඩි දැඩි ගතියක් පියා දැක්වූයේ ඔහුගේ සිතේ වියවුල නිසා යයි ඇට කල්පනා විය. දුප්පත් ඩේවිඩ, දුප්පත් හියු.

දෙදෙනා ම පිටවී ගියහ. ඔහු රළු ලෙස ඇගෙන් වෙන් වී ගියේ ය. ''මගේ පුතා මට හද වඩා ගන්ට බැරිය කියා ඔබ හිතනවා හේමා. මා හය අවුරුද්දක් තිස්සේ ඔහු බලා ගත්තේ නැද්ද?'' යි හෙතෙම රළු වදනින් විචාළේ ය.

''හියු—මේ—මේ—මම කරුණාකරලා තව ටික දවසක් ඩේවිඩ තියා ගන්න ද? මේ ලෙඩේ හොඳ වෙනකල් ඔහු තියාගන්ට මම බොහොම කැමතියි.''

හියු සේරා දෙස බලා හිස සැලී ය. ''නෑ, සේරා, ඩේවිඩුයි මායි අපේ ගැළවිල්ල ලබා ගන්ට එපායැ.''

ඇට අතිනත දී ආචාර කොට ''ඔබට අනේකවාරයක් ස්තුති වේවා'' යි හේ කී ය.

2

ඒ සියුමැලි දරුවා වඩාගෙන හියු නෙවිල් ඔහුගේ වත්ත දෙසට පා නැගී ය. ඩේවිඩට සිය පියා ගේ ටවිඩ ජකෙටවුවේ රළු බවත් ඔහුගේ විශාල අත්වල නුපුරුදු සුව පහසුත් දැනුණේ නිසොල්මන් ව සිටියේ ය.

තියුණු ඇස් යුවළකින් යුත් මනා පෙනුමක් ඇති ඔහුගේ තරබාරු ආයා හියු ගේ බංගලාවේ සිට දෑත් ඔසවමින් දුව අවුත්, ''අයියෝ, පූංචි මහත්තයා, කොහේද ගියේ. මම හැම තැනම හෙව්වා—මේ මහත්තයා ඔහොම්ම මයි.''

''බැහැපන් දෙට්ට'' යි හියු නෙවිල් හෙමිහිට කී ය. ''උඹේ බඩු අරන් පැයක් ඇතුළත මෙහෙන් පිටවෙන්ට ඕනෑ.'' හියු ගේ ස්වරයෙන්, ඔහුට කිසිවක් කියා බේරීමට ඉඩක් නැති බව ඇට හැඟුණි. කනස්සල්ලට පත් ඕ ගත වෙවුලමින්, තරහෙන් පුපුරමින්, එතැනින් පිටවූවා ය.

අසල්වැසි වතුකාරයන් ගේ බංගලාවලට වඩා බොහෝ සේ විශාල වූ, හියුගේ ගලින් තැනූ බංගලාව ඉදිරිපස ලොකු පෝටිකෝවක් හා බරාඳයක් විය. හියු ගෙදර පියගැට පෙළ නැග, ළමයාට සෙල්ලම් කිරිමට වෙන් වූ කාමරයට ඔහු ගෙන ගියේ ය. විශාල වුවත්, සිරුරට කිසි සැපක් නුදුන් තනි ඇඳක් හා වත්තේ ම සාදන ලද දළ මේසයක් හා ලාච්චු පේළියකින් යුත් පෙට්ටගමක් ද සහිත වූ මේ කාමරය අඳුරු එකක් විය. මේ සියල්ල මැනවින් ඔහු දුටු පළමුවෙනි වාරයත් මෙය විය.

ළමයා ඇඳ මත තබා හේ හෙමිහිට මෙසේ කී ය: ''ඩේවිඩ්, ඔබ ඔහොම ඉන්න ඕනෑ. ඔබේ රෑ කෑමත් සමග කරෝලිස්ට ඇවිත් මෙහි ඉන්ට කියන්නම්.''

ඩේවිඩ් සිය විශාල දෙනෙතින් ඔහු දෙස බැලී ය. ''මගේ පින්තූර පොත දෙන්න පුළුවන් ද?'' යි හේ කොඳුළේ ය.

හියු කාමරය වටේ ම බලා ජනෙල්වත මත, ඉරි, කැඩී බිඳී ගිය කඩදසි කවරයක් දැමූ පින්තූර පොතක් දුටුවේ ය. ලාබ පොතේ අවලක්ෂණ ගතිය දැක' හේ කම්පා විය.

''මේකද ඕනෑ?''

''ඔව්, සර්.''

''සර්'' යන වචනය ඔහුගේ සිරුරට වැදුණු පහරක් මෙන් විය. ''මට සර් කියන්ට එපා. ඇහුණ ද? තාත්තා කියන්න. ඒක මතක තියා ගන්න ඔච්චර අමාරු ද?''

''නෑ, තාත්තා.''

''ඊ ළඟට මේ පොත ගැන. වෙන පොත් නැද්ද?''

පොතේ තද පැහැති පිට කොළය දෙස බලමින් ඩේවිඩ් හිස සැලී ය.

හියු ලොකු අකුරක් පෙන්වා ''ඒ මොකක් දැයි ඔබ දන්නවාද?'' යි ඇසී ය.

ළමයා ලොකු ඇඟිල්ල දෙස රවා බැලී ය.

''ඉතින්, ඔබ දන්නවා ද? නැද්ද?''

ඔහුගේ හඬ නැසෙන තරමට සිහින් ය. ''න. . . .නෑ සර්. . . . .නෑ තාත්තා.''

‘‘එහෙනම් මේක?’’ ඔහු ‘‘B’’ අකුරටත් ‘‘C’’ අකුරටත් ඇඟිල්ල තැබී ය.

ළමයා නො සතුටින් යළිත් හිස සැලී ය.

‘‘මොනවා!’’

හියු නෙවිල් සාක්කුවල අත්දමා ගෙන කවුළුව වෙතට ගියේ ය. අවුරුදු හයේ දී තමාට කියවිය හැකි විය. නුමුත් එය ළමයා ගේ වරද නො වී ය. හියු නෙවිල් ම වරද කරු විය.

ඔහුගේ උගුර හිර වී අනිත් අතට හැරුණි. ‘‘සුභ රාත්‍රියක් වේවා, පුතා. හොඳට නිදගෙන උදේ නැගිටින්න. එතකොට හොඳ වේවි.’’ අවුරුදු බොහෝ ගණනකට පසු සිය පුතු ගේ මුහුණ සිඹීමට ඔහු තුළ බලවත් ආශාවක් ඇති විය. එහෙත් පුරුද්දත් පුදුම සහගත ලජ්ජාවකුත් ඒ වැළැක් වී.

සාක්කු යටට ම අත් දමාගෙන හියු බරාඳයට ඇවිත් ජේම්ස්ට අඬ ගැසී ය. සේවකයන් ගේ කාමර පැත්තෙන් දුව ආ මේ අප්පු ගේ සොර මුහුණ දෙස හියු නො මනාපයෙන් බැලී ය. තමාගේ ස්වාමියාට හොඳට කන්ට බොන්ට දී රැකබලා ගන්නා තෙක් ඔහු වැඩි විමසීමක් නො කළ නිසා අවුරුදු ගණනක් මුළුල්ලේ ම ජේම්ස් සොරකමට ඇබ්බැහි වී සිටියේ ය.

‘‘අර ගැණි ගියා ද?’’

‘‘සර්, මේක ඇගේ වරදක් නො වේ. පුංචි මහත්තයා නිතර ම—’’

‘‘උඹේ අදහස මම ඇහැව්වේ නෑ’’ යි හියු නෙවිල් කුපිත ව කීය. ‘‘පැයක් ඇතුළත දී මේ ගෙයින් දෙවට යන්ට යයි මම ඇට කිව්වා.’’ ඔහු තම ඔර්ලෝසුව දෙස බැලී ය. ‘‘විනාඩි විස්සකින් ඇ මෙතැනින් පිට නුණොත් උඹත් යන්න ඕනෑ. නුඹලා ගැන මම ඉවසුවා ඇති.’’

‘‘හොඳයි, සර්.’’

‘‘මට බ්‍රැන්ඩි සහ වතුර ටිකක් ගේන්ට කරෝලිස්ට කියාපන්, විගහට!’’

තමාට අයිති වැඩය අලුත් සේවකයකුට පැවරීම ගැන බලවත් සේ උදහස් වූ මේ මිනිසා එතැනින් පිටවී ගියේ ය.

හියු බරාඳයේ තුබූ හාන්සි පුටුවක දිගා විය කම්කරුවන් ගේ ලයින් වලින් ලහි ලහියේ ගැසෙන බෙර හඬ ද, ඉඳ හිට පිඹෙන හක් ගෙඩි හඬ ද ඇසෙන්ට විය. බල්ලෝ කීප දෙනෙක් උඩු බුරුලන්ට වූහ. මොහුගේ බලුගෙවල සිටි බල්ලෝ ද ඊට ම එකතු වූහ.

මට සැනසෙන්නට කිසි ම තැනක් ඇත්තේ ම නැද්ද? අවුරුදු මෙපමණ ගණනක් මුළුල්ලේ කළ උත්සාහයේ ප්‍රතිඵල මේක ද? සශ්‍රීක ව වැඩෙන කෝපිත්, කලින් කල ගලා එන මුදල් රාශියත් ඇරුණු විට, මේ කිසි සැපක් නැති ගෙයත්, තනි ව සිටින මළපත අකුරක් නො දන්නා මේ පුතාත් හැර ඔහුට සැනසීමට තිබෙන්නේ කුමක් ද?

පසු ගිය අවුරුදු කීපය දෙස බැලූ විට ඒවා කොතරම් හිස්දැයි ඔහුට දැනුණි. එහෙත් ඒවා එසේ හිස් නො විය යුතුව තිබිණි යයි හේ කල්පනා කළේ ය.

වෙනත් පියවරු ද පුත්තු ද මහත් ළබැඳියාවෙන් වෙළී සිටියහ. හියු ගේ ඇස් කල්පනාවෙන් බර විය. වගකීමෙන් තොර ව විනෝදය හා ප්‍රීතිය සෙවීම ඔහුගේ නිසග ගතියෙකි. ළමයා ඔහුගෙන් පියකුගේ යුතුකම් අපේක්ෂා කළේ ය. එහෙත් ඒ සැපයීමට හේ අපොහොසත් විය.

''සර්, බරැන්ඩි.''

ඔහු ළඟ සිටි සේවකයා අවුරුදු විසි ගණනකට වඩා වයස නැති ගැටවර යෙකි. කැම පිසීම, පිහන් සේදීම වැඩ පමණක් නො ව දුෂ්ට ජේම්ස් ගේ වැඩවලින් අඩකුත් කළ, කණිටු සේවකයෙකි. හියු නෙවිල් කරෝලිස්ට දෙවියකු මෙන් විය.

''බෝතලේ ඔතන තියලා ඩේවිඩ් පුංචි මහත්තයා ළඟට පලයන්. අද රෑ පුංචි මහත්තයා එක්ක ඉන්ට ඕනෑ. ජේම්ස්ට එන්ට කියාපන්,''යි පසු ව හිතුණු විලාසයෙන් හේ කී ය.

''ජේම්ස් ආයා එක්ක ගියා,'' යි කරෝලිස් කීවේ ය.

හියු තොල් විකා ගත්තේ ය. මේ ගැහැණිය ජේම්ස් සමග කතා කරමින් සිටිද්දී ඩේවිඩ් පැන ගියේ යයි කම්කරුවකු කීවේ සැබෑවකි. ඒ මිනිසා තමාට ම දෙටට දැමීමට සිදු නො වීම මෙයින් සැලසුණු වාසිය යි.

හේ යතුරු කැරැල්ල මේසය මත දැමී ය. ''හොඳයි; නුඹට ම මේ සියල්ල බලා කියා ගන්ට පුළුවන්. නිදගන්ට ඉස්සර පුංචි මහත්තයට උණු උණුවේ කිරි ටිකක් දෙන්ට ඕනෑ.''

වීදුරුව අතින් ගෙන, හියු දැකුම්කලු දර්ශනයන්ගෙන් හෙබි ඒ දිස්ත්‍රික්කයේ අති රමණීය දර්ශනයක් දෙස බලමින් සිටියේ ය. වාඩි වී සිටි තැන ම සිට, එකක් පිටුපසින් එක එක නැග අහස දක්වා උස් වූ කඳුගැට පෙළ හේ දුටුවේ ය. මිටියාවතේ නිල්වන් කුඹුරු ද, පොල් ගස් ද, ගම්බද කෝපි වතු ද අනූන විය. මෙසේ බලා සිටිද්දී ම—සමහර විට ඔහුගේ ම විය හැකි—කම්කරු පිරිසක් සතියට ඕනෑකරන කන බොන දේ ගෙන පතන ඉඩම් ඔස්සේ සිය වත්තට එන සැටි හේ දුටුවේ ය.

හේ නැගිට පිය ගැට පෙළේ මුදුනත ම සිට ගත. දකුණු පසින්, මුදුන අක්වා කෝපි වලින් වැසුණු විශාල කන්දකි. අවට හැම දෙසින් ම පෙනුණේ සශ්‍රීක ව වැඩුණු කෝපි පඳුරු ය. ඔහුගේ කෝපි! මෑතක ඇති වූ දියුණුවට වඩා උද්‍යොග කරවන සුළු වූ කාලයේ, විනාශය ඔන්න මෙන්නැ යි පෙනුණු ඒ ඈත කාලයේ පරිශ්‍රමයන් ගේ ප්‍රතිඵලයයි මේ. මුළු දිස්ත්‍රික්කයේ ම ඊට සමකළ නො හැකි සේ අලංකාර වූ ගබඩා කාමරය ද කෝපි ඇට ශුද්ධ කරන මඩුව ද ඉඩමේ තැනිතලා බිමක විය.

ඉතා ශොභමාන අක්කර හත් සියයක් මුලදී ලබාගත් කුඩා ඉඩම් කැබැල්ලට ටිකෙන් ටික ඈඳා ගැනීමට ඔහු ගත් ප්‍රයත්නය දන්නෝ ඔහුත් දෙවියෝත් පමණකි. දවසෙක මේ සියල්ල හිමිවන්නේ ඔහුගේ පුතාට ය—ඔහුගේ ගෙදරට අමුත්තකු වූ, ඇත්තෙන් ම සිය පියාට ද අමුත්තකු වූ, පුතාට ය.

තවමත් පමා වූයේ නැතැයි හේ ගරාදි වැට අල්වා ගනිමින් ම සිතී ය. සිය පුතා දෙසට යන්නට හැරෙද්දී ම, තමාගේ බංගලාව දෙසට එන කඩිසර අශ්වාරොහකයකු ඔහුගේ නෙතට ලක්විය.

මේ සා දුරදී පවා මයික් ඔ'පැරල් හා ඔහුගේ විසාල අසුත් හඳුනාගත හැකි විය.

අශ්වයා සෙමින් සෙමින් කුර තබමින් ගමන් ගති. නිග්‍රෝ ජාතිකයන් ගේ හිස් වැස්මක් ලා සිටි, මාස ගණනක් මුළුල්ලේ දූළි පිහියක හෝ කතුරක පහස නොලත් හිසකෙස් හා රතු රැවුළ ඇති, මේ තරබාරු අශ්වාරොහකයා අසු පිටින් බැස්සේ ය. ඔහු ඇඳ තුබූ කෙටි ට්වීඩ කබාය පුපුරන තරමට තදවී තුබුණි. ලොකු කළු පටියකුත් රිදී ගාංචුත් කලිසම් කට්ටලය ඇඟ දූවටී ය. කුඩැල්ලන් වළක්වන පටි බැඳි කළු සපත්තු දෙකකින් හේ සැරසී සිටියේ ය.

‘‘හියු, නාකි දුෂ්ටයා, මෙච්චර කලක් මා බලන්ට නාවෙ ඇයි’’ යි හේ ගුගුළේ ය.

‘‘ඊට වඩා වැදගත් වැඩ තිබුණු හින්ද’’ යි කියමින් සිය අසල් වැසියාට ආචාර කරන්ට හියු ළං වුණි. ඔහුගේ මුවින් අරක්කු ගඳ නික්මුණේ ය.

‘‘යකා ගෙ පිළිගැනීමක් නෙ මට ලැබෙන්නෙ,’’ යි අයිරිෂ් ජාතිකයා ආඩාපලි කීවේ ය. ‘‘කෝ, ඔබේ අර හොර කුදිරකාරයා. මගේ අස්වයාට වතුර ඕනෑ. ඌගේ ඇඟ අතුල්ලන්ටත් ඕනෑ. මුත්තු සාමි, නාකි යකා! මුත්තු සාමී, ‘ඉන්ගෙවා’ ජඩයා.’’

තම මිත්‍රයන් ගේ විගඩම්වලට හොඳට පුරුදු හියු ද මහ හඬින් කෑ ගැසූ විට දෙමළ කුදිරකාරයා ඉස්තාලය දෙසින් බැගෑපත් ලෙස ආචාර කරමින් දිව ආවේ ය.

අවශ්‍ය වූ විටෙක පයිප්පය දල්වා ගැනීමට ගිනි හුලක් ද පසෙක ඇති ව, ඔවුන් බරාඳයේ ආලාප සල්ලාපයෙහි යෙදී සිටිය දී හියු මෙසේ කී ය: ''ඔබ ආවේ හොඳ වේලාවක නෙ, ජේම්ස් ගිහිල්ලා. ඒ ගැන මට කනගාටු නෑ. ඔහු දෙවට දැමීමේ කරදරෙන් බේරුණා. ඒ නමුත් ඔබට ඇතැයි කියා හිතනවා නම්, රෑ කෑමට බිත්තර ටිකක් හොයා ගන්ට පුළුවනි.''

''ඇති නැති කම කැලේ දනවා ඕයි! රසවත් 'ව්‍යඤ්ජනයක් තිබුණා ම නරක ද මිනිහෝ? ලයින්වල සිටින ගෑණු කීප දෙනෙක් මෙහාට ගෙන්නනවා. ඔය කෙල්ලකට කොච්චර රසවත් ලෙස ව්‍යඤ්ජන හදන්ට පුළුවන් ද? කරන්ට ඕනෑ කුමක් දැයි මම කියන්නට ම ඕනෑ ද?''

හියු දත් පා සිනාසී, කරෝලිස්ට අඬ ගැසී ය. ලයින්වල ගෑණුන්ගෙන් කිසි උදව්වක් නො ලැබුණාට රසවත් ව්‍යඤ්ජනයක් සපයාදීමට මොහුට බැරි කමක් නැති බව හියු හොඳින් දත්තේ ය.

''හරිෂෝක්, මේක,'' යි කියමින් අයිරිෂ් ජාතිකයා විස්කි වීදුරුවක් පුරා බීවේ ය. ''මටත් මෙයින් විස්කි පෙට්ටි එකක් හෝ දෙකක් ගෙන්වා ගැනීමට ස්කොට්ලන්තයේ සිටින ඔබගේ විස්කි පෙරන සමාගම ගැන මට දන්වන්ට ඕනෑ.'' ඔහුගේ පළල් කකුල් සැප පහසු පිණිස දිගහරිමින් හේ මිතුරා දෙස නෙත'ගින් බැලී ය. ''ඔබට මොකක් ද අමාරුවක් තියෙන් නැඩයි. මොකද ලෙඩේ, ආ?''

''අද සවස පුංචි ඩේවිඩ් ව සර්පයෙක් දෂ්ට කරලා අපට ඒ ගැන හරියට වෙහෙසෙන්ට වුණානෙ,'' යි හියු කීය.

''හැබැට ම!'' යි ඔපැරල් කාන්සාවෙන් කී ය. ''නයෙක් නෙවෙයි, නේ ද?''

''නෑ. දෙයියන්ට පින් සිද්ද වෙච්චාවෙ. එහෙම වුණානම් ඔහු මැරෙයි. මම හිතනවා ඒ පුංචි මාපිලෙක් වෙන්ට ඇතෙයි කියලා. ඒ වුණත් මගේ කදිම මස්සිනා ගෙ—ටොම් ගේ—නෝනා නිසා නො වේ නම් ඒ ළමයා ජීවත් වෙන්නේ නෑ.''

''ඔබ කියන්නේ ලන්තානාවේ නෙවිල් නෝනා ගැන ද?''

හියු හිස සැලී ය. ''ඈ නියම ප්‍රතිකාර ද කළා. ඒක පුදුම විධියට කළා. වෙහෙස වීමත් ලේ ගැලීමත් නිසා දුර්වල ව සිටින නමුත් දැන් ළමයාට සනීපයි.''

''දේව මැණියනි,'' යි මයික් ශ්‍රද්ධාවෙන් ඇස් පෙරළමින් මතුළේ ය.

''හියු, ඔහු හොඳ ළමයෙක්. ඔබ හොඳ පියෙක් ද නැතහොත් කවද නමුත් ඒ තත්ත්වයට එයිද යන්න මට නම් සැක සහිතයි.'' හියු මුමුනන්නට විය. ''නිශ්ශබ්ද වෙනවා ඔයි! ඔබ කේන්ති නො ගස්සා මට ඔබට කෙලින් ම කථා කරන්ට පුළුවන්. ළඟදී දවසක ඔබට හරි කරදරයකට මුහුණ පාන්ට වෙයි. දැනටමත් ඔබට කරදර නැතුවා නො වෙයි.''

''ඉස්සාගේ ඔළුවේ අශුචි තබාගෙන මං සුදනා කිව්වා වගේ. මයික්, නුමුත් කුලිකරුවන් එක්ක ඔබ වගේ මම කේන්ති ගන්නේ නෑ.''

''හා, ඒක හරි. ඉඳ හිටලා යුක්තිය ඉෂ්ට කළා ම හොඳ ප්‍රතිඵල ලැබෙනවා,''යි මයික් පිළිවදන් දුනි. ''කට කතාවල් හැබෑනම් ඔබේ මස්සිනා ගේ ලොකු කන්තාතියාට එවැන්නක් අවශ්‍ය යි. අර ගිනි තියන දවසේ මහ කැත වැඩ වගයක් කළාලු නේ ද?'' ඔහුගේ කුඩා ඇස් ලෙළඳුනි.

''ඔබට මේ ඔපාදූප ලැබෙන්නේ කොහෙන්දැයි දෙයියෝ දනි,'' යි හියු මිමුනුවේ ය.

''ඔබේත් කොච්චර දේ කෙනකුට දැනගන්ට පුළුවන් ද?'' යි අයිරිෂ් ජාතිකයා පැවසී ය. ''හොඳයි දැන් ඉතින් ඕවා නො වෙයි, නෙවිල් නෝනා ගැන කියනවකො. මොකක් හරි නිසා මට තවම එහෙ යන්ට බැරිවුණා. ආරංචිවල හැටියට ඈ හැඩකාරියක්.''

හියු පයිප්පය ඉරුවේ ය. සේරා ගේ නියම රූ සපුව විස්තර කිරීම ඔහුට උගහට විය. එහෙත් එසේ කළ යුතුදැයි ද ඔහුට නිශ්චය කළ නො හැකි විය. සිනහවට කැපෙන පිරුණු දෙතොලත්, ඈ ඔහුට බැණ වදින ලීලාවත්, වළ ගැසුණු කොපුල් තලයත්, ඇගේ සිහින් සිරුරේ කඩිසර ගතියත්, සෘජු සප්‍රාණික බැලීමෙන් ඔප් නැඟුණු තියුණු නිල්වන් නෙත් යුවළත්, ඔහුගේ සිතේ ඇඳී ගියේ ය. ''හැඩකාරියක්?'' යි හේ හෙමිහිට කී ය. ''ඒක කියන්ට අමාරුයි. නුමුත් ඊට වඩා වැඩි දෙයක් ඈට තියෙනවා—දුර්ලභ වීර ගතිය.''

''ස්ත්‍රියක ගේ අන් හැමකට ම වඩා මා අගය කරන ගුණය'' යි මයික් කීයේ ය. ''මේ සතිය කෙළවර වන්ට මත්තෙන් මම කොහොම හරි යනවා.''

''ඈට ආධ්‍යාත්මික ශක්තිය තියෙනවා'' යි හියු තමාට ම මෙන් කියා ගති. ''ඒ සමග ම විකට රසයකුත්. මා සමග වැඩි පැහැදීමක් නැති නිසා මට එය හරිහැටි පේන්නේ නෑ.''

''නෙවිල් නෝනා ඔබ සමග අමනාප මොකද?'' යි ඔ'පැරල් විචාළේ ය.

''ලන්තානා වත්ත විකිණීමෙන් ඇගේ අගනා ටොම් --මගේ මස්සිනා-රැවටුවා යැයි ඇ හිතනවා. නුමුත් මම එහෙම කළේ නෑ. ඔබ දන්නා හැටියට, ඒ ඉඩම බොහොම සාරයි. ඒක හරි හැටියට වැවවොත්—''

''ඒ එක්ක ම ගේත්. ඒකත් ඉතා ම හොඳ යයි ඔබ කියනවා ද මිත්‍රයා?''

''ලන්තානාවට මනමාලියක් කැඳවාගෙන ඒමට තරම් ටොම් මෝඩ බව මම දන්නේ කොහොම ද?''

''ඔබ ද ඇතුළු ව ඔහුට ඊෂ්‍යා නො කරන කිසි ම කෙනෙක් මේ දිස්ත්‍රික්කයේ නැති බවට ඕනෑ ම ඔට්ටුවක් මම අල්ලනවා.''

හියු උරහිස සෙලවී ය. ''තනිකඩ ජීවිතය ගැන කිවයුතු බොහෝ දේ තියෙනවා.''

''ඔබට ඩේවිඩ් මතක නැති වෙනවා නේද?'' යි සරදම දුරලා මයික් කී ය.

හියු රවා බැලී ය. දෙදෙනා ම ටික වේලාවෙක් නිශ්ශබ්ද වූහ. හියු වහා නැගිට්ටෙ ය. ''මම රටින් ගෙන්වා ගත් අලුත් බල්ලන් බලමු. ළඟ දී දවසක ඔබයි මමයි මුව දඩයමේ යන්ට ඕනෑ.''

3

අරලිය හා ලන්තානාව යන වතු දෙක අතර මායිම ඇළකි. හියු නෙවිල් හා සේරා පළමුවෙන් ම හමු වූයේ මේ ඇළ පහළ ය. වතු දෙක මුදුනෙහි වූ කඳුවලින් රූරා බස්නා මේ දිය කඳ අවට සියල්ලන්ට ජලය නො මසුරු ව සපයමින් පහළ මිටියාවත් කරා ගලා බසී.

වතු දෙකේ මායිම් අතර දී මේ කුඩා ඇළ කුඩා කාණුවක් මෙන් කුඩා විය. වතුවල බෙදීම උපහාසයට ලක් කරමින් මෙන්, සිනාසෙමින් බස්නා ඒ දියදහර තලාතු මිනිරන් හා තිරිවාන ගල්වලින් ශොභමාන වූ ස්වාභාවික මාර්ගයක් විදහා පැවා ය.

සේරා සිය මායිම දෙසින් මෙහි ළං වූ විට මදක් පැකුළුණා ය. හියුගේ වත්තට ඉතාම ළං වූ මුල් ම අවස්ථාව මෙය යි. සශ්‍රීක ව වැඩෙන ඔහුගේ කෝපිවලින් එපිට උළු සෙවිලි කළ ගෙයක් ඇට පෙනුණේ ය.

ටික දවසකට පෙර නයා දෂ්ට කළාට පසු, ඩේවිඩ් ගේ සැප සනීප විචාරා ඇ ලියුමක් යැවූ නමුත් ඔහු ගැන කිසි ම ආරංචියක් ලැබී තිබුණේ නැත. අන්තිමේ දී හියු ගේ නිශ්ශබ්දතාව ඉවසිය නො හී ඕ මායිම කරා ගමන්කොට ඒ වත්ත දෙස අවිනිශ්චිත ව බලා ගත්වන ම සිටියාය.

කුරුල්ලෙක් අරලිය වත්ත දෙසට පියාඹා ගියේ ය. සේරා හදිසියේ ම වාගේ ගල් හරහා අනික් මායිමට පැන ගත්තා ය.

ගෙය දෙසට වැටුණු වක් වූ මග ඔස්සේ ඕ හති දමමින් ගමන් ගත්තා ය. හියු ඇ කෙසේ පිළිගනිද්ද යි නො දත් නමුත් ඩේවිඩ් ගේ තොරතුරු දැන ගැනීමට පැවැති නො ඉවසිල්ල නිසා ඒ ගැන ඇ සැලකුවේ නැත.

කන්ද පසෙක පිහිටි මේ ගෙය වත්තෙන් කපාගත් ගලින් තැනූ සතරැස් එකකි. කුළුණු ඉස්සූ බරාඳයක් විය. වහළෙන් උඩට තැනූ දුම් නළයකි. ඇ අවිනිශ්චිත ව පියගැට පෙළ නගින විට, බරාඳයේ කිසිවෙක් නො සිටියේ ය. එහි වසා තුබූ කවුළු කීපයෙන් එකකට ඕ තට්ටු කළා ය.

විටින් විට ඇ මෙසේ තට්ටු කළ නමුත් පිළිතුරක් නො ලැබුණි. ගෙයි පිටිපස කාගේ දෝ පොළු පහරක් ලත් බල්ලකු බුරනු ඇට ඇසුණි. ඒ සමග ම ''කවුද බල්ලාට ගැහැව්වේ?'' යි අසමින් දෙමළෙන් පරුෂ වචන කියා බණින හියු ගේ කට හඬ සේරාට ඇසුණේ ය. විනාඩි කීපයකින් සේරා දෙසට එන ඔහුගේ නො ඉවසිලි අඩි ශබ්දය ද ඇසුණි.

''සේරා! ඔබ. . . . .!''

ඔහුගේ ඇස් බැම්වල රැඳුණු රැවුම ඕ නො සැලකුවා ය.

''සුභ උදෑසනක්, හියු,'' යි ඕ නො ඉවසිලිවත් ව කීවා ය. ''මම ආවේ ඩේවිඩ් ගැන අහන්නයි.''

''ආ එක හොඳයි. නුමුත් ඒක යුතු නෑ,'' විස්මයානුකූල භාවය වෙනුවට දුන් ඔහුගේ මුහුණේ පැවතුණේ නො සැලකිලි සහිත වූ ද උපහාසාත්මක වූ ද මඳ හසෙකි.

''කරුණාකර. . . .මට ඔහු බලන්ට පුළුවන් ද?''

''මෙතරම් දුර සිට ඔබ ඔහු බලන්ට ආ කොට මම බැහැයි කියන්නේ කොහොම ද?''

''ඩේවිඩ්'' යි හියු කෑ ගසා අඩ ගැසී ය. දෙවෙනි වර ද මෙසේ අඩ ගැසූ නමුත් ඩේවිඩ්ගෙන් පිළිතුරක් නො ලත් හියු සේරා දෙස පසුතැවිල්ලෙන් බලා ''මම ඒ තරම් සාර්ථක පියකු සේ පෙනෙන්නේ නැති හැඩයි; මම ඔහු එක්ක එන්නම්.''

අනික් හැම දේ ගැන ම දැඩි ආත්ම විශ්වාසයක් ඇති මොහු සිය පුතා ගැන මෙබඳු හැඟීම් ඇතුව සිටීම ගැන සේරා කනගාටු වූවා ය. ඔහු යන්ට හැරුණු විගස ම ඩේවිඩ් නො කැමැත්තෙන් වාගේ එන පියවර හඬ ඇසී ඔහු වඩා ගැනීමට දිව්වා ය.

හියු මේ සියල්ල අන්දුන් කුන්දුන් ව බලා සිටියේ ය. ළමයා ගේ ක්‍රීඩා කාමරයට සේරා ඇදගෙන යනු දුටු හියු බරාඳයේ මුදුන් පියගැටය කරා ළඟා වූයේ අඩක් රවමින් ය. ලන්තානාවේ සිට දරුවා වඩාගෙන ආ ඒ

දවසේ මෙන් තම පුතාට ළං වූ එක දිනයක් වත් නො වී ය. ඔහුගේ පපුව මත දරුවා හෙලූ හුස්ම ද, ඔහුගේ කුඩා සිරුර ද, වඩාගෙන ඒමෙදී ලත් ආස්වාදය ද ඔහුට දැනුදු සිහි විය.

ඔහු එහි සිටගෙන සිටින අතර සේරා ගේ සිහින් පියවර හඬ ඇසුණි. අතකින් ළමයා වැළඳගෙන සේරා පසෙක සිටියා ය.

''මා කොහේ ද කියලා ටොම් පුදුම වෙලා ඇති. මම ගෙදර යන්ට ඕනෑ,'' යි ඕ කීවා ය.

''ඔබ ආ බව ඔහු දන්නේ නැද්ද?''

සේරා හිස සැලුවා ය. හියු හදිසියේ ම බැරෑරුම් බවක් දැක්වී ය.

''ඔබ තනියම ඒම ගැන ඔහු කැමති වෙන්නේ නෑ, සේරා.''

සේරා ඔහු දෙස රවා බැලුවා ය.

''ටොම් බොහොම සිරිත් විරිත් ගරුකරන මිනිහෙක්. ඒ බව ඔබ තාම දන්නේ නැද්ද?''

ඇ තැති ගැස්සුණා ය. ඩේවිඩ් ගැන ම කල්පනාවෙන් සිටි ඇට ඇගේ ගමනේ ඒ පැත්ත ගැන සිත යොමුවුණේ නැත. ඇ ඉක්මණින් යන්ට හැරුණු නමුත් හියු එය වැළැක් විය. ''මොහොතක් ඉන්න, සේරා. ඔබ මෙහි ඉන්න අවස්ථාවේ දී යමක් පෙන්නන්ට මං කැමතියි. කරුණාකර ඉන්න.''

ඔහුගේ ප්‍රකාශය අනුව ඕ ඔහු විශ්වාස කළා ය. පුදුමයට පත් ව, සේරා ඔහු සමග කෑම කන කාමරයටත් ඉන් බැහැර තවත් කාමරයකටත් ගියා ය. එහි බඩු සී සී කඩ තිබුණි. මෙය ඔහුගේ කාමරය යි. දුම්කොළ සුවඳ එහි විහිදුණේ ය. ඇ බැලූ කෙණෙහි ම එහි දුටුවේ ඔහුගේ වටිනා තුවක්කු හා මසුන් අල්ලන උපකරණ දමා තුබූ කැබිනට් අල්මාරි දෙකකි. අසුපිට යන විට අවශ්‍ය, රිදී බැඳි උපකරණ මේසයක් මත නො සැලකිල්ලේ දමා තුබුණි. ඇත් දළ ද, පුරවා සෑදූ ඇත් හිස් ද එහි විය. එහෙත් මේසයක් මත තුබුණු ප්‍රතිරූපය නිසා ඕ ඉදිරියට ඇදී ගියා ය.

''ඩේවිඩ් ගේ අම්මා?''

මෙය අනවශ්‍ය ප්‍රශ්නයක් විය. ඩේවිඩ් ගේ මනා සේ පළල් වූ නළල ද, ප්‍රාණවත් දෙතොල ද තියුණු නෙත් යුවළ ද ඕ එකවර ම හඳුනා ගත්තාය. මේ සියල්ලට ම වඩා ඇගේ ඇස් දෙක ඉතා සෞම්‍ය මුහුණකැයි සිතූ සේරා ගේ සිත් තුළ විශාල කරුණාවක් ඇති විය.

හියු පසෙකින් නිහඬ ව සිටියේ ය.

''ඇ දැනහැඳින ගන්ට ලැබුණා නම් කෙතරම් අගේ ද? ඔබ ඇට අතිශයින් ම ප්‍රේම කරන්ට ඇති.''

''ඇ මට කිව්වේ මම කවදාවත් කසාද නො බැඳිය යුතු මිනිසුන්ගෙන් කෙනකු බවයි,'' හේ සෙමින් කී ය. සේරාට හෙමිහිට කාමරයෙන් පිට වීමට ඉඩ දී හේ පසෙකට හැරුණේ ය.

කාණ්ඩය 5

1

"ඔබෙ බලාපොරොත්තු තහවුරු කිරීමට හැකි වීම ගැන මම බොහොම සතුටුයි, නෙවිල් නෝනා.''

උදර ලීලාවක් හා ස්ථුල දේහයක් ඇති මේජර් ඩන්කන් දිග හැරුණේ ය. ''නත්තල් කාලයේ දි පමණ, කියා මට කියත හැකි. හැම දෙයක් ම සාමාන්‍ය යෙන් සුදුසු පරිදි තිබෙනවා.''

''ලන්තානාවේ දී ම බබා හම්බ වුණාට කමක් නෑ නේ ද?'' යි සේරා ඕනෑකමින් ඇසුවා ය.

මේ මහනුවර දෙස්තර මහතා ඔහු ඉදිරියේ සිටිනා තරුණිය ගේ දිලෙන නෙත් දෙස බලා තමාගේ මේසය මත වූ කඩදාසි එහා මෙහා පෙරළන්ට විය. ''හා, ඒක මම හොඳයි කියන්නේ නෑ. ඒ කියන්නේ අනතුරු සහිත නිසා නො වෙයි. ඒක නුවණට හුරු නැති විය හැකි නිසා. දෙසැම්බර් මුල හරියේ දි තරම නුවරට ආවොත්, ඒ කියන්නේ. . .''

සේරා ඔහු දෙස පියකරු මදහසක් හෙළුවා ය. අන්තිම මොහොත වනතුරු මහනුවරට යෑමට ඇගේ කිසි ම අදහසක් නො තිබුණේ ය. ඒ අතර මේ ආරංචිය ඇට ලැබුණු කෙණෙහි ම නො ඉවසිලිමත් වූ ඕ හිස් වැස්මේ පටිවත් නිසි පරිදි ගැට ගසන්නේ නැතිව රෝගීන් පරීක්ෂා කරන කාමරයේ සිට කෙලින් ම ටොම් වෙත දුව ගියා ය.

''නත්තල් තෑග්ගක් අපට ලැබෙන්ට යනවා,'' යි ඕ ප්‍රමුදිත මුහුණකින් යුතු ව පැවසුවා ය.

පෙරළා යන ගමනට නුවර සිට රථයක් කුලියට ගැනීම අවශ්‍ය ම යයි කී ටොම් සේරා ගේ ආරක්ෂාව ගැන බොහෝ සැලකිලිමත් විය. ''ටොම්, මට කිසි අමාරුවක් නැහැ. ඇත්තෙන් ම මා මීට වඩා හොඳ සනීපෙන් කවදාවත් හිටියේ නෑ,'' යි කියමින් ඕ ඊට හරස් කැපුවා ය.

මැක්ලොයිඩ්ලා ගේ ගෙදරට නො ගොස් පසුකර ඒම නො කළ හැකි විය. සේරා රහසින් කී ආරංචිය ලැබූ මැක්ලොයිඩ් නෝනා සේරා තරම ම මහත් සතුටට පත්වූවා ය. සේරා බැහැර සිටිය දී ටොම් සමග ඇ වහා ම සාකච්ඡා

කොට, සේරා කැමති වූවත් නො වූවත්; මහනුවරට එතරම් ඈත නොවූ හෙයින්, මැක්ලොයිඩ්ලා ගේ ඩන්ඩී වත්තට නොවැම්බර් අවසානයේ දී ඈ කැඳවාගෙන ආ යුතු බව තිරණය කරන ලදි.

‘‘එමෙන් ම ඈ කැමැති නම් ඊට කලින් ඕනෑ ම වේලාවක,’’ යි මැක්ලොයිඩ් නෝනා සතුටින් කීවා ය.

සේරා ගැබිණි ව සිටි කාලයේ පැවැති දුෂ්කරතා සියල්ල මැඩගත හැකි වූයේ ඇට ලැබෙන්ට ඇති දරු සම්පත ගැන කල්පනා කිරීමෙනි. දවසින් දවස සුදුමැලි වන ඈ දුටු ටොම්, මැක්ලොයිඩ්ලා ගේ ආරාධනය පිළිගැනිමට ඇවිටිලි කෙළේ ය. එහෙත්, කොතරම් හොඳ අදහස් ඇති වුවත් පළපුරුද්දක් නැති බණ්ඩා ගේ සැලකිල්ලට ඔහු පවරා යන්ට නො කැමැති වූ සේරා ඒ අදහස එක එල්ලේ ම පිළිකෙව් කළා ය.

‘‘ටොම් මම මෙහි ඉන්නේ ප්‍රීතියෙන්. වත්තේ වෙන දේවල් හැම වේලේ ම බලා ඉන්ට මට ආසයි. මට කරදර හිටින්නේ ඔබගෙන් ඇත් වූවොත් පමණයි,’’ ඕ ඔහුට නිතර නිතර කියන්ට වන. ඇගේ දිලිසෙන සිනාරැල්ල ඔහුගේ බිය තුනී කළේ ය.

ඔවුන් ලන්තානාවේ ගත කළ ඒ මාස කීපය තුළ දියුණුවේ පෙර නිමිති දක්නට ලැබිණි. හොඳින් කප්පාදු ර්කොට තුබූ කෝපි පැළ, පරණ ගස් වසමින් වැඩුණේ ය. එද සඳ එළිය පැවැති රෑ මෙහි දක්නට ලැබුණු ලී කොටං අව්වට වියලී, කාලගුණයෙන් තව තවත් දිරා පත් ව වැඩිකල් යන්නට මත්තෙන් වෙයන් කා විනාශ වනු නියත ය. වැඩීගෙන එන පැළ සිටුවීමට අලුත් බිම් කැබලි සූදනම් කරමින් තිබුණි. මුළු වත්ත පුරා ම, කඳු මිටියාවත් ඔස්සේ, වක් වූ අඩි පාරවල් වැටී තිබුණි.

සේරා ගේ ඇඟ පත තද අමාරු මග හැරුණු විට, මේ අඩිපාරවල් ආදිය බැලීමට ඇට මහත් නො ඉවසිල්ලක් ඇති විය. සෑම උදයක ම, ටොම් ගිය පසු, මේ අඩිපාරක් ඔස්සේ ගමන් කරමින් වත්තේ වැඩිදියුණුව බලා සතුටු වෙමින් හවස ටොම් ගේ සිත ඇදවීමට වහල්වන යමක් ඇද්දැයි ඕනෑකමින් සොයා බැලුවා ය. පතනේ සිටින ගෝනකු, හාවකුට වඩා ලොකු නො වූ මී මින්නකු හෝ තුරු වදුලේ සැඟවෙන උරුලෑවකු දැකීම ඇට මහත් ප්‍රීතියක් විය. දවසක් කෝපි ගස් වැවුණු කැලෑ බද පාරක ඈ යන විට තද ගඳක් ඇට දැනුණි. කෝපි පඳුරු අතර එහාමෙහා යන බවක් ද දැනුණි. හදිසියේ ම, දුඹුරු පැහැති සිරුරෙහි පුල්ලි වැටුණු සතෙක් කැලේට පැන්නේ ය.

ටොම්ට මේ කොටියා ගැන කිසිවක් නො කියන ලදී. ඔහුට තුබුණු වෙන බැරෑරුම් වැඩපළ අතර මේ කොටියා ගැන මතක නැති වී තිබුණි. කුසයම් හෙයකින් ඌ දුටු බව ඈ කිව්වොත් ඌට වෙඩි තබනු නියත ය.

හොත් දරුවා ගේ දැගලිල්ලෙන් නිති උදම් වූ ඕ වත්තේ සිටින නායකු විනා අන්කිසි පණ ඇති සතකු මරනු තබා, මැරීමේ අදහස පවා අප්‍රිය කළා ය.

සමහර විට අරලිය හා ලන්තානා වතු දෙක අතර මායිමේ සිටින ඇට තමන්ගේ ගස්වලට වඩා ඉතා සශ්‍රීක ව වැඩෙන හියුගේ කෝපි ගස් පෙනේ. ලන්තානාවට හියුගේ පැමිණීම කලාතුරකින් සිදුවීමටත් ටොම්ට හා ඇට මෙතෙක් එහි එන්ට ආරාධනා නො කිරීමටත් හේතුව ඇට අවබෝධ විය.

2

එක් උදෑසනක ඕ වත්තේ නුපුරුදු දෙමංකඩකට පැමිණියා ය. එයින් එක පාරක් යොමු වූයේ ඇ කවදවත් නො ගිය පැත්තකට ය.

කඳු දෙසින් හමන මදනල පහස ද ගිම්හානයේ උෂ්ණත්වයෙන් යුත් හිරු රැස් ද විඳිමින් ඕ හෙමිහිට ගමන් කළා ය. පුරුදු වූ විට මේ රට කොතරම් අලංකාරදැයි ඕ කල්පනා කළා ය. ඒ අලංකාරය සිය සිරුරට පවා කා වැදුණාක් මෙන් ඇට දැනුණි.

ඇත කථා බස්හි යෙදෙන දෙමළ කම්කරුවන් ගේ කට හඬත් ඊටත් වඩා හයියෙන් ශබ්ද නගන කන්කානින් ගේ හඬත් ඇට ඇසුණේ ය. අතක් ගොටු ගසා ඇස්වලට තබා බැලූ ඇට දක්නට ලැබුණේ ගොන්සාලේස් හා ටොම් අව්වට ලන කිසි හැඩයක් නැති හිස් වැසුම් ය. එයින් කට කොණකින් සිනහ පහළ වුණි. ප්‍රිය ටොම්! ඔහු දැන් කොතරම් උද්‍යොගවත් වැවිලිකාරයෙක් ද! එහෙත් ඇ ගැන සැමවිට ම කොතරම් සැලකිලි සහිත ද?

සේරා කඳු පාමුලට ලහි ලහියේ ගමන් කරමින් කම්කරුවන් ගේ පොදු බරාදයක් සහිත ලයින් පේළියට පැමිණියා ය. නාසිකාභරණ වලින් සැරසී සිටි රුප සම්පන්න කාන්තාවෝ දෙදෙනෙක් සේරා දැක හුනස්නෙන් නැගිට දැත් ඇඳිලි බැඳ සිනහ මුහුණින් ''සලාම්'' කියා ආචාර කළහ.

මේ ස්ත්‍රීන්ගේ ආචාර සම්පන්න ලීලාව ගැන සිතමින් සේරා ද ''සලාම්'' යි කියා සිනහ වූවා ය. මේ මිනිසුන් ගේ චාම් ගතිගුණ ඕ ප්‍රිය කරන්ට වූවා ය. ඔවුන්ගේ හැම ලෙඩක් ම පාහේ නෙවිල්ලා දුන් එඩරු තෙල් ටිකෙන් සුව වූ බැවින් ඇ හා ටොම් ගැන ඔවුන් තුළ පැවැත්තේ තදබල විශ්වාසයකි. මේ යුවළට විසඳන්ට බැරි ප්‍රශ්නයක් ලෝකයේ නැතැයි ඔව්හු සිතූහ.

ඕ බර කල්පනාවකින් ගමන් කළා ය. 'ලෙඩ සුව කිරීමෙන් ලබන බොරු කීර්තියට වඩා වැඩි යමක් ඇගෙන් බලාපොරොත්තු වූ බව පෙනුණි. ඔවුන් හා සමග කථාබස් කිරීමට දෙමළ භාෂාව ඉගෙන ගත යුතු විය. ඔවුන්ගේ

දුෂ්කරතා ගැන සොයා බලා, ටොම් පිරිමින්ට උදව් වූවාක් මෙන් ම තමා මේ ස්ත්‍රීන්ට ද උදව් විය යුතු බව ඇට පෙනුණේ ය. නිරායාසයෙන් ම සේරා සුසුමක් හෙළුවා ය. ඇගේ වගකීම් දවසින් දවස වැඩිවන බව දැනගත්තා ය. එහෙත් ස්වභාවයෙන් ම ඇ වගකීමෙන් තොර ව කටයුතු කළ බව ඇට ම දැනුණේ ය.

ඇ ගමන් ගත් අඩිපාර ඇළට වැටුණේ ය. දැන් කම්කරුවන් ගේ ලයින් පේළියෙන් ඉතා දුරය. ඇට පුරුදු කම්කරු කට හඬ ද දැන් නැසේ. මෙසේ හැතැප්ම දෙකක් හෝ තුනක් ඇවිදින්නට ඇති. දැන් ඇ සිටින්නේ වත්තේ මායිමේ කඳු ගොඩලි සහිත තණ පිට්ටනියක බව ඇට අවබොධ වූයේ ය.

හදිසියේ ම නැම්මක දී සේරා වන ලැහැබකට පැමිණියා ය. ඒ අසල හුදෙකලා ව පිහිටි ගෙයකි. ඒ තනි ගේ වටේ බැඳ තුබුණු වැට කොතරම් අලංකාර වී ද යත් ඕ මදක් නැවතී ඒ දෙස බැලුවා ය.

මිදුලේ මිරිස් පැල රත්පැහැ කරලින් බර විය. දෙහි ගස් කීපයක් ද, කොස් ගහක් හා අඹ ගහක් ද, හොඳින් සාත්තු කරනු ලැබූ බතල වැල් ද විය. අඹ ගස මුදුනේ මැස්සක පුල්ලි වැටුණු කිකිළියෝ ය. මල්වතු හිඟ මේ පළාතේ අලංකාර ''සීනියා'' හා ''මාරිගෝල්ඩ්'' පාත්තියක් තිබීම ලොකු පුදුමයක් විය.

කම්කරුවන් රැස්වන තැන සිට ඇ දුටු, මෙතෙක් ඇට ප්‍රහෙලිකාවක් වූ, ගෙය මෙය වෙන්ට ඇතැයි ඇට හැඟුණි. එහෙත් හොඳින් රැක බලන ලද කුඩා වත්තේ, මේ හුදෙකලා ස්ථානයේ, කවරෙක් වසයි ද? ඇ මෙසේ කල්පනා කරමින් ළඟවෙද්දී මහත ලක්ෂණ බලු පැටියෙක් සෙල්ලම් කරමින්, පනිමින් ඇ වෙතට දුව ආවේ ය.

ඒ බලු පැටවා හුරතල් කරන්ට ඇ නැමුණු විට දෙරකඩ අසල කළුවරෙහි යමක් සෙලවුණි. සේරා බැලුවා ය. නැවතත් ඒ සෙලවීම යළිත් දක්නා ලදී.

සේරා ළඟ වූවා ය. නො කැමැත්තෙන් ම වාගේ හෙමින් හෙමින් ඉදිරියට ගොස්, පහළට වැටෙන සේ පොල් අතු සෙවෙණි කළ පියස්ස යටින් හිස නමාගෙන ගෙට ඇතුළු වූවා ය.

මුල්ලේ ලිප මත තබා තුබූ හැළියකින් නැඟුණු සැර දුමින් සේරා වැසී ගියා ය. ඒ දුම එන්ට එන්ට නගිමින් ඇගේ ඇස් කන් නාසා පිරී, හුස්ම ගන්ට පවා අමාරු වී, සිහිසන් නැතුව බිම ඇද වැටුණා ය.

එහි සිටි කාර්යක්ෂම වූ තරුණ කාන්තාව සේරා ගේ හිරි වැටුණු වළළුකර පිරිමදිමින්, බැඳපු කුඩු නිවෙන්නට බිමට බැවා ය. එකවර බැලූ පමණින් ම සේරා ගේ තත්ත්වය ඕ මැන ගත්තා ය.

සේරා ගේ ඇස් පළලට ඇරුණි. කළුවර ගෙපැළ දුටු සැටියේ පහළ වූ බිය ඇ අසල නැමී සිටි කාන්තාව දුටු කෙණෙහි මග හැරුණේ ය. තද දුකක් හඟවන, දිලෙන ලොකු නෙත් යහළ කුළුණු බර විය. රන්වන් දුඹුරු මුහුණ මත දෙතොලින් ඇගේ බිය තුරන් කරවන මඳ සිනහවක් නැඟුණි. අඳුරට හැඩ ගැසුණු සේරා මේ ස්ත්‍රිය බෙල්ලට වැටෙන සේ කොණ්ඩයක් බැඳ, සුදු හැට්ටයකින් හා ඉහ ළඟින් නෙරිය වැටෙන සේ ඉතා පිරිසුදු සාරියකින් ද සැරසී සිටිනු දුටුවා ය.

ඇගේ දේහ විලාසයේ අභිමානවත් ගතියක් දක්නා ලදී. තව දුරටත් ළං ව බැලූ සේරාට මුදු සිනිඳු කොපුල් තලත්, සිහින් නාසයත්, විසිතුරු කැටයමින් නිම වූ කුණ්ඩලාභරණ පැලඳි කන් දෙකත් නිසා ඔප් නැඟුණු ඇගේ රූප ශොභාව දැනුණි.

තමාගේ මේ සා දීර්ඝ නිරීක්ෂණය ගැන සිතමින්, සේරා තරමක ලජ්ජා වෙන් සිනහ වූවා ය. සේරා පුදුමයට පත්කරවමින්, ඒ ස්ත්‍රිය සිහින් හඬින් ''ඔබට දැන් වැඩි සනීපයක් දැනෙනවානේ,'' යි ඉංග්‍රීසියෙන් කීවා ය.

''ඔබ ඉංග්‍රීසි කතා කරනවා ?''

''අපේ බොහොම දෙනා කතා කරනවා. ඒක පුදුමයක් නො වෙයි,'' ඕ ශාන්ත ව පැවසුවා ය.

සේරා ලජ්ජා හරිත වූවා ය. ඇ කළේ සමාව දිය නො හැකි වරදකි—පළමු ව කාගේදෝ පෞද්ගලික නිවාසයකට එබිකන් කර බැලීම, දැන් මේ අශොභන සිද්ධිය!

''මම. . . . .මම බොහොම කනගාටුයි. මම අවිනීත වෙන්ට අදහස් කළේ නැහැ. ම. . . . .ම බලූ පැටියා දැක්කා. . . . .''

ඒ කාන්තාව සිනාසුණා ය. ''මේ තරම හුදෙකලා ස්ථානයක ගෙයක් දැකීම ඔබට පුදුමයක්. ඒක ස්වාභාවික යි. මට තේරෙනවා.''

''නුමුත් මං කළා වගේ ඒකට ඇතුල් වෙන්ට හොඳ නැතෙ. ඒ මදිවාට''

''අනේ, ඒ ගැන කරදර වෙන්න එපා. ඔබට සිහි නැති වූයේ මන්දැයි මට තේරෙනවා. සිහි නැතුව ඉන්ද දී මම පොඩි බෙහෙතක් දුන්නා. ඒ ඔබ සුව කරාවි.''

තත්වාවබොධයෙන් සේරා ඇස් තදින් හැරගත් විට කිසි කනගාටුවක් නො දක්වා, ඕ මෙසේ කීවා ය. ''බයවෙන්ට ඕනෑ නෑ. ආයුර්වෙදය ගැන මට පොඩි දැනීමක් තියෙනවා. මගේ සීයා මහනුවර අන්තිම සිංහල රජ්ජුරුවන් ගේ රාජ වෛද්‍යවරයා. මගේ පියාත් වෛද්‍යවරයෙක්. ඔහු ලියූ කසාය සැදුවේත් මමයි.''

සේරා ඇගේ සැක යටපත් කරගත්තා ය. ඇත්තෙන් ම ඇගේ සිහිසන් නැතිවීමේ ලකුණු දැන් කොහෙත් ම නැත. ඕ බොහෝ දුරට සුවපත් වී සිටියා ය.

‘‘ඔබ බොහොම කරුණාවන්ත වූවා,’’ යි කියමින් සේරා නැගිට්ටා ය.

තරුණිය පැකුළුණා ය. ‘‘විපතට පත්වූවන්ට යමෙක් උදව් කරන්නේ නැද්ද?’’

‘‘කරුණාකර මට ඔබේ නම කියන්න’’ යි සේරා මහත් ඕනෑකමින් කීවා ය.

ඇගේ අලුත් යෙහෙළිය ළත වූවා ය. පසුව සුවිනීත මඳ සිනහවක් පහළ කළා ය. ‘‘ලීලා. කියා මට කතා කරන්න. අනික් නමෙන් කමක් නැහැ. මතක තබා ගැනීමට ඉවහල් වෙන කිසි කෙනෙක්වත් කිසි දෙයක්වත් නෑ.’’

‘‘මම ලන්තානාවේ සේරා නෙවිල්. මට කවදාහරි ඔබට යමක් කරන්ට පුළුවන් නම්. . . . .’’ යි පටන් ගත් නමුත් මේ පුදුම රූමත් කාන්තාවට නුසුදුසු යමක් නැවතත් කියවේදෝයි සැකයෙන් නිශ්ශබ්ද වූවා ය.

ලීලා මඳ සිනහ පා හිස සැළුවා ය. ‘‘මම ඔබට ස්තූති කරනවා නෙවිල් නෝනා. මට කළ හැකි උදව්වක් ඔබට තියෙනවා යයි මා හිතන්නේ නෑ. නුමුත් ඔබට නැවත අසනීපයක් දැනුණොත් සමහර විට මට උදව් කරන්ට පුළුවන් වේවි. දැන් පරිස්සමින් යන්න.’’

සේරා ලන්තානාව දෙසට පැකිලෙමින් ගමන් ගන්නා අතර මේ අබිරහසක් බඳු වූ ලීලා සමග යහළු වීමට කැමැත්තක් ඇති වූ නමුත් ඇගේ ගෙදරට අවසර නොමැති ව යෑම නුසුදුසු බව කල්පනා කළා ය.

3

කවදත් ප්‍රමාද වී ගන්නා උදේ ආහාරයට යන ටොම් හා ගොන්සාලේෂ් හමු වූ සේරා වහා ම ඔවුන්ට එක්වූවා ය.

‘‘ගොන්සාලේස්, අර වත්ත පල්ලෙහා තියෙන පුංචි ගෙදර ඉන්නේ කවුද?’’

ටොම් සිය බිරිඳ දෙස සැලකිලිමත් ව බැලීය. ‘‘සේරා ඔබ නැවතත් හිතු කැමැත්තේ හැටියට ඇවිදලා තියෙනවා. ඔබ ඉන්නා තත්ත්වයේ හැටියට ප්‍රෙමිය. . . . .’’

''ඇ කවුද ගොන්සාලේස්? ඇ එහි ඉන්නේ මොක ද?'' සේරා ගේ උද්‍යොගය කොතරම් අධික වී ද යත් ටොම් කතා කළ බවවත් ඇට නො දැනිණි.

''සේරා ඔබ කතා කරන්නේ කා ගැන ද?''

සේරා සිය සැමියා ගේ අත මිරිකා ඇල්ලුවා ය. ''පෙම්වත, මම ඔබට තව මොහොතකින් සියල්ල ම කියන්නම්. පළමුවෙන් මට දැනගන්ට ඕනෑ. . . . අපි කම්කරුවන් රැස්වන තැන සිටලා දැකපු අර පොඩි ගේ. ඒකයි.''

''මමත් මේ ගැන විස්තර දැනගන්ට කැමතියි,'' යනුවෙන් ටොම් සන්සුන්ව කී ය. කවුරුත් ගේත් ගෞරවයට භාජන වූ, කලාතුරකින් පහළවන අයෝමය බැල්ම ටොම්ගේ දෙනෙතෙහි පෙනුණි. කොන්දෙස්තර ඒ දෙස නො පැකිලී බැලී ය.

''ඔබට කියන්නයි මම හිතාගෙන හිටියේ, සර්. ඒ නෝනා මෙහි පදිංචි ව සිටි උඩරට රදළ පවුලක කෙනෙක්. මේ වත්ත වැවීම පළමුවෙන් ආරම්භ කළ කාලයේ ඇගේ පවුලට ඉඩම් නැතුව ගියා. ඔවුන්ගේ පරණ සේවක යෙක් පදිංචි ව සිටි මේ ගෙපැළ හැර ඔවුන්ට යන්ට වෙන තැනක් තිබුණේ නෑ. එහි ගිය ටික කලකින් ම මවුපිය දෙදෙනා ම මළා. කනගාටුවවලු මරණයට හේතුව, සර්. ඔවුන්ට කලින් තිබුණු දේපළවල හැටියට මෙහෙම ජීවත් වෙන්නේ කොහොම ද? ඔවුන්ගේ දියණිය—ලීලා—මෙහි ම හිටියා. ඇගේ ජීවිතයේ දුක්මුසු අවස්ථා බොහෝ තිබුණා.''

''මම ඕක හිතුවා,'' යි සේරා කොඳුළා ය.

ගොන්සාලේස් තම හිස් කබලේ ළඟ දී සුවවූ තුවාල අත ගෑවේ ය. ''මාව සනීප කළේ ඇයි. සර්, කථාන්තරේ ඒකයි. ඇ ඉතා ම හොඳයි. ගම් වැසියන්ට හරියට දෙව් දුවක් වගේ. ඒ වුවත් මෙහි අලුතෙන් පදිංචියට ආ අය, ඇ මෙරට බෙහෙත් හේත් ගැන හොඳට දන්නා නිසා, ඇ මායාකාරියක් කියා හිතනවා.''

සේරා ගේ නෙත් යුවළ ඈත පෙනෙන සුදෝ සුදු නිවසට යොමු විය. ''මට මේ තාක් හමු වූ කාන්තාවන් අතුරෙන් ඇ ඉතා ම සුවිනීත කාන්තාව යයි මට කල්පනා වුණා.''

4

සේරා ගේ ළමයා ලැබීමට කාලය ළංවෙත් ම, මහනුවර යුද්ධ හමුදාවේ දෙස්තර මේජර් ඩන්කන් පහසුවෙන් හමුවීමට හැකි සේ මැක්ලොයිඩ් නෝනලා ගේ නිවසට යන මෙන් ටොම් නොයෙක් විට ඇවිටිලි කෙළේ ය.

දෙස්තර හමුවීමට ගිය එක ම ගමනෙන්වත්, පසුව ඔහු සමග කළ කථාවෙනවත් ටොම් සෑහීමට පත් නො වී ය. යුධ භටයන් ගේ ලේ ගැලීම, බිබිලි නැගීම්, පාචන, අතීසාර, උණ ආදී රෝගවලට ප්‍රතිකාර කිරීමට මේජර් ඩන්කන් සමත් වූ නමුත්, ටොම් ඔහු කෙරෙහි එතරම් විශ්වාසයක් තුබුවේ නැත. සේරා ගේ තත්ත්වය ගැන ඔහු ඕනෑවට වඩා විශ්වාසය තබතැ යි හේ සිතී ය.

ටොම් ගේ භීතිය ගැන මේජර් ඩන්කන් අවඥා සහිත ව සිනාසුණි. ඈ ඉතා හොඳ සනීපෙන් සිටින බව හේ නිතර ම කී ය. ළමයා ලැබෙන්ට මාසයකට පෙර ඈ මැක්ලොයිඩ් නෝනලා ගේ ගෙදරට ගියොත් සෑහේ. ඒ ඒ අවස්ථා අනුව හොඳට පරිස්සම් වූ කල මෙය ඉතා සුළු දෙයකි. ''මෙහෙම අවස්ථාවල දී නෙවිල් මහත්තයා, නෝනාවරුන් ටිකක් සතුටු කර තැබීම හොඳ බව ඔබ දන්නවා නෙ. ඈ ඔබෙන් දීර්ඝ කාලයක් තිස්සේ වෙන්කර තැබුවොත් ඈගේ සිත කරදර වෙනවා මිස යහපතක් වෙන්නේ නෑ.''

මෙබඳු දෙයක් කල්පනා කිරීමට තරම් ඩන්කන් මහතාට අවබෝධයක් තිබීම සැක සහිත වූ බැවින් ඔහුට මේ අදහස දෙන්ට ඇත්තේ සේරා බව ටොම් හරි හැටියට ම සැලකුවේ ය.

නො කැමැත්තෙන් එකඟ වූ ටොම් නත්තල් සමයේ දරුවා බලාපොරොත්තු වුවත් සේරා නොවැම්බර් 20 වෙනිදට කලින් ඩන්ඩී වත්තට යා යුතු යැයි නියම කළේ ය.

දිනෙන් දින ම සේරා ගේ සුදුමැලි ගතිය වැඩිවෙනු දැක්ම ඔහුගේ බලවත් නො ඉවසිල්ලට හේතු විය. කම්මුල් තෙමාගෙන ඒ වසන් කිරීමට ඕ උත්සාහ කළා ය. ඉඳහිට ඇති වූ ක්ලාන්ත ගතියත් ඈ සැලකුවේ නැත. සිහි නැති වූ විට උරන්ට දෙන ලවණ ඖෂධයක් ඈගේ ලේන්සුවක සඟවා ගෙන තුබූ බව ටොම් හදිසියේ දුටුවේ ය.

5

ඔක්තෝබර් මාසය වන විට වත්තේ වැඩ ඉතා උනන්දුවෙන් කෙරිණි. සේරා ගේ ඉල්ලිම පරිදි වතුර වළ අසලින් වෙන් කළ අක්කර විස්සක් විශාල වූ වනාරොද හැර අනිත් හැම තැන ම කෝපි වැවිල්ල සඳහා එළි කළ යුතු විය. දවස මුළුල්ලේ කන්ද පාමුල සිට ගස්මුල් කපමින් මිනිස්සු කඳු මුදුනට පැමිණියහ. උඩ තිබෙන විශාල ගස් සම්පූර්ණයෙන් කපා බිම හෙළන විට ඒ සමග මුලින් ඉදිරි ඇද වැටෙන, වැල් එතුණු ගස්වල හඬින් මුළු වන පෙදෙස දෙවනත් විය.

අතුපතර කැපීමෙන් පසු මේ සියල්ල වියලීමට හරින ලදී. මිනිස්සු වෙනත් හදිසි වැඩවල නිරත වූහ.

අල්පෙනෙත්ති හිස් තරම් කුඩා වූ කොළ පැහැති කෝපි ඇට පැහෙමින් කහ හා රතු පැහැ ගැහෙන සැටි නෙවිල්ලා ලන්තානාවේ ගත කළ අටමස තුළ දී දුටුවාහ. අස්වැන්න නෙලා ගැනිමට සුදුසු කාලය පැමිණියෙන් අලුයම සිට ඇදිරිය තෙක් ටොම් ඉතා වෙහෙසී වැඩ කෙළේ ය.

අලුත් අස්වැන්න ගබඩා කරතැබීමට, ගබඩා කාමරයවත් කෝපි ඇට ශුද්ධ කරන තැනවත් තව ම සිංහල කොන්ත්‍රාත්කරුවන් සාද නිමකර තිබුණේ නැත. මේ හැර, රාමසාමි හා ඔහුගේ පිරිස පොරොන්දු වූ පරිදි ලන්තානාවට නො පැමිණියෙන්, අතිරේක කුලීකරුවන් සෙවීමට ද ටොම්ට සිදු විය.

වතුකාරයන් කම්කරුවන් සොයා යන කාලය මෙය යි. ඔවුන්ට යම්කිසි භාග්‍යයක් වුණි නම්, ළහ දී ඉන්දියාවෙන් පැමිණ රක්ෂාවල් සොයන කම්කරු පිරිසක් ඔවුන්ට අතර මග දී හමුවනු ඇත. සමහර විට මෙසේ හමුවන පිරිස, වෙන කිසියම් වත්තක් සොයා යන අය වෙන්ට ද පුළුවන. ඔවුන් සමග වැඩි කතාබස් කිරීම නිෂ්ඵල ය. එසේ වූ කල්හි මුළු හැතැප්ම විසි දෙකක ම මහ ගෙවා ගම්පොළට හෝ තවත් දුරින් පිහිටි මහනුවරට පැමිණිය යුතු වේ. මෙසේ ගිය විට බොහෝ විට ඉන්දියාවේ සිට අවුත්, මහ මහ අසල විඩා හරිමින්, ගිනි ගොඩවල් ගසාගෙන සිටින පිරිසක් දක්නට ලැබේ. ටොම් හා ගොන්සාලේස් ඉතා වෙහෙසීගෙන කම්කරුවන් සෙවූ නමුත් මෙතෙක් ඔවුන්ගේ උත්සාහය ව්‍යර්ථ විය.

ඔක්තෝබර් මාසය අවසානයේ දී ඊසාන දිග මෝසම් කාලය පැමිණියේ ය. උෂ්ණය තියුණු ලෙස පහළ බැස්සේය. ලන්තානාවේ බංගලාව පිටිපස දෙසින් පිහිටි කඳු වැටියෙන් මීදුම පැතිරෙන්නට වන.

කෝපි ඇට ශුද්ධ කරන කාමරයේ අලුත් වැඩියා කිරීම නිතර පරික්ෂණයට භාජන වීම නිසා, එහි වැඩ බොහෝ දුර නිම වී තුබුණෙන් දවසක් උදැසන ගොන්සාලේස් මෙසේ කී ය. ''ඉදුණු කෝපි හුඟක් තියනවා, සර්. අපි දැන් වැඩ පටන්ගන්න ඕනෑ. එක් කෙනකුට බුසල් දෙක බැගින් කඩන්ට පුළුවන් බැවින් තවත් කම්කරුවන් එනතුරු බලන්ට ඕනෑ නැත.''

''අත්හදා බලන්ට ඇත්තෙන් ම අද හොඳ නෑ,'' යි ටොම් කීවේ ඉඩමට වැහිපොද අතරින් පතර වැටෙන්ට වූ බව දැක ය.

ගොන්සාලේස් හිස සැලී ය. ''නෑ, සර්. අපි පටන්ගැම්මක් කරන්ට එපායැ,'' යි හේ නැවතත් කී ය.

කම්කරුවන් ගේ නම් අඩ ගසා ඔවුන්ගේ හිස් හා උරහිස් රැකගැනීමට ලොකු ගෝනි ද, කෝපි ඇට දැමීමට කුඩා කුට්ටි සාක්කු ද දෙන ලදී. වැඩට සිටි හැම දෙන ම කෝපි නෙලීමට යොදනු ලැබූහ.

''දවල් 11 ට බුසලකුත්, සවස 4 ට තවත් බුසලකුත් නුඹලා නො වරදවා ගේන්ට ඕනෑ. නැත්නම් වැඩට නො පැමිණි හැටියට ලකුණු කරනවා,'' යි ගොන්සාලේස් නියෝග කෙළේ ය.

ඔහු ටොම් දෙසට හැරී කරුණු පැහැදිලි කළේ ය. ''වැඩේ කරගන්ට පුළුවන් හොඳ ම පිළිවෙළ එහෙමයි, සර්. නැත්නම් ඒ අය කෝපි පඳුරු යට වාඩි වී ගස්වල කෝපි ඇට කුණු වී වැටෙනතුරු ඕපාදූප කතාකරමින් කල් ගෙවනවා.''

තනි තනි ව හෝ දෙන්නා තුන් දෙනා බැගින් හෝ විසිරී ගිය කම්කරුවෝ හැම දෙසට ම දුව ගියහ. විනාඩි ස්වල්පයකින් එක්කෙනකුදු දක්නට ලැබුණේ නැත.

ඔවුන් පසු පස්සේ ගිය ටොම් ඔවුන් වැඩ කරන ලීලාව කල්පනා සහිත ව බැලී ය. ගොන්සාලේස් හොඳ මිනිසෙකි. දක්ෂයෙකි. එහෙත් ඔහුගේ අදහස් දැඩි ය. මෙසේ වෙහෙසෙමින් අවිශෙෂයෙන් කෝපි නෙලීමේ අවාසියක් තිබෙන බව ටොම්ට වැටහුණි. ක්‍රමානුකූල නො වී ආවට ගියාට නෙලීමෙන් කෝපි ඇට ලොකු තොගයක් අපතේ යයි. අමු ඇට බිම විසිරී තුබුණු සැටි හේ දැක්කේ ය. තමාගේ ඇට කොටස වහ වහා කඩා විවේක ගැනීමට කල්පනා කරන සමහර මිනිස්සු ගහේ අත්ත පිටින් කඩාගෙන පැහිච්ච ඇට නෙලා ඉතුරු අමු ඇටත් සමග අත්ත පසෙක වීසි කරති. ඊළඟට මොවුන් යන්නේ ඒ ළඟ ම තිබෙන පඳුරට නො ව පඳුරු කීපයක් නමුත් පහු කොට වඩා ම පලදාව ඇති පඳුර කරා ය. මෙසේ බලයෙන් වැඩ කරවා ගැනීමේ ක්‍රමය නිසා කෝපි සාදන කාමරයට ගෙනෙන හැම පැහිච්ච ඇට බුසලකට ම තවත් බුසලක හෝ ඊට වැඩි ගණනක අමු ඇට බිම විසිරෙන බවත් පඳුරු මගහැරී යන බවත් ටොම්ට දැනුණේ ය.

එහෙයින් පේළි සෑදී ඇට නෙලීමේ වැඩ කල් නො යවා ඇරඹීමට ටොම් ඉටා ගති. ඒ ක්‍රමය වඩා වියදම් යන සුළු ප්‍රමාද සහිත එකකැ යි ගොන්සාලේස් කී නමුත් වඩා හොඳ ක්‍රමය එය බැව් මොහුට පැහැදිලි විය.

වඩුරාළ අලුත් වැඩියා කරමින් සිටි කෝපි සාදන කාමරයේ අන්තිම ඇණය සවිකරනවාත් සමග කෝපි ඇට අතුරන මැස්සට ඒ ඇට ගෙනෙන ලදී. මෙය මධ්‍යාහ්නයේ පමණ විය. ඇට තළන උපකරණය සම්පූර්ණයෙන් අලුත් වැඩියා කරන ලද්දේ ය. ළඟ දී මහනුවර සිට ගෙන්වනු ලැබූ අඩියක් විෂ්කම්භය ඇති සිලින්ඩරයේ දැති සාදික්කා පෙරන්ගාන උපකරණයකට සමාන විය. දිලිසෙන, අලුත් තඹ ආවරණයකින් යුතු එය ක්‍රියාත්මක වීමට දැන් සූදානම් ව පැවැත්තේ ය.

''දැන් වතුර එවනු'' යි ටොම් අණ කළේ ය.

ඇට තළන උපකරණයේ ජලය ගඩ ගඩ ගා ගලායන්ට විය. සිලින්ඩරය කැරකුණි. කෝපි ඇටවල ලොඳ හා පොතු නිසි පරිදි තැළී ගැලවී ලෙල්ල වෙන ම ජලතටාකයකට බේරුණේ ය.

සිලින්ඩරයේ අගට සවිකළ ලී රෝදයත් මීහරක් හමින් පෙනෝර ආදිය සවි කළ සිලින්ඩරයකට ඇදා තිබුණු මේ කෝපි ඇට තළන යන්ත්‍රයත් පරණ එකක් වූ නමුදු ඔහුගේ මුල් කෝපි තොගය වියළා සකස් කරන අන්දම දැකීම ඔහුගේ නිම්හිම් නැති ප්‍රීතියට කාරණයක් විය. ඉතා ම හොඳ යන්ත්‍ර සූත්‍ර සහිත කෝපි සාදන ගෙයක් දවසක තමා සකස් කරගන්නා බව හේ සිතා ගති. දේව පිහිටෙන්, ලන්තානාවේ කෝපි, වෙළඳ පොළේ අන් කිසි ම කෝපි වර්ගයකට දෙවෙනි නො වන කාලයක් ලැබෙනවා ඇත.

කෝපි ඇට තළා ඒවා පැසවීම පිණිසත් ශර්කරා ඉවත් කිරීම පිණිසත් ලී ටැන්කිවල දමනු ලබන්නේ වියළීම පහසු කිරීමට ය. පැය දෙළහේ සිට දහ අට දක්වා කාලයක් කෝපි ඇට ලී ටැන්කිවල තබනු ලැබේ. මීට පසු ගලා එන ජලයෙන් ඒවා සෝද මැස්සක් මත හෝ වියළන බිමක දමා සති තුනක් පමණ වියළනු ලැබේ. ඉර පායන දවසක මැස්ස මත ඇති ඇටවල පොත්තේ රිදීවන් සුදු පැහැය ඇස් කණ කරන තරම් තදින් දිලිසේ.

මේ කාලයේ දී ටොම්ට මොහොතක් වත් නිවාඩු ලැබුණේ නැත. එක ම වේලාවේ ඔහු හත් අට පොළක ම සිටිය යුතු විය. සෑහෙන පමණ කම්කරුවන් නැතිකම ද මහත් බාධාවක් විය. ගොන්සාලේස්ට හා ඔහුට තවමත් සෑහෙන පමණ කම්කරුවන් සොයා ගත නො හැකි විය. මේ අතර හොඳට ඉදුණු ඇට කොළ අතුරින් දීප්තිමත් ව බබළමින් බොහොමයක් වියළෙන්ට ද පටන් ගති.

6

1861 අවුරුද්දේ අග දෙමාසය තුළ බලාපොරොත්තු නුවූ තරම් තදින් පැවැති වැස්ස, සාමාන්‍යයෙන් වැස්සට ප්‍රිය කළ සේරාට මහත් හිරිහැරයක් විය. එක් උදෑසනක ටොම් උදය තේ පානයට පැමිණි වෙලේ ඈ නිදන කාමරයේ බිම සිහිසන් නැතිව වැතිර සිටියා ය.

විගස සුවපත් වූ ඕ ඔහුගේ භීතිය අස්ථාන යැයි කියමින් සිනාපෑව ද හේ එයින් සෑහීමකට පත් නො වී ය. ඇගේ තෙත් පොකුටු හිසකෙස් පිස දමමින්, නුපුරුදු තද ගතියකින් මෙසේ කී ය, ''සේරා, ඔබේ බඩුබාහිර අසුරා සූදනම් කර ගන්න. හෙට උදේ අපි මැක්ලොයිඩ්ලා ගේ ගෙදර යනවා. ඔබට මෙහි දී හදිසියක් වීමට ඉඩ හරින්න මට බෑ.''

සේරා එකඟ වූවා ය. හේ තවදුරටත් කථාකරමින් ''අවාසනාවකට මෙන් මට පැය කීපයක් වත්තෙන් පිට වී සිටින්ට වෙලා තියෙනවා. කම්කරු පිරිසක් කොත්මලේ පාරේ කැරකෙන බව ආරංචි යි. අපේ හාල් කරත්ත හොයන්ට ගොන්සාලේස් ගියා. සමහර විට, වැස්ස නිසා කරත්ත අතර මග හිර වී ඇති. මම දැන් ගොන්සාලේස් හොයා, කරත්ත පසෙක ද කම්කරුවන් හොයන්ට අරින්ට ඕනෑ. ඒ හැර ඉදිරි දවස් කීපය තුළ කළ යුතු වැඩ නියම කරන්නටත්, ඔබ ඩන්ඩී වත්තට ගෙනයන බව ඔහුට කියන්ටත් ඕනෑ.''

සේරාට තමාගේ වැඩ පිළිවෙළ විස්තර කරන අතර ශරීරයේ විඩාවත් ඈ ගැන ඇති නො ඉවසිල්ලත් නිසා ටොම් ගේ මුහුණ සුදුමැලි වී තිබුණි. ''වැඩිම වුණොත් මම හතරවෙන කොට එනවා. ඒ වුණත්, සුන්දරිය එක පැයකට පවා ඔබ ද යන්ට මා වාවන්නේ නැහැ.''

දයාවෙන් ඈ සිප සනහා හේ පිටවී ගියේ ය.

හෙම්හිට කාමරයට ගොස් මෙතෙක් කල් මහමින් හෝ ගොතමින් සිටි, දරුවා ගේ ඇඳුම් තොගයත් ඇට ඕනෑ කෙරෙන අන් සියලු දේත් ඕ අසුරා සකස් කර ගත්තා ය. ගෙදර පුදුම එළවන නිසල බවක් පැතිරිණ. ටොම්ගෙන් වෙන්වන මේ පළමුවෙනි වතාව සිහිවෙත් ම ඇගේ සිත සොවින් පිරුණි. තමාගේ බඩු අසුරා පසු ව කාමරය ශුද්ධ කර ටොම් ගේ බඩු සුපරීක්ෂාකාරී ව සකස් කොට, නිසි දේ නිසි තැන තැබුවා ය. බණ්ඩා කැඳවා ඈ නැති අතරතුර කළ යුතු දේ ගැන මනා උපදෙස් ද දුන්නා ය. වත්තේ සිට ඩහදිය පෙරාගෙන සැමියා පැමිණි විට උණුසුම් ඇඳුම් සපයා උණු තේ හෝ කෝපි කෝප්පයක් දෙන ලෙස ද, ඇඟ සෝදගැනීමට උණු වතුර සපයන ලෙස ද ඕ නියම කළා ය.

ඕ දැන් අතිශයින් ම වෙහෙසට පත් වී සිටියා ය. නැවතත් තනි වූ ඕ තමාගේ කොන්දේ වේදනාව ඉවසිය නො හැකි වූවා, බිම හිඳ ගත්තා ය.

අහසින් හෙණ හඬක් නික්මිණි. කාමරය හදිසියේ ම කළුවර විය. ඉර බැස ගිය බව ද ඕ දුටුවා ය. ඈ බලා සිටියදී ම ඒ මේ අත පාවෙන වලාකුළු එකිනෙක ගැටෙමින් එකතු විය. අඳුර එන්ට එන්ට ම වැඩි වී හිරු ද වැසී ගියේ ය. අවට ලා කහ පැහැ ගැන්විණි. යළිත් හෙණ හඬක් ළඟ ළඟ ම ඇසුණි. මීදුම් පටලයකින් කඳු පෙළ වැසී ගියේ ය. ගෙයත් මුළු මිටියාවතත් මී දුමින් වට විය.

සුදු තිරයකින් වැසුණාක් මෙන් දැන් මුළු වත්ත ම අඳුරේ ගිලුණි. කවුළුවල හැපෙන අතු රිකිල්ලක් හැර ඈට දක්නට අන් කිසිත් නැත. ඈත මහ මඟ එන වෝම් ගැන මතක් වී ඕ කනස්සලු වූවා ය. දැන් එන මහ කුණාටුවට ඔහු අසුවෙනු නො අනුමාන ය.

‘‘බණ්ඩා!’’ යි ඕ අඬගැවා ය. ‘‘මහත්තයාට නාන්න පුළුවන් තරම් උණු වතුර ලැස්ති කරන්න.’’

බණ්ඩා දෙර ළඟට අවුත් ඈ අසුරා තිබෙන පෙට්ටි දෙස බැලී ය. ‘‘නෝනා, යන්නේ කවද ද?’’ යි හේ බයාදු කමින් විචාළේ ය.

‘‘හෙට උදේ,’’ යි ඕ කනගාටුවෙන් පැවසුවා ය.

පළමුව අහස දෙස ද නැවත ඈ දෙස ද බලා, ‘‘ලොකු වැස්සක් එනවා,’’යි හේ කිවේ ය.

‘‘මොනවා කරන්ට ද, බණ්ඩා?’’ දැන් මැක්ලොයිඩ් නෝනලා ගේ ගෙදර සිටීම වඩා මැනවැයි ඈට ම වැටහුණි.

දැන් වේලාව කීය ද? තව ම සවස තුනයි නේද? හැබැටම දැන් ඊට වඩා පමා වෙලා නේ ද?

සැණෙකින් කෙටුණු විදුලියෙන් විහිදුණු එළියෙන් අහස බෙදුණි.

‘‘බණ්ඩා’’ යි නිරායාසයෙන් ම ඈට කෑ ගැසුණි. දුව ආ ඔහුට එළිපත මත වැටී, හතිලමින් ඈ සිටිනු දුටු කල්හි ඔහුගේ ඇස් බියෙන් පළල් වී ඇරුණි.

ඈ යන්තමින් සිනහ පෑවා ය. ‘‘වතුර වීදුරුවක්.’’

බණ්ඩා අතුරු දහන් විය.

කුණාටුව එන්ට එන්ට ම තද විය. හදිසියේ හැමූ සුළඟකින්, ඇගේ කුඩා වන ලැහැබේ ගස්වැල් ඉදිරී වැටුණි. කම්කරු ගෙවළ වහළ ඉගුළුණි. ඉදිරියෙහි සියල්ල ම බිම හෙළමින් සුළඟ හැමී ය. හෙණ හඬ පුපුරමින් මහ වැහි බිඳු වැටෙමින් තිබියදී ඇගේ වේලාව ද ළඟා වූ බව ඕ දැනගත්තාය.

ඊ ළඟට ආ විළි රුදව සංසිඳෙතැ යි බලාපොරොත්තු ව ඕ ශාන්ත ලෙස ඇඳ කෙළවරේ හිඳ ගත්තා ය. දැන් වේලාව කීය ද? හතර පසු වී විනාඩි දහයක් පමණ ය. සවස් වරුව ගෙවී ගිය හැටි! ටොම් මෙහි හිටියා නම්! මැක්ලොයිඩ්ලා ගේ ගෙදරට යෑමේ ප්‍රශ්නයක් දැන් නැත.

තව වරක් රුදවක් ඇතිවී, ඈ දැතින් ම ඇඳේ වත අල්ලා ගත්තා ය.

නැවතත් එය සංසිඳුණි. ඇගේ ඇස් බැම්වලට වැටී තුබුණු ඩාදියෙන් තෙත් වූ හිසකෙස් පසෙකට ලා ප්‍රසූතිය ගැන ඈ අසා තුබූ නොයෙක් දේ ඕ සිහිපත් කරන්ට වූවා ය.

විළි රුදව නො නැවතී ම හටගති. ඇට වේදනාව නිසා කෑ නො ගසා සිටිනු නො හැකි විය. අනේ දෙවියනේ, ඈ කුමක් කරන්ට ද? ''බණ්ඩා!''

මේ වර බණ්ඩාගෙන් පිළිතුරක් නැත. මුළු ශක්තිය යොදා පිටිපස බරාඳය වෙත ගොස් ඕ යළිත් අඬ ගැසුවා ය. නුමුත් හිස පටන් දෙපතුල දක්වා ඈ වැස්සෙන් තෙමුණා පමණකි. ''ඔහු පැනලා යන්ට ඇති,'' ඕ සිතුවා ය. ''පැනලා යන්නට ම ඇති.''

මෙයින් පසු වෙලාව ගත වූ සැටි ඈ නො දත්තා ය. ඇතැම් විටෙක, ඇගේ කාමරය කෙටෙන විදුලියෙන් ආලොකවත් විය. අනික් විටෙක ඇගේ සිරුර පවා ගිල්වන ගනඳුරෙන් අඳුරු විය.

ඉක්බිති, හදිසියේ සීතල අතක් ඇගේ නළල මත ඇට දැනුණි. සිනිඳු කුලුණු හඬක් ''බණ්ඩා මා ඔබ ළඟට ගෙනාව. මේක හොඳවෙයි, නෙවිල් නෝනා. බයවෙන්න එපා. . මම ඔබට උදව් කරනවා.''

දෙනෙත් විදහා බැලූ ඕ, පතනේ ගෙදර තරුණ ලීලා දුටුවා ය.

7

මෙයින් පැය තුනකට පසු, වැස්ස නැවතී, කඳු මුදුනින් සඳ පායා නැග එන වෙලාවේ, සේරාගේ දියණියෝ උපන්නාහ.

ගරා වැටුණු කඳු හා ගංවතුර පසු කරමින් ටොම් පෙරළා ගෙදර පැමිණියේ මැදියම් රෑ ය. තොලේ ඇඟිල්ල තබා ගත් උදර සිංහල යුවතියක් ගෙයි දොර ළඟ ඔහුට මුණ ගැසුණා ය.

''නෙවිල් මහත්තයා, ඔබෙ භාර්යාවට මේ දැන් දුවක් ලැබුණා. ඈ බොහොම පුංචි යි. නුමුත් හොඳින් ආරක්ෂා කළ විට හරියාවි.''

''ඔබ. . . . . .ඔබ ද ඇට උදව් වුණේ?''

''මට පුළුවන් දේ මම කළා.''

කළ ගුණ සලකමින්, ඇගේ උරහිස මත තැබූ ටොම් ගේ වැඩුණු අත, වෙව්ළී ය. හේ නො පමාව ගේ තුළට ගියේ ය.

සේරා ශාන්ත ලෙස නිද සිටියා ය. ඇගේ සැමියා ඇතුළු වන විට ම ඈ ඇස් ඇර බලා, ගිලන් පරිද්දෙන් සිනහ පෑවා ය. ''හා, මගේ පණ, ඔබ සුරැකි ව සිටීම මට සැනසීමක්. අපට දැන් දුවෙක් ඉන්නවා, ටොම්.''

ළදරුවා ගේ ඉතා කුඩා හිස මෑණියන් ගේ අත් ගොවුවෙහි සුරක්ෂිත ව පවත්නා අයුරු පහන් එළියෙන් හේ දුටුවේ ය. මුදු සිනිඳු කම්මුල අත ගා, ප්‍රේමයෙන් උමතු වී, හදිසියේ ම කවුළුව දෙසට හැරුණි.

කඳු අතර බැසයමින්, නිදන්නට සැරසෙන ළපටි සඳ දැක සේරා වෙත නැමුණු ටොම්, චන්ද්‍රයා යන අර්ථය ඇති ''ඩයනා'' යන නම මතක් වී ''මා සුරතල් පෙම්වතිය, අපි මෑට 'ඩයනා' යි නම් කරමු,'' යි කී ය.

කාණ්ඩය E

1

ඩයනා ඉපදී දවස් දහයකින් ලීලා හෙමිහිට පිටවී ගියා ය. කොහේ දැයි කවුරුවත් නො දන්හ. මේ දස දින තුළ දී පවා පළමුව හමු වූ අවස්ථාවේ දී ඇ ගැන දත් තොරතුරුවලට වඩා යමක් නෙවිල්ලාට දැන ගත නො හැකිවිය. ඇගේ නිශ්ශබ්දතාව කවරකුටවත් බාධා කළ හැකි දෙයක් නො වී. කිසි දිනක ගෙවා නිම කළ නො හැකි සේ කළ ගුණ සැලකීමට දැන් ඔවුහු බැඳී සිටියහ. හැමදා ම අලුයම පැමිණ කළ යුතු වැඩ සියල්ල කර දී ඕ නික්ම ගියා ය. නව වෙනි දවසේ දී ඕ පෙරළා නො එන බව සේරාට කීවා ය.

"දැන් මට යන්ට කාලය ඇවිත් තියෙනවා. කිසි ම දේකට බය වෙන්න එපා. ළමයි හදා වඩා හොඳ පළ පුරුද්දක් ඇති ගැණියක් මම එවන්නම්," යි ඕ පැවසුවා ය.

"නුමුත් ඇත්තට ම අප නිතර හමුවීමට ඔබ එනවා නේ," යි කියමින් සේරා කඳුළු සැලුවා ය.

ලීලා හිස වනා, "බොහොම ස්තුතියි. නුමුත් ඒක කරන්ට පුළුවන් වෙන්නේ නෑ. මා යන්නේ තවත් දිස්ත්‍රික්කයකට යි. ආපසු එන්ට වේදැයි දන්නේ නෑ."

ආචාර ලීලාවෙන් මේ සිංහල තරුණියට සිය අත දිගු කළ සේරාට මහත් කනගාටුවක් දැනුණි. මේ දෙදෙනා අතර වැඩි කතා බහක් නො තිබුණත් අසීමිත කරුණා ගුණයෙන් යුත් කුලීන, බුද්ධි සම්පන්න මිතුරියක නැති වී යන බව ඇට දැනුණි. ලීලා වෙනුවට වැඩට ආ ශාන්ත ගති ඇති, මධ්‍යම වයසේ සිටි සෝමා, ඩයනාට ඉතා ආදරේ වුවත්, සම්පූර්ණයෙන් ම විශ්වාසදායක හා කාර්‍ය්‍යක්ෂම වුවත්, ලීලා නැති පාඩුව සේරාට දවස් ගණනක් ම දැනුණි.

දෙසැම්බර් මාසයේ පැමිණීමත් සමග ම සේරා නත්තල් උත්සවය පැවැත් වීමේ වැඩ කටයුතුවල නිමග්න වූවා ය.

එක් සැන්දෑවක, ටොම් හා සේරා අතිනත ගෙන ඔවුන්ගේ ඉඩමේ ඇවිදින අතර ''හියුටත් ඩේවිඩ්ටත් නත්තලට අපි ආරාධනා කරන එක හොඳය,'' යි ටොම් කී ය.

සේරා ප්‍රීතියෙන් උදම් වූවා ය. හියු කල් තබා කීවාක් මෙන් ඇ අරලිය වත්තට ගිය ගමන ගැන ටොම් ඒ තරම් පැහැදුණේ නැත. ලන්තානාවේ මැදිහත් වීමක් නැතුවාට හියුට තමාගේ ජීවිතය ගෙන යන්ට පුළුවන් බව ඔහු හොඳට ම පැහැදිලි කර තිබුණි. ඇරත් ඈ මඳක් චාරිත්‍ර ගරුක නුවූවා සේ ය. ''කම්කරුවන් ඕපාදූප කියනවා—ඔබ දන්නවානෙ. . . .''

''නුමුත් ඩේවිඩ් ගැන අසා යැවූ ලියුමට හියු මට උත්තර එව්වේ නෑ. ඒ නිසා මම බොහොම දුක් වුණා—''

''මම දන්නවා පෙම්වතිය, ඔබ ගැන කිසි දෙයක් කල්පනා නො කොට ඔබ මෙසේ යාම ඔබේ ගතිවල හැටියට නම් හරි. නුමුත් සේරා මම ඔබ නම්, ආයිත් ඔහොම යන්නේ නෑ.''

හියු නෙවිල් හා තව දුරටත් සම්බන්ධයක් නැතිව මාස කීපයක් ගත විය. බොහෝ විට ඩේවිඩ් දැක ගැනීමට ඇගේ තදබල ආශාවක් ඇති වූ නමුත් ටොම් ගේ අදහස් අනුව පැවතීමට ඕ තදින් ම ඉටා ගත්තා ය.

නත්තල් සම්බන්ධයෙන් ඔහු කළ යෝජනාවට දූන් ඈ බලවත් උනන්දුවක් දැක්වූවා ය. ''හා, ටොම්, ඔබ එය යෝජනා කරතැ යි මම බලාපොරොත්තු වුණා. මේ නත්තල ඩේවිඩ්ට ඉතා ප්‍රීතිමත් කාලයක් කිරීමට මම බොහොම කැමතියි. අපට ආරාධනා කරන්ට, අඳුනන කියන තව ළමයින් හිටියා නම්.''

මෙසේ ටොම් හා සේරා වැඩ පිළිවෙළ සංවිධානය කළහ. ඔවුන්ගේ කෝපි ගබඩාවේ නත්තල් දේව මෙහෙයක් පැවැත්වීමට ඔව්හු පාදිලි තුමා සමඟ කටයුතු පිළියෙළ කළහ. මීට අවිවාහක වතුකාරයන් දෙළොස් දෙනකුට පමණ ආරාධනා කරන ලදී. මෙයින් බොහෝ දෙනා කලින් පැමිණියාහු වෙති. ඔවුනතර උද්භිද උද්‍යානයේ ක්රෝලි මහතා ද, ලන්තානාවේ අනිත් පැත්තේ විසූ තඹ කෙස් ඇති, තරබාරු මයික් ඕ'පැරල් නම් අයිරිෂ් ජාතික මහතා ද වූහ. හියු, ඩේවිඩ් නෙවිල් හා මැක්ලොයිඩ්ලාත් එක් වූ විට මුළු ගණන සොළොසකි. එදු ම සවස පෙරළා යන්ට බැරි, දුර බැහැර සිට පැමිණියවුන්ට, කෝපි ගබඩාව නිදන කාමරයක් වෙනු ඇත.

නත්තල් ළඟා වෙත් ම කම්කරු ස්ත්‍රීන් පේළි සැදී කෝපි ගෙන එද්දී කෝපි මැෂින් ක්‍රියා කරන ශබ්දය දවස මුළුල්ලේ ම ඇසුණි. හැම තැන ම සිටිය යුතු වූ ටොම්, කම්කරුවන් පරිපාලනය කරමින් ද, මැෂින් නිසි ලෙස

යෙදවීමෙන් ද, නෙලන අයට ඕපාදූප කථා කරන්ට හෝ බුලත් හපමින් කාලය අපතේ යවන්ට ඉඩ නො දෙමින්ද වත්තේ වක් වූ කුඩා අඩි පාරවල් දිගේ නිති එහා මෙහා ගියේ ය.

සේරා ඉතා සැහැල්ලු සිතකින් කුඩා බංගලාවේ සිය කටයුතුවල නිරත වූවා ය. වත්තේ ගත කළ දස මාසය ඉතා ඉක්මණින් ගෙවිණි. ඒ කාලය ගතවුණා නොව ඉගිලී ගියාක් මෙන් විය. වත්තේ වැඩවල නිරතවීම මිස මේ දීර්ඝ කාලය මුළුල්ලේ ම ටොම්ටත් තමාටත් කිසි විවේකයක් නො ලැබුණු බව ඇට දැන් වැටහුණි.

හැම කෙනකුට ම සුළු සුළු තෑගි දිය යුතු ව තිබුණි. ටොම්ට මේස් කුට්ටම් තුනකුත්, ඩේවිඩ්ට පාට ලේන්සුවකුත් කලකට පෙර ම ගොතා තිබුණි. මේ හැර නොයෙක් නොයෙක් කෑම සෑදීමත් නිමිහිම් නැති දේ සූදනම් කිරීමත් කළ යුතු විය. නත්තලට සතියකට කලින් ටොම් මහනුවර යද්දී ගෙනගිය බඩු ලැයිස්තුව දිග එකක් විය. වයින් වර්ග, හැම්, කේජු, වියළි පලතුරු හා ලුණු දැමූ බටර්—ලන්තානාවට ආ දා සිට මෙතෙක් රස නො විඳූ සුඛොපභොගී ද්‍රව්‍ය—මේ ලැයිස්තුවට අයත් වූයේ මෙද නත්තල ඩයනා ගේ නම් තැබීමත් සමග උත්සව දෙකක් වූ හෙයිනි. මේ ලැයිස්තුවට ම ඩේවිඩ්ට පොත් හා අලුත් දුන්නක් හා ඊතලයක් ද අයත් විය.

දුනු ඊතල ලිය වූයේ බණ්ඩා ය. කැලේ සිට මංමුළා වී ආ වැද්දකුගෙන් දුනු විදීම ඔහු ඉගෙන ගෙන තිබුණේ ය. එක් උදෑසනක දුන්නක හා ඊතලයක කදිම ආකෘතියක් ගෙනැවිත් මෙවැන්නක් ඩේවිඩ් පුංචි මහත්තමයාට දෙමු යි කීය. නත්තල් දිනට පෙරදා මැක්පාලේන් පාදිලි තුමා ත් මැක්ලොයිඩ් නෝනා මහත්මයාත් පැමිණියහ. උදර ලීලාවෙන් නැගී සිටගත් දර්ශනීය කඳු පෙළ අවට, වලා පෙළින් තොර නිල්වන් අහසෙහි හිරු බබළමින් නත්තල් දිනය උදා විය.

ටොම් සේරාට දුන් නත්තල් තෑග්ග ඔහු හදිසියේ මහනුවර දී ලබාගත් හාමෝනියම් නම් කුඩා සංගීත භාණ්ඩයකි. ඈ ප්‍රිය කළ තූර්යවාදනයට මෙතෙක් ඇට ඉඩ නො ලැබුණු හෙයින් මේ ත්‍යාගය පරයන අනෙකක් නො වී ය. දේව මෙහෙය පැවැත් වූ කෝපි කාමරයේ, ඇගේ තූර්යවාදය සමග පිරිමි සියල්ලන් ම උච්ච ස්වරයෙන් නත්තල් ගී ගයද්දී, මේ නත්තල අමතක කළ නො හැකි එකක් සේ ඇට දැනුණි. ගායනය කෙළවර වීමත් සමග ම සේරා තම සැමියා දෙස බලා, ඔහුගේ පළල් උරහිස් මත සියලු බර ගෙනයාමට සමත් බැව් සිහි වී, ඔහු කෙරේ ස්තුති පූර්වක ව දෙවාශීර්වාදය පැතුවා ය.

දේව මෙහෙය ද කෙළවර විය. හියු නෙවිල්, සේරා ගේ ආරාධනය පිළිගෙන තිබූ නමුත් ඔහුවත් ඩේවිඩ්වත් දේව මෙහෙයට නො පැමිණියහ. කදිමට ඇඳ පැළඳ සිටි ඇලිසන් නෝනා මෙසේ කීවා ය:

''නෙවිල් නෝනා, ආරාධනාවක් නොමැතිව අපේ පැමිණීම ගැන ඔබ කුමක් සිතාවි ද යි මා දන්නේ නෑ. සාමාන්‍යයෙන් අවුරුද්දේ මේ කාලයේ දී හියු බලා කියා ගන්නා, එඩ්වින් ගේ වත්තට අපි එනවා. අපට මෙහි එන්ට ඇවිටිලි කළේ හියු යි.''

ඔවුන්ගේ පැමිණීම ගැන කිසිදු නො කැමැත්තක් නැති බව සේරා නත්තලට ම කැපෙන උණුසුම හදවතින් දන්වූවා ය. පළමු ව එඩ්වින්ට ද, ඉන්පසු හියුට ද කතාකොට, ඔවුන් මැක්ලොයිඩ නෝනා මහත්මයාට හඳුන්වා දුන්නා ය.

ඇට වඩා උසින් වැඩි හියු, ළඟින් සිටගෙන, දෙනෙත් විදහමින් සේරාට අත දී, ''මගේ නැනාණ්ඩි සේරා, මවු තනතුර ඔබට ගැළපෙන කදිම! ඩයනාට, ටිකක් ලොකු වුණා ම පාවිච්චි කරන්න තෑග්ගක්.''

සේරා ළමයා ආයාට දී පාර්සලය ලිහන්ට වූවා ය. කුඩා පෙට්ටියක පියන හළ වහා ම ඇගේ මුවින් නිරායාසයෙන් ම නිකුත් වූයේ ''ඕ! හියු, ඔබ මේ තරම්. . . . !''

එහි විල්ලුද රෙද්ද මත,.අගනා මුතු පටක් විය.

හියු උරහිස් සෙලවී. ''ජේන තරම් ඕක වටින්නේ නෑ. පසුගිය ද බටහිර වෙරළේ අරිප්පු මුතු පරයේ දී මට ඕවා ලැබුණා. දූ කෙළීමට කැමැත්තක් තිබේ නම් මුතු බෙල්ලන් ගොඩක් අරගෙන කපන්ට ඕනෑ. මට ටිකක් වාසනාව තිබුණා. මෙයින් හොඳ ම මුතු ලැබුණේ එතැන දී ය. අනික්වා මම කොළඹින් ගත්තා.''

ඇලිසන් පසෙකට වී මේ දෙස බලා සිටියා ය. ඇගේ ඊර්ෂ්‍යා සහගත බැල්මෙන් සේරා මවිත වූවා ය. පෙට්ටිය හදිසියේ ම වසමින් ''ඇ මා සමග අමනාප වාගේ,'' යි ඕ සිතුවා ය.

මේ දවසේ ඉතුරු කාලය ඇලිසන් ගේ මෙන් විය. පිරිමි ඇ වටකර ගත්හ. ඉඳහිට සිනහව තදින් වැඩිවන විට ඇගේ ඊර්ෂ්‍යා සහගත බැල්ම වරක් සේරා දෙසට ද වරක් හියු දෙසට ද යොමු විය. වරක් මේ බැලුම් එකිනෙකට ගැටුණි.

දවසේ විනෝද සිරියට කුමක් වී ද? අලුත් වෙනසක් ඇතුල් වී තිබුණි. ඒ කුමක් දෝ හෝ යි සේරා නො දත්තා ය. එය හිරිහැරදායී බව පමණක්, ඇට දැනුණි.

පිරිමි වැඩි. වැඩියෙන් සුරාපානය කළෝ ය. විකට රසයෙන් අනූන වූ සතුටු සාමීචි දළ රළු බස්වලට පෙරළුණේ ය. හොඳ සභා සිරිත් නැතිව ගියේ ය. ඇ ප්‍රිය කළ මේ කරුණාවත් චතුකාරයෝ හදිසියේ ම අසභ්‍ය සේ ඇට පෙනුණි. ටොම් පවා, වෙනදට වඩා බොන්ට වී, අමුතු ගතියක් දැක්වී ය.

සවස් කාලය පැමිණියෙන් ඇලිසන් නෝනා සේරාට ළංවී, ''අපි නටන්ට කැමතියි. අප වෙනුවෙන් වාදනය කරන්නැ,'' යි කිවා ය.

ඕ නිශ්ශබ්ද ව හාමෝනියම ළහට ගියා ය. කාමරය අස් කරන ලදී. සේරා සංගීත වාදනය කළ අතර, ඇලිසන් හා ටොම් ඔවුනොවුන් දෙස ප්‍රිය බැලුම් හෙළමින් නටන්ට පටන් ගත්හ. අනිත් පිරිමි ද සහකාරියන් සමහ ආලිංගන නැටුමේ යෙදුණෝ ය.

හදිසියේ ම හියු ඇ ළහට අවුත් එක අතක් හාමෝනියමේ තබා ගෙන මෙසේ කී ය:

''එන්න සේරා, මාත් එක්ක නටන්න.''

''එතකොට කවුද වාදනය කරන්නේ?'' යි ඕ පිළිවදන් දුන්නා ය.

''තරබාරු අයිරිෂ් මයික් ඉන්නෙ. එන්න සේරා, අද ඔබේ යුතුකම් ඕනෑවටත් වඩා ඉෂ්ට කළා.''

ඇ හිස වැනුවා ය. ''මම ඊට වඩා වාදනයට කැමතියි.'' ඔබ අනිත් අය ආකර්ෂණය කළාක් මෙන් මා ආකර්ෂණය කරන්නේ නැතැ යි ඕ සිතුවා ය.

හියු ගේ කපටි බැල්ම අභියෝගයකින් මෙන් ඇ කෙරෙහි යොමු විය. ඊ ළහට තරබාරු මයික් රූරා එන විට හියු ඔහුගේ උරහිසින් අල්ලා, ''මයික්, අප වෙනුවෙන් වාදනය කරන්න. නෙවිල් නෝනාටත් නටන්න ඉඩක් ලබා දෙන්න.''

ඇගේ විරුද්ධත්වය නො තකා හියු ඇගේ දැතින් ම අල්ලා නටන්ට සූදනම් විය. දූන් ඕ ද මඳ සිනහ පාමින්, අන් සියල්ලම නො තකා නැටුමෙහි යෙදුණා ය.

''සේරා, ඔබ කොච්චර ලස්සණ ද? ටොම් කවදවත් එහෙම කියනව ද?''

ඊට කෙසේ පිළිවදන් දිය යුතු දූයි සේරා කල්පනා කරන්ටත් පෙර, පිටි පසින් සිටි ඇලිසන් ගේ කටහඬ ඇසුණි. ඇට මේ වචන ඇසුණු බව සේරා දූන ගත්තා ය.

''අද රෑ ඔබ සමග මා නටන්නේ නැද්ද, හියු?'' යි ඇලිසන් ඇසුවා ය.

හියු හිස නමා ආචාර කොට අත දී වැළඳගෙන නටන්ට පටන් ගති. මේ දෙදෙන යස රහට ගැළපුණි.

මීදුම් පටලයකින් වැසුණාක් මෙන් මොවුන් කැරකී යනු සේරා දුටුවා ය. ඇලිසන් ගේ උරහිස්වලට උඩින් හියු ගේ ඇස් තවමත් යොමු වුණේ ඇ දෙසට ය. ඇහක බලා ගත්තා ය. එඩවින් පැරඩෙ තනිවම ඉඳගෙන සිහිසන් නැතිවන තෙක් බොමින් සිටියේ ය.

2

ජනවාරිය ගෙවී තද උෂ්ණයෙන් හා වියළි සුළඟින් යුත් පෙබරවාරිය ළඟා විය. තුන් මසක් මුළුල්ලේ පැවැති අස්වැනි කාලය කෙළවර වීමට දැන් ආසන්නව තුබුණි. දවසේ නියමිත අස්වැන්න ගෙන ඒමට පඳුරුවල අතු පිසිලි කඩන කම්කරුවන් ගැන පරීක්ෂාකාරී වීමත්, යන්ත්‍ර සූත්‍ර අබලන් වී තිබීමත්, තලන ලද හා වියළන ලද හොඳ කෝපි පටවා හැරීමේ දුෂ්කරතාදි යන් නිසා අධික ලෙස වෙහෙසී සිටි ටොම් ඉක්මනින් කිපෙන සුලු විය.

කරත්ත එවා සති ගණනක් ගත වී යයි කොළඹ ඒජන්තවරුන් ඔහුට දැන්වූ නමුත් තව ම ඒවා ළඟා වී නැත. ඒ අතර කෝපි නරක් වෙමින් තිබිණි. ඊට යෙදිය හැකි පිළියමක් ද නො වී ය.

අන්තිමේ දී, කරත්ත ආ බව ආරංචි විණි. කෝපි ගෝනි කර තබාගත් කම්කරුවෝ කඩිමුඩියේ වත්තේ පටු අඩිපාරවලින් ගමන් කොට, මහපාරට අවුත් ඒවා කරත්තවල පැටවූහ. වෙහෙස නො බලා තව තවත් ගෙන ගොස් පැටවීමට ඔව්හු ආහ.

එක් සවසක ටොම් ඊට ටික වේලාවකට පෙර තැපැල්කරු ගෙනා ලියුමක් දෙස රවා බලමින් සිටියේ ය. ''ලබන අවුරුද්දේ සහනයක් ලබා ගැනීමට මේ අස්වැන්න ආධාර වේ යයි මා විශ්වාස කළා,''යි හේ ගොන්සාලේස්ට කී ය. ''නමුත් මේ ලියුමේ කියා තිබෙන්නේ අපේ හොඳ කෝපිවලින් වැඩි හරියක් පාවිච්චියට නුසුදුසුය කියායි. මේ වැඩේ ගෙන යන්ට නම් කොහොම හරි අපි ලබන අවුරුද්දේ මීට වඩා හොඳින් කරන්ට ඕනෑ.''

මංමාවත් පමණක්වත් හොඳින් තිබුණා නම්! අභිනවයෙන් පත් වූ මැකාර්ති ආණ්ඩුකාර තුමා මංමාවත් දියුණු කිරීමට හැකි තරම් උත්සාහ ගන්නා නමුත් කොත්මලේ හා දෙළොස්බාගේ දිස්ත්‍රික්කවල තත්ත්වය දියුණුවීමට තව බොහෝ කල් ගතවන බව පෙනේ. රථවාහන ගමනට නුසුදුසු, වළ ගොඩලි සහිත පාරවල් දිගේ ගෙනගිය කෝපි කොළඹ ඒජන්තවරුන්ට ලැබුණේ පමා වී පමණක් නො ව තෙත් කා පුස් බැඳී ය. එහි වටිනාකම ද ඔහුගේ තක්සේරුවෙන් තුනෙන් පංගුවකටත් අඩු විය..

මේ හැර වියදම් පක්ෂය ද අධික වූයේ ය. ගබඩාවේ හා කෝපි ඇට සාදන කාමරයේ අඩුපාඩු පිරිමැසීමට ද, ගිනිගත් ආයුධ සැපයීමට ද, අලුත් ලයින් පේළි සෑදීමට ද, කැලෑ කපා වල් නෙලීමට ද ටොම් ගේ මූල ධනයෙන් වැඩි කොටසක් වියදම් විය. තවත් කළ යුතු ව තිබුණු වැඩ රාශියෙන් ටොම් බෙහෙවින් කම්පා විය.

ඉතා වෙහෙසී වැඩ කළ දවසක, සවස් කාලයේ සේරා සමග බරාඳයේ වාඩිගත් මොහු, ''අපි හැකිතරම් දුරට වියදම් අඩු කරන්ට ඕනෑ,'' යි කීය.

''අඩු කරන්ට දෙයක් තවත් තිබේ ද?'' යි සේරා හැඬුවා ය. ''උදේ කෑමට කැවුම් කා කෝපි බොනවා. දවාලටත් රෑටත් බත් කන්නේ එක ම ව්‍යඤ්ජනයක් එක්ක. ගමෙන් බඩු ගෙන එන්ට මම මස් පෙට්ටියවත් යවන්නේ නෑ. මීටත් වඩා මම මොනවා කරන්න ද?''

''මා කල්පනා කළේ ගෙදර වියදම් ගැන නො වෙයි. ඔබේ කුකුළනුත් එළවළු කොටුව ආදියත් එක්ක ඔබ කොතරම් හොඳට බලා කියා ගත්තා ද? ඔබ නො සිටියානම් මා කුමක් කරාවි දැයි දන්නේ නෑ. මොනවා වුණත් නත්තල් කෑමට අපි වියදම් කළා වැඩියි. බලන්න මේ ඔක්කොම බිල්!''

දෙස් දෑක්වීම මොහුගේ ගතියක් නො වේ. එහෙත් මෙය මොහුගේ සිත් වේදනාවේ ලකුණක් බව දත් සේරා, තමාගේ සිත පෑරුණු බව නො හැඟවීමට උත්සාහ දැරුවා ය. එහෙත් ඔහුගේ කථාව පීඩා ජනක විය. මෙය ඩයනා බවුතිස්ම කළ දිනය යි. උත්සවය ඇගේ අදහස අනුව ම නො ව ඔහුගේ ද ඕනෑකම උඩ කෙරිණි.

සිත් වේදනාවෙන් තැවුණු ටොම්, තව තවත් නිහඬ විය. ඔහුගේ කරදර අනේ මටත් කිවොත් යි සේරා සිතුවා ය. ඔහුගේ හිතේ පැවැති බර ටිකක් වත් අඩු කිරීමට ඇට යමක් කළ හැකි වුවොත්! ඔහුගේ හිරිහැර කුමක් දැයි දැන ගැනීමට ඈ දැරූ ප්‍රයත්නය නිෂ්ඵල විය. ඈ ඉතා ප්‍රියකළ ඔහුගේ ශාන්ත විකට රසය ද දැන් නැත්තේ ය. ඉඳහිටලා අසල්වැසි වතුකාරයන් පැමිණි විට පමණක් ඒ දක්නට ලැබිණි.

වතුකාරයන් වැඩි දෙනා හැතැප්ම බොහෝ ගණනකින් ඔවුනොවුන් ගෙන් ඈත් ව ජීවත් වූ බැවින් මේ හමුවීම් වූයේ කලාතුරකිනි. උදේ සිට සවස් වනතුරු ටොම් වත්තේ වැඩවල යෙදීමෙන්, වැක්රෝල් පරීක්ෂා කිරීමෙන්, වියවුල් සහිත කම්කරු ප්‍රශ්න විසඳමින් හිරිහැරදයක ගනුදෙනු සොයා බැලීමෙන් නිරත වූ බැවින් සේරාට ඇගේ පාඩුවේ වැඩ කරගන්ට සිදු විය. ඇගේ කාලයෙන් වැඩි හරියක් ගෙවුණේ ඩයනා හුරතල් කිරීමෙන් වුවත් ඉඳහිටලා සවස් කාලයක වත්තේ සීමාවෙන් හා එහි බැරෑරුම් ප්‍රශ්න වලින් ද ඈත් ව සිටීමට ඈට නො ඉවසිලි ගතියක් ඇති විය. එවිට කාර්යාල යට ගොස් ටොම් ගේ කරවට තම අත් දමා ගත්තා ය.

''එන්න පෙම්වත, මා සමග අසු පිටින් යන්න. දවස ගානේ ම පොත් පෙරළ පෙරළා ගණන් හිලව් බලනවාට වඩා එයින් ඔබට සෙතක් වෙයි.''

සමහර විට, ඔහු එසේ අවුත්, දෙදෙන ම අසුන් නැඟ මදනල පහස විඳිමින් ගමේ ඇවිද්දහ. එවිට, තාවකාලික ව නමුදු, ඔවුන්ගේ කම්කටුළු අමතක විය.

බොහෝ විට ඔහුට වැඩ වැඩි බැවින් ඕ තනිය ම අසු නැඟ ගියා ය.

මඳ පවන හමමින් තුබූ එවැනි එක් සවසක, නවයොවුනෙන් උදම් වූ ඕ තොමෝ කාර්යාලයට දුව ගෙන ආවා ය.

‘‘හා! ටොම්, කොතරම් පියකරු සැන්දෑවක් ද! ඔය කබල් පොත් අමතක කර, එන්න මාත් එක්ක අසු පිට යන්න.’’

එහෙත් එද තැපැල් මල්ලෙන් ලැබුණු ලියුම් සමග කොළඹින් ලැබුණේ සිත වියවුල් කරන ආරංචිත්, තව නවත් බිල්පත් හා බැන්කුවේ ගනුදෙනු ප්‍රකාශනයකුත් ය. ටොම් හිස වනමින් රවා බැලී ය.

‘‘කළ යුතු වැඩ රාශියක් තියෙනවා,’’ යි හේ නො ඉවසිල්ලෙන් කී ය.

‘‘මට කනගාටුයි, ටොම්. මා හිතා හිටියේ. . . . .’’

නුමුත් දැනට ම ඔහුගේ හිස නැමී තිබුණේ පොත්වලට ය.

ඈ ආපසු ගෙදර ගොස්, තම අසුට සෑදලය දැමීමට අස්ගොව්වාට කීවා ය. ඈ කඳු බෑවුමේ බාගයක් දුර ගිය විට තවත් අශ්වාරෝහකයෙක් ඈ දෙස එනු දුටුවා ය. විස්තර කළ නො හෙන තරම් ඈගේ හද සෙලවී ගියේ ය. ඒ හියු නෙවිල් බව ඕ හැදින ගත්තා ය.

හියු ඒ අසු ළඟට ම අවුත් ආචාර කෙළේ ය. සේරා සිය අසු හසුරුවා ගත් කදිම විලාසයත් ඔහුට ප්‍රත්‍යාචාර කරද්දී ඈගේ කුඩා හිස නැමුණු උදර ලීලාවත් ඔහුගේ නෙතට ලක් විය.

‘‘ඇත්තෙන් ම සේරා, ඔබ නැටීමට මෙන් ම අසු නැග යෑමෙහිත් හැබැ දක්ෂියක්. ඔබේ සහජ හැකියාවන් මේ කැලේ අපතේ යනවා.’’

හියුගේ අසු බැලීමට බලවත් අභිලාෂයකින් නැමුණු ඈගේ මුහුණේ රත් වූ කපොලින් පමණකි හියු කී වචන ඈට ඇසුණු බව පෙනි ගියේ. ‘‘කොච්චර ලස්සණ ද! මේ තරම් කදිම සතෙක් ලංකාවෙන් හොයාගත්තේ කොහොම ද?’’

‘‘කවද හරි මූ පිට නැඟ යන්ට කැමති ද? කල්තියා එකක් කියන්නම්. මේ කලිල් ඒ තරම් ලේසි පහසු නෑ.’’

ඈගේ නෙත් දිලිසුණි. ‘‘ඒක වඩා හොඳයි. ටොම් මට ඉඩ නුදුන්නාට, මම කැමති සැර අස්සයකුට ය. හා! අනේ මට හරි ආසයි කලිල් පිට යන්ට. මේ මෝඩ පුරුද්ද නිසා නො වේ නම්. . . . .’’

‘‘ඔය අදහස් ගැන මගේ මස්සිනා ටොම් කියන්නේ මොනවාද යි මම දන්නේ නෑ. හැබැට කෝ අද එයා ?’’

''ඔබ වගේ නෙවෙයි, හියු, එයාට එළියට එන්ට විවේකයක් නැති තරම් වැඩ.''

''මගේ හේතුව! තනිවට මා මදි ද?''

හියු ඕනෑවට වඩා ළංවීම ඈට හිරිහැරයක් විය. නැවත ඔහුගේ පෞරුෂත්වය ඈට දැනුණි.. නො කැමැත්තෙන් නමුදු ඇගේ සිත නිරායාසයෙන් ඔහු කෙරේ බැඳී ගියේ ය. හැම ස්ත්‍රීන් දෙස ම මොහු බලන්නේ මේ ආකාරයෙනැ යි ඕ හදිසියේ ම කේන්තියෙන් කල්පනා කළා. ය. ''එද නත්තල් රෑ ඔහු ඇලිසන් පැරඩේ දෙස බැලුවේත් මෙහෙම යි.''

''මේ අයිතියක් නැති ඉඩමේ ඔබ මට වළක්වන්ට පුළුවන් කමක් නෑ.''

ඈ සිය අසු වේගයෙන් එළවූවා ය. ඈ පිටිපසින් ඇසුණේ හියුගේ කස පහර ය. තව ටිකකින් මේ දෙදෙන ළඟ ළඟ ම පාහේ ගමන් ගත්හ.

දූන් කඳුගොඩලි නැති සමතල බිමක් ඔස්සේ මහ වැටී තිබුණි. සේරා සිය අසුගේ පසකට දූන් පා පහරින් ඌ වේගවත් ව ගමන් කරන්ට වූයේ ය.

හියුගේ අසුගේ කුර හඬ කන වැකුණු සේරාගේ දෙතොල මඳ සිනහ රැල්ලක් රැඳුණි. ක්‍රමයෙන් අහලින් අහල ළංවී අසුන් දෙදෙනා සමාන්තර ව සිට ගත්හ.

ඊට පසු ඔවුහු හදිසියේ ම ලොකු බෑවුමක් අසල නැවතී උරිනුර ගැටී සිට ගත්තෝ ය.

සේරාගේ අසුගේ බෙල්ල පිරිමදිමින් හියු, ''ඔබට අමාරු නෑ, සේරා?''යි කී ය.

දිලිසෙන නෙත් යුවළත් තදින් ගැහෙන හදවතත් ඇතිව ඕ හිස සැලුවා ය. සේරාගේ අශ්වයා පිරිමැදීමට නැඹුරු වූ හියුගේ කමිස අත් කෙළවර ඇගේ අතේ වැදිණි. තමාගේ පාදයෙහි වැදී සේරාට කලිල්ගේ පාර්ශ්වයේ උෂ්ණය ද දැනුණි. ටික වේලාවක් යනතුරු සේරාට මේ වේගවත් ගමන මිස වෙන කිසිවක් අමතක විය. ඕ තවමත් මේ ගමනින් උදම් ව සිටියා ය.

හදිසියේ ම හියු අතින් වැළඳගෙන කාමාස්වාදරතියෙන් මත් ව සිප ගති. ගමනින් උදම් ව සිටි ඕ ඊට ප්‍රත්‍යාචාර පවත්වා අසු එළවා ගියා ය. මෙසේ යන ඈ දෙස හියු බලාගත්වන ම සිටගත.

පතන බිම හරහා අසු එළවා ගිය ඈට ඔහුගේ සිනහ හඬ ඇසුණි.

3

තව කලකට හියු නෙවිල් පතන බිම්වලදී හමුවීමට ඇට ප්‍රස්තාවක් නො ලැබෙන බව නිරායාසයෙන් ම ඇට හැඟුණි. එහෙත් මාස කීපයකට පසු යළිත් එහි ගිය ඇට, එද හමුවීමෙන් ඇ තුළ අභ්‍යන්තර මෙන් ම බාහිර වෙනසක් ද ඇති වූවා සේ දැනුණි.

ඇගේ සන්තුෂ්ටියෙන් එක්තරා ප්‍රමාණයක් අඩු වී තිබුණි. ඇට ඇ ම නුරුස්නා සුලු විය. ටික වේලාවකට නමුත් ඇ සිපගැනීමට හියුට ඉඩදීම දැන් ඇගේ මහත් කනස්සල්ලට කරුණක් විය.

ලන්තානාව පිළිබඳ නොයෙක් ප්‍රශ්න ගැන සිත තදින් යොමු වී සිටි ටොම්ට, සිය බිරිඳ ගේ වෙනස නො දැනුණේ ය. . ඇ ගැන කොහෙත් ම කල්පනාවක් ඔහුට ඇද්දූ යි ඕ සමහර විට මවිත වූවා ය. දැන් පවත්නා දුෂ්කරතා වලින් ලන්තානාව මුද ගැනීම ඔහුගේ එක ම අදහස විය. ඔහු හා සමග ගමන් යැමට ප්‍රයත්න දැරීම නිෂ්ඵල බව සලකා ඕ නැවතත් පයින් හෝ අසුපිටින් හුදකලා ව දිග ගමන්වල යෙදුණා ය.

ඇගේ සිත තදින් ඇදී ගිය උස් කන්දක් ගේ පිටිපස විය. ඇ මෙහි කවදවත් ගමන් කර නැත. මෙය බොහෝ සෙයින් රළු පතන බිම්වලින් යුත්, රජය සතු කැලෑවකි. තනියම එහි නො යායුතු යයි ඇට ටොම් අවවාද කර තිබුණි. දවසක් සවස ඇ අසුපිටින් මේ හරියෙන් යන විට උද්‍යොග ජනක සිද්ධීන්ට තුඩු දෙන අඩිපාරක් මෙහි වැටී තිබෙනු දක්නා ලදී. ඕ ඒ දෙසට අසු මෙහෙය වූවා ය.

ගන වදුලින් හා එල්බෙන ලිය මඩුළුවලින් ද අඳුරු වූ වන රොදින් පරඬැල් පත්වල ගඳ හමන්ට වන. නො පෙනෙන කඳු ඇළියකට කඩා වැටෙන දිය කඳකින් නැගෙන හඩ මිස මේ වන රොද මුළුමනින් ම නිහඩ ව පැවැත්තේ ය. සේරා වෙවුලුවා ය. අන්තිමේ දී කැලය කෙළවර වී තණ බිම් කඳු මුදුන දක්වා පැතිරී තිබෙනු දැක්ම සේරාට ප්‍රීතියක් විය. එතැන් සිට මීටියාවතේ ඇතින් ඇ දුටුවේ කුඹුරු හා පොල් ගස් මායිම් කොට ඇති කුඩා ගමකි. එය පාළු වී තිබෙන හැඩ මේසා ඇතට පවා පෙනුණි. කුඹුරුවල වැඩ කරන සතෙක්වත් මිනිසෙක්වත් නැත. දුඹුරු පැහැති ගෙපැල් ද, කුඹුරු ලියදි ද පාළු වී ගොස් තිබුණි.

එහෙත් ගම් වැසියෝ එහි වූහ. ඇ එහි යද්දී ඔවුන් තම ගෙපැල්වල දෙරකඩ සිටිනු ඕ දුටුවා ය.

ලංකාවේ ගම්බද පළාත්වල ගමන් කර පුරුදු සේරා ගම් වැසියන්ගේ සුහදතාවයත් සිනා මුසු මුහුණින් මල් පලතුරු දෙන අයුරුත් දැක තිබේ. එහෙත් මේ කඳුකර පෙදෙසේ එබන්දක් නො වී ය. පහත රට සිංහලයන්ට

වඩා පැහැපත් වූ, මනාසේ ඇඳ පැලඳගත්, මේ උඩරට ජනයා ශාන්තොදර ලීලාවකින් ඈ දෙස බැලූ හ. ඔවුහු ඉතා දිළිඳු වූහ. සේරා කඳු මුදුනත සිට හෙළු බැල්මෙන් ම ඔවුන්ගේ කුඹුරු පාළු වී තිබෙන බව දුටුවා ය. ඔවුන් කෙසේ ජීවත් වෙද්දැ යි ඕ පුදුම වූවා ය. අසු හෙමිහිට මෙහෙයවමින් ඕ, ඇකයෙහි තබා ළදරුවකුට කිරි පොවන මවක සමග අවිනිශ්චිත ව සිනාසුණා ය.

එකෙණෙහි ම ඒ ළඟ සිටි මිනිසා කුමක්දෝ මුමුනමින් ඒ මවත් දරුවාත් ගෙට තල්ලු කෙළේ ය. මෙය ගුරුකමට ගත්තාක් මෙන් අනික් ගම්වැසියෝ ද එකිනෙකා ඔවුන්ගේ ගෙවල් තුළට වන්හ. එක අයෙකුවත් පිට සිටියේ නැත. පාලු පාරේ බල්ලන් කීප දෙනෙක් පමණක් ඇඟ මැක්කන් කසමින් සිටියහ.

මීට හේතුව කුමක් ද? අසුපිට සිටින ගැහැණියක දැක්ම ඔව්හු පිළිකුල් කළෝ ද? එසේ නැත්නම් වෙන යම් කිසි කාරණයක් වී ද?

උදුර බැල්මෙන් යුත් සුපරීක්ෂාකාරී මිනිසුන්ගෙන් ගහණ මේ නිසල ගම්මානයෙන් අප්පසු හැරුණු සේරා සිතුවිලි බර හදවතින් යුතුව, දිග මහක් ඔස්සේ කඳු බෑවුමේ සෙමින් සෙමින් අසු මෙහෙයවූවා ය.

එහෙත් කැලේ දැනට ම අඳුරු ය. රෑට කෑ ගසන සතුන්ගේ හැඬීම ද ඇරඹිණ. නිශාචර සතුන් නිසා කැඩෙන, සෙලවෙන කෝටුවල හඬ ද, පායා එන සඳට හූ කියන ඇත නරි රැළකගේ හඬ ද ඇසිණ. මොහොතක් මොහොතක් පාසා ම අඳුර එන්ට එන්ට ම වැඩි විය. නුපුරුදු සතකුගේ ගඳත් ඇට නුදුරින් දැනිණ. ඒ සමග ම අසුගේ කන්වලින් බිය සුළු බවක් ද පෙනිණ.

අසුගේ කරට තට්ටු කර ඌ දිරි ගැන් වූ නමුදු එයින් පලක් නො වී ය. අඩි පාර නො පෙනෙන තරම් කළුවර වී තුබූ බැවිනි. දැන් ඔව්හු කැලය පසු කිරීමට ඔන්න මෙන්න කියා සිටියහ. ඊළඟ නැම්ම පසු කළ විට ඔවුන් ගේ ළඟ එළිමහනට වැටෙනු ඇත.

විශාල සතකු ගේ ශරීරය ගස්වල වැදීමත්, බිය එළවන රළු පරළු කුංච නාදයත් සේරාට ඇසුණේ මේ අවස්ථාවේ දී ය.

ඕ කල්පනා කිරීමට තරම්වත් කල් පමා නුවූවා ය. හැකිතරම් ඉක්මනින් කැලෑ රොදින් පිට විය යුතු බව ඈට දැනුණි. බිය වූ අසු ඕ කඩිනමින් ම මෙහෙය වූවා ය. ඔවුන්ගේ මුහුණුවල වදින ලියවැල් හා ගස් අතුරින් ගමන් කොට පතනට පැමිණියා ය.

සේරාට පිටිපසින් නැඟුණු හඬ නැවතුණු බව දැනුණේ ය. පිටිපස හැරී බැලූ විට වන රොද ඉමේ සොඩ ඉහළට ඔසවා කන් අයාගෙන සිටි ඇතකු ඕ දුටුවා ය.

ටොම් ඇ සොයා යෑමට අසු පිළියෙළ කරමින් සිටිද්දී ඕ නො ඉවසිලිවත් ව ගේ ළඟට සේන්දු වූවා ය. වෙවුලන සිරුරකින් යුක්ත ව ඇ ඔහු වැළඳගත් ඒ අවස්ථාවේ සිය ගෙපැළත් ඔහුත් දකීමෙන් ලත් ප්‍රීතිය පෙර නො වූ විරූ තරම් විය.

''සේරා, ඔබ කොහේ ද ගියේ? සිත් තැවුලෙන්, මා පිස්සු වැටීලයි හිටියේ.''

ඕ යන්තමින් ඔහු දෙස බලා සිනහ පෑවා ය. ''හා, ටොම් මට කනගාටුයි. අනික් පැත්තේ තියෙන්නේ මොනවා දැයි බලන්ට මම කන්ද නැංගා. . . .''

''ඔබ කන්ද මුදුනට ම ගියා? අර කැලේ හරහා?''

ඕ හිස සැලුවා ය. ''තරහ වෙන්ට එපා ටොම්.''

''එහි වන සතුන් ඉන්න බව දන්නේ නැද්ද? එහි දළකාරයකුත් ඉන්නවාලු. හැබැයි, ඒක ආරංචියක් විතර යි.''

''ආරංචියක් විතරක් නො වෙයි. මම උං මේ දැන් දැක්කා.''

දෙදෙනා ම එක හෙළා කැලේ දෙස බැලූහ. කඳු පෙදෙසේ අළුවන් පැහැය මැඩගෙන පැවැති අඳුරු කඳක් මිස අන් කිසිවක් දක්නට නො වී ය. දැන් ඒ පෙදෙස හඳුනා ගැනීමට නො හැකි සේ අන්ධකාරය දැඩි විය. ඒ පීඩාදයක, රෞද්‍ර අන්ධකාරයකි.

4

පසුවදා උදේ ටොම් දෙවෙනි කෝපි කෝප්පය බොමින් ගමේ තත්ත්වය නැවතත් විස්තර කරන්නැ යි සේරාට කී ය.

''එහි තියෙන්නේ මොනවා දැයි සෙවීමට නො ගොස් මෙහි අවුරුද්දක් ගත කළ බව සිතීම පවා මට ලජ්ජාවක්. අපි මේ අන්දමේ ගමන්වල යෙදෙන්නේ නැත්නම් අපේ ජීවිත කොතරම් සීමා සහිත විය හැකි දැයි මෙයින් පේනවා. සමහර විට අනික් හැම දේ ම පසෙක දමා මම ලන්තානාව ගැන ඕනෑවට වඩා සිත යොමු කළා වෙන්ට ඇති.'' ඇඳේ කරව කරමින් ප්‍රීතියෙන් සිටි ඩයනා දෙසට ද පසු ව දිලෙන නෙත් ඇති සේරා දෙසට ද ඔහු දෙඇස් යොමු විය.

''හා! ටොම්, මේ කුඹුරු පුරන් වී තිබෙන හැටිත් අර මිනිසුන් ගේ දුප්පත් කමත් දකින විට මට ඉවසිය නො හැකි තරම් කනගාටුයි.''

''ඒ ගැන මම අද උදේ සෝදිසි කර බලනවා,'' යි හේ පොරොන්දු විය.

මේ පලාත්වාසීන් අතර මෙම ගම ලන්තානා ගම යනුවෙන් ප්‍රකට වූ බවත් ඊට හේතුව ලන්තානා වත්තටත් හියු නෙවිල් ගේ අරලිය වත්තටත් අතර කඳු පා මුල පිහිටීම බවත් ඔහුට හැඟීමක සේයාවක් තිබුණේ ය.

මේ ස්ථානයට ගොස් පෙරළා පැමිණි හේ සේරා මෙන් ම මහත් කනස්සල්ලට පත් වී ය. ඇට හැඟුණු විරුද්ධත්වය දුන් ප්‍රකට සේ පෙනුණේ ය. පිරිහී යන මේ ගමේ වැසියන් අතර ඔවුන් කෙරේ ප්‍රබල විරොධයක් දක්නා ලදී.

එහෙත් ඒ විරොධයත් ගමේ පැවැති දුප්පත් කමත් පිළිබඳ අබි රහසක් නැත. ටොම් ගොන්සාලේස්ගෙන් ප්‍රශ්න කළ විට ඔහු කිසි පැකිලීමක් නැතුව දුන් පිළිතුර මෙසේ යි: ''සර්, ඒ මිනිස්සු තරහෙන් ඉන්නේ මේ වතු දියුණු කරන විට ඔවුන්ට ලැබෙන වතුර අපිරිසුදු වන නිසයි.''

''ඔබ කියන්නේ අපේ ඇළ ඔවුන්ගේ කුඹුරුවලට ජලය සපයන බව ද?''

''අපේ කෝපි සිවියෙන් ඔවුන්ගේ ඇලේ වතුර කිළුටු වෙනවා'' යි ගොන්සාලේස් විනීත ලෙස වරද හරි ගැස්සී ය.

''කදිම විශේෂයක්.'' ටොම් ඒ කුඩා කාමරයේ ඔබ මොබ ගමන් කෙළේ ය. ''නුමුත් ඒක මහ අසාධාරණයක් මිනිහෝ! ඒ කුඩා ගම ශූන්‍ය වූවා වැනි ය. මිනිස්සු නිහීන ලෙස ම දුප්පත් ය. ඔවුන්ගේ කුඹුරු පුරන් වී තිබෙන්නේ අප නිසා. අපට මේ ගැන කළ හැකි කිසි ම දෙයක් නැද්ද. . . .? හා, මා දන්නවා, ගොන්සාලේස්. අපි ඔවුන්ගේ මුලාදැනියාට පණිවුඩයක් යවමු. පුළුවන් නම් මාව හම්බවෙන්ට හෙට හවස හතරට විතර එන්ට කියා. එවේලාවට ම මගේ මස්සිනාටත් එන්ට පණිවුඩයක් යවමු. මේ අවාසනාවන්ත තත්ත්වය ගැන මොනවා හරි කරන්ට ඕනෑ.''

සේරාට ඔහු මෙසේ කී ය. ''සමහර විට හියු රෑ කෑමට ඉදීවි. ඒ ගැන කල්තියා බණ්ඩාට කියන්න.'' ඔහුගේ පැමිණීම ගැන ඕ කැමති නුවූවා ය. එහෙත් ටොම් ගේ අදහස්වලට ඇ අනුකූල විය යුතු ය.

පසුවද සවස හතරට, පැසීගෙන එන හිසකෙස් ඇති කොණ්ඩය බැඳපු, මනා සේ ඇඳ පැළඳගත් මිනිසකු ගොන්සාලේස් කාර්යාලයට කැඳවා ගෙන ආවේ ය. සිංහල සිරිත් අනුව අමුත්තා බුලත් අතක් ටොම්ට දී ඇදිලි බැඳ ආචාර කෙළේ ය. ටොම් ද බුලත් අත පිළිගති.

''වාඩිවෙන්න,'' යි ටොම් කරුණාවන්ත ව කී ය. වත්තේ සාදන ලද අබලන් පුටුවක මේ මහලු මිනිසා වාඩි ගත්තේ උදුර ලීලාවෙනි. එසේ වාඩිගෙන ටොම් කථාව අරඹන තුරු සිටියේ ය.

පුළුවන් වුණොත් එන බව ද, තමා එනතුරු බලා නො සිටිය යුතු බව ද දන්වා හියු නෙවිල් පණිවුඩයක් එවා තිබුණෙන්, ටොම් අසල විහාරයක භික්ෂූන් වහන්සේ නමකගෙන් ඉගෙන තුබූ උසස් සිංහල වචන යොදමින් කථාව පටන් ගති.

''මේ ඔබේ කුඹුරු සම්බන්ධයෙනි. පසුගිය උදෑසන මම ඔබේ ගමට ගියෙමි. කුඹුරු පුරන් වී ගොස්, ඔබේ මුළු ගම ම මහත් අග හිඟ කම්වලින් පීඩා ලබන බව මට හොදින් ම වැටහී තිබේ.''

මුලාදෑනියා මද සිනහවක් පෑ ය. ''අපේ භාෂාව ඔබ ඉතා හොදට කථා කරනවා.'' මී ළහට ඔහුගේ වචන එඩිතර විය. ''මගේ ගම ගැන. අපේ පුරාණ රටේ අලුත් වැවිලි පැන නැග තිබෙන බොහෝ තැන්වල තත්ත්වය මෙහෙම ම යි. අපේ පරම්පරාගත ඇළ දෙළවල් ඔබේ කෝපි වතු නිසා වෙන අතකට හරවා තියෙනවා. නැත්නම් කිළුටු කර තියෙනවා.''

මොහුගේ ප්‍රකාශවල යුක්තිය ඔහුට පෙනී ගිය නමුත්, නිදහසට කරුණු ඉදිරිපත් කිරීම ද අවශ්‍ය බව ටොම්ට හැඟුණි. ''නුමුත් අපි ඒ තරම් දුෂ්ට මිනිස්සු නො වෙයි, නේ ද?'' යි හේ ශාන්ත ව ඇසී ය. ''කැලෑ එළිකොට අපි ඔබේ රටට ධනයත් සෞභාග්‍යයත් ලබා දුන්නා. කලින් කිසි ම පාරක් නැතුව තුබූ තැන්වල අපි පාරවල් දැම්මා. මුල දී රාජ මෙහෙය කරවා ගනිමින් හෝ උපයන කොටසින් බොහොමයක් ලබා ගනිමින් හෝ ඇමති වරුන් සතුටු නො සතුටු විදියට හෝ රජුගේ කැමැත්ත අනුව නඩු විසඳනවා වෙනුවට අප හොද අධිකරණ ක්‍රමයක් පිහිටුවා තිබෙනවා.''

මුලාදෑනියා හිස සැලී ය. ''නුමුත් මේ අලුතෙන් ලැබූ ධනයෙන් අපට සැලසී තිබෙන සෙත මොකක් ද? අපි කලින් මීට වඩා වාම පැවතුම් ඇති ව සිටි මිනිස්සු. ඒ කාලයේ අපි ගනුදෙනු කළේ මුදල්වලින් නො ව බඩු බාහිරාදියෙන්. සාමාන්‍යයෙන් බිම් කොටන්නා පවා අභිමානයෙන් ජීවත්වුණේ ඔහුගේ ම ඉඩම් ඔහු වගා කළ නිසා ය. අපේ රාජධානියට ගලා එනවා යයි ඔබ කියන මේ ධනයත් සමග—අපට වඩා අමුතු ම පිරිසක් වූ—පහත රට සිංහලයන් බොහෝ දෙනා ද මෙහි එනවා. ඔවුන් ගේ එක ම බලාපොරොත්තුව මුදල්. නිදහස භුක්ති විදිනවා වෙනුවට ඔවුහු මුදලට වහල් වෙති. බොහෝ දෙනා වස්තුව සොයන්නෝ ය, හොරු ය, ඉතාම දුෂ්ට මිනිස්සු ය. ඔබ අපෙන් කෙළෙහි ගුණ බලාපොරොත්තු වන්නේ කෙසේ ද? ඒ ඇරත් විහාර ගම් වශයෙන් අපි රැකගත් ඉඩමුත්, අපේ රජ වරුන් දඩයම් කළ කැලෑත් අපට නො දැනුවත් ව ම විකුණමින් අපේ ජීව රුධිරය වැනි අපේ ඇළ දෙළවල් පවා අපෙන් උදුරා ගන්නා කොට, අප කුමකට කළ ගුණ සැලකිය යුතු ද?''

මුලාදෑනියා හිස නමා ආචාර කෙළේ ය. ''මට සමාවෙන්න, මහත්මයා. මේ අයුතුකම් මට තදින් ම දැනෙන නිසා ඒවා හඬ ගා කියන්ට වී තිබෙනවා.''

''නුමුත් මීට ඇති පිළියම කුමක් ද?''යි ටොම් ඇසී ය. ''මට ඕනෑ ඔබට උදව් වෙන්ටයි.''

''ඔබට ඕනෑ අපට උදව් වෙන්ට?''

''ඔව්. මට කළ හැකි ඕනෑ ම දේකින්.''

මහලු මිනිසා නැවත කථාව ඇරඹූ විට වාක්‍යයක් වාක්‍යයක් පාසා ඔහු ප්‍රකාශ කළේ කලක් මුළුල්ලේ මේ කරුණු ඔහුගේ සිත තුළ තැන්පත් ව තිබී දැන් අනාවරණය කරන පරිද්දෙනි.

''ලන්තානා හා අරලිය වතු දෙක අතර කැලෑ රොදක් තියෙනවා. . . .'' ටොම් ඊෂ සැලී ය. ''එහි උල්පතක් තියෙනවා. අපේ ගමේ ඇළ වෙනුවට ඔබට එහි වතුර පාවිච්චි කළ හැකි නම්. . . . .''

''නුමුත් ඒක මගේ කෝපි සාදන තැනටත් ජල භාජන වලටත් බොහොම ඇතයි.''

''ඇලකින් වතුර හරවන්ට පුළුවන් වේවි.''

''එසේ කළ විට මගේ කෝපි සාදන ගේ තියෙන තැනත් මාරු කරන්ට වෙයි. ඒක මට කරන්ට වත් කම නැහැ.''

මුලාදෑනියා මඳ සිනාවක් පෑ ය. ''අපට උදව් කරන්ට ඔබට පුළුවන් වේ යයි මම හිතුවේ නෑ.''

''ඉන්න, අරලිය වත්තත් ඔබේ ඇළ පාවිච්චි කරනවා. උල්පතේ වතුර හරවා ගැනීමේ වියදම්වලින් කොටසක් වත් දරන්ට මගේ මස්සිනා හියු නෙවිල් මහතාත් කැමැති කරවා ගත හැකි නම්. . . .''

මුලාදෑනියා නැගිට්ටේ ය. ''ඒක නිෂ්ඵල වැඩක්. හියු නෙවිල් මහත්තයා ගම ගැන වැඩි සැලකිල්ලක් නෑ. එසේ වුවත් මගේ මිනිසුන් වෙනුවෙන් මම ඔබට ස්තුති කරනවා.''

ඔවුන්ගේ පාරම්පරික චාරිත්‍රානුකූල ව හේ නැවතත් දෝත් බැඳ, ආචාර කොට පාරට බැස හෙමිහිට ගියේ ය.

ටොම් ඔහුගේ කොන්දෙස්තර දෙසට හැරුණි. ''හරි ආඩම්බරකාරයා, ගොන්සාලේස්. නුමුත් ඒ ගැන මම අගේ කොට සලකනවා. මිනිහෝ, අපි මේ මිනිසුන්ට මොනවා හරි උදව්වක් කරන්ට ඕනෑ. මගේ මස්සිනා. . . . අනුමාන නෑ, අර එන්නේ එයා තමයි.''

මග හැර ගියේ ය.

ගොන්සාලේස් ප්‍රස්තාවෝචිත ලෙස මග හැර ගියේ ය.

හියු අසුගෙන් බැස ඌ බැඳ නැඹී ය. ''අමුතු කැඳවීමක්, ටොම්. පැවැත්වෙන උත්සවයකුත් නැතුව, ඔබේ මස්සිනා ප්‍රතිසංස්කරණය කරන්ට දේව මෙහෙයකුත් නැතිව, මට අඩ ගසා එව්වේ ඇයි?''

ඕනෑකමින් ම කේන්ති එන්නට ඉඩ නො දී ටොම් ඔහු කැඳවූ කාරණය කී ය. ''කැලේ තියෙන උල්පත අපේ වතු දෙක අතර ජල පාරකට වැටී තියෙනවා. ගමේ ඇළ පාවිච්චි නො කොට ඒ ජලය අපේ කෝපි තළන යන්ත්‍රාගාරවලට හරවා ගැනීමට යන වියදමෙන් කොටසක් ඔබත් දරන්ට කැමැති නම්. . . .''

තමා වාඩි වී සිටි පුටුවේ හේත්තු වී හියු දුන් මඳ සිනහව ඉතා ප්‍රියංකර විය. ''දැන් මේ බලන්න, මගේ පරණ යාළුවා, ඔබගේ අදහස්වලට එකඟ වීමට ඇති සතුට තරම් වෙන සතුටක් මට නෑ. ඔය අදහස බොහොම පරාර්ථකාමියි. නුමුත් ඒක ක්‍රියාවෙහි යොදන්ට බෑ. මම දන්නවා. මේ ගම් වැසියෝ හරි ම කම්මැලි යක්කු. ඇරත් මේ අවස්ථාවේ දී මට ඕකට වියදම් කරන්ට හැටියකුත් නෑ. ඇත්ත කියනවා නම් අලුත් අස්සයන් දෙන්නෙකුයි, බල්ලන් කීප දෙනකුයි මම රටින් ගෙන්වන්ට මුදල් යොද තියෙනවා. මට බොහොම කනගාටුයි. ඔය ධන පරිත්‍යාගවලට, ඔබට වෙන අතක් සොයාගන්ට සිදුවේවි.''

ටොම් නැගිට හියු දෙස බැලුවේ අවඥා සහගත ලෙස ය. ඔහු හොඳට ඔප දැමූ සපත්තුවට අසුන් පදවන උපකරණවලින් ගසමින් සිටියේ ය. ''දෙයියන් පල්ල, ඔබේ නම් වැඩි අමුත්තක් වෙලා නෑ, කාටහරි උපකාරයක් කිරීමට ඔබ කවදවත් අපහසුවක් විඳ තියෙනවා ද? එමෙන් ම ඔබ යමක් කරන්ට කැමති නො වන කොට බොරු කතාවක් ගොතා ඒ වැඩෙ මගහැර නො සිටි අවස්ථාවක් තිබුණා ද? මට ලන්තානාව විකිණීම යුක්ති සහගත හැටියට ඔබ සිතනවා සමග ඔබේ ඊනියා යහලුවන්ටත් කියනවා. ඔබ මගේ පියාට කළ දේ ගැන සඳහන් කරමින් ඒ ගත්තේ ඔබේ ම මුදල්ය කියා එයත් යුක්ති සහගත හැටියට පෙන්වනවා. නුමුත් ඒ මුදල් එසේ ගැනීමෙන් ඔහුගේ මරණය ඔබ ඉක්මන් කරවූ බව ඔබට හැඟුණා ද? දැන් අපේ වතු නිසා විනාශයට පත් වූ මේ ගමට ඔබෙන් සිදු විය යුතු යුතුකම මඟ හරින්ට හදන්නේ ඒක කරන්ට බැරි දෙයක් කියායි. වියදම් කරන්ට හැටියක් නැත කියායි. මට පුළුවන්ය කියා ඔබ හිතනවා ද?''

හියු ද නැගිට්ටේ ය. දෙදෙනා ම මේසය හරහා ඔවුනොවුන්ට මුහුණ පා සිටගත්හ.

''ඔබ කොච්චර මෝඩයෙක් ද ටොම්? ඔබේ ම වගකීම යයි ඕනෑවට වඩා හිතනවා. අපට කවදවත් හොඳින් ඉන්ට බැරිවීම පුදුමයක් නො වේ.'' හියුගේ මඳ සිනහ දැන් උග්‍ර කෝපයක් බවට පෙරළුණි. ''ඔබ ඔබේ පියා

ගැන කතා කරනවා. හොඳයි, මම වරදක් කළා තමයි. නුමුත් ඔබ හිතන තරම් බරපතළ එකක් නො වේ. මම ඒ බව පිළිගත්තා. ඊටත් වඩා මොනවා ද ඕනෑ? ටොම් නෙවිල්, ඔබට අතීතය මතක නැති කර දමන්ට බැරි තරම් වරදක් ඔබ නව ම කරලා නැද්ද? මේ නිෂ්ප්‍රයෝජන දෝෂාරෝපණ අපි දැන් පැත්තක දමු. ඒවා පැත්තක දලා මම දැන්වත් මින් මතු කවදවත් එකඟ නො වන ඔබේ මොට්ට යෝජනා ගැන සිත යොමු කරමු.''

මේසය හරහා මේ දෙදෙනා ඔවුනොවුන්ට ඉතා ළංව මුහුණ පා සිටිනු සේරා දුටුවා ය. රූප ලක්ෂණ වලින් සමාන වන නමුදු හැඟීම්වලින් මොවුහු බොහෝ වෙනස් වූහ. ටොම් බලවත් අධිෂ්ඨානයක් ඇති එඩිතර ගතියක් පෑ අතර හියු ඔහුගේ මුහුණෙන් හා ඇස්වලින් කෝපාවිෂ්ට ව සිටින අයුරු දැක්වී ය.

''ටොම්! හියු!''

උද්වේගය කෙළවර වුණි. මොහොතකින් තම සිත දමනය කරගත් හියු, ඈ දෙස කල්පනා හරිත මඳ සිනහවක් හෙළී ය. හියු මිට මොළවා අත ඔසවා ගෙන සිටීම තමා දුටු සිහිනයක් දැයි ඕ විස්මිත වූවා ය.

''සේරා, මා ගැන ඔබ තුළ පැවැති අදහස කොතරම් යුක්ති සහගත දැයි ඔබට පෙනෙයි. ඔබේ ස්වාමි පුරුෂයා තව ටිකකින් ඔබට නිසැකයෙන් කියනවා වාගේ මම මනුෂ්‍ය වේශයෙන් සිටින යකෙක්.''

ටොම් නො ඉවසිලිවත් ව ඒ මේ අත හැරුණේ ය. ''ඔබ හුඟක් මැත දෙඩනවා, හියු.''

''නුමුත් ඔබ කියන හැටියට මම නිතර ම එහෙමනෙ. මෙහි ඇති එක ම වෙනස අපි ළමයි නො වන බවයි.''

''එහෙනං අපි වැඩිහිටියන් වගේ හැසිරෙමින් යුක්ති සහගත මිනිසුන් හැටියට මේ වැඩය ගැන කතා කරමු.''

හියු සිය හිස් වැස්ම ගත්තේ ය. ''අපි එය කතා කරලා ඉවරයි. මගේ තීරණයත් ඔබ දන්නවා.''

''නුමුත් ඔබ රෑ කෑමට ඉන්නවා කියා අපි බලාපොරොත්තු වෙනවා'' යි සේරා මෝඩ ලෙස කීවා ය.

හියු කනගාටුව හඟවමින් හිස සැලී ය. ''ඒ ආරාධනය මට ලොකු අල්ලසක්. එය පිළිගන්ට බැරිවාට කනගාටුයි. නුමුත් අද දවසට මට ටොම්ගෙන් ලැබුණු සංග්‍රහය හොඳට ම ඇතැයි කියා මම හිතනවා. ශුභ රාත්‍රියක් වේවා, සේරා, ටොම්!''

හියු ගේ අසු ගේ කුර හඬ පහළ පාරෙන් කන වැකිම නැවතීමත් සමග ටොම් සිය අත් දෙස බැලී ය. පළල් ඇඟිලිවලින් යුත් ලොම් සහිත වූ ඔහුගේ අත් කඩිසර ය. හෙම්හිට අත මිට මොලවා මේසයට තද පහරක් දී, ''ගම්වැසියන්ට වතුර ලැබේවි. මම පොරොන්දුවක් වුණා. දෙයියන් පල්ල, මොනවා වුණත්, මගේ වචනය මම තියනවා.''

5

පසුව ද උදේ ටොම් හා ගොන්සාලේස් තියොඩලයිටයත්, පොලුත් ගෙන කැලේ දෙසට ගියහ. මීට සතියකට පසු ව තමාගේ බංගලාව පිටිපස වූ අක්කර හැටක් විශාල ආණ්ඩුවේ ඉඩම මිලයට ගැනීමට අවසර ඉල්ලා මහනුවර දිසාපති තැනට ටොම් ඉල්ලුම් පත්‍රයක් යැවී ය.

ආණ්ඩුවේ මිනින්දෝරුවෙක් මේ ස්ථානය මැනීමට වැඩිකල් යන්නට මත්තෙන් පැමිණියේ ය. ඊට ටික දවසකට පසු එකී ඉඩම් කැබැල්ල මහනුවර දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවට දැන්වීම් පළ කරන ලදී.

මේ වැඩය සාර්ථක වේ යැයි සේරා එතරම ම විශ්වාස ව සිටියේ නැත.

''හොඳයි, ගාණ උස්සන්ට හියු තරහින් වෙන්දේසියට ගියොත්?'' යි ඕ පසුබට වෙමින් ඇසුවා ය.

ඇ බලාපොරොත්තු වූ පරිද්දෙන් ම ඇගේ බිය ගැන ටොම් රවා බැලී ය.

''ඔහු එහෙම කරන්නේ ඇයි? ඒ ඇරත් අසල් වැසියාට විරුද්ධ ව ගණන් ඉස්සීම – අසල් වැසියා මස්සිනා වුවත් – සුදුසු වැඩක් නො වේ.''

''එය නො විය හැකි දෙයකැ යි මම සලකන්නේ නෑ'' යි සේරා හෙම්හිට කීවා ය. ඒ අවස්ථාවේ දී ඇට යථා තත්ත්වය කොතරම් හොඳින් අවබොධ වී ද යත් ඇ කෙළින් සිටීමට වෙහෙස දැරුවා ය. ටොම්ට හෝ ජීවතුන් අතර සිටින වෙන කවරකුටත් වඩා හොඳින් ඕ හියු දනී. අර පතනේ දී හමු වූවායින් පසු මේ අවබොධය දැන් බියකරු ලෙස ඇට දැනුණි.

මාසයකුත් දවස් දහයක් ගත වූ පසු සේරා ඩයනා ද වඩාගෙන මහනුවර සිට සිය සැමියා එන තුරු බලා සිටියා ය. දික් වූ වංගු සහිත අඩිපාරේ අසු පිට එන ඔහු බරාඳයේ සිට බලමින් සිටි ඇට සමහර විට පෙනෙයි. සමහර විට නො පෙනී යයි. එහෙත් දුර එන ඔහුගේ දර්ශනයෙන් ඔහුගේ අදහස් සඵල වී ද නැද්දැයි වටහා ගන්ට බැරි වුණි. ඔහු අසුගේ සැදලය කෙළින් කොට තබාගෙන සුපුරුදු පරිදි ප්‍රීතියෙන් හිස් වැස්ම වනමින් ආචාර කළේ ය.

එහෙත් සේරාට පුදුමයට කරුණක් වූයේ බලාපොරොත්තු රහිත ලෙස ඔහුට කොළඹ යන්ට සිදු වී තිබෙන බැවින් ඔහු ප්‍රමාදවන බව කියා මහ නුවරින් පණිවුඩයක් එවා තුබූ බැවිනි.

ඕ ඔහු හමුවීමට දුව ගියා ය. ඇ සිඹීමට ඔහු නැමුණු විට වෙනද නැති කලබල ගතියක් ඔහු කෙරෙහි පැවැති බව ඇට දැනුණි.

''ඒක, අපේ සේරා. නුමුත් ඔබෙ කීම හරි. හියු එතන හිටියා. ඔහු ගණන ඉස්සුවා. මම එය මිලයට ගත් නමුත් එහි මිලට වඩා හතර ගුණයක් වැඩියෙනුයි මම එය ගත්තේ. ඊටත් මගේ යෝජනා ක්‍රමවලටත් මුදල් ගෙවීමට මට ණයක් ගන්ට සිද්ද වුණා—ඒ නිසයි මට කොළඹ යන්ට වුණේ.''

ඔහු අසුගෙන් බැස තෝන් ලණු අස් ගොව්වාට විසි කළේ ය.

''මම ඉන්න තාක් මේ වැඩෙ මම හරි හැටියට කරනවා. කෝපි සෑදීමට අලුත් ගෙයක් හා ගබඩාවක්! අලුත් යන්ත්‍ර සූත්‍ර! කවදහරි මේවා කරන්ට ඕනෑ. දැන් කළා ම මොක ද?''

වෙනද මෙන් නො ව ඔහුගේ ගතියෙහි මහත් නො සැලකිල්ලක් පැනුණු බැවින් සේරා නො ඉවසිලිවත් ව මෙසේ කීවා ය.

''නුමුත් ඔබ නිතර ම කිව්වෙ කවදවත් මුදල් ණයට ගන්නේ නැත කියායි.''

ටොම් තද සිනහවක් පහළ කළේ ය. ''ඒකෙ රසවත් හරිය එතනයි. හොඳයි මුදල් ලැබුණේ කොහෙන්දැයි හිතන්න? කාගෙන්වත් නො වෙයි, අපේ මිත්‍ර එඩ්වින් පැරඩේගෙන්.''

කාණ්ඩය 7

1

ඇන්ගස් මැක්ලොයිඩට ලියූ ලිපිය ටොම් හෙමිහිට කියෙව්වේ ය.

''ඉතින් එංගලන්තයේ අවුරුද්දක් ගත කොට මගේ මස්සිනා හියු ආපසු අරලිය වත්තට ඇවිත් සිටී. අර ගමේ ඇළ ගැන ඇති වූ වාදයෙන් පසු දූනට අවුරුදු තුනක් ගත වූ කාලයේ දී, මේ මෑතක ඔහු හමුවන්ට මා ගිය තෙක්, ඔහු දක්නට ලැබුණේ ඉඳහිට බොහෝ දුරින් බව කල්පනා කරන විට පුදුමයක් වැනි ය.

''මස්සිනාවරුන් අතර මේ තත්ත්වය කනගාටුදයක ය. තුමුත් කරුණු හොඳ අතට හැරේ යයි මම හැම අතින් ම බලාපොරොත්තුවෙමි. මේ අනවශ්‍ය හෙදය නිරවුල් කිරීමට මට පුළුවන් හැම දෙයක් ම මම කරන්නෙමි.

''ඇළ සම්බන්ධ කාරණයේ දී හියු ඒ විදියට හැසුරුණේ මට විරුද්ධ ව ඔහුගේ ඇති තද මුරණ්ඩුකම නිසා යයි මගේ පෞද්ගලික විශ්වාසය යි. මක්නිසා ද, මගේ යෝජනා ක්‍රමයට ඔහු විසින් වියදම් කළ යුතු ප්‍රමාණයට සමාන වන තරමේ විශාල පරිත්‍යාගයක් ඔහු ගමේ පන්සලට කළ බව මට දූනගන්ට ලැබුණු බැවිනි.

''මගේ අලුත් කෝපි සාදන ගෙයි වැඩ නිම වී තිබේ. වැටුප්වලටත්, උපකරණවලටත් එය ගොඩ නගන කාලයේ මගේ වත්තේ වැඩවලට පැමිණි අවහිර කම් අතිනුත් ගිය වියදම මා බලාපොරොත්තු වූවාට වඩා ඉතා වැඩි ය. ඒ මදිවාට පාරවල් තැනීම ආදි තවත් ප්‍රධාන වැඩවලට බරපතළ වියදම් සැලසී ඇත. ඔබ දන්නා පරිදි මගේ ඉඩමට අවශ්‍ය හැම දෙයක් ම සැපයීම සඳහා ඕනෑ ම වියදමක් දැරීමට මම තදින් ම අධිෂ්ඨාන කර ගෙන සිටිමි. මේ නිසා මගේ ප්‍රතිපත්තියක් තව දුරටත් කඩා බැන්කුවෙන් මුදල් ණයට ගන්ට ද සිදු වුණි. එඩ්වින් පැරඩේගෙන් ගත් ණය තවමත් මගේ හිතට ලොකු බරක්. මුල් මුදල අඩු කරන්ටවත් ඔහු මට කවදවත් නො කියන නමුත්, ඔබට කිව්වා ම මොකද, පොලිය ගෙවීමට වත් මට දූන් හරි අමාරු යි.

''කෙසේ වෙතත් හැම මෝසමක දී ම පලදව වැඩි වැඩියෙන් ලැබෙන බැවින්, අමුතු ආපදවක් නො පැමිණියොත් දුෂ්කරතා මහ හරවා ගැනීමට අපහසු නො වනු ඇත.''

මෙහි දී ටොම් ලියුම පසෙක ලා ඉදිරිපස බැලී ය. ඊ ළහට සුසුමක් හෙළා නැවතත් එය කියවන්ට පටන් ගති.

''මහ ඇළ ගම්වැසියන් ගේ ප්‍රයෝජනයට පවරා, අලුත් කෝපි සාදන ගෙයට කැලේ උල්පතින් ජලය සැපයෙනු දැකීම සතුටකි. කුඹුරුවලට පිරිසුදු ජලය ලැබෙන්ට වූ ද පටන් කිසියම් ගම්වැසියකු එළවළු හෝ පලතුරු වැනි තැගි ඇරගෙන මා හමුවීමට නො පැමිණි දවසක් නැති තරම් ය. ඒ තැගි මා බාර නො ගත්තොත් ඔව්හු ඊට තදින් ම අමනාප වෙති.

''ස්ත්‍රීහු සේරාගෙන් උපදේශ ලබා ගැනීමට හෝ සැලකිලි දක්වා ගැනීමට ඔවුන්ගේ දරුවන් ගෙනෙති. පුරුෂයෝ මා ඔවුන්ගේ නිල නො ලත් විනිශ්චයකාරයා හැටියට සලකමින්, මා කියන කවර දෙයක් නමුත් අවිවාදයෙන් ම පිළිගනිති.

''ලොකු වර්ණනාවන්, ඇන්ගස්, නමුත් ඒ නිසා ඇතිවන වගකීම්වලින් ද තොර නො වේ. ඉඩම් අක්කර බාගයකට දෙළොස් දෙනකු පමණ ආරාවුල් කරන කොට නඩුකීම වෙනුවට එය නිරවුල් කිරීමට උඩරට නීතිය දැන සිටිය යුතුයි. (ඒ හැර ඉංග්‍රීසි හා රෝම ලන්දේසි නීතිත් මෙරට නීතිඥයන් දැනගතයුතු වීම ගැන මම අනුකම්පා කරමි.) මගේ වටිනා කාලයෙන් බොහෝ විට පැය ගණන් ගත වෙන්නේ පුරුෂයකුගේ හෝ භාර්යාවකගේ දුක් ගැනවිලි සංසිඳුවීමට ය.

''එහෙත් මට හැකි පමණින් මේ මිනිසුන්ට උදව් කිරීමට මා කැමැති යි. මා ආශ්වාස කරන වාතය මෙන් ම ඔවුන් ද මට මේ රටේ සිටින ඉතා ම කුළුපග පිරිසක් වී සිටිනවා. ලන්කානාවේ දියුණුව සැලැස්වීමට දේව පිහිට ලැබෙ වා. ඒ මගේ ඒක ම ආයාචනය යි.''

ඇන්ගස් හා මැක්ලොයිඩ නෝනාට ඔහුගේ හා සේරා ගේ ද ආශිර්වාදය දක්වන වචන ස්වල්පයක් ලියා ලියුම අවසන් කොට කවරයක් ද ලියා එය තැපැල් කාරයකු ලවා යැවීමට ගොන්සාලේස්ට බාර දුන්නේ ය.

ඉක්බිති සිතිවිලි බරින්, හේ ගෙදර දෙසට නික්ම ගියේ ය.

2

මිදුලේ අඹගස යට ඉඳගෙන පයිප්පය උරමින්, ටොම් නෙවිල් දවසකට දෙකකට පෙර ජෝර්ජ් සැඩන් තෑගි කළ මැක්ස් නමැති රන්වන් බලු පැටවා සුරතල් කරන ඩයනා හා සේරා දෙස බලා සිටියේ ය. නුමුත් ඔහුගේ සිතිවිලි ඉතා ඈත ය. නිද සිටියත් අවදි ව සිටියත් මේ දවස්වල ඔහුගේ සිතුවිලි යොමු වූයේ ඔහුගේ මුදල් තත්ත්වයේ අවදානම කෙරෙහි ය.

ගන ව වැඩුණු කෝපි පඳුරු දෙසත් ඔහුගේ මුදල් රාශියක් වියදම් වූ මනා සේ තැනූ මංමාවත් දෙස හා කෝපි සාදන අලුත් ගෙයි වහළත් බැලූ හෙතෙම සුසුමක් හෙළී ය. බැන්කුවට තිබෙන ණය කවදවත් ඔහුට අඩු කරගන්ට ලැබෙන්නේ නැද්ද? එඩ්වින් පැරඩේ ගේ ණයෙන් බෙරෙන්ට ලැබෙන්නේ ම නැද්ද?

ඩයනා නිසා ලැබූ ප්‍රීතියකින් සේරා මහත් සේ සිනාසුණා ය. තණ පිට්ටනියෙන් යා නො දී සේරා තදින් අල්ලාගෙන ඩයනා සිටි අතර බලු පැටවා සේරා ගේ කෙස් කළඹ කටින් ඩැහැගෙන ඇද්දෙන් ඇගේ වරලස ලිහී ගියේ ය. ඩයනා තණ බිමේ පෙරළෙමින් කොක් හඬලා සිනාසෙන්ට වූයෙන්, සේරා කල්පනාවෙන් යළිත් කෙස් ටික සාද ගත්තා ය:

''ඩයනා ඔය ඇති. දැන් ඔබයි මැක්සුයි නිදන්ට යන්ට වෙලාව හරි,'' යි ටොම් මඳ සිනහවක් පාමින් කී ය.

''එන්න රත්තරන්, තාත්තාට කියන්න ශුභ රාත්‍රියක් වේවා කියලා,'' යි සේරා සායම් ගිය ගවුම පිස දමමින් තණ පිට්ටනියෙන් නැගිට්ටා ය. ලක්ෂණ රෙදි පිළි යමක් ඇට කොපමණ කලකින් දෙන්ට බැරි වී දැයි ටොම්ට කල්පනා විය.

විනීත පියකරු සේරාත්, ඈ සමග කුන්දු පනිමින් ආ සිව් හැවිරිදි දඟකාර දියණියනුත් ඔවුන්ගේ එකිනෙකාට ඇති ආදරයත් දුටු ඔහු, පිටස්තර කෙනකු සේ ඔහුට ම සිත් විය.

ඩයනා ඔහුගේ දණහිස් ළඟ වැටෙමින් ''තාත්තා, අපිත් එක්ක කවදවත් සෙල්ලම් කරන්නේ නෑ,'' යි කීවා ය.

''තාත්තාට හිරිහැර කරන්න එපා, රත්තරන්, ඔහුට මහන්සියි.''

''තාත්තාට හැම තිස්සේ ම මහන්සියි.''

ශුභ රාත්‍රියක් ප්‍රාර්ථනා කරමින් ඩයනා දුන් හාදුව පිළිගනිමින් ඈ සිඹ ''ඔබ බලා සිටින්න මං කැමතියි'' හේ මෘදු ලෙස පැවසී ය.

උයනේ තනිව ම සිටින විට ඇගේ වචන ඔහුගේ කනේ රැඳී තිබුණි. ඒ වචන සැබෑ ය. මේ දවස්වල ඒ කිසිවකු ගේ ආශ්‍රයට හේ සුදුසු නො වී ය. තවත් ළමයින් සිටියා නම් කොතරම් අගේ ද; සේරාත් ඔහුත් බලාපොරොත්තු වූ පුතාවත් ලැබුණා නම්—එහෙත් ඩයනා ලැබීමේ දී ඇට ඇති වූ අමාරු ව නිසා සේරාට තවත් ළමයින් ලැබෙතැ යි බලාපොරොත්තුවන්ට නුපුළුවන් බව ඩන්කන් දෙස්තර මහතා ඔවුන්ට කියා තිබුණි.

මෙය දෙදෙනාට ම මහත් දුකක් වූ නමුත් සේරා ස්වකීය සිත් වේදනාව සඟවා ගැනීමට හොඳින් දැන සිටියා ය. ලන්තානාවේ ඔවුන් කම්කටුළු රාශියක් වින්ද නමුත් සේරා ඇගේ උද්‍යොගමත් භාවයත් තාරුණ්‍යයත් රැක ගෙන සිටි අතර, ඔහුගේ තාරුණ්‍යය පිරිහී තිබෙන බව ටොම්ට දැනුණි.

බිරිඳකගෙන් බලාපොරොත්තු විය යුතු සියල්ලෙන් සේරා පරිපූර්ණ බව හේ දත්තේ ය. ඇතැම් වේලාවක, තමා දන්නා සේරා හැර හිරිහැරදයක කලබලකාර උද්වේග සම්පන්න සේරා කෙනකු ඇ කෙරෙහි ඇති බවත් ඔහුගේ දුබලකම ඒ මධ්‍යයේ දී පෙනෙන බවත් ඔහුට ම දැනුණි. ඇ සම්පූර්ණයෙන් තෘප්තිමත් කළ හැකි ද යන ප්‍රශ්නය ද ඔහු ඉදිරියේ පැන නැංගේ ය. එහෙත් ගෙදර දෙරේ වැඩවල ඇ විනීත ලෙස යෙදෙනු දුටු හේ සැනසීමට පත් විය.

මේ හිරිහැරදයක තත්ත්වය ඔහුට දැනෙන්ට වී දැන් කලක් ගත වී ගියේ ය. නමුත් මැතක දී යළිත් ඇගේ නො ඉවසිලිවත් ගතියක් දැක ඔහුගේ සිත කලබල විය. අසු පිට නැග ඇ හිසකේ විදහා ගෙන වේගයෙන් දිව ආ සැටිත්, යමෙකුගෙන් මිදෙන්නට තැත් කරනු වැනි බැල්මක් ඇගේ මුහුණෙහි තුබූ සැටිත් හේ එද උදේ දුටුවේ ය.

මෙයින් පැය බාගයකට පසු, ඩයනා ඇඳේ නිදි කොට උයනට පැමිණි විට ඔහු තවමත් පයිප්පය උරමින් අඹගස යට ම වාඩි වී සිටියේ ය.

‘‘මහන්සි ද, පෙම්වත?’’

‘‘ටිකක්.’’

ඔහුගේ පුටුව ළඟ තණ බිමේ ඉඳගනිමින් ඇගේ සිසිල් අත ඔහුගේ උරහිස මත තුබුවා ය. පසුව ඇගේ වැළමිට ඔහුගේ දණහිස් මත තබා ඔහුගේ වෙහෙසුණු මුහුණ දෙස ඕ බැලුවා ය.

‘‘ඔබට මේ හිරිහැර සියල්ලෙන් නිදහස් වෙන්ට පුළුවන් නම් මම කැමතියි. එසේ නිදහස් වී කෙළින් ම එංගලන්තයට හෝ—කොහේ හරි නිවාඩුවකට යන්ට ඕනෑ.’’

‘‘මට නිවාඩුවක් ඕනෑ නෑ.’’

''මගේ පෙම්වත, හියුට වඩා ඔබටයි නිවාඩුවක් ඕනෑ. ඔහු අර අලුතෙන් ගෙනා අස්සයා නැග වත්තේ මායිමේ යනවා පසුගිය ද මම දැක්කා. එංගලන්තෙ ගත කළ නිවාඩුවෙන් පස්සෙ ඔහු ඉතා හොඳ සනීපෙන් ඉන්න පාටයි.''

ඔහු ටොම්ට වඩා ප්‍රාණවත් ව තරුණ ව සිටිනු දැක්ම ඇට පුදුමයට කරුණක් විය.

''ටොම් අපට සුමානෙකට දෙකකටවත් කොළඹ—මහනුවර වැනි තැනකට නමුත් ගිහින් විවේක ගන්ට බැරි ද?'' යි ඕ විමසුවා ය.

''අපට එහෙම විවේක ගන්ට වත්කමක් නෑ.''

මේ දවස්වල ඔවුන්ට බොහෝ සැප පහසුකම් අත් හරින්ට සිදු විය. ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය දේ මිසක් ඉන් බැහැර වෙන කිසිවක් ඔවුන්ට තිබුණේ නැත. හියු නෙවිල්ගෙන් කිසි ම සහයෝගයක් නො ලබා කරන ලද වැඩ අතර කෝපි සාදන අලුත් ගේ තැනීම, කැලේ දෙළට ඇළක් කැපිම හා අරලිය ලන්තානා වතුවල මායිමට කිට්ටුවන්ට තරම් අනික් ඇළේ ජාකොටුවක් දැමීම ප්‍රධාන විය.

3

හාමෝනියම වාදනය කරමින් සිටින අතර හදිසියේ ඇසුණු ශබ්දයක් නිසා ඕ කවුළුව දෙසට හැරුණා ය. ගම්බද තරුණියන් දෙදෙනකු විස්මිත ව ගල්ගැසී සිටිනු ඕ දුටුවා ය. එතැනට පැමිණි බණ්ඩා ඔවුන් එසේ සිටීම ගැන තදින් විරුද්ධ විය. මෙසේ හැසිරෙන මේ ස්ත්‍රීහු කවරහු ද? ඔවුන් හදන්නේ උඩරැටියනට නින්ද කරන්ට ද?

ඔහුගේ වේගයට ලැබුණු පිළිතුර මිමිනීම් හා ළාමක සිනාසීම් පමණකි. බණ්ඩා දැන් විවාහයට සුදුසු වයසෙහි උන් කඩවසම් තරුණයෙකි.

ඇගේ විනෝදය සැහවීමට උත්සාහ දරමින්, ''ඒ ගොල්ලන්ට ඕනෑ මොනවාද?'' යි ඕ ඇසුවා ය.

නො කැමැත්තකින් හේ පිළිතුරු දුනි. මේ ලැජ්ජා නැති ගැමි යුවතියන්ට ඕනෑ කළේ නෝනා මහත්මයා ගේ රන්වන් කෙස් ඇති දිගු වරලස දැක ගැනීමට ය. ''ඔවුන්ගේ ගරුසරු නැති කමට දඬුවමක් වශයෙන් මම ඔවුන් වීදියට ම එළවමි. ඇත්තෙන් මා එසේ කරනවා.''

''හොඳයි බණ්ඩා, මම ම ඔවුන්ට සුදුස්සක් කරන්නම්,'' යි ඕ කීවා ය.

ඔහු ගිය පසු ඕ කොණ්ඩෙ ගැටය ලිහුවා ය. ඇගේ දිගු වරලස ඉහ දක්වා වැටුණේ කඳු මතින් ගලා බසින දියදහරක් මෙන් බබළන්ට වන. කාමරයට නිසොල්මනේ ඇතුළුවුණු තරුණියන් දෙදෙනාගෙන් කෙනෙක් ඇගේ සිනිඳු ඇඟිල්ලෙන් එය අත ගෑවා ය. ''හරියට සේද වගේ'' යයි ඕ මිමිනුවා ය. මේ කුළක් මෙන් නිල්වන් වූ ඒ යුවතියගේ කෙස් කලඹ දණහිස් දක්වා වැටුණි.

''ටොම් එය මගේ කොණ්ඩයට වඩා බොහෝ සෙයින් අලංකාර කියලයි මට හිතුණේ,'' යි සේරා කීවා ය.

පිළිතුරු වශයෙන් ටොම් පහළ කළ සිනහව බලෙන් ඇදගත් එකකි. ඔහුගේ සිතිවිලි ඉතා ඈත බව ඇට දැනුණි.

''අද සවස ඉයන් ස්ටුවර්ට් බංගලාවට අසුපිටින් යනවා මම දැක්කා'' යි දීර්ඝ වේලාවක් නිහඩ ව සිට හේ කී ය. ''ඔහු යන්ට පෙර ආපසු එන්ට මට ලැබුණේ නැතුවාට කනගාටුයි. අර බර අදින අලුත් හරකුන්ගෙන් තවත් තුන් දෙනකුට වසංගතේ බෝවෙලා. ඒ දුප්පත් සතුන් බේරාගන්ට මා පුළුවන් තරම් උත්සාහ කළා. නමුත් උන් ජීවත් වෙතැයි මා හිතන්නේ නෑ.''

සේරා ගේ මුහුණ අනුකම්පා බරින් අඳුරුවුණි. ''හා, ටොම් ඔබට තවත් විපත්තියක්.''

''මට තව විපත් කීයක් ඉවසන්ට පුළුවන් වේ දැයි මම කල්පනා කරන්නේ.'' අඳුරේ දැල්වුණු ටොම් ගේ පයිප්පේ එළියෙන් ඔහුගේ දුක්බර මුහුණ පෙනුණි. ''මේ රටට ආ එකෙන් ප්‍රයෝජනයක් වුණා දැ යි මට දැන් හිතෙනවා.''

මේ ලෙසට ඔහු කතා කළ පළමුවෙනි වාරය මෙය යි. සේරා ඔහු අත තදින් අල්වා ගත්තා ය.

''ඇත්තෙන් ම ප්‍රයෝජනයක් වුණා, පෙම්වත. ටොම් මේ අහන්න. ඉයන් ආවේ මොකදැයි ඔබ දන්නවා ද? ඔහු මෙහෙම කිව්වා. මගේ ළහ මුදල් ටිකක් ඉතුරු කරලා තියෙනවා. එයින් ටොම්ට උපකාරයක් වෙනවා නම් එයින් ඔහු ප්‍රයෝජන ගනිතොත් මම සතුටුයි. නුමුත් මිනිස්සු කියන්නේ මේ දිස්ත්‍රික්කේ ඉන්න නිහීන ම තැනැත්තා ඔහු කියායි.''

''ඉතින් අපේ අභාග්‍යය ගැන හැමෝ ම දන්නවා,''යි ටොම් මහත් ශෝකයෙන් කී ය.

''පෙම්වත, අපි මෙහි මුලින් ම ආ තැන් සිට ම අලාභ හානි වුණු කොට මේ ආරංචි පැතිරෙන්නේ නැතුව තියේ ද? කරුණු හොඳ අතට හැරේවි.''

''සේරා, කරුණු යෙදී තිබෙන බරපතළකම ගැන ඔබට තේරෙන හැඩක් පේන්ට නෑ. මේ අවුරුදු කීපය තුළ ම මම යන්තමින් කටයුතු කළා මිසක් වෙන කිසිවක් කළේ නෑ. එඩ්වින් පැරඩේගෙන් ගත් ණය මුදලින් ශතයක් වත් බේරන්ට බැරිවුණා. මම බැන්කුවට ණයයි. . . .

සේරා නිහඬ වූවා ය. ඊළඟට ඕ මුදු වදනින් මෙසේ පැවසුවා ය: ''මෙහි ආ එක ප්‍රයොජනයක් වුණා දූ යි ඔබ අහනවා. ඉයන් කිව්වේ මොකක් ද යි ඔබ දන්නවා ද? අර ආණ්ඩුවේ ඉඩම මිලයට ගන්ට පරිත්‍යාගශීලි ව ක්‍රියා කළ හැටිත් ගම්වැසියන්ගේ යහපත සඳහා ඇළ ළඟ තුබුණු කෝපි සාදන ගෙය වෙන තැනක පිහිටුවීමට ටොම් වෙහෙසුණු සැටිත් නො දන්නා මිනිහෙක් මේ මුළු දිස්ත්‍රික්කේ නෑ. මේ තත්ත්වයේ වෙන කෙනෙක් මෙහෙම කරයි කියා හිතන්ට බැරි ය. නුමුත් මා කියන්ට කැමති දෙයක් නම් මේ නිසා ටොම් අපි සියලු දෙනාට ම කදිම ආදර්ශයක් වූ බවයි. ඔහු නිතර ම ගම්වැසියන්ට උදව් කිරීම නිසා ඔහු උඩරට මහත් කීර්තියක් ලබා සිටිනවා.''

ටොම් ඉදිරියට නැමී ඇගේ අත ගති. ''ඉයන් ස්ටුවර්ට හා එවැනි අය හමුවීම ධෛර්‍යයට කාරණයක්. නුමුත් ඒකෙන් බිල්වලින් නිදහස් වෙන්ට බෑ, පෙම්වතිය.''

''එපමණක් නොවෙයි. පසුගිය ද මට පාදිලි උන්නාන්සේ හමුවුණ වේලේත් ඔහු මට කීවේ ඔහු යන එන කොතැනදීත් ඔබ කරන හොඳ ඔහුට ඇසුණු බවයි. දිය උල්පත සම්බන්ධ විශිෂ්ට කාරණය ගැන විතරක් නො වේ. ඔබ මිනිසුන්ට උදව් කරන ශාන්ත පිළිවෙළ ගැන. ඔබ මේ විදියට වැඩ කරගෙන ගියොත් වතුවැවිලිකාරයන් අතර ඔබ මහ බලවතෙක් වන බවත් මම ඔබට ධෛර්‍ය දිය යුතු බවත් ඔහු කිව්වා. වතුවල වැඩ කරමින් එහි ම ජීවත් ව සිටින මිනිසුන්ට කළ යුතු බොහෝ දේ තියෙනවා—ඔවුන්ට කොයි ලෙසකින්වත් උදවු දෙන අය බොහො ම දුර්ලභයි. ඔහුගේ කීම හරි, ටොම්. ඔබ මේ පළාතට අවශ්‍ය යි!''

ටොම් හිස වැනී ය. ''ගම්වැසියන්ට ජලය ලබා දෙන්ට ගොස් මා විනාශ වීම ගැන මම පරාර්ථකාමී මෝඩයෙකැයි බොහෝ දෙනා කල්පනා කරනවා.''

''නුමුත් හියු ඇර—ඒ ගැන ඔබට හොඳ නො කියන කිසි කෙනෙක් නෑ''යි ඕ වේගයෙන් පැවසුවා ය. ''ගම්වැසියන් එන්නා සේ ම, ඔවුන්ගේ ගැටලු නිරාකරණය කරගන්ට ඔබ හමුවෙන්ට ඔවුන් එන හැටි බලන්න.''

''ඒ අය එන්නේ මා මෙන් ම ඔබ නිසාත්,'' යයි ටොම් මෘදු ලෙස ප්‍රකාශ කෙළේ ය.

සැන්දෑ කාලයේ අඹ ගස පිස එන මඳ නල සමග ම බකමුහුණු පැටවකුගේ මොළොක් හඬක් ද ඇසෙන්ට එන. තරු බබළන මේ රාත්‍රියේ කඳු නිසොල් මත් වුණි. සුළඟ තදින් හමන්ටවූයෙන් ලන්තානා යනුවෙන් මේ වත්තට නම ලැබීමට හේතු වූ ගඳපානා මල්වල සුවඳ විහිදෙන්ට වනි. මලානික බව දැනෙන්ට වූ සේරා, සුසුමක් හෙළා අත්පා දිගු කළා ය.

4

ටොම් ගේ ජනප්‍රිය භාවය ගැනත් වැවිලිකාරයන් අතුරෙහි ඔහු දැරූ තත්ත්වය ගැනත් සේරා කී දේ සැබෑ ය. තමාගේ කම්කටුළු නිසා ඔහුට බොහෝ දුරට ඈ කෙරෙන් බැහැර ව සිටීමට කොතරම් දුරට සිදු වූ නමුත් දිස්ත්‍රික්කයේ ඔහු දැරුවේ උසස් තත්ත්වයකි.

ලන්තානාව ඒ ප්‍රදේශයේ ප්‍රමුඛ ස්ථානයක් ගත්තේ ය. ඉඳහිටලා ලන්තානා බඩු ගබඩාවේ පවත්වන දේව මෙහෙයන් ද ඉන්පසු පවත්වනු ලබන විශාල භොජන සංග්‍රහයන් ද නො කඩව කෙරුණු සිරිතක් විය. හියු නෙවිල්, අයිරිෂ් ජාතික තරබාරු මයික් හා ඔහුගේ සහචරයන් ගම්පොළ හා නාවලපිටියේ තානායම් පොළවල ඉරිදු දවස්වල දී තරුණයන් එක් වී තරමක් දුරට කෑ කෝ ගසමින් පැවැත් වූ සාදයන් හැරුණු විට, ලන්තානාවේ මෙකී රැස්වීම්වලින් හුදෙකළා වූ මේ දිස්ත්‍රික්කයට විශිෂ්ට සමාජ සේවයක් සැලසුණි. සේරා ද ඒ රැස්වීම්වලට අතිශයින් ප්‍රිය කළා ය.

හැතැප්ම තිහක දුර ප්‍රමාණයේ සිටි එක ම යුරෝපීය කාන්තාව වූ සේරා දැරුවේ උසස් තැනකි. ආගන්තුකයන් මෙහි නැති සති අන්තයක් නො වූ තරම් ය. හුදෙකලා බවින් හෝ බලාපොරොත්තු සුන් යම් අවස්ථාවක මෙහි පැමිණි, සමාදරයෙන් නො පිළිගත්, එක ම වතුකාරයකුදු නො වී ය. බිරිඳකගේ හා නියම නිවාසයක ප්‍රීතිය භුක්ති විදීමේ ප්‍රස්තාවක් පිළිබඳ බලාපොරොත්තු සුන් ව සිතුවිලි වැලේ වෙලුණු මේ මිනිසුන් නෙවිල්ලා හමුවීමට පැමිණි කල, ඈ කෙරෙහි මඳ වශයෙන් නමුදු ප්‍රෙම කිරීම පුදුමයක් නො වේ.

තවද වැවිලි ප්‍රශ්න ගැන සාකච්ඡා කිරීමට වතුකාරයන් නෙවිල්ලා වෙතට පැමිණෙන සිරිතක් ද පැවැත්තේ ය. වතුකාරයන් ගේ කාරුණික හැඟීම් හා දෙශපාලකයන් ගේ ආධානගාහී මතත් අතර විශාල පරතරයක් පැවැති බැවින් සාකච්ඡාවට භාජන විය යුතු ප්‍රශ්න බොහෝ විය.

වැවිලි කාරයන් වෙනුවෙන් සෑහෙන පමණ මන්ත්‍රීවරු ව්‍යවස්ථාදායක මන්ත්‍රණ සභාවේ පෙනී නො සිටියාහ. වතුවල කෝපි ඉක්මනින් හා කාර්යක්ෂම ලෙස ලෝකයේ වෙළඳ පොළවලට යැවීම සඳහා අවශ්‍ය මංමාවත් නඩත්තු කිරීමටත්, බදු ගැන සලකා බැලීමටත්, එඩිතර ලෙස කරුණු ප්‍රකාශ කර සිටිය යුතු විය.

අවුරුදු හතලිහක දී බ්‍රිතාන්‍ය ආණ්ඩුව හැතැක්ම 3000 ක මංමාවත් තනා පාලම් ඉදිකොට තිබුණි. කිපවිටක් ම පසු බැස තුබූ දුම්රිය යෝජනා ක්‍රමයත් අන්තිමේ දී හොඳින් ක්‍රියාත්මක වෙමින් පැවැත්තේ ය. නුමුත් විටින් විට ආණ්ඩුකාරවරුන් මාරු කිරීමේ ප්‍රතිපත්තිය නිසා බොහෝ අඩු පාඩු ඇති විය. සමහර විට තමාගේ ප්‍රතිපත්ති මුදුන් පත්වීමට පෙර හොඳ ආණ්ඩුකාරයකුට අස් වී යන්ට සිදුවේ. ඒ අතර උදසීන ආණ්ඩුකාරයකු ගේ පත්වීමෙන් ඊට කලින් සිටි ආණ්ඩුකාරයා කළ යහපත මැකී යන තරම් අනර්ථයක් සැලසේ. ලංකාවේ ආර්ථික පදනම ගැන ප්‍රධාන වශයෙන් වගකිව යුතු වතුකාරයන් ගේ අදහස් ගැන නිසි සැලකිල්ල ඇති කරවා ගැනීම ඔවුන්ට තදින් ම අවශ්‍ය වූ දෙයකි.

වැවිලිකාර සමාජයේ මේ ආදී නොයෙක් ප්‍රශ්න ලන්තානා බංගලාවේ බරාඳයේ දී නිරාකරණය කරන ලද්දේ සේරා, ඩයනා සමග ක්‍රීඩා කරමින් සිටි අතරය; නැතහොත්, ඇගේ ඉල්ලීම පරිදි, මේ පුරුෂයන් ලැජ්ජා සහිත ව ගෙනා ඉරුණු මේස් කමිස ආදිය මහන අතර ය. බොහෝවිට මේ අය රෑ බෝවනතුරු ආලාප සල්ලාපයෙහි යෙදී සිටියහ.

එහෙත් මොවුන් නිතර පැමිණි නමුදු, ලන්තානාවේ දුෂ්කරතා ඔවුන් සියලු දෙනා ම දැන සිටි බැවින්, එහිදී ලැබුණු නිර්ලොභී ආගන්තුක සත්කාර යෙන් ප්‍රයෝජන ගැනීමට ඔව්හු මැලිවූහ. දඩයම් කළ සතුන් ද ඔවුන්ගේ වතුවල පලදාව ද කොතරම් තෑගි වශයෙන් ගෙනෙන ලදද යත් සේරාගේ ආහාර ගබඩාව එළවළු පලතුරුවලින් ද වල් ඌරු හා මුව ගාත්වලින් ද තර වළි කුකුළන් හෝ පරෙවි ආදී පක්ෂීන්ගෙන් ද පිරුණි. එමෙන් ම මුළු දිස්ත්‍රික්කය ම ප්‍රිය කළ ඩයනාට ද තෑග්ගක් නොර නො වී ය.

ඇට කවදාවත් මතක නැති නො වන එක්තරා රැස්වීමක් වූයේ ය.

රාත්‍රී කෑම අවසන් වී බොහෝ වේලාවක් ගත වූයෙන් සේරා ඇඳ මත වැතිරී ඇස් අයාගෙන සිටි අතර ටොම් ගේ යහළුවන් ඊට යාබද කාමරයේ සිට වැළ නො කැඩී කරන කථා ඇට හොඳින් ම ඇසුණි.

ටොම් පොත්වල ගනුදෙනු බලමින් සිටින විටත්, ඔහුගේ වත්තේ කෙළ වරක් නැති ව ඔබ මොබ ඇවිදින තුරුත්, නැත්නම් ඔහුගේ යහළුවන් සමග රෑ බෝවන තෙක් කතාවේ යෙදී සිටින තුරුත්, ඈ මෙසේ තනියම බලා සිටිය යුතු රාත්‍රී අපමණ විය.

ඈ නිසොල්මන් ව සිය ඇඟිලි අගින් රාත්‍රියට අඳින ගවුමේ සුදු ලේස් පටිය අල්ලාගෙන සිටිත් ම කතාව නො නැවතී පැවැත්තෙන් එය ඇගේ මොළය කාවැදී යන තරම් විය.

තරබාරු මයික් ඔ'පැරල් ගේ මහ ගෝසාව ඉඳහිට කිසි කාරණයක් නැතුව සිනාසීමෙන් කැඩී ගියේ ය. ඉයන් ස්ටුවර්ට ගේ හඬ මෘදු වූයේ ඉඳහිට ලජ්ජා බර, පැකිලීමකින් යුක්ත විය. හීන්දෑරි ජෝර්ජ් සැඩන් ඇදලා පැදලා කළ කථාව ඊටන් හෝ හැරෝ විද්‍යාලයයන්හි ආස්වාදය ලද්දකි. ඇත්ත වශයෙන් ඒ කථාව කොයි විද්‍යාස්ථානයේ ඌරුවට අයත් දැයි ඇට නිශ්චය කරන්ට බැරි වුණි. ටොම් කථා කළේ ටිකක් වුව ද, ඔහුගේ හුරු පුරුදු කල්පනාකාරී කථාව කාගේත් සැලැකිල්ලට යොමු වූයේ ය.

එහෙත් අද රෑ සභා ශාලාවේ පැතුරුණේ අමුතු හඬකි. රළු, අමිහිරි හඬක් වූ, එහි බලයත් නො ඉවසිල්ලත් මුළුමනින් ම ගැප් වී තුබුණි.

‘‘වැවිලිකාරයන් වූ ඔබට අතුරු වැවිල්ලක් දන්ට යයි කියා මම අවුරුදු ගණනක් මුළුල්ලේ කිව්වා නේ ද?’’ යි ඇට ඇසුණි. ‘‘මේ රටේ ආර්ථික තත්ත්වයේ අනාගතය කෝපිවලින් ම බලාපොරොත්තු වීම මෝඩකමක්. ‘තිත්ත කෝපි’ ගැන සම්පූර්ණයෙන් ඔබගේ විශ්වාසය තබන්ට එපා යයි මම නැවතත් කියනවා.’’

‘‘ඔබ තේරවිලි නේ කියන්නේ, ආචාර්ය ත්වයිට්ස්,’’ යි මයික් ඔපැරල් හඬ නගා කී ය.

‘‘කෝපි, ඔපැරල් මහත්තයා, කෝපි! රසෙන් තිත්ත, පෙරළීමෙන් තිත්ත කෝපි! දැන් නම් එහි ස්වර්ණමය යුගයයි—තවත් අවුරුදු බොහෝ ගණනක් නැත්නම් සදහට ම එය එසේ වන්නට පුළුවන. නුමුත් අපට වසංගතයක් වූ මීයන් ගැන කල්පනා කරන්න. දැන් ඔවුන් එන්නේ නැ. නුමුත් ඒ වෙනුවට වෙන වසංගත ඇති විය හැකියි. මුදල් පරිහානිය මතක ද? නැ, ඔබ බොහෝ දෙනකු එන්නට පෙරයි. කළු ලප හැදීම? කෝපි මැස්සා? හා, ඒවා ඔබට හොඳට මතක් වෙනවා ඇති.’’

බරාදයේ නිශ්ශබ්දතාව පැතුරුණි. ‘‘මීට කලින් අපට කෝපිවලින් ලැබුණු හිරිහැර ඇති—යටත් පිරිසෙයින් මේ රටේ වැවෙන කෝපි වර්ග ගැන. කෝපි මැස්සා ගැන ද මේ අවස්ථාවේ දී මතක් කරන්ට ඕනෑ. පළමුවෙන් මේ ලෙඩේ පටන් ගත්තේ කිසි හානියක් නැති අන්දමට ය. මුල දී කුඩා පැළෑටිවල ඉරි වර්ගයක් වැටුණා. ඊළඟ අවුරුද්දේදී කොළේ පිට පැත්තේත් ඇට පොකුරුවලත් පුස් ගතියක් ඇතිවන්ට පටන් ගත්තා. තුන් වැනි අවුරුද්දේ දී මුළු ගසට ම ලෙඩ බෝවී සමහර ගස්වල එක ඇටයක් වත් නැතුව ගියා.’’

ඔහු මදක් නැවතී යළිත් මහත් ආයාසයකින් කතා කරනු සේරාට ඇසුණි.

‘‘මැස්සා බෝවුණේ කොහොම දැයි අපි දන්නේ නැ. 1843 වනතුරු අපේ කෝපිවලට හානියක් වුණේ නැ. ඒ අවුරුද්දේ දී පළමුවෙන් ම මෙය සොයා ගත්තේ කැප්ටන් රොබටසන් නම් මහතෙක්—ඔහුගේ ලපල්ලගල්ල

නම් වත්තේ දී ය. ඔබ දන්නා පරිදි එය නැගෙනහිර දෙසට පැතිරී ගියේ එයින් තොර වූ එක ද වත්තක් නැති තරම් විය. එවිට අපට දෙයියන් සිහි වුණා නේ ද?''

''ඉතින් දැන් අපට එයින් හානියක් නැනෙ, සර්. එහෙම තියෙනවා ද?'' යි ජෝර්ජ් සැඩන් ඇදලා පැදලා කී ය. ''ඒ පරණ කළු මැස්සා ගැන දැන් අහන්ට ලැබෙන්නේ කලාතුරකින්.''

''එය [illegible] වෙනත් බෝවෙන්ට ඉඩ තියෙනවා''යි ත්වයිට්ස් සෘජු ව පැවසී ය.

''බොහෝ සෙයින් සුළං නො වදින තෙතමනය ඇති තැන්වල. නුමුත් ඒ එක්ක ම වැවිලිකාරයන් වන ඔබ විශෙෂයෙන් මැ වර්ගයේ පැළවලින් ලබාගැ හැකි සෙවණේ වටිනාකම ගණන් ගන්නේ නෑ. මෙහි කාරණය නම් අපේ පැළවලට රෝග වළක්වා ගැනීමේ ශක්තිය නැති බවයි. මා කියන්නේ මෙරට කෝපිවල අනාගතය ගැන මට ලොකු බයක් තිබෙන බවයි.''

මොහොතක් නිශ්ශබ්දතාව පැවති පසු ටොම් කල්පනාකාරී ව මෙසේ කීය. ''ආචාර්ය ත්වයිට්ස්, ඔබ කියන්නේ අපට තේ වවන්ට—ඒ ගැන 1839 පටන් පේරාදෙණිය වත්තේ අත් හද බලා ඇති බව මට දැනගන්ට ලැබුණා—''

''ඒක හරි, අලුතෙන් සොයා ගත් ඇසෑම් තේ ඇට එවූ ආචාර්ය වොලිච් නම් මහතෙක් සිටියා. ඊට අවුරුද්දකට පස්සේ ඇති වූ පැළ දෙසියයක් සාර්ථක ලෙස වැවුවා. ඒ නිසා තේ මතු බලාපොරොත්තු ඇති වැවිල්ලක් බව ආණ්ඩුවට දැන්නුවා.''

''එය ඒ තරම් සාර්ථක වුණා නම් ඒක මීට වඩා දියුණු නුණේ මන්ද?'' යි ටොම් සෙමින් ඇසී ය.

''ඔබ හරි, ටොම්.'' කවුරුත් මීට එකඟ වූවා සේ 'හ්ම්' හඬක් නැඟුණි. ''අවුරුදු දහසයක් තිස්සේ ඒකෙ දියුණුවක් පෙනුණේ නැත්නම්—ඒක යකාට ගියාවේ. මට කියන්ට තියෙන්නේ—''යි ජෝර්ජ් සැඩන් කී ය.

ඉයන් ස්ටුවර්ට් ලජ්ජා සහිත ව කතා කළේ ය. ''වැවිලිකාරයන් එක් කෙනෙක් දෙන්නෙක් පමණ චීනයෙන් හා ඇසෑමයෙන් පැළ ගෙන්වා සාර්ථක ලෙස වවා තිබෙන බව දන්නවා. චීන වර්ගය පුස්සැල්ලාවේ රොත්ස්චයිල්ඩ් වත්තේත් අනික් වර්ගය මෙතැන් සිට අර කන්දෙන් එහා දෙලොස්බාගේ පෙනිලන් වත්තේත් වවා තියෙනවා වගේ මතකයි. තේ වැවීම දියුණු නුවූයේ ඒ සෑදීමට යන අධික වියදම නිසා බවත් අපි දන්නවා.''

තියුණු උඩුරැවුලක් ද ඇති ජෝර්ජ් ස්මිත් මහා බැරෑරුම් ලීලාවෙන් රැල් බුරුල් හැරියේ ය. ඉන්දියාවේ සිට මෙහි පැමිණි පලපුරුදු ඇති තේ වතු කාරයෙක් සමග ටික කලකට ඉහත මම කතාවක යෙදුණා. ඔහු මෙහි තේ වවා වංග කුලීකාරයන් ලවා තේ සාදන්ට වෑයමක් කළ නමුත් දැන් එය අත්හරින්ට යනවා. තවත් කීප දෙනකුත් මෙසේ එය අත්හරින්ට යන බව කිව්වා.''

ත්වයිටස් ගේ වචන මාලාවේ නො ඉවසිලිවත් බවක් දක්නට ලැබුණි. ''අපි හිතට ගත්තොත් සුළු අමාරුකම් මැඩ පවත්වා ගන්ට පුළුවන්. වැවිලි කාරයන් වන ඔබ මතක තබාගත යුතු දේ නම් යම් හෙයකින් වැවිල්ල පාළු වුණොත් ඒ වෙනුවට නව දෙයක් වැවීමට සූදානම් විය යුතු බවයි. ඒ නිසා කෝපි හා කෝපි ගැන ම පමණක් සම්පූර්ණ බලාපොරොත්තුවෙන් සිටීම සුදුසු නෑ.''

තවත් මොහොතක් නිශ්ශබ්දතාව පැතුරුණු පසු මයික් ඔපැරල් ගේ මුවින් නැගුණේ මහත් සිනහ හඬකි.

''නරක පැත්ත ම බලන තෘණ විද්‍යාඥයන් ගේ කතාවලට මගේ ඇඟ හිරි වැටෙනවා. සත්තකින් ම අපේ මිල ගණන් විටින් විට වැඩිවන බව ජේන්නේ නැද්ද? හා, මට නම් කෝපි මිසක් වෙන කිසි දෙයක් ඕනෑ නෑ.''

''හා, මටත් එහෙමයි,'' හදෙනකුගේ පමණ කටහඬ ඇසුණි.

''ඔබේ අදහස, ටොම්,'' යි ත්වයිටස් ශාන්ත ව විචාළේ ය.

සේරා ඔහුගේ පිළිතුරට ඕනෑකමින් ඇහුම්කන් දුන්නා ය.

ඔහු චකිත ස්වරයකින්, කථා කරනු සේරාට ඇසුණි. ''මට ඕනෑ කළත් අතුරු වැවිල්ලක් කරන්ට මට වත්කමක් නැතැ,'' යි ටොම් හෙමිහිට කී ය. ''නුමුත් වෙනසක් කළ යුතු දැයි ද මම නිශ්චය කරගෙන නැත. ලන්තානාව සාර්ථක කෝපි වත්තක් කිරීමට මම වැඩ පිළ්යෙළ කර තිබෙනවා. මම එය අත් අරින්නට සූදානම් නෑ.''

''නුමුත් මගේ පෙම්වත එසේ ඔබට කරන්ට සිද්ද වුණොත්,'' යනු සේරා විස්මිත වූවා ය. ''අනේ දෙවියනි, අපට උදවු දුන මැනවි. කවර හේතුවක් නිසා නමුත් ටොම් මේ තරම් ප්‍රියකරන ඉඩම අපට අහිමි නො වේ වා. අනික් අස්වැන්න හොඳ එකක් වේවා. . . . . .'' වෙහෙසට පත් ඇගේ දෙනෙත් පිය වී නින්දට වැටුණි.

පහළ කම්කරු ලයින්වල මහත් ඝෝෂාවක් පැන නැංගේ ය. ස්ත්‍රී පුරුෂයෝ බියෙන් කෑ ගැසූහ. සීනු නාද කරන ලදී. ඔවුන්ගේ ලයින් දෙරකඩ හරියේ ම තවත් ගවයකු මරනු ලැබ එයින් තෘප්තියට පත් දිවියෙක් කැලේට රිංගා ගති. සේරා දිගට ම නිද ගත්තා ය.

5

ගෙයින් පිටත උෂ්ණය අධික විය. බංගලාව අසල කපුරු ගහේ වියළි කොළ පවා සැලුණේ නැත. වාතය උෂ්ණාධික විය.

සේරා ගේ මුළුතැන් ගෙය ඇතුළේ උණුසුම ඉතා වැඩි ය. එහි වූ පේර ජල්ලි සහිත කල්දේරම ළඟ සිටි සේරා ගේ ඉහින් කණින් ඩාදිය මුගුරු පෙරෙන්ට වන. කල්දේරමෙ පේර ජල්ලි උතුරමින් ඇගේ ඇස් පවා දැවෙන්ට විය.

මෙහි ජල්ලි තවමත් හැදෙන්නේ නැද්ද? ඊයේ මුළු ද ඇ, බණ්ඩා හා ඩයනාත් වත්ත පුරා ඉබේ වැවෙන පේර අහුලා ගත්හ. අද මේ ජල්ලි සාද ඇ බාරගත් පරිදි එය මහනුවරට යැවිය යුතු වූයේ ය. ඒ හැර අච්චාරු චට්නි ආදිය සැදිය යුතු ව තුබුණි. මෙයින් ලැබෙන මුදල් ටික නමුත් ඇට අවශ්‍ය සුළු දේ එයින් මිලයට ගැනිමට ප්‍රස්තාව ලැබුණි. එසේ නැත් නම් ඒවා ගැනිමට ඇට වත්කමක් නැත.

නාවලපිටියේ හා පුස්සැල්ලාවේ තානායම් පොළවලට එක වර්ගයකින් බෝතල දුසිම බැගින් ද, ජෝර්ජ් සැඩන් හා මයික් ඔපැරල්ට එක වර්ගයකින් බෝතල තුන බැගින් ද, ඉයන් ස්ටුවර්ටට ජල්ලි බෝතල හයක් ද දිය යුතු වුණි. ඇගේ දෙතොල් මඳ සිනහවකින් වක් විය. ඒ අයට ආශීර්වාද වේවා; මේ තරම් බෝතල් ගණනක් ඔවුන්ගේ වතුවල ඔවුන් තනිව ම කාලා කවද ඉවර වේ ද? මෙසේ ඇණවුම් කර තිබෙන්නේ ටොම්ට හා ඇට උදව් වීමට ම පමණක් බව ඕ දැන ගත්තා ය. ටොම් හා ඇ කම් කටුලුවලින් නිදහස් වූ දට ඇ ඔවුන්ට මේවා නිතර ම සපයනු ඇත. තවත් ඩාදිය බිඳක් ඇගේ ඇසට වැටුණෙන් ඇගේ අතින් එය නො ඉවසිලිවත් ව පිසදමන ලදී.

කල්දේරමෙ පැසෙන ජල්ලිය ලණු වැටෙන තරමට පදම් වූ විට එය සකස්විමට ආසන්න යයි ඕ කල්පනා කළා ය. තව විනාඩි පහක් ගියාවේ.

ඇ පිටිපස සිටි බණ්ඩා කෑ ගැසූයෙන් ඇ ඒ දෙසට හැරුණා ය. ඔහු කවුළුවෙන් බලාගත්වන ම සිටියේ වෙවුලමින් ඇඟිල්ලක් ඔසවා යමක් පෙන්වන්ට විය.

පිටිපස මිදුලේ මායිමක තුඹු ගසක් යට ඩයනා හා බලු පැටවාත් නිද සිටියහ. සේරා කවුළුවෙන් බැලූ විට කැලෙන් ආ දුඹුරු පැහැති සිවුපාවකු මේ දෙදෙනා දෙසට රිංගා එනු දුටුවා ය.

ඒ බියකරු අවස්ථාවේ දී පවා සේරා ඒ කොටියා ගේ රූප ලක්ෂණයෙන් ආස්වාදයක් ලැබුවා ය. දිලිසෙන මාංශපේශීන් හා රන්වන් පුල්ලි ඇති උගේ හමේ බඩයට සුදු පැහැය තණබිම අතුරෙහි මොනවට කැපී පෙනුණි.

ටොම් මහනුවර සිටින බවත් තමන්ට සහල් ලැබෙනතුරු හාල් ගෝනියක් ගෙන ඊමට ගොන්සාලේස් අරලිය වත්තට ගිය බවත් ඇට මතක් විය.

කෑම කන කාමරයේ තුබූ ටොම්ගේ නො: 12 තුවක්කුව දෙස ඇගේ අත නිරායාසයෙන් ම දික්වුණි. එහි බර ද ඇට දැනුණේ ඇ එයින් ඉලක්කය ගත් විට ය.

තව මොහොතක් ගත වුණොත් කොටියා ළමයා හෝ බලුපැටියා ඩැහැ ගනු නියත ය. කුරුමානම් අල්ලන කොටියා නිසොල්මනේ ඇඟ මස් ගන ව තබාගෙන පනින්ට සූදානම් ව සිට ගත.

ඊ ළඟ මොහොතේ දී තුවක්කුවෙන් නිකුත් වූ වෙඩි පහරේ වේගයෙන් ඇ පස්සට විසි වුණා ය. වෙඩි හඬ මැඩගෙන කොටියා ගේ මරහඬ පැන නැංගේ ය. ඩයනා හා බලු පැටවා ඇ වෙත දුව ආහ. ඔවුන් සිටි තණ බිමේ කැරකී වැටුණු කොටියා මරහඬ දී අවසන් හුස්ම හෙළා වැටුණේ ය.

ඇ තුවක්කුව බිම තබනවාත් සමග ළමයා අඬමින් ඇගේ ඇඟ දැවටුණා ය. සේරා වෙවුලමින් ඇ වඩාගන්ට තැත් කරත් ම ඇට හිටගන්ට තරම්වත් දණහිස් පණ නැති බව පෙනුණි.

යම් හෙයකින් වැරදීමකින් මගෙන් වෙඩිපහර ඔබට වැදුණා නම් යි සිතමින් ඕ ඩයනා වඩා ගති. අහෝ දෙවියනි, එබඳු වැරදීමක් වීම අමාරු වැඩක් නොවේ. ඔවුන් මෙහි මුලින් ආ වේලාවේ දී ටොම් වෙඩි තබන්ට උගන්වා නො තිබුණානම්—කාට කියන්ට පුළුවන් ද?

බණ්ඩා හා කම්කරුවන්ගෙන් බාගයක් පමණ දෙනා කොටියා බැලීමට ගොස් සතුටු සිනහ පාමින් ඇගේ ක්‍රියාව ගැන ආඩම්බර වූහ.

ආරංචිය වහා පැතිරී ගියෙන් හියු නෙවිල් සවස් කාලයේ සතා බැලීමට ආවේ ය.

‘‘ඔබෙ කීර්තිය පැතිරිලා ඉවරයි—ප්‍රිය නෝනා. ඇරත් සේරා, මෙ පළාතේ මින් පෙර වෙඩි නො තැබූ තරම් විශාල සතෙක්.’’

‘‘මං තවමත් කල්පනා කරන්නේ මා එය කළේ කොහොම ද කියායි. වාසනාවකට වගේ. . . .’. .’’

‘‘ඒක කදිම වෙඩිල්ලක්,’’ යි හියු කී ය. ‘‘හෙට වෙනතුරු ටොම් එන්නේ නැතැ යි ඔබ කිව්වා. මම සතා හම ගසා උගේ හම පදම්කර සකස් කිරීමට කොළඹට යැවීම ගැන ඔබගේ අමනාපයක් තිබෙනවා ද?’’

සේරා තිගැස්සුණා ය. ‘‘ඕකෙන් ඔබ කැමැති දෙයක් කරන්න. නුමුත් අනේ පින්සිද්ද වෙයි ඕක එළියට ගෙනියන්න.’’

හිශු ඈ දෙස මඳ සිනහ පෑවේ ය. ''නැවතත් මම ඔබට ආචාර කරනවා, සේරා. ඔබට මගේ ප්‍රශංසාව මදි. බය වෙලා සිටියත් සටන් කිරීම—ඒක ම ඇති.''

ඔහු ගිය පසු ඈ ඉදිරිපස බලා ගත්වන ම හුන්නා ය. බය වීමත් සටන් කරන්ට නො දැන සිටීමත් ගැන ඕ කල්පනා කළා ය. එය කොතරම් ම නරක ද?

හෙට උදේ කම්කරුවන්ට ගෙවීමට මුදල් ඇති කුඩා හම් බැගයක් ටොම් ගෙන එනවා ඇති. මාසය කෙළවර වන විට ඔහුගේ මුහුණ නිතර ම රැළි වැටේ. ඇගේ අත් මිට මෙලවුණි. වත්තෙන් ඔහුට සෑහෙන ලාභයක් වෙතොත් කොපමණ අගේ ද? එහෙත් ලන්තානාවේ කඳු මිටියාවත්වලින් බිහිවුණු අන්ධකාරය ඇගේ මතු බලාපොරොත්තු සුන්කිරීමේ පෙර නිමිත්තක් බඳු විය.

කාණ්ඩය 8

1

එඩ්වින් පැරඩේ කොළඹ වෙළඳාමෙහි යෙදී සිටින අතර රෝගාතුර වූයේ ය. ඔහු මඳක් සුවපත් වූ විට ඇලිසන් පැරඩේ නෝනා විවේක කාලයක් ගත කිරීම පිණිස දෙස්තර මහතා ගේ අවවාද පරිදි සිය සැමියාත් රැගෙන උඩ රටට පැමිණියා ය.

පැරඩේ ගේ අදහස වූයේ වෙළඳ ව්‍යාපාරය අත්හැර දමා කෝපි වැවිල්ල පටන් ගැනිම ය. එහෙත් කොළඹ ස්වකීය වෙළඳාම අත්හැර මෙසේ කෝපි වගාව ඇරඹීම සඳහා ශරීර ශක්තිය ලබා ගැනීමට කලක් ගත විය.

ඒ අතර ලන්නානාවේ කම්කටුළුවලින් ටොම් නෙවිල් නිදහසක් නො ලද්දේ ය. ඔහුගේ තිස්තුන් හැවිරිදි වයසට වඩා මහලු බවක් හේ දැක්වී ය. අව් වැසි පිනි සුළං ආදියෙන් ඔහුගේ සම රළු වී තිබුණි. නො ඉවසිලිවත් කම නිසා හම ද රැළි ගැසිණ. බර කල්පනාවලින් හා නිශ්ශබ්දතාවෙන් මේ දවස් ගත කළ ටොම්ගෙන් ඇට සැපක් බලාපොරොත්තු නො විය හැකි තත්ත්වයට ටොම් වැටී සිටින හැඩක් සේරාට පෙනුණි.

එක් සවසක ඔහු වැඩ නිමවා ගෙදර ආපසු ධයනාගේ සුරතල් ඕ විස්තර කරන්ට පටන් ගත්තා ය. බොහෝ විට ඔහු මේ කතාවලින් ප්‍රීතිවන නමුත් මෙවේලේ ඊට් ඇහුම්කන් නො දෙන බව ඕ දුටුවා ය.

‘‘ටොම්, දැන් 'වැඩ කටයුතු නරක අතට හැරිලා ද?’’

‘‘වෙනදා වගේ ම තමයි. එන්ට එන්ට වැඩ ගොඩ ගැහෙනවා. එකක් හරි යන කොට තව එකක් වරදිනවා. මා මෙහි ආ ද පටන් කම්කරුවන්ට- හාල්වලට- කොන්ත්‍රාත්කාරයන්ට- මංමාත්වලට- ගබඩාවලට- යන්ත්‍රෝපකරණාදියට- වියදම් ම කළා මිස වෙන කළ දෙයක් නෑ. මේකෙ කම්මුතුවක් නැද්ද?’’

‘‘අස්වැන්නෙනුත් නිතර ම යමක් ලැබෙනවා නේ ද?’’ යි ඕ කීවා ය.

‘‘යමක් ලැබෙනවා! කොච්චර ටික ද! යන්තම් ගිය අවුරුද්දේ පමණක් වැඩ පටන් නො ගෙන මීට තුන් අවුරුද්දකට ඉස්සෙල්ලා ගොන්සාලේස් කිව්වා වගේ මම කැලේ එළිකර වවන්ට පටන් ගත්තේ නැත්තේ මන් ද?

එහෙනම් අපේ පැළවලින් මෙලහකට පලදව ලැබෙනවා ඇති. නුමුත් මෝඩයකු වූ මම වළවල් හෑරීම, පේළි සෑදීම හා වැඩිපුර කම්කරුවන් යෙදීම වැනි දේට වැඩි මුදල් වියදම් කළේ නෑ.''

''ටොම් ඔබ හැමද ම ඉවසන සුළු නෙව ද? මගේ පෙම්වත, දැනුත් ඉවසන්න. අලුත එළිකළ හරියෙන් ඔබට තව අවුරුදු දෙකකින් අස්වැන්නක් ලැබෙවි.''

''අවුරුදු දෙකකින්? මේ අවුරුද්ද මෙන් තවත් අවුරුද්දක් මට ඉවසිය හැකි දැයි මට ම සැක සහිතයි.''

පිරිහී ගෙනයන මිනිසකු මෙන් එද රෑ ඔහු ඇගේ නම අඩගසා වෙවුලමින් නැඟිට්ටේ ය.

''සේරා මට ලන්තානාව අත්හැර දමන්ට වුණොත්.''

''එහෙම දෙයක් ගැන ඔබ කල්පනා කරන්ට ඕනෑ නෑ.''

''මම දැන් වික්කොත් මගේ නම්බුව රැකගෙන ණයත් බේරාගන්ට පුළුවන්. දවසක මට ණය බේරන්ටත් බැරි ව බංකොලොත් ලබන්ට සිද්දවීම මට හීනයක් වගේ පේනවා.''

''විකුණලා, ඊට පස්සෙ?'' යි සේරා හඬ නගා කී ය. ''නැවතත් ලන්ඩනයේ ඔබේ ආරක්ෂණ කන්තෝරුවට යන්න ද? අවුරුද්දකට පවුම් 100 ක් ලබමින් තවත් කෙනකු යටතේ මෙහි වැඩ කරන්න ද? ටොම් ඔබේ ආත්ම විශ්වාසය කෝ?''

ඇගේ වචනවලින් පසුව ඇති වූ නිශ්ශබ්දතාව දිගට ම පවතින්ට විය. ටොම් යළිත් කථා කළේ ඔහුට හුරුපුරුදු වූ ආත්ම ශක්තිය ඇතිව ය.

''ඔබ හරි, සේරා. මට ඒක ඕනෑ වුණා. නුමුත් මට විශ්වාසය තියෙනවා.''

පසුව ද උදේ කම්කරුවන් රැස්වන ස්ථානයට පැමිණ ගොන්සාලේස් කම්කරුවන් ගේ නම් අඩ ගසන විට ඔහුට මේ කාරණය යළිත් මතක් විය. ඔහුගේ මුළු පිරිසට ම කරන්ට බැරි තරම් වැඩ රාශියක් තිබුණු නමුත් වැඩට පැමිණ සිටියේ කම්කරුවන් අතළොස්සකි.

ගොන්සාලේස් වැඩට පැමිණි කම්කරුවන් ගණන් ගනිද්දී, රාමසාමි ගේ සෙනඟ පමණක් මෙහි සිටින බව ටොම් දුටුවේ ය. කරුප්පන් ගේ කණ්ඩායමෙන් එක් කෙනෙක්වත් පැමිණ නැත. ඔහුගේ මුව කෝපයෙන් දැඩි විය. දැන් දැන් එළිපිට ම විරුද්ධත්වය ප්‍රකාශ කර තිබේ. හොඳයි; ඒ අතට දැන් ඔහු වඩා කැමති විය.

ඉතා පැහැදිලි සාක්ෂි ඇතුව මිනිසකු වරදකාරයා වනතුරු ඔහු හෙළා නො දැකීම ටොම් ගේ ස්ථිර ප්‍රතිපත්තියකි. එහෙත් කරුප්පන් සම්බන්ධ යෙන් මේ ප්‍රතිපත්තිය පවා නො තකා හැරීමට ඔහුට සිදු වූයේ ඔහුගේ සිතේ බලවත් කහටක් තිබුණු බැවිනි. මේ මිනිසාත් ඔහුගේ කණ්ඩායමත් නො පමා ව වත්තෙන් පන්නා හැරීම ඔහුගේ සිත තුළ පැවති අදහස ය. එහෙත් එසේ ක්‍රියා කිරීමට හේතුවක් වත් පුළුවන්කමක් වත් ඔහුට නො තිබුණේ ය. වතු කම්කරුවන්ගෙන් සාර්ථක ලෙස වැඩ ගැනීමට ඉතා ම තියුණු උපාය ඥානයක් අවශ්‍ය ය. කණ්ඩායමක් කෙසේ වෙතත් එක මිනිසකු වුව ද නැති වුවහොත් කළ යුතු වැඩ එක්රැස් වූ විට, බරපතළ දෙයක් වනු නියත ය.

කරුප්පන් ඔහුගේ ලයින් පේළියේ සිට එන විට කම්කරුවන්ගෙන් වැඩි දෙනාට දවසේ වැඩ බාර දී යවා තුබුණි. බොහෝ නියාලු කමක් දක්වමින් ඔහු දැක් වූ ආචාරයෙහි ගැප් වී තුබුණු අහංකාර ගතිය දැනී, පමාවීමට ඇති හේතු මොනවා දැයි ටොම් සැරෙන් ඇසී ය.

කන්කානියා ඔහු දෙස රවා බැලී ය. මහත්මයා මේ ගැන නො මනාප වී නම් හේ එයට කනගාටු විය. වත්තේ කම්කරු පිරිසෙන් වැඩිදෙනකු ඔහුට අයත් නො වේ ද? ඒ නිසා ඔහු කැමැති වේලාවකට එන්ට ඉඩ නැද්ද?

ටොම් මේ අසා කෝපාවිෂ්ට විය. එහෙත් මෙය ගණනකට නො ගත් ලීලාවක් දක්වමින් මෙසේ කී ය.

''ගොන්සාලේස්, අද කරුප්පන් හා ඔහුගේ පිරිසට වරුවක් පමණක් පඩි පොතේ ලකුණු කරනු.''

ඔහු කන්කානියා දෙසට හැරී ගොන්සාලේස්ට කී දේ ම කී ය. ''දැන් නොම්මර හතරේ කට්ටියේ නෙලීම පටන් ගනින්. එය හරිහැටි නො කළොත් උඹේ පඩිය තවත් කැපෙනවා ඇති.''

ඔහු අනිත් අතට හැරී යන්ට ගියේ ය.

එදා සවස ඔහු කොන්දෙස්තර සමඟ දිනපතා පොත්වල ගණන් ලියන විට, ගොන්සාලේස් පැන බිම තැබී ය.

''සර්, ඔහුටත් ඔහුගේ පිරිසටත් වරුවක් ලකුණු කිරීම ගැන කරුප්පන්ට බොහොම තරහ යි. ඔහු නොයෙක් අන්දමින් තර්ජන කරන බව මට ආරංචියි.''

''එහෙම කරපුවාවෙ'' යි ටොම් ශාන්ත ව කී ය. ''මම ඕනෑ එහෙකට ලෑස්තියි.''

''නුමුත්, සර්, ඔහු බලවත් මිනිහෙක්. බොහෝ හිරිහැර කරන්ට ඔහුට පුළුවන්.''

''වෙන්ට පුළුවන්. එයාට ඕනෑ දේ මෙහෙ කරන්ට ආවොත් වැඩේ වරදීවි. ලන්තානාවේ ඔහුට ඕනෑ විදියට වැඩ කළා ඇති. අර දුප්පත් ඇන්ස්ට්‍රැතර් මහත්තයාට ඔහු සැර කරන සැටි, ඔබ ම මට කිව්වා නේ ද? මාත් එක්ක ඒවා කරන්ට ලැබෙන්නේ නෑ.'' කොන්දෙස්තර කනස්සලු වී සිටින බව දුටු ටොම් ඔහුගේ කරට අත දමා, ''මේ ගැන හිරිහැර වෙන්ට එපා, මිනිහො. ඒක මම බලාගන්නම්.''

මීට දවස් කීපයකට පසුවත් කරුප්පන් හා ඔහුගේ කණ්ඩායම ප්‍රමාද වූයෙන් මෙ පරිද්දෙන් ම දඬුවම් කරන ලදී.

තුන්වෙනි වරට මෙසේ සිදු වූ විට ස්වභාවයෙන් ම ශාන්ත ව සිටින ටොම්ට ඉවසිය නො හැකි විය. අවාසනාවකට මෙන් තරබාරු අයිරිෂ් ජාතික මයික් මොහුගේ දෙමළ දැනීම දියුණු කරන්නට, මෑතක ඉගැන් වූ තදපරුෂ වචන කීපයක් ටොම් නිරායාසයෙන් ම ඉගෙන ගත්තේ ය. දැන් තමාට ම පුදුම එළවන වාග් චාතුර්යයෙන්, ඒ වචන යොද බැණ වදින්ට වූයෙන් කම්කරුවෝ මවිත ව සිටගත්හ. ගොරිල්ලකුගේ වැනි මුහුණක් ඇති කන්කානියා කෝපයෙන් රවා බලන්ට විය.

මේ සියල්ල කෙළවර වූ පසු ගොන්සාලේස් කනස්සලු සහිත ව ඔහු දෙසට හැරුණි.

''සර්, කන්කානියකුට ඔහුගේ පිරිස ඉදිරියේ මෙවැනි වචන පාවිච්චි කළ එක වැරදියි. කරුප්පන්ගෙන් ඔබට කවදවත් බේරෙන්න ලැබෙන්නේ නෑ.''

ගොන්සාලේස් තව දුරටත් සම්පූර්ණ විස්තරයක් කළ පසුව ය ටොම්ට තමා කළ මෝඩකම වැටහුණේ.

මීට දවස් තුනකට පසු ස්වකීය බංගලාවට ඉදිරිපස දොර පඩිය අයිනේ පොළොව මෑතක දී හාරා දමා දෝ සමතලා නුවූ බව ටොම්ට පෙනුණේ ය. මෙසේ වීමට හේතුව කුමක් දැයි පහත් වී බලන ඔහුට පස්ගොඩ අස්සේ කිළුටු රෙදි කැබැල්ලකින් ඔතා කහ නූලකින් ගැට ගැසූ කුඩා පොට්ටනියක් දක්නට ලැබුණි. ඒ තුළ පිළිස්සූ ඇට කටුවගයකුත් දුඹුරු නූලකින් ගැට ගැසූ ගැනු හිසකෙස් රොදකුත් විය.

ඔහු මේ පොට්ටනිය හෙමිහිට බණ්ඩා වැඩ කරමින් සිටි මුළුතැන් ගෙට ගෙන ගියේ ය.

ටොම් එය ඔහුට දක් වූ විට කොලුවාගේ මුහුණ මැල වී ගියේ ය. ''මහත්තයා, මේක පැගුවා ද?'' යි හේ මිමිනුවේ ය.

''මම හිතන්නේ නෑ. ඇයි. . . .? පැගුවා නම්. . . .?'' කොලුවා බියපත් වී සිටීම ටොම්ට විහිළුවක් විය.

''මේක බොහොම සැර හූනියමක්. මැරෙන්ටයි කරල තියෙන්නෙ. මහත්තයාට මේක පැගුණා නම් මහත්තයා මැරෙනවා.''

ටොම් සිනාසුණි. ''ඔබට මීට වඩා මොලේ තියෙනවා යයි මම හිතුවා.'' විහිළුවක් මෙන් සැලකුවත් මේ සිද්ධිය ගැන ඔහුගේ සිත් වේදනාවක් ද ඇති විය. ඔහු මෙය විශ්වාස නො කළ නමුදු කවුරු හෝ තමා මරන්ට සැරසීම ඔහුගේ සිත් වේදනාවට කරුණක් විය. මේ ගැන කිසිවක් සේරාට නො කියන ලදී.

කම්කරු වියවුල් මධ්‍යයේ දවස් ගත වූ බැවින් යටකී හූනියම ගැන සිත මෙහෙයවන්ට ඔහුට ප්‍රස්තාවක් ලැබුණේ නැත. ඔහුගේ සිත යොමු වූයේ වත්තේ වැඩට වන හානිය ගැන යි. එහෙත් වෙන කෙනකුට මෙය අමතක වූයේ නො වේ.

මීට ටික කලකට පසු ඔහු බිමට බර ව තුබූ විශාල ගලක් යටින් තනිව ම ගෙදර යන අතර කිසියම් ශබ්දයක් ඇසී උඩ බැලී ය. එකෙණෙහි ම ඔහු පා තබන්ට සූදනම් වූ තැනට මහ ගලක් පෙරළුණි. උඩ ගල අසල මිටි මිනිසකු රිංගා යනු දුටු ටොම් මේ අන් කිසිවකු නො ව කරුප්පන් බව නිසැක ව ම දැන ගති.

මේ ගල දෙස බලා අනික් වාරයේ දී මෙහෙම ගැලවීමේ වාසනාවක් නො තිබෙන්ට පුළුවනැයි හේ සිතී ය.

බෙරෙන්ට බැරිතරම් අවුලක් සැලසී ඇති බවත් ඒ ගැන දැන් කිසිවක් කළ නො හැකි බවත් පෙනී ගියේ ය. ඊ ළඟට සේරා සිටිය දී කම්කරුවන් ගේ වැටුප් ගෙන ඊම සඳහා ටොම් ට මහනුවර යෑමට සිදු විය.

2

සේරා ගේ මුහුණ ආචාරාත්මක ලෙස සිඹ ටොම් පිට වූයේ කරදර බර සිතකිනි.

''වත්තේ මෙච්චර හිරිහැර තියෙද්දී ඔබ තනිකර යන්ට මම කැමැති නෑ.''

''ටොම්, කරදර වීම ඔබේ ගතියක් නො වේ. කමක් නෑ, පෙම්වත. මීට කලින් දහ දෙළොස් සැරයකටත් වඩා තනියම ඉඳලා තියෙන්නෙ.''

''ඔව්— නමුත්,'' ඇගේ සිතට අනවශ්‍යලෙස බිය වද්දන්නේ නැතුව හේ මෙයින් නතර කෙළේ ය.

බණ්ඩා ආචාර සම්පන්න ලෙස හිස් වැස්ම අතින් ගෙන එහි සිටියේ ය. ''නෝනා මහත්තයා මම බලාගන්නම්, සර්. බයවෙන්න එපා.''

කොලුවා ගේ උද්‍යොගවත් මුහුණ දෙස ටොම් සිනහවක් නැතුව බැලී ය. අසුපිට නඟිමින් ''ඔව්, ඔබ නෝනා බලාගන්න,''යි හේ පැවසී ය.

ටොම් පිට වී ගිය හැම විටක ම පැවති පාළු ගතිය ලන්තානාවේ පැතුරුණි. ඔහු මෙහි සිටින විට පවතින බලාපොරොත්තු සහගත ගතිය, ඔහු පිටවුණු විට නැති වූයේ තද අඩු පාඩුවක් දැනෙන්ට වන. ඔහු සිටින විට සේරා ඉතා සන්තෝෂයෙන් කරන ගෙදර දෙරේ සුළු වැඩ අද උදේ ඇගේ සැලකිල්ලට හේතු නො වී ය.

ඩයනා ද ගෙන ඇ ගෙයින් පිට වී කෝපි වත්තට ගියා ය. ලීලා ගේ කුඩා සුදු ගෙය පාළු වී ගොස් ඉන් දුමක් පිට නො වී තිබෙන සැටි ඕ දුර තබා ම දුටුවා ය. මේ අවුරුදු කීපය මුළුල්ලේ එහි සිටි විනීත සිංහල කාන්තාව කොහි යන්ට ඇද්දැයි කවුරුවත් නො දත්හ.

''අම්මෙ, මොකක් ද අර සද්දෙ?''

ඩයනා තම අත් තදින් අල්ලා සිටිද්දී, ඇත වෙවුලමින් ගසන සිහින් බෙර හඬක් සේරාට ඇසුණි.

''බෙර හඬ, රත්තරන්. ඇයි ඔබ මීට ඉස්සෙල්ලාත් අහලා තියෙන්නෙ.''

''ඒ හඬට මං කැමති නෑ, අම්මෙ. ඒක නවත්වන්න යයි කියන්න.''

''මට ඒක කරන්න බෑ. එන්න ඩයනා.''

''අපි අර වතුර වළට ගිහිල්ලා වතුර පාගමු. එහාට මේ හඬ ඇහෙන්නේ නෑ.''

එතැනට පවා ඉතා පිරිසුදු නිසොල්මන් වාතය පීරාගෙන ගමන් කළ ඒ හඬ නො කඩ ව කන්දෙස්කිරියාවක් ලෙස ඇසෙන්ට විය. ඇද මීට කවදවත් කැමැති නුවූ නමුත් අද උදේ පැවැති ඒ හඬ ලහි ලහියේ වේගයෙන් ගසන බෙර හඬක් වූයේ ය.

කෝපි ගස් අතරෙන් ඔවුන් ගෙදර යත් ම එවේලේ සිටියේ කම්කරුවන් ඉතා ටික දෙනකු බව ඇට පෙනුණි. වරක් ඈ දෙස කව්දෝ කෙනකු විස්මයාකුල බැල්මක් හෙළා වහා ගියේ, ඇගේ සිත්හි බියසුලු ගතියක් රඳවමිනි.

''අද උදේ මිනිස්සු වැඩ කරන්නේ නැත්තේ මන්ද?''යි ඇ ගෙදර ගියවිට බණ්ඩාගෙන් විචාළා ය.

''අද දෙමළ අවුරුද්ද, නෝනා.''

ඇගේ සිත කළකිරුණි. තදින් බෙර ගසමින්, අරක්කු බොමින් හා ඝෝෂා කරමින් පවත්වන මේ උත්සව ගැන ඕ දැන සිටියා ය.

ඩයනා ගේ ආයා– සෝමා– දැඩි කනගාටුවෙන් මෙන් බරාඳයට දුව ආවා ය.

''අය්යෝ! නෝනා! මාව එක්කං යන්ට අපේ අයියා ඇවිල්ලා ඉන්නවා. අම්මාට අන්තිම ලු. අනේ මම දැන් යන්ට ඕනෑ.''

ඒ ස්ත්‍රියත් ගිය පසු සේරා අතිශයින් ම තනිවූවා ය. ඩයනා උපන් දවසේ ඇ හුදකලා ව සිටි අයුරු ඇට මේ අවස්ථාවේ දී මතක් විය.

නො කඩව පැන නගින බෙර හඬ ගිගුම දෙමින් පැය කීපයක් ගත විය. ඇඳිරි වැටුණි. ලයින්වල බුරන බල්ලන්ගේ හඬත් කුරුලු ගී නාදයත් නැවතීම සමග ම බෙර හඬ එන්ට එන්ට ම වේගයෙන් ''ඩුං ඩුං ඩුං ඩුං ඩුං ඩුං'' අනුකරණයෙන් පැතුරුණේ ය.

ඩයනා තද නින්දට වැටී සිටි ඇඳෙන් සේරා කෙළින් වූවා ය. ඇගේ අත් වලින් දරුවාගේ කළුවන් අක්බඹුරු හිසකේ පිරිමදින විට ඒ අත්වල ඇලෙන සුලු ගතියක් ඇට දැනුණි. ඕ කාමරයෙන් පිට වී බරාඳය දෙසට ආවා ය.

දැන් ගෙට කිට්ටු ම ලයින්වලින් බෙරහඬ නික්මුණේ ය. විශාල ගින්නක් වටකොට පන්දම් එළිය ද නටන මිනිසුන්ද ඕ හිඳගත් තැන ම සිට දුටුවා ය. බලා සිටින අතර බිහිසුණු වෙස් මුහුණු බැඳගත් වෙන මිනිස්සු කීප දෙනෙක් ගින්න වටේ කැරකෙමින් ඒ මේ අත පනිමින් නටන්ට වූහ.

''නෝනා රෑ කැම කන්නේ නැද්ද?''

ඇ වේගයෙන් නැගී සිට, ඇගේ බිය ද කම්පාව ද සැහවීමට මෙන් අත් මිට මොළවා ගත්තා ය. එහි සිටියේ බණ්ඩා පමණකි.

''අද රෑ මට වැඩි බඩ ගින්නක් නෑ.''

බණ්ඩා කම්කරු ලයින් දෙස රවා බැලී ය. ''කම්කරුවෝ හරියට ම අරක්කු බොනවා. නෝනා ඇඳට යන එක හොඳයි– මෙතන ඉන්නෙ නැතුව. එහෙම නැත්තම් මම නෝනා ළඟ ඉන්නවා.''

''නුඹ ගිහින් නිදගනින්'' ඕ වහා කීවා ය.

''මම පිටි පස්සෙ ඉස්තෝප්පුවේ ඉන්නම්,''යි හේ ශාන්ත ව කියා අඳුරු දත් විය.

''ධුං ධුං ධ ධා ධුං ධුං ධුං ''

මේ තාලය ඇගේ මොළයට කා වැදුණි.

ගිරිහිස මුදුනේ තඹ පැහැගත් සඳ උද විය. එහි දීප්තිය ඝන වලාකුළකින් වැසී ගියේ ය. බෙර හඬ එන්ට එන්ට ම වැඩි විය. ගිනි ඇවිලෙන පන්දම් ගත් අත් ඇති නළුවන් ගේ නැටුම් හා ගැයුම් වියරු වැටුණවුන් ගේ මෙන් දියුණු තියුණු විය. කෙළවරක් නැති කෑ ගැසීම් මධ්‍යයේ ඉඳහිටලා තියුණු හඬක් ද පැන නැංගේ ය.

ඈට නින්ද යන්ට ඇත. ඈ අවදි වූ විට සඳ බැස බෙර හඬ ද නැවතී බියකරු නිහඬ බවක් ද පැවතිණ.

යළිත් ඇගේ අල්ල ඩහදියෙන් නැවී ගියේ ය. කළුවරේ කුමක්දෝ වැනුණේ ය.

ඈ කෙළ ගිල්ල හඬ ඈට ම ඇසුණි. පපුව ගැසෙන හඬ ද එසේ ම ඇසුණි. ඇගේ මනසට නොයෙක් දේ ආය. නිශ්චල රාත්‍රියක විවිධ හඬ නඟී. කුඩා සතුන් ගමන් කරන හඬ —කිසි තේරුමක් නැති හඬ– ඇතැම් විට ඇසේ.

ඡායාවක් සැලුණු තැන ඇති පඳුරෙන් ඇගේ ඇස් වසඟ විය.

''මේ පඳුර සෙලවූ සුළං හඬ''යි ඕ තමාට ම කියා ගත්තා ය.

පඳුර අසල ඡායාව යළිත් සෙලවුණි. මේ වර වඩාත් ළඟ සර සර ගාන හඬක් ඈට ඇසුණේ ය.

කිසි දෙයක් කර ගත නුහුණුව ඕ පුටුව මත ගල්ගැසී සිටගත්තා ය. මෙසේ බිය සහිත සිතුවිලි මැද ම, ඈට කාමරයේ තනිව ම නිදා සිටි ධයනා ගැන ඇති වූයේ මහත් බියකි.

ඈ ටිකක් ඇවිද්ද විට ඡායාව යළිත් සැලුණි. පස්සා දෙරින් කළුවන් කෙනකු ගෙට පැනගත් බව සඳ එළියෙන් ඕ හදිසියේ දුටුවා ය. ධයනා ගැන සිතා එකෙණෙහි ම ඕ පැන්නා ය. ඈ නිදා සිටි නිදන කාමරයට ගෙයි පිටිපසින් ඇතුළුවන්ට පුළුවන.

ඈ ඉතා කළුවර කෑම කාමරයට යත් ම බණ්ඩා කෑ ගැසී ය. කව්දෝ වැටුණි. ඇගේ භීතිය මැඩ ගැනීමට ප්‍රයත්න දරමින් ඕ බිත්තියට හේත්තු වූවා ය. ඈ සිටි කාමරයට ඇතුල්වන කෙනකුගේ සේයාව දෙරට යන්තමින් වැටෙනු දුටුවා ය.

‘‘ටොම් ගේ තුවක්කුව තුබූ රාක්කය ළඟට ඇට යා හැකි වෙතොත්? යටත් පිරිසෙයින් නිදන කාමරයේ දෙර ළඟටවත් ඇට යන්ට හැකි වූවොත්?’’ යි ඕ කල්පනා කළා ය.

අඳුරේම ඒ මිනිසාගේ තද හුස්ම හෙළීමත් එන්ට එන්ට ම ළංවීමත් ඇට දැනුණි. අරක්කුවල ඇඹුල් ගඳත් ඇහෙන් නිකුත්වන තෙල් වල තද දුර්ගන්ධයත්, ඇගේ නාස් පුඩු විනිවිද ගියේ ය. ඩයනා වෙතට කෙසේ හෝ යා යුතුයයි බලාපොරොත්තු සුන් ව ඕ කල්පනා කළා ය.

ඕ නැවතත් කවුළුව ළඟින් ටිකක් එහා මෙහා ගියා ය. දුගඳ වහනය වන අතකින් ඇගේ කට වසන ලදී. තවත් ඩහදිය වැකුණු ගොරෝසු අතකින් ඇ දඩු අඩුවක ලූවාක් මෙන් අල්ලාගනු ලැබුවා ය. ඇ බලාපොරොත්තු රහිත සටනක යෙදෙමින් පොර බදන විට කසු කුසු හඬක් හා නිදන කාමර යේ දෙර දෙසට එන තවත් අඩි හඬක් ඇට ඇසුණි.

වියරුවැටුණාක් මෙන් පොර බද එක අතක් ඇට මුදගත හැකි විය. එය උඩට නගා අත පත ගාන කල්හි ටොම් ගේ තුවක්කු මිට අසුවූයේ ය. එය තදින් පැටලී තුබුණෙන් ඇ අදින්නට වූවා ය. කැ ගසන්ට බැරිවන සේ මිනිසාගේ අතින් කට මිරිකුණේ ය.

ගේ ළඟ කව්දෝ කැ ගැසී ය. ඇට කට හඬවලුත් දුවන්නන්ගේ පා හඬත් ඇසුණි. දූත් අඳුරේ නො පෙනෙන රූපයන්ගෙන් පිරී තිබෙන්නාක් බඳු ය. දුෂ්ට අත හදිසියේ ඇ මුදවා ලී ය. සේරා ගේ කකුල් පණ නැති විය. ගෙයි මුල්ලේ වක ගැසී සිටින ඇට ගුටි බැට හුවමාරු වන හඬත්, ගෙරවුම් හා ශාප කිරීමුත්, ඇසුණි. අඳුරේ ම කව්දෝ ඇ ළඟින් පිරා ගෙන ගියේ ය. කකුලක් ඇගේ කකුල් පැගුවේ ය: පාවහන් නැතිව යන එන හඬ ටික වේලාවක් තිබී, නිහඬ බව පැතිරී ගියේ ය.

ගොන්සාලේස් ඇ වෙතට නො ඉවසිලිවන්ත ව අවුත් ඇ නැගිට්ටෙව්වේ ය. බණ්ඩා හිස පිටි පස කැපුණු තුවාලයකින් ලේ ගලමින්, මඳක් වැනෙමින් ඒ ළඟ ම සිටියේ ය.

‘‘ඩයනා’’යි ඇ වියරු වැටී කැ ගසා ‘‘මට ඩයනා ළඟට යන්ට ඕනැ,’’යි කීවා ය.

ඇගේ සීරුණු කට අතින් වසාගෙන තදින් වමනය කරමින් නිදන කාමරයට වැනි වැනී ගොස් එහි සිය දියණිය ශාන්ත ව නිද සිටිනු දුටුවා ය.

ගෙට රිංගා ගත් මිනිසුන් දෙදෙනා කවුරුදැයි හැඳින ගැනීමට කිසි ද ක්‍රමයක් තිබුණේ නැත. ටොම් සුදු මැලි වූ දෙතොල් හා කළු ගල් මෙන් තද මුහුණක් ඇතිව, සිත් වේදනාවෙන් හා විඩාවෙන් පෙළෙමින් සිය කම්කරුවන් ඉදිරියේ

සිට ගති. ඒ හැම දෙනම ඔහු දෙස හිතේ අමාරුවක් ගැප් වූ බැල්මක් හෙළා පෙරද රෑ සිදුවීම ගැන කිසිවක් නො දන්නා බව කීහ. බණ්ඩා කීවෙ තමාගේ හිස පිටි පසට වැදුණු පහරින් ඔහු සිහිසන් නැතුව වැටුණු බව පමණකි. ගේ මුර කරමින් සිටි ගොන්සාලේස් ඔහු ක්ලාන්ත වී මිදුලට එනු දැක මේ දෙදෙන ම හරි වේලාවට ම වාගේ ගේ තුළට පිවිසියෝ ය.

සිය පිරිසට අරක්කු පොවා සේරාට හා ඩයනාට සාහසික ලෙස පහරදීමට ඔවුන් පෙළඹවූයේත් මේ සියල්ලට ම මූලික වූයේත් කරුප්පන් ය යනු ටොම් ගේ බලවත් හැඟීම විය. රාමසාමි ගේ මිනිස්සු පවා ඔවුන් දන්නා දේ කීමට තරම් නිර්භීත නුවූහ. ඔවුන් පණ බයෙන් සිටි බැවිනි. මීළඟ ප්‍රස්තාව ලැබුණු වහා ම තමාට කොතරම් පාඩු වුවත් කරුප්පන් හා ඔහුගේ පිරිස පන්නා හැරීමට ටොම් ඉටා ගති.

සති කීපයකට පසු ලොකු කන්කානියා ගේ සහෝදරයා අවුත් කරුප්පන් රෝගාතුර ව සිටින බවත් ඔහු සුව වීමට බෙහෙත් හෝ දෙස්තර කෙනකුට ලියුමක් හෝ අවශ්‍ය බවත් කී ය. ටොම් හිඳගෙන මේසයට පැන්සලයෙන් අනිමින් සිටියේ ය. ඔහුගේ බැල්මේ හදිස්සියෙන් දක්නට වූ තියුණු බැවින් පමණක් අදහසක් උපන් බව දැනුණි.

''මං දෙන මොන ම බෙහෙතකින් වත් ඔහුගේ ලෙඩ සනීප වේ යයි මම හිතන්නේ නෑ,''යි ටොම් පැවසී ය. ''ඔහුගේ ණය බෙරන්ටය කියා ඔහුට කියනු. එවිට මම ඔහුට වත්තෙන් අස් වී යන්ට ලියුමක් ද දෙනවා. ඉන් පස්සේ ඔහුට ඕනෑ ම තැනකින් ප්‍රතිකාර ලබා ගන්ට නිදහස ලැබෙයි.''

ඒ මිනිසා යන්ට ගියේ ය.

එදා රෑත් ඊට පසුදා රෑත් නැවත වරක් වත්තේ බෙර හඬ පැතිරෙන්ට විය. ලෙඩ කළ යකුන්ට දෙළ පිදේනි දී උන් පන්නා හැරීමට රෝගියා ගේ ලයිමේ බලිතොවිල් කරන ලදී.

'තුන්වෙනිද උදයේ, උස් වූ සිරුරකින් යුත් රුසිරැති ස්ත්‍රියක් හා තවත් කීප දෙනෙක් වැඩ හවර වූ පසු හාල්, බිත්තර, දෙහි හා පැණිරස විස්කෝතු වගයක් අලංකාර රෙද්දකින් වසා ගෙන බංගලාවට පැමිණියාහ.

ටොම් ගේ දෙපාළඟ වැතිරුණු ඒ ස්ත්‍රිය තමා පැමිණියේ තම සැමියා වෙනුවෙන් කරුණු කියන්ට යයි පැවසුවා ය. ''ඔහු හොඳ මිනිහෙකි; ඔහු මේ වත්ත හැර යන්නේත් නැතුව අවුරුදු ගණනක් මුළුල්ලේ මෙහි වැඩ කළා. දැන් ඔහු ස්වාමියා ගේ පිහිටක් වත් නැතිව මරණාසන්න ව සිටිනවා.''

''ඔහුට උදව් කර ගැනීමට ඔහුට ම පුළුවන්''යි ටොම් කී ය. ''කරුප්පන් තමාගේ නමින් ම ලියාපදිංචි කළ ඉඩමක් ඇති, ඉඩම් හිමියෙක්. ඔහු ම දෙස්තර කෙනෙකු ගෙන්නා ගත්තාවෙ. මම බෙහෙත් දී මිනිහ මළොත්

ඔහුට වස දුන්නාය කියා මට චෝදනා ලැබෙවි. ඔහු ආරෝග්‍යශාලාවට යවා ඔහු මළොත් ඔහුගේ මරණය ගැන වග කිව යුත්තා මා හැටියට සලකනවා ඇති. ''ඔහු මඳක් නැවතී නිර්දය ලෙස තැගි වෙතට ඇඟිල්ල පෑ ය. ''අරවා ගෙනියනු. මා මැරෙනවා දකින්ට කැමැති මිනිහෙකු ගේ තැගිවලින් මට වැඩක් නෑ.''

පිහිට සොයා පැමිණි අය සිත් වේදනාවෙන් නිහඬ ව සිට ඔවුනොවුන් දෙස බලා හෙමිහිට නික්මී ගියහ.

මේ සියල්ල බලා සිටි සේරා බොහෝ සෙයින් කලබල වූවා ය.

''ටොම්, ඔබ කිසියම් දෙයක් මට නො කියා හංගන බවට සැක නෑ. ඔබ අවශ්‍ය වූ විට පිහිට නො වන කෙනෙක් නො වෙයි.''

''මා නැතිද රෑ වූ දේ ඔබට මතක නැතිවුණේ නෑ නේ ද?''

''නෑ, නුමුත්, ටොම්, ඇත්තට ම—''යි ඈ මූණ රතු ගැහී නිහඬ වූවා ය. ඇගේ අවවාදය විශේෂයෙන් ම ඉල්ලා සිටියොත් මිස වත්තේ වැඩවලට බාධා නො කිරීම කවදත් ඇගේ ප්‍රතිපත්තිය වීය. ටොම් කොයි අන්දමින් ක්‍රියා කළත් ඊට ඉතා හොඳ හේතු යුක්ති ඇති බව ඕ දත්තා ය.

දවස් දෙකකට පසු පනහක් හැටක් පමණ සේනාවක් බංගලාවට පැමිණියාහ. මේ සෙනග මැද, කරුප්පන් උස්සාගන එනු ලැබී ය. මිනිසා උග්‍ර ලෙස රෝගී ව සිටින බව නම් සැබෑ ය. එහෙත් ඔහුගේ ස්ථූල ශරීරයේ මස් ඇකිළී ඔහු දුබල ව වැහැරී ගොස් සිටියත් ඔහුගේ දෙනෙත්හි කෝපාවිෂ්ට බැල්ම තවමත් දක්නට ලැබුණි

''මරණාසන්න මිනිසා, තමා මරන්ට තැත් කළ අයගෙන් ම පිහිටක් ලබා ගන්ට ඉදිරිපත්වීම කොතරම් පුදුමද''යි ටොම් කල්පනා කෙළේ ය. ගලක් මෙන් දැඩි බැල්මෙන් නතර වූ ඔහු ඉදිරියට ආ කන්කානියා ගේ බිරිඳ නැවතත් බෙහෙත් ඉල්ලා අඬන්ට වූවා ය.

''ණය ගෙවා වත්ත හැර යනු. එවිට ළඟ ම ආරෝග්‍ය ශාලාවෙන් බෙහෙතුත් ප්‍රතිකාරත් ලබා ගැනීමට උඹට නිදහස තිබෙනවා,''යි හේ අනුකම්පා රහිත ව ම කී ය.

සේරා ඔහු පිටිපස සිට සංඥාවක් කළ නමුත් ඔහු එය සැලකුවේ නැත.

කන්කානියා ගේ සහෝදරයා ටොම් ඉදිරියේ බැගෑපත් ලෙස ආචාරකොට කථා කරන්ට විය. ටොම් ඇහුම් කන් දුන්නේ නැත; ඔහුට හදිසියේම ආභාසයක් ලැබී තිබුණි. එදා උදේ නවරත්නම් ඔහුගේ සහෝදරයා ගේ කූඩා ඉඩමෙන් මුදල් හුහක් රැස් කර ගත් බව ආරංචි විය. ඔහුගේ නෙරා තිබුණු ඉණෙන් එය එසේ ම බව දැනගති.

නපුරු කථාව ශාන්ත ව නවත්වා හේ මෙසේ කී ය. ''අන්තිමේ දී උඹේ මොළේ පෑදිලා ණය ගෙවන්ට සූදානම් ව සිටීම ගැන මම සතුටුයි, නවරත්නම්. මේ නිෂ්ඵල කතාව අත්ඇර දලා ගනුදෙනුව කෙළවරක් කරමු. කාසි මට දෙනවා.''

ඔහු හදිසියේ ම මිනිසාගේ ඉණ දෙසට ඇඟිල්ල පෑ ය.

බලාපොරොත්තු රහිත ව මෙසේ කරුණු සැලසුණෙන් නවරත්නම් ඉණේ ගැටේ ලිහා ලොකු නෝට්ටු මිටියක් ඇද ගත්තේ ය. ටොම් කල්පනා සහිත ව වත්තට එන්ට තිබෙන මුදල ගණන් කර ගෙන කුවිතාන්සිය ලිවීමට ගේ තුළට ගියේ ය.

අවට සිටි මිනිසුන් අතර ගල් ගැසුණාක් බඳු නිශ්ශබ්දතාවක් පැතුරුණි. දැන් මුමුනන හඬක් පැන නැගී ය. ඒ සියල්ල යටපත් කොට ඇසුණේ රෝගාතුර මිනිසා ඔහුගේ සහෝදරයාට බැණ වදින හඬ ය. ''පල් මෝඩයා, උඹ මාව මරා, ඒ මදිවාට හිඟන්නකු වගේ වළලා දන්ට ද කල්පනාව ?''

ඔහුගේ රන්වන් වූ සාහසික නෙත් යුවළ සේරා දෙසට හැර වී ය. ''නෙවිල් පවුලට ම ශාපවේවා. අද විතරක් නො වෙයි සදහට ම ශාපවේවා.''

කම්කරුවන් එහා මෙහා වන්ට විය. ගොන්සාලේස් ඔහුගේ ''ජිම් ක්‍රෝ'' තොප්පිය මදක් නැවෙන්නට ඔහුගේ සිහින් ඉසේ රඳවා අත්මිටි මොලවා ගෙන පිරිස මැදට පැන ''තව වචනයක් තකා කළොත් උඹට දෙන්නේ මේකෙන්!'' කියා තර්ජනාත්මක ව කුඩය ඉස්සුවේ ය.

ගොන්සාලේස් මිටි වුව ද ඔහුගේ කෝපය නිසා රෝගියා බියෙන් හැකුළුණි. තවමත් කෝපාවිෂ්ට වූ ඕවර්සියර් කුඩය වනමින් පියගැට පෙළට නැග සේරා පසෙකට වී සිටියේ ඔහුගේ සුදුමැලි මුහුණේ වීරෝදර දර්ශනයක් ඇතුව ය.

මේ කලබලය ඇසී, කෝපය මැඩගෙන ටොම් එතනට පැමිණි විට මුළු පෙදෙස ම නිශ්ශබ්ද විය.

ඕනෑ කමින් ම ටොම් රෝගියා ළඟට ගියේ ය. ''උඹේ කුවිතාන්සිය මෙන්න. මේකත් ආපහු ලබාගන්ට උඹ කැමති ඇතැ''යි අවඥා සහිත ව කී ය. මෙසේ කියා, ටොම් පරිස්සම් කර තුබූ හූනියම ඔහුගේ කම්බිලිය මත දැමී ය. මෙහි ප්‍රතිඵලය විදුලි සැරයක් බඳු විය. මිනිසා ගේ අත් පැකිළී පස්සට විය. ඒ කුමක්දැයි දැනගත් අවට සිටි මිනිස්සු හයින් ත්‍රස්තව සුසුම් හෙළූහ. කවදවත් අපට වරදක් නොකළ දෙරේට දුන්නා— ''අපේ දෙරේට ඕක කරුප්පන් දුන්නා!'' ඔව්හු අත් මිට මොලවාගෙන කෝපයෙන් දිලෙන බැලුම් හෙළමින් ඔහු පිරිවරා ගත්හ.

ගොන්සාලේස් හූනියම දෙස රවාගෙන සිටියේ ය. ''සර්, මේ ගැන මට කලින් කිව්වා නම් මම කැමතියි. මෙහෙම වැඩ බොහොම බරපතළයි. මේ හූනියම් මතුරන්නේ රට සොහොන් පළක මිනී වළක් උඩ මේවා නපුරු වැඩ. ඒවා කරන්නේ නපුරු මිනිස්සු. බලන්න සර්, කරුප්පන් ගේ මිනිස්සුවත් මෙහෙම දේකට සම්බන්ධවෙන්ට කැමැති නැති සැටි.''

ටොම් නිශ්ශබ්ද වීමට අතින් සංඥා කෙළේ ය.

''මේ මිනිහා කොයි අන්දමේ කෙනෙක්දැයි නුඹලා දැන් දැක්කා. ඔහුත් එක්ක යන්ට කැමති අය කවුද? දැන් පඩි ලබාගෙන පිටවෙන්ට කැමති අය කවුද?''

මිනිස්සු මුමුනමින් කන්කානියා වටේ සිටි ඔහුගේ නෑදෑයන් දෙතුන් දෙනාගෙන් බැහැර වූහ. පනහක්, හැටක් නැතහොත් හැට හතර දෙනෙක් පමණ කම්කරුවෝ, රෝගියාත් ඔහුගේ භාර්යාවත් තවත් තුන් දෙනෙකුත් තනිකර දමා, ඔවුන්ගෙන් ඈත් ව සිට ගත්තෝ ය. අර ටික දෙනා ගොන්සාලේස් සමග පඩි ගැනීමට කාර්යාලයට ගිය අතර ඉතුරු ව සිටි වැඩි දෙනා මහත්මයාට බැගෑපත් ව ආචාර පවත්වා ශාන්ත ලෙස ලයින් කරා ගියහ.

3

කල් තබා ම වැසි කාලය එළඹියේ ය. දවසක් දවසක් පාසා ධාරානිපාතයෙන් වැසි වසින්ට වන. කාණු පිරීතිරී ගියේ ය. පීලි උතුරා ගලන ජලය කඳුරැළි සිරිගති. ඒ අතර බුරුල් වූ රතු පස් සහිත කඳු ගොඩලි ගස් ගල් පෙරළමින් රුරා වැටුණි.

තද වරුසා මැද කල්පනාකාරී ව ටොම් ගමන් ගත්තේ ය. හිස මඳක් නැමී තිබුණි. මිට මෙලවූ අත් සාක්කුවල දමා සිටියේ ය. ඔහුගේ හිස් වැස්මෙන් දිය බේරී වැටුණත් සපත්තු වැහි වතුරෙන් පිරී තිබුණත් ඒවා ගැන හෝ තෙත ඇඳුම් ගැනවත් ටොම් ගණන් ගත්තේ නැත. මින් පෙර කිසි කලෙක ඇති නො වූ අන්දමේ සෘතු ගුණයෙන් කැඩී බිඳී යන, තමා ම ඉතා මහන්සි වී වියදම් දරා සෑදූ වතු පාරවල තමා පැය ගණනක් ඇවිද්ද බව ඔහුට දැනුණේ නැති තරම් ය.

කෝපි ගස්වල කොළවලින් වැටෙන වතුරට ද හේ ගොදුරු විය. සැන්දෑවේ ඇඳිරි වැටීගෙන එන වේලේ ගමන් ගත් මොහුට තමාගේ හැම උත්සාහයක් මැඩලීමට වත්තට ඇති ශක්තිය මෙනෙහි විය.

කම්කරුවන් ගේ ලයින් ළඟට යනවිට නිශ්ශබ්දතාව පැවතුණි. යටත් පිරිසෙයින් මෙය ඔහු ජය ලැබූ ස්ථානයකි. සියල්ල ශාන්ත ව පැවැත්තේ ය. ඔහු යටපත් කිරීමට පැවැති එතරම් තද ප්‍රයත්නය හා සසඳන විට දැන් ලැබෙන සහනය අල්ප ය.

මෙසේ ගමන්කොට කෝපි සාදන ගෙට හේ පැමිණියේ ය. ''ටොම් ගේ මෝඩකම''යයි හියු නෙවිල් නම් තැබුවේ මේ ගෙට ය. කල්පනා බර ව එහි ඇතුළුවුණු ටොම් තමාගේ හුදෙකලා බව සම්පූර්ණ කරනු පිණිස දෙර වසාගති. වත්ත වෙනුවෙන් ඔහුගෙන් සැලසුණු ශ්‍රේෂ්ඨතම සේවය මෙයයි. එයින් සැලසෙන ඵල ප්‍රයෝජන මෙහි ගැප් වී තිබුණි.

ඔහු අභිනව යන්ත්‍ර සූත්‍ර දෙසට ගියේ ය. දැන් ඒවා වැඩ නැතිව ක්‍රියා විරහිතව තිබේ. මෙය ඔහුගේ නිෂ්ක්‍රමණයක් හෝ අවසාන සුබ පැතුමක් විය. කෝපි ඇට තළන පරණ යන්ත්‍රය මෙය යි. එය ඍතු කිපයකට ගොදුරු ව අබලන් ව තිබුණේ ය. බිත්තිවලට හේත්තු කොට තිබුණේ කෝපි ඇට වලින් පිරුණු ගෝනි ය. ඔහු ඒ අසලින් යන විට ඔහුගේ නාස්පුඩු සැලුණි. සත්තකින් ම තෙතමනය නිසා ඒ කෝපි ඇටවලට කිසි හානියක් සිදු වී නැද්ද?

රිදී වන් ඇට මිටක් ගෙන ඔහු එය සිඹ බැලී ය. ඒවා යන්තමින් පුස් අල්ලා තිබුණි. කාල ගුණය හොඳ වී තව ටික දවසකින් ඒවා කොළඹට නො යැව්වොත් ඔහුගේ කෝපි යළිත් විනාශ වනු නියත ය. එහෙත් ඔහුගේ බර අදින අලුත් ගොනුන් වසංගතයෙන් මැරී යෑම නිසා ඔහුට යළිත් පිටින් එන කරත්ත ගැන බලාපොරොත්තුවන්ට සිදු විය.

''හොඳට මස් දමා තුබූ කෝපි ඇට අතගා හරින ලදුව ඒවා රිදී දහරක් මෙන් පතිත විය. මේවා නරක් වුණොත් අපරාදයෙකැ''යි හේ සිතී ය. ''මේ හොඳ කෝපි; බොහොම කෝපි වලට වඩා හොඳයි. නුමුත් තව අවුරුද්දකින් පමණ අලුත් පැළ පල දරූ විට ඊටත් වඩා හොඳ කෝපි ලැබෙනු ඇත. තවත් අවුරුද්දකින්.........''

ලී කවුළු පියනක් හැර තෙත් වූ භූමිය දෙස ටොම් බලා සිටියේ ය. වලා කුලින් ගැවසි අහස දෙසට ගිය කඳු, පින්නෙන් නැහැවී, අළුවන් ව තුබුණි. හරින ලද කවුළුවේ කොළ රහිත අත්තක් ගැටෙමින් සැලසූ කත්දෙස්කිරියා වෙන් නිදහස් වී, හේ එතැනින් නික්ම පුස් බැඳි, තෙත් කා තුබූ දූම ළඟට ගියේ ය. ''මේක යකාගෙ කාලගුණයක්! යකාගෙ රටක්. අපි මේ රටෙන් පිට වුණොත් වඩා හොඳය,''යි මිමිනුවේ ය. ''නුමුත් මොන ඉලව්වක් වුණත් මේ තරම් හොඳ ජීවිතයක් මට කවදවත් ලැබුණේ නෑ.''

ඔහුගේ දුෂ්කරතා මධ්‍යයේ මංමාවත් හා පාලම් ද, මේ කෝපි සාදන ගෙය ද, හොඳට වැඩුණු පැළ ද ඔහුගේ ම උත්සාහයෙන් ඔහු විසින් ඇති කරන ලද්දේ ය.

''දැන් ඔබ කල්පනා කරන්නේ හැම දෙයක් ම අත් ඇරදලා යන්ට!''යි ඔහුගේ අභ්‍යන්තරයෙන් උපහාසාත්මක හඬක් නැගුණි.

ලී පෙට්ටියක් මත වාඩි වී ටොම් හිස නමා දැතේ තබා ගති.

''මේ සදකාලික ණයට මට මුහුණ පාන්ට බැ. කරන්ට තියෙන ඉතා ම නම්බුකාර වැඩේ වත්ත විකිණීමට මා කළ තීරණය යි.''

වත්ත මිලයට ගනු කැමැති කෙනකු පෙර දින කොළඹින් එවා තුබූ ලියුම හේ අතට ගත්තේ ය. ඔහු මේ කාරණය කාටවත් කියා තිබුණේ නැත. හැමට ම වඩා එය සේරාට දැන්වීමට හේ බිය විය. ඒ ගැන සිත් වේදනාවෙන් හා කලකිරීමෙන් ඇගේ කෝපය ඇවිස්සෙන හැටිත් ඉන් පසු කනගාටුවෙන් මිරිකී ඈ නිහඬ ව සිටින සැටිත් ඔහුට කල්පනා විය.

කෙසේ වෙතත් ඔහු ඇට හෙට මෙය දන්වනු ඇත. මුහුණ පෑ යුතු ඕනෑ ම දේකට ඔහු මුහුණ පානු ඇත. ඔහුගේ තීරණය දැන් අවසාන යි.

වෙහෙසට පත් වූ හේ තෙත් වූ ඇඳුම් නිසා තමාගේ ඇට කටු පවා විනි විද යන ශීත දැනී නැගිට්ටේ ය. ඔහුගේ හිස ගැස්සී උගුර තද විය. ඔහු බංගලාවට ආසන්න වූ විට හැම පියවරක් ම තැබුවේ අමාරුවකිනි. හෙළු සැම සුසුමක් සමග ම ඉළකටුවලට අනින්නාක් මෙන් වේදනා විය.

සේරා ඔහු එන තුරු බරාඳයේ බලා සිට ඔහු දුටු වහා ම වැස්සේ ම දුව ගොස් අතින් අල්ලා ගති.

''ටොම් මුළු දවස තිස්සේ කොහේ ද ගියේ ? ඔබ හොඳට ම තෙමිලා!''

ඇට මඳහස දැක්වීමට ඔහු යත්න දැරූ විට දත් ඇඳි වෙවුලන්ට විය. ''මම ටිකක් තෙමිලා. එච්චරයි.''

''ටිකක් තෙමිලා—! පෙම්වත මම බොහො ම නො ඉවසිල්ලෙන් හිටියේ. ඔබ දවල් කෑමට ආවෙත් නෑ. –ඔබ හිටියේ කොහිදැයි කවුරුවත් දන්නේ නෑ.''

ඔහු දෙස සැලකිලිමත් බැලුම් හෙළමින් ඕ ඔහු බංගලාවට කැඳවා ගියා ය.

''හා, ටොම් ඔය හෙම්බිරිස්සාවත් තියාගෙන කොහෙත් ම යන්ට වටින්නේ නෑ.''

ඇගේ බැණ වැදීමෙහි ද සැපතක් තිබුණි. එහෙයින් උණු වතුර හා උණුසුම් ඇඳුම් සූදානම් කර තුබූ නිදන කාමරයට ගෙන යාමට හේ ඉඩ දුන්නේ ය.

පසු ව සැර රා වීදුරුවක් අතේ ඇතිව, ඉතා වෙහෙස පත්ව, නිහඬ බවෙහි යෙදී, වැස්සේ සෝෂාවටත් වහළේ සිදුරුවලින් බේරෙන වැහි බින්දු එකතුවීමට තුබූ භාජනවලට වැසි වැටෙන හඬටත් සවන් දෙමින්, සාලයේ

වාඩි වී සිටියේ ය. එහෙත් අන් සියලු හඬට වඩා ඔහුගේ ගැහෙන හිස තුළින් නික්මුණු හීන් හඬ ශබ්දවත් වුණි. ‘‘හෙට’’ යි ඔහු මලානික ව සිනී ය. ‘‘හෙට මම ලියුමක් ලියා පර්ගියුසන් ගේ යෝජනාවට එකඟ වෙලා ඒ බව සේරාට කියනවා.’’

පසුවද උදේ ඔහු නැගිට්ටේ තද උණකින් පෙළෙමිනි. ඔහුගේ වෙනස් වූ පැහැය දැක පපුවේ වියළි කැස්සට කන්දුන් සේරා බියපත් වූවා ය. තවමත් නො කඩව පවතින වැස්ස නො තකා ඈ ගොන්සාලේස් සොයා ගනු පිණිස කාර්‍යාලයට දුව ගියා ය.

‘‘මම දැන් වහා ම දෙස්තර මහත්මයාට පණිවුඩයක් යවනවා. ඒ අතර නෝනාමහත්තයා හියු නෙවිල් මහත්තයාට පණිවුඩයක් යැව්වොත් බොහොම හොඳය,’’ යි ගොන්සාලේස් කී ය.

සේරා මාපටැහිල්ල හපමින් කල්පනා භරිත ව සිටියා ය. ඈ ඊට කැමති නුවූවා ය. තුන් මාසයකට පෙර එහි ආවාට පසු ඔහු පොරොන්දු වූ නමුත් හියු ඔවුන් වෙතට නො පැමිණියේ ය. ඉක්බිති ඈ හදිසියේ ම තීරණය කරගෙන ටොම් ගේ මේසයේ වාඩි වී වහා ලියුමක් ලීවා ය.

ඇගේ ඇහිලි ලහි ලහියේ කඩදසිය මත ක්‍රියාත්මක විය. ‘‘ප්‍රිය හියු, ටොම්ට බොහොම අසනීපයි. ඔබට මෙහි පැමිණීමට ඉඩ තිබේ නම් මම ඉතා කෘතඥවෙමි. —සේරා.’’

පැයක්වත් ගතවන්නට මත්තෙන් ඔහු පාරේ අසු නැග එන හඬ ඇසුණි. ඔහු හමුවීමට ඈ දුව ගියේ අන්දුන් කුන්දුන් නැතිව ය.

‘‘ටොම් බරපතළ ලෙස ම අසනීපෙන්’’ ඈ ඉකිබිඳිමින් කීවේ ඔහුගේ කබායේ සුව ස්පර්ශය ලබමිනි.

ඔහුගේ අත්වලින් මොහොතකට ඈ තදින් වැළඳගෙන ඇගේ නිකට උස්සා මද සිනහ පා ‘‘බලන්න සේරා, මේ මේ කොහෙත් ම ඔබේ ස්වභාවය නො වේ. එහෙමද?’’

කිසි බරක් නැතුව විශ්වාස සහිතව ඔහුගේ එහි සිටීම පවා, ධෛර්‍යයක් විය. ඈ පෙරටුව නිදන කාමරයට යන අතර කඳුළු මුසු මද සිනහ රැල්ලක් නැගිණ.

ටොම් කොට්ට මත වැතිරී සිටියේ ය. ඔහුගේ හුස්ම හෙළීම දුබල ව ශීඝ්‍ර ව පැවතුණි. මුහුණ ඉතා සුදුමැලි විය.

හියු ඔහු වෙතට නැමී ‘‘වැඩි සනීපයක් නෑ, ඒ ටොම්, මගේ පරණ යාළුවා?’’

ටොම් ගේ ඇසිපිය සැලුණි. ‘‘මෙය පොඩි සීතලයක්.’’

''කිසි එකක් ගැන කරදර වෙන්න එපා. මට පුළුවන් හැම දෙයක් ම කරනවා. මේවර මම ඔබ අමාරුවේ දන්නේ නෑ.''

ඔහු සේරා බැහැරට කැඳවා අබ පැලැස්තරයක් සාදන හැටි කියා දුන්නේ ය. ''එය වැඩිය සැරට හදන්ට එපා.''

කථා කිරිමේ ශක්තිය නැතුව ඕ හිස සැලුවා ය. ඔහු ටික වේලාවකට ඇගේ උර හිස මත අත තබා ''සේරා, දැන් ඔබට අධෛර්‍ය වෙන්ට බෑ. ඔබේ මුළු ශක්තිය යොද ක්‍රියා කරන්ට ඕනෑ වේවි,'' යි කී ය.

''ඔබ මට උදවු කරනවාද, හියු?''

''මම උදව් කරන්නම්.''

''කරන්ට ඕනෑ මොනවාදැයි මට කියන්න. මම ඒක කරන්නම්.''

හේ නො කැමැත්තෙන් සිනාසුණි. ''මා දෙස්තර කෙනෙක් නො වේ, සේරා. මට කියන්න පුළුවන් හදිසි අවස්ථාවල දී අපේ කම්කරුවන්ට කරන දේ පමණයි. ඔහුට පුළුවන් තරමක් බොන ජාති දෙන්න. ඒවාට බරැන්ඩි බින්දුවක් හෝ දෙකක් මිශ්‍ර කරන්න. දෙස්තර එනතුරු අපට කළ හැකි දේ එච්චරයි.'' ඔහු හිස් වැස්ම ගෙන බරාඳය දෙසට ගියේ ය. ''මම ඩන්කන් දෙස්තර මහත්තයා එක්ක එන්න අසු පිටින් නුවරට යනවා. අපි වහා ම ඒ ස්ථානයෙන් පිට වුණොත් මධ්‍යම රාත්‍රි වෙන්ට ඉස්සෙල්ලා ආපසු එතහැකි. නුමුත් යම් විදියකින් ඔහු පිට ගිහින් හිටියොත් මම ඔහු හොයා ගන්ට ඕනෑ නිසා පමාවෙන්ට පුළුවනි.'' හේ නැවතත් ඇගේ අත අල්ලා ''අපට පුළුවන් හැම දෙයක් ම කරමු, හිතවතිය, ටොම් ශක්තිවන්තයි. කරුණු යෙදිලා තියෙන්නේ ඔහුගේ වාසියටයි,'' කී ය.

කෙළවරක් නැති සේ පැය ගණන් ගතවුණි. හියු දෙස්තර කැඳවා ගෙන ඊමට තව පැය බොහෝ ගණනක් ගතවන බව ඇ දැන සිටි නමුත් ඔහු එද්දැයි බැලීමට වරින්වර කවුළුව ළහට යෑමට මිස සේරා ටොම් ගේ සමීපයෙන් බැහැර නො ගියා ය.

වත්තේ සියලු වැඩ නැවතී තිබුණි. ගොන්සාලේස් හා බණ්ඩා දවස මුළුල්ලේ දෙර ළඟ සිටියහ. මෙයින් පිටත කම්කරුවෝත් ගම් වැසියෝත් එහා මෙහා ගියෝ ය. නැතහොත් ආරංචි සොයා ගැනීමේ බලාපොරොත්තුවෙන් නැවතී නිහඬ ව කණ්ඩායම් සැදී සිටියා හ.

වරක් කවුදෝ හෙමිහිට දෙරට තට්ටු කළෙන් සේරා එහි ගිය විට පරණ ගම මුලාදැනියා අවුත් ගෞරව පෙරදැරි ව සිටිනු දුටුවා ය. හේ කතා නො කර ම, බිත්තර ටිකක් ද තමාගේ ගස්වලින් කඩාගත් පැසුණු දෙඩම් ගෙඩි හා බෙලි ගෙඩි කිපයක් ද දමා එතූ සුදු ලේන්සුවක් ඇගේ පාමුල තැබී ය.

''මේවා උණට හොඳයි'' හේ මෘදු ලෙස කී ය. ''දෙඩම් හා බෙලිවලින් හාමුදුරුවන්ට සිසිල් බීමක් සාද දෙන හැටි බණ්ඩා දන්නවා.''

ඈ අත දිගු කොට ඔහුට ස්තුති කරන්ට සූදනම් වූ නමුත් ඔහු තමාට හුරු ලෙස දෝත් බැඳ ආචාර කොට හෙමිහිට පිටවී ගියේ ය.

ඩයනා කාමරයට ඇතුළු වන්නටත් පිට වන්නටත් වූයෙන් ඈ පිටු දැකීමට තරම් සේරාට හිතක් පහළ වුණේ නැත.

''තාත්තාට බොහොම අමාරු ද?'' ඔ වරක් ඇසුවා ය.

ඇගේ මවු හිස සැලුවා ය.

''අම්මේ මැක්සුයි මමයි දහ නොකර ඉන්නම්.'' ඈ පා හඬ නො නගා ම කාමරෙන් පිටවෙනවාත් සමග ම බල්ලා ද කනස්සලු සහිත ව ඇගේ පස්සෙන් ගියේ ය.

පැය ගණන් ගත විය. සේරා ටොම් ගේ ඇඳ ළහ ඉඳගෙන ඔහු අමාරුවෙන් හුස්ම හෙළන හඬටත් යන්තමින් ඇඳ ඇතිරිල්ල ඇහිලිවලින් සූරන හඬටත් කන් දුන්නා ය.

දවසක් දවසක් පාසා අවුරුද්දකට දවස් දෙසියයක් වැසි වැස්සේ ය. තවමත් වසිනවා යයි ඕ කල්පනා කළා ය. තෙතමනය සහිත සුළං රැල්ලක් කාමරයට වැදුණෙන් ඈ සළුවෙන් උරහිස් පොරවාගත් අතර ටොම්ට ද කම්බිලියක් පෙරෙව්වා ය. ඈ වාඩි වූ විට පුටුවේ ඇලෙන සුලු ගතිය ඇගේ අත්වලට නැවතත් දැනෙන්ට වී හදිසි පිලිකුළකින් නැගිට කවුළුව ළහට ගියේ කවුළු රාමුවට හිස තබා ගනු පිණිස ය. ඇගේ අත් මිට මෙලවෙන්ටත් දිග හැරෙන්ටත් වුණි.

''ලන්තානාවට දෙස් නැගිය යුතු ය,'' යි ඕ කල්පනා කළා ය. ටොම්ට යමක් සිද්දවුණොත් – ටොම් වත්තට ඕනෑ කරන සියල්ල ම දුන්නා. අනේ, දෙයියනේ, ටොම් ව ද ඊට ගොදුරු නො වේවා.........

මහ දිගේ එන අසුන් ගේ හඬ ඇසෙන විට එළිවෙන යාමයේ තුනට කිට්ටු ය.

වීඩාවට පත් ව, හොඳට ම තෙමී, ඩන්කන් දෙස්තර මහතාත් හියුත් ඈ ළහට වහා පැමිණියෝ ය.

''කෝම ද ඔහුට?'' යි දෙදෙන ම එකැවර ඇසූහ.

ඕ හිස සැලුවා ය.

දෙස්තර මහතා රෝගියා පරීක්ෂා කළ පසු ඔහු සේරා එළියට ගෙන ''ඔබ දන්නවා ද ඇත්ත වශයෙන් ම ඔබේ සැමියාට තියෙන්නේ නිව්මෝනියාව,''යි හෙමිහිට කී ය. ''අපි උග්‍ර අවස්ථාව එළඹෙන තුරු ඉන්ට ඕනෑ. ඒ අතර අපි ඔහුට හැම උදව්වක් ම දෙමු.''

ඕ හියු දෙසත්, තරබාරු දෙස්තර දෙසත්, බැගෑපත් ව බැලුවා ය. "ඔබ දෙදෙනා ම ඉන්නවා නේ?"

තවත් දවාලක් හා රාත්‍රියක් ගත විය. ටොම් සිහි නැතිව නන් දෙඩන්ට විය.

"ඔහුගේ හිතේ මොනවා නමුත් තියෙනවා," යි දෙස්තර කී ය. "මා බලා පොරොත්තු වූ අන්දමට ඔහු රෝගය මැඩලීමට උත්සාහ කරන්නේ නෑ. ඔහුට තියෙන කරදරය මොකක්දැයි අපට දැනගන්ට හැකිනම්—"යි කියමින් රෝගියා ළඟට පාත්වෙනවාත් සමගම ටොම් දඟලමින් මොනවාදෝ මිමුණුවේ ය.

"ලියුමක් ගැන මොකද්ද," යි ඇස් නෙරවමින් හේ කී ය. "ඔහුගේ හිත කරදර කරන තරම් විශේෂ වූ වැදගත් ලියුමක් ගැන ඔබ දන්නවා ද?"

"මා දන්නා හැටියට නම් එහෙම ලියුමක් නෑ."

"ඔබ ඕවර්සියර්ගෙන් ඇසිය යුතුයයි මම යෝජනා කරනවා. ඔහුට මීට උදව්වෙන්ට බැරිනම් මම යෝජනා කරන්නේ ඔබේ සැමියාගේ ඇඳුම් සෝදිසි කරන්ටයි. අපි වෑයම් කරලා ඔහුට උදව්වෙන්ට ඕනෑ."

මෙතරම් වැදගත් ලියුමක් ගැන ගොන්සාලේස් කිසිවක් නො දැන සිටි බැවින් ටොම් එදා අධික ලෙස තෙමුණු දවසේ ඇඳ සිටි ඇඳුම් සේරා පරීක්ෂා කර බැලුවේ ශෝකාකුල සිතකිනි. වහාම වත්ත මිලයට ගැනීමට සතුටු බැව් දන්වා කෙනකු විසින් ලියන ලද තවමත් තෙත සහිත ව පොඩි වී තිබුණු ලියුමක් ඈට සම්බ විය. ඒ ලියුම මෙසේයි: "වහාම මෙය මිලයට ගැනීමට මම නො ඉවසිල්ලෙන් සිටිමි. තවත් වත්තක් මට විකිණීමට අදහස් කර තිබෙන බැවින් හැකි තරම් ඉක්මනින් ඔබෙන් පිළිතුරු ලැබීමට කැමැති ය. මේ මාසේ 15 වෙනි ද වන විට ඔබෙන් පිළිතුරක් නො ලැබුණොත් ඔබ අදහස වෙනස් කරගන්ට ඇතැයි සිතන්නෙමි."

දෙස්තර මහතා සේරා දෙස පුදුම පත් ව බැලී ය. ඇගෙත් මුහුණ සුදුමැලි ව ගියෙන් ඈට කෙළින් සිටගන්ට පවා නුහුණු කල්හි පුටුවක පිටිපස අල්ලා ගත්තා ය.

උගුර කට වියළුණු ඕ හිස සැලුවා ය.

"මෙන්න මේකෙන් උගුරක් බොන්න." මෙසේ කියමින් වතුර මිශ්‍ර කළ බ්‍රැන්ඩි ස්වල්පයක් ඇගේ කට ළඟට කෙළේ ය.

ඇගේ මුහුණේ මලානික ගතිය නැති වී ගියෙන් බිත්තියේ දින දර්ශනය දෙස ඕ බැලුවා ය. එද 13 වෙනිදා ය. ඈ වහා ම පිළිතුරක් යැව්වොත් වත්ත විකිණීමට තවමත් යන්තම් කාලය තිබේ. ලන්තානාව විකිණීමට තීරණය කරගැනීම සඳහා ටොම්ට හොඳ හේතු යුක්ති තිබෙන්ට ඇත. ඔහුගේ බිරිඳ වශයෙන් ඔහුගේ අදහස අනුව ක්‍රියා කිරීම ඇගේ යුතුකමකි.

ඔහුගේ අදහස්.........

ඇගේ හිස කෙළින් වුණි. උරහිස් පළල් විය.

''ඔබ කරන්ට යන්නේ මොනවා ද නෙවිල් නෝනා,''යි දෙස්තර මහතා විස්මය පත් ව විචාළේ ය.

සේරා පිළිතුරක් නුදුන්නා ය. ඕ ටොම් ළහට නැමී ඇගේ දෑතින් ම ඔහුගේ අතක් අල්ලා ගත්තා ය.

''ටොම්''යි ඕ පැහැදිලි ව කීවා ය. ''මා කියන දේ ඔබට ඇහෙනවා ද, පෙම්වත ?''

ඔහු හෙමිහිට ඇස් ඇර බැලුවේ දීර්ඝ කාලයකට පසු ව යි.

''ටොම්, මගේ පෙම්වත, මා කියන දේ අහන්න......වත්ත මිලයට ගන්නා කථාව ඔක්කොම මම දන්නවා.''

ඔහු කථා කරන්ට වෑයම් කරත් ම ඇ එක් අතකින් ඔහුගේ දෙතොල් වැසී ය.

''තවම කතා කරන්ට වෑයම් කරන්ට එපා, ටොම්, පෙම්වත, ඔබට ඕනෑ දෙයක් මම කරන්නම්. ඔබ කැමති නම් ඒ යෝජනාව පිළිගන්නා බව දන්වා ලියුමක් ලියන්ට තව ම කල් තියෙනවා.''

''ඔබට — ඕනෑ — මොනවා ද?''

ඕ ඔහු වෙත දණගසා හිඳගත්තා ය. ''අන්තිම වෙන තුරු ඉන්ට,'' යි ඕ මිමුනුවා ය. ''තව ම නො විකුණා ඉන්ට, ටොම්. පෙම්වත අපට ජය ලැබෙනවාට සැක නෑ. මම ඒ බව දන්නවා.''

ඔහු දෙස බලා සිටි හියුට දැනුණේ ටොම් ඇතුළත ආලෝකයක් පැතුරුණු බවයි.

''.......මට– විකුණන්ට – ඕනෑ – වුණේ නෑ. ඩයනා– ඔබ නිසා පමණ යි.''

''අපි වත්ත නො විකුණන බව මම මේ පර්ගියුසන් කියන මිනිහාට ලියා යවන්නම්''යි සේරා ආඩම්බරයෙන් පැවසුවා ය.

ටොම් ගේ දෙතොලින් පළ වූයේ සිනා රැල්ලක සේයාවකි. ''හැබෑට ම සන්තෝසයි........''

දෙස්තර මහතා සේරා ගේ උරහිසට අත තැබී ය. ''නෙවිල් නෝනා, දැන් ඔහු නිදගත්තාවෙ. දැන් ඉතා ම බරපතළ තත්ත්වය මඟ හැරුණා යයි මම හිතනවා.''

ඔවුන් පිටු පසින් හියු නෙවිල් හෙමිහිට කාමරයෙන් පිට වී ගියේ ය.

4

සේරා කවදවත් බලාපොරොත්තු නුවූ තරම් දක්ෂ භාවයක් හියු සති තුනක් පමණ කාලයක් මුළුල්ලේ දක්වී ය. ඔහුගේ පරිපාලනය යටතේ ලන්තානාව නිරායාසයෙන් දියුණු වුණි. දැන් කොළඹට යවා ඇති කෝපි පවා අප්‍රමාද ව පිටත් කර හැරීමට හැකි වූයේ ඔහු නිසා ය.

ටොම් ගේ සැප සනීප බලන්ට හෝ දවසේ සිදුවීම් වාර්තා කරන්ට හෝ එන විටක මිස සේරා ඔහු දුටුවේ කලාතුරකිනි. එබැවින් ඔහු ඇ මගහැර සිටින්නේ ඕනෑ කමින් ම දෝ හෝයි කල්පනා කරන්ට පටන් ගත්තා ය. කොයි විටක හෝ කෑමට ආරාධනා කළත් ඔහු අරලිය වත්තට ආපසු යන්ට ඕනෑ, ඉක්මනින් කළ යුතු වැඩක් තියෙනවා, නැත්නම් මම දැන් කාලයි ඉන්නේ ආදී මොනවා හරි කියා මග හැරියේ ය.

ඔහුගේ පරණ නො සැලකිලිමත් ගතිය නැවතත් ඉදිරිපත් වී ඇත. ටොම් යළිත් සුවපත් වෙගෙන එන විට ඔහු හැම දෙයක් ම සැහැල්ලු කොට තැකී ය. සේරාට ද පරණ පුරුදු ලෙස අවඥ සහගත ව ක්‍රියා කළේ ය.

ඔවුන් කෙළෙහි ගුණ දක්වීමට උත්සාහ කළ නමුත් හියු එය ද නො කළ හැකි තත්ත්වයකට පැමිණ වී ය. ''මගේ ප්‍රිය යාළුවා, මම කාටත් කරන්නේ ඔය ටිකයි. ඒ ගැන මොකුත් හිතන්න එපා.''

''හියු, මොකද ඔය තරම්— ගණන් ?''

''මම ?''යි කියමින් විචාරාත්මක ලෙස හේ ඇස් බැම කැරකී ය. ''මගේ ප්‍රිය සේරා, ඇත්ත වශයෙන්ම මම තමයි මේ ලෝකයේ ඉතා ම වාම් පුද්ගලයා.''

''වාම්! එක මොහොතක දී ඉතා ම කම්මැලියකුගේ සොබාව ඔබ හඟවනවා, අනික් මොහොතේ දී බරපතළ වැඩ කිරීමේ ශක්තියක් ඔබ පෙන්වනවා,''යි ටොම් කී ය.

''මායාවක් පමණයි, මම සහතික වශයෙන් ඔබට කියනවා. මගේ නියම රාජකාරිය කම්මැලි කමයි. වැඩ කිරීම මට විශ්වාස කරන්ට බැරි තරම් හිරිහැරයක්. ටොම්, මට මේ අවස්ථාවේ දී මතක් වෙන්නේ, සඳුද හිටන් ගොන්සාලේස් ගේ අත් අඩංගුවට ඔබ පත් කරන්ට සිද්ද වෙන බවයි. අපට වගකීම් — තියෙනවා.''

සුව වීගෙන එන ලෙඩකුගේ ස්වාභාවික වූ නො රිස්සුම් ගතියෙන්, ටොම් හඬ නගා මෙසේ කී ය. ''හියු, ඔබ කොච්චර පල්හැලි දෙඩවනවා ද? මා අසනීපෙන් සිටි කාලේ දී ඔබ් කළා වගේ ඔබට සාමාන්‍ය භාසාවෙන් කතා

කරන්ට බැරි මොන යකා නිසා ද? ඔබේ නියම රාජකාරිය කම්මැලිකම! මේ දිස්ත්‍රික්කෙ බොහොම වැවිලිකාරයන්ට වඩා හොඳින් ඔබට වැඩ කරන්ට පුළුවන්. ඔබේ ඉඩමත් සමග ම මේ ස්ථානය ඔබ පාලනය කළ හැටි බලන්න. ඔබ කතා කරන දෙයින් බාගයක් තරම් කතා කරන්නේ පුරා ජේරුවට.'' ඔහු ලාමක ලෙස කතාව නැවැත් විය. ''කනගාටුයි, මම හිස තුවාල වූ වලසකු වගේ.''

''ඔබටත් මනුස්ස ගතියක් ඇතුව ඉන්ට පුළුවන් බව මට දැන ගැනීම හොඳ දෙයක්.'' පාදඩ ගොළුවකු ගේ මෙන් හියු ගේ විරිත්තිල්ල නිසා ඔහුගේ වචන වල විෂ අඩුවුණි. ''ඇත්තට ම ටික කලකට මා ඔබට හමු නො වෙනවා ඇත. පැරඬේලා ඔවුන්ගේ වත්ත වන ග්ලැන් ලෝරියේ පදිංචියට එනවා. වැවිල්ල ගැන පුරුද්දක් ඇති වන තුරු එඩ්වින්ට උදව්වෙන්ට මම පොරොන්දු වුණා.''

''එඩ්වින් වතු වවන්ට යනවා?''යි විශ්වාස නො කරන ලීලාවකින් ටොම් ඇසී ය.

''ඔබට හොඳට ප්‍රශ්න කරන්ට පුළුවන්. එසේ වුණත් ඒක අපේ වැඩක් නො වෙයි. ඔහු අසනීප ව හිටියා. ඒ ගොල්ලන් ගේ කල්පනාව උඩරට වාතය—'' ඔහු කතාව නැවැත් විය. ''මේ දවස්වල මම හරියට දේව දූත යෙක් වගේ. එහෙම නේ ද?''

ටොම් ඔහුගේ කොට්ටවල වැතිරී සුසුමක් හෙළී ය. ඔහුගේ අවුල් වූ හිසකෙස් හා කර ඇරපු ප්ලැනල් කමිසයත් ඔහුගේ දුර්වලතාව විදහා පෙන් වූ අතර මේ මස්සිනා වරුන් දෙදෙන අතර සමාන කම ද තදින් එළිදරව් වුණි. ''ඔබ ආපසු ආ විට අපි හම්බවෙමු?''

''ඒක කවද්ද වේ දැයි දන්නේ දෙය්යෝ විතර යි. ළඟ දී මාස කීපයකට ඉන්දියාවට යන්ටත් අදහසක් මට තියෙනවා. පුළුවන් වුණොත් එහි දී කොටි දඩයමකුත් කිරීමටයි මගේ බලාපොරොත්තුව.''

''දැන් ඔබ ස්ථිර ලෙස:පදිංචි විය යුතු කාලය,''යි ටොම් කී ය. ''ඔබ එංගලන්තෙන් ආවේ මේ ජනවාරි මාසේ නේද?''

''ඉතින් මේ ජූලයි. ඔබ දන්නවා ඇති එක තැනක වැඩි කල් ඉන්න කොට මට එතන එපා වෙනවා.''

අතික්‍රාන්ත වර්ණනාවන් කෙරේ තමා මෙන් ම තම මස්සිනා ද දක්වන නො මනාපය සැලකූ ටොම් ''ඔබේ උදව් මට මතක නැති වෙන්නේ නෑ,'' කියා නැවතුණි. ''සමහර විට, මම තද ගති ඇති මස්සිනා කෙනෙක් හැටියට හැසිරෙන බව මම දන්නවා. ඔබත් මමත් එකඟ නො වන බොහෝ කාරණාත් තිබෙනවා– නමුත් මොන ඉලව්වක්ද, මා කියන්ට යන්නේ මොකක් දැයි ඔබ දන්නවා.''

හියු යන්තමින් මොනවාදෝ කියා කවුළුව වෙතට ගිය විට ටොම් ඔහු දෙස බලමින් සිටියේ ඇස් බැම් රැළි ගැසුණු රැවුමකිනි.

හියු ගේ ස්වාභාවික තත්ත්වය, ඔහු සේරාට ආචාර කරද්දී මොහොතකට පළ විය. ඔවුන්ගේ නිහඬ බවට නිගාදුන් ගස්වල අතු පතරින් නිකුත්වුණු මුදු හඬ මුසුවූ සැන්දෑ සමයේ ඔව්හු හුදකලා ව සිටියාහ. සේරා දුබල ලීලාවකින් බිම තුබූ මලක් අහුලා එහි පෙති කඩා තණ පිට්ටනියට වීසි කළා ය.

‘‘ඔබ ඇනුම් පද නො කියතැයි මට දැනුණා නම්, ඔබට ස්තුති කරන්ටයි මා හිටියේ.’’

‘‘ඇනුම්පද දුබලයන් ගේ පිළිසරණ ය, ඔබ එය දැන සිටියේ නැද්ද?’’

සුළං හමන්ට වූයෙන් ඕ වෙවුලුවා ය.

‘‘මට ඔබ තේරෙන්නේ නැ’’යි ඕ සානුකම්පික ව කීවා ය. ‘‘අපි මිත්‍ර වෙන්ට මා කැමතියි, නුමුත්–’’

‘‘නුමුත් ඔබ ඒකට ලැස්ති නැතුවා වෙන්ට ඇති. සමහර විට අප දෙදෙනාට ම එය නො හැකිවා වෙන්ට පුළුවනි.’’

ඔහුගේ මුහුණ අඳුරේ දී බැබළුණි. ස්වරය බාගෙට බිඳුණු ළමයකු ගේ වැනි ඔහුගේ කට හඬේ ඉඳ හිටලා පැවැති රළු ගතිය වෙන කිසි හඬකට වඩා ඈ කැළඹීමට පත් කළේ ය.

‘‘ඔබ තව ම රූප අඳිනවා ද?’’යි ඕ හදිසියෙන් ම ඇසුවා ය.

‘‘මම එක පින්තූරයක් ඇඳලා ඉවරකළා විතරයි. කවදා හරි මම පෙන්නන් නම් කො.’’

‘‘තවත් පිළිහුඩුවෙක් ද?’’

‘‘ඔබයි, සේරා.’’

ඈ හුස්ම හෙළා නිශ්චලවුණු හැටි ඔහුට දැනුණි. ඊට පසු ඉකි බිඳිනු වැනි හඬකින් ඕ සිනාසුණා ය. ඇගේ ඇඟිලි තුඩින් තවත් මලක පෙති කැඩුණි.

‘‘මම නිතර නිතර එන්නේ නැ, සේරා’’

‘‘ඇයි? ඇයි?’’ කියා ඈ ඇසුවේ ඇගේ මුවින් ගිලිහෙන වදන් නවතාගත නො හැකිව ය.

''සමහර විට මම ඉතා අමාරු දේවල් සමග සටන් කිරීමට ඉතා ම කම්මැලි නිසා වෙන්ට පුළුවනි. ඔබ දැන් දන්නවා ඇති, මම නිතර ම ලේසි පාරේ ගමන් කරන බව. මා මොනවා කළත් මා ගැන වැඩිය නරකට හිතන්ට එපා. මිනිහකු ගේ ගතිගුණ ගැන ඔහුට කළ හැකි දෙයක් නැති බව නිතරම මතක තියා ගන්න.''

ඔහු ලහි ලහියේ එතැනින් නික්ම ගියේ ය. ඔහුගේ පියවර හඬ ඇත ඇසුණි.

5

මේ දැන් ලැබුණු ලියුම ගැන සේරා සිත මෙහෙය වූවා ය. ''පැරඩේලා ඔවුන්ගේ වත්තට ඇවිල්ලා මාස දෙකකට කිට්ටු වුණ බව මම දැන හිටියේ නෑ. ටොම්, එඩ්වින් ගේ කොළඹ වැඩපළ පාලනය කරන්නේ ලැන්සිං මහත්තයා බව ඔබ දැන හිටියා ද?''

ටොම් ඔහුගේ බිල්පත් හා චක්‍රලෙඛන දෙස රවා බලන්ට විය. ''මම හිතනවා පසුගියද වතුකාර සංගමයේ රැස්වීමේ දී මයික් ඔපැරල් මේ ගැන සඳහන් කළාය කියා. ඔහු නිතර ම කියන ඕපා දූප නිසා එවේලාවේ දී මම වැඩිය ඇහුන් කන් දුන්නේ නෑ.''

සේරා නැවතත් මැක්ලොයිඩ් නෝනා ගේ ලියුම ගැන සිත යෙදුවා ය.

''මම ඔබට දීර්ඝ කාලයක සිට ලියුමක් ලියන්ට අදහස් කළ නමුත් මගේ සන්දිපත් ඉදිමීම නිසා පෑනක් අල්ලන්ට නො හැකි ව සිටියෙමි. පැරඩේලා ඔවුන්ගේ ''ග්ලැන්ලෝරි'' වත්තට යන ගමන් මෙහි පැමිණියා''යි මැක් ලොයිඩ් නෝනා ලීවා ය. ''——සමහර විට ඔබ දන්නා පරිදි තොටුපළින් ටිකක් එහා පිහිටි ඒ ස්ථානයට මෙහි සිට ඇත්තේ සැතැප්ම කීපයකි. එඩ්වින් පැරඩේ ගේ පෙනුම ගැන මට පුදුම හිතුණා. ඔහු හොඳට ම දිරලා. එපමණක් නො වෙයි. ඔබ දන්නවා ඇති ඔහු අතිශයින් ම ශාන්ත මිනිසකු බව. ඔහු සැලකිලි දැක් වූයේ කරුණු දෙකකටයි. ඔහුගේ බිරිඳටත් වෙළඳ ව්‍යාපාර යටත් පමණයි. එකකින් වෙන්වීමත් රෝගාතුර වීම නිසා වැඩ කරන්ට බැරි වීමත් නිසා, තහ් ඇලිසන් කෙරෙහි, අනුකම්පා සහගත තත්ත්වයේ බලාපොරොත්තු ඇතුව සිටී. ඔහුගේ තත්ත්වය බොහො ම බැරෑරුම්. කරදරය ශාරීරික මෙන් ම මානසික ද විය හැකි. වත්තේ කිසියම් වැඩක හෝ සිත් ගන්නා සුලු දෙයක නිරත වීමට මග සැලසුණොත් මිස ඔහු ගැන මගේ ලොකු බයක් තියෙනවා. දුප්පත් එඩ්වින් නිසාවත් ඔබට පුළුවන් නම් ඔවුන් සම්බවෙන්ට යන මෙන් මම උදක් ම ඉල්ලා සිටිමි. මා ඔහු කෙරෙහි නිතර ම ඉතා ළැදි කමකින් සිටි බව ඔබ දන්නවා ඇත.''

සේරා මේ ලියුම ටොම් ට දුන්නෙන් ඔහු එය කියවා කිසි අදහසක් ප්‍රකාශ නො කොට ආපසු දුනි.

''මම හිතනවා අපි ඉක්මනින් එහි යන්ට ඕනෑය කියා, එහෙම නේද?''යි සේරා කී විට ටොම් නො පැහැදිලි මොකක්දෝ උත්තරයක් දුන්නේ ය.

''කනගාටුයි ටොම්, මට අපේ ණය අමතක වුණා.''

''කමක් නැ සේරා, මම ඔහුත් එක්ක කතා කරන්ට කැමතියි.''

මේ අනුව ඔවුන් එන බව කියා දවසක් ඇලිසන්ට කල් තබා ම පණිවුඩයක් යවන ලදී.

නෙවිල්ලා මහත් ප්‍රීතියෙන් අසු නැග ගියෝ ය. ඩයනා සෝමා ළඟ තබා සේරා සිය සැමියාත් සමග කවර නමුත් දූර ගමනක යෙදෙන්නේ කලාතුරකිනි.

''ග්ලැන් ලෝරි'' වත්තට යෑමට ලංකාවේ විශාල ම ගංගාව වූ මහවැලි ගඟින් එතෙර විය යුතුයි. නෙවිල්ලා අඟුල ළඟට කිට්ටුවන විට කරත්ත පේළි සැදී පාර දිගේ එනු ඔවුහු දුටුවෝ ය. ගංතෙර වැල්ලේ තවත් කරත්ත බොහොමයක් ලිහා තිබුණේ ය.

මෙය සුප්‍රසිද්ධ රැස්වීම් පොළකි. අතරමං වූ කරත්ත පිළිබඳ ව ද පුස්සැල්ලා දිස්ත්‍රික්කය හෝ ඊටත් ඔබබෙහි මූදු මටටමේ සිට අඩි 6000 ක් පමණ උස් වූ නුවරඑළියේ ප්‍රාන්තයේ වතු සම්බන්ධ ව ද අලුත් ම ආරංචි, මෙහි දී ලබා ගත හැකි විය.

මේ අවස්ථාවේ දී වාසනාවකට මෙන් අඟුල මෙතෙර තිබුණේ ය. එය එතෙර තිබුණේ නම් මෙතෙරට ගැනීමට බොහෝ වේලා ගත වීමෙන් ප්‍රමාද වන්නට තිබිණි. කරත්තකාරයන්, පළමුව අශ්වාරෝහකයන්ට අඟුලට නගින්ට ඉඩ දෙන ලදින් සේරා හා ටොම් ද අසුන්ට කෑම ගෙන කල් ඇතුව එහි ඇවිත් සිටි කුදිර කාරයා ද සෙලවෙන අඟුලට නැංගාහ.

සැඩ පහර හරහා ඔරුකාරයන් රිටිවලින් අඟුල දියත් කරත් ම අශ්වයෝ බියෙන් හේෂාරව කළෝ ය. ටොම් සේරාට කෙළින් සිටීමට උදව් විය. අඟුලේ ආරක්ෂාව සදහා වැටක් තිබුණේ නැත. එහෙත් සේරා එක් අතක් අසුගේ කරට තබා ගෙන හිස ඔසවා නෙත් අයා බලමින් මේ අලුත් ගමන් ක්‍රමයේ හැම මොහොතක ම විනෝදස්වාදය ලැබුවා ය. ගඟමැද බියකරු සුළි වලට අඟුල අසු වී ඔරුකාරයන් ගේ කුඩා හබල් සැඩ පහරට ඔරොත්තු නො දෙන්නා සේ පෙනුණු විට සේරා ටොම් දෙසට හැරී සිනහ වී, සුළඟින් ලෙළෙන අක්බඹුරු හිසකෙස් සකස් කරමින්, විනෝද වූවා ය.

''ටොම්, මේක හරි සෙල්ලමක්!''

වැනෙන අහුල මත නො සෙල්වී සිටීමට තරම් ශක්තිමත් ශරීරයක් ඇති ටොම් ගේ සිතේ කලබලය ද මේ වචනවලින් මහ හැරුණේ ය. එගොඩට ළං වන විට ඔරු කාරයෝ අහුල ගොඩ බසින තැන ඉක්ම වා යෑම හෝ වනගත ගංතෙර ගල්පරයේ වැදීම හෝ වැළැක්වීමට නිසි වේලාවට හබල් ඇන අහුල නැවැත් වූහ.

''ග්ලැන්ලෝරි'' වත්තට තව ඇත්තේ හැතැප්මක් පමණකි. එහෙත් නෙවිල්ලා උදේ එළිවෙන්ට පෙර මේ ගමනට පිටත් වුව ද තොටුපොළේ ප්‍රමාද වීම නිසා වත්තට හැරෙන තැනට ළඟාවන විට මධ්‍යාහ්නය විය.

මේ සෘතුවේ කාල ගුණය යහපත් වූ නිසා ඔව්හු සඳ එළියේ අසුන් පිට නැඟ පෙරළා ඒමට සූදානම් ව සිටියා හ. ''ඩයනාත් සෝමාත් ඉතා ම හොඳින් ආරක්ෂා සහිත ව සිටියත් ආපසු යෑමට මම සතුටුයි. ඒ එක්ක ම සඳ එළියේ අසුන් පිට යෑමත් හරි ප්‍රීතිදායකයි, ටොම්''යි සේරා කීවා ය.

වත්ත හරහා වැටී තුබූ වක් වූ මහ ඔස්සේ ඔව්හු නිශ්ශබ්ද ව අසුන් නැඟී ගිය හ. පාර අද්දරට ම වැවී තුබූ කෝපි ගස්වලින් එහි අඳුරු ස්වභාවයක් පෙනුණි. මේ ගස් හොඳින් වැඩී තුබූ නමුත් ඒවා නො සලකා හැරීමේ ලකුණු ද ටොම් විසින් දක්නා ලදී. ඒ හැර වැවිල්ලේ පිහිටීම ඔහුට සහජයෙන් ම අප්‍රිය වූ පරිද්දෙන් පැවැත්තේ ය. මේ ස්ථානය ගල් ගොඩලිවලින් ගහණ ව කඳුවලින් වැසී පමණට වඩා තෙත් ව, පමණට වඩා නිශ්ශබ්ද ව පැවතිණ. අහසේ පියාඹා යන උකුසු යුවළක ගේ හීන් හඬ මිස, මේ අසලක ජීවමාන ලක්ෂණයක් නො වී ය.

කඳු අතර නැම්මකින් හැරුණු විට ඔවුන්ට දක්නට ලැබුණේ පසෙකින් ගල් දමා තැනූ සක්මනකින් යුතු දෙමහල් මැඳුරකි.

එංගලන්තයේ රදළවරුන් ගේ මැඳුරුවලට සමාන ව තනා ඇති මෙය කෝපි ගැවසුණු කඳුකරය නිසා පාළු ගෙයක් සේ අඳුරු බවක් දැක් වී.

''අඳුරු''යි සේරා සුසුමක් හෙළුවා ය. ''නියම දුම් කවුළු– පිත්තල වැද්ද වූ දෙරක් — ලෝහමය කවුළු. මේ උපකරණවලින් බාගයක් එඩ්වින් පිට රටින් ගෙන්වා වගේ.''

''නුමුත් දුම් කවුළුවලින් දුම් නොනගී,''යි ටොම් කොඳුළේ ය. ඒ ගොල්ලන් ගෙදර නැතුවා වගේ.''

සිය කළකිරීම සහවාගත නුහුණු සේරා, ටොම් අසු පිටින් බැස, නො පෙනෙන සීනුවක යකඩ මිටක් අදිනු දුටුවා ය. එය ඇත නද දෙනු ඇට ඇසුණු නමුදු දෙර ඇරීමට මෙහෙකාරයෙක් වහා නො පැමිණියේ ය. ඇතුළතින් කටහඬකුදු තව ම නැත.

''මහා පුදුමයක්,''යි මුමුනමින් හේ එය නැවතත් ඇද්දේ ය.

ගෙයි පසෙක දොරටුවකින් සුදු රෙද්දක් හා කබායක් ඇඳ හිස තලප්පාවක් බැඳ සිටි පරණ තාලේ මිනිහෙක් හෙමිහිට පැමිණියේ ය.

''උඹ ද මෙතන අප්පු,''යි ටොම් කොටින් ඇසී ය.

''ඔව්, සර්.''

''ගෙදර කවුරුත් නැද්ද?''

අවිනිශ්චිත බැල්මක් හෙළන මේ මිනිහා මොවුන්ට ඇතුළු වීමට දොර අරින අතර ඔහු නැසෙන තරමට මොනවාදෝ කොඳුලේ ය.

අඳුරු දෙසකට විහිදෙන සේ, ලීවලින් තැනූ බිමෙන් යුත්, දික් සාලයේ මදතැන් ගිය විට, විසිතුරු කැටයමින් හෙබි අත්වැලක් සහිතව බුරුත ලීයෙන් සැදුණු පියගැට පෙළකි. ඔප දමා නන් කැටයමින් විසිතුරු වූ ලී බඩු ද අලංකාර වූ විසිත්ත කාමරය ද මැලවුණු මලින් සැදී ගත් මේසයක් ඇති කැම කාමරය ද පසු කොට ඔව්හු ඒ මහලු මිනිසා පසු පස්සේ ගොස් පියගැට පෙළ නැග උඩුමහලට සැපත් වූහ. මෙහි ද සියල්ල නිශ්ශබ්ද විය. හැම දෙරක් ම වසා තුබුණි. දූලි පිරී තෙතමනින් යුත් වූ මේ ස්ථානයේ පුස් බැඳී පැවැත්තේ ය.

සේරා ටොම් දෙස නෙතගින් බැලුවා ය. ගෙදර කවුරු හෝ සිටිද්ද නැද්ද? එසේ නැත් නම්, මෙය මේ මහලු අප්පු වැව්ලිකාරයන් ගේ චාරිත්‍ර ධර්මවලට ගැළපෙන පරිද්දෙන් ඔහුගේ ස්වාමියා නැති අතර ඔවුන්ට රස කැවිලි පෙවිලි ආදියෙන් සංග්‍රහ කිරීමට පෙර මුහුණ කට සෝද ලක ලැස්ති වීමට නිකම් කැඳවා ගෙන යෑමක් ද?

ඇගේ දෙතොලින් ''ඇලිසන්'' යන ශබ්දය නිකුත්විණ. ටොම් හිස වනා ''දෙය්යෝ දනී''යි පිළිවදන් දුනි.

මහලු මිනිසා දෙරක් ඉදිරියේ සිටගෙන නෙවිල්ලා දෙස බැලී ය. නැවතත් ඔවුන්ට නො තේරෙන වචන වගයක් ඔවුන්ට කොඳුරා කීවෙන් ඊට පිළිතුරු වශයෙන් ඔවුන් වචනයක් වත් කතා කරන්ට පෙර ඔහු සක්මන දිගේ ලහි ලහියේ ගමන් කොට නො පෙනී ගියේ ය.

ටොම් හෙමිහිට දෙරට තට්ටු කළේ ය. පිළිතුරක් නැත. ඔහු තදින් තට්ටු කළ විට හොදින් අගුලු ලා නො තුබූ දොර ඇරී නිදන කාමරයක් පෙනුණි.

එහි එඩ්වින් පැරඩේ බිම වැතිරී සිටියේ ය. ඇස් ගිලී තිබුණි. හම ඇකිළී මුළු සිරුර ම භයානක නිල් පැහැයෙන් යුතු විය.

ටොම් සේරාට ඒ නො පෙනෙන්නට හරස් ව, වහා ඇ දෙසට හැරී ''මා එනකන් පහළ ඉන්නැ,''යි කී ය.

ඔහු ඒ ප්‍රකාශ කළ විලාසයෙන් ඊට පටහැනි වන්ට ඉඩක් නො තිබුණි.

මහලු අප්පු කෑම කන කාමරයේ මේසය නො සැලකිලිමත් ව රෙදි කැබැල්ලක් ගසමින් දූලි පිසදමනු ඕ දුටුවා ය. පර වූ රෝසමල් පෙති බිම වැටුණෙන් ඔහු ඒවා එසේ ම තිබෙන්ට හැර කම්මැලිකමින් බර ව පුටු හා සයිඩ් බෝඩ අල්මාරිය වෙත ගියේ ය.

''කෝ නෝනා,''යි ඕ ඔහුගෙන් විචාළා ය.

''නෝනා ගිහින් දැන් සුමානයක් වෙනවා. ඒ ගියදට පස්සෙන්ද හිටන් මහත්තයා ලෙඩින්.''

''ගියා, ගියේ කොහාට ද?'' එඩ්වින් ගැන ඇට තව ම දන්වා නැත්නම් වහා ම ඔහු ගැන කියා පණිවුඩයක් යැවීමට අවශ්‍ය විය.

''හියු නෙවිල් මහත්තයා නෝනා එක්ක ගියා. කොහේ ගියාදැයි කියන්ට දන්නේ නෑ. නෙවිල් මහත්තයා අරලිය වත්තේ නැතෙයි කියා කම්කරුවෝ කියනවා. ඔහු ගිහිල්ලා.''

හියු ඇලිසන් කැටුව ගිහින්? ක්ලාන්ත වූවාක් මෙන් දැනෙන්ට වී සේරා මේසය අල්ලා ගත්තා ය.

ශාන්ත භාවය පෙන්වීමට යත්න දරමින් ''අනිත් වැඩ කාරයෝ? ඒ ගොල්ලෝ කොහේ ද?''යි ඇසුවා ය.

''මහත්තයා පණ අදිනවා කියාල හිතලා ඒ ගොල්ලො පැනලා ගිහින්. මම හුඟක් නාකියි. ඒ වුණත් මෙහෙම ලෙඩට මම බයත් නෑ!''

''අපේ කුලීකාරයා රෙන්ගන්, ඊයේ මහත්තයාට ලියුමක් අරන් ආවේ නැද්ද?''

අප්පු මදක් කල්පනා කොට මෙසේ පැවසී ය. ''රෙන්ගන්, හ හා අර කඩකාරයා කියාපු මිනිහා වෙන්ට ඇති. මෙහි නරක ලෙඩ තියෙන බව දැන ගත්තා ම පැනලා ගිහිල්ලා. ඔහු කිසි ම ලියුමක් දීලා නැහැ. ඔහු එන්නේ කඩේට විතරයි. ගෙදර කිට්ටුවට වත් එන්නේ නෑ.''

සිහිනයකින් මෙන් මහලු මිනිසා කාමරේ ඇවිදිමින් මෙතන පුටුවක ද අතන මේසයක ද රෙදි කැබැල්ලක් ගසමින් දූලි පිස දැමී ය. දීර්ඝ ගමනින් හා උෂ්ණයෙන් පිපාසාවක් හට ගත් සේරාට විඩාව ද දැනුණි. කම්පා වීම නිසා ඕ ක්ලාන්ත ද වූවා ය.

ඕ වතුර වීදුරුවක් ඉල්ලුවා ය. දිලිසෙන රිදී බන්දේසියක වීදුරු හා වතුර ජෝගුවක් ද තබාගෙන හේ පැමිණියේ ය.

ඈ බඩ පුරා ම බී හිස් වීදුරුව අතින් ගෙන සිටින විට ටොම් පැමිණ එය දැක වහා වීදුරුව උදුරාගෙන විස්මයාකූල ව මෙසේ කී ය.

''සේරා, ඔබ මොනව ද කළේ? එඩ්වින් පැරඩේට කොලරාව!''

6

සේරා ගේ මුහුණෙහිය ස්වාභාවික වර්ණය පළමුවෙන් මතු වූයේ.

''ඔබ හොඳට ම දන්නවා ද?'' යි ඕ සෘජු ව විචාළා ය.

''හොඳට ම දන්නවා. ඔහු බරපතළ අන්දමට ම ලෙඩින්.''

''දුප්පත් එඩ්වින්! අනේ ටොම්, අපට පුළුවන් හැම දෙයක් ම ඔහුට කරන්ට ඕනෑ.''

ටොම් හිස සැලී ය. ''මම ඔහු ළඟ ඉන්නම්. ඔබ වහා ම පිටවෙන්න ඕනෑ. හැතැප්ම පහක් හෝ හයක් දුර ඇති මැක්ලොයිඩ් නෝනා ගේ ගෙදරට අශ්ව පිටින් යන්න. එහි ගොස් විවේක ගන්න. ඔබ ආරක්ෂා වීමට කළ යුතු දේවල් දැනගෙන ලන්තානාවට ආපසු යන්න.''

''සමහර විට විෂ බීජත් රැගෙන,''යි සේරා හෙමිහිට මතක් කළා ය. ''නෑ, ටොම්, එඩ්වින් ව අත්හැර දමා ගිය තවත් අය ඉන්ට පුළුවන්. මම ඔබට උදව්වෙන්ට ඉන්නවා. සෝමා ඩයනා ව හොඳට බලාගනියි. මොනව වුණත් මම ඔබ අත්හැර යන්නේ නෑ.''

''ටොම් අත්වලින් මොහොතකට දෙනෙත් වසාගෙන, ''දෙවියෝ අපට ශක්තිය දෙත්වා! මේ වසංගතෙන් යටත් පිරිසෙයින් ඇවත් බේරේ වා.''

ඔහුගේ සිතුවිලි එඩිතර වුණි. හදිසි අවස්ථාවල දී සිහි නුවණින් කටයුතු කිරීමේ පුරුද්ද මෙවර ද මතු විය. ආසියාතික කොලරා රෝගය ගැන සිත මෙහෙය වූ ඔහුට තමා ඒ ගැන දන්නේ ඉතා ටිකක් බව මතක් විය. ඒ ගැන දැන ගැනීමට වැඩි සැලකිල්ලක් ද නො දක්වන ලදී. රෝගයේ අවස්ථා තුනක් ඔහුට අනුමානයෙන් මතක් වුණි. මස් පෙරළීමෙන් හා ශරීරය වියළීමෙන් ඇතිවන දෙවැනි අවස්ථාවේ දී දවස් දෙකකින් හෝ පැය කීපයකින් මාරණාන්තික වෙන්ට පුළුවන. එඩ්වින් පැරඩේ ගේ නිල්වත් වූ සිසිල් හමත්, ඔහු නිතර නිතර වතුර ඉල්ලා කෙඳිරි ගෑ ලීලාවත්, වෙනත් ලක්ෂණත් සලකා බලන විට ඔහු දෙවැනි අවස්ථාවේ ප්‍රාරම්භ කාලයේ සිටින බව සිතිය හැකි විය. මීට ප්‍රතිකාරය කුමක් ද? රෝගියා උණුවතුරේ බැස්සීම ඉතා ම ඵලදායක යයි ටොම් අසා තිබේ. එහෙත් එඩ්වින්ට ඒ ප්‍රතිකාරය දීමට ඔහුගේ රෝගය බරපතළ වැඩි විය. රස්නය ඇති වතුරවලින් නැවීම හොඳ ය. මස් පෙරළීමට අබින් හොඳ බෙතකි. මොන යකාගෙන් ද අබින් සොයා ගන්නේ. ගෙදර අබින් ඇබිත්තක්වත් නැතැයි එඩ්වින් යන්තමින් කී ය. ආහාර වශයෙන් ලා කැඳ, ලුණු කැඳ ඊට සෑහේ.

හදිසි ආභාසයක් ලැබ, ඔවුන් දෙස බලා සිටි මහලු සේවකයා දෙසට හේ හැරුණේ ය.

''ගංජා!'' යි හේ තියුණු හඬින් පැවසී ය. ''මහත්තයාට ඉක්මනින් ගෙනෙන්.''

මිනිසාගේ ඇස් ලෙළදුනි. ටොම් සිතුවා හරි. ඔහු ගංජා කාරයෙක්. මෙරට නිපදවනු ලබන මෙ මද්‍ය ද්‍රව්‍යය ඔහු දන්නවා ඇත.

''මම ගන්ජා ගන්නේ නෑ,'' යි හේ කොඳුරා කී ය.

''නො ගෙනාවොත් ඔබෙ ස්වාමියා මැරේවි,'' යි ටොම් පැහැදිලි ලෙස ම කී ය.

මෙහෙකාරයා පිට වී ගොස් කළු පාට ඇලෙන ද්‍රව්‍යයක් සහිත දුම් කුඩු හෙප්පුවක් රැගෙන ආවෙ ය.

ටොම් සැක සහිත ව ඒ දෙස බැලි ය. එඩ්වින් ගේ ජීවිතය බෙරා ගැනීමට තිබුණු එක ම ප්‍රස්තාව මෙය යි. ඔහු වහා ම දියයුතු ඇණවුම් දුන්නේ ය. හොඳ පිරිසිදු කම තිබිය යුතුයි. කන බොන භාජන වෙන් කරන්ට ඕනෑ. ඒවා සේදීම සේරා ම කළ යුතුයි. දූනට ඔවුන්ට යෙදිය හැකි ආරක්ෂා විධි සියල්ල මේවා ය.

හදිසියේ ම ඔහුට ඇලිසන් මතක්වුණි.

''ඇ හියුත් එක්ක ගිහින්,'' යි සේරා වඩා හඬ නො නගා කීවා ය. ''කොහේ ද කියලා අප්පුත් දන්නෙ නැතිලු.''

ටොම් ඇ දෙස පුදුමයෙන් බැලි ය. ''හියු එක්ක ගිහිල්ලා ? මොන ඉලව්ව කට ද?'' ඇගේ මුහුණ පරීක්ෂාකරන කල්හි ඔහුට තත්ත්වාවබොධයක් ඇතිවුණි. ''අනේ දෙයියනේ ඔබ කියන්නේ—''

ඔහු කථාව නවත්වා එහා මෙහා ඇවිද්දේය. ''හරියට කාරණා දන්නේ නැතුව අපි කිසි දෙයක් හිතාගන්න එක හරි නෑ. ඒ ඇරත් දූන් අපේ සිත යොමු විය යුත්තේ එඩ්වින් ගැනයි.''

ටොම් පැකුළුණි. ''කවුද දෙමළ කම්කරුවෙක් ඉන්දියාවෙන් බෝකර ගෙන එන්ට ඇති.'' මහනුවර ඩන්කන් දෙස්තර මහතාට එන්ට කියා හෝ ඔහුට ''ග්ලැන්ලෝරි'' වත්තට වහා ම එන්ට නො හැකි නම් උපදෙස් ලබා ගැනීමට ලියුමක් ලියනු සඳහා ලෝහමය කැටයම්වලින් විසිතුරු වූ ඇලිසන් ගේ ලියන මේසය ළඟ ඔහු වාඩි ගති. තව ද සියලූ ම ආරක්ෂා විධි සලසනු පිණිස කොලරා වසංගතය ගැන හැ ම වතුවලට ම දූන්වීමට ඔහු තවත් ලියුමක් ඇන්ගස් මැක්ලොයිඩ් ට ලිව්වෙ ය. තමාගේ ලියුමක් ගොන්සාලේස් ට යැවීමට ද ඉල්ලීමක් කරන ලදී. මක්නිසා ද යත්, ''මේ පාළු ගම්මානයේ මට එවිය හැකි ශක්ති සම්පන්න මිනිහකු ඉතුරු වී නැතැ,'' යි හේ ලිවී ය.

මේ අතර සේරා එඩ්වින්ට සාත්තු කිරීමට උඩ තට්ටුවට සෙමින් ගියා ය.

හේ දුබල අත්පා සංඥවකින් ඇට ඔහු වෙතට ළංවෙන්ට එපායයි දැන්වීමට ප්‍රයත්න දැරී ය. මේ රෝගයෙන් පිඩා විඳින තෙක් සිහි ඇතුව සිටීම මෙහි විශෙෂ ලක්ෂණයකි. තවත් මස් පිඩුවක් පෙරළී හේ වේදනාවෙන් මිරිකුණි. ඔහුගේ අත් පා පිරිමදින විට කඩදාසියක් මෙන් වියළි ව රළු ව තුබූ හම බියකරු සේ සීතල බව දැනුණි. නාඩි වැටීම නැසෙන තරම් ය.

ඉක්කාව මග හැරුණි. ''වතුර'' යි එඩ්වින් බැරැඩි හඬින් කෑ ගැසී ය. ඉතා දැඩි වූ ඒ පිපාසාව කවදවත් නො සන්සිඳෙතැයි ඔහුට සිතුණි.

මෙය බිහිසුණු අවස්ථාවක ආරම්භය යි. ලයින්වල දෙදෙනකුගේ මළ සිරුරු භූමදන කළ යුතු ව තිබුණි. මරණාසන්න ව සිටි තව තිදෙනකු බේරා ගැනීමට ටොම් උත්සාහ දැරූ නමුත් ඔව්හු මළෝ ය. කම්කරුවන් හැම දෙන ම පැනගොස් සිටියා හ. කලින් කොලරාව වැළඳී සුවය ලැබීයයි කියන මහලු මිනිසා පමණක් නතර වූයේ, පුදුමාකාර ලෙස උදව් දීමට පොහොසත් විය.

අබ පැලැස්තර ලෑම, ඇකිළී ගිය ශීතල වූ ශරීරය තැවීම, හැන්දක් හැන්දක් පාසා දියාරු වූ කැඳ පෙවීම ආදියෙන් සේරා හා ටොම් එද රෑ මුළුල්ලේ එඩ්වින් පැරඩේ ගේ ජීවිතය රැක ගැනීමට සටන් කළහ. උදේ වන විට ඔහු ජීවත් ව සිටියේ, වමනයත් තද මස් පෙරළීමත් අඩුවුණි.

සවස් වරුවේ දෙස්තර මහතා පිළිතුරු එවමින්, අබින්වලින් සාදගත් ඖෂධයක් ද සුවඳැති හුණු විශෙෂයක් ද කැඳට අරලුප්පිටි ද තොගයක් එවා පිරිසිදුකම ගැන ඉතාමත් සැලකිලිමත් වන ලෙස හා විෂබීජ වැළැක්වීම පිළිබඳ උපදෙස් ද දී තිබුණි. දෙස්තර මහතා ද රෝගී ව සිටියේ ය. යුද හමුදවේ අනික් දෙස්තර මහතා මාතලේ කැලෑ උණ හා අතීසාර රෝගීන්ට ප්‍රතිකාර කිරීමට ගොස් සිටියේ ය. දවසේ පැය විසි හතර ම වැඩ කිරීමට ඔහුට සිදු වී තුබුණි.

තුන්වෙනි දවසේ එඩ්වින් පැරඩෙ ගේ රෝගය සුව වීමේ මුල් ලකුණු දක්නට තිබුණු අතර ටොම් ට ද නොබෝද රෝගී ව සිටීම නිසා ඇති වූ දුර්වලතාව නිසා රෝගය බෝ විය.

කිසියම් ගුප්ත බලයක පිහිටෙන් සේරා සුවපත් ව සිටියා ය.

හොඳ සනීපෙන් තොර ව තමා රෝගී ව සතියකට පමණ පසු ඩන්කන් දෙස්තර මහතා අසු පිටින් මෙහි ආ විට රෝගීන් දෙදෙන ම සුවය ලබමින් සිටියාහ. එහෙත් ටොම් ගේ රෝගය බරපතළ නො වී ම වාසනාවක් කොට සලකන ලදී. දැන් ඉතා බරපතළ තත්ත්වයක සිටියේ සේරා ය. ඇට වහා ම ඇඳට වී සිටීමට අණ කරන ලද්දේ ය. එහෙත් ඊට කලින් දෙස්තර මහතා

සුවපත් වෙගෙන එන රෝගීන්ට සාත්තු සේවිකාවක් හා පණිවුඩ කාරයකු ද යවා තිබුණි. ''මා හිතා ඉන්නේ උඩරට කාන්තාවක් ඔබ වෙත එවන්ට,'' යි නේ කී ය. ''ඇගේ නම ලීලා ය. ඇ රූප සම්පන්න කාන්තාවකි. පුදුම එළවන සාත්තු සේවිකාවකි.''

''ලීලා'' යි අමන්දනන්දයට පත් සේරා කෑ ගැසුවා ය. ඇ සොයා ගැනීමට කීපවරක් ම දැරූ ප්‍රයත්න නිෂ්ඵල ව තිබුණි. දෙස්තර මහතා පුදුම ව බලා සිටින විට ඕ මෙසේ කීවා ය: ''ඩයනා ඉපදෙන විට මට උදව් කළ තරුණිය ගැන මා ඔබට කිව්වා මතක නැද්ද? ලීලා නිසා නො වේ නම්. . . . .'' යි කියා ඇගේ කතාව නැවැත්වූවා ය.

දෙස්තර මහතා හිස සැලී ය. ''ඕ එහි ඉතා ම හොඳට වැඩ කළා. මට මෙතෙක් කල් හමුවුණු හොඳ ම සාත්තුකාරිය ඇය යි. ඇගේ නෑදෑයන් ඇත් සමග වැඩි ආශ්‍රයක් නැත්තේ ඇ සාත්තු සේවයේ යෙදීම ඔවුන්ට අවනම්බුවකැ යි සිතන නිසා. නමුත් දුප්පත් මිනිස්සු ඇට වඳින්නෙ නැතුවා විතරයි.''

''මට ඒක විශ්වාස කරන්ට පුළුවන්,'' යි සේරා මිමුනුවේ මේ කුලීන සිංහල තරුණිය ගැන ගොන්සාලේස් ඇට කී දේ මතක් වීමෙනි. මේජර් ඩන්කන් ඇට දුන් අබින් මිශ්‍ර බෙහෙතෙන් ගුණ ලැබෙන්ට පටන් ගෙන තිබුණි. දෙස්තර මහතා ඇගේ උරහිසට තට්ටු කර, ''ඔබේ ඇස් දෙක වහගන්න. ඇ එන තුරු කිසි දෙයක් ගැන කරදර වෙන්න එපා.''

එහෙත් ඔහු කතාව කෙළවර කරන්ට මත්තෙන් ඇට බොහෝ දවසකින් පසු ව ලැබුණු පළමු තද නින්දට වැටුණා ය.

ටොම් ගේ කාමරයට ආපසු ගිය ඩන්කන් දෙස්තර මහතා ඔහුගේ තුන්වෙනි රෝගියා වූ එඩ්වින් පැරඬේ ගැන වැදගත් කරුණු කීපයක් විචාළේ ය. දැනට රෝගයේ ඉතා උග්‍ර ලක්ෂණ අහෝසි වී ඇතත් එඩ්වින් සුවපත් වෙ ගෙන එන විදිය ගැන ඔහුට එතරම් සතුටක් නො වී ය.

හදිසියේ ම ටොම් බාධා කරමින් ''අපි පණිවුඩයක් යැවීමට ඇලිසන් පැරඬේ ඉන්නේ කොහේ දැයි දැන ගත්තොත් හොඳය කියා මම හිතනවා. ඇත්ත නම් එඩ්වින් ඇගේ නම එක වරක්වත් සඳහන් නො කිරීමයි. ඇ ඉන්නා තැන අපි ඇසූ විට ඔහු උත්තර දෙන්නේ නෑ,'' යි කී ය.

දෙස්තර මහතා මෙසේ කී ය: ''ඔහු දන්නවා ද මම දන්නේ නෑ. ගිය සුමානේ ඇ යුරෝපයට ගියා යයි මට ආරංචි යි.''

ඔවුන් පිටිපස ශබ්දයක් ඇසී දෙදෙනා ම හැරුණාහ. එහෙත් පළල් ව ඇර තුබුණු දොර ළඟ කිසි කෙනෙක් නුවූහ. දෙදෙන ම ඔවුනොවුන් දෙස බියපත් ව බලා ගත්තෝ ය. ''එඩ්වින්'' යි ටොම් මිමුනුවේ ය. ''ඉක්මන් කරපන් මිනිහෝ, ඉක්මන් කරපන්!'' යි දොස්තරට කෑගැසී ය.

දෙස්තර මහතා දැනට ම කාමරෙන් බාගයක් දුරට පිට වෙලා ය. ටොම් ක්ලාන්ත ව මෙන් ඇඳෙන් බැස ඔහු පසු පස්සේ එඩ්වින් ගේ කාමරයට ගිය හැටියේ ම ඔහුට දක්නට ලැබුණේ එඩ්වින් ගේ අතින් පිස්තෝලයක් උදුරා ගැනීමට ඔහු සමග පොර බදන දෙස්තර ය.

පසුව ද ලීලා ගේ පැමිණීම වාසනාවකි. මක්නිසාදයත්, එඩ්වින්ට යළිත් රෝගය වැළඳීම නිසා ඔහුගේ ජීවිතය දවස් කීපයක් අවදනම් තත්ත්වයක පැවති බැවිනි.

සේරා සිය මිතුරිය ප්‍රීතියෙන් පිළිගත්තා ය. ගත වූ අවුරුදු ගණන ඇගේ උපශාන්ත ලක්ෂණය වැඩි කළා පමණක් නො ව පෘථග්ජන ලෝකයෙන් බැහැර ව සිටීමේ සිල්වත් භාවයකුත් ඔප් නැග තිබුණු බව පෙනුණි. ඇගේ විනීත දර්ශනය බලාපොරොත්තු සහිත භාවයේ ආභාසය ලද්දකි. ආචාරාත්මක ලීලාවෙන් ඇ හිස එස වූ කල්හි මුවඟ රැඳි මඳ සිනහරැල්ල සේරා ගේ මුව මඩලින් නිකුත්වන මඳ සිනහවට නො දෙවෙනි නො වී ය.

''හා, කොපමණ එකක් ද ඔබ ආ එක. දැන් ඉතින් එඩ්වින්ට ජීවත්වීමට ප්‍රස්තාව ලැබෙයි.''

ලීලා බරපතළ ලෙස හිස සැලුවා ය. ''ඔබ කළාට වඩා අමුත්තක් මට කරන්ට නෑ. ඔබ කොතරම් පුදුම සාත්තුකාරියක් දැයි මේජර් ඩන්කන් මට කියා තියෙනවා.''

''මම නියෝග පිළිපැද්ද විතරයි. ලීලා ඔබ කොහේ ද ගිහින් හිටියෙ? ඔබට ලියුම් ලැබෙන විදිය දැන්නුවේවත් අපට ලියුමක් එව්වේවත් නැත්තේ ඇයි?''

''මහනුවර මට ඉන්ඩ ඕනෑ වී තිබුණා,'' යි ඕ විනීත ව සිනාසුණා ය. ''ඉතා ඉක්මනින් මම මේ ගිහි ජීවිතෙන් වෙන් වෙනවා. මම දසසිල් උවැසියක් වෙන්ට යනවා.''

සේරා මේ කල්පනාව ගැන කම්පා වූවා ය. මේසා රුවැති ලීලා කසාවතින් සැරසී හිස මුඩු කිරීම! හිතන්නටවත් බෑ.

''අනේ, කනගාටුවෙන්න එපා. එය මා ප්‍රීතියට පත් කරනවා.'' මේ හැර තමා ගැන වෙන කිසිවක් ඕ නො කීවා ය. ''කෝ ඩයනා! ඇ කොහොම ද?'' යි ඕ උනන්දුවෙන් ඇසුවා ය. ''ඇ මට නිතර ම සිහි වෙනවා.''

''අපි ආපසු යනතුරු ඇ බලා කියා ගැනීමට මැක්ලොයිඩ නෝනා ලන්තානාවට ගොස් සිටිනවා. ඇ දැන් අඳුනන්ට බෑ, ලීලා. ඇගේ වයසට වඩා ඇ බොහොම උසයි. එච්චර නෙවෙයි, හරි ම හරි දඟ මල්ල.''

ලීලා සිනාසුණා ය. ''ඈ ඒවගේ ම හුරතල් කියා මා හිතනවා. මැක්ලොයිඩ් නෝනා කොච්චර හොඳ කෙනෙක් වෙන්න ඕනෑ ද? ඒ වුණත්, ඇගේ හුරතල් බබා බලාගැනීමට තවත් කෙනෙක් ඒම ගැන සෝමා වැඩි කැමැත්තක් නැතුව ඇති.''

ඇගේ දිග සිනිඳු ඇඟිලිතුඩින් ඈ ගෙනා නෙලුම් මල්වල පෙති අල්ලනු සේරා දුටුවා ය.

''ඩේවිඩ් නෙවිල්? ඔහුත් සනීපෙන් ඉන්නවා ද?''

සේරා ඈ දෙස පුදුමයට පත් ව බැලුවා ය. ''ඔබ ඔහු දන්නවා ද? ඔව්, ඔච්චර ළඟ සිටි නිසා දන්නවා ඇති. ඔහුගේ තාත්තා ඔහු එංගලන්තයේ පාසැලකට යවා තියෙනවා.''

නැවතත් ලීලා ගේ මුවග මඳ සිනහ පහළ විය. ''ඒක හොඳයි, ඔහුට වයස දහතුනක් යයි හිතන්ටවත් අමාරුයි. . . . .අපේ පෙරදිග තත්ත්වයේ හැටියට දැන් ලොකු මිනිහෙක්. එතකොට. . . . .එයාගේ පියා?''

සේරා කලබලෙන් හිස සැලුවා ය. ''මම දන්නේ නෑ,''යි ඕ හීන් හඬකින් පැවසුවා ය. ඊට පසු ඇගේ හිසකෙස් වේගවත් ව පිටිපස්සට ලමින් ලීලා දෙස තද බැල්මක් හෙළුවා ය.

''එයා ඉන්නවා. . . . .එයයි ඇලිසනුයි. . . . .පැරඩේ නෝනා. . . . .''

සේරා වියරු වැටුණාක් මෙන් ලීලා ගේ වළලුකර අල්ලා ගත්තා ය. ඈ හෙමිහිට අත බුරුල් කරද්දී ඇගේ දෙනෙතෙහි රැඳුණු කරුණාව ඉවසනු බැරුව සේරා පසෙකට හැරුණා ය.

''අපි එයා ගැන විනිශ්චයක් නො කරන එක හොඳ නේ ද?''

සේරා සීලිම දෙස බලමින් හාන්සි වූවා ය. ''මේ කොයි හැටි වුණත් පුදුමය ඔහු නරක හැටියට මට තාමත් හිතන්න බැරි එකයි.''

''ඔහු නරක නෑ ''

ලීලා කථා කළ ලීලාවේ කිසියම් අදහසක් ගැප් ව තිබුණු බව සිතූ සේරා ඈ දෙස වහා බැලුවා ය. ''ලීලා. . . . .කොහොම ද ඔබ මේ සියල්ල ම දන්නේ?'' යි ඕ මිමුනුවා ය.

ලීලා කවුළුව වෙතට ගියා ය. ''ඩේවිඩ් නෙවිල්ට වයස අවුරුදු පහ වන තුරු මා ඔහු ව බලාකියා ගත්තා. ඔහුගේ පියාට මා නිතර ම ප්‍රේම කළා. නුමුත් ඒ බව ඔහු කවදාවත් දැනගත්තේ නෑ.''

''ඒ නිසා ද. . . . . . .?''

''ඒ නිසා තමයි මම අස්වෙලා ගොස් වතු දෙක අද්දර ඇති ගෙයි පදිංචියට ගියේ. ඔහු දැක දැකත්, ඔහු ළඟ ම අරලිය වත්තේ සිටීමට මට හිත දුන්නේ නෑ. මුල දී දුර බැහැර යෑමට තරම් ශක්තියක් ද මට තිබුණේ නැහැ.''

''ඉතින් දූන්. . . . . . ?''

ලීලා හැරුණු විට ඇගේ මුහුණ සම්පූර්ණ උපශාන්ත ගුණයෙන් බැබළුණි. ''දූන් මට කරදරයක් කළ හැකි කිසිවක් අද මෙලොව නැත. මට ශාන්තිය ලැබී තියෙනවා. සංසාර දුකින් මිදී උතුම් වූ නිර්වාණයට පත්වෙන හැටි අපට බුද්ධාගම උගන්වනවා.''

7

ඇලිසන් හා හියු නෙවිල් එකට ගොස් නැති බව අන්තිමේ දී දක්නා ලදී.

ටිකින් ටික කථාන්තරය හෙළි විය. අරලිය වත්තේ හියු ගේ කොන්දෙස්තර ගෙනුත්, මහලු අප්පු කළ ප්‍රකාශවලින් හා එඩ්වින් ම කී දෙයිනුත් කරුණු එළිදරව් වූයේ ය.

සිය සැමියා සමග ''ග්ලැන් ලෝරි'' වත්තේ හුදෙකලා ජීවිතයක් ගත කිරීම ඇලිසන්ට හිරිහැරදයක වූ බව පෙනේ. සමහර විට හියු දවස් ගණන් එහි ගත කෙළේ ය. අසල්වැසි හැඩි දූඩි වතුකාරයන් ද ගෙන්වා පවත්වන ලද ෂැම්පින් සාද එමට ය. පැරඬේලා තනිය ම කෑම ගත් රැයක් නැති තරම් විය.

''මහත්තයයි නෝනයි වැඩිය එකට ඉඳන් කථා කරන්නේ නෑ,'' යි මහලු අප්පු වරක් කී ය. ''මට හරි කනගාටුයි. මහත්තයා බොහො ම හොඳයි. නෝනත් කරුණාවන්තයි. මගෙ පවුල මැරිච්ච වේලාවෙ මට රුපියල් පනහක් දුන්නා.'' මෙය ඇලිසන් ගේ චරිතයේ සේරා නො සිතූ ලක්ෂණයක් විය.

අලුතෙන් පැමිණි මිනිසුන් කණ්ඩායමක කෙනකු රෝගාතුර වූ විට ඔහු බැලීමට දවසක් එඩ්වින් කම්කරුවන් ගේ නිවාසවලට කැඳවනු ලැබී ය. ඒ රෝගියා සිටි කාමරයට ඇතුළුවීමට පෙර ඔහුට මහත් පිපාසාවක් දැනී, ලයින්වලට ඇතුළුවන තැන තුබූ පීල්ලකින් වතුර බීවේ ය. මේ වතුර පීල්ල ඒ කම්කරුවන් ගේ වැසිකිළි හරහා වැටී තුබූ බව ඔහුට පසුව දැන ගන්නට ලැබුණි.

ඒ මිනිසා පෙළුණේ කොලරා රෝගයෙනි. බඩුත් පටවාගෙන ඇලිසන්ට වහා ම පිට වී යන්ට යයි කීමට එඩ්වින් පෙරළා ලහි ලහියේ එන විට ඕ නෙවිල් වැළඳ ගෙන සිටියා ය. මහලු සේවකයා කනස්සලු ලෙස මෙය ප්‍රකාශ කළේ ''මහත්තයා ආපහු එනකොට වැඩේ වැරදිලා'' යනුවෙනි.

සමහර විට දබරයක් තියෙන්ට ඇති. නැත්නම් දබරයකටත් වඩා අත්ත වූ තද නිශ්චල භාවයක් පවතින්ට ඇති. ඇලිසන් ඇගේ බඩු ස්වල්පයත් පොදි ගන්නා ගෙන, එඩ්වින්ට කොලරා වසංගතය පැතිරීම ගැන කීමට මතක් වීමට පෙර, පිට වී ගියා ය.

රෝගයේ මූලික ලක්ෂණ එඩ්වින් කෙරෙහි පහළ වූයේ මීට පසු ද රාත්‍රියේ ය. මේ වන විට ඇලිසන් හා හියු කොළඹට පැමිණ සිටියා හ. ඇලිසන් වහා ම එංගලන්තය බලා යාත්‍රා කරන නැවක කාමරයක් ලබාගැනීමට ඇට පුරුදු කලබල ගතියෙනුත්, හියු කලින් සූදනම් කර තුබූ පරිදි දීර්ඝ සංචාරයක යෙදීමට ඉන්දියාවට යන්ටත්, කටයුතු සූදනම් කළහ. ඇලිසන් මෙසේ හුදකලාව ගියේ ඇයි දැයි සේරා ගේ සිත තුළ නැගී—එහෙත් නො අසන ලද ප්‍රශ්නය වී.

එඩ්වින් ලන්තානාවට ගොස් දෙමසකි. සේරා ගේ සාත්තුවේ හොඳකම නිසා, සෙමින් වුව ද සුවපත් වේගෙන එන ලකුණු පෙනුණි. එහෙත් දෙවෙනි වර රෝගය වැළඳීමෙන් ඔහුගේ ශක්තිය බොහෝ දුරට හීන ව තුබුණේ ය. වැහැරී ගිය සිරුරේ මාංශපේශීන් කඩා හැලී තිබුණා පමණක් නො ව, ඊටත් වඩා බරපතළ දෙයක් වූයේ ජීවිතය ගැන කිසි සැලකිල්ලක් ඔහු කෙරේ නැති වීම ය.

ඇලිසන් සොයා ගැනීමට නිෂ්ඵල ලෙස ප්‍රයත්න දරමින් පැය ගණන් මුළුල්ලේ ලියුම් ලියමින් හේ කාමරය තුළට වී සිටියේ ය. ඔහුගේ නමට ලියුමක් ලැබුණු විට දක්වන උනන්දුවත් ඊට පසු ඔහුගේ නිශ්චල භාවය හා කනස්සල්ලත් ටොම් හා සේරා අනුකම්පා සහගත ව බලා සිටියා හ. ඇ ගැන ඔහු කතා කරතොත් කොතරම් හොඳ දැයි ඔවුහු කල්පනා කළහ. එහෙත් දවසින් වැඩි කොටස ඔහු ගත කළේ වැනෙන අත් ද රැවෙන ඇස් ද පැසුණු කෙස් සහිත නැමුණු හිස ද ඇතිව ය. ඔහුගේ යම්තම් වත් ප්‍රාණවත් ගතියක් ඇති වූයේ ඩයනා සමග සිටින විට පමණකි. ඒ ළමයා ඔහුට අතිශයින් ආලය කළේ ය. ඇ සඳහා ඔහු සිය උදසීනකම් දුරලා විස්මය ජනක කෙළි සෙල්ලම්වල යෙදුණේ ය. මෙතරම් නිශ්චල ව්‍යාපාරිකයකුට ගෙතිය හැකැයි සේරාට නො සිතිය හැකි කථාන්තර ද කීවේ ය.

ඔහුට සම්පූර්ණ සුවය ලබාගත හැක්කේ ඩයනා ගේ මාර්ගයෙන් බව දුටු සේරා ඔවුන් දෙදෙනා ගේ ආශ්‍රයට හැම අතින් ම අනුබල දුන්නා ය. මේ දවස්වල ඇගේ සිත මෙහෙයීමට වැඩ රාශියක් තිබුණි. ටොම් ළඟ ළඟදී ම දෙවරක් රෝගාතුර වීමෙන් ඔහුගේ ශක්තිය බොහෝ දුරට පිරිහීම නිසා වත්තේ පාලනය ඔහුට තනිව ම කළ නො හැකි බව ඇට අවබොධ වන්ට පටන් ගති.

ඔහුට නො දැනුවත්ව ම ඔහුගේ කරපිට පැවරී තුබූ වැඩ බොහොමයක් ඔහුට පහසු කරනු පිණිස ඕ බාර ගත්තා ය. රෝගී කම්කරුවන්ට උපස්ථාන කිරීමේ කර්තව්‍යය දූන් ඈ පිට සම්පූර්ණයෙන් ම පැවරී තිබුණි. හැම දූ ම උදේ පැයක් ඈ වෙත එන කවරකුට නමුත් නොමිලයේ ප්‍රතිකාර කරන බෙහෙත් ශාලාවක් පැවැත් වූවා ය.

ආදයම ටිකක් වැඩිකර ගැනීම පිණිස එළදෙනුන් හා කුකුළන් ඇතිදූඩි කිරීම ඈ දියුණු කොට අසල්වැසි වැවිලිකාරයන්ට කිරි, බටර් හා බිත්තර සැපයුවා ය. ඔහු රෝගාතුර ව සිටින විට කම්කරුවන්ට වැටුප් ගෙවීම පිණිස ඇගේ ආදරණීය අරාබි අශ්වයා විකුණුවා ය. ඒ වෙනුවට ඈ මිලයට ගත් ලාබ වර්ගයේ පේගු පෝනියා හොඳට ම සෑහෙන බව ඈ පැවසුවේ එඩ්වර්ඩ් පරිද්දෙනි. ඔවුන්ගේ ජීවිතය තුළ කවදවත් නො තිබුණු තරම් අඩදබරයකට තුඩු දුන්නේ මේ කාරණය යි.

බරාඳයේ තනිව ම වාඩි වී සිටි එඩ්වින් පැරඬෙ ට ඔවුන් නුපුරුදු ලෙස මහත් හඬින් කෑ ගසනු ඇසුණි. ඒ හඬ ගෙය වෙන්කර තුබුණු සිහින් බිත්ති විනිවිද ගියෙන් හැම වචනයක් පාසා ම ඔහුට ඇසුණේ ය.

''ඒ වෙළඹ විකිණීමට ඔබට කිසි ම යුතුකමක් තිබුණේ නෑ. ඌ මම ඔබට දුන් තෑග්ග.''

''ටොම් අපට මුදල් ඕනෑකර තිබුණා. ඇරත් ඌ මට ඉක්මන් වැඩියි, ඇත්තෙන් ම. . . . .''

''අපි කසාද බැන්දට පස්සේ ඔබට ලැබුණු එක ම ප්‍රියකරු දෙය ඒ වෙළඹ යි.''

''පෙම්වත, අපි දබර කරන්ට ඕනෑ නෑ. ඌ නො විකුණා මොනවා කරන්ට ද?''

''මේ කබල්වත්ත මට ඕනෑ වූ විදියට විකුණලා දන්ට යි. මං එඩ්වින්ට ණයත් බේරා මේ සියල්ලෙන් ම අපට මෙලහකට නිදහස ලබන්ට තිබුණා. මොන ඉලව්වට ද ඔබ ඒකට බාධා කළේ?''

කුසීත කමින් අවදි වූ එඩ්වින් ගේ සැලකිල්ල උද්‍යොගවත් ලෙස මේ කථාවට යොමු විය. සේරා ලේන්සුවකින් කට වසා ගනිමින් කාමරයෙන් පිට වෙනවාත් සමඟ සුසුම් ලමින් අඩනු ඔහුට ඇසුණි.

ඔහු ද සුදුමැලි ව, වැනෙමින් හෙමිහිට නැගිට සාලයට ගියේ ය.

ටොම් එහි සක්මන් කරමින් සිටියේ එඩ්වින් ඇතුළු වෙනවාත් සමඟ ම හිස ඔසවා බැලී ය.

''අපේ ඒ හැම වචනයක් ම ඔබට ඇහුණාය කියා මම හිතනවා'' යි හේ තරහෙන් කී ය.

''ඔව්, එසේ ඇහුණ එක ගැන මම සතුටු යි.''

ටොම් සක්මන නතර කොට ඔහු දෙස රවා බැලී ය.

''මම අන්ධ ආත්මාර්ථකාමී මෝඩයෙක්. මට සමාවෙන්න, ටොම්. මම හිතුවෙ නෑ ඔබෙ කාලය මෙච්චර නරකෙයි කියල.''

''අනේ මේ, දෙයියන්නෙ පිහිටයි. මා ඔබට තියෙන ණය නො ගෙන ඉන්ට ලෑස්තියි මට කියන්ට එන්ට එපා. . . .''

''මට එහෙම කල්පනාවක් යන්තම් වත් තිබුණේ නෑ.'' මහලු මිනිසා ගේ අවඥාත්මක උදර භාවය ටොම්ට කස පහරක් මෙන් වැදුණේ, වෙහෙසට පත් ව අතින් හිස පිරිමදින්ට පටන් ගත්තේ ය.

''එන්න බරාඳයට, ටොම්. මට ඔබ සමඟ කතා කරන්ට ඕනෑ. මට අදහසක් ආවා.''

මෙයින් පැයකට පසු ටොම් සිය පුටුවේ ඉදිරියට නැඹුරු ව වාඩි වී දෑත් බැඳගෙන එඩ්වින්ට ඇහුම්කන් දෙමින් සිටියේ ය.

''ඔබ මට සියලු ම කාරණා එළි කර තියෙනවා. ඒ සියල්ල ගැන මම කල්පනා කරන හැටි ඔබ දන්නවා. මගේ වැඩ පිළිවෙළ සපල වෙනවා කියා මම කියන්නේ නෑ. එක්තරා ප්‍රමාණයක අවදානමක් එහි තියෙනවා. නුමුත් මගේ කල්පනාවේ හැටියට ඒක හොඳ යෝජනාවක්. ඔබ ඒ ප්‍රස්තාව ලබා ගන්ට කැමැති නම්. . . . . .''

එඩ්වින් ගේ යෝජනාව ටොම්ට සුදුසුය කියා හිතෙන අන්දමට වියදම් කරනු සඳහා ලන්තානාව ඇපකර ගෙන තවත් මුදල් ණයට දෙන්ට ය. උපන් ව්‍යාපාරිකයකු වූ එඩ්වින් ඔහුගේ රෝගාතුර භාවයත් වෙන කොයි දේ ගැනත් සැලකිල්ලක් නො දක්වන කෙනකු සේ පෙනෙතත් ඔහුගේ ලියුම් කියුම් කියවමින් වෙළඳ පොළේ තත්ත්වය ගැන පරීක්ෂාකාරී ව සිටි බව පෙනේ. පැරඬේ පුටුවට හාන්සි වී, මාස කීපයකට පස්සේ සුරුට්ටුවක් කට දල්වා ගෙන සිටි ඒ අවස්ථාවේ, ඔහුගේ අදහස් පැහැදිලි වී හොඳ සනීපෙන් සිටින ලකුණු ටොම්ට පෙනුණි.

''මෙය හරි ගියොත්—මම හිතනවා එහෙම වෙයි කියල—ඔබට සෑහෙන මුදලක් උපයාගන්ට පුළුවනි. ඒ මුදලුයි ඔබේ අලුත් පලදාවෙන් ලැබෙන ලාබයි එකතු වුණා ම ඔබට ලන්තානාව කිසි ණයක් නැතුව පාලනය කරන්ට පුළුවන් වෙලා ලාබ ගලා ඒවි. මොකද මේකට කියන්නෙ ?''

''මේකට මට ඔබට ඉඩ දෙන්න බෑ'' යි ටොම් මිමුනුවේ ය.

''මම කිසි දෙයක් තව ම කරලා නෑ. මම යෝජනා කරන්නේ ඔබේ බ්‍රෝකර් වෙලා ලන්තානාව ඇප කරගෙන ඔබේ ම සල්ලි යොදවන පිළිවෙළක්. මෙය වෙළඳ යෝජනාවක්. එක්කො පිළිගන්න. නැත්නම් අත් අරින්න.''

ටොම් ඔහු ඉදිරියේ සිටි මේ පුරුෂයාගේ රළු මුහුණ පරීක්ෂණාත්මක ව බැලී ය.

''එය හොඳ ගනු දෙනුවක්.''

එඩ්වින් ප්‍රීතියෙන් පිනා ගොස් නැගිට්ටේ ය. ''බොහොම හොඳයි! මට අවසර තිබෙනවා නම් ඔබේ කාර්යාලය පාවිච්චි කොට විශෙෂ පණිවුඩකාරයෙක් ලවා ලියුම් කීපයක් යවන්ට තියෙනවා.''

සේරා එඩ්වින් ගේ මේස් කකුලක් එළලමින් සිට එහි අන්තිම මැස්ම කඩා හැරියේ ඔහු දෙස මඳ සිනහවක් හෙළමිනි.

''අපි මුලින් කොළඹ දී හමු වූ විට ඔබට මම මේස් එළලනවා යයි කියා හිතුවේ කවු ද? මැහුම් ගෙතුමුත් ගෙදර වැඩත් මට කොච්චර අප්‍රිය දැයි ඔබ දන්නවා නම්!''

ඇගේ නෙත් යුවළෙන් හා කට හඬින් ප්‍රකාශ වූ සිනහව මැත දී ඈ වෙනස් කළ අමුතු ප්‍රබෝධයක ලක්ෂණය පෑ ය. ඒ ලක්ෂණය ඉදිරියේ එඩ්වින් පැරදී ලජ්ජා වූවා සේ පෙනුණි. ඔහු සිය මිතුරන්ට උදව් දීමට මාර්ගයක් වූවා පමණකි. මේස් කකුල ගෙන හේ පරීක්ෂා කර බැලී ය.

''ඔබ මේක බොහොම ලස්සණට කරලා තියෙනවා—ඔබ හිතටගත් හැම දෙයක් ඔබ කරන්නා වාගේ තමයි.''

''එය මට කරන්ට සිදුවුණ නිසා. මට ඕනෑ හැටියට ඉන්ට තිබෙනවා නම් මුළු දවස තිස්සේ ම පතනවල ඇවිදිනවා, නැත්නම් අසුන් පිට යනවා, ඒත් නැත්නම් ගස් වැවෙන තුරු—වත්තේ ඇවිදිනවා.''

එඩ්වින් මඳ සිනහ පෑ ය. ''ඔබේ ශාන්ත ගුණය කෙසේ වෙතත්, ප්‍රිය තෝනා, වෙන දෙයක් වෙන්ට හැර නිකම් සිටින තත්ත්වයේ කෙනෙකැයි කියන්ට බැහැ. මගේ අදහස ඔය මතුපිට ශාන්ත ගුණය ඇතුළත පවා තරුණියක ගේ සංසුන් ගතියට වඩා වෙනස් යමක් තිබෙන බවයි.''

''එඩ්වින්!''

''අපේ හොඳ යාළුවා වන ඇන්ගස් මැක්ලොයිඩ් කියන්නාක් මෙන්, 'මම මනුෂ්‍ය ස්වභාවය පරීක්ෂාකර බැලීමට සූරයෙක්'—ඒ සමග ම ඇත්තෙන් ම ඔබෙ පියා වීමට තරම් වයස ඇති කෙනෙක්.''

ඔහුගේ මඳ සිනහව මුහුණේ පෙනුණු ශෝකය තියුණු කළා පමණකි. ඉදිරියට නැමී සේරා ඔහුගේ අත ඇල්ලුවා ය. ''ප්‍රිය එඩ්වින්, ඔබ ගියාම අපට කොච්චර පාළු ද? ඔබ අපට කොච්චර උපකාර කළා දැයි ඔබ දන්නේ නෑ. ලන්තානාව විකුණුවා නම් අපි දෙදෙනාට ම ඉවසා ගත නො හැකි දෙයක්.''

එඩ්වින් ඇගේ අතට තට්ටු කළේ ය. ''මොන බොරු ද සේරා. ටොම් ගේ වැඩ හරි හැටියට යොදු ගෙන අර තරමක උනන්දුවක් ඇති කිරීමට උදව් දීම මිසක් මා කළ දෙයක් නෑ.''

ඈ හිස සලද්දීත් හේ තවත් වේගවත් ව මෙසේ පැවසී ය. ''මොන ඉලව්වක් ද—මට සමාවෙන්න, සේරා! —අර ණය නො ඉල්ලා සිටීමේ අදහස පවා රිස්සුවේ නැත. තමාගේ ජීවිතය ගලවා දුන් ව්‍යාපාරිකයකු ගේ කෙළෙහිගුණ ලබාගැනීමට එකඟ නො වන තරමට ආඩම්බරයි—මට එහෙම ලැබුණත් නො වේ. නුමුත් මම ඔහුගේ ගතිය අගේ කොට සලකනවා.''

''දැන් ඔබ වැඩ හරි හැටියට යොදු ගැනීමක් ගැන කතා කළා,'' යි සේරා කී ය. ''සමහර වේලාවට එය බොහොම අමාරු වැඩක්. -අපේ ජීවිතය කෝපි—අපේ ආහාරය කෝපි—අපේ කතාව කෝපි—අපේ දර්ශනයත් කෝපි.''

''තවත් ජේන දේවල් තියෙනවා,'' යි එඩ්වින් තරහෙන් කී ය.

ඇගේ මැහුම දෙස යළිත් ඕ හිස නමා ගත්තා ය. ''ඒක මා දන්නවා.''

''අපි සියලු දෙනාට ම සමහර විට ඒ තවත් දේවල් නො පෙනී යනවා. මටත් ඒක අවබෝධ වෙන්නේ දැනුයි.'' ඔහුගේ වේගය ඕනෑකමින් ම තුනී විය. ''අඩු ගණනේ ලන්තානාව ගැන මීට පස්සේ ඔබ හිරිහැර වෙන්ට ඕනෑ නෑ. කෝපි මිළ කවදවත් මේ තරම් නැග්ගේ නෑ. ටොම් යෙදූ මුදල්වල පළමුවෙනි ලාභ කොටස් දැන් ගලා එන්ට පටන්ගෙන තියෙනවා. ඔහු පසු බැස්සීමට කිසි දෙයක් වෙතැ යි සිතන්ට ඉඩ නෑ—''

''එමෙන් ම ඔහු අමුතු මිනිහෙක්.''

ටොම් ඔහුගේ ''බීගල්'' වර්ගයේ බල්ලන් දෙදෙනා ද කැටුව ඇතුළු වූ වහා ම ඔව්හු ඔවුනොවුන් දෙස බලා මඳ සිනහ පෑහ. ''කොහොම ද එඩ්වින්, යමු ද පතනේ පැත්තෙ හාවෙක් වත් දඩයම් කරන්න.''

''නෑ, මට නම් බෑ. මට ඕනෑ හාවා කෑමට සූදනම් වෙලා තියෙන්ටයි.''

''මගේ යාළුවා, ඔබට ලැබෙන්නේ බණ්ඩා ඉස්තරම් හැටියට සෑදූ හා මස් ඉස්මෝරුවක්—සේරා, මොනවයින් ද ඒක රසවත් කරන්නේ?''

''හොඳට කරවෙන්ට අඹරාපු කොත්තමල්ලි, සූදුරු, වෙලිච්ච මිරිස්, අමු ඉඟුරු හා මීටිකිරි.''

''ඔය කතාව කියන කොට මට මතක් වෙනවා අරබීටන් නෝනා ලියනවයි කියන අලුත් සූපශාස්ත්‍ර පොත්'' යි ටොම් කී ය.

ඔහු පිටිපස සතුටින් බුරමින් යන බල්ලන් ද කැටුව ටොම් ගිය පසු, සේරා මුදු වදනින් මෙසේ කීවා ය. ''ටොම් නැවතත් විනෝද වෙනවා දැකීම පුදුමයක්. කාලයක් තිබුණා. . . . . . .හා, ඒක ඕනෑ නෑ දැන්.''

ඇගේ මුහුණේ ශ්‍රී ශොභාව එඩ්වින් ගේ විස්මිත වේදනාවකට කරුණු විය.

''ටොම්, ඔබට ඉතා කදිම සැමියෙක්.''

''මම ඒක දන්නවා.''

''ඔබෙ ප්‍රීතිය ගැන මට ඊර්සියයි.'' එඩ්වින් සුසුමක් හෙලා හිස සලා ''නෑ, මම ඇත්ත වශයෙන් ම එහෙම අදහස් කරන්නේ නෑ.''

''එඩ්වින්—මට සමාවෙන්න. නුමුත් ඇලිසන් ගැන කිසි ම ආරංචියක් ලැබිලා නැද්ද?''

''කිසිවක් නෑ—'' ඔහු වේදනාවෙන් මිරිකුණු මුහුණක් දැක් විය. ''මම වහා ම ලියුමක් ලිව්වා නම් නැව් සමාගම මගින් මට ඇ සොයාගන්ට තිබුණා. ඇගේ නම නැවතත් අහන්ට වත් එපා වුණේ මොන පිස්සුවක් මට හැදිල දැයි දන්නේ නෑ. මට පුළුවන් හැම මගකින් ම සොයා බැලුවා. නුමුත් ඇ ගැන ආරංචියක් නෑ.''

කතා කිරිම හෝ සිතැඟි දැක්වීම නිෂ්ඵල බව සලකා ඕ නිශ්ශබ්ද වූවා ය. ඔහු තනිව ම දුක් විදිම ගැන ශොකවෙමින් අතීතයේ දී ප්‍රමාණය ඉක්මවා නිශ්ශබ්දව සිටීම ගැන ඕ තමාට ම දෝෂාරෝපණය කර ගත්තා ය.

''මා ඇ වෙනුවෙන් තැන්පත් කළ සුළු මුදල හැර, මුදල් ඉපයීමට ඇ කරන්නේ මොනවා දැයි දෙයියෝ දනිති. මට ලොකු ම හිරිහැරයක් වෙලා තියෙන්නේ ඒකයි. මා ජීවත්වෙන තුරු මට නම් මේ ගැන සමාවක් දී ගන්ට බැහැ.''

''අනේ, එඩ්වින්.''

''නෑ, සේරා. එය වැඩියක් ම මගේ වරද. ඇලිසන්—මට වඩා බොහොම තරුණ, රූප ලක්ෂණයෙන් හා උද්‍යොගයෙන් පිරිතිරි සිටින කෙනෙක්. කල්පනා ශක්තියක් නැති මා වගේ මොට්ට වෙළෙන්දකු විවාහ කර ගැනීම අනේ දෙවියනේ ඇට කොච්චර හිරිහැරයක් වෙන්ට ඇද්ද? මම දිග කතාවක් පටන් ගත්තා ම ඇගේ පයල්ලු කුඩා සපත්තු එකිනෙකට වද්දන සැටි මට තවමත් පේනවා. . . . .අපට ළමයි හිටියානම්. එහෙනම් මෙහෙම වෙන එකක් නැහැ නෙ.''

හේ මදක් නැවතී හෙමිහිට මෙසේ කී ය. ''හියු නෙවිල්ට පවා මට සම්පූර්ණයෙන් දෙස් තබන්ට බෑ. මිනිහෙක් සාමාන්‍යයෙන් මනුෂ්‍ය ගති ඇත්තෙක්. ඇලිසන්ට යමක් ගැන හිත වැටුණා ම ඇ එයින් කිසි සේත් වළක්වන්ට බැහැ. පුදුමයක් නම් මට හියු ගැන දුක්වෙන්ට වීම යි. ඔහුගේ ඉරණම අනුව කලබලකාරී අන්දමින් ඔහු සොයන්නේ—කුමක් ද? අපි බොහෝ දෙනා වගේ ආදරය යි. නුමුත් ඔහුට ලැබෙන්නේ රැවටිල්ලක්.''

සේරා ගේ ඇස් කඳුලින් පිරුණි. ''ඉතින් ඔබ කියන්නේ ඔබ කල්පනා ශක්තිය නැති කෙනෙක් කියලයි. ඔබ හොඳ මිනිහෙක්, එඩ්වින්.''

''මම? හොඳයි? නෑ, ප්‍රිය නෝනා. ඉතා තදින් ආලය කිරීම මම දන්නවා. එයින් කිසියම් අවබෝධයකුත් ඇතිවෙනවා.''

''ඉතින් දූන්—? දූන් ඉතින් ඔබ කරන්නේ කුමක් ද?''

''මා දන්නා වැඩට යනවා. ඔබේ ටොම් මට අමුතු උනන්දුවක් ඇති කළා. මෙහි මිනිසුන් අතර ඔහු කෙරේ ඇති විශ්වාසයත්, ඔබ දෙපළ කරන හොඳ වැඩත් මට පේනවා. මගේ වෙළඳ ව්‍යාපාරය හැර මට ද කොළඹ දී කරන්ට පුළුවන් වැඩ තියෙනවා. සමහර විට එය දේශපාලනය විය හැකි යි. ව්‍යවස්ථාදයක මන්ත්‍රණ සභාවට ආණ්ඩුවේ මන්ත්‍රීවරයකු හැටියට පත් කරන්ට යෝජනාවකුත් තියෙනවා—''

''එඩ්වින්, කොච්චර අගේ ද?''

''සමහර විට මට ඒ නිසා වැවිලිකාරයන්ට උදව් වෙන්ට පුළුවනි. මේ රටෙ වැඩි ම ආදයම වතුකාරයන්ගෙන් ලැබෙන නමුත් වතුකරයේ ප්‍රශ්න ගැන සෑහෙන පමණ සැලකිල්ලක් ලැබෙන්නේ නැත.''

හේ නැගිට කවුළුවෙන් පිටත වූ කෝපි ගස්වලින් වැසී ගිය කඳු දෙස බැලී ය.

''මගේ ව්‍යාපාරයට පිටස්තර යමක් කරන්ට ලැබීම හොඳ දෙයක්. මිනිහකුට කිසියම් මෙහෙයිමක් ඕනෑ. ධනය උපයනවාට වඩා අමුතු දෙයක් කරන්ට ඕනෑ. නුමුත් මම ඉස්සෙල්ලා යුරෝපයට යනවා—කොහේ හිටියත් ඇලිසන් සොයන්ට.''

ඔහුගේ ව්‍යාපාරික කටයුතු අවුල් වී තිබීමත් නැවක වහා ම ඉඩ ලබා ගැනීමට නො හැකි වීමත් කරණ කොටගෙන සැලසුණු ප්‍රමාදයෙන් නැවත රෝගී වීමට තරම් ලෙල්ලම් වූ එඩ්වින් ලන්තානාවට පැමිණියේ නැව් නැගීමට සතියකට කලිනි. මීට පසු ද කොළඹ විශෙෂ පණිවුඩකාරයකු මගින් එවන ලද ලියුම් දෙකක් මීසරයෙන් ලැබුණේ ය. හදිසියේ ඔහුගේ මුහුණ සුදුමැලි වීමෙනුත් අත් වෙවුලීමෙනුත් මේ ලියුම් දෙකින් එකක් ඇලිසන්ගෙන් වෙන්ට ඇතැයි ටොම් හා සේරා අනුමාන කළහ. එය ශාන්ත ව කියවීමට ඉඩහැර ඔව්හු හෙමිහිට බැහැර වූවෝ ය.

ටික වේලාවකට පසු එඩ්වින් ඔවුන් වෙතට පැමිණියේ ය. ඒ සුළු කාලය තුළ දී ඔහු වෙහෙසට පත්ව මහලු ව ගිය කෙනකු සේ පෙනුණි.

වචනයක්වත් නො කියා ලියුම් දෙක දී ඩයනාට හා ඇගේ බල්ලාට ද අඩගසමින් හේ කෝපි වතු දෙසට ගියේ ය.

පළමුවෙනි ලියුම ඇලිසන්ගෙන් විය. එය කයිරෝ නගරයේ රෝහලකින් ලැබුණි.

ඈ මෙසේ ලීවා ය:

''මා පෙම්වත, මට මීට වඩා කිසිවක් කරන්ට බැරි යයි ඔව්හු කියති. අනේ ඒ උදවිය මේක මට කිව්වේ බොහොම නො කැමැත්තෙන්; හරියට මම මරණයට බයවගේ, නැත්නම් කවදහරි බය වෙලා හිටියා වගේ; ජීවිතයේ ආසාවෙන්ට දෙයක් තියෙනවා වගේ! ඔබ නිසා නො වේ නම් මගේ ජීවිතය හැම විට ම හිස් වූ එකක්, නැතහොත් හරය වෙනුවට මා තෝරාගත් පොතුවලින් පිරුණු එකක් කියා මට ජේනවා.

ගිහි සැපතින් බැහැර වූ විනීත මුහුණුවලින් ද සුදු හිස් වැසුම්වලින් ද ශොභමාන මේ කන්‍යා සහෝදරියෝ ,ඉතා ම කරුණාවන්තයහ. මට බොහොම උදව් කරන මැඩලින් සහෝදරිය මගේ කොට්ටය යට තබා ගැනීමට කුරුසයක් දී තිබෙ. මා කුරුසයක් ගෙන ඉන්නවයි කියා හිතුව හැකි ද? එඩ්වින්, මගේ දෙමවුපියන් හා ගුරුවරුන් මා පල්ලියට යවන්ට කළ වැර වෑයම් නැවතුණාට පස්සේ මම පල්ලියට හයවරක්වත් ගිහිල්ලා ඇතැයි කියන්න බෑ. නුමුත් පුදුමය නම්, නො දැනුවත්ව ම වාගේ මගේ ඇඟිලි කොට්ටය යටට ඇදී ඒ කුරුසියේ දැඩි පහස විඳීම යි. ඇත්තට ම එය සමහර විට අල්ලා ගෙන ඉන්ට තරම් වටිනා දෙයක්.''

ලියුම මෙහි දී කැඩී දෙවෙනි කොටස ඇ පැන්සලෙන් ලියා තිබුණේ කියවන්ට බැරි තරම් නො පැහැදිලි ලෙස ය.

''පෙම්වත, මම නිතර ම ඔබේ හිත රිද්දවා තියෙනවා. අනෙක් මිනිසුන්ගේ සිත් ඇද ගැනීමට මා තුළ වූ ආශාව අසාධ්‍ය ලෙඩක් වෙලා තිබුණා. නුමුත් එය වැටහුණේ ඔබට විතරයි. හියු නෙවිල් ගැන නම්—ඔහුට මා, කවදවත් ඕනෑ වුණේ නෑ.''

තවත් තැනකින් ලියුම කැඩුණි.

''මට ටිකක් වෙහෙසයි, මගේ එඩ්වින්. දූන් ඔබට මාව අවශ්‍ය නොවන මේ වෙලාවේ මගේ මුළු හෘදයෙන් ම මම ඔබ කෙරෙහි ආදරයෙන් වෙසෙමි. ඔය තරම් කුරුණාවන්ත, ඔය තරම් තතු දන්නා, ආදරණීය එඩ්වින්, ඔබ පරිස්සම් වෙන්න. හැකිනම් මට සමාවෙන්න.''

ඇලිසන්.

රෝහලින් ලැබුණු අනික් ලියුමේ සඳහන් වූයේ ඔවුන්ට අතිශය කනගාටුවෙන් පැරඩේ මහතාට දන්වන්ට සිදු වී තිබෙන්නේ ඔහුගේ බිරිඳ 1866 නොවැම්බර් 30 වෙනි දින පෙනහැලිවලට විෂබීජ ඇතුළුවීමකින් මළ බවත් ඇ අවසන් හුස්ම හෙළීමට ළංවන තුරු ම ඇගේ නියම නමවත් සැමියාගේ ලිපිනය වත් නුදුන් බවත් ය. මේ සමග ඇති ලියුම එවා ඇත්තේ මරණ මොහොතේ දී ඇ කළ ඉල්ලීම පරිද්දෙනි.



කාණ්ඩය 9

1

අරුණු නැගීමත් සමග ලන්තානාව රන්වන් පැහැයෙන් කඳු අතර බබළන්ට වන. හිරු රැස් පහස පොකුරුවලින් බර වූ කෝපි උයන් ආලෝකයෙන් බැබළ වී ය. කම්කරුවන් ගේ මළ කෝපි ඇටවලින් ලහි ලහියේ පුරවනු ලැබෙත් ම කෝපි සාදන ගෙයි ඇට තළන යන්ත්‍රය නිතොරව ක්‍රියාත්මක වූයේ එයින් නැගුණු ශබ්දය ඒ උදය ශ්‍රී ශොභා මධ්‍යයේ ලන්තානාව ගීතවත් කිරීමෙහි සමත් වී. ප්‍රීතියෙන් උද්දම ව, මැක්ස් නැමති බල්ලාත් කැටුව, කාර්‍යාලය කරා ගමන් කළ ටොම් ගේ තාලයක් නැති සිවුරුහන් බැම ද ගීත රාවයට එකතු විය.

ගීයක් ගයද්දී ඇති වූ ස්වර බණ්ඩයේ දී හදිසියේ ම හේ නතර විය. කල්පනා හරිත වූ හේ, ''දෙවියන් වහන්සේට ස්තුති වේවා! මට පිහිටවුව මැනව.''

උචිත පද මාලාවක් ගැන සිතන්නට නො හැකි වූ ටොම්, ඇණ හිටියේ, සශ්‍රීක ව වැඩුණු කෝපි පඳුරකට සිය නෙත් යොමු ව, කියන්නට තැත් කළ දේ ද අමතක වූ හෙයිනි.

ටොම් කාර්‍යාලයට ඇතුළුවෙත් ම පොත් දෙස බලමින් ගොන්සාලේස් මඳ සිනහ පානු දැක ඔහුගේ කරට උඩින් එබිකම් කර තමා මැත දී කළ සටහන දෙස බැලී ය.

''මා කවදවත් බලාපොරොත්තු නුවූ තරමට හොඳයි. වාසනාව උදවෙන කොට හැරුණු අතේ ම පවතින අත්දම පුදුම යි.''

''මේ සැරේ හොඳ පැත්තට, සර්. මෙතෙක් කල් අපට තිබුණේ අ—වාසනාව.''

අන්‍යෝන්‍ය ආදරය හා අවබොධය හඟවන සුළු මඳ සිනහවක් දෙදෙනා අතර හුව මාරු විය. ඕවර්සියර් ගේ හිසට උඩින් පැවැති ඇඳුම් එල්ලන ඇණය දැක ටොම් ගේ ඇස් බැම නැටවුණි.

''ඉස්තරම් තොප්පියක් අරන් තියෙන්නෙ! මේ දවස්වල බොහොම ආඩම්බර වගේ, කසාද බඳින්න හේම කල්පනාවක් නැතුවා වගේ, ආ?''

ගොන්සාලේස් ලජ්ජා හරිත මුහුණක් පෑවේ ය. ''නෑ, ඇත්තෙන් ම නෑ සර්, න. . . . .න. . . . .නෑ සර්. . . . .නෙවිල් මහත්තයා පඩි වැඩි කළාට ස්තුතියි. ඒ එක්ක ම බාගෙ පඩියට වැඩ කරන්ට මම කැමති වෙනකොට, ඉතුරු බාගෙ මට ලැබිය යුතු යයි මම බලාපොරොත්තු වුණේ නෑ.''

''එය ලැබීමට ඔබ හැම අතින් ම සුදුසුයි මිනිහෝ.'' ටොම් ඔහුගේ පිටට තට්ටු කොට ජීවිතය හොඳය යන හැඟීමෙන් බැහැරට ගියේ ය. අන්තිමේ දී ගොන්සාලේස්ට ඒ හිඟ වැටුප් මුදල දෙන්ට ලැබීමත් ඔහුට සුදුසු වූ පරිදි සෑහෙන වැඩි වැටුපක් දීමට හැකිවීමත් ටොම්ගේ ඉමහත් ප්‍රීතියට හේතු විය.

ඔහු පිට වී යද්දී ම කවුළුව ළඟට එබී, ''මට කියන්ට මතක නැති වුණා. අද ආයි මං මේ පැත්තේ එන්නේ නෑ. අද නෝනා ගේ උපන් දවස''යි කී ය.

''ඇට සුබ දවසක් මම ප්‍රාර්ථනා කරනවා. සර්, මට සමාවෙන්න මා කුළුපග වෙන්න හදනවා නම්, ඈ ඉතා අගේ කළ අර උඩවැඩියා පැළේ මම යවා ඇති.''

උගුරේ හිඳිසි පැකිළීමක් දැනී ටොම් කෙළ ගිල්ලේ ය. කන්ද මුදුනේ කැලේ ගසකින් ගොන්සාලේස් ඉතා වෙහෙස වී ලබාගත් මේ උඩවැඩියා පැළය ඕවර්සියර් ගේ මහත් ප්‍රීතියට ඉවහල් විය. මල් හට ගත් එහි සුන්දර දර්ශනය ටොම් හා සේරා දුටුවේ ඊට ටික දවසකට පෙර පමණකි. දිග රිකිල්ලේ සම්පූර්ණයෙන් පිපුණු මල් තිස් එකක් විය. මල්වල හැම පෙත්තක ම ළා රත් පැහැ ගැන්වී තුබූ අතර මලේ සුදු පැහැති බොටුව දම්පාටින් දිලිසුණි.

''ඒ කළ වැඩේ හරි නෑ,''යි ටොම් කී ය. තව දුරටත් යමක් කීම අවශ්‍ය නො වන්නට මෙන් දෙදෙනා ගේ දෙනෙත් මුණ ගැසුණි.

සියුරු හඬලමින් ටොම් ආපසු ගෙදර ගියේ ය. ඩයනා දිවග දික් කරමින් සේරා ගේ කැම පිහාවා මල්වලින් ඉතා පරිස්සමින් සරසන අයුරු හේ දුටුවේ ය.

වත්තේ නමට සරිලන පරිදි ම ලන්තානා මලින් (ගඳපාන මලින්) මෙය සැරසීම ගැන හේ පුදුම විය. නොයෙක් අලංකාර මල් වර්ග එහි තිබුණු නමුත් මෙය තෝරාගත හැක්කේ ඩයනාට පමණකැ යි ඔහුට සිතුණි.

මේ අප්‍රකට මල් රිකිලිවල තද සුවඳ ඔහුගේ නාස් පුඩු විනිවිද ගියේ ය. ඔහු ඇඟිලි තුඩින් ඒ මල් රිකිල්ලක් ගත් විට එහි ගොරෝසු බවත් කොළ වල රළු ගතියත් දැනුණි. ගන්ධය අප්‍රිය වූවාටත් වඩා ස්පර්ශය ඊටත් අන්ත විය.

ඒ කොළ අතර සිහින් මල් රාශියක් විය. රත් හා දම් පැහැයෙන් ද රන් හා කසාවතින් ද මුසු වූ ඒ කුඩා මල් පොකුරු දෙස හිස පහත් කොට බලා විස්මය පත් වූ ඔහුට මෙවා මීට කලින් නො පෙනුණේ මන්ද යි ප්‍රහේලිකාවක් විය.

ජීවිතයත් මෙබඳු ම යයි ඔහුට කල්පනා විය. ලොකු දේ සෙවීමට යෑමෙන් අප සමීපයේ ම ඇති කුඩා දේ මඟ හැරී යයි.

ඩයනා තමාගේ විසිතුරු අත්කම දෙස බලා පස්සට වූවා ය. ''තාත්තේ, මෙහෙම හොඳ ද?'' යි ඕ නො ඉවසිලිවත් ව ඇසුවා ය. ''බොහොම තියෙන නිසා මේවා කැත මල් යයි සෝමා කියනවා. අර එහා බලන විට සිය ගණන් මල් තිබෙනවා. මම මේවාට කැමති,'' යි ඕ දරදැඩු ලෙස ම පැවසුවා ය.

''මමත්, දූවේ. එය පුදුම අදහසක්.''

ඔහු පහත් වී ඈ වඩාගෙන හිසට ඉතා උඩින් ඉස්සී ය. ඇගේ කුඩා කකුල් එල්ලෙන්ට වූයෙන් ඈ කොක් හඬ ලා සිනා සුණා ය.

''උඩට, උඩට තාත්තේ,''යි ඈ කෑ ගසත් ම ඇගේ ළා රත් පැහැති උණුසුම් දැත ඔහුගේ කර වටේ එතිණ. ඔහු ද ඈ බිම තබන්ට පෙර ඇගේ වත සිඹිමින්, නිතර නිතර තමා ඈ සුරතල් නො කළේ මන්ද යි කල්පනා කළේ ය.

මහත් ප්‍රීතියෙන්, උදේ කැම නිම වූ පසු සෝමා හා මැක්ස් නැමති බල්ලා ද කැටුව ඩයනාට ඇවිදින්ට යන්ට සලස්වන ලදී. මේ අතර බණ්ඩා බර පෙට්ටියක් උසුලා ගෙන පැමිණියේ ය. එය හැර බැලූ විට උපන් දින සුබ පැතුම් සහිත ව එඩ්වින් පැරඩේ එවා තුබූ ''ෂැම්පින්'' බෝතල් පෙට්ටියක් බැව් පෙනුණි.

මේ අවස්ථාවේ දී ඔවුන්ගේ මනැස යොමු වූයේ ඇලිසන් ගේ සේයාවට යි. ඇගේ මරණය ගැන ආරංචි වූ දවස ද මතක් විය. මුලින් ම ඈ ගැන කම්පා වී සිටි එඩ්වින්ට ස්ථිර වශයෙන් ඇගේ මරණය දැනගන්ට ලැබී, තදබල සිත් වේදනාවෙන් මිදී, ඔහුගේ සුපුරුදු වැඩ පළවල යළිත් යෙදෙන්ට විය. වරක් මොවුන්ට ලියූ පරිදි ඔහුට ජීවිතයේ ඉතුරු ව තිබුණු එක ම දේ එය යි.

සේරා මේසය ළඟින් නැගිට, දෙනෙතින් වැහෙන කඳුළු සඟවා ගැනීමට කවුළුව ළඟට ගියා ය. ''ඇලිසන් ගේ අන්තිම ලියුමේ හැම වචනයක් ම මට මතකයි. හියු ඒවා දන්නවාය කියා ඔබ හිතනවා ද?''

''මම හිතනවා එඩ්වින් ඔහුට ලිව්වාය කියා.''

''එඩ්වින් කොච්චර පුදුම කෙනෙක් ද? ඔහු කෙරෙහි ඇති තතු දැකීමේ හා වැටහීමේ ශක්තිය වෙන කවරකු තුළවත් මම දැකලා නෑ.''

ඔහුගේ විශෙෂ දර්ශනය පවා නො සැහී, මත්පැන් බීමෙන් පිළිසරණ ලබා ගැනීමට පවා සිදු වූ කාලය ඊට පසු ඇට මතක් විය. සමහර විට ඔහුගේ දුර්වලත්වයෙන් ඒ අවසාන ශක්තිය ඔහුට ලැබෙන්ට ඇත. එහෙත් ඒ ශක්තිය නිසර්ගයෙන් ම පැවතුණු එකකි. හියු සම්බන්ධයෙන් මෙය මීට වඩා වෙනස් ය. මක්නිසාද යත් ඔහු නිතර ම තාත්ත්වික භාවයෙන් මිදෙන්නට දඟලන බැවිනි. දැන් ඔහු පිට වී මාස පහක් ගත වූ නමුදු ඔහු ගැන කිසි ආරංචියක් වත් නැත.

ඇගේ සිතිවිලිවලට උත්තර දීමක් වශයෙන් මෙන් ටොම් මෙසේ කී ය. ''හා, ඒක නො වෙයි, මට අද උදේ හියු ගේ කොන්දෙස්තර සම්බ වුණා. හියු ළඟදී ම දවසක එන්ට පුළුවන් බැව් ඔහු කියනවා.''

සේරා ගේ නහරවැල් විනිවිද ගියේ ය. ඇට ටොම් දෙස බලා යන්තම් මඳ සිනහ පෑ හැකි විය. ''එයා ගේ විධියට මොකුත් නූනා වාගේ ඇවිත් දෝෂාරොපණයෙනුත් බේරෙන්ට පුළුවනි.''

ටොම් මෙසේ කී ය. ''ඩයනා ගෙ මේසේ සැරසිල්ල ගැන ඔබ මොනවද හිතුවේ—? අර ගඳපාන මල්? ඒ ඇගේ ම අදහස යි.''

''ඇගේ ඒ පියකරු වයසෙ, ඈ අල්ලන හැම දෙයක් ම මායාවකින් මෙන් ශොභමාන වන සුලු නේද?'' යි කියමින් සේරා කවුළු රාමුවට හේත්තු වූවා ය. ''මුතු මෙන් දිලිසුණු මැස්සකු ගේ පියාපතක්, අපේ රටෙ දම් පැහැති කැලෑ මලක රැඳුණු පිනි බිඳුවක්—මම හිතනවා කොබෙයියකුගේ පියාපතක් වෙන්ට ඇත කියා—මට ලැබී එය උගේ හැම නාරටියක් පාසා ම අලංකාර කළ පියාපතක් වූ හැටිත් බොහෝ කලකට පෙර දුටු කල්හි මට ඇති වූ පුදුමය දැන් මතක් වෙනවා. මේ සොයා ගැනීම්වල විස්මය අපි මතක නැති කර දමන්නේ කොහොම ද?''

''ඒවා කවදාවත් මතක නැති වෙන්නේ නෑ, සේරා.''

මඳ සිනහරැල්ලක සේයාවක් ඇගේ දෙතොලේ රැඳුණි. ''නැති වූයේ මොනවා දැයි මතක් වෙත් ම ඉඳහිට ඒවායේ ඡායාවන් මට පේනවා.''

වලාකුළකින් නැගී එන හිරු, කඳුකරය ආලෝකවත් කරත් ම, ප්‍රීතියෙන් උද්දාම ව ඈ හුස්මක් අදිනු ටොමට ඇසුණි.

''මේ දර්ශනය ඉතා පියකරුයි,'' ඕ කීවා ය. ''මේ ස්ථිර කඳුකර දර්ශනය, අපේ දුක් කෙතරම් නො වැදගත් බව පෙන්වනවා ද?''

ටොම් හෙමිහිට මෙසේ කී ය. ''ඒ කඳුකර පෙදෙසට මම ගරු කරනවා.'' ඔවුන්ගේ අත් එකිනෙකට බැඳ වෙළා ගත්හ.

ඇගේ නිල් වීත්ත ගවුමේ අත් වැළමිටිවලට ඉහළින් උස්සා කොතරම් ඉක්මනින් සිය ගතිය වෙනස් කොට ඔහු දෙස සිනහමුසු බැල්මක් හෙළී ද යත් ඔහුට ඈ තේරුම් ගැනීම පවා දුෂ්කර විය.

''මගේ මේ වැඩක් නැති උපන් දවස ප්‍රීතිවත්ට අපි කරන්නේ මොනවා ද? අපි නාවලපිටියට අසුන් පිට ගොස් හැමෝට ම තෑගි ගනිමු ද? එහෙම නැත්නම් අපිත් එක්ක රෑ කැමට එන්ටය කියා වැවිලිකාරයන්ට පණිවුඩ යවමු ද? හා ටොම් ඒක හරි ප්‍රීතියක්—නැත්නම් මොකුත් නො කර අපි ම හැකි තරම් විනෝද වෙමු ද?''

ටොම් ඇගේ කරට අත ද මුහුණ නමාගෙන ඒ දෙස බලමින්, ''හරි පොඩි කෙල්ල නේ ද?'' යි කී ය.

''එක දවසනෙ. හා ටොම්, ලෝකයේ කිසි ම කරදරයකින් තොර ව, මම සන්තෝෂයෙන්, ප්‍රීතියෙන් හා විනෝදයෙන් හිටියෙ කොයි කාලෙ ද?''

ඇගේ ස්වභාවයෙන් උද්‍යොග වූ ටොම්, ''හොඳයි, එහෙනම්, ඔබට ඕනෑ හැම දෙයක් ම අපි කරමු. නුමුත් වත්තේ අනිත් කොණේ කිසියම් දෙයක් ඔබට අද උදේ පෙන්නීමට මම කැමැති,'' යි කී ය.

ඔහුට පෙර ඕ සූදානම් ව සිටියා ය. ඩයනා සමග බරාඳයට ගිය ඕ, හදිසියේ ම විශ්වාස කළ නොහෙන තරම් පුදුමයකින් ''ටොම්, ඔබ මගේ අස්සයා ආපසු අරන් තියෙනවා,'' යි කියමින් තම සුරතල් අසුගේ කර වටේ අත් දමීමට ඈ පියගැට පෙළේ පහළට දුවන හඬ ඔහුට ඇසුණි.

එද උදේ සේරා කිසි විදියකින් වත් නවත්වන්ට නො හැකි විය. පළමුව, පතන්වල අසු පිටින් ගොස් ඒ අසු ගේ අඩි පාරවල් නැවත බලන්නටත් ඊළඟට ඇළ අයිනේ ගසක නැමී තුබූ අත්තක වල් උඩවැඩියා මල් කඩා ඇගේ පටියේ ගසා ගන්නටත් ඈට ඕනෑ විය.

ඇගේ මනාපය පරිද්දෙන් ඈට සංචාරය කරන්ට ඉඩ හැර ටොම් ඉවසිල්ලෙන් ඈ පසු පස්සේ ගමන් කළේ ය. තමාට යමක් පෙන්වීමට සූදානම් වූ ටොම්ට ඊට ඉඩ නො තබා, කළේ වරදැයි ඈට සිතෙන තෙක්, ඔවුහු ගමන් කළහ.

''මේක අලුත් පාරක් නේ ද ටොම්?'' වත්තේ ඈ කලාතුරකින් යන පෙදෙසකට මඟ පෙන්වමින් හේ හිස සැලී ය. මෙහි කෝපි ගස්වලට උඩින් මුදු මට්ටමේ සිට අඩි 3000 කට ඉහළින් ස්වාභාවිකා කැලෑ ගස්වලින් ආරක්ෂිත වූ මනහර දර්ශනයක් ලබාගත හැකි වූ සානුවක් පිහිටියේ ය.

වත්තේ ඉහළ ම තැන වූ මෙතැනින් එකිනෙකට සම ව පිහිටි ගිරි ශිඛර විය. එතැන් සිට බටහිර දෙසින් බැලූ කෙනකුට ළඟ ම පිහිටි කඳු කපල්ල ඔස්සේ පහත රට බිම්මානයේ රුචිර දර්ශනය අනාවරණය වී.

සානුවේ එක් පසෙක තුරු රැසින් සෙවණ ලද මහ ගලකි. ඉන් පහළ විසිතුරු මල්කම් කළාක් මෙන් පැතිරි තුබූ පරඬලා පත් ය. ඒ අසල ම දේ දුනු රැසින් පහස ලැබූ කුඩා දිය ඇල්ලකි.

මේ සා සිරි සොබාවක රස විඳිනු බැරි සේ මෙන් සේරා හිස නමාගෙන නිහඬව සිටගත. හෙමිහිට අසුපිටින් බැස විසල් කඳු පෙළ ද පියගැට පෙළක් සේ දිස් වූ ලියැදි ද, නිල්මිණි සෙයින් බබළන දිය කඳින් පිරි ඇත විලක් ද සුදෝ සුදු දගැබක් ද දෙස ඕ වශීකෘත ව බලා සිටියා ය.

''මුළු වත්තෙන් ම දර්ශන රමණීය ස්ථානය මෙය යි. මෙතැනට බොහෝ වාරවල නා එක පුදුමයි.''

ටොම් අසුගෙන් බැස ඈ ළඟින් සිට ගත්තේ ය. ''සේරා, ලංකාවට ඒම ගැන ඔබ කවදවත් කනගාටු වුණා ද?''

ඕ, සැණෙකින් හිස හරවා ''මා සිහිනෙන් සිතුවාටත් වඩා සතුටින් මෙහි ඉන්නවා,'' යි කීවා ය.

''ඔබට හිරිහැර කම්කටුළු එමට තිබුණා.''

''පෙම්වත, මගේ ප්‍රීතියට හා උනන්දුවට හේතු වූයේ ඒ හිරිහැර කම්කටුළු තමා. යටත් කළ යුතු අලුත් දේවලින් අපට අභියෝගයක් නුවුණි නම්, අපි මොන විදියේ මිනිස්සු වන්නේදැයි මට හිතෙනවා.''

ඔහුට මේ ප්‍රහේලිකාවක් වූ බව ද ඒ කවදවත් අවබෝධ නො වන බව ද ඕ දුටුවා ය. අන්තරායදයක වැඩට ඇගේ ඇති ප්‍රිය ඔහුට පෙනෙන්නේ ධෛර්යය ලෙස ය. මහත් ආයාසයකින් ඈ යටපත් කරගත් ඇගේ චිත්තාවේගයන්ගෙන් මිදීමට මෙන් ම සංයමයෙන් තොර සිය හැඟීම් ප්‍රකාශ කිරීමෙන් වැළකීමට ද ඔහු දැක් වූ කැමැත්ත ඕ දත්තා ය. වචනවලින් කිව නො හැකි හැඟීම්වලට හිමිකම් ඇති ටොම්! තෘප්තිමත් නො වූ ඇගේ ආස්වාද රතිය ටොම්ට කිසි කලෙකත් නො දැනේවා!

''අප අද මෙහි නිර්මාණය කරන දේ අපෙන් පසුව ද බොහෝ කල් පැවතේ,'' ඕ විනීත ව පැවසුවා ය.

මෙරටට එන නෞකා ගමනේ දීත් ඈ ඔහුට කීවේ බොහෝ සෙයින් මේ හා සමාන දේ ම ය. ඒ උසස් සිතුවිල්ල නිසා ලන්තානාව දියුණු කිරීමට ඔහු ඉටා ගත්තේ ස්වාර්ථය පිණිස ම නො ව ඩයනා ගේ ද, රහසින් දෙදෙනා ම පැතූ පුතු ගේ ද නො දත් අනාගතයේ යහපත පිණිස ය.

ඔහුගේ සිතුවිලි දැනගත්තාක් මෙන් තව දුරටත් ඕ මෙසේ සෙමින් කීවා ය. ''විවාහ වූ වෙනත් බොහෝ වතුකාරයන් මෙන් අපේ රටට ආපසු යන්ට පමණක් සෑහෙන සල්ලි හම්බ කරන්ට ඔබ හිතුවේ නෑ. ඔබ වවා තිබෙන්-

හේ අනාගතය සලකා ගෙන යි. කැලේ ගසක් කපා දැමූ හැම තැන ම ඔබ පලතුරු ගස් හා ලීදඬු ලබා ගන්ට පුළුවන් ගස් වැව්වා. අපේ පලක් නැති පතන ඉඩමේ පවා සුළං බඳන කපුරු ගස් වවා තිබෙනවා—'' යි ඕ මඳ සිනහ පා,, ''මගේ රෝස මල් පාත්ති වැවීමටත් ඔබේ වටිනා ඉඩම මට දුන්නා. ඔබ ලන්තානාව ගැන කල්පනා කළේ අපේ වාසස්ථානය හැටියට මිස, වෙන අය මෙන්, නිකම් වෙළඳ ව්‍යාපාරයක් හැටියට නො වේ,'' යි කීවා ය.

''ඔබ කදිම කෙනෙක්, සේරා,'' යි හේ බැගෑපත් ව කී ය.

අමුතු හොඳක් ඇට නැති බව යළිත් කීමට ඕ උත්සාහ කළා ය. බිම ඇද වැටෙන්ට පුළුවන් තරම් ඉහළින් ඇ තැබීම ගැන ඕ අකැමති වූවා ය. හේ තද කල්පනාවක යෙදී සිටියේ ය. ''ඔව්, අපේ නිර්මාණය අනාගතය සඳහා තමා,'' යි හේ පැවසී ය. ''ඒ ගැන කියන්ටයි ඔබ් මා මෙහි ගෙනාවේ. ඒ තමා ඔබේ උපන් දින තෑග්ග.''

ඇ විචාරාත්මක ව ඔහු දෙස නෙත් හෙළුවා ය.

''අප සිටින මේ ඉඩමේ ඔප්පු තියෙන්නේ ඔබේ නමින්. අපි ගේ හදන්ට යන්නෙත් හරියට ම ඔබට ඕනෑ විදියට යි.''

විශ්වාස කළ නො හැකි වූවා සේ ඔහු දෙස ද, සීමාරහිත ව පෙනෙන ක්ෂිතිජය දෙස ද බැලූ ඇගේ දෙනෙත් කඳුළින් පිරුණි. විනිවිද පෙනෙන වීදුරු කවුළු ද දූවිලි නැති, ගෝනුස්සන් නොරැඳි, නො තෙමෙන වහළක් ඇති නියම ගෙයක්? මීට පසු පීල්ලෙන් හෝ නාන කාමරේ බාල්දියකින් නෑමක් නැත? මිටි නමුත් ඉඩ කඩ ඇති ආගන්තුක කාමර ද, හැම කාමරයකින් ම අවට සුන්දරත්වය බලන හැකි පළල් වීදුරු කවුළු ද ඇති ගෙයක් ඇට දැනට ම පෙනුණි. බොහෝ විට ඇගේ සිතේ ඇඳී පැවැත්තා සේ ම දැනට ම එය ඇ ඉදිරියේ මැවී පෙනුණේ, හරියට ම එහි යෑමට ඇට අඬගසන්නාක් මෙනි.

ටෝම් රහසිගත ව ආරාධනා කළ අමුත්තන් අසු පිටින් එත් ම ඔව්හු බංගලාවට සේන්දු වූහ. සෝමා ගේ ද උදව් ඇතුව, බණ්ඩා මුළුතැන් ගෙයි කෑම සූදනම් කරමින් සිටියේ ය. ගමින් ගෙනා පුළුස්සන ලද ඌරු නාම්බකු ද, තරබාරු කුකුළු පැටවු ද, වත්තේ එළවළු ද, සේරා ගේ පට්ටියේ ම සෑදූ ක්‍රීම් සහිත ලොකු පලතුරු සලාදයක් ද තිබුණි.

එද සවස, මාස ගණනකට පසු ව, සේරා ළා කහ පාටැති ක්‍රිනෝලීන් සේද ගවුමක් ඇඳ, එදිනම උදේ ටොම් දුන් රතු ගලක් බැඳි ලොවාදුව පැළඳ ගත්තා ය. නැවතත් ඇ සිය දුඹුරු කේශ කලාපය දිලිසෙන තුරු පීරා, ඒ සිනිඳු කෙස්වලින් කියඹුවැල් ගොතා මූණ දෙපස වැටෙන්ට ද ගත්තා ය.

ඩයනා ඇහිල්ලක් කටේ දමා උරමින් ඇ දෙස ඉතා ඕනෑකමින් බලා සිටියා ය. ඇගේ ඉමක් කොනක් නැති කතාව, නතර වී තිබුණි. ඕ නෙත් අයාගෙන සිටියා ය.

සේරා ගේ මඟුල් දවසේ ලැබුණු, අලංකාර කොශේය රෙද්දක් අතුළ මේසය වටේ දෙළොස් දෙනෙක් වාඩි ගත්හ. මේසය මත වූ විසිතුරු ලෙස අතු විහිදුණු ඉටිපන්දම් පහන ඇගේ මිත්තණියන්ගෙන් උරුම වූවකි. ආගන්තුක සත්කාරයෙහි යෙදෙමින් ටොම් මේසේ එක් කෙළවරක වාඩිගෙන සිටි අතර, සේරා අනික් කෙළවරේ ප්‍රීතියෙන් උදම් ව, ශාන්ත ව වාඩි ගෙන සිටියා ය. සේරා මේ තරම් පියකරු ව සිටි අවස්ථාවක් මින් පෙර නො වී යයි ඇ දෙස නෙත් හෙළූ පිලිප් ක්‍රෝලි කල්පනා කළේ ය. නෙවිල් ගේ බිරිඳ මෙතරම් ආකර්ෂණීය ස්වභාවයකින් මින් පෙර නො දුටු විරූ යයි මයික් ඔපැරල්ට හැඟුණි.

ඉටිපන්දම් එළිය විහිදෙත් ම මෙහි සිටි පිරිමි එකොළොස් දෙනා ම තම තමන් කැමැති සෑම ලක්ෂණයක් ම ඇ කෙරේ දුටහ. ඇගේ ප්‍රීති රසයෙන් කොටසක් ඒ සැමෙකකුට ම ඕ දුන්නා ය.

මේසය කෙළවර සිට ටොම් නැගිටටේ ය. ''මම දූන් මේ හැම දෙනාද සවුදිය පුරන්ටයි යන්නේ,'' යි ඔහු හෙමිහිට කීයෙන් නිශ්ශබ්දතාව පැතුරුණි. සියලු දෙනා සේරා හා ටොම් දෙස බැලූහ.

''අපේ හොඳ මිත්‍ර එඩ්වින් පැරඩේ සේරා වෙනුවෙන් බොන්නටැයි කියා ෂැම්පින් තොගයක් එවා තිබෙනවා. ඒ නිසා මම දූන් සේරාට මේ දෙන කොට, ඔබ සැම ද වීදුරු පුරවා ගන්ට ඕනෑ.''

බණ්ඩා බීමවලින් වීදුරු පුරවන අතර ඔවුනොවුන් අතර සාකච්ඡාවක් පැවතුණි. ඊළහට හැම දෙනා එකවිට ම නැඟී සිටි කල්හි අලුත් කට හඬකින් ගිලිහුණු වදන් මෙසේ යි: ''යකාට ගියත් ටොම්, මමත් ඇ වෙනුවෙන් බොන්ට කැමතියි!'' හියු නෙවිල් කාමරයට ඇතුල් විය.

2

හැම දෙන ම ඉටි රූ තැබුවාක් මෙන් නිසොල්මන් වූහ. කිසිවෙක් නො සෙල් වූණේ ය. කිසිවෙක් කථා කෙළේ නැත. එහෙත් හියු නෙවිල් අසු පිට යෑමේ උපකරණ කිහිලි ගන්නා ගෙන ඉදිරියට අවුත් ටොම් ළඟ සිට ගනු සියලු දෙනා ම බලා සිටියෝ ය.

''මම යන්තම් වෙලාවට ආවා,'' යි හේ කී ය. ''මට බොන්ට දුන්නොත් හොඳ යයි මගේ මස්සිනාට පෙනී ගියොත්.'' ඔහු මදක් වැනෙන බවත්, ඇගේ සැමියා ගේ මුහුණ කෝපයෙන් දිලිහෙන බවත්, තව මොහොතකින් මහ අවුලක් වෙන්ට පුළුවන් බවත් සේරාට පෙනී ගියේ ය. ඕ තවත් වැම්පේන් වීදුරුවක් පිරවීමට බණ්ඩාට හෙමිහිට සංඥවක් කළා ය.

‘‘ටොම්, මම බලා ඉන්නවා,’’ යි ඕ ප්‍රීති සහගත ව පැවසුවා ය. ඇගේ කටහඬින්වත් ස්වභාවයෙන්වත් ඇගේ හැඟීම කුමක් දැයි කාටවත් නො දැනුණි.

‘‘ඔන්න සේරාට සුබ පැතුම්,’’ යි කියමින් ටොම් බීම බොනවිට ඔහුගේ අත සෙලවුණේ යන්තමිනි.

‘‘ඔන්න සේරාට,’’ යි අනික් අය සුබ පතා බොන්ට වූහ. ඔවුන්ගේ නෙත් නෙවිල්ලා දෙසට හැර අනික් හැම දෙසට ම යොමු වුණි.

ඒ අයගේ කටහඬ නැසී යත් ම ‘‘ඔන්න සේරාට’’ යි හියු නෙවිල් කියා හිස් වීදුරුව කොතරම් තදින් හප්පා තැබීද යත් එයින් වීදුරුව දෙදරුම් කෑය.

නැවතත් කලබලයකට මුග පෑදෙන බියකරු ලකුණු පහළ වූ නමුත් සේරා ගේ ශාන්ත කට හඬින් එය යටපත් විය.

ඕ නැගිට සිටිමින් ‘‘බොහොම ස්තූතියි,’’ කීවා ය. ‘‘ඔබ සියලු දෙනාට ම ආපසු සුබ පතමින් මම බොනවා.’’

දැන් කවුරුත් රැල් බුරුල් ඇරගෙන පුටු එහාට මෙහාට කර මේසය වටා වාඩිගත්හ. මෙවර දහතුන් දෙනෙක් සිටියෝ ය. කෙසේ නමුත් හියු නෙවිල් සේරා ළඟ ම අසුනේ වාඩි ගත්තේ ය.

එවිට ඔහු බොහෝ සෙයින් බීමත් ව සිටි බවත්, සාමාන්‍යයෙන් ජීවිතය මුළුල්ලේ ම බොමින් සිට දවසක පදමටත් වඩා බීමෙන් වෙරිමත් ව නිහඬ ව සිටින ලීලාවක් දැන් මොහු කෙරෙහි ද ඇති බවත් ඕ දුටුවා ය. එමෙන් ම කිසියම් හේතුවක් නිසා ඔහුගේ මේ දුර්වලත්වය ගැන, ඕ වෙනද නැති තරම්, ඔහු කෙරෙහි අනුකම්පා සහගත වූවා ය.

‘‘ඔබ ඉන්දියාවේ සිට ආවේ කවද්‍ද ද?’’ යි ඔහුගෙන් සෙමින් ඇසුවා ය.

මහත් සැලකිලි සහිත ව ඇහුම්කන් දෙමින් හේ ඉදිරියට නැමුණි. ‘‘ඊයේ සවස. මගේ කන්කානියාට ගොන්සාලේස් හමුවුණ නිසා; ඔබේ උපන් දවස බව අහම්බෙන් දැනගත්තා. ඉන්දියාවෙන් ඔබට තෑග්ගක් ගෙනාවා—ඒක මගේ පෙට්ටිවල.’’

‘‘බොහොම ස්තූතියි,’’ ඕ කීවා ය.

හියු හිස ඔසවා මුළු මේසය දිගට ම නෙත් හෙළී ය.

‘‘හය මාසයක් තරම් කල් රටින් පිට හිටලා ඇවිදිනුත් නුඹලා හැම දෙනාගෙන් ම මට ලැබෙන්නේ යකාගෙ ආචාරයක්.’’

‘‘ඔබේ කතාව බලාගෙනයි, හියු,’’ ටොම් කී ය.

''මම සමාව ඉල්ලනවා—ඔබේ බිරිඳගෙන්. ඔබෙන් නො වේ. ඔබ එක්කෙනකුගෙන්වත් නො වේ.'' ඔහු නැගිට වැනෙන්ට පටන් ගති. මුහුණ රත් පැහැ ගැන්වී නො ඉවසිලිවන් ගතියකින් මොහු ළඟ ම වාඩිගෙන සිටි මයික් ඕ'පැරල් ඔහුගේ විශාල අත දිගුකොට කාටත් ඇසෙන හඬකින් ''නිකන් හිටපන්, පල් මෝඩයා,'' යි මිමුනුවේ ය.

''නිකන් හිටින්ට—මොන රුදුවකටද?'' යි හියු කොඳුලේ ය. ''මං ආවේ මගේ මස්සිනා ගේ බිරිඳට උපන් ද සුබ පතන්ඩ. කාටවත් කවදවත් නො ලැබුණු තරම් කදිම බිරිඳක්. මගේ —යස මස්සිනා ඇ කොහොම හොයා ගත්තා ද. . . . . හා කමක් නෑ. කොහොම හරි හොයාගත්තනෙ. නුමුත් ඔහුගෙන්වත් වෙන කිසි කෙනෙකුගෙන්වත් අපහස විඳින්ට මං කැමති නෑ, ඇහුණද? මෙතනට ආවෙ හොඳ හිතින් මයි. . . .''

''වාඩිවෙන එක හොඳයි, හියු,'' යි ටොම් පැහැදිලිව ම කී ය.

''ඔව්. . . . . .වාඩිවෙන එක හොඳයි! මගේ යස මස්සිනා කියන එක කරන්න. . . . .''

කිසි ම ශබ්දයක් නැතිව හියු මේසය දිගට ම ඇවිද්දේ ය. මේ දෙදෙනා නිශ්ශබ්ද ව ඔවුනොවුන් දෙස රවා බැලූහ.

''මගේ ම කැම මේසේ දී මම ඔබ සමග දබර කරන්නේ නෑ,'' යි ටොම් කී ය.

''ඇයි? දේසනාවක් නැද්ද?'' හියු තමාගේ වචන දූත් හොඳින් සංවර කරගෙන සිටියේ ය.

''නෑ. ඇයි මම මොකට ද? මට කනගාටු, කවදවත් නැතුව අද වැනි දවසක මෙහෙම සිද්ද වුණ එකයි. කොහොම වුණත් අපේ විරුද්ධකම් රහසිගත ව අපි බේරා ගනිමු. එහෙම බැරි නම් නිකම් ඉඳිමු.''

''මට දේසනා කරන එකයි ඔබේ රස්සාව. වයස් ගතවීමත් සමග ඔබේ ඉවසීම වැඩිවෙලා වත් ද?''

ඉතා අමාරුවෙන් යටපත් කරගෙන සිටි ටොම් ගේ ඉවසිල්ල අතුරුදහන් වුණි. ඔහුගේ අත මිට මෙලවී, නහර ඉලිප්පී කෝපයෙන් පුපුරන බව බලා සිටි අය දුටහ.

''ඉවසිල්ල? ඔබේ හැසිරීමට මම ඉවසනවා යයි කියතොත්—නෑ. නුමුත් ඒ ගැන විනිශ්චයකරන්ට මම ලෑස්තිත් නෑ.''

‘‘මොන හොඳ නො හොඳ තේරීමක් ද?’’ යි හියු පිළිවදන් දුනි. ඔබ කොහෙත් ම නො දන්නා, මම දැන් කතා කරන්ට අදහස් නො කරන කරුණු ගැන ද? ඕපාදූප, මෙහි ඉන්න මා ඉදිරියේ කතා කරන්ට කාටවත් ධෛර්‍ය්‍යයක් නැති ඕපාදූප?’’

සේරා වහා නැගිට්ටේ ය. ‘‘ඔබට පමණක් අයිති දේ ගැන ටොම්වත් මෙහි ඉන්න කිසි කෙනෙක්වත් කතා කරන්ට යන්නම්වත් කැමැත්තක් නැති බව මම හොඳින් ම දන්නවා.’’ ඇ ඔහු දෙස බැලූ සැටි කාමරේ අන් කිසි කෙනකු නො සිටි ලෙසක සේ ය. ‘‘මිනිහකුට තමාගේ සැටි වළක්වන්ට බැහැ,’’ යි ඕ සෙමින් කීවා ය. පුදුම ලෙසින් පැවැති නිශ්ශබ්දභාවය මධ්‍යයේ, අමුත්තන් දෙස මඳ සිනහ පා ඕ තනිව ම වත්නට ගියා ය.

ඇගේ පියකරු අඹගස සෙවණේ වාඩි වී නවාගත් දැත සිය හිස රඳවාගෙන තරු බබළන අහස දෙස නෙත් හෙළා ඇ සිටින විට, හියු එහි ඇ සිටින බව දැනගත්තේ බොහෝ වේලාවකට පසු ව බව ඇට දැනුණි.

ගලක් මෙන් නිසල ව, හියු ඇ දෙස බලාගත් වන ම සිටියේ ය. ඔහුගේ අවිනීත කටහඬ අසමින් ඕ වෙවුලන්ට වූවා ය.

‘‘ඔබේ උපන් දින උත්සවය මම නරක් කළා, එහෙම නේ ද? ඇයි ඒ බව නො කියන්නේ?’’

‘‘දුප්පත් හියු. . . . . .’’

‘‘මොනවා, ඇයි එහෙම කියන්නේ? ඔබෙන් වත් වෙන කාගෙන් වත් මට අනුකම්පාවක් ඕනෑ නෑ.’’

‘‘ඔබ ඔය තරම් දිවුරන්නේ මොට ද?’’ ඕ ගවුම හරිගස්සා ගනිමින් සිට ගත්තා ය. ඇගේ දෙ දණ දුබල බව හදිසියේ දැනෙන්ට වූයෙන් ඇ කලින් සිටි තැන ම සිටියා නම් වඩා හොඳ යයි ඇට සිතුණි. ‘‘මම මගේ අමුත්තන් වෙතට නැවතත් යන්ට ඕනෑ. . . . .’’

‘‘ඔබේ ආගන්තුකයන් ඔබේ ස්වාමියාත් එක්ක කෝපි ගැන කතාකරමින් හරි වැඩ. කෝපි මිල ඉතා ඉහළට නැඟීම, ඇන්ගස් මැක්ලොයිඩ් ගේ අලුත් කෝපි ගබඩාව, මයික් ඔපැරල් ගේ කම්කරු ආරාවුල්, කෝපි ගසට සෙවණ ලබාදීම හෝ එළිමහනේ තිබීම ගැන ඇති වැදගත් ප්‍රශ්නය, අතිරේක වැවිලි ගැන ක්‍රෝලි ගේ කෙළවරක් නැති කතාව, හා ආචාර්‍ය්‍ය ත්වයිට්ස් කෝපි ගැන පවසන අදහස් යන මේවා ගෑන තොර තෝංචියක් නැති කතාවල්. ඔව්, සේරාත් යන්න. ඔවුන්ට එක්කහුවෙන්න. ඒ අයත් බොහොම සන්තෝෂ වෙනවාට අනුමානයක් නෑ. මම ඔබට එක අවවාදයක් දෙනවා. තිත්ත කෝපි තමා ඔබට විනා කරන හතුරා.’’

3

කොළඹ හොඳ ම ගෘහනිර්මාණ ශිල්පියා ටොම් ගේ අලුත් නිවසෙහි සැලැස්ම සකස් කෙළේ ය.

සේරා කීවාක් මෙන් මෙය සාදනු ලබන්නේ ඉඩමේ හැඩය අනුව යි. මහ මැදුරක් නො වූවත් ඒ නිසා ඉඩමේ රුචිර දර්ශනය ඔප නැගෙනු මිස කිසි ලෙසකින් එයට හානියක් නො වනු ඇත. ‘‘මෙය කදිම ගෙයක් වේය,’’ යි ගෘහ නිර්මාණ ශිල්පියා කීවේ සැබවකි.

ගෙයි තුන් පැත්තක කුළුණු ඉස්සූ බරාඳය අඩි 20 ක් පළල් ය. ඉතා ළ අලංකාර දර්ශනය ගෙන දෙන චතුරශ්‍රය, මතු සකස්වන උයන අද්දරට ඇරෙන වීදුරු කවුළු සහිත සක්මනකින් යුක්ත වෙයි. සාලය හා කෑම කන කාමර දෙසට වැටුණු ප්‍රන්ස කවුළුවලින් ද මේ නිවස අලංකාර වන්නේය.

නො වැළැක් විය හැකි පමාවීම් හා බලාපොරොත්තු නැති දේද සිදු විය. දවසක හුණු නැත. තවත් දවසක ඕනෑ තරම් හුණු ඇතත් සෑහෙන පමණ වැලි නැත. තුන්වෙනි දවසේ ගල් මදි ය. ඊට පසු ගල් ගෙනෙන්ට ගිය කම්කරුවෝ බර උසුලාගෙන කෙඳිරිගාමින් ඒවා ගෙනෙන්නාහ. කන්ද මුදුනේ පෙදරේරුවන් දෙදෙනෙකු විටින් විට බුලත් හපමින් නො සැලකිල්ලෙන් මෙන් ඒ ගල්වලට දුන් කුළු ගෙඩි පහරින් බොහෝ විට ඒ ගල් කැඩුණාට වඩා නො කැඩී ගියේ ය. ගල් ගෙනෙන අය ද දවස් කීපයකට පසු වැඩේ එපා වී පලා ගියහ.

දවසින් දවස කාලය ගෙවුණේ මෙපරිද්දෙනි. එහෙත් මේ ප්‍රමාදවීම් රාශිය මධ්‍යයේ බිත්ති පැන නැංගේ ය. කවුළු නියමිත ස්ථානවල සවි කරන ලදී. ගලින් බැඳි දුම් කවුළු ද තැනී අන්තිමේ දී සිතේ ප්‍රීතිය දනවමින් රත් පැහැති උළුවලින් වහළ සෙවිලි ලද්දේ ය.

1868 වර්ෂය අවසානයේ දී ටොම් ගේ නව නිවසේ වැඩ කෙළවර විය.

පළ පුරුදු නැති වතු කම්කරුවන් සෙමින් ගේ තනද්දී, සේරා ඇගේ අලුත් උයන සකස් කරන්ට වූවාය. නන්වන් පැහැයෙන් පිපුණු කුසුම් රැසින් ගැවසී මල් පාත්ති ද, පියගැට පෙළක් මෙන් සැදුණු තණ බිම ඔබබෙහි පන්ගස් වැවෙන ඉවුරු සහිත නෙළුම් විලක් ද විය.

ඔවුන් අලුත් ගෙට ගෙවදුණු ද පැවැති තරම් ශ්‍රී ශෝභාවක් ඈ ලන්කාෂාවේ මීට පෙර නුදුටු විරූ ය. ප්‍රබෝධජනක සුළඟත් මුදු හිරු රැසත් නිසා දෙසැම්බරය නිතර ම වතුවල පියකරු මාසයක් විය. එද ගිරි කුළුවල දිස් වූ උදර ලීලාව ද, දැකුම්කලු බව ද, තව ටික කලකට කාලගුණය හොඳින් පවත්නා ලකුණු දක් වී ය.

මිථ්‍යා ඇදහිලි විශ්වාස කරන ගොන්සාලේස්, ''අලුත් ගෙට හොඳ දවසක යන එක හොඳ,'' යයි කී ය.

රාමසාමි කන්කානියා භාග්‍යය උද වීමට අලුත් දොර ළඟ අඹ කොළ එල්ලී ය.

එහෙත් මහලු සිංහල ගම්මුලාදැනියා වෙන දවසක් තෝරා ගැනීමට ටොම්ට ඇවිටිලි කළේ ය. නොයෙක් ක්‍රමවලින් ටොම් ගේ හා සේරා ගේත් උපන් දවස් සොයාගත් හෙතෙම ඔවුන්ගේ කේන්ද්‍ර අනුව, ''ඔබට ග්‍රහයෝ ඉන්න හැටි හොඳ නෑ,'' යි කීය. ''අද සුබ නෑ. ග්‍රහයෝ බලවත්. . . . .''

ටොම් සිනාසුණි. ''මට ඉඩම ඊට වඩා බලවත්. පරණ අවුරුද්ද ගෙවෙන්ට ඉස්සෙල්ලා ගෙට ගෙවදින්ට හැකිවීම මට භාග්‍යයක්.''

''සමහර විට ඉඩම වඩා බලවත් වෙන්ට පුළුවනි,'' යි මහලු මිනිසා කනගාටුවෙන් පැවසී ය. ''සමහර විට ඊට වඩා දුරින් ග්‍රහයන් දෙස බැලීම හොඳ වෙන්ට පුළුවන්.''

ඔවුන් මෙපමණ කල් සිටි මානා අතුවලින් සෙවෙණි කළ පරණ ගෙපැලින් ටොම් අන්තිම බඩුමුට්ටු ගෙන යන විට සේරාට බලවත් වේදනාවක් දැනුණි. ටොම් හා ඈ ද සිය තුරුණු වියේ පෙම් පසින් බැඳී, නොයෙක් දුෂ්කරතාවලට මුහුණ පා ඒවා මැඩ පවත්වාගෙන, ජයගත්තේ මෙහි දී ය. මේ ගෙපැලේ ලී දඬු වෙයන් කා වහළ සෙවෙණි කළ අතු අව්වෙන් හා වැස්සෙන් දිරා පත්වී යන විටත් ඔවුන්ගේ ඒ ආද්ධ්‍යාත්මික ශක්තියේ ලක්ෂණ මාත්‍රයක් වුව ද එහි නො නැසී පවතිනු ඇත.

මඳ වේලාවක් ඕ එහි ඉදිරිපස සිටගත්තා ය. කැලේ ගිනි තබා විනාශයට පත් වූ ගස් කොළන් හා නො සලකා හරින ලද කෝපි ගස් මධ්‍යයේ පාළු පිටියක් මෙන් පළමුවෙන් මේ වත්ත දුටු සැටි ඕ සිහිපත් කළා ය.

ඉක්බිති ඕ ටොම් සමග ඔවුන්ගේ අලුත් ගෙදරට හෙමිහිට ගියා ය. හිරු රැසින් නැවෙන කඳු මුදුනේ සිට නෙත් හෙළූ ඔවුන්ට අවට දක්නට ලැබුණේ රත් පැහැති ගෙඩි ගැවසුණු, මනාසේ වැඩුණු කොළ විහිදුණු, අක්කර ගණන් කෝපි ගස් ය. දැන් ඒ ස්ථානයේවත් ගෙඩිවලත් තිත්ත බවක් නැති සේ පෙනිණි.

ඇගේ සිත ප්‍රීතියෙන් පිනා ගියේ ය. ඔවුන්ගේ මහත් අභිලාෂය වූ පරිද්දෙන් ම, තව මාස කීපයකින් තවත් දරුවකු ලැබීමේ ලකුණු ද පහළ වී තිබුණි.

ඇගේ මේ ප්‍රීතිය අතර ම, මේ දවස්වල සේරා කෙරෙහි ශාන්ත ස්වභාවයක් දක්නා ලදී. මේජර් ඩන්කන් දොස්තර මහතා ඈ බෙහෙවින් පරිස්සම් විය යුතු බව දන්වා තුබුණේ ය. ඇගේ ස්වාභාවික හැසිරීමට ඇති වූ මේ බාධාව නිසා ඕ ඉඳහිට කනස්සලු වූවා ය.

මේ දවස්වල ලන්තානාවේ පැවැති අභිවෘද්ධිය නිසා ටොම්ට පෙර කවදවත් නො වූ තරමට වැඩ බහුල විය. ඉඩමට පිටත් වූ උදෑසන පටන් ඉතා වෙහෙස මහන්සි වී සවස ගෙදර එනතුරු ඔහු ඇට දක්නට ලැබුණේ අතුරු පස සංග්‍රහයක් ලැබීමට දවාලේ ආ ටික වේලාවේ දී පමණකි. සවස් වන විට ගොන්සාලේස් සමග වැක් රෝලයත් වෙනත් නොයෙක් ගනුදෙනුත් බැලිය යුතු වූයේ ය. මේ හැර දැන් ටොම් සමාදන විනිශ්චයකාරයකු ව සිටි බැවින් වත්තේ වැඩ හැර නවත් රාජකාරි ද මහත් රාශියක් වූ නිසා ලියුම් ද විශාල ගණනක් ලිවිය යුතුව තිබුණි. සති අන්තය ගම්වැසියන් ගේ ප්‍රශ්න නිරාකරණය කිරීමට වෙන් කරන ලද්දේ ය. ආරාවුල් පවත්නා තැනට ම අසු පිටින් ගොස් හේ බොහෝ විට යම් යම් ප්‍රශ්න නිරවුල් කළේ ය.

ටොම් ගේ මුළු ජීවිතය කැප වූයේ ලන්තානාවට ය. මේ වත්තත්, එහි පාමුල ගමත්, වැවිලිකාරයන් ගේ බැරෑරුම් ප්‍රශ්නත් හැර ටොම් ගේ සැලකිල්ල යොමු වූ දෙයක් වෙන නැත. කම්කරු වැටුප් ගෙන ඊමට මාස් පතා නුවර යෑමත් ඉදහිටලා නමුත් කොළඹ යෑමත් ඔහු එන්ට එන්ට ම නුරුස්සන්නට විය.

ලන්තානාවේ දුෂ්කර කාලය දැන් ගෙවී ගොස් ය. වත්තේ කෝපි පල ගෙන, ඔහු පිහිටු වූ අභිනව යන්ත්‍රොපකරණවලින් සැහෙන ප්‍රතිඵල ලැබෙන්ට පටන් ගෙන තිබුණෙන් ඔහුගේ කෝපි, අස්වැන්නෙන් ද වර්ගය අතින් ද බෙහෙවින් දියුණු වී තිබුණි. කම්කරුවෝ ද හොඳින් වැඩ කළහ. මුළු දිස්ත්‍රික්කයේ ම හොඳ පලදවක් ලැබුණු වත්ත මෙය යි. ටොම්ට නිරායාසයෙන් මෙන් මුදල් ගලා එන්ට වන.

මේ නව සම්පත නිසා ඔවුන්ගේ ප්‍රීතිය වැඩි වී දැයි සේරාට ඇති වූ සැකය ඕ කිසිවකුට හෙළි නො කළා ය. ලංකාවේ දසත පැතිරී ගිය දියුණුවේ ශ්‍රී ශොභාව මධ්‍යයේ බබළන ටොම්ට වත්තේ සේවයෙහි නිරත නො වී කල් ගෙවිය හැකි ද?

දැන් කෝපි රජකරන කාලය යි. රටේ අසහාය ස්වාමියාත් කෝපි යි. 1868 ට ලැබූ මේ අවුරුද්දේ හොණ්ඩරය පවුම් 82 දක්වා නගි යයි බලාපොරොත්තුවක් පැවතුණි. ස්ථිර වශයෙන් ම ලංකාවේ ස්වර්ණමය යුගය උද වූවා බඳු විය.

වැවිලි පවත්නා දිස්ත්‍රික්ක තව දුරටත් දියුණුවීමට අදළ වන සේ කොළඹ සිට මහනුවර දක්වා අලුත් දුම්රිය පාර නිමකරන ලද්දේ ගත වූ වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දී ය. මංමාවත්, වැව හා පාලම් ඉදිකරමින් තිබුණි. අලුත් වැවිලි සඳහා අක්කර දහස් ගණන් කැලේ කපමින් තිබුණි. කෝපි වවා ඇති හෝ කෝපි වැවීමට සූදනම් කරන ලද ඉඩම් අක්කර එක් ලක්ෂ

හැට දහකි. ''මේෂ'' නමැති නෞකාවේ දී මනමාලියක් වශයෙන් තමා සිටි අවස්ථාවේ බලාපොරොත්තු වූ අදහස්, සිහිනයක් සැබෑ වන්නාක් මෙන්, මුදුන් පත්වන රහ ඇට පෙනුණි.

ගෙට ගෙවදීමත් අලුත් අවුරුද්ද ලැබීමට පෙර දිනත් උත්සව එකවර පැවැත්වීමට යෝජනා කරන ලද්දේ ටොම් විසිනි. මිත්‍රයන් ටික දෙනකු සඳහා මෙසේ උත්සව පැවැත්වීමට සේරා කැමැති වූ නමුත් එය ඇගේ ස්වාභාවික උනන්දුව සහිත ව වූ කැමැත්තක් නො වන බව ටොම්ට නො වැටහුණේ ය.

''හියුටත් ආරාධනා කරන්ට ද ඔබේ බලාපොරොත්තුව,'' යි ඇ ආරාධනා පත්‍ර ලියමින් විචාළා ය.

ටොම් හිස සැලි ය. ''ඔහු මේ දවස්වල වන්නේ කොයි වෙලෙත් නෑ. මට දැනගන්ට ලැබෙන හැටියට ඔහු මුළු කාලය ගත කරන්නේ එක්කෝ කොළඹ නැත්නම් නුවර. නුමුත් ඔහුටත් දන්වන එකයි යුතු.''

''තවත් කවුරුවත් ඉන්නවා ද?''

''ඔව්, ඇයි, ආචාර්ය ත්වයිට්ස්,'' ටොම් ඇගේ කර ළඟ සිටගෙන ලැයිස්තුව දෙස බැලි ය. ''ඒ එක්ක ම පිලිප් ක්‍රෝලිටත්.'' ඇ ලියුමක් අවසන් කරනු හේ දුටුවේ ය. ''මම ත්වයිට්ස් බොහොම කාලෙකින් දැක්කේ නෑ. අපට කියන්ට ඔහු සොයාගත් අමුතු දේවල් තියෙනවා දැයි මම දන්නේ නෑ.''

මීට බොහෝ කලකට පසුවත් ඒ අලුත් අවුරුද්දට පෙරද පැවැති උත්සවය සේරාට මතක් වුණේ ටොම් මෙතෙක් කල් සේවය කිරීමෙන් වූ බලාපොරොත්තුව මුදුන් පත්වීමක් වශයෙනි. ඔහු අවට දක්නට ලැබුණේ ඔහුගේ ජයග්‍රහණයන්හි සංකේත ය. ඔහුගේ සශ්‍රීක වත්ත, අලංකාර ගෘහ භාණ්ඩ වලින් බබළන දූකුම්කලු අලුත් නිවස හා ඔහුගේ පරණ ගෙදරින් ගෙනා පියකරු රිදී බඩුන් යන මේවා ය. මේ දවසේ ඔහු සේරාට ඇත්ත වශයෙන් ම කීවේ, ''සේරා, අපි දැන් පොහොසත්. අවුරුදු මෙපමණ ගණනක් හිරිහැර කරදර මධ්‍යයේ ජීවත් වූවා වාගේ, මතුවටත් අපට ඒ හිරිහැරවලින් සම්පූර්ණයෙන් මිදී සිටින්ට හැකිවෙතැයි මට හිතෙන්නේ නෑ.''

ඇ ඔහුගේ මුහුණ සිඹින විට එය කල්පනාවෙන් බර වී තිබුණි. ''මේ තත්ත්වයට එන්ට ඔබ බොහොම මහන්සි වී වැඩ කළා.''

සවස් කාලයේ හියුගෙන් ලියුමක් සමග විශාල පාර්සලයක් ද ලැබුණි.

මා ප්‍රිය සේරා,

මා ඇවිත් සිටින්නේ මදක් උණ ගැනී බැවින් ඔබේ ගෙට ගෙවදීම හා අලුත් අවුරුද්දට පෙර ද පැවැත්වෙන උත්සවයටත් එන්ට බැරිවීම ගැන සමාවෙන්න ඕනෑ. මේ සමග එවන තැග්ග ඒ තරම් ගැළපෙන එකක් නො වූවත් එය ඔබේ අලුත් ගෙදරට ය. ඔබ ඔතැන නිති සැපතින් වෙසේවා.

මීට, සද ළැදි,
හියු

අ. ලි.

"ටොම් මා ගැන ඒ තරම් සතුටක් දක්වතැයි මට හිතෙන්නේ නෑ."

"මේ සමග එවන තැග්ග තෙල් සායමින් අඳින ලද ඇගේ පිළිරුව යි."

ටොම් මඳ වේලාවක් ඒ දෙස බලා එය නුරුස්නා බව තීරණය කෙළේ ය. ඔහු කවදවත් සතුටක් නො දැක්වූ අර කහපාට ඇඳුම ඇඳ උරහිස දෙසට හිස නමාගෙන බාගෙට ඇස් පියාගෙන බර කල්පනාවක යෙදී සිටින ආකාරය ගැන ඔහු කැමැති වූයේත් නැත.

"මේකෙන් ඔබ කිසි දෙයක් සලකන්නේ නැති කෙනෙක් වගෙයි පේන්නේ," යයි කියමින් ඔහු පසෙකට වන. "හා ඒක ඔබේ නියම අංග ලක්ෂණ ඇති එකක් බව මම පිළිගන්නවා. සමහර අංගවලින් බොහොමත් ම හොඳයි. නුමුත් ඔබ ඔය විදියට මට පේන්නේ නෑ. වෙන කාටවත් එහෙම පෙනේ දැයි මම හිතන්නෙත් නෑ."

"මම හිතනවා මේක තරමක් හොඳයි කියා," සේරා හෙමිහිට පැවසුවා ය.

"චිත්‍ර කලාව ගැන මම වැඩි යමක් දන්නේ නෑ. නුමුත් ඔබේ කටවත් ඇස්වත් ඔය විදියට මම දැකලා නෑ."

එහෙත් දවස් කීපයක් ලන්තානාවේ නැවතී සිටි මැක්ලොයිඩ් නෝනා ටොම් බැහැරට ගිය පසු පිළිරුව දෙසත් සේරා දෙසත් නිශ්වල ව බැලුම් හෙළා හිස සැලුවා ය.

"මේක නම් ඉතා සැලකිය යුතු පින්තූරයක්. නුමුත් ටොම් ඒ ගැන කැමති නො වීම මට පුදුමයක් නො වෙයි."

"මම මේකට කරන්නේ මොකක් ද?," යි සේරා අසරණ ව විචාළා ය.

"මගේ අවවාදය නම් ඕක අල්ලලා පැත්තකට දන්නයි."

මයික් ඔපැරල් ටොම් සමඟ බරාඳයේ ඉතා උනන්දුවෙන් කතා කරමින් සිටියේ ය.

''ඔව්, මගේ මස්සිනා හරි පුදුම මිනිහෙක්. රූප අඳින්ටයි, රේස් යන්ටයි, වෙඩි තියන්ටයි—වෙඩි තියන්ට නම් මා දැක තිබෙන ගජ හපනා. නුමුත් ඔබ ඇයි ඔහු සමඟ කතා කරන්නේ නැත්තෙ. අරලිය වත්ත යකාට යන්ට ඇරලා නෙවැ. ඔහු ළඟ ඉන්න අර ජඩ කොන්දෙස්තරයා ඒ වත්ත කනවා. එයාගෙ ජාවාරම බේර ගන්නවා. මගේ හොඳම යාළුවා හියු. නුමුත් ඔහු නිසා දැන් මට වෙලා තියෙන්නේ හිරිහැරයක්.''

''නුමුත් මම මොනවා කරන්න ද, මයික්?''

''එයාට කතා කරන්න. කරුණු පැහැදිලි කරන්න. ඔබ ඔහුගේ නෑයෙක් නේ ද? ඔහුගේ කාලයෙන් වැඩි හරියක් වත්තෙන් පිට වී සිටීම නතර කරන්න. ඔහු විනාශ වී යන්ට ඉස්සෙල්ලා ඔහුගේ මොළේ පාදන්න. මගේ කල්පනාවේ හැටියට ඔහු සම්පූර්ණයෙන් විනාශ වී යන්ට තව වැඩි කලක් නෑ.''

ටොම් බරාඳයේ සක්මන් කරන්ට වන. ''මට පුළුවන් එකක් මම කරන්නම්. නුමුත් එයින් යහපතක් වේ ද කියන එකයි මගේ සැකය. හියුත් මමත්. . . . . . .''

''හා, මම හොඳට ම දන්නවා ඔබ දෙන්නා අතරේ වැඩි හොඳක් නැති බව. දෙන්නාගෙන් එක්කෙනකුට නැති ගති ඕනැවට වඩා අනිකාට තියෙනවා. ඔබ සමග ඊර්ෂ්‍යාවෙන් සිටින එක නම් ඇත්තයි. ඒ වුනත් ඔබ ටිකක් උත්සාහ ගන්ට ඕනෑ. ටොම්, එහෙ කෙරෙන දේවල් මගේ හිතට හරි නැහැ.''

මහත දෙහෙත සිරුරකින් හා බකල කකුල් දෙකකින් ද සිහින් හිසකේ වලින් ද යුත් ඇන්ගස් මැක්ලොයිඩ් කථාවට එකතු විය. ''හා! ඔව් මයික්, මාත් ඔබේ පැත්තට යි. හියුට ටිකක් හෙමින් යන්ට යයි කවුරු හරි කියන්ට ඕනෑ වෙලාව දැන් තමා.''

''කන්දකින් පෙරළෙන ගලක් නවත්වනවා ඊට වඩා පහසුයි. නුමුත් ඒ ගල බිමට වැටෙන්ට නො දී අකුල් හෙළන්ට වත් බැරිකමක් නැහැ,'' මයික් කී ය.

අභිනව වර්ෂය උදාවන තුරු ඔවුහු බරාඳයේ සිටියහ. ඉතා ප්‍රීතිමත් විය යුතු මේ සන්ධ්‍යාව එතරම් පියකරු නො වූයේ සමහර විට ඇ වෙහෙස ව සිටි හෙයින්දෝ යි සේරාට සිතුණි. ටොම් හා ඇන්ගස් මැක්ලොයිඩ් සමග සාකච්ඡාවක යෙදී සිටින ආචාර්ය ත්වයිට්ස් ගේ කටහඬ බරාඳයේ අනික් කෙළවරින් ඇසෙන්ට වන.

උකුල මත ලේන්සුවක් කරකවමින් සිටි සේරා ද ඔහුගේ වේගවත් කට හඬ නිසා ම නිශ්චල ව ඊට සවන් දෙන්ට වූවා ය.

‘‘ඔබේ පළාතේ මොකුත් අමුත්තක් තියේනවාද?’’ යි ඇන්ගස් මැක්ලොයිඩ් තරමක උපහාසයකින් මෙන් විචාළ විට ඊට පිළිතුරු වශයෙන් මේ තරුණ විද්‍යාඥයා හිස සැලී ය.

‘‘ගිය සුමානේ මඩුල්සිමේ වැවිලිකාරයෙක් මාව බලන්ට ආවා. භයානක ලෙස ඒ වත්තේ පැතිරී ගිය රෝගයක් වැළඳුණු කෝපි කොළ සැම්පලයක් ඔහු ගෙනාවා’’ යි හේ සෙමින් කී ය.

‘‘අලුත් එකක්?’’ යි ටොම් සැලකිලි සහිත ව ඇසුවේ ය.

‘‘ඉතාම. . . . . .අලුත්. . . . . .එකක්. මේ රටේ මීන් පෙර කවදවත් මෙහෙම දෙයක් තිබුණේ නැති බව මම හොදට ම දන්නවා.’’

මොහොතක් නිශ්ශබ්දතාවය පැවතුණි. ඊ ළහට ජෝර්ජ් සෙඩන්, ‘‘ඒක මොනවා වාගේ ද, සර්.’’

‘‘කොළේ ඇතුල් පැත්තේ ලස්සණ කහපාට තිතක් වගේ.’’

‘‘මහත්තුරුනි, මේකෙ ප්‍රතිඵල තමුන්නාන්සේලා දන්නවා ද? මේ රෝගය කෝක වුණත් රට පුරා ම භයානක ලෙස ඉක්මනින් පැතිරෙන්ට ඉඩ තියෙනවා. මුල දී මෙය දැනගන්ට ලැබුණේ හැතැක්ම ගණනක් ඈත මඩුල්සිම පළාතෙන්. දැන් ඒක මෙහේ. මී ළහට කොහාට යයි ද?’’. ඔහුගේ කටහඬ ගැඹුරු වුණි. ‘‘මහත්වරුනි, මට මේක අල්ලන්නේ නෑ. මෙය භයානක රෝගයක් නො වේවා යි අපි දෙයියන්ගෙන් ඉල්ලමු.’’

මේ සියලු දෙනා අතර වූයේ නිශ්ශබ්දතාවයකි. සේරාට මෙසේ කල්පනා වූයේ ය. ‘‘ඔහු බය වෙලා. මම කවදවත් ඔහු ඔය විදියට ඉන්නවා දැක්ලා නෑ. සාමාන්‍ය වශයෙන් ආචාර්ය ත්වයිටස් බොහොම ශාන්තයි, එඩිතරයි, ආත්ම දමනයෙන් යුක්ත යි.’’

ඒ නිශ්චලතාව මධ්‍යයේ ඔර්ලෝසුවක වේලාව වදිනු ඇට ඇසුණි. ඈ වහා නැගිටටෙ ඇගේ හිස එඩිතර ලෙස කෙළින් කරගෙන මුහුණ රත්පැහැ ගන්වා ගනිමිනි.

‘‘මේ අහන්න. මේ අලුත් අවුරුද්ද අපි ආරම්භ කළ යුත්තේ කොළ රෝග ගැන කතා කිරීමෙන් ද?’’ යි ඕ කීවා ය.

මී ළහට මධ්‍යම රාත්‍රියේ සීනු හඬ ඔවුන්ට ඇසුණි.

‘‘ශුභ අලුත් අවුරුද්දක් වේවා! ඔබ සියලු දෙනාට ම ඉතා ම ශුභ අලුත් අවුරුද්දක් වේවා,’’ යි ඕ ආශිර්වාද කළා ය.

බීම වීදුරු එකිනෙකට ගැටීම, ගී ගායනය, හදිසියේ ම මැක්ලොයිඩ් නෝනා දුබල ව වෙහෙස පත්වූවා සේ පෙනීම—මේ සියල්ල අලුත් අවුරුද්ද ලබන මොහොතේ දී සේරාට ඉතා තියුණු ලෙස දැනුණි. ඒ සියල්ලටත් වඩා ඇට තදින් දැනුණේ ආචාර්ය ත්වයිට්ස් මහතා ගේ වීදුරුව ඇගේ වීදුරුව හා ගැටීමේ දී වෙවුලූ අයුරුත්, අනාගතය දෙස බලන ඔහුගේ දුබල දෙනෙතින් හෙළූ විඩාපත් බැල්මත් ය.

4

මැක්ලොයිඩ් නෝනා ගේ දෝලාව හෙමිහිට පාරේ උසුලාගෙන යන හැටි බලමින් ටොම් හා සේරා වත්තේ අද්දර සිටියහ. ඔවුන්ගේ අන්තිම ආගන්තුකයා ද මෙසේ පිටත්ව ගියා ය.

''ඉතින් වැඩට යමු,'' යි ටොම් අස්වැසිලි ලැබූ කෙනකු ගේ හඬින් පැවසී ය.

අලුත් අවුරුද්දට පෙර ද පැවැති උත්සවයේ දී ත්වයිට්ස් ගේ මුවින් ගිලිහුණු වදන් අවුරුද්ද ලබන කොට ම ඔහුගේ කණ වැකුණු වේලේ සිට ඔහු නො ඉවසිල්ලෙන් කල් ගෙවන්ට විය. මෙ හැඩිදූඩි තෘණ විද්‍යාඥයාට ඔහු තුළ පැවැති ගෞරවය නිසා— ඔහු මහා විද්‍යාඥ ඩාවින් හා ලියුම් ගනුදෙනු කරන මිත්‍රයකු වූවා පමණක් නො ව ඒ කාලයේ සිටි ශ්‍රේෂ්ඨතම තෘණ විද්‍යාඥයාත් ඔහු නො වේ ද?—අලුත් රෝගයක් ගැන ඔහු කළ ප්‍රකාශය වඩාත් සැලකිය යුතු විය. ප්‍රස්තාව ලැබුණු වහා ම මේ අද්භූත අලුත් රෝගය කුමක් දැයි බැලිමට මයික් ඔපැරල් කරා ඔහු අසුපිටින් යන බව ඕ දැන ගත්තා ය.

හදිසි වෙහෙසක් ඇට දැනුණි. ඔවුන් බංගලාවට ළඟා වූ විට ම ඕ කෙළින් සිට ගැනීමට, දෙරේ කණුවට හේත්තු වූවා ය.

''ටොම්, අද උදේ මා සමග ඉන්න,'' යි ඕ කීවා ය.

ඔහු ඇ දෙස පුදුමයෙන් බලා, ඇගේ දෙනෙත් නිල් පැහැයෙන් පැල්ලම් ගැසුණාක් බඳුව ද, කම්මුල් සුදුමැලිව ද තිබෙනු දැක, ඇගේ විනෝදයට හේතුවේ යයි සිතා මේ ලොකු උත්සවාදිය යෝජනා කිරීම ගැන පසුතැවිලි විය.

එහෙත් වත්තේ අස්වැන්න ලබාගන්නා බැරෑරුම් අවස්ථාවේ දී ඒ ගැන නො සලකා සතියක් පමණ කල් ගත කිරීම නිසා ගොන්සාලේස් ඔහු කැඳවා ගෙන යෑමට දෙවරක් ම පැමිණ තිබුණි. සේරා වැඩ බහුලකමින් වෙහෙසට පත් වී සිටිතැ යි හේ කල්පනා කෙළේ ය. ඇගේ තත්ත්වයේ සිටින ස්ත්‍රීන්ට මෙසේ වන බව ඔහු අසා ඇත.

''ඇයි සොඳුර, මා සොයා බලන්ඩ ඕනෑ දේ තියෙනවානෙ. ඒවා මඟ හරින්ට පුළුවන් දේවල් නො වෙයිනෙ. මම ඉක්මනින් එන්නම්.''

ඕ ඉවත බලා ගත්තා ය. ''මුල් තැන ත්තං ම ලැබෙන්නේ වත්තට,'' යි ඕ කල්පනා කළා ය. ''ඊට පටහැනිවීමෙන් ප්‍රයෝජනයක් නෑ. එය නිතරම මට වඩා අගෙයි.''

ඇගේ උරහිසට කරුණාවෙන් තට්ටු කරමින්, ''ඔබට ඕනෑ කරන්නේ හොඳ විවේකයක්'' යි හේ කී ය.

ඇගේ මුහුණ සිඹ, අව්වට ලන තොප්පිය ද හිස ලා ගෙන කන්ද පාමුලට හේ බැස ගියේ ය. ආරෝහපරිණාහ සම්පත්තියෙන් අනූන වූ සිරුරකින් යුක්තව, පොළොව කාවදින සුළු අඩි තබමින් ඔහු ගමන් කළ එඩිතර ලීලාවත් ඔහු ගත් හැම පියවරක් පාසා තෙත් වූ පොළොව මත වැදුණු සැරයටි පහරත් සේරා බලා සිටියා ය.

ඔහුගේ සිතුවිලි කොතරම් බලාපොරොත්තු සහිත අදහස්වලින් පිරුණු ඒවා ද? ඇ පළමුවෙන් ම ඔහුට ආකර්ෂණය වූයේ ඔහුගේ මේ ශාන්ත ආත්ම විශ්වාසය නිසාත් කවර වැඩක් භාරගත්තත් ඊට හිත කය දෙක සම්පූර්ණයෙන් යෙදීමට ඇති ශක්තිය නිසාත් ය.

ප්‍රධාන වශයෙන් ඇ හා ඩයනා වෙනුවෙන් ලන්තානාව දියුණු කිරීමට ඔහු තුළ පැවැති අධිෂ්ඨානය මේ ගතිගුණවලට දෙස් දුණි. මහත් දුෂ්කරතා පිරි ඉතුරුණු සමයක ඔහු ඒවා මැඩ ජය ගත්තේ ය. දැන් මේ ගුණ සමූහය හේතුකොට ඔහු දිස්ත්‍රික්කයේ නායකයකු වීම ගැන ඇ දෙස් නැගිය යුතු ද?

සේරා ගේ ඇස් බැම රැළි වැටුණි. නෑ එසේවන්ට බැරි යයි ඕ කල්පනා කළා ය. ටොම් කෙරෙහි කවදවත් ඇ විරුද්ධ වන්නේ කෙසේ ද? එහෙත් ඔවුන්ගේ ජීවිතයේ ශාන්ත ස්වභාවය දූරී භූත කරන බලයක් ලන්තානාවේ පැවැත්තේ ය.

එසේ නැතහොත්, ඒ තිත්ත කෝපි නැත්නම් රත්තරන් කෝපි, ඊට යටපත් වූ පෙදෙසින් බැහැර යමක් පවතීදැයි වත් මිනිසුන්ට සිහිපත් නො වීමට තරම් අනභිභවනීය බලයක් සතුව පැවැත්තේ ද? නැතහොත් සිය නිවස හා දරු සුරතල් ද සැප විහරණ හා සභ්‍යත්වයේ පහසුකම් ද නැති වී ගොස් දුක් කම්කටුල්ලෙන් හා හුදෙකලා බවෙන් පීඩිත ව ඩාදිය මුගුරු හා ජීව රුධිරය පවා හෙළමින් ක්‍රියාපරවශ වීමට මොවුන් දිරි ගැන්වූයේ මතුවට ලැබෙන ධනස්කන්ධය ද?

ඇ ඉදිරියේ දිස් වූයේ නොයෙක් කනස්සලුකම් හා බලාපොරොත්තු සුන්වීම්වලට ගොදුරු වෙමින් අවුරුදු විස්සක් තිහක් පමණ කාලයක් මුළුල්ලේ මෙරට කරන ලද වැවිලි ය. වැඩුණු දැළි රැවුල් ඇති ආදි වතුකාරයන් වරිච්චි ගෙවල වෙසෙමින් සිටි අයුරුත්, අතීසාර, උණ, කොලරා ආදී රෝගවලින්

හා හුදෙකලා භාවයෙන් පීඩා විඳිමින් මැරී ගිය කෙළවරක් නැති ජනකායත්, ඕ දුටුවා ය. එමෙන් ම සිතුවාටත් වඩා යස ඉසුරින් දියුණු වී සිටි සමහරුනුත් බලාපොරොත්තු සුන් ව දේපළ විකුණා දමා සිය රට යන සමහරුනුත් ඕ දුටුවා ය.

ඇ හා ටොම් ද ඔවුන්ගේ පරපුර ද නැඟී සිටියේ මුලින් ම සේවය කළ පරණ වතුකාරයන්ගේ ශ්‍රම ශක්තියේ ආනුභාවයෙන් මළවුන්ගෙන් නැගිට්ටා සේ ය. එහෙත් මොවුන්ගේ ජිවිතය ද එකී මූලික ජනයාගේ ජීවන තත්ත්වය ම අනුගමනය කිරිමක් විය. මී ළඟ පරපුරේ—ඩයනාගේත්, ඇ ගැබ සිටින දරුවාගේත් ය. එමෙන් ම තරුණ ඩේවිඩ් නෙවිල් ගේ තත්ත්වය කෙසේ වේ ද? කඳුමත රැකවරණයට මුර සේවයේ යෙදෙන සෙබළුන් වැනි සන කොළ ඇති කෝපි ගසට ඔවුහුත් වහල් වෙත් ද?

ඕ නළල අත ගැවා ය. එය තෙත් වී තිබෙන බව දැනුණි. ''ටික වේලාව කට ගෙදරින් පිට වෙන්ට ඕනෑ,'' යි කල්පනා කොට සාලුව ද ගෙන එළි මහනට බැස්සා ය.

වෙනද මෙන් ඇගේ පියවර යොමු වූයේ පරණ බංගලාව අසල වතුර වළ දෙසට ය. කණ මැදිරින් ගේ රඟ පැම්වලින් හා දියේ ඉස්ගෙඩින් ගේ කෙළි සෙල්ලමින් ද තොර නො වුණු මේ ස්ථානය ඇට ශාන්ත සුවය එළ විය.

එහෙත් අලුත් ගෙදර සිට මෙහි ආ යුත්තේ වක් වූ දික් පාරකිනි. පහසු වෙන් යා හැකි දීර්ඝ මාර්ගවලට නිතර නො ඉවසිලිවත් වූ ඕ කන්දේ තද බැවුමක් හා තියුණු වංගු ඇති කෙටි පාර දිගේ යැමට තීරණය කර ගත්තා ය. ළඟ දී පැවති වැසි නිසා පාර ලිස්සන සුලු වූයෙන් සේරා හෙමිහිට පරිස්සමින් ගමන් කළා ය. වරක් ඇ ලිස්සා වැටුණු නමුදු වහා ම නැගිට ගත්තා ය. නැවතත් මෙබන්දක් සිද්ද නො විය යුතු විය.

වතුර වළ අසල හිරුරැසින් රත් වූ ගල් තලාවක හිඳගත් ඕ දිය මත තැනෙක අඳුරත් තැනෙක හිරු රැස් කළඹත් රඟපානා අයුරු බලමින් සිටියා ය. මෙහි වැල්ලේ වැටී තුබුණු නයි හැවක් සව් කඩදයි කැබැල්ලක් මෙන් දිස් විණි. එහෙත් සේරා නයින් ගැන සිතා කරදර වූයේ නැත. ඩේවිඩ්ට නයා දෂ්ට කරන්ට ඇත්තේ මෙතැන දී ය. ඒත් එසේ වූයේ ඔහු නයි ගුළකට නො දැනුවත්ව ම අත දැමීමෙනි. ඇගේ විරුද්ධත්වය පවා නො තකා අවඥ සහිත සිනහ රැල්ලකින් මුව සරසා ගෙන දුඹුරු පැහැති සිරුරින් යුත් හියු ඇට පළමුවෙන් ම හමුවූයේත් මෙතැන දී බව ඇට කල්පනා වූයේ ය.

වතුර වළ දෙස බැලූ ඕ ඇගේ මුහුණ පිළිබිඹු වී තිබෙනු දුටුවා ය. අධිෂ්ඨාන ශක්තියක් දක්වන බරපතළ පෙනුමක් ගැප් වූ ඒ මුහුණ තරුණ මනමාලියක් වශයෙන් එද මේ හිරුරැසින් රත් වූ ගල් තලා මත පුස්කෑ රෙදි පිළී වැනූ වේලේ පැවැති මුහුණේ පෙනුමට වෙනස් වූයේ නම් ඒ ඉතා ස්වල්ප මාත්‍රය-

කිනි. සුළි මතු වී ගලන දිය පාරේ ගීතයට සවන් දෙමින් හිස දැතේ රුවා ගෙන සිටි ඇ එතැනින් යළිත් නැගිට්ටේ හීන් පොද වැස්සක් වසින්ට වූ කල්හි ය.

ගස්කොළ නාවමින් පොළොවට වතුර බී ගන්නා තරමට වැස්ස තද කරන්ට වූයෙන් ඕ සාලුව තදින් උරවට දවටාගෙන සෙමින් සෙමින් පාරේ උඩහට ගියා ය.

තමා දරුගැබ ඇතිව සිටීන බව සැලකූ ඕ මේ කාලගුණය ඉක්මනින් නොනවතින බව ද දූන කෝපි ගස්වල ගන නිල් කොළ වදුලින් වැටී තුබුණු අනික් පාරට හැරුණා ය. එන්ට එන්ට ම තද වූ වැස්සට ගොදුරු වූ ඕ ලහි ලහියේ ගමන් ගත්තේ කඳු මුදුනත එළිමහනට පැමිණිය හැකි අනික් වංගුව කරා යෑමට ය.

තවත් පියවරක් ඉදිරියට තැබූ ඕ එතැන පාර අද්දර ඉදිරියට නෙරා පිහිටි ගලක් මුදුනට ආවා ය. අවට දර්ශනය දෙස බලමින් තවත් පියවරක් තැබුවා ය. පා තැබූ ගල දෙදරුම් කා ලිස්සන්ට විය. දැත් විදහා යන්තම් නො වැටී වැළකීමට පස්සට බර වූවා ය. පස් බුරුල් වී ගල් ඇද වැටෙනු ඇට ඇසුණි.

අනික් මොහොතේ ඕ වැටෙන්ට වූවා ය. හදිසියේ ම ඇගේ භීතිය කල්පනාකාරී ස්වභාවයකට පෙරළුණි. වැටීමට ඇති බිය තව දුරටත් තහවුරු උණේ ඇගේ කුස හොත් දරුවා කෙරෙහි අනුකම්පාවෙනි. ඇ ඒ අසල පඳුරක් අල්ලාගන්ට අත් දිගු කළ නමුත් එය වැරදුණි. ඉදිරියට නෙරා තුබූ ගලක පැටලී ගවුම ඉරුණු විට එය ඇල්ලීමට තැත් කරද්දී ලිස්සා වැටී ලේ ගලන්ට වන. තවත් පඳුරක් ඕ අල්ලා ගත්තා ය. එයින් ඇ පෙරළී යෑම වළකිතැයි මෙහොතකට පෙනුණි.

ඉක්බිති අතු රිකිලි නැමී ගොස් ඇගේ අත ලිස්සා ගියේ ය. ඇගේ සිහි නැතිවන්ට පෙර අන්තිමට ඇති වූ හැඟුම එද කෝපි ගසක් බව ය.

‘‘මේක කවදවත් හවරවන්නේ නැද්ද?’’ යි ඕ සැක කළා ය. වේදනාවෙන් පීඩිත ඇගේ ශරීරය නිසා ද එසේ නැත්නම් ඇගේ අභ්‍යන්තරික ශූන්‍යභාවය නිසා දැයි ඕ නො දත්තා ය.

කැලඹුණු ස්වභාවයක් දක් වූ ටොම් ගේ මුහුණ ඇගේ දර්ශන පථයට ලක් වත් ම ඕ ඔහුගෙන් ඉවත බැලුවා ය. වත්ත බිලි කරගත් තම පුත්‍රයා නැවත ලබාගැනීම මිස ඇට අන් කිසිවක් අවශ්‍ය නො වී ය.

විසංඥ භාවයේ ගැඹුරු පාතාලයට කිමිදීමට ඇ ප්‍රයත්න දැරූ නමුදු හැම අතින් ම මිනිසුන්ගේ කට හඬත් ඉඳහිට බෙහෙත් උගුරක් දෙකක් තොල් ගාන්ට අමතන බවත් ඇට ඇසුණි. එහෙත් ඇට ඕනෑ කළේ යළිත් අන්ධකාරයේ නිමග්න වීමට ය.

අමාරුවෙන් ඇස් ඇරගත් ඕ තොමෝ මැක්ලොයිඩ නෝනා මෙහි ආවේ කෙසේ දැයි දවසක් කල්පනා කළා ය. ඉන්පසු එන්ට එන්ට ම අඳුරු වැටුණෙන් ඈ හමුවේ පැවැත්තේ කිසි හරයක් නැති පුදුම තත්ත්වයකි.

ගොන්සාලේස් වහා අසුපිට නැඟ ගොස් මැක්ලොයිඩ නෝනා නැවත කැඳවා ගෙන ආ බව ඈට පසුව දැනගන්ට ලැබුණි. එහෙත් ඈ එනවිට සියල්ල කෙළවර වී තුබුණි. ඈ වැටෙනු දුටු දෙමළ කොලුවකු ගේ කෑ ගැසීම අසා ඈ නැවත ගෙදරට උසුලාගෙන ගියේ ටොම් ය.

අන්තිමට ජයගත්තේ වත්ත යයි ඕ කල්පනා කළා ය. මහ බෑවුම්වලින් යුත් නිතර වැසි වසින මේ වත්ත කෙසේ හෝ ජයග්‍රාහී වූයේ ය. ඈට තවත් ළමයකු නො ලැබෙන බව ඕ දැනගත්තා ය.

ටොම් හා මැක්ලොයිඩ නෝනා ගේ නො ඉවසිලි වදනිනුත් කඳුළු පිරි මුහුණිනුත් යුතුව පුදුම ලෙස නිශ්ශබ්ද ව සිටි ඩයනා ගේ ඉඳහිට අඬන ඇඩුමෙනුත් දවස් ගත විය.

පක්ෂියකු ගේ බඳු සිහින් මුහුණක් ඇති මැක්ලොයිඩ නෝනා එක් දිනක් සිතුවිලි බරින් යුත් මුහුණක් ඇතිව ඈ ළඟ ‘‘ඔබ උනන්දු වෙන්ට හොඳ කාලය දැනුයි, සේරා.’’

සේරා වේදනාවෙන් බර දෙනෙත් ඈ දෙසට හැරවූවා ය.

‘‘හැබැට ම, ඔබේ යුතුකම් ඉටු විය යුතු සැමියකුයි, ජීවත් ව ඉන්නා ළමයෙකුයි සිටින බව ඔබට අමතක වී ද?’’

‘‘මට බෑ මැක්ලොයිඩ නෝනා, මට තව ම. . . .’’

‘‘එහෙනං අරකට කන් දෙන්න.’’

නිසොල්මනේ, දෙරින් එපිට සිටි ඩයනා සිහින් හඬකින් හඬනු ඔවුන්ට ඇසුණි.

‘‘හැබැට ම, අර සිද්දිය වුණු දා, ඈ වෙතින් ඔබේ මුහුණ හැර වූ තැන් සිට ම, ඈ ඔහොමයි.’’

සේරා ගේ හදවත අනුකම්පාවෙන් උණු වී ගියේ ය. පැකිලෙන ස්වරයකින් ඕ දරුවාට අඬගසා ඇගේ මුදු සිනිඳු සිරුර තුරුළු කර ගත්තා ය.

කාණ්ඩය 10

1

මැක්ලොයිඩ නෝනා පිට වී ගොස් බොහෝ වේලාවක් ගත වූ පසු මහ හෙණ හඬකින් ගෙය දෙදරුම් කැවේ ය. මොහොතක් අහස වලාකුළින් තොර ව පැහැදිලි ව තිබුණි. ගත වූයේ විනාඩි කීපයකි. මහ වැසි වසින්නට වන.

ගසන හිරිකඩින් තමා නැහැවී ගිය ද, ඒ නො තකා සේරා එළිපත මත සිටියා ය. ගේ ළහ ම වත්තේ තුබූ මල්ගස් කීපය හැර අන් සෑම තැන ම වැසී ගිය මීදුම දෙස ඇගේ ඇස් ඇලී තිබුණි. තඹවන් මහවැහි ද අහස ද ඈ සිසාරා ගත. පිලි උතුරමින් කුඩා දිය ඇලි මෙන් වැටී කාණු උතුරා ගිය වැහි වතුර ගෙමිදුල හරහා වැටුණු කුඩා දෙළ පාරක් මෙන් විය.

මල් පාත්ති ද ගෙට එන මහ ද රතු පසින් වැසී ගියේ ය. මොර සූරන මහ වැස්ස, බියකරු ලෙස නො නැවතී ම පැවැත්තේ ය.

''සේරා! මොන ඉලව්ව ද ඔය කරන්නේ?''

ඕ හැරී ටොම් වෙතට දුව ගියා ය. ''ටොම් මට ඉවසන්ට බැහැ, ඉවසන්ට බැ. අනේ මෙතැනින් ඈතට ටිකකට වත් එක්ක යන්න.''

හිරිහැරයෙන් පීඩිත වූ හේ ඈ දෙසට හිස නැමී ය. ඔහුගේ අතින් ඇගේ කෙස් කළඹ පිරිමැදිණ.

''සේරා, ඔබ හොඳට ම තෙමිලා. එන්න, ඇවිත් ඇඳුම් මාරු කරන්න.''

''ටොම්, මට මෙහෙ ඉන්න බැරි එකනේ මා කියන්නේ.''

හේ නිදන කාමරයට ඈ කැඳවා ගියේ ය. ''අපි බලමුකො ඒ ගැන, ප්‍රේමීය. මම පුළුවන් තරම් ඉක්මනින් යන්ට බලන්නම්.''

ඕ පැත්තකට වී ඔහු දෙස බලාගත්වන ම සිටියා.

''දැන්ම ම ඒක කරන්ට අමාරුයි, සේරා. ඔබට ඒක පේන්ට ඕනෑ. නුමුත් මට පුළුවන් වූ මොහොතේ දී. . . . .''

''කමක් නැ, ටොම්,''යි ඕ සෙමින් කොඳුලා ය. ''මම අහපු බවවත් අමතක කරන්න. මට තේරෙනවා. ඔබ වත්තට ඕනෑ. වත්තට ම තමා ඔබ හැම ද හිමි වූයේ.''

විමසුම් ඇසින් ටොම් දෙස බලා ඔහුගේ පැසෙන හිසකෙස් ද, හැඩිදැඩි වන සිරුර ද, සිතේ තෘප්තිමත් භාවය පිළිබිඹුවන මුහුණ ද ඕ දුටුවා ය.

එහෙත් දැන් ඔහු විපරීත ව සිටිතැ යි ඕ සිතුවා ය. පහර වැදුණේ මන්දැ යි නො දන්නා ළමයකු ගේ අයුරින් ඇගේ මිට ද මෙලවිණි. මීට පෙර මගේ ජීවිතයේ දී අනවශ්‍ය වූ තරමට, ඔබේ ප්‍රේමය මට දැන් ඕනෑ බව, ටොම්, ඔබට නො පෙනේ ද? අනේ ටොම්, ටොම්, අපට මේ වෙන්නේ මොකක්ද?

''මෙහි ඉන්ට ඔබ කැමතියි කියලයි මා හිතුවේ.'' හේ අසරණ ලෙස කී ය.

සේරා ගේ වේගය ඇවිස්සුණි. ''ඔබට ඕනෑ ම දෙයක් ප්‍රමාණයට වැඩි. වෙන්ට පුළුවනි. . . . .ඔබේ වටිනා ලන්තානාව සම්බන්ධයෙන් වුවත් අපි මහනුවර නො ගිහින් දැන් මාස කියක් ද? කුලි කාරයන්ට පඩිගේන්ටත් නො ගිහින් දැන් ගොන්සාලේස් එහි යවනවා. අපි කොළඹ නො ගිහින් දැන් කොයි කලක් ද? මාස දහතරක්! වත්තේ කොතන ගියත් මට මගේ නැතිවෙච්ච දරුවා මතක්වෙන බව ඔබට කොයි වෙලාවකවත් හිතෙනවා ද?'' එන්ට එන්ට ම වේගවත් වූ නමුදු ඕ උත්සාහයෙන් ශාන්ත වූවා ය. ''මගේ යෙහෙළියන් හම්බවෙන්ටත්, සාප්පු යන්ටත් ඔවුන් නගරවල කරන දේ කරන්ටත්, මටත් ඉඳහිටලා.නමුත් ආසා ඇති බව ඔබට කොයි විටෙකවත් හිතෙනවා ද? ඇගේ ස්වරය යළිත් වේගවත් වීම මැඩපවත්වා ගැනීමට ඇ ගත් ආයාසය ව්‍යර්ථ විය. ''ඇත්තට ම මට මෙහෙ හැම දෙයක් ම එපා වෙලා, ටොම්. වැස්සත්, කෙළවරක් නැති මේ දර්ශනයත්, ඔබේ මේ එකාකාර කෝපි පඳුරුත් මට තිත්ත වෙලා. වෙන හැම දෙයක් වාගේ ම මට ම මාවත් එපා වෙලා!''

ටොම් හෙමිහිට පසෙකට හැරුණි. ඔහු මහලු සේ ඔහුට ම දැනුණි. ඇ නරකක් අදහස් නො කළත්, මේ කෙදිනක වත් අමතක නො විය හැකි අමිහිරි වචන නො කියන සේ, ඇ වඩා ගන්නට ඇත්නම් යි ඕහට සිතුණි.

''මට පුළුවන් වුණු හැටියේ ම ඔබ කැමැති ඕනෑ ම තැනකට එක්ක යන්ට හැකි තරම් උත්සාහ කරන්නම්. ටික කලකට අපි එංගලන්තයට යමු. මට හිතෙනවා අපි ඩයනා ඉස්කෝලෙ යවන්ටත් දැන් කාලෙ හරි වගෙයි. දැන් අපි මෙහාට ඇවිල්ලා අවුරුදු නමයක් විතර නේ.''

ලේ එනතුරු තොල් විකමින් සේරා කාමරයේ තනිව ම සිටියා ය.

''ඕ, ටොම්, මා එසේ නරකක් අදහස් කළේ නැතැ,'' යි ඕ තමාට ම කොඳුරා ගත්තා ය. නුමුත් දූනට ම වරද වී තිබෙන බව ඇට පෙනුණි. ඔවුන් අතර පැවති ප්‍රේමය ටිකකින් නමුදු පලුදු වූයේ ය. එය නැවත කවදවත් පෙර සේ නො පවතිනු ඇත.

සේරා ඩයනාට පාඩම් ඉගැන්වීමෙහිත් ඇගේ හා තමාගේ මැහුම් මැහීමේත් ඉතා උනන්දුවෙන් යෙදුණා ය. ගෙයි හා වත්තේ ඕනෑ ම වැඩක යෙදීමෙහි කාර්‍යක්ෂම භාවයක් ඇට පැවැත්තේ ය.

ටොම් ඔහුගේ කාර්‍යයන් නිසි පරිදි පිළියෙල කරමින්, මින් පෙර නො පැවති විරූ අන්දමේ සැලකිල්ලකින් වත්තේ වැඩෙහි ඇලෙමින් නිහඩ බවක් දක් වී. මේ යුවළ අතර පරතරය ද හෙමිහිට වැඩි වී ගියේ ය.

එංගලන්තයට යෑම ගැන මොවුන් නිතර කතා කර තුබූ නමුත් ගමන ළං වෙත් ම ඒ ගැන සිතීම මේ දෙදෙනාට ම ප්‍රීතිමත් නො වී ය. ඔහු වැළඳ ගැනීමේ අභිලාෂයක් ඇතැම් විට ඇති වූ නමුත්, අධික චිත්තෝද්වේගය ඔහු අප්‍රිය කළ බව ඇට ෂොක් විය. ඇගේ චිත්ත සන්තාපයෙන් ඇ මිදුණේ ලන්තානාවෙන් දුර බැහැර අසු පිටින් ගිය ගමන්වලිනි.

2

රට පුරා ම කොළ රෝගය සිත් කම්පා කරවනු තරම් සීඝ්‍ර ලෙස පැතුරුණේ ය. මේ ගැන ආචාර්‍ය ත්වයිට්ස් මහතා ගේ ලියුමකින් දැනගන්ට ලැබුණු බර්ක්ලි පාදිලිතුමා හා බ්රෝම් මහතා ද මේ රෝගයට ''හෙමීලියා වැස් ටේට්රික්ස්'' යයි අලුත් නමක් දුන්හ. වතුකාරයෝ මීට ඉබේට ම වාගේ ''වනසන එමිලි'' යයි නම් කළහ.

කෙසේ වෙතත් ආචාර්‍ය ත්වයිට්ස් හැර මෙහි බරපතළකම ගැන වැඩි දෙනා නොසැලකූහ. මෝසම පටන් ගන්නා මැයි මාසේ දී කොළවල පහළ වූ කහපාට පුල්ලි ජුලයි හා අගෝස්තු මාස්වල දී එන්ට එන්ට ම වැඩි වී කොළ හැලෙන්ට විය. අන්තිමේ දී කොළ හැලුණු මේ පැළ මැරුණාක් මෙන් විය. එහෙත් ඊ ළඟ සෘතුවේ දී යළිත් ලියලූයෙන් අක්කරයකින් හොණ්ඩර කීපයක පලදාවක් පඳුරුවලින් ලැබුණි. පලදාව තරමක් අඩු වුවත් වෙනත් කොළ රෝග හා වසංගත මෙන් මෙය ද වැඩි කලක් නො පවතී යයි නො සිතීමට තරම් හේතු නො වී ය.

මේ අතර බෞද්ධයන් ගේ පූජනීය සමනල කන්ද අඩවිය වවා සශ්‍රීක කරන ලදුයෙන්, ලංකාව අනාගත බලාපොරොත්තු සහිත ශ්‍රී සෞභාග්‍යයේ ලක්ෂණ ගෙන හැර පෑ ය.

ආචාර්ය ත්වයිට්ස් පමණක් වැවිලිකාරයන්ට පරීක්ෂාකාරී වන ලෙස අනාවැකි පැවසී ය. සින්කෝනා හා තේ වැවිල්ල වහා ම පටන්ගත යුතු යයි ඔහු නැගු උද්ඝෝෂණය උපහාසයට ලක් විය. නො දන්නා ද්‍රව්‍ය දෙකක් වැවීම පිණිස එන්ට එන්ට ම මිල අධික වන කෝපි අක්කර දහස් ගණනක් මුලිනුදුරා දැමිය යුතු ද? මේ මිනිහා උමතුවෙන් දෙඩවන්නේ ද?

ආචාර්ය ත්වයිට්ස් ටොම්ට මෙසේ ලි ය. ''හැම දෙසින් ම මට ලැබෙන්නේ නින්ද අපහාස පමණකි. මේ කොළ රෝගය අනික්වා මෙන් මහහැරී යතැ යි මට කියති. මා කොපමණ වෙහෙස ගත්තත් මට මේ රෝගය සුව කිරීමට මාර්ගයක් සොයන්ට බැරි ය.

මට පෙනෙන හැටියට මෙය සම්පූර්ණයෙන් සුව කරන්ට බෑ, ටොම්. ගෙන්දගම් ඉසීමෙන්, සම ප්‍රමාණයකින් පෝර දැමීමෙන්, සෙවණ ලබා දීමෙන් ඔබ ගන්නා උත්සාහය අත්හද බැලුවාට වරදක් නෑ. නුමුත් උණුසුමේ හා තෙතමනේ තත්ත්වය මේ දිලීරය (පුස්) වැඩීමට කොතරම් උදව් වෙද්ද යත් එය මැඩලීමට සමත් ප්‍රතිකාරයක් සොයා ගන්නට නැත. ''හිමීලියා වැස්ටේට්රික්ස්'' රෝගයෙන් කෝපි ගස සාමාන්‍යයෙන් නො මැරෙන බව අප සොයා ඇත. එහෙත් එහි ප්‍රාණවත් ගතිය හීන කොට, මේ වැවිල්ල නිෂ්ඵල වන තරමට පලදාව අඩු වී යයි. ඊට හොඳ ම ආහාරය මෙහි සොයා ගෙන තිබේ. ඒ සඳහා තවත් තැනකට යන්නේ කුමට ද? කම්කරුවන් ගේ රෙදි පිළිවලින් ද, සුළඟින් ද, දෙවියන්ට විතරක් පේන තවත් මාර්ගවලින් ද, මේ රෝගය මෙරට හැම වත්තකට ම හැම කෝපි පඳුරකට ම පැතිරෙනු නියත ය.''

මහනුවර වැවිලිකාර සංගමයේ රැස්වීමකින් පසු ආපසු අසුපිට නැග මහ පාරේ එන ටොම් ගේ හිස සිතුවිලි බරින් නැමී තිබුණි. ඔහු දන්නා වතු කීපයක ම මේ කොළ රෝගය පැතිරී පැවැත්තේ ය. මයික් ඔපැරල්, හියු, ඉයන් ස්ටුවර්ට් හා තවත් හදෙනකු ගේ පමණ වතු මේ රෝගයට ගොදුරු වී තිබුණි.

යන මග ඔස්සේ කෙළවරක් නැතිව තුබූ කෝපි ගස් පේළි දෙස හේ බැලී ය. සමහර ඒවායේ රෝග ලක්ෂණ යන්තම් පැවැති අතර, සමහර ගස්වල කොළවල යට පැත්තේ නාශක කහ පැල්ලම් විය. තවත් සමහර ඒවාට රෝගය තදින් ම වැළඳී, කොළවලින් තොර ව ගස් මැරුණාක් මෙන් විය.

දෙවියන් පල්ල, මෙහෙම අවස්ථාවක දී මහ හැරලා මා එංගලන්තයට යන්නේ කොහොම ද?

පීඩාවට පත් මිත්‍රයන්ට උදව්වීමටත්, උදව් කළ යුතු වූත් අවස්ථා දවසක් දවසක් පාසා වැඩි වෙයි. වතු වැඩි ගණනක වැඩ නැවතීම නිසාත් කම්කරුවන් ගේ ගණන බොහෝ සෙයින් අඩු කිරීම නිසාත් ඔවුන් අතර පැවැත්තේ මහත් නො සන්සුන් කමකි.

අශ්වාරෝහකයකු එනු දුටු ටොම්, ඒ තැනැත්තා සුදුමැලි සිහින් මුහුණකින් යුත්, වැඩි සනීපයක් නැති ජෝර්ජ් සෙඩන් බව දැනගති. ජෝර්ජ් ළඟට ම අවුත් අශ්වයා නැවැත් වූ විට වෙනදා මෙන් ප්‍රීතිමත් ලෙස ආචාර කෙළේ ය. ජෝර්ජ් තමාගේ හිරිහැර කරදර ගැන ඕනෑවට වඩා විලාප කියන කෙනකු නො වන බව ඔහු දෙස සැලකිලි සහිත ව බැලූ ටොම් කල්පනා කළේ ය.

''කොහොම ද, ජෝර්ජ්?''

''ඔක්කොම හොඳයි, 'වනසන එමිලි' මගේ වත්තත් එක්ක යකුන් නටනවා. නැත්නම් හැම අතින් ම හොඳයි.''

මෙය ජෝර්ජ් ගේ පියා ගේ වත්ත බව ටොම් දැන සිටියේ ය. ඒ මහල්ලා මේ වත්ත ගැනීමට මුදල් ණයටත් ගත් බව ආරංචි යි. යම් හෙයකින් කොළ රෝගය නො කඩව පැවතුණොත් එය ඔහුට මහත් පාඩුවක් වනු ඇත.

''ඔබ ඒ ගැන කරන්නේ මොකක් ද? ගෙන්දගම් කුඩු ඉහිනවා ද?''

''මම ගෙදර යනවා, ටොම්.''

ජෝර්ජ් ගේ ස්වාභාවික ඇදිල්ල පැදිල්ල නැතුව හෙම්හිට කතා කළෙන් ටොම් අනුකම්පා සහගත ව ඔහු දෙස බැලී ය.

''පලදව විනාශ වෙලා තියෙද්දී මේ ස්ථානය පාලනය කරන්ට වියදම් කරන්ට බෑ,'' යි කියමින් ජෝර්ජ් කනස්සලු විය. ''මම ඉන්නේ ආපහු රට යන්ටයි. විකිණිය හැකි මුදලකට හැම දෙයක් ම විකුණා දමා ඉක්මනින් ම. . . . .නැහැ. . . . .ලාබ ම නැවකින් යන්ටයි මං හදන්නේ.''

''මට කනගාටුයි, ජෝර්ජ්. මට කළ හැකි උදව්වක් තියෙනවා නම්. . . .''

ජෝර්ජ් හිස සැලී ය. ''ඒ ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඔබට කරන්ට පුළුවන් දෙයක් තියෙනවා—මගේ අස්සයා ගන්න. ඌ පිට යනවාට මම කැමැති නෑ.'' ඔහු ඉදිරියට අවුත් අසු ගේ බෙල්ල කරුණාවන්ත ලෙස පිරිමැද්දේ ය.

''බොහොම සන්තෝසයි. ඔබට ඕනෑ ගණනකට. නිතර ම ඔය අස්සයාට මගේ ආසාවක් තිබුණා.''

''බොරුකාරයා.''

ජෝර්ජ් ගේ මුහුණේ හදිසියේ ම බැරෑරුම් පෙනුමක් ඇති වුණි. ''ටොම්, ඔබ ඌව ගන්නවාට මම කැමතියි, ටොම්. ඔබත් සේරාත් මට කළ උදව් බලනකොට මේක පොඩි දෙයක්.'' ඔහු හැරී ඉක්මනින් කන්ද පාමුලට අසු මෙහෙය වී ය. පසුව ටොම් හෙමිහිට ලන්තානාව දෙසට අසු නැග ගියේ ය.

සේරා හා ඩයනා තණ පිට්ටනියේ මැක්ස් නමැති බල්ලාත් සමග සෙල්ලම් කරමින් සිටින අතර ඩයනා මොහු හමුවීමට දුව ආවා ය. ටොම් ගේ දෙනෙත් මොහොතකට දීප්තිමත් විය. ඩයනා ගේ සුරතල් සිනහවෙන් හා දඟකාර ලීලාවෙන් ඔහුට ලැබෙන ප්‍රීතිය අන් කිසිවකුට දිය නො හැකි විය. හේ වහා ඇ සිඹ වැළඳ ගත්තේ ය.

ඕ ද ඔහු සිඹ ඔහුගෙන් මිදී බල්ලාත් රැගෙන දිව්වා ය. ටොම් හෙමිහිට සේරා ළඟට ගියා ය.

''ජෝර්ජ් සෙඩන් දේපළ විකුණා දමා රට යනවා,'' හේ කී ය.

''හා නෑ, ටොම්. මේ කොළ රෝගය නිසා**?**''

හේ හිස සැලී ය. දෙදෙනම නිශ්ශබ්දව නිවසට ගමන් ගත්හ.

''සේරා. . . .'' යි කියා මොහතකට ඇගෙන් ඉවත බැලූ ටොම් නැවතත් එඩිතර බැල්මෙන් යුත් දුඹුරු පැහැති දෙනෙතින්, ඇගේ ගෞරවයට භාජන වූ සිතුවිලි බර ශාන්ත ස්වරයෙන් යුතුව, ඇ දෙස හැරී, ''ඔබට මෙසේ කිරීමට දෙයියන්පල්ල මා කැමැති නැහැ, ප්‍රේමිය. ඒ වුණත් මට දැන් මෙහි ඉන්ට සිද්දවෙලා තියෙනවා. මේ අවස්ථාවේ දී මට මගහැරලා යන්ට බෑ. සමහර විට මට උදව් කරන්ට පුළුවන් මාර්ග ඇති විය හැකියි. . . .'' හේ කථාව නැවැත් විය. ''ඕනෑ නම් ඔබට හා ඩයනාටත් ආපහු රට යන්ට පුළුවනි.''

සේරා ඔහු දෙස බලා මේ විදියට කරුණු සැලසෙනු ඇතැයි ඕ නිතර ම දැන සිටි බව කල්පනා කළා ය. ඇ කුමක් කීවත්, ඔහුගේ තීරණය නො වෙනස් වන බව ඔහුගේ ඇස්වලින් ම ඇට පෙනුණි.

ඕ දිග සුසුමක් හෙළුවා ය. ''අපි ඔක්කොම නවතිමු'' යි කීවා ය.

ඇගේ සිතට තවත් බරපතළ සිතුවිල්ලක් පළමුවෙනි වරට පැන නැඟුණි. තවද ටොම් ගේ මුහුණ දෙස බැලූ ඇට පෙනුණේ, මේ දුෂ්කර තත්ත්වය ඇට වඩා දීර්ඝ කාලයක් ටොම්ට මහත් බරක් වී තුබුණු බව යි. ඩයනා හා ඇ වෙනුවෙන් ලන්තානාව වර්තමාන තත්ත්වයට ගෙන ඊමට ඔහුගේ ජීව රුධිරය පවා ඊට කැපකර තිබුණි.

අනේ දෙවියනේ. . . . . .යම් විදියකින් ලන්තානාවටත් කොළ රෝගය වැළඳුණොත්?

3

මේ දවස්වල ගිලුණු දෙනෙතින් හා වෙහෙස පත් ගතින් යුතුව ටොම් අවදි විය.

අරලිය වත්තට කොළ රෝගය බෝ වූ බව අසා හේ කම්පා විය. ශෝකයෙන් මැඩලනු ලැබ, සිය මස්සිනා බැලීමට යාමට තීරණය කෙළේ ය. එහෙත් හියු කොළඹ ගොස් යයි ගොන්සාලේස් කී ය. සති ගණන් ගත වූ නමුත් අරලිය වත්තට තවමත් හියු නාවේ ය. තමාට වත්තක් ඇති බවවත් මස්සිනාට මතක නැති වී දෝ හෝ යි ටොම්ට සිතුණි.

තුරඟ තරඟ සමයේ අශ්වාරෝහක මහතුන් ගේ තරඟවලින් ජයග්‍රහණය ලැබූවන් ගේ නම් අතර හියු සඳහන් නො වූ රේස් පොරයක් නැති තරම් විය. හැම වැදගත් පෝලෝ ක්‍රීඩාවක දී ම පාහේ විශිෂ්ට ක්‍රීඩකයකු වශයෙන් හියු නෙවිල් ගැන පත්‍රයේ වාර්තා විය.

තමාගේ වත්තට වෙන්නේ කුමක් දැයි කියා යන්තමින්වත් සැලකීමට හියුට ඕනෑ නැති වී දැයි ටොම් පුදුම පත් විය. ඔහුගේ පුත්‍රයාට ඔහු හිමි කරන්ට යන වස්තුව ගැන බිඳක්වත් ඔහු කල්පනා කළේ ද?

අවුරුදු ගණනක් මුළුල්ලේ ටොම් හෙම්හිට ඉතා මහන්සි වී දියුණු කළ මේ වත්තට බලවත් තර්ජනයක් කරමින් එක රැයක් පමණ සුළු කාලයක් තුළ දී ලන්තානාව අසලට මේ රෝගය පැමිණියේ ය. නින්දෙනුත් අවදිවත් ටොම් ගේ සිතුවිලි යොමු වූයේ ඔහු අවට වතුවලට වැළඳුණු රෝගය ගැනයි. සිතුවිලි දමක පැටලී සිටි ටොම් දිනපතා ම නින්දෙන් අවදි වූයේ පසුව ද තත්ත්වය කෙසේ වෙද්දූ යි යන කල්පනා බරින් මැරී ගිය චිත්ත පීඩාවකින් වෙහෙසුණු ලීලාවෙනි. හැම රාත්‍රියක ම නින්දට ගියේත් තවත් දවසක් මේ නපුරු වසංගතයෙන් ලන්තානාව බේරුණා යන හැඟීමේ සැනසිල්ලක් ඇතුව ය. දේව පිහිටෙන් මෙය මෙසේ ම වේවා. තමාගේ වත්තේ කර තිබෙන විශිෂ්ට වැවිල්ලට උසස් ආදයමක් තමාට ලබා දීමටත් රෝගය මැඩ පැවැත්වීමට තරම් ඒ සාරවත් ගස්වලට හැකි වීමටත් ඉඩ තිබුණි.

එහෙත් ත්වයිට්ස් සමග ඔහු කළ සාකච්ඡාවෙන් ඔහට සැනසීමක් නො ලැබිණි.

''මෙය එන්ට එන්ට වැඩි වෙනවා, ටොම්. මීට පිළියමක් සොයන්ට මා උත්සාහ කළේ නැතැයි ඔබ හිතනවා ද? මේ කොළ රෝගය පැතිරීම කෙසේ හෝ නවත්වන්ට මගේ රසායනාගාරය ඇතුළතත් එයින් පිටතත් පැය ගණන් මා ගත කරන්නේ නැතැයි ඔබ හිතනවා ද?'' ත්වයිට්ස් මෙසේ හැඬී ය. ''බ්‍රිතාන්‍යයේ හොඳ ම මොළවලට මා ලියා තිබෙනවා. ඔවුන්

මට කියා එවන්නේ මා දන්නා දේ ම යි. මේ දිලීරය ඊට ඉතා ම හොඳ කෑම වර්ගය සොයා ගෙන තියෙනවා. එක කෝපි පැළයකින් යැපෙන්ට පුළුවන් තෙක්, එය වෙන අතක් සොයන්නේ කුමට ද?''

කවුළුවෙන් ඈත අඳුරු පෙදෙස දෙස මලානික බැල්මක් හෙළමින්, සුදුවන් ඇසිබැම් සහළ යා වෙන සේ රැළි ගසමින්, කල්පනාභරිත ව සිටින ඔහු තවමත් ටොම්ට පෙනුණි. ලංකාවේ සිය සේවා කාලය නිමවීමට ආසන්න ව, ප්‍රතිකර්මයක් සොයා ගත නො හැකි රෝගයක ගැටළුව විසඳමින් සිටි මහලු මිනිසකු ය, ටොම් දුටුවේ.

අන්තිමේ දී හියු අරලිය වත්තට ආපසු පැමිණි බව ගොන්සාලේස් කීයෙන්, ටොම් සිය මස්සිනා හමුවීමට දුක්බර සිතකින් පිටත් විය. හියු වත්ත ගැන නො සලකා හැර සිටින බව මාස කීපයකට පෙර මයික් ඔපැරල් කී වේලේ ටොම් එහි ගියා නම් සමහර විට අරලිය වත්තට මේ රෝගය මැඩපවත්වන්නට හැකිවෙන්ට නො තිබුණි යයි කාට කිව හැකි ද? දැන්වත් මේ ස්ථානය කොන්දෙස්තරට ඕනෑ හැටියට වැඩ කරන්ට භාර නො දී හියුට මෙහි ටිකක් නැවතීමට පෙළඹවීමට ටොම්ට සිත් වූයේ මෙද උදේ අරලිය වත්ත ගැන ගොන්සාලේස් කී කරුණු වගයක් නිසා ය.

තමා ඉදිරියට ඇත්තේ එතරම් පියකරු නො වන වැඩක් බව දැනගෙන ස්ථිර අධිෂ්ඨානයකින් යුක්තව යි ටොම් පිටත් වූයේ.

ලන්තානාව හා අරලිය වතු අතුරින් ගලා යන ඇළ පසු කළ වහා ම ටොම් ගේ පුපුරුදු බර අඩිය පැකිලෙන්නට විය. තමාගේ වත්ත හියු මෙසේ නො සලකා හරින්නේ කවර හෙයින් ද? කෝපි ගස් යට ගන ව වැඩුණු වල් පැලැටි; නිසි ලෙස කප්පාදු නො කිරීම නිසා වැහැරී ගිය අතු; දිරාපත් වූ කෝපි සාදන ගෙය හා මඩුව යන මේ සියල්ල ටොම් දුටුවේ ය. කරුණු මෙසේ තිබිය දී හියු ගේ ගස්වලට කොළ රෝගය බෝවී පලදාව අඩුවීම පුදුමයක් නො වේ.

සිත් කම්පාවට පත් වූ ටොම් ඉදිරියට ම ගියේය. ඔහුගේ වැවිලිකාර ඇසට හැම පසින් ම දක්නට ලැබුණේ නො සැලකිලි කමේ ලකුණුය. මාස කීපයකට පෙර ඔහු මේ වත්ත පාලනය කළ දුෂ්ට කොන්දෙස්තර ගැන කරුණු හියුට කී නමුත් තමාගේ වැඩ බලාගන්ට යයි නො කියා කී බැවින් ඔහුට අවවාද දෙන්නට තැත් නො කෙළේ ය. ඔවුන්ගේ ළමා කාලයෙන් පසු ව, අවවාදයක් දීමට හෝ උදව්වීමට ඉදිරිපත් වූ හැම විටක ම හියු ඊට පටහැනි වූ අන්දම පුදුමයකි. එමෙන් ම දෙදෙනාම ඔවුනොවුන්ගේ නරක පැත්ත දෙස ම බැලූ සැටිත් පුදුමයකි.

ගස්වැලින් ආවරණය වූ බරාඳය සහිත බංගලාව දුන් ඔහු ඉදිරියේ විය.

''දෙයියනේ, බලන්නකො කව්ද ඇවිත් ඉන්නෙ කියලා මයික්. මගේ යස මස්සිනා ටොම්නෙ, වෙන කවු ද?''

හියු ගේ අලස කටහඬ බරාඳයේ තුබූ නැම් පුටුවකින් නික්මිණි. ටොම් ඔවුන් දෙසට මුහුණ රතු කර ගෙන යද්දී මයික් ඔපැරල් පසෙකින් එබඳු ම පුටුවක සිටින සැටිත්, දෙදෙනා අතර ඔවුන් තනි රැකීමට මෙන් විස්කි බෝතලයක් හා වීදුරු දෙකක් සහිත කනප්පුවක් තුබූ සැටිත් දුටුවේ ය. ටොම් ගේ බැලිම තියුණු විය. ඔහු බලාපොරොත්තු වූයේ තම මස්සිනා, හුදකලා ව හමුවීමට ය.

''එන්න ඉස්රහට ටොම්. පමාවුණොත් ගියා. අඩ්ඩක් එහෙම ගහලා කියනවකො තමුසෙගෙ ඔය හොඳ ඔප වැටුණු නළල රැළිගැනෙන්ට හේතුව මොකද කියලා?''

හියු ගේ මේ විකාර ලිලාව නිසා බැරෑරුම් බවක් හඟවන්ට ටොම් ඉඩ නො ලද්දේ ය. තමාගේ දේශනාව අන් දිනකට කල් තබා මෙදින හොඳට ම ප්‍රීතිවීමට තිරණය කර ගත් ටොම් සිනාසුණි.

''මේ දවස්වල අපට උඩරට දී ඔබ වැඩිය දකින්ට ලැබෙන්නේ නෑ නොවැ,'' යි බීම වීදුරුවක් ගනිමින් හේ පැවසී ය.

''සමහර විට මට මොකුත් මෙහෙ නැති නිසා. . . . .''

''ඇයි ඔබෙ වත්ත. . . . . .''

''මගේ මුළු ජීවිතයේ අගත් මුලත් වත්ත නො වෙයි.''

''ඔබේ කෝපිවලට සෑදී තියෙන කොළ රෝගය ගැන මට කනගාටුයි.''

''මට තරම් කනගාටුවක් නැතුවා හේමා, ටොම්,'' යි හියු නො සැලකිලිමත් ව පැවසී ය.

ටොම් නිරායාසයෙන් මෙන් හිස සැලී ය. හියු කිසි දෙයක් කෙරෙහි වැඩි සැලකිල්ලක් නො දැක්වීමත්, ජීවිතයේ ඕනෑ ම අතකට පෙරළීමට ඇති බිය සැක නැති ගතියත් ඊර්ෂ්‍යා කරවන සුලු විය. මහත් බරපතළ කම් සිත දරා සිටීම මොන ශාපයක් දැයි ටොම් කල්පනා කෙළේ ය.

ඔවුන් එහි වාඩි වී සිටිද්දී ම ඇඳිරි වැටුණි. මස්සිනා ගේ මුවින් ගිලිහුණු වචනවලින් ආ අලස හඬ අසමින්, මයික් ඔපැරල් හිටියත් නො හිටියත් වත්ත ගැන කිසිවක් තමා කිව යුතු දැයි ටොම් නැවතත් සිතා, කිසිවක් නො කීමට තීරණය කර ගත්තේ ය.

ඔව්හු කතාව වෙන අතකට යොමු කරමින් එංගලන්තයේ හැරෝ මහා ශාස්ත්‍ර ශාලාවෙන් ළඟ දී පිට ව සිය පියාට එකතු වීමට එන ඩේවිඩ් ගැන කථා කළහ. ඩේවිඩ් ගේ වයස දහහත් අවුරුද්දක් නො වේ දැයි, ටොම්ට හදිසියේ සිතට නැඟුණි. වයස් ගතවන නමුත් හියු ගේ කම්මුල් ළඟ හිසකෙස් යන්තමින් සුදු වී තිබෙනු මිස වැඩි වෙනසක් නැති අතර, තමා බරපතළ හැඟීම් ඇති තලත්තානියකු වී සිටින බව ටොම්ට පෙනි ගියේ ය.

මඳක් නො මනාපයෙන් මෙන් මෙසේ වන්නේ ඇයි දැයි ඔහු සැක කරන්ට වූයේ ය. අවුරුදු දෙකකට වැඩි මහලු වුවත්, වගකීමෙන් විරහිත ව, දැඩි දිවි පෙවෙතක් ගත කරන හියු, ඔහුගේ තාරුණ්‍යය රැකගත්තේ කෙසේ ද?

මෙබඳු හැඟීම්වල සිත ගැටෙමින් සිටිය දී කව්දෝ කළු පැහැති මිනිසෙක් ඇඳිරියේ ම බරාඳය අසල කැරකුණේ ය.

මේ දැවැන්ත කළු මිනිසා ටොම් ගේ පුටුව පිටිපස සිට ආචාර කරත් ම, ''අනේ දෙයියනේ, මේ රිලා මූණ මා දැක්කේ කොහේ දී ද? හා, හා, මේ ඔබේ ඉඩමේ සිටි කරුප්පන් කන්කානියා නේ ද, ටොම්?'' යි මැක් විචාළේ ය.

ඔහු දෙස බැලීමට ටොම් හැරෙනවාත් සමග ම ඔහු අඳුරට නැමෙනු දක්නා ලදී.

''මට ජේන හැටියට ඔහු වැඩට දක්ෂයි,'' හියු කම්මැලිකමින් කී ය. ''ඊට අඩු පඩියට මිනිසුන් නැති නිසා මගේ කොන්දෙස්තර ඔහු ළඟ දී රස්සාවට පත්කර ගත්තා. ඔහු එළවා දමන්ට මට කරදරවෙන්ටත් බැ.''

''ඔබ මෝඩයෙක්, හියු.''

''එහෙම හිතනවා ද, ටොම්. ඔහු පාඩමක් ඉගෙන ගත්තා. ඔබ ඔහු දෙටට දැම්ම ද පටන් ඔහුට රස්සාවක් නැතුවයි හිටියේ.''

''නෙවිල්ලා සමග තරහ වෙන්ට එයම මදැ,'' මයික් කී ය.

''ඔහුගේ යම් අමනාපයක් තියෙනවා නම් ඒ ඔබ සමග ටොම්. මා එක්ක නො වෙයි.''

හියු කන්කානියා දෙසට හැරුණි. හුවමාරු වූ දෙමළෙන් එක ම දරුවා දරුණු බඩේ ලෙඩකින් පෙළෙමින් මරණාසන්න ව සිටින බවත්, දැන් ඔහුට හියුගෙන් ණය මුදලක් ඕනෑ වී තියෙන බවත් පෙනුණි.

''වෙන ණය දෙන්න බැ. ගිය සැරෙත් මා කිව්වා නේ ද?'' යි හියු තදින් පැවසී ය.

කන්කානියා ගේ දෙනෙතින් කඩා හැලුණු කඳුළු පහන් එළියෙන් ජේන්ට වූයේ ඔහුගේ ඕනෑකමේ බරපතළ බවක් දැක් වී.

''දැන් නම් ඔහු කියන්නේ ඇත්ත වගේ මට හිතෙනවා,'' යි මයික් කී ය.

හියු ගෙයි කාමරයකට ගොස් ඔහු සකස් කළ බෙහෙත් කුඩු වගයක් ගෙනවුත් කරුප්පන්ට එයින් එක කුඩක් එද රැටත් අනික පසුවදටත් දෙන්ට නියම කර දුන්නේ ය. ඉන්පසු ''දෙශීය බෙහෙත් ගැන කියන්ටවත් ණය මුදල් ඉල්ලන්ටවත් එන්ට එපා,'' යි හේ කීවේ ය.

''මහත්තයා මේ බෙහෙත් හරියන්නේ නෑ. මගේ ළමයාට තියෙන්නේ යක්ෂ දිස්ටියක්. ඒ යකාට ඕනෑ කරන්නේ මගේ ළමයා මරා ඌට ගේ අයිතිකර ගන්ටයි. අනේ මම මේ සල්ලි ඉල්ලන්නේ මගේ එක ම දරුවා බේරා ගන්ටයි.''

''බැහැයි කියා මා කිව්වා නේද?'' යනු හියු ගේ පිළිතුර විය.

කරුප්පන් ඔහු දෙස රවා බලා යන්ට ගියේ ය. මයික් ද හියුට අවවාද කිරීමට නො කැමැති වූයේ ඔහුගේ වැඩක් බලාගන්ට යයි වරක් හියු ඔහුට තරවටු කළ බැවිනි.

කරුණු සැලසුණු අන්දමින් වත්ත ගැන කිසිවක් අවවාදත්මක ව නො කීම නුවණට හුරු බව ටොම්ට වැටහුණේ ය. ලන්තෑරුමක් අතින් ගත් කම්කරුවකුත් කැටුව ටොම් අරලිය වත්ත හරහා ගියේ ය. ඔහු මෙහි දී දුටු සියල්ලෙනුත්, තමා කියන්ට ආ දේ නො කීමෙනුත්, කරුප්පන් කන්කානියා ගේ දුෂ්ට බැල්මෙනුත්, ලයින්වල වේදනාවෙන් පෙළෙමින් දරුවකු නගන දුබල හඬිනුත්, ටොම් චිත්ත පීඩාවට පත් විය.

පසු ද උදේ අරලිය වත්තේ ලයින්වලින් නැග ආ බෙර හඬ අසා ඒ කුමක් දැයි ගොන්සාලේස්ගෙන් ටොම් විචාළේ ය. එහෙත් ඔහු පිළිතුරු දීමට පෙර ඒ කුමක් විය හැකි දැයි ටොම් දැනගති.

කරුප්පන් ගේ දියණිය මළා ය.

4

අරලිය වත්තේ ආරාවුල් වියවුල් ඇතිවෙතැ යි ටොම් බලාපොරොත්තු වූ නමුත් එහි සියල්ල ශාන්ත ව පැවැත්තේ ය. තමාගේ සිතේ පැවැති භීතිය අස්ථාන එකකැ යි ඔහුට වැටහුණි. නැවතත් තමාගේ කටයුතු ඔහුගේ සිතෙහි මුල් තැන ගති.

කොළ රෝගය නිසා ඒ අවුරුද්දේ මහත් කැළඹීමක් පැවැති නමුත් එඩින්බරෝහි ආදිපාද ඇල්ප්‍රඩ් අර්නස්ට් ඇල්බට් කුමාරයා පිළිගැනීමට ලංකාව ලකලැස්ති වෙමින් සිටියේ ය. වැවිලිකරුවන් අතර විශිෂ්ට කීර්තිලංකාව යක් ලැබ සිටි ටොම්ට උද්‍යාන ප්‍රිය සම්භාෂණ, භෝජන සංග්‍රහ, බාල් නැටුම්, පෙරහැර ආදිය සඳහා ගලා ආ ආරාධනා පත්‍ර දුටු ඔහුට මුලින් සිතුණේ ඒවා විනීත ලෙස ප්‍රතික්ෂේප කළ යුතුය කියා ය. එහෙත් සේරාට විනොදස්වාදය ලැබිය හැකි අවස්ථාවන් සැලසීමට ඉන් ඇති ඉඩ ප්‍රස්තා දැක, ඒ ඇරයුම් පත් ප්‍රීතියෙන් අතපත ගා බලන්නට විය.

ඩයනාට පාඩම් කියා දෙමින් ඇ මිදුලේ සිටින විට, හේ ඇරයුම් පත් සියල්ල ම ඇගේ උකුල මත තැබී ය.

‘‘ප්‍රේමිය, මේ උත්සවවලට යාමෙන් ඔබට ප්‍රීති වෙන්ට පුළුවනි. හොඳ ලස්සණ ඇඳුම් රාශියක් ගන්ටත්, අමුතු අය කීප දෙනකු හඳුනා ගැනීමටත් ඔබට මෙයින් ප්‍රස්තාව ලැබෙවි.’’ ඔහු ලජ්ජා සහිත ව මඳ සිනහ පහළ කෙළේ ය.

සේරා ආරාධනා පත්‍ර දෙස බලා අමන්දනන්දයට පත් වූවා ය.

‘‘හා ටොම්! ඇත්තට ම ඔබෙ අමනාපයක් නැද්ද? මේවා ඔබ කොතරම් පිළිකුල් කරනවා ද කියා මම දන්නවා.’’

‘‘අපි දෙන්නාට ම මෙයින් හොඳක් වේවි නේ ද?’’ ඔහු කතාව නවත්වා ඇගේ නළල සිප ගත් විට හිසට හිස තබා ඇ ඔහු වැළඳ ගත්තේ පසුගිය හදිසි අනතුරෙන් පසු මෙතෙක් නො කළ ලීලාවකිනි.

පළමු ව කොළඹ ගොස් එඩ්වින් පැරඩේලා ගේ ගෙදර සිට ඇට අවශ්‍ය ඇඳුම් ආයිත්තම් ගැනීමට ද ඊ ළහට ඔවුන්ට ආරාධනා ලැබී තිබෙන උත්සව බොහොමයක් මහනුවර පැවැත්වෙන බැවින් එහි යැමට ද ඔවුහු අදහස් කළහ. ඩයනා මැක්ලොයිඩ් නෝනා ළහ නවත්වනු ඇත.

දවල් කාලයේ කොළඹ සූර්ය තාපය ඉතා සැඩ ය. පොළොව ඉරි තැළෙන තරම් රත් වේ. යන්තමින් හෝ හමන සුළහට නැග එන ධූලිවලින් වීදිය දෙපස ගස්වල රත් මල් නැවී යෙයි.

හිරු බැස යයි. ඇත ක්ෂිතිජයට තරමක් උඩින් පටන් ගන්නා රත්පැහැ වූ සැදෑ වළාවෝ අහස ද, පොළොව ද, ඇත මුහුද ද එකාකාර ව රක්ත වර්ණයෙන් බබළවති. ඉන්පසු ඇතිවෙන නිසල බවත් සමග ම හැම දෙසින් ම අඳුර පැතිරේ.

හිරිගල් පරවල ගැටෙන තරහ පෙළින් බිඳෙන හඬ මිස නිශා සමය මුළුමනින් ම නිසල ය. අහසේ බබළන තුරුරැස් දහර ළසඳ එළියට නිගා දේ. සියල්ල පරයා බබළනුයේ සිකුරු තරුව යි.

ගවුමට උඩින් තුබූ කබාය උර හිසින් පන්නා කැඩපත ඉදිරිපිට ඉඳ ගැනීමට පෙර සේරා ඔර්ලෝසුව දෙස බැලුවා ය. වේලාව අලුයම දෙක ය. අහසේ දිලෙන තරු නව ම විදුරු මිණි මෙනි. එඩ්වින් ගේ නිවෙස පිටිපස විලෙහි රිදී දිය කඳ, පුන්සඳ එළියෙන් බැබළිණි.

රන් හා සුදු පැහැති විසිතුරු පට පිළියෙන් කළ ඇඳුම ලා ගත් ඇගේ පිළිබිඹුව දෙස බලමින් ඕ ඇනුමක් ඇරියා ය. සැන්දෑවේ අතිශයින් ප්‍රමොදයට පත්වී සිටි ඕ නැවතත් කඳුකරයට යෑමට පුල පුලා සිටියා ය.

මුල දී සාප්පු යෑමෙන්, මිතුරියන් හමුවීමෙන්, උත්සවවලට සහභාගිවීමෙන්, ඕ ආස්වාදයක් ලැබුව ද, ක්‍රමයෙන් ඒ ප්‍රීතිය පිරිහී ගියේ ය. අගනුවර උෂ්ණයෙන් පෙළෙමින් නිදගත නො හැකි ව එළිවෙන්ට බොහෝ වේලාවකට පෙර අවදි ව ටොම් ගේ හා ඇගේ කාමර ඉදිරිපිට ඇති සඳලුතලයට හොරෙන් ම ආ ඇට නැවතත් ලන්තානාවේ හුදෙකලා භාවයේ ප්‍රීති රසය විඳීමට බලවත් අභිලාෂයක් ඇති විය.

ඉම් සා උදැසන කොළඹ පැවැත්තේ මුදු සිනිඳු ගතියක් වුවත්, මෙ පරිසරය කිසි සේත් ඇගේ සිත් නො ගත්තේ ය. දිරා ගිය පොල් අතු සෙවිලි කළ අඹරාවක් සහිතව පාරේ ගමන් කරන බර කරත්තයක් ද, නගරයෙන් ඈත පිරිසුදු ළිං වලින් ගෙනා ජලය විකුණන මිනිසකු ද, රත් පැහැති තලප්පාවකින් හිස සරසා ගත් රියැදුරකු කොහේ දෝ සාදයකට ගොස් පෙරළා ගෙදර එන කනස්සලු යුරෝපීයයකු නංවා ගෙන දක්කන රථයක් ද දෙස ඕ අලස ව බලා සිටියා ය.

වත්තේ කම්කරුවන් දූන් වැඩට රැස්වෙනු ඇත. තණ මත වැටී ඇති පිනිබිඳු දහස් ගණන් විදුරු මිණි සෙයින් බබළන අතර කඳු පිස එන මඳ නල කුරුළු ගී රැව් දසත පතුරවනු නියත ය.

මහ වැහි වලාවක ලකුණු පැය විස්සකට පෙර මෙන් දැනුදු අහසේ විය. අනාගතයේ දී මුහුණ පාන්ට වන භයංකර හා බරපතළ අවස්ථා ගැන මෙ අවස්ථාවේ දී ඇට සිහිපත් වූයේ ය. මුළු හැන්දෑ කාලයේ දීත් බාල් නැටුමේ දීත් කිසි ම පදනමක් නැති සිත් තැවුලකින් ඕ පෙළෙන්ට වූවා ය.

බාල් නැටුම ගැන සිත යොමු වෙත් ම සන්ධ්‍යා සමයේ පැවැති ශ්‍රී ශොභාව ඔහට යළිත් සිහිපත් විය. දික් වූ රතු කබා හැඳ, උස් තොප්පි හිසලා සිටි ලස්කරිඤ්ඤ භට හමුදාව, එඩ්වින් ගේ රථය දෙරටුව පසු කරනවාත් සමඟම ආචාර පැවැත් වූ ලීලාව ඕ දුටුවා ය. ආණ්ඩුකාර තුමා ළඟ සේවයට නියමිත සුදු ඇඳුම්වලින් සැරසුණු සේවකයෝ, ඒ රථයේ දෙර හළහ. සැමියා ගේ අත අතින් ගෙන සේරා රත් පැහැති බුමු තුරුණ මත විශාල විසිත්ත කාමරයට ගමන් කරත් ම, තමන්ගේ නම් අඬ ගසනු ඇට ඇසුණි.

සර් හර්කියුලස් රොබින්සන් ආණ්ඩුකාර තුමා කෙරෙහි ඕ පැහැදී සිටියා ය. මීට පෙර දෙවතාවක් ටොම් සමග රජ ගෙදර භොජන සංග්‍රහයන්ට සහභාගි වූ ඇට ඒ ආණ්ඩුකාර තුමා ප්‍රසන්න කෙනකු බව දැනුණි. මුඩුව ගිය හිසකින් හා ගා දැමූ රැවුලින් යුත් ආණ්ඩුකාර තුමා ඇගේ රූප ශොභාවෙන් ප්‍රමුදිත ව මඳ සිනහ පා, ඇ සමග ආලිංගන නැටුමක යෙදෙමින් ‘‘වැවිලි කර්මාන්තය නිසා ඉතා පියකරු කතුන්ගෙන් කෙනකු කොළඹට නො ලැබී යාම ලොකු අභාග්‍යයකැ,’’ යි මිමුනුවේ ය.

‘‘ඔබ වතු ජීවිතයට කැමැති ද?’’ යි ඇගෙන් විමසී ය.

‘‘ඔව්, ඒකාන්තයෙන් ම,’’ යි ඕ පිළිතුරු දුන්නා ය.

‘‘මම බොහොම සන්තෝෂයි. ඔබේ සැමියා ඒ පැත්තේ නම ගිය කෙනෙක්. ඔහු කරන හොඳ වැඩත්, වැවිලිකරු සංගමයේ ඔහු ක්‍රියා කරන පිළිවෙළත්, එඩ්වින් පැරඩේ මට කියා තියෙනවා. එබඳු මිනිසකුට උදව් කරන්ටත්, හිරිහැර කරන්ටත් බොහෝ දුරට පුළුවන් වන්නේ ඔහුගේ බිරිඳටයි’’ හේ හෙමිහිට කී ය. සිනහ පාමින් ඇ වෙත බලා, ‘‘ඔබේ සැමියා ඇත්තෙන් ම වාසනාවන්තයි’’ කියේ ය.

5

ඇන්ගස් මැක්ලොයිඩ්ට මැණියන්ගේ අභාවයෙන් වූ ශෝකය මදිවාක් මෙන් ඔහුගේ වත්තට කොළ රෝගය ද බෝවුණි.

හේ ටොම්ට මෙසේ ලීය:—

‘‘මම බඩු පටවාගෙන කැනඩාවට යන්ට බලාපොරොත්තු වෙමි. අවශ්‍ය වැඩ කරවා ගැනීමට භාරකාරයකුයි, කෝකියකුයි ඉතුරු ව අනික් හැම දෙනා ම පිටත් කෙළෙමි. ඩන්ඩී වත්ත මිලයට ගන්ට ද කෙනකු සොයා ගෙන සිටිමි. එය සුළු මුදලකට බව කීම අනවශ්‍ය ය.

මෙහි සියල්ල ම මට මැණියන් සිහි කිරීමට ඉවහල් වෙයි. ඇ සිටියා නම් මා මෙහි ම නවත්වන බව දනිමි. අපි කොළ රෝගය ගැන නිතර කතා කෙළෙමු. ඇගේ අදහස වූයේ යම් විදියකින් වත්තට මේ රෝගය බෝ වුණොත් කෝපි උගුල්ලා තේ වැවීම යොග්‍ය බවයි. එවැනි ගතියක් ඇ තුළ තිබුණි. ඇ අද සිටියා නම් මා ලවා එය කරනවාට කිසි සැකයක් නෑ. මම ද ඊට කැමැත්තෙන් ම අවනත වෙනවා නිසැකයි.

අද තත්ත්වයේ හැටියට මා එක්කෝ අලුතු ජීවිතයක් ඇරඹිය යුතුයි. නැත්නම් පිරිහී යා යුතුයි. මට හැකි එකම ක්‍රමය පිටරට ගොස් මුල සිටන් ම වැඩ ඇරඹීම යි. මෙහි සිටගෙන තේ හෝ සින්කෝනා වැවීමෙන් එය කළ හැකි නො වේ දැයි ඔබ කියාවී. තාත්තා වැවූ කෝපි උගුල්ලා ඒවා ගින්නට කැප කර බලා සිටින්නටත්, අප හොඳ හැටි නො දන්නා මේ අපුකට ඇට ජාතිය පැළකර කම්මැලි කමින් නැතහොත් අන්තිමට මෝඩවෙන හැටියට තුන් අවුරුද්දක් තිස්සේ බලා සිටින්නටත් හැක්කේ මහා බලයම්පන්නයකුටයි—නැත්නම් මට වඩා තරුණයකුට යි. මේ අවස්ථාවේ දී මට ඕනෑ කරන්නේ කම්මැලිකමින් සිටීම නො වේ. නො කඩව වැඩ කිරීම යි.

ඩන්ඩී අවට වතු දෙළහක් පමණ රෝගයෙන් පෙළේ. තවමත් පලදව ලැබේ. එහෙත් එන්ට එන්ට ම අඩු ය. කෝපි මිල නම් කවදවත් නැති තරමට නැඟ තිබේ. කොළ රෝගය ගැන දැන් අන්තිමට ආණ්ඩුවටත් පත්‍රවලටත් ඇස් ඇරී තිබෙන බව පෙනේ. මට නම් හැඟෙන්නේ, ත්වයිටස් කීවා හරි බව යි. ඒකාන්තයෙන් ම ලංකාවේ කෝපිවල අවසානයේ මුල මේ තමා.''

ඇන්ගස් වත්ත හැර යා යුතුව තිබුණේ නොවැම්බර් අවසානයේ දී ය. ඔහු පිට වී යෑමට දෙසතියකට කලින් නෙවිල්ලා හමුවීමට ආවේ ය. සිය මැණියන් එංගලන්තයට ගිය ගමනේ දී ඇත් දළක අන්දවා තුබූ ඇගේ කුඩා පිළිරුවක් හේ සේරාට දුන්නේ ය.

සැන්දෑව මුළුල්ලේ ඒ රූපයට නෙත් යොමු කළ සේරා එහි දක්නා කරුණාබර එහෙත් එඩිතර මුව මඩල ද, ඉන් පසු ඇට දක්නට නො ලැබෙන ඒ කුඩා නෙත් සඟළෙහි ඇති නොබාන සුලු ගතිය ද දුටුවා ය. ඇන්ගස්ට ද, ඒ ආද්ධ්‍යාත්මික ගතිවලින් සමහරක් උරුම වී තිබුණි. ඔහුගේ මැදියම් වයසේ දී ඈත පෙදෙසක ගන කැලෑවක ඔහු අමුතු ජීවිතයක් අරඹනු ඇත. වැවිලි කර්මාන්තයෙහි පුරෝගාමී වූයේත් මතුවට වන්නේත් ඔහු වැන්නෝ ම ය. සමහර විට, සභ්‍යත්වය නිසා එන්ට එන්ට වැඩිවන පහසුකම් නිසා, අනාගත පරම්පරාවල ජනයා මන්දෝත්සාහි විය හැකි නමුදු, පුරාණයේ පුරෝගාමී වූවන්ගේ ආද්ධ්‍යාත්මික ශක්තිය උරුමකර ගෙන ශාන්ත ව ද ඉවසිල්ලෙන් ද නො පැකිළ ක්‍රියා කරනවුන් ඉදහිට වත් ඇතිවන්ට පුළුවන් බව සේරා සිතුවා ය.

ඇන්ගස් පිටත් වී යෑමට නැගිටවේ ය. හේ මුඩු ව ගිය හිසින් හා මැලවුණු නෙත් යුවළකින් යුත් වීරෝදර සිනහවකින් ඔප් නැඟුණු මුව මඩලක් ඇත්තෙකි. සේරාට හදිසියේ ම මෙසේ කල්පනා විය. ''අපට නැවතත් ඔහු කවදවත් දකින්ට ලැබෙන්නේ නෑ. තවත් යාළුවෙක් සදහට ම නැති වුණා.''

ඔහු නැඟ යන අසු මඟ බැස නො පෙනී යත් ම ඈ ටොම් ගේ උරමත මුහුණ රඳවා ඉකි බිඳින්ට වූවා ය. ඇගේ නැමුණු හිසට උඩින් ඔහු පාළු පාර දෙස බැලී ය. ඔහුගේ දෙනෙත් ද කඳුළෙන් තෙමී ගියේ ය.

ඩේවිඩ් නෙවිල් ගෙදර ආවේ නොවැම්බර් මාසයේ දී ය.

සේරා මිදුලේ වැඩ කරමින් සිටින අතර කවුදෝ උස කෙනකු ඈ දෙසට කන්ද නැඟ එන බව දුටුවා ය. ඈ නැඟිට ඉවත වැටුණු කෙස් කළඹින් දැස් වසා ගත්තේ ඉරු එළිය වළක්වන අටියෙනි.

මොහොතකට නිසල වූ ඇගේ හදවත යළි කැළඹී ගියේ ය. ''හියු, මේ හියු නො වේ ද'' යි කල්පනා කළා ය. මේ ආවේ හියු නො ව, ඊට වඩා උස් වූ පළල් වූ සිරුරක් ඇති, ඒ හා සමාන ම රූ සපුවකින් යුත් තරුණයෙකි. ඔහුගේ තරුණ මුහුණ දිලිසෙන නිල්වන් නෙත් සහළකින් හෙබියේ ය.

මේ ඩේවිඩ් නෙවිල් බව ඕ හඳුනා ගත්තා ය. ඝන නිල් කෙස් කළඹ සුළඟට සෙලවෙමින්, දිගට අඩි තබමින් ඉදිරියට එන ඔහු, මුල්ලුව පසෙකට විසි කොට ප්‍රීතියෙන් පිනා ගොස් තමා වෙත දුව එන සේරා දැක, මුලින් ඇති වූ චකිතය අමතක කොට, අහිංසක කොලු තාලයෙන් ම ඈ වැළඳ ගත්තේ ය.

''සේරා නැන්දේ, මට මතක ඇති තරම් කාලයක ඔබ මෙච්චර ලස්සණට හිටියේ නෑ.''

''ඩේවිඩ් නෙවිල්, දැන් මගේ වයස යන්තම් තිහ වුණා පමණ යි. ඒක දැනගන්න.''

සේරා සිනාසෙමින් සුළඟින් ලිහිල් වූ වරලස සකස් කරගෙන ඇගේ පොඩි වූ ගවොම දෙස කනස්සල්ලෙන් බැලුවා ය. ''ඔබ මාව දැක්කේ මම මිදුලේ මෙතරම් කැතට ඉන්න වෙලාවෙනෙ. ඔබ හරියට ම ඔබේ තාත්තා වාගෙ ම යි. . . . .හරි කලබලේ! කෝ බලන්න ඔබ දිහා, හැබෑට ම මම හිතනවා හියුටත් වඩා උසෙයි කියා.''

සේරා සම්බන්ධයෙන් ඔහුගේ හිතේ කා වැදුණු කරුණු කීපයකි. 'නිකම් මතක ඇති දෙයක් පමණක් නො වේ. ඕනෑ ම විහිළුවකට කැමැති සිනහ මුසු මුහුණක් ඇත්තියක් හැටියට පමණක් නො ව ගෙදර ද කුකුළු කොටුවක් ද කාර්‍යක්ෂම ලෙස හා ශාන්ත ලෙස පාලනය කරන්නටත් පතනේ අසු නැග යාමටත් සමතියක් හැටියට ය. ඔහු උස මහත ටොම් නෙවිල් ගැන ද යම්කිසි හැඟීමක් ඇති කර ගෙන තිබුණි. බරපතළ ලෙස යමක් ගැන සලකන, නො සෙලවෙන කඳු මෙන් ස්ථිර සාර අදහස් ඇති දයාන්විත කෙනකු ලෙසිනි. පාසැල් ජීවිතය ගත කිරීමට යන්ට පෙර ඔහු මොවුන් දුටුවේ කලාතුරකින් නමුත් ලන්තානාවේ නො බිඳෙන සමගියක් හා ප්‍රීතියක් පිළිබඳ හැඟීමක් ඔහුගේ සිතේ රැඳී පැවැත්තේ ය.

ඔහු සේරා දෙස බැලුවේ ඔහු සමග නැවේ ආ තරුණියන්ට වඩා ඇ වයස් ගත නො වූ තැනැත්තියක සේ සිතමිනි. ඇගේ සිරුර තවමත් ළද බොළඳ විය. ගමන ද විනීත ය. කඩිසර ය. ඔහුට මතක තුබූ කරුණාබර ගතිය ද, විකට රසය ද ඇගේ නෙත් යුවළේ තවමත් අනූන ව තිබුණි.

''ඔබ ගැන මට කියන්නැ,'' යි ඕ ඉතා ඕනෑකමින් කීවා ය. ''ඔබ මොනව ද කළේ. මම හිතුවා ඔබ මීට හය මාසයකට කලින් එයි කියලා.'' මේ උස තරුණයා ඩේවිඩ් යයි සිතා ගැනීම දුෂ්කර විය.

ඔහුගේ ම ඉල්ලීම අනුව ලංකාවට එන්ට පෙර ඉන්දියාවේ තේ වත්තක හමාසයක් වැඩ පුහුණුවීමට ඔහුගේ පියා අවසර දී තුබුණේ ය.

''නැන්දේ, මම හිතනවා තේවලට ඉදිරියට හොඳ අනාගතයක් තියනවා ය කියා. එහෙත් වැඩ පුරුදුවීමට තාත්තාගෙන් අවසර ලබාගන්ට මට බොහොම අමාරු වුණා. නුමුත් අන්තිමේ දී ඔහු එකඟ වුණේ නො ඉවසිලි වත් ව වාගෙයි,'' හෙතෙම පැවසී ය.

ඇසෑමයේ අලංකාර තේ වත්තේ සිට ආලපාළුවී ගිය අරලිය වත්තටත්, වත්ත ගැන කිසි වගක් නැතිව හුන් පියකු වෙතටත් ආ හෙතෙම පුදුමයට හා කනස්සල්ලට පත්ව සිටියේ ය.

මේ තරම් හයංකර ලෙස කොළ රෝගය වැළඳී තිබෙනු ඔහු දුටු පළමු වෙනි වතාව මෙය යි. වියළී ගිය ගස් ද කසාවන් ලපවලින් යුත් රෝගී කොළ ද, ඔහු දුටුවේ ලාදුරු රෝගයෙන් පීඩිත ව මරුමුව ගිලී සිටින මිනිසකු ගේ ආකාරයෙනි. වත්ත සතුටුදයක තත්ත්වයකට පත් කිරීමට ඔහුගේ පියාගේ කම්කරුවන්ගෙන් කිසිම ධෛර්යයක් වචනයෙන් මුත් නො ලැබුණේ ය. හොර බැල්මෙන් යුත් කොන්දෙස්තරත්, ගරුසරු කමක් නැතිව පිළිකුළින් මෙන් බලන කළු පැහැති කම්කරුවනුත්, කරුප්පන් කන්කානියා ගේ දුෂ්ට බැල්මත් යන මේ හැම දේකින් ම පෙනී ගියේ වත්තේ කම්කරුවන් ගේ විනය ගරුක බව හොඳට ම පිරිහී ගොස් ඇති බවයි. එහෙත් යම්කිසි ඵලදයක ක්‍රියාවක් කිරීමට නම් සිය පියාත් සමග කල්පනාවෙන් කටයුතු කළ මනා බව ඔහුට අවබෝධ විය.

''අරලිය වත්තේ තත්ත්වය කොහොම දූයි ඔබ දන්නේ නෑ,'' යි කියා හදිසියේ ම සිය පියාට පක්ෂපාත විය යුතු බව මතක් වී හේ නිශ්ශබ්ද විය. එසේ වුවද ඔහු නො කී හැම දෙයක් ම ඕ දූන සිටියා ය. නැතහොත් අනුමාන කළා ය.

මෙද සවස ඔහු සමග ඒමට පියා අකැමැති වීම ඔහුට පුදුමයකි. කනස්සළු ගතියෙන් හා අරලිය වත්තේ පැවැති වියවුල් සහිත භාවයෙන් මිදීමට ඉටා ගත් ඩේවිඩ්, නෙවිල්ලා හමුවන්ට යන්ට කැමැති බව හියුට කී ය.

''මහත්මයාත් එන්නේ නැද්ද?'' යි ඔහු විචාළ නමුත් හියු ඔහු දෙස අමුතු බැල්මක් හෙළා ඊට එකඟ නො වී ය.

''අපි වැඩිය එහි යන්නේ නෑ,'' යි හෙතෙම කොටින් පැවසී ය. ''උඹ පලයන්. උඹ දකින්ට ඔවුන් ආසා වෙනවා ඇති.''

එහෙයින් හේ තනිව ම ආවේ ය. එක් අතකින් පියා ගේ ඇස් ඉදිරියේ නැතුව මේ නැන මස්සිනාලා හමුවීමටත් අනික් අතින් අරලිය වත්ත ගැන ටොම් නෙවිල්ට කතා කිරීමටත් ප්‍රස්තාව ලැබීම ගැන හේ ප්‍රීති විය.

ඇත්ත නම් ඔහු සමග වත්ත ගැන කිසිවක් කතා කිරීමට හියු නො කැමැති වීමයි. ''මට මෙ ස්ථානය හොඳට ම තිත්තයි.'' හේ ඇදලා පැදලා කී ය. ''උඹට පුළුවන් විදියට පවත්තා ගෙන පලයන්. එහෙ ම නැත්නම් අවුරුදු ගණනක් ම තිබුණා වගේ ඔහේ තිබුණාවෙ, නුමුත් දෙයියන්ට පින් සිද්ද වෙන්න මට කරදර නො කර ඉඳින්.'' ඩේවිඩ් ටොම් ගේ අවවාදය ගැනීමට අධිෂ්ඨාන කර ගත්තේය.

''මම මොකුත් ඇහුවොත් ටොම් අමනාප වෙයි ද? ඇත්තට ම, වත්ත ගැනත් තාත්තා ගැනත් මගේ හිතට හරි අමාරු යි.''

හදිසියේ ම ඔහු අල්ලාගෙන සිටි සේරා ගේ අත දැඩිවන සේ දැනුණේ, ඔහුගේ හැඟීමක් පමණක් ද?

''ඔහුට. . . . . .සනිප නැද්ද?''

''හා, ඔව,'' නුමුත්. . . . .නිරාශාසයෙන් ඕ සුසුමක් හෙළුවා ය. මෙ වේලේ ඩේවිඩ්ට මතක් වුණේ ධයනාට නම් තැබූ දවසේ රෑ ඔහු ඇඳේ නිදි යයි සිතා ඔහුගේ පියාත් සේරාත් ආලිංගන නැටුමක යෙදුණු අන්දම ය.

සේරයි ඔහුගේ පියයි? හරි වැඩක් නෝ ද! ඔහුගේ සිත කම්පා වී ගියේ ය.

''එන්න, ටොම් කන්තෝරුවේ ඇති.''

ඒ ගොඩනැගිල්ල දෙසට ඔවුන් යන විට දුව ආ ධයනා අමුත්තා දැක නතර වී ඇඟිල්ලක් කටේ ගසා ගත්තා ය. දික් කකුල් ඇති මේ නව හැවිරිදි සුරතල් දැරිය දහහත් හැවිරිදි පිරිමි ළමයා දැක අත කටින් ඉවතට ගෙන හරි ගැසෙද්දී ඇගේ රූ සිරිය කැපී පෙනුණි. දික් වූ ඇසි පිහාටු අතරින් බලන්නට ද, ලෙළදෙන රත් ලවන ඔප ගන්වමින් නො දැනුවත්ව ම මෙන් මුකුළු සිනහ පාමින් මුහුණ රැළි ගැන්වීමට, ඕ දැනට ම පුරුදුව සිටියා ය.

හැබැට ම ළමයා ගේ සිතට නැඟුණේ කුමක් දැයි කල්පනා කරමින් සේරා ඩේවිඩ් දෙස හැරී සිනා පානා විට ඔහු ධයනා දෙස පුදුමයෙන් බලා සිටිනු ඕ දුටුවා ය.

ටික මොහොතකට අවුරුදු කීපයක් ඉදිරියට ගියාක් මෙන් ඈට දැනුණි. ඈට පෙනුණේ අද සිදුවන දේ නො ව මින් අවුරුදු අටක දහයක අනාගත සිදුවීම ය. යළිත් ඈ වත්මනට සිත එළවූවා ය. මැක්ස් නමැති බල්ලා ඇගේ ගවුමට පැන්නේ ය. කිකිළියෝ කෙකර ගෑහ. සැඩ හිරු රැසින් ඇගේ ඇස් පිඩා විදි අතර, දේවදාරු හා යුකැලිප්ටස් ගස්වල සුවඳ දසත විහිදමින් මඳ සුළඟක් ද හමන්ට වන.

''ඩයනා!'' යි ඈ හඬ ගැසුවේ මේ විනෝදවස්ථාව වෙනතකට යොදමිනි. ''මා ඩේවිඩ් ගැන කියනවා ඔබ අසා තියෙනවා නෙ.''

එවිට ඇගේ මුකුළුව ළමයකු ගේ නියම සුරතල් ගතිය දක්වී. මේ ළමයා ලස්සණ සුරතල් ළමයකු නේ දැයි ඩේවිඩ් තමාට ම කියා ගත්තේ ය.

''නයි ගුලේ ඩේවිඩ්, නේ ද?'' යි ඕ සමච්චල් කළා ය. ''කොච්චර මෝඩකමක් ද කළේ. නයි ගුළකට අත දලා.''

මෙයින් ඇති වූ විවාදයෙන් පසු දෙදෙනා යච්දිච් මිතුරෝ වූහ.

6

ඩේවිඩ් ගිය පසු ටොම් සේරාට කතා කොට ''අරලිය වත්තේ ආරාවුල් හටගනී යයි ඩේවිඩ් බලාපොරොත්තු වෙනවා,'' යි කී ය.

සිය තරුණ බෑණාත් සමග පැයකට වැඩි වේලාවක් කන්තෝරු කාමරේ කතා කරමින් සිට ඩේවිඩ් අසු නැග ගිය පසු ටොම් සිතිවිලිදමක පැටලී ගියේ ය.

''කරුප්පන්?'' යි සේරා පැවසී ය.

ටොම් හිස සැලී ය. ''දුවගේ මරණයෙන් ඇති වූ සෝකය ඔහුට තව ම ඉවසන්න බෑ. ඔහු ඒ ගැන දෙස් කියන්නේ හියුට යි. ඔහුගේ මුළු කම්කරු කණ්ඩායමත් අරගෙන මාසෙ අන්තිමට—සිකුරාදට—වැඩිපුර මාසෙක පඩිත් ගෙන වත්තෙන් පිට වී යන්ට යයි කරුප්පන්ට හියු කී විට අද තත්ත්වය අන්තිමට ම නරක අතට හැරුණා.''

''ඒක සාධාරණ වගෙයි නෙ.''

''ඔව්. නුමුත් කල් දුන්නා මදිය කියා ඒ ගොල්ලෝ යන්ට බෑ කියනවා. ඒ ඇරත් කරුප්පන්ට පිස්සු වගෙයි කියා ඩේවිඩ් හිතනවා.''

ඔහු අරලිය වත්ත දෙස ඕනෑකමින් බැලී ය. ‘‘තරුණ ඩේවිඩ මෙහි ආ එක හොඳයි. අරලිය වත්තේ වැඩ කෙරෙන විදිය මට කොහෙත් ම අල්ලන්නේ නෑ.’’

බංගලාවට එන පාරේ අසුන් ගේ කුර හඬත් ඒ සමග ම හදිසියේ දොරට තට්ටු කරන හඬත් ඇසී පළමුවෙන් නැගිට්ටේ සේරා ය.

ටොම් රෑට අඳින කමිසයට උඩින් කබායක් ලා ගෙන එළියට බහින අතර ඕ ගවුම ඇඳ ගනිමින් ඔහු පිටිපසින් ආවා ය. ටොම් ගේ ලන්තෑරුම් එළියෙන් ඩේවිඩ සුදුමැලි මුහුණෙන් වුවත් තද අධිෂ්ඨානයක් ඇතිව සිටින බව දිටී ය.

‘‘සර්, මිනිස්සුන් කීප දෙනකුන් සමග වහා ම වත්තට එන්න පුළුවන් ද? කරුප්පන් බංගලාවට ගිනි තියලා—අපට මිනිස්සු බොහොම අඩුයි. . .’’

‘‘දුවන්න, දුවන්න තාත්තා ළඟට. . .මොහොතකින් මම එන්නම්.’’

‘‘බොහොම ස්තුතියි, ටොම්.’’ මෙසේ කියා වහා ම ඩේවිඩ වේගයෙන් අසු එළවා ගියේ ය.

‘‘අර මෝඩයා හියු කවදවත් දැනමුතුකමක් අහන්නේ නෑ.’’

ටොම් වහා ම ඇඳුම් ලා ගත්තේ ය. ‘‘රාමසාමි සහ ඔහුගේ පිරිසට අරලිය වත්තට එන්ට කියා දැන් ම ම පණිවුඩයක් යවන්න සේරා.’’

හෙතෙම ඇගේ මුහුණ සිඹ පිට වී ගියේ ය.

සේරා අරලිය වත්තට එන විට මධ්‍යම රාත්‍රියත් ඉක්මිලා ය. බංගලාවට හැම අතින් ම ඇවිලුණු ගින්න අහසට බුර බුරා නගිනු ඕ දුටුවා ය. ඈ ළං වන්ට වන්ට කම්කරුවන් ගේ කෑකෝ ගැසීම් ද ඇසුණි. මිනිසුන් ඒ මේ අත කලබලෙන් දුවන සැටි ද ඕ දුටුවා ය. නෙවිල්ලා ඉන්න ලකුණක්වත් දක්නට නැත. එහෙත් හියු ගේ මෙහෙකරු කරෝලිස් වියරු වැටුණකු මෙන් ඈ ළඟින් දුව යන විට මෙසේ ඇසුවා ය.

‘‘කෝ මහත්තුරු?’’

‘‘දන්නේ නෑ, නෝනා. මම හිතනවා ගේ ඇතුළෙහි කියලා. මම මහත්තයා හොයන්ටයි යන්නෙ.’’

ගින්නෙන් දැවෙන ගෙට ඔහු ඇතුල් වෙනු දැක ඕ තොමෝ බියෙන් වෙවුලන්ට වූවා ය. මේ ගිනිතැබීම නිසා ඕ කම්පා වූවා ය. ඕනෑකමින් ම ගෙයක් ගිනි තැබූ මිනිසා ස්වාභාවික මිනිසකු විය නො හැකිය. ඈ අසල ම යම්කිසි තැනක ඔහු සැඟ වී සිටින්ට බැරි නැත. . . .

නිසැක ව ම විනාශ මුඛයට පත්වන්ට ආසන්න වූ බංගලාවේ ඇති හැම වටිනා බඩුවක් ම මිනිස්සු ඉවත් කරන්ට වූහ. රෝස් නෙවිල් ගේ ප්‍රතිරූපය වීසි කොට තණකොළ ගොල්ලේ තිබෙනු දැක සේරා වහා දුව ගොස් එය ගෙන හෙමිහිට ගසකට හේත්තු කළා ය. ටොම් හා ඩේවිඩ් ගිනි ඇවිලෙන දෙරටුවෙන් ඉවතට පනිනවා දුටු ඕ ඔවුන් හමුවීමට දුව ගියා ය.

''ඔබ හියු දුටුවා ද?''

''කරෝලිස් ගේ කල්පනාව ඔහු ගේ ඇතුළේ කියාය,'' යනුවෙන් ඕ පිළිතුරු දුන්නා ය.

ඩේවිඩ් මහත් චිත්ත පීඩාවට පත් වූයේ ය. ''අනේ දෙයියනේ,'' යි කියමින් ඔහු නැවතත් ගොඩනැගිල්ල දෙසට දුවන්ට සැරසුණු නමුත් ටොම් ඔහු වැළකී ය.

''වහළේ කඩා වැටෙනවා. පස්සට පනින්න. . . . . ''

මේ ගිනි ජාලාවේ කොහේ නමුත් හියු පැටලී ඇතැයි සේරා සිතුවා ය. ටොම් ඈ අල්ලා පස්සට තදින් අදිනු යන්තමින් දැනුණි. ඉක්බිති වහළ කඩා වැටී ගිනි පුළිඟු රැසක් අහසට විසුරුණි.

වහළ කඩා වැටෙන්ට ඉතා ළං ව තිබිය දී හියුට පැන ගන්ට සිත් වුණේ ගෙයි පිටිපස දෙසින් රිංගමින් ඔබ මොබ හැසිරෙන කරුප්පන් දුටු විට ය. ඒ මිනිසා ඔහු එනතුරු බලා සිටියේ ය. ගිනිදැල් එළියෙන් කරුප්පන් අත පිහියක් තිබෙන බව හියු දුටුවේ ය. දළ රොම් ගැවසි ඔහුගේ පපුව ද, පැතලි මුහුණ හා ඇටකටු පෙළක් මෙන් දිස් වූ දත් ද එල්බෙන දෙතොල ද ගිනි රැසින් විදහා පෙනුණි.

හියු හෙමිහිට පසෙකට විය. දෙවියන් පල්ල මූට පිස්සු යයි හේ කල්පනා කළේ ය.

තරබාරු සිරුරක් ඇති කරුප්පන් පිහිය අතින් ගෙන නිසොල්මන් ව හියු දෙස බලාගත්වන ම සිටියේ ය. හදිසියේ ම හේ කඩා පැන්නේ ය. හියු පසෙකට වහා පැනගත් නමුත් අතට පිහි පාරක් වැදිණි.

මේ මිනිසාට උන්මත්තකයකු ගේ කෛරාටික කමත් වීයඝියත් තිබුණේ ය. දැන් ඔහු නුවණින් ක්‍රියා කළ යුතු ය.

මල්ලව පොර පිටියක මුෂ්ටි ප්‍රහාරයට සැරසී සිටින්නාක් මෙන් මේ දෙදෙනා ඔවුනොවුන් දෙස නැවතත් මුහුණ පා සිටියාහ. ගොරොක් ගෙඩි මෙන් බියකරු වූ ඔහුගේ දෙනෙත් දුටු හියු ඒ හෙළන බැල්ම ද, එහි තුළ වූ සිතිවිලි ද කුමක් දැයි සිතී ය. කිසි හරයක් නැති ඒ තියුණු බැල්මේ දුෂ්ට

චේතනා පමණක් ගැබ් වී ඇති බව හියුට අවබෝධ විය. ඔහුගේ ගත දෙතොලින් කෙළ වැගිරෙනු දක්නා ලදී. ඔහුගේ කළු දැවැන්ත සිරුර නො සෙල්වී පැවැත්තේ එය කොයි මොහොතක පුපුරාදෝයි නො දැනෙන තරම් කෝප වේගයක් එහි පිළිබිඹු වුණි.

ඇස්, ඒ ඇස් දෙස ම බැලිය යුතු විය.

හදිසියේ ම මේ ඇස්වලින් යක්ෂාවේශයක් ඇතිවූවකු ගේ ලකුණු පහළ විය. කරුප්පන් තවත් වරක් පිහියෙන් ඇන්න විට හියු පස්සට පැන ගත්තෙන් ඒ පහර ද වැරදුණේ ය. ඒ මොහොතේ දී හියු අත දිගු කොට මේ පිස්සු මිනිසා ගේ මැණික් කටුවෙන් ඇල්ලී ය. වරක් ග්‍රහණය මිදුණු නමුත් යළිත් තදින් අල්ලා ගත්තේ ය.

වල් සතකු ගේ මෙන් දුගඳ හමන ඔහුගේ හුස්ම හියු ගේ මුහුණට වැටුණි. දෙදෙනාගේ ම මස් පිඩු එකට ගැටෙමින් කළ මහ සටනකින් පසු හියු කන්කානියා ගේ අත පස්සට නැමී ය.

තමාගේ දැඩි ග්‍රහණයෙන් ඇහ හිරිවැටුණි. ටිකින් ටික ගැඹම ලිස්සා යද්දී ඩාදියෙන් මුහුණ තෙත් වී ගියේ ය. ප්‍රතිමල්ලවයා ගේ සිරුරේ බරත්, ඔහුගේ අනුපම ශක්තියත් ඔහුට දැනුණි.

යළිත් හියු කරුප්පන් ගේ මැණික් කටුව අල්ලා ගනිද්දීම ලිස්සා ගියේ ය. හිතින් හේ ශාප කරන්ට විය. ඔහුගේ සිරුරේ හැම මස් පිඩක් ම දැන් මාරක සටනක යෙදී තිබේ. වළ ගොඩලිවල ඒ මේ අත පෙරළෙමින් ඔව්හු පොර බැදූහ.

හියු ගලක හැපී දෙදෙනා ම බිමට ඇද වැටුණේ ය. වරක් හියු ද තවත් වරෙක කරුප්පන් ද ඔවුනොවුන්ගේ ඇහ මත වැටෙමින් සටන් කළහ. ඉක්බිති සෙම් තලියක් කාරා දමමින් කරුප්පන් නැගිට්ටේ ය. දෙදෙන ම නැගී සිටියහ.

හියු පැන්නේ ය. කරුප්පන් ඇන්නේ ය. පිහියා තුඩේ පහර තමා ඇඳ සිටි කමිසය පසා කරමින් ඉළ ඇට සිදුරු කර ගෙන ගිය බව හියුට දැනුණි. පහරේ වේගයෙන් ම ඉදිරියට නැමුණු තරබාරු දේහය දිටී ය. හියු පස්සට පැන්නේ ය.

වියළි පොළොව මත ඔහු තදින් වැටුණි. කළු පාට මිනිසකු තමා අවනත කරන්ට සූදානම් වනු යළිත් දුටුවේ ය. එවේලේ තුබුණු මුළු ශක්තිය ම යොද දෙපයින් ම හේ පහර දුන්නේ ය.

ඔහුට අන්තිමට ඇසුණේ මේ පිස්සු මිනිසා ගේ හිස් කබල ගල් පොළොවේ වදින හඬ ය. ඔහු දෙකන්හි හෝ ගානා හඬක් ඇසුණි. හේ මහා අඳුරක ගිලුණි.

දවස් ගණන් ගත වී ගියේ ය. රෝගාතුර හියු ටොම් ගේ ගෙදර ටිකින් ටික සුවය ලබමින් සිටියේ ය. ඔහුට සිහි ලැබුණු විගස ම, ‘‘කරුප්පන්ට වුණේ මොකද?’’යි ඇසී ය.

‘‘එයා මැරිලා, හියු,’’ යි ටොම් කනස්සල්ලෙන් පිළිවදන් දුනි.

හිස් කබලක් ගලක හැප්පුණු හඬ හියුට මතක් විය. ‘‘එතකොට කරෝලිස්?’’ යි හේ ඇසී ය.

‘‘ඔහු ද මළා. ස්වාමියා සොයන්ට ගිනි ඇවිලෙන ගෙට, ගිය වෙලේ ඔහු ගිනි බත්වී තිබෙනවා.’’

හියු නෙත් පියා ගති. හා! දුප්පතා. ඒ දුප්පත් කරෝලිස් මෙන් අවංක පක්ෂපාත සේවකයකු යළිත් කවදවත් නො ලැබෙනු ඒකාන්ත ය. තමාගේ නිවස සම්පූර්ණයෙන් ද විනාශ වී ගිය බවත් තරුණ ඩේවිඩ් අලුත් සේවක පිරිසක් සමග කාර්යක්ෂම ලීලාවෙන් අරලිය වත්තේ වැඩ හෙමිහිට කර ගෙන යන බවත් හියුට දැනගන්ට ලැබුණි.

ටොමට වඩා මේ රෝගියාට උවැටන් කිරිම පහසු බව සේරාට පුදුමයකට මෙන් දැනුණේ ය. ඉඳහිටලා ඔහුට කර තිබෙන නියමයක් ගැන නො ඉවසිලි ගතියක් දක්වනවා මිස බොහෝ සෙයින් ඔහු නිශ්චල ව සිටිමින්, ඈ සාත්තු සප්පායම් කරන අන්දම මැලවුණු මුහුණින් බලා සිටී.

අරලිය වත්ත ගැන ඔහු කිසි සැලකිල්ලක් දක් වූයේ නැත. ඩේවිඩ් එහි වැඩ කර ගෙන යන පිළිවෙළ විස්තර කරන කල්හි ඔහු එය අසා සිටියේ මහත් අපුලකිනි. ටොම් හා සේරා ගේ පරණ බංගලාව අලුත් වැඩියා කළ පසු, හියුට සෑහෙන පමණ සුවයක් ලැබුණු වහා ම ඩේවිඩ් සමග ඔහු එහි ගියේ ය.

මීට දෙසතියකට පසු ටොම් හා සේරා ඔහු බැලීමට ගිය කල්හි පරණ සිටි ලෙස ම ඔහු ඇඳ මත වාඩි වී සිටිනු දක්නා ලදී. ඔහු ඔවුන් දෙස මඳ සිනහ පා ඔවුන්ට වාඩිවන ලෙස තුවාල නො වූ අතින් සංඥා කළේ ය. පැයක් මුළුල්ලේ වත්ත හැර අනික් හැම කාරණයක් ගැන ම ඔවුන් සාකච්ඡා කළ පසු ටොම් හා සේරා යන්ට නැගිට්ටාහ.

‘‘ඔබ බොහොම ඉක්මණින් නැවතත් වැඩ කරනවා ඇති හියු!’’

හියු ගේ මුහුණේ පහළ වුණේ සතුට පළවන සිනහ රැල්ලකි. ‘‘එහෙම සිතනවා ද, ටොම්?’’

‘‘වත්තට කරන්නේ මොකද යි තීරණය කර හමාර ද?’’

''ඔබ අදහස් කරන්නේ කොළ රෝගය ගැන ද?'' යි කියමින් ඔහු කර ගැස්සී ය. ''කරන්ට තියෙන එක ම නුවණක්කාර වැඩේ මේ විනාශ වෙච්ච කෝපි උගුල්ලා දමා තේ වැවීම යයි ඩේවිඩ් මට කියනවා. එහෙම නේ ද, ඩේවිඩ්?''

''ඔව්, සර්,'' යි ඩේවිඩ් නො පැකිළි ව පැවසී ය.

''පේනවා ද, මට සර් කියන පුරුද්ද තාම අත්හැර ගන්ට බෑ.''

ඩේවිඩ් ඔහු දෙස දත් නියවා, ''තාත්තා යයි කියන්ට මට ඔබගෙන් ඒ තරම් ප්‍රස්තාවල් ලැබුණේ නෑ.''

හියු සිනහ පෑ ය. ''තේ වැවීම නුඹට හොඳයි, ළමයා. ඒ තේ වවන්ට කොච්චර කල් යයි ද? අවුරුදු තුනක්? හතරක්? ඒ වගේ ම ළඟ දීම නුඹට තියෙන්නේ හරි වැඩ ගොඩක්. මේ කෝපි ගස් ඔක්කෝම උගුල්ලා ඉඩම නැවතත් වවන්ට එපා යැ.''

''ඔබ එකඟ නම් මම ඒක කරන්ට ලෑස්තියි.''

හියු කාමරය වටේ හෙමිහිට බැලී ය. පළමුවෙන් ඔහුගේ නෙත් යොමු වුණේ ප්‍රසන්නවත් මුහුණක් හා පැහැදිලි නෙත් යුවළක් ඇති තමාගේ තරුණ උස පුතා දෙස ය, ඊ ළඟට කරුණාන්විත මුහුණකින් හෙබි තරබාරු මස්සිනා වෙත ය, අන්තිමේ දී ඔවුන් පිටිපසින් ඕනෑකමින් ඔහු දෙස බලා සිටි ජේරා දෙස ය. ඊට පසු හදිසියේ ම කළ යුත්තේ කුමක් දැයි ඔහුට නිසැකව ම අවබෝධ විය.

''හොඳයි, මා ගැන කල්පනා කරන්ට ඕනෑ නෑ,'' යි හේ පැවසී ය.

ඔහු දෙස බලා සිටි අනික් හැම දෙන ම නිශ්චල වූහ. ඔවුන්ගේ විස්මය පත් ලීලාව ඔහුට මොහොතක් ප්‍රීතිය ගෙන දුනි.

''ඔබ කැමති නම් තනියම ඒ වැවීම කරන්න. මුළු ජීවිත කාලයට ම සෑහෙන තරම් වැවිලි කරලයි මම ඉන්නේ.'' හේ ඇඳ මත ඍජු ව සිට ගති. ''ඩේවිඩ්, ගන්නවා ඔය කබල් වත්ත. සමහර විට ඔබයි ඔබේ මාමා වන ටොමුයි ඔය වත්ත හොඳින් වවනවා ඇති. දැන් ඉතින් මම බලන්නෙ ජීවත් වෙන්න යි. කෝපිත් යකාට ගියාවෙ. තේත් යකාට ගියාවෙ.''

ටොම් වහා ම ඉදිරියට පියවරක් තැබී ය. ''ඔය විදියට ඔබට දැන් ඇති වන හැඟීම පුදුමයක් නො වේ. . . .''

''ඔව් මගේ නියම අදහසයි ඒක, ටොම්.''

''නුමුත් තාත්තේ. . . . .''

‘‘ඔක්කෝම වැඩ බාර අරගන්න පුතා. ඕනෑ හැටියකට කරන්න. මම නැවතත් තැන් තැන්වල ඇවිදින්ටයි යන්නෙ. එසේ ඇවිදලා මාත්සි වුණා ම මම නැවතත් එන්ට පුළුවනි. . . . . . .නැත්නම් සමහර විට එන්ට බැරි වෙයි. කවුද දන්නෙ?’’

නිශ්ශබ්දව සිටින මිනිසුන් දෙදෙනා ඉක්මවා ඔහුගේ බැල්ම අඳුරේ තනිව ම හුදකලා ව සිටගෙන සිටි සේරා දෙසට යොමු විය. හදිසියෙන් ඇගේත් මොහුගේත් දෙනෙත් ගැටිණි. තත්ත්වාබොධයකින් මෙන් වෙන්වීමෙ ආචාර කරන ලිලාවකින් ඕ ඇඟිල්ල කටෙ ගසා ගත්තා ය.

7

මේ දවස්වල වත්තේ කළ යුතු වැඩ තිබුණේ ස්වල්පයකි. කලක් පල බර ව තුබු ගස් දූන් කොළ හැලී මැරී තිබෙන්නාක් බඳුව තිබීම ද, මල් හට ගැනි ටික කලකින් ම ඒවා මකුළු දූලි මෙන් අතු අග විසිරී වැටීම ද, කම්කරු ලයින් අතරින් ගමන් කරන විට ඉක්මණින් හෝ ටිකක් ප්‍රමාද ව රක්ෂාවෙන් අස්විය යුතු බව දන්වා එවන ලියුම් බලාපොරොත්තු වෙමින් මලානික මුහුණු ඇතුව සිටින කම්කරු කණ්ඩායම් සිටීම ද, වත්තේ ඒ මේ අත ඇවිදින විට දුටු ටොම් කම්පා වී ගියේ ය.

ඒ කම්කරුවන්ට මුහුණ පාන්ට තිබුණේ කුමක් ද? සාගිනි විඳගැනීමත්, අතරමග රෝගාතුර ව හෝ මරණයට පත්වමින් ගෙදර යන ගමනත් පමණි.

දවසක් උදෑසන ලයින් දෙසට යන විට මහලු රාමසාමි කන්කානියා ගෙයි දෙර ළඟ සිට නැගිට ආචාර කරනු හේ දුටුවේ ය. ඔහුගේ තරුණ බිරිඳ වන සෙල්වරාණිත්, වැඩිමල් ළමයි දෙදෙනාත් එසේ ම කළහ. එහෙත් රිදියෙන් කළ බෝ කොළයක් එල්බෙන රිදී හවඩියකින් පමණක් ඉණ සරසා ගෙන සිටි, තෙල් ගැවාක් මෙන් දිලිසෙන සිරුරක් ඇති බාලම දරුවා ඇඟිලි තුනක් කට ලා උරමින් නෙත් අයාගත් වන ම ඔහු දෙස බලා සිටියේ ය.

ටොම් මේ කනස්සලු දයක තත්ත්වය දැක ඉවතට ගියේ ය.

‘‘නරක කාලෙ, රාමසාමි.’’

‘‘ආමා, දෙරේ. මිච්චම් අගතු.’’ (ඔව්, බොහොම නරකයි, සර්).

ඔහුගේ ඇඟේ ඉලකටු පෑදී තිබුණි. රැවුලේ සුදු කෙස්ගස් ටිකෙන් ඔහුගේ කනස්සලු භාවය වඩාත් කැපී පෙනුණේ ය. ශක්තිය පිරිහුණු පසුත් බොහෝ කල් සේවය කොට මහලු වූ අශ්වයකු ගේ ලීලාවක් ඔහුගෙන් දක් විණ.

ටොම් ගේ බැල්ම මෘදු විය. මුල දී එක සෘතුවක දී මීස වත්තේ ඇති වූ නොයෙක් අවස්ථාවල දී රාමසාමි ඔහුට ළැදියාවකින් ක්‍රියා කෙළේ ය. ටොම්ට මෙන් ම, මේ කොළ රෝගය ඔහුට ද මහත් විපතක් හැටියට දූනේ.

කප්පාදු කිරීමට එක කෝපි පැළයක් හෝ, කඩා ගැනීමට එක කෝපි ඇටයක් හෝ තිබෙන තුරු මේ මිනිසුන් ගේ නම් දෙවියන්ගේ නාමයෙන් පඩි ලැයිස්තුවේ තිබෙන්ට හැරීමට ටොම් සිතා ගත්තේ ය. ඔව්, අවශ්‍ය වුවහොත් ඊටත් වැඩි කාලයක් ඔවුන් අස් නො කෙරෙනු ඇත.

සිතුවිලි දමෙහි ම පැටලී රාත්‍රිය ගත කරන විට ම අසල අඹ ගසෙන් නිකුත් වන බකුසු හඬ ද, පැය ගණන් මුළුල්ලේ නො කඩව ම නැගෙන රැහැයි හඬ ද ටොම් අතිශයින් කම්පා කර වී ය.

දිය පාර ගැන යළිත් හියු සමග සිහිනයෙන් ආරාවුල් ඇතිකර ගත් ඔහුට අවදි වූ විට හියු වත්තෙන් ගොස් බව සිහිපත් වෙයි.

නැවතත් ටොම් නින්දට වැටුණෙන් තරුණ ඩේවිඩ් කෝපි උදුරා දමන විට වේදනාවෙන් හඬන අරලිය වත්ත ද ඔහුට සිහිනෙන් පෙනුණි.

ඉන් පසු අරුණාලෝකයත් සමග ම වත්තේ ගමන් කරන විට අකාරුණික හිරු එළියට යට වූ එහි දුක්ඛිත ස්වභාවය දුටුවේ ය.

"අනේ දෙයියනේ, මට කළ හැකි කිසිවක් නැද්ද?'' යි ඔහුගේ හද පත්ලෙන් පැන නැගුණු මේ ප්‍රශ්නයට පිළිතුරක් ඔහු සවනත නො වැටිණි.

ලෙඩ බෝවුණු වත්තේ ගස් අතරින් ගමන් කොට පස්වරුවෙහි ගෙදර පැමිණි හේ බොහෝ වෙහෙසට පත් වී සිටියේ ය.

"පෙම්වත, පෙම්වත, ඇයි මේ තරම් දුක් විඳින්නේ,'' යි සේරා පසෙකට වී දණින් වැටී ඇසුවේ, ඔහු පුටුවක වාඩි වී දෑතෙහි හිස සභවා ගත් විට ය.

"මට කළ හැකි යමක් තවත් තියෙන්ට පුළුවනි.''

ඔහු ළඟ දණ ගසා, හිඳ, කුලුණු බරින් ඕ ඔහුගේ හිස පිරිමදිද්දී පැසී යන හිසකෙස් දුටුවා ය. දහස් වරකටත් වඩා ඇ කියූ දේ මීස ඇට තවත් කිව හැක්කේ කුමක් ද? ලන්තානාවේ කොළ රෝගයට ප්‍රතිකාරයක් පමණක් බලාපොරොත්තු වූ ඔහුට, වෙන කවර දෙයක් කීවත් ඇති පල කිම?

"ඇත්තේ එක ම නිවැරදි පිළිතුරයි, ටොම්,'' ඕ හෙමිහිට කීවා ය.

"මම ඒක නම් කරන්නේ ම නෑ!'' යි කියමින් හේ සිට ගත. "මේ තරම් අවුරුදු ගණනක් මුළුල්ලේ වවා ඇති දූඩි කළ මගේ කෝපි ගස් උදුරා දමන්නේ කොහොම ද? අක්කර හය සීයක්. අක්කරයෙන් අක්කරය උගුල්ලා, ගස් පුළුස්සා, ඒ පිළිස්සූ තැන්වල අමු අමුවේ ම මා කිසිත් නො දන්නා පැළ ජාතියක් හිටවන්නේ මොන හිතකින් ද, සේරා?''

''අනිත් අය එහෙම කරනවා,'' යි ඕ තරයේ ම කිවා ය. ''අල්ලපු වත්තේ ඩේවිඩ්. . . . . .''

''ඩේවිඩ් තරුණයෙක්. ඔහුට ඉඩම හා මා අතර ඇති තරම් සම්බන්ධකමක්වත්, බැඳීමක්වත් නෑ. ඒ ඇරත් තේ වැවීම—තේ හැදීම—ගැන මම දන්නේ මොනවා ද?''

''ඩේවිඩ්ට පුළුවන් ඔබට උදව් වෙන්න. . . . . .''

ටොම් හිස සැලී ය. ''මගේ කෝපි මම උගුල්ලන්නේ නෑ සේරා. ඒක හරියට මිනීමරනවා වගේ වැඩක්. කොළ රෝගය මග හැරිලා යන්නේ නැතැයි මම හිතන්නේ නෑ. එහෙම වුණොත් අපි ඔක්කොම මෝඩයෝ වෙනවා නේ ද? මම හොඳට පෝර දමූ නිසා අපට අස්වැන්න ටිකක් ලැබෙනවා.''

''ගස්වලින් ලැබෙන ආදයම තරමට ම ඒ පෝරවලටත් වියදම් වෙනවා.''

හේ වේගයෙන් කාමරය හරහා ඇවිද සේරා ඉදිරියේ සිට ගත. ''මා පරාජය වී යයි පිළිගන්ට බැහැ, සේරා. එහෙම නැතුව මම මේවා විකුණා දමා රට යන්ට පුළුවනි. පුදුමයි මට ඒක කරන්ට ලෑස්ති වෙලා වැඩි කලක් ගත වුණේ නෑ. වත්ත සරුසාරට තුබුණු අවුරුදු ගණන කොච්චර ටික ද, සේරා. බයිබලයේ දක්වන අවුරුදු හතවත් නෑ නොවැ.''

''අනේ මගේ ටොම්,'' යි ඕ මිමුනුවා ය. 'එපා. . . . . . .''

''මම මොනවා කරන්න ද, සේරා? ඔබත් ඩයනාත් ගැන කල්පනා කරන්ට තියෙනවා නෙ. සමහර විට මම තනියම හිටියා නම්...ඔබ දෙදෙනාට හිරිහැර කරදර විඳින්ට මට ඉඩ අරින්න බෑ. මම මොනවා කරන්න ද?''

මිට මොලවා ගත් අතක් අනෙකට තට්ටු කරමින් බර කල්පනාවක ටොම් යෙදුණි. අමාරුවෙන් හිත හදගෙන හේ මෙසේ කී ය.

''මේ දිස්ත්‍රික්කයේ තේ වැවීමට කැමති කෙනකු ඉන්දියාවේ සිට අද උදේ මට ලියුමක් එවා තිබුණා. ලන්තානාව ගැනත්, එය හොඳ තත්ත්වයක තබා ගැනීමට මා ගත් උත්සාහයත් කවදෝ කියා තියෙනවා. හොඳ ගානකට ඉඩම ඉල්ලනවා. මම ඒකට එකඟ වෙන්න ද?''

සේරා දිග සුසුමක් හෙළුවා ය. වත්තට වහල්වීම නම් නැති විය හැකියි. සමහර විට ආපසු එංගලන්තයට යෑමටත්, කුඩා ගෙයක් හෝ සමහර විට ගම්බද ගොවි පළක් මිලයට ගැනීමටත් ප්‍රස්තාව ලැබෙන්ට පුළුවන. ඩයනාටත් පාසැල් යන්ට ඉඩ ලැබෙවි.

ඔහුගේ පීඩිත මුහුණ දෙස ඕ බැලුවා ය. සිහිනය මැකී ගියේ ය.

"ඔබ කරන්ට යන කොයි දෙයක් නමුත් මට හොඳයි." ඕ ශාන්ත ව පැවසුවා ය.

"ඇත්තට ම ද, සේරා?"

"ඔව."

ඔහුගේ නෙත්වල දීප්තිය යළිත් හෙමිහිට මතු විය. ඒවායේ ගැප් ව තුබූ විස්මයාකුල භාවය ද විශ්වාස නො කරන සුලු ගතිය ද ඕ දුටුවා ය. ඔහු ඈ දෙස බලන්ට වූයේ දිගු කලකට පසු නැවත හමුවුණු කෙනකු දෙස බලන්නාක් මෙනි.

දවස් ගතවීමත් සමග නව සිරියාවක් ඈ කෙරෙහි ඇතිවනු සේරාට දැනුණි. වත්ත ගැන ඈ තුළ පැවැති පැරැණි විරෝධය ඇගේ නො ඉවසිලිමත් ගතියත් සමග ම පහව ගියේ ය.

මුල දී ඕ ලන්තානාවට අභිරුචියක් දැක්වූවා ය. පසු ව ටොම් හා ඔවුන්ගේ ජීවිත එය හා සමග වෙළී පැටලී තිබෙන නිසා ඕ ඊට පිළිකුල් කළා ය. දැන් පැමිණ තිබෙන්නේ අනුකම්පා සහගත තත්ත්වයකි. ඔවුන්ගේ උදව් දැන් වත්ත බලාපොරොත්තු වන බැවින් ඇගේ හෘදයාභ්‍යන්තරය කරුණා සහගත චේතනාවකින් බර ව මෙ ඉඩමට කලින් තිබුණාට වඩා දැඩි වූ, අලුත් වූ ඇල්මක් ඇති විය.

දවසක් සවස් වේලේ ඕ කෝපි ගස් අතරින් හෙමිහිට ගමන් කළා ය. කළුවන් කෝපි ගෙඩිත්, කොළ හැලුණු ගසුත් දැක ශෝකයෙන් ඒවා අත ගෑවා ය. පසු ගිය අවුරුදු කීපය තුළ පැවැති සිරියාව හා සසිරු බව යළිත් උදවනු නැත. ලන්තානාවේ කෝපි තවමත් ආරක්ෂා කරගත හැකිය යන මිථ්‍යා මතයෙන් ටොම් මුළා වී සිටින්නේ ඇයි ද?

ලන්තානාවත් අරලිය වත්තත් වෙන් කරන ඇළ කරා ඕ පැමිණියා ය. හියු ද දැන් නැත. සිටින්නේ ඩේවිඩ් පමණකි.

අරලිය වත්ත ගෙන තිබෙන්නේ අමුතු ම මුහුණුවරකි. ඩේවිඩ් සිය පියාණන් වැවූ කෝපි ගස් උදුරා දමා ගිනි තබා තිබේ.. තවමත් නැවුන් පසකින් යුත් පොළොව මත අප්‍රකට ලෙස වැඩී ගෙන එන තේ පැළ පෙළින් පෙළ දිස් වුණි.

ඈ සිට ගෙන සිටි අතර ඩේවිඩ් තමා වෙතට එනු ඕ දුටුවා ය. නැවතත් ඇට ඔහු පෙනුණේ හියු එන්නාක් මෙනි. පරණ පුරුදු පරිදි හියු ගේ දර්ශනයෙන් ජනිත වූ ප්‍රමෝදය මොහොතකට පහළ වූයේ ය. නව යොවුන් රසයෙන් උදම් ව මඳ සිනහ රැල්ලකින් හොබවා ගත් මුව මඬලින් සැරසී ඒ තරුණයා ඇට ළං වූ කල්හි, ඒ චිත්ත ප්‍රීතිය අනූනව පැවතුණි. හියු ගේ හැම අංග ලක්ෂණයක් ම ඔහුට ඇත්තේ නොවේ දැයි ඇට සිතුණි.

"මම ඔබේ තේවල අලංකාරය බලනවා, ඩේවිඩ්."

අරලියවත්තේ අලුත් පැල පළමුවරට......කෝපිවලට වඩා හොඳ අනාගතයක් ඇති කර්මාන්ත උදව වැඩිදුර නොවන බව සිතුවේය.

ඔහුගේ දෙනෙත් දීප්තිමත් විය. ''දැනට වැඩි ලස්සණක් නැ. නුමුත් අවුරුද්දකින් හෝ දෙකකින්. . . . . ''

අවුරුද්දකින් දෙකකින් කෝපිවලින් වූ හානිය අමතක වී අස්වැන්න ලැබීමෙන් ඉඩම සශ්‍රීක වන බව ඈ කල්පනා කළා ය.

ටොම් හා ඩයනා එකට මහ බැස එනු ඈ දුටුවා ය. ඒ තරුණිය ගේ දර්ශනයෙන් ඩේවිඩ් ගේ මුව පියුම පොබයා ගිය සැටි ද ඈ දුටුවා ය. මේ ගැන තරමක වේදනාවක් ද නැති නො වූ මහත් ප්‍රීතියක් ඇ හද තුළ ජනිත විය.

සිවු දෙන ම එක් වී ටොම් ගේ වියළි කෝපි ගස් අතුරින් කඳු මුදුන දෙසට හෙමිහිට ගමන් කළහ. ඔවුන් කඳු මුදුනට ළං වත් ම හිරු බැස යමින් පැවතුණි.

නිසා කත පිළිගැනීමට අවට කඳු පෙළ මීහිදුමින් සැරසී සිට ගත. සැඳෑ හිරු රැසින් නැහැවී යන කල්හි උෂ්ණ කලාපික රටවල බබළන සිරිය මැද නටු වී ගිය කෝපි ගස් අනාවරණය විය. සැඳෑ වලා ගැබින් නිකුත් හිරු රැස් අවර ගිර ගැටී බැස යත් ම අනාගත යස ඉසුරක පෙර නිමිති එහි ගැප් වී ඇති සේ නෙවිල්ලා සැලකූහ.

සේරා සිය සැමියා දෙස බලා ඔහු හිස ඔසවනු දුටුවා ය. අරලිය වත්තේ ශක්තිමත් ව වැඩෙන අලුත් පැළ පළමුවරට දුටු ඔහු ඒ මොහොතේ දී ම කෝපිවලට වඩා හොඳ අනාගතයක් ඇති කර්මාන්ත උදව වැඩි දුර නො වන බව සිතුවේ ය.

ඔහුගේ දෙනෙත්හි පරණ පැවැති එඩිතර ගතිය සමග අධිෂ්ඨාන බල වේගයක් මුහුණේ පිළිබිඹුවන සැටියක් ඔහු දෙස බලා සිටි සේරාට දැනුණි. ඔහු ඈගේ අත් අල්ලා ගත් විට නව දිවියක උදමින් ඈ ඇළලී ගියා ය.

''ඇත්තෙන් ම ඩේවිඩ්, ඔබ කළා හරි! උනන්දුවක් නැතිව—සිතිවිලි මාත්‍රයට ඉඩ දී—කනගාටුවීමෙන් වැඩක් නෑ. ඉඩම් දියුණු කරගැනීමට තවමත් මහ පැදී තියෙනවා. තේ වැවීමෙන් ඔබ කළේ හරි ම හොඳ වැඩක්.''

''ඉතින් මාමෙ. . . . . . .ඔබ ?''

ටොම් ගේ මුවින් ගිලිහුණු වචන බලාපොරොත්තු වූ පරිදි කල්පනාකාරී ස්පිර බවක් දැක් විය. ''මම ඔබ අනුගමනය කරනවා, පුතා.'' ඔහු සේරා දෙසට හැරී, ''ප්‍රේමිය, ඒ කරදර විඳ ගනිමින් අවුරුදු කීපයක් බලාපොරොත්තු සහිත ව ඉන්ට ඔබ සූදානම් වෙතොත් පමණයි.''

''ඕනෑ තරම සූදානම්, ටොම්,'' යි ඈ කීවා ය.

ලංකාවෙ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින්
කොළඹ ලේක් හවුස් මුද්‍රණාලයේ මුද්‍රණය කරවා
ප්‍රසිද්ධ කරන ලදී.

සිංහල
EBOOKS

සිංහල නවකතා 1000කට අධික ප්‍රමාණයක් නොමිලේ
Ebook ආකාරයෙන් කියවන්න...
දැන්ම www.sinhalaebooks.com වෙත පිවිසෙන්න..

ක්‍රිස්ටීන් විල්සන් මහත්මිය, සුප්‍රකට ශල්‍ය වෛද්‍යවරයෙකු වූද, ප්‍රවීන ග්‍රන්ථ කතුවරයෙකු වූද අභාවප්‍රාප්ත ආර්. එල්. ස්පිට්ල් මහතාගේ එකම දියණියයි.

සිය පියාගේ ආභාශය තම ලේඛන කලාව වර්ධනය කර ගැනීමේ ලා ඇයට නොමඳව ලැබිණි. තම පියා ලංකාවේ මහ වන පෙදෙස්වල සංචාරය කළ අවස්ථාවලදී ඇය පියා සමග එකතු විය. එනයින් ඇය ලංකාවේ වන දිවිය පිළිබඳව මහත් අත්දැකීම් රාශියක් ලැබීය.

රොඩීන් හි අධ්‍යාපනය ලද ඇය් ලංකාවට පැමිණීමෙන් අනතුරුව විවිධ ලිපිලේඛන පුවත්පත් සඟරා ආදියට සැපයුවාය.

THE BITTER BERRY යනුවෙන් ඇය විසින් රචිත ඉංග්‍රීසි නවකථාව 'තිත්ත කෝපි' යනුවෙන් පරිවර්තනය කොට ප්‍රසිද්ධ කරනු ලැබුයේ 1962 දී ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි. ඇය තවත් කෘතීන් 2 ක කතුවරිය ලෙස හිමිකම් කියයි.

ISBN 955 – 9034 – 16 – 2